මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා
**http://pitaka.lk** වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# අංගුත්තර නිකාය

# 4

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලෝක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය ආර්යරත්න රේරුකාන මහතා

# අංගුත්තර නිකාය

# 4

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1956
දෙවැනි මුද්‍රණය - 2013

**ත්‍රිපිටකය**

**අංගුත්තර නිකාය 4**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැඟීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මඟ පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2013 නොවැම්බර්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංඥාපනය

සූත්‍ර පිටකයේ හතරවෙනි නිකායවූ අංගුත්තර නිකාය නිපාත එකොළහකින් යුක්තයි. එක අඞ්ගයකින් යුත් ධර්ම පළමුවෙනි නිපාතයෙහිද, අඞ්ග දෙකකින් යුතු ධර්ම දෙවෙනි නිපාතයෙහිද යනාදී වශයෙන් ඒ ඒ නිපාත වෙන්කර තිබේ. පළමුවන සංඝායනාවේදී මේ නිකාය ආරක්ෂා කිරීමට භාරවූයේ අනුරුද්ධ මහ රහතුන්වහන්සේටය. මේ පොතට අංගුත්තර නිකායේ 8 නිපාතයේ 6 වෙනි වර්ගයේ සිට 11 වෙනි නිපාතයේ අවසානය දක්වා ද ඇතුල් කළෙමි.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයබීරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයබීරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රත්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත පින්කන්දේ පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද, පැල්මඩුල්ලේ ශ්‍රී සද්ධම්මෝදය පිරිවෙනාධිපති පණ්ඩිත කේ. පඤ්ඤාරාම ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත විමල විජයසූරිය මහතාද, ඩී. එන්. ඒ. මුදලිගේ මහතාද, ඒ. ඇස්. බී. ඩබ්ලිව්. නානායක්කාර මහතාද, ඇල්. ජී. පෙරේරා මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

12 - 1 - 56.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

$x$

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


පිට

**අට්ඨක නිපාතය**

දෙවෙනි පණ්ණාසකය

6. ගොතමී වර්ගය 1411
7. චාපාල වර්ගය 1425
8. යමක වර්ගය 1443
9. සති වර්ගය 1452
10. සාමඤ්ඤ වර්ගය 1462

**නවක නිපාතය**

පළමුවෙනි පණ්ණාසකය

1. සම්බොධි වර්ගය 1464
2. සීහනාද වර්ගය 1482
3. සත්තාවාස වර්ගය 1504
4. මහා වර්ගය 1516
5. පඤ්චාල වර්ගය 1552

දෙවෙනි පණ්ණාසකය

6. ඛෙම වර්ගය 1557
7. සතිපට්ඨාන වර්ගය 1558
8. සම්මප්පධාන වර්ගය 1563
9. ඉද්ධිපාද වර්ගය 1564
10. සාමඤ්ඤ වර්ගය 1565

**දශම නිපාතය**

පළමුවෙනි පණ්ණාසකය

1. ආනිසංස වර්ගය 1566
2. නාථ වර්ගය 1579


මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. මහා වර්ගය 1595
4. උපාලි වර්ගය 1620
5. අක්කොසක වර්ගය 1626

දෙවෙනි පණ්ණාසකය

6. සචිත්ත වර්ගය 1640
7. යමක වර්ගය 1655
8. ආකඞ්ඛ වර්ගය 1667
9. ථෙර වර්ගය 1681
10. උපාසක වර්ගය 1699

තුන්වෙනි පණ්ණාසකය

11. සමණ සඤ්ඤා වර්ගය 1728
12. පච්චෝරොහණී වර්ගය 1739
13. පරිසුද්ධ වර්ගය 1750
14. සාධු වර්ගය 1752
15. අරිය වර්ගය 1755

සතරවෙනි පණ්ණාසකය

16. සම්මාදිට්ඨි වර්ගය 1758
17. යමක වර්ගය 1762
18. සාධු වර්ගය 1775
19. අරියමග්ග වර්ගය 1776
20. පුද්ගල වර්ගය 1777
21. කරජකාය වර්ගය 1777
22. සාමඤ්ඤ වර්ගය 1792

**ඒකාදසක නිපාතය**

1. නිස්සය වර්ගය 1798
2. අනුස්සති වර්ගය 1817
3. සාමඤ්ඤ වර්ගය 1851

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අංගුත්තර නිකාය.

## අට්ඨක නිපාතය

### දෙවෙනි පණ්ණාසකය.

### 6 ගොතමී වර්ගය.

**1. (මහා පජාපතී) ගොතමී සූත්‍රයඃ-** 1. "එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් නුවර නිග්‍රොධාරාමයෙහි වාසය කරණසේක. ඉක්බිති මහා ප්‍රජාපතී ගොතමීතොමෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියාය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාය. එකත්පසෙක සිට මහා ප්‍රජාපතී ගොතමීතොමෝ භාග්‍යවතුන් වහන්සේට, (ii) "ස්වාමීනි, ස්ත්‍රිය ගිහිගෙන් නික්ම තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද ධර්ම විනයෙහි අනගාරික නම් ශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාව ලබන්නේ නම් යහපතැයි" කීවාය.

2. "ගොතමිය, (i) කම් නැත, ස්ත්‍රිය විසින් තථාගතයන් වහන්සේ වදාළ ධර්ම විනයෙහි ගිහිගෙන් නික්ම අනගාරික නම් ශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාව තොපට රුචි නොවේවා." (ii) දෙවනුවත් මහා ප්‍රජාපතී ගොතමීතොමෝ භාග්‍යවතුන් වහන්සේට (මෙහි 1 (ii) සහ 2 (i) යෙදිය යුතුයි.) තුන්වෙනුවත් (මෙහි 1 (ii) සහ 2 (i) යෙදිය යුතුයි.)

3. ඉක්බිති මහාප්‍රජාපතී ගොතමී තොමෝ භාග්‍යවතුන් වහන්සේ ස්ත්‍රියට තථාගතයන් වහන්සේ විසින් වදාළ ධර්ම විනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිද්දට අවසර නොදේ යයි දුක්වූවා, සිත නරක් වූවා, කඳුළු පිරුණු ඇසින් යුක්තව බුදුන් වැඳ ප්‍රදක්ෂිණා කොට ගියාය.

4. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් නුවර කැමතිතාක් කල් වැස විශාලා මහනුවර යම් තැනෙක්හිද එහි වැඩිසේක. පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙන්නේ විශාලා මහනුවර යම් තැනෙක් හිද එහි විසූහ. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි වාසය කරණසේක. ඉක්බිති මහා ප්‍රජාපතී ගොතමීතොමෝ හිසකෙස් සිඳුවා කසට වස්ත්‍ර හැඳ බොහෝ ශාක්‍යස්ත්‍රීන් සමග විශාලාමහනුවර යම්තැනෙක්හිද, එහි වැඩිසේක. අනුක්‍රමයෙන් විශාලාමහනුවර මහා වනයෙහි කූටාගාර ශාලාව යම්තැනෙක්හිද එහි පැමිණියාය.

5. "ඉක්බිති (ii) මහා ප්‍රජාපතී ගොතමීතොමෝ ඉදිමී ගිය පයින් ධූලි වැකුණු සිරුරින් දුක් වෙමින්, නරක්වූ සිතින්, කඳුළු පිරුණු ඇස් ඇත්තී අඬමින් දොරටුවෙන් පිටත සිටියාය. (iii) ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඉදිමුණු පා ඇතිව ධූලි වැකුණු අවයව ඇතිව දුක්වූ, සිත නරක් වූ කඳුළු පිරුණු මූණ ඇතිව අඬමින් දොරටුවෙන් පිටත සිටි මහා ප්‍රජාපතී ගොතමිය දැක, "ගොතමිය, නුඹ ඉදිමුණු පාවලින්, ධූලි වැකුණු අවයව වලින් දුක්වූවා, සිත නරක්වූවා කඳුළු පිරුණු ඇස් ඇත්තී අඬමින් දොරටුවෙන් පිටත කුමක් නිසා සිටින්නෙහිද?"

6. "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, එසේමය (ii) භාග්‍යවතුන් වහන්සේ ස්ත්‍රියට තථාගතයන් වහන්සේ විසින් වදාළ ධර්ම විනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය නම් ශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාවට අවසර නොදෙති." (iii) "ගොතමිය එසේ වීනම් යම්තාක් මම ස්ත්‍රියට තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්ම විනයෙහි ගිහිගෙන් නික්ම අනගාරික නම් ශාසනයෙහි පැවිද්ද ඉල්වම්ද ඒතාක් මෙසේම ඇත්ව සිටින්නැයි" කීසේක.

7. "ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටිසේක. එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්

වහන්සේට, "ස්වාමීනි, (මෙහි 5 (ii) සහ 13 (ii) යෙදිය යුතුයි) කියයි. (ii) "ස්ත්‍රිය තථාගතයන් වහන්සේ විසින් වදාළ ධර්ම විනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිකවූ පැවිද්ද ලබන්නේ නම් යෙහෙකැයි" කීසේක.

8. "ආනන්දය, (මෙහි 2 (i) යෙදිය යුතුයි.) දෙවනුවත් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ආනන්දය, (මෙහි 2 (i) යෙදිය යුතුයි.) තුන්වෙනුවත් මෙහි (මෙහි 2 (i) යෙදිය යුතුයි.) (මෙහි 7 (ii) යෙදිය යුතුයි.)

9. "ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ස්ත්‍රියට තථාගතයන් වහන්සේ විසින් වදාළ ධර්ම විනයෙහි ගිහිගෙන් නික්ම අනගාරික සංඛ්‍යාත පැවිද්ද අන් අයුරකින් ඉල්වන්නෙම් නම් යෙහෙකැයි' සිතුසේක.

10. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි, (ii) ස්ත්‍රිය තථාගතයන් වහන්සේ විසින් වදාළ ධර්ම විනයෙහි ගිහිගෙන් නික්ම අනගාරික සංඛ්‍යාත පැවිද්ද ලබා සෝවාන් ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ ප්‍රත්‍යක්ෂ කරන්ට (iii) සුදුසුදැයි" ඇසූසේක. "ආනන්දය, (මෙහි 10 (ii) යෙදිය යුතුයි.) සුදුසුය.

11. "ඉදින් ස්වාමීනි, (මෙහි 10 (ii) යෙදිය යුතුයි.) සුදුසු නම් ස්වාමීනි මහාප්‍රජාපතී ගෝතමිය භාග්‍යවතුන් වහන්සේට බොහෝ උපකාරීය, මවගේ සහෝදරිය ය. මව කළුරිය කළාට පසු භාග්‍යවතුන් වහන්සේව දැඩි කළාය, පොෂ්‍ය කළාය, කිරි පෙවීය, ස්වාමීනි ස්ත්‍රිය තථාගතයන් වහන්සේ විසින් වදාළ ධර්ම විනයෙහි ගිහිගෙන් නික්ම අනගාරික නම් ශාසනයෙහි පැවිද්ද ලබන්නේ නම් යෙහෙකැයි" සැළකළසේක.

"ආනන්දය, ඉදින් මහා ප්‍රජාපතී ගෝතමී තොමෝ ගරු කරුණු අටක් පිළිගන්නේ නම් එයම ඇයට උපසම්පදාව වේවා.

12. "උපසම්පදා වී වර්ෂ සියයක් ගිය භික්ෂුණිය විසින් ද එදා උපසම්පදා වූ මහණහට වැඳීම, දැක හුනස්නෙන් නැගිටීම

දොහොත් මුදුන්දීම, ගෞරවය, කටයුතුය (ii) මේ ධර්මය සත්කාර කොට, ගරුකොට, පූජාකොට ජීවිතාන්තය දක්වා නො ඉක්මවිය යුතුය.

13. "භික්ෂුණිය විසින් භික්ෂූන් නැති ආවාසයක වස් නො විසිය යුතුය. (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) අඩ මසකට වරක් භික්ෂුණිය විසින් භික්ෂු සංඝයාගෙන් පොහොය විචාරීමද අවවාද ඇසීමට පැමිණීමද කටයුතුයි. (මෙහි 12 (ii) ඡේදය යෙදිය යුතුයි.) වස් විසූ භික්ෂුණිය විසින් භික්ෂු භික්ෂුනී සංඝයා කෙරෙහි කරුණු තුනකින් පවාරණය කටයුතුය.

"දැකීමෙන් හෝ ඇසීමෙන් හෝ මුත වශයෙන් දැයි යන තුනෙනි. (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) ගරු ඇවතකට පැමිණි භික්ෂුනිය විසින් සංඝයා දෙ කොටස වෙත පක්ෂයක් පුරණ හික්මීමෙහි හැසිරිය යුතුයි. (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) දෙ වර්ෂයක් ධර්ම සයෙක්හි හික්මෙන ලද හික්මීම් ඇතිව හික්මෙන්නිය විසින් දෙ වැදෑරුම් සංඝයා කෙරෙහි උපසම්පදාව සෙවිය යුතුය. (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) කිසියම් කරුණකින් භික්ෂුණිය විසින් භික්ෂූන්ට ආක්‍රොශ නො කළ යුතුය. පරිභව නොකළ යුතුය. (මෙහි 12 (ii) ඡේදය යෙදිය යුතුයි.)

14. "ආනන්දය, අද පටන් භික්ෂුනීන්ට භික්ෂූන් කෙරෙහි වචන මාර්ගය වැසූයේය. භික්ෂූන්ට භික්ෂුනීන් කෙරෙහි වචන මාර්ගය නො වැසුවේය. (මෙහි 12 (ii) යෙදිය යුතුය) ආනන්දය, ඉදින් මහා ප්‍රජාපතී ගෝතමීතොමෝ මේ ගරු ධර්ම අට පිළිගනීද එයම ඇයට උපසම්පදාව වේවා."

15. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගරු ධර්ම අට උගෙන මහා ප්‍රජාපතී ගෝතමිය යම් තැනෙක්හිද එහි වැඩිසේක. වැඩ මහා ප්‍රජාපතී ගොතමියට "ගොතමිය, (ii) ඉදින් ඔබ බර පොරොන්දු අටක් පිළිගන්නේ නම් එයම තොපට උපසම්පදාව වේ.

16. (මේ ඡේදය 12 ඡේදය මෙනි. (මෙහි 15 (ii) යෙදිය යුතුයි.)

17. "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයෙනි, ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළදරු වූයේ, තරුණ වූයේ, සැරසීම ස්වභාවකොට ඇත්තේ හිස පටන් නෑවේ, උපුල් මල් මාලාවක් හෝ ඉද්ද මල් මාලාවක් හෝ කෝඹු මල්මාලාවක් හෝ ලබා දෑතින් පිළිගෙන උත්තමාංගය වූ හිසෙහි පිහිටුවන්නේය, ස්වාමීනි එසේම මම දිවි ඇතිතාක් නො ඉක්ම විය යුතුවූ මේ ගරු ධර්ම අට පිළිගන්නෙමි."

18. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටිසේක. එකත් පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට, "ස්වාමීනි, මහා ප්‍රජාපතී ගෞතමිය විසින් දිවි ඇතිතාක් නොඉක්ම විය යුතුයයි අෂ්ට ගරු ධර්මයන් පිළිගන්නා ලදී.

19. "ආනන්දය, ඉදින් ස්ත්‍රිය තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද ධර්ම විනයෙහි පැවිද්ද නොලැබූයේ නම් 'ආනන්දය බ්‍රහ්මචර්ය බොහෝ කල් සිටියේ වන්නේය. වර්ෂ දහසක් සද්ධර්මය පිහිටන්නේය, ආනන්දය යම් දවසෙක සිට ස්ත්‍රිය තථාගතයන් වහන්සේ විසින් වදාළ ධර්ම විනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය නම් සස්නෙහි පැවිදි වූයේද ආනන්දය දැන් බ්‍රහ්මචර්යය (ශාසනය) බොහෝ කල් නොපවත්නේය. ආනන්දය දැන් වර්ෂ පන්සියයක් සද්ධර්මය සිටින්නේය.

20. 'ආනන්දය, යම්සේ යම්කිසි කුලයක ස්ත්‍රීහු වැඩිවෙත්ද පුරුෂයන් අඩුවෙත්ද, ඒ කුල ගම් පහරණ සොරුන් විසින් පහසුවෙන් මැඩපැවැත්විය යුත්තාහු වෙත්, ආනන්දය එසේම යම් ධර්ම විනයෙක්හි ස්ත්‍රිය ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිද්ද ලබයි ද ඒ බ්‍රහ්මචර්යය (ශාසනය) බොහෝ කල් නොපවත්නේ වේ.

21. "ආනන්දය, සම්පූර්ණවූ හැල් කෙතෙහි සුදු ඇට ඇති රෝගය පහළවේද, එසේ ඒ හැල් කෙත බොහෝ කල්

නොපවත්නේවේ. ආනන්දය, එසේම ස්ත්‍රිය යම් ධර්ම විනයෙක්හි පැවිද්ද ලබයිද, ඒ ධර්ම විනය බොහෝ කල් නො පවතී. ආනන්දය යම්සේ වැඩුනු උක්හේනක මඤ්ජෙට්ඨික නම් රොගය වැඩෙයිද එසේ ඒ උක් කෙත බොහෝ කලක් නො පවතී. ආනන්දය එසේම යම් ධර්ම විනයෙක්හි ස්ත්‍රිය ගිහිගෙයින් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදිවේද, ඒ බ්‍රහ්මචර්යය (ශාසනය) බොහෝ කල් නොපවත්නේවේ. ආනන්දය පුරුෂයෙක් යම්සේ මහත් විලකට මුලින් ජලය නොඉක්මීම පිණිස ඉවුරක් බඳින්නේය. ආනන්දය එසේම මා විසින් ප්‍රථම කොට භික්ෂුනීන්ට දිවිහිම්කොට නොඉක්මවිය යුතුවූ 'ගරු ධර්ම අටක් පනවන ලදී."

**2. භික්ඛු නොවාදක සූත්‍රය:-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලාමහනුවර මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වසන සේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක් හිද එහි පැමිණි සේක. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටි සේක. එකත් පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්වහන්සේට "ස්වාමීනි, කරුණු කීයකින් යුක්තවූ මහණ තෙමේ භික්ෂුනීන්ට අවවාද දෙන්නියක් වශයෙන් සම්මත කළ යුතු දැයි" ඇසූසේක.

2. "ආනන්දය, කරුණු අටකින් යුක්තවූ මහණතෙම භික්ෂුනීන්ට අවවාද කරන්නෙකැයි සම්මත කළ යුතුය. කිනම් අටකින්ද යත් (ii) ආනන්දය, මේ ශාසනයෙහි මහණ තෙම සිල්වත් වේද, ප්‍රාතිමොක්ෂ සංවරශීලයෙන් සංවරව වාසය කරයිද, පිළිපැදීමෙන් හා හැසිරීමෙන් යුක්තවූයේ ස්වල්පමාත්‍ර වරදෙහි බිය දක්නා සුළුවූයේ, ශික්ෂාපද සමාදන්ව රකීද, බහුශ්‍රැත වේද, අසන ලද්ද දරන ලද්දේ රැස්කරණ ලද්දේ වේද.

3. ඔහුට ප්‍රාතිමොක්ෂ දෙක (භික්ෂු භික්ෂුනී) විස්තර වශයෙන් කට පාඩම් වෙත්ද, බෙදන ලද්දාහුවෙත්ද පවත්වනලද්දාහු වෙත්ද සූත්‍ර වශයෙන් අනුව්‍යඤ්ජන වශයෙන් තීන්දු කරණ ලද්දාහු වෙත්ද, යහපත් වචන ඇත්තේ වේද යහපත්

ප්‍රකාශ කිරීම් ඇත්තේ, ඍජුව කියන කෙළ තොලු නොවූ අර්ථය ප්‍රකාශ කරන නාගරික වචනයෙන් යුක්තවූයේ වේද, භික්ෂුණී සංඝයා දැහැමි කථාවෙන් කරුණු සහිතව පෙන්වන්නට, සමාදන් කරවන්නට තෙදගන්වන්නට, සතුටු කිරීමට, දක්ෂවේද, බොහෝ සෙයින් භික්ෂූන්ට ප්‍රිය වේද මනවඩන්නේ වේද, භාග්‍යවතුන් වහන්සේ උදෙසා පැවිදි නොවූ කහ වස්ත්‍ර අඳින මොහු පෙර ගරු ඇවතකට නො පැමිණි කෙනෙක් වන්නේද.

4. "විසිවස් ඇත්තේ හෝ විසි වසට වැඩිවූයේ වේද, ආනන්දය මේ කරුණු අටින් යුක්තවූ මහණ තෙම භික්ෂූන්ට අවවාද කරන්නෙකු වශයෙන් සම්මත කළ යුතුයි."

3. **ගොතමියොවාද සූත්‍රය**:- 1. (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.) "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මට භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා හුදකලාවූ අප්‍රමාදවූ, කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව කාය ජීවිත දෙක්හි අපෙක්ෂා රහිතව වාසය කරන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ මට සංක්ෂේපයෙන් ධර්ම දෙශනා කරණු ලැබේවා."

2. "ගොතමිය. මේ ධර්මයෝ තෘෂ්ණාව පිණිස පවතිත්. තෘෂ්ණා ක්ෂයවීම පිණිස නොවෙත්යයි නුඹ යම්ධර්මයක් දන්නෙහිද?"

"එක්වීම පිණිස පවතිත්, වියොගය පිණිස නොපවතිත්, රැස්කිරීම පිණිස පවතිත්, රැස් නොකිරීම පිණිස නොපවතිත් මහා තෘෂ්ණාව පිණිස පවතිත්, ආශානැති බව පිණිස නොපවතිත්, නොසෑහීම පිණිස පවතිත් සෑහීම පිණිස නොපවතිත්, පිරිස් සහිත බව පිණිස පවතිත්, විවේකය පිණිස නොපවතිත්, කුසීත බව පිණිස පවතිත්, වීර්යය පිණිස නොපවතිත්, දුකසේ පොෂ්‍ය කටයුතු බවට පැමිණෙත්, සුවසේ පොෂ්‍ය කටයුතු බවට නොපැමිණෙත් යයි යම් ධර්ම කෙනෙක් දනිත් නම් ගොතමිය ඒකාන්තයෙන් මේ ධර්මය නොවේ. මේ විනය නොවේ, මේ ශාස්තෘ ශාසනය නොවේයයි යයි දැන ගනුව."

3. (මෙහි 2 මෙති ඡෙදයේ "පවතිත්" යන්නට "නොපවතිත්" කියාද, "නොවෙත් යන්නට" "වෙත්" කියාද වෙනස්කර යොදා

ගත යුතුයි.) ඒකාන්තයෙන් මේ ධර්මය මේ විනය මේ ශාස්තෘ ශාසනයයි දරව."

4. ව්‍යග්ඝපජ්ජ (දීඝජානු) සූත්‍රයː- 1. එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කෝලිය ජනපදයෙහි කක්කරපත්ත නම් කෝලියයන්ගේ නියම්ගමක් වේද, එහි වාසය කරන සේක. එකල්හි වනාහි දීඝජානු නම් කොලිය පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසක සිටියේය. එකත් පසක සිටි දීඝජානු කොලිය පුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේට "ස්වාමීනි, ගිහි වූ කාමභෝගීවූ අපි පුත්‍රයන්ගේ පීඩාවෙන් වසමු. කසීසළු හා සඳුන් පාවිච්චි කරමු. මල්ගඳ විලවුන් දරමු. රන් රිදී මසු කහවනු දරමු. ස්වාමීනි, ඒ අපට යම් ධර්ම කෙනෙක් මෙලොව යහපත පිණිසද, මෙලොව සැප පිණිසද, පරලොව සැප පිණිසද වන්නාහු නම් එසේ ධර්ම දෙශනා කරනු ලැබේ."

2. "ව්‍යග්ඝපජ්ජය, මේ ධර්ම සතරක් කුලපුත්‍රයාට මෙලොව යහපත පිණිස පවතිත්. කිනම් සතරක්දයත්? උත්සාහ සම්පත්තිය, ආරක්ෂා සම්පත්තිය, යහපත් මිතුරන් ඇතිබව, ආදායමට සමාන ජීවිකාව යන සතරයි.

3. "ව්‍යග්ඝපජ්ජය, උත්සාහ සම්පත්තිය කවරේද? ව්‍යග්ඝපජ්ජය, මේලෝකයෙහි කුලපුත්‍ර තෙමේ යම් කර්මාන්තයකින් ගොවිතැනින් හෝ වෙළඳාමෙන් හෝ, ගව පාලනයෙන් හෝ, ධනුශිල්පයෙන් හෝ රාජ පුරුෂ භාවයෙන් හෝ ශිල්පයකින් හෝ ජීවිකාව කරයිද, එහි දක්ෂ වූයේ කම්මැලි නොවූයේ, ඊට උපාය සිතීමෙන් යුක්තවූයේ වේද, කරන්නට සුදුසු වූයේ, නියම කිරීමට සුදුසුවූයේ වේද, ව්‍යග්ඝපජ්ජය, මේ උත්සාහ සම්පත්තියයි කියනු ලැබේ.

4. "ව්‍යග්ඝපජ්ජය, ආරක්ෂාසම්පත්තිය කවරේද, ව්‍යග්ඝපජ්ජය, මේ ලෝකහෙි කුලපුත්‍රයාට උට්ඨානවීර්යයෙන් ලත්, අතේ ශක්තියෙන් පුරුදු ඩහදිය සෙලවුන, ධාර්මිකවූ දැහැමින් ලත් යම් වස්තු කෙනෙක් ඇද්ද, ඒ වස්තු කිමෙක්ද, රජවරු නොගන්නාහු නම් සොරු නොගන්නාහු නම්, ගින්නෙන්

විනාශ නොවන්නේ නම් දියට ගසාගෙන නොයන්නාහු නම් බලෙන් දඩ වශයෙන් නොගන්නාහුනම් යෙහෙකැයි ආරක්ෂා කරයි, ව්‍යග්ඝපජ්ජය, මේ ආරක්ෂා සම්පදාවයයි කියනු ලැබේ.

5. "ව්‍යග්ඝපජ්ජය, කළ්‍යාණ මිත්‍ර බව කවරේද, ව්‍යග්ඝපජ්ජය, මේ ලෝකයෙහි කුලපුත්‍රතෙම යම් ගමක හෝ නියම්ගමක වාසය කරයිද ඒ යම් ශ්‍රද්ධාවෙන් යුත්, ශීලයෙන් යුත්, ත්‍යාගයෙන් යුත්, ප්‍රඥාවෙන් යුත්, ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ වැඩිමහළු ස්වභාව ඇති තරුණයෙක් හෝ වැඩිමහළු ස්වභාව ඇති වැඩිමහල්ලෙක් හෝ වෙත්ද, ඔවුන් සමග ආශ්‍රය කරයිද, සාකච්ඡා කරයිද කථාවට පැමිණෙයිද,

6. "යම්බඳු ශ්‍රද්ධාවන්තයන්ගේ ශ්‍රද්ධාවට අනුව හික්මෙයිද යම්බඳු සිල්වතුන්ගේ ශීලයට අනුව හික්මෙයිද, යම්බඳු ත්‍යාගවන්තයන්ගේ ත්‍යාගයට අනුව හික්මේද, යම්බඳු ප්‍රඥාවන්තයන්ගේ ප්‍රඥාවට අනුව හික්මේද ව්‍යග්ඝපජ්ජය, මේ කල්‍යාණමිත්‍ර භාවයයි,

7. "ව්‍යග්ඝපජ්ජය, සමජීවික බව කවරේද, ව්‍යග්ඝපජ්ජය මේ ලොකයෙහි කුලපුත්‍රතෙම වස්තූන්ගේ අයද දැන වස්තූන්ගේ වැයද දැන සමව දිවිපවත්වාද, වැඩි වියදම් නැත්තේද, ඉතා අඩු වියදම්, නැත්තේද මෙසේ මාගේ අය වැය මැඩගෙන සිටී. මාගේ වැය, අය මැඩගෙන නොසිටී කියායි.

8. "ව්‍යග්ඝපජ්ජය වෙළෙන්දෙක් හෝ වෙළෙන්දෙකුගේ අතවැස්සෙක් හෝ තරාදියක් ගෙන මෙපමණකින් පහත් වූයේය මෙපමණකින් උස් වූයේයයි දනියි. ව්‍යග්ඝපජ්ජය මෙසේ කුලපුත්‍ර තෙම වස්තූන්ගේ අයද දැන වස්තූන්ගේ වැයද දැන, ඉතා වැඩිත් නැතිව ඉතා අඩුත් නැතිව සමව ජීවිකාව කරයි. මෙසේ මාගේ අය, වැය මැඩගෙන සිටී. වැය, අය මැඩගෙන නොසිටීයයි සමව ජීවිකාව කරයිද,

9. "ව්‍යග්ඝපජ්ජය, ඉදින් මේ කුලපුත්‍රතෙමේ අය අඩු වූයේම මහත් ජීවිකාවක් කරයි. ඔහුට මේ කුලපුත්‍රතෙමේ දිඹුල් කන්නාක්මෙන් භොගයන් කායයි කියන්නෝ වෙත්. ව්‍යග්ඝපජ්ජය, ඉදින් මේ කුලපුත්‍රතෙමේ බොහෝ අය ඇත්තේම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දුකසේ ජීවිකාව කරයිද, මේ කුලපුත්‍රතෙම වස්තුව තිබෙද්දීත් නොකාමැරෙන්නේයයි, කියන්නෝ වෙත් ව්‍යග්ඝපජ්ජය යම්කලෙක පටන් මේ කුලපුත්‍රතෙම වස්තුන්ගේ අයද දැන වැයද දැන සමව ජීවිකාව කරයිද, ඉතාවැඩියත් ඉතා අඩුවත් නොකරයිද මෙසේ මාගේ අය, වැය මැඩගෙන සිටී වැයම අය මැඩගෙන නොසිටියි. ව්‍යග්ඝපජ්ජය, මේ සම ජීවිකාවයි.

**10.** "ව්‍යග්ඝපජ්ජය, මෙසේ උපන්නාවූ භොගයන්ට විනාශමුඛ සතරක් වෙත්, ස්ත්‍රීන් කෙරෙහි ලොල් බව, සුරාවෙහි ලොල් බව, සූදුවෙහි ලොල් බව, පවිටු මිත්‍රයන් පවිටු යහලුවන්, පවට නැමීම ඇති බව යන සතරයි. ව්‍යග්ඝපජ්ජය, යම්සේ මහත් විලක පිරෙන දොරටු සතරක් වෙත්ද, බසින දොරටු සතරක් වෙත්ද, පුරුෂයෙක් තෙම එහි පිරෙන දොරටු ඇද්ද එය වසන්නේය. පිටවෙන මුඛවෙත්ද ඒවා හරින්නේය. වර්ෂාවද යහපත් කොට නොවසින්නේය. ව්‍යග්ඝපජ්ජය මෙසේ ඒ විල පිරිහීමක්ම කැමති විය යුතුය වැඩීමක් කැමැති නොවිය යුතුය.

**11.** "ව්‍යග්ඝපජ්ජය, එසේම (මෙහි 8 ඡෙදය යෙදිය යුතුයි) ව්‍යග්ඝපජ්ජය, මෙසේ උපන් භොගයන්ගේ අය මාර්ග සතරක් වෙත්. ස්ත්‍රී ලොල් නොවීම, සුරා ලොල් නොවීම, සූදුවෙහි ලොල් නොවීම යහපත් මිත්‍රයන් ඇති බව යහපත් යහළුවන් ඇති බව යහපතුන්ට නැමෙන බව යන සතරයි. ව්‍යග්ඝපජ්ජය, මහත් විලක පිරෙන දොර සතරක් වෙත්ද, පිටවෙන දොරටු සතරක් ඇද්ද ඒවා වසත්ද, වර්ෂාවද යහපත්සේ ධාරා හෙලයිද, ව්‍යග්ඝපජ්ජය, එසේ මහත් විලේ වැඩීමක්ම කැමති විය යුතුයි. පිරිහීමක් කැමැති නොවිය යුතුය. ව්‍යග්ඝපජ්ජය, එසේම මෙසේ උපන් වස්තුන්ට මෙසේ පිරෙන දොරටු සතරක් වෙත්ද, ස්ත්‍රී ලොල් නොවේද, සුරා ලොල් නොවේද, සූදුවෙහි ලොල් නොවේද, යහපත් මිත්‍රයන් ඇතිබව යහපත් යහළුවන් ඇතිබව යහපතුන්ට නැමෙන බව යන සතරයි. ව්‍යග්ඝපජ්ජය, මේ ධර්ම සතර කුල පුත්‍රයාට මෙලොව හිත පිණිස පවතිත්, මෙලොව සැප පිණිස පවතිත්.

**12.** "ව්‍යග්ඝපජ්ජය, ධර්ම සතරක් කුල පුත්‍රයාට පරලොව හිත පිණිස පරලොව සැප පිණිස පවතිත්. කිනම් සතරක්ද

යත්, ශ්‍රද්ධා සම්පත්තිය, සීල සම්පත්තිය, ත්‍යාග සම්පත්තිය, ප්‍රඥා සම්පත්තිය යන සතරය ව්‍යග්ඝපජ්ජය, ශ්‍රද්ධා සම්පත්තිය කවරේද, ව්‍යග්ඝපජ්ජය, මේ ලොකයෙහි කුල පුත්‍රතෙම ශ්‍රද්ධාවත් වේද, තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය අදහයිද? ඒ භාග්‍යවත් (මෙහි 3 අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ (i) ආහුණෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) ව්‍යග්ඝපජ්ජය, මේ ශ්‍රද්ධා සම්පත්තිය යයි කියනු ලැබේ.

13. "ව්‍යග්ඝපජ්ජය, සීල සම්පත්තිය කවරේද? ව්‍යග්ඝපජ්ජය, මේ ලොකයෙහි කුල පුත්‍රතෙම සතුන් මැරීමෙන් (අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ 4 පණ්ණාසකයේ 18 වර්ගයේ 21 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි) ව්‍යග්ඝපජ්ජය, මේ සීල සම්පත්තියයි කියනු ලැබේ.

"ව්‍යග්ඝපජ්ජය, ත්‍යාග සම්පත්තිය කවරේද? ව්‍යග්ඝපජ්ජය, මේ ලොකයෙහි කුල පුත්‍රතෙම ත්‍යාගය පිණිස මුදන ලද්දේ සෝදන ලද අත් ඇත්තේ පරිත්‍යාගයෙහි යෙදුනේ ඉල්වීමට සුදුසුවූයේ බෙදා දීමෙහි ඇලුනේ වේද ව්‍යාග්ඝපජ්ජය, මේ ත්‍යාග සම්පත්තියයි කියනු ලැබේ.

14. "ව්‍යග්ඝපජ්ජය, ප්‍රඥා සම්පත්තිය කවරේද? ව්‍යග්ඝපජ්ජය, මේ ලොකයෙහි කුල පුත්‍රතෙම ප්‍රඥාවත් වේද ආර්යවූ තියුණු අවබොධ ඇති මනාකොට දුක් ක්ෂය කිරීමට යන දියුණුවේ ප්‍රතිඵලය වූ නුවණින් යුක්තවූයේ වේද, ව්‍යග්ඝපජ්ජය, මේ ප්‍රඥා සම්පත්තියයි කියනු ලැබේ.

"ව්‍යග්ඝපජ්ජය, මෙකරුණු සතර කුල පුත්‍රයාට පරලොව හිත පිණිස පවතී.

15. (1) "අප්‍රමාද ඇත්තේ කර්මාන්ත කරණ තන්හි උට්ඨාන වීර්යයෙන් යුක්තවූයේද කර්මාන්ත විධාන කිරීමෙන් යුක්තවූයේ වේද, ජීවිකා වෘත්තිය සමකොට පවත්වාද රැස් කරණ ලද්දක් රක්ෂා කෙරේද, ශ්‍රද්ධා ඇත්තේද, ශීලයෙන් යුක්තවූයේද වචන දන්නේද පහවූ මසුරු මල ඇත්තේද පරලෙව්හි විපාක දීම් ඇති සැපයට හෙතුවූ මාර්ගය නිතර පිරිසිදු කෙරේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

(2) "මෙසේ මේ අට කාරණයෝ ගෘහ වාසයෙන් යුක්තවූ සැදැහැවතා හට දෙලොව සැප ගෙන දෙන්නේ යයි සත්‍ය නම් ඇති ශාස්තෘන් වහන්සේ විසින් වදාරණ ලද්දාහුය. මෙසේ ගෘහස්ථයන්ට ත්‍යාගය තෙමේද මේ ආත්මයෙහි සැප පිණිසද පරලොව සැප පිණිසද පවතී. මේ සෙසු පිනද ප්‍රකාරයෙන් වැඩේ යයි වදාළ සේක."

**5. උජ්ජය සූත්‍රය:-** 1. "ඉක්බිති උජ්ජය බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක් හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාව අවසන් කොට එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි උජ්ජය බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට භවත් ගෞතමයන් වහන්ස අපි පිටරට යනු කැමැත්තම්හ. ඒ අපට පින්වත් භාග්‍යවතුන් වහන්සේ යමක් අපට බොහෝ කලක් මෙලොව හිත පිණිසද මෙලොව සැප පිණිසද පරලොව හිත පිණිසද පරලොව සැප පිණිසද වන්නාහු නම් එසේ බණ වදාරණ සේක්වා."

2-13. (මේ ඡෙද මේ වර්ගයේ 4 සූත්‍රයේ 2-13 ඡෙද මෙන් වෙත්. "ව්‍යග්ඝපජ්ජය, යන්නට "බ්‍රාහ්මණය" කියා යොදා ගතයුතුයි.)

**6. කාමාධිවචන සූත්‍රය:-** 1. "මහණෙනි, බිය යන මෙය කාම වස්තූන්ට හා ක්ලෙශයන්ට නමකි. මහණෙනි, දුක යන මෙය කාමවස්තූන්ට හා ක්ලෙශයන්ට නමකි, මහණෙනි, රෝගය යන මෙය කාමවස්තූන්ට හා ක්ලෙශයන්ට නමකි. මහණෙනි, ගෙඩිය යනු මෙය කාමවස්තූන්ට හා ක්ලෙශයන්ට නමකි. මහණෙනි, හුලය යන මෙය කාම වස්තූන්ට හා ක්ලෙශයන්ට නමකි. මහණෙනි, බැම්ම යනු මෙය කාමවස්තූන්ට හා ක්ලෙශයන්ට නමකි. මහණෙනි, මඩ යන මෙය කාමවස්තූන්ට හා ක්ලෙශයන්ට නමකි මහණෙනි, ගර්භය යන මෙය කාමවස්තූන්ට හා ක්ලෙශයන්ට නමකි.

2. "මහණෙනි, කුමක් හෙයින් භය යන මෙය කාමයන්ට නම් වේද, මහණෙනි, යම් හෙයකින් කාමරාගයෙහි ඇලුනාවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

මේ තෙමේ ආශාවෙන් බැඳුනේ මෙලොව බියෙන්ද නොමිදෙයි, පරලොව බියෙන්ද නොමිදෙයි, මේ නිසා භය යනු කාමයන්ට නමකි.

3-10 (මේ ඡේදය 2 ඡේදය මෙහි එහි "භය" වෙනුවට දුක, රොගය, ගෙඩිය, හුල, බැම්ම, මඩ, ගර්භය, යන වචන යොදා ඒ ඒ ඡේදය යොදා ගත යුතුයි.)

11. 1 "සිත් නැති ගැනීම බියද, දුඃඛයද, රොගයද, ගණ්ඩයද හුලද, මඩද, යන මොහුද, සංසයද, පංකයද, යන දෙකද කාමයෝයයි කියනු ලැබෙත්.

2. "පස්කම් සැපයට බැස්සේ නැවත භවයෙහි ඉපදීම පිණිස යෙයි. මහණ තෙම යම් කාලයෙක්හි කෙලෙස් තවන වීර්ය ඇත්තේ සම්‍යක් ප්‍රඥාව නොහරීද එබඳුවූ ඒ මහණ තෙම යා නොහැකිවූ මේ කාම මඩ ඉක්මවා ජාති ජරාවන්ගෙන් යුක්තවූ කම්පාවන්නාවූ ප්‍රජාව බලයි."

7. **පඨම ආහුණෙය්‍ය අට්ඨධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු අටකින් යුක්තවූ මහණ තෙම (මෙහි, 3 අංගුත්තර නිකායේ ආහුණෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 6 (ii) (iii) ඡේදය යෙදිය යුතුයි.)

2. "කිනම් අටකින්ද යත්? (මෙහි මේ වර්ගයේ 2 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි)

3. "යහපත් අය සහාය කොට ඇති, යහපත් අයට නැමෙන කළ්‍යාණ මිත්‍රයෙක් වේද, (ii) යහපත් පෙනීමෙන් යුත් සම්‍යක් දෘෂ්ටිකයෙක් වේද ශ්‍රෙෂ්ඨ සිතට අයත් මේ ආත්මයෙහි අප්‍රමාදය ඇති ධ්‍යාන සතර පහසුවෙන් ලබන්නේවේද, නිදුකින් ලබන්නේවේද, සැපෙන් ලබන්නේවේද,

"නානා ප්‍රකාර පෙරවිසූ කඳ පිළිවෙළ සිහිකරයි. එනම් එක් ජාතියක්ද (අංගුත්තර නිකායේ දුතිය, පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 4, 5, 6, 7 ඡේදය යෙදිය යුතුයි) පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවා සිටි නුවණින් (1 අංගුත්තර නිකායේ

දුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 8, 9, 10, 11 ඡේද යෙදිය යුතුයි.) වාසයකරයි.

"මහණෙනි මේ කරුණු අටින්වූ මහණ තෙම (මෙහි (3. අංගුත්තර නිකායේ, ආහුණෙය්‍ය වර්ගයේ 10. සූත්‍රයේ 6. (ii) (iii) යෙදිය යුතුයි)

8. **දුතිය ආහුණෙය්‍ය අට්ඨධම්ම සූත්‍රයː-** 1 "මහණෙනි, කරුණු අටකින් යුක්තවූ මහණ තෙම (මෙහි 3 අංගුත්තර නිකායේ, ආහුණෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 6. (ii) (iii) ඡේදය යෙදිය යුතුයි.)

2. "කිනම් අටකින්ද යත්? "මහණෙනි, මේ ලොකයෙහි මහණතෙම (6 වර්ගයේ 2 සූත්‍රයේ 2 (ii) ඡේදය මෙහි යෙදිය යුතුයි.) බහුශ්‍රැතවේද, පටන්ගත් වීර්ය ඇත්තෙක් වේද, ශක්ති ඇත්තේ කුශල ධර්මයන්හි වැඩ බහා නොතැබූයේද ප්‍රාන්ත සෙනාසන භජනය කරණ ආරඤ්ඤිකාංගය රක්නෙක් වේද, නොඇලීම හා ඇලීම ඉවසන්නේ වේද උපන් නො ඇලීම මැඩ මැඩ වාසය කරයි බිය හා භයානක අරමුණ ඉවසන්නේ වේද උපන් බිය හා භයානක අරමුන මැඩ මැඩ සිටී.

3. (මෙහි මේ වර්ගයේ 7 සූත්‍රයේ 3 (ii) සිට සියලු ඡේද යොදාගත යුතුයි)

9. **උජ්ජුභූතට්ඨපුග්ගල සූත්‍රයː-** 1. "මහණෙනි, ආහුණෙය්‍යවූ පාහුණෙය්‍යවූ දක්ෂිනාර්හවූ ඇදිලි බැඳීමට සුදුසුවූ මේ පුද්ගලයෝ අටදෙනකි.

2. "කිනම් අට දෙනෙක්ද යත්? සොවාන් පුද්ගලයාය සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමට පටන්ගත් පුද්ගලයාය, සකෘදාගාමි පුද්ගලයාය. සකෘදාගාමී ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමට පටන්ගත් පුද්ගලයාය, අනාගාමී පුද්ගලයාය, අනාගාමී ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමට පටන්ගත් පුද්ගලයාය, රහත් පුද්ගලයාය. රහත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමට පටන්ගත් පුද්ගලයාය යන අට දෙනයි. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3\. 1. "පිළිපන්නාවූ සතර දෙනද ඵලයෙහි සිටි සතර දෙනද යන ප්‍රඥාවෙන් හා ශීලයෙන් යුත් මේ සංඝ තෙමේ ඍජුය.

2\. "දන්දෙන්නාවූ පින් කැමති ප්‍රාණීවූ, කෙලෙස් විපාක දෙන්නාවූ, කුශල් කරන්නාවූ, මනුෂ්‍යයන්ට සංඝයා කෙරෙහි දෙන ලද දෙය මහත් ඵලවේ."

10\. **සමුක්කට්ඨ'ට්ඨ පුග්ගල සූත්‍රයඃ-** 1-2. (මේ ඡේද මේ වර්ගයේ 9 සූත්‍රයේ 1. 2. ඡේද මෙන් වෙත්.) පිළිපන්නාවූ සතර දෙනද ඵලයෙහි පිහිටි සතර දෙනද යන අෂ්ටාර්ය පුද්ගල කෙනෙක් වෙත්ද මේ සංඝ තෙමේ සත්වයන්ට උත්කෘෂ්ටවේ.

3\. (මේ ඡේදය 9 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

**ගොතමී වර්ගය නිමි.**

---

## 7. චාපාල වර්ගය

11\. **ලාභිච්ඡා සූත්‍රයඃ-** 1. "මහණෙනි, ලොකයෙහි මේ පුද්ගලයෝ අටදෙනෙක් ඇත්තාහ.

2\. "කවර අට දෙනෙක්ද යත්? (ii) මහණෙනි, මේ ශාසනයෙහි උසස් විවේකයෙන් යුතු නිදහස් පැවතුම් ඇති භික්ෂුවට ලාභය ලැබීම පිණිස අදහසක් උපදියි. (iii) හෙතෙම ලාභය පිණිස ගැටෙයි. වෑයම් කරයි. නැගිටියි. ලාභය පිණිස ගැටෙන්නාවූ වෑයම් කරන්නාවූ නැගිටින්නාවූ (iv) ඔහුට ලාභය නූපදියි. (v) හෙතෙම ඒ අලාභයෙන් ශොකවෙයි. ක්ලාන්ත වෙයි. වැළපෙයි. ලෙහි අත ගසා හඬයි. සිහිමුළා බවට පැමිණෙයි. මහණෙනි, මේ භික්ෂුව ලාභයට ආශා ඇතිව වාසය කෙරේද (vi) ලාභය පිණිස නැගිටීද ගැටේද වෑයම් කෙරේද ලාභය නොලබන්නේ ශොක කෙරෙයි. වැළපෙයි. (vi) හෙතෙම සද්ධර්මයෙන් හෙවත් ශාසනයෙන්ද චුතවූයේ යයි කියයි.

3\. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) (ii) ඔහුට ලාභය උපදියි. හෙතෙම ඒ ලාභයෙන් මත්වෙයි. විශෙෂයෙන් මත්වෙයි.

ප්‍රමාදයට පැමිණෙයි. මහණෙනි, මේ භික්ෂුව ලාභයට ආශා ඇතිව වාසය කෙරේද ලාභය පිණිස නැගිටීද ගැටේද වෑයම් කෙරේද ලාභය ඇති මදය හෙවත් ලාභයෙන් මත් ගතිය ඇති ප්‍රමාදය ඇති (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

**4.** (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) (ii) හෙතෙම ලාභය පිණිස (නොනැගිටියි. නොගැටෙයි. වෑයම් නොකරයි. (iii) ලාභය පිණිස නොනැගිටින්නාවූ නොගැටෙන්නාවූ වෑයම් නොකරන්නාවූ (iii) (මෙහි 2 (iv) ඡේද යෙදිය යුතුයි) (iv) ලාභය පිණිස නොනැගිටීද, නොගැටේද, වෑයම්නොකෙරේද, ලාභය නැති ශොක ඇති වැළපීම ඇති (මෙහි 2 (vi) යෙදිය යුතුයි)

**5.** (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) හෙතෙම ලාභය පිණිස (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) ලාභය පිණිස නොනැගිටින්නාවූ (මෙහි 3 (ii) යෙදිය යුතුයි. (ii) මෙහි 4 (ii) යෙදිය යුතුයි) ලාභය ඇති මදය ඇති ප්‍රමාදය ඇති (මෙහි 2 (vii) යෙදිය යුතුයි.)

**6.** (මෙහි 2 (ii) (iii) (iv) යෙදිය යුතුයි) (ii) හෙතෙම ඒ අලාභයෙන් ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවැළපෙයි. ළෙහි අත් ගසා නොහඬයි. සිහිමුළා බවට නොපැමිණෙයි. මහණෙනි, මේ භික්ෂුව ලාභයට ආශා ඇතිව වාසය කෙරේද (iii) ලාභය පිණිස නැගිටීද, ගැටේද වෑයම් කෙරේද, ලාභය නැත්තේ ශොක නැත්තේ වැළපීම නැත්තේ සද්ධර්මයෙන් හෙවත් ශාසනයෙන්ද චුත නොවූයේයයි කියයි.

**7.** (මෙහි 2 (ii) (iii) යෙදිය යුතුයි) ඔහුට ලාභය උපදියි. (ii) හෙතෙම ඒ ලාභයෙන් මත් නොවෙයි. විශෙෂයෙන් මත් නොවෙයි. ප්‍රමාදයට නොපැමිණෙයි. (iii) මහණෙනි, මේ භික්ෂුව ලාභයට ආශා ඇතිව වාසය කෙරේද, ලාභය පිණිස නැගිටීද, ගැටේද, වෑයම් කෙරේද, ලාභය ඇති මදය නැති ප්‍රමාදය නැති හෙතෙම සද්ධර්මයෙන්ද චුත නොවූයේ යයි කියයි.

8 (මෙහි 2 (ii) යෙදිය යුතුයි) හෙතෙම ලාභයෙන් නොනැගිටියි. නොගැටෙයි. වෑයම් නොකරයි ලාභය පිණිස

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොනැගිටින්නාවූ නොගැටෙන්නාවූ වෑයම් නොකරන්නාවූ ඔහුට ලාභය නූපදියි. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ලාභය පිණිස නොනැගිටීද නොගැටේද වෑයම් නොකෙරේද, ලාභය නැති ශොක නැති වැළපීම් නැති හෙතෙම සද්ධර්මයෙන්ද චුත නොවූයේ යයි කියයි.

**9.** (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) හෙතෙම ලාභය පිණිස නොනැගිටියි. ගැටෙයි. වෑයම් නොකරයි. ලාභය පිණිස නොනැගිටින්නාවූ නොගැටෙන්නාවූ වෑයම් නොකරන්නාවූ ඔහුට ලාභය උපදියි. (මෙහි 7 (ii) යෙදිය යුතුයි) මහණෙනි, මේ භික්ෂුව ලාභයට ආශා ඇතිව වාසය කෙරේද ලාභය පිණිස නොනැගිටීද, නොගැටේද, වෑයම් නොකෙරේද, ලාභ ඇති මත්ගතිය නැති ප්‍රමාදය නැති හෙතෙම සද්ධර්මයෙන්ද චුත නොවූයේයයි කියයි. මහණෙනි, මේ පුද්ගලයෝ අටදෙන ලොකයෙහි ඇත්තාහ."

**12. අලමත්තනො සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්ම සයකින් යුක්තවූ භික්ෂුව තමහට යොග්‍ය වෙයි. අනුන්ටද යොග්‍ය වෙයි.

**2.** (i) "කවර සයකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව කුශල ධර්මයන්හි වහා චිත්ත සමාධියට පැමිණේද ධර්මයන් සිතෙහි දරන්නේ වේද දරණලද ධර්මයන්ගේ අර්ථ පරීක්ෂා කෙරේද, අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදුනේ වේද (ii) යහපත් වචන ඇත්තේ යහපත් වචන කථා කරන්නේ පුරවැසි වචනයෙන් යුක්ත වූයේ වේද, විසුරුනා කෙළතොලු නොවූ අර්ථය ඇඟවීමෙන් සබ්‍රහ්මචාරීන්ට විස්තර කරන්නෙක් සමාදන් කරවන්නෙක් තෙද ගන්වන්නෙක් සතුටු කරවන්නෙක් වූයේද, (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

**3.** "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ භික්ෂුව තමහට යොග්‍යය, අනුන්ටද යොග්‍යය.

**4.** (මේ ඡෙදය 2 ඡෙදය මෙනි.) (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

**5.** "මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූ භික්ෂුව තම හට යොග්‍යයි. අනුන්ට අයොග්‍යයි.

**6.** (මෙහි 2 (i) යෙදිය යුතුයි.) යහපත් වචන නැත්තේ යහපත් වචන කථා නොකරන්නේ පුරවැසි වචනයෙන් යුක්ත නොවූයේ වේද විසුරුන කෙළතොලු නොවූ අර්ථය ඇඟවීමෙන් සබ්‍රහ්මචාරීන්ට විස්තර කරන්නෙක් සමාදන් කරවන්නෙක් තෙද ගන්වන්නෙක් සතුටු කරන්නෙක් නොවූයේද (මෙහි 5 ඡේදය යෙදිය යුතුයි.)

**7.** "මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූ භික්ෂුව අනුන්ට යොග්‍යයි. තමහට අයොග්‍යයි.

**8.** "කවර සතරකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව වහා කුශල ධර්මයන්හි චිත්ත සමාධියට පැමිණේද, ඇසූ ධර්මයන් සිතෙහි දරන්නෙක් වේද, දරණ ලද ධර්මයන්ගේ අර්ථ පරීක්ෂා නොකරන්නෙක් වේද, අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි නොයෙදුනේ වේද (මෙහි 2 (ii) සහ 7 ඡේදය යෙදිය යුතුයි.)

**9.** "මහණෙනි, ධර්ම තුනකින් යුක්තවූ භික්ෂුව තමහට යොග්‍යය අනුන්ට අයොග්‍යය.

**10.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කුශල ධර්මයන්හි වහා චිත්ත සමාධියට නොපැමිණේද, ඇසූ ධර්මයන් සිතේ දරන්නෙක් වේද, දරණ ලද ධර්මයන්ගේ අර්ථ පරීක්ෂා කරන්නේ වේද, අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදුනේ වේද, යහපත් වචන නැත්තේ යහපත් වචන කථා නොකරන්නේ පුරවැසි වචනයෙන් යුක්ත නොවූයේ වේද විසුරුන කෙළතොලු නොවූ අර්ථය ඇඟවීමෙන් සබ්‍රහ්මචාරීන්ට විස්තර කරන්නෙක් සමාදන් කරවන්නෙක් තෙද ගන්වන්නෙක් සතුටු කරන්නෙක් නොවූයේද, (මෙහි 9 ඡේදය යෙදිය යුතුයි.)

**11.** "මහණෙනි, ධර්ම තුනකින් යුක්තවූ භික්ෂුව තම හට යොග්‍යය අනුන්ට අයොග්‍යය.

**12.** "කවර තුනකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව කුශල ධර්මයන්හි වහා චිත්ත සමාධියට නොපැමිණේද

ඇසූ ධර්මයන් සිත්හි දරා ගන්නෙක් වේද, දරණ ලද ධර්මයන්ගේ අර්ථ පරීක්ෂා කරන්නෙක් වේද අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි නොයෙදුනේ වේද, (මෙහි 2 (ii) සහ 11 ඡේදය යෙදිය යුතුයි.)

13. "මහණෙනි, ධර්ම දෙකකින් යුක්තවූ භික්ෂුව තමහට යොග්‍යය අනුන්ට අයොග්‍යය,

14. "කවර දෙකකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම කුශල ධර්මයන්හි වහා චිත්ත සමාධියට නොපැමිණේද ඇසූ ධර්මයන් සිත්හි දරා නොගනීද දරණ ලද ධර්මයන්ගේ අර්ථ පරීක්ෂා නොකෙරේද අර්ථය දැන ධර්මය දැන ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙහි නොයෙදුනේ වේද (මෙහි 2 (ii) සහ 13 ඡේදය යෙදිය යුතුයි.)

13. **චිත්තසණ්ඨාපන සූත්‍රය**:- 1. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත් පසෙක සිටියාවූ 'ඒ භික්ෂු තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කළේය. "ස්වාමීනි, යහපති මට භාග්‍යවතුන් වහන්සේ කෙටිවූ ධර්මයක් දෙශනා කෙරේවා! මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ඒ ධර්මයක් අසා තනිවූයේ වෙන්වූයේ අප්‍රමාදවූයේ කෙලෙස් තවන වීර්ය ඇත්තේ සිතින් දුරු කළ ආත්ම භාවය ඇතිව වාසය කරන්නෙමි කියා යි.

මෙපරිද්දෙන්ම මේ ශාසනයෙහි ඇතැම් හිස් පුරුෂයෝ මටම ආරාධනා කරත්. ධර්මය දෙශනා කළ කල්හි මාම ලුහු බැඳිය යුතුයයි සිතත්. මට භාග්‍යවතුන් වහන්සේ කොටින් ධර්මය දෙශනා කෙරේවා, මට සුගතයන් වහන්සේ කොටින් ධර්මය දෙශනා කෙරේවා, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මයේ අර්ථය මම දැනගන්නෙම් නම් ඉතා යෙහෙක. මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මයට දායාද කරුවෙක් වන්නෙම් නම් ඉතා යෙහෙක." යනුයි.

4. "එහෙයින් මෙහිලා භික්ෂුව, ඔබ විසින් මෙසේ හික්මිය යුතුයි. (ii) අධ්‍යාත්මිකවූම හිත එකග වන්නේද,

තැන්පත්වන්නේද, උපන් ලාමක අකුශල ධර්මයෝ හිත පැතිර නොපවතිත් යනුයි. මහණෙනි, ඔබ විසින් මෙසේ හික්මිය යුතුයි. (ii) යම් හෙයකින් ඔබගේ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

3. "මා විසින් මෛත්‍රී චෙතො විමුක්තිය පුරුදු කරන්නේද බහුල වශයෙන් වඩන්නේද ඉතා පුහුණු කරන්නේද, අඩිතාලමක් මෙන් ස්ථිරව පුහුණු කරන්නේද, නොනැගිට පුරුදු කරන්නේද, බලවත්සේ ආරම්භ කරන්නේද යනුයි. (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

4. "මහණ, යම් හෙයකින් ඔබ විසින් මේ සමාධිය මෙසේ වඩන ලද්දේ මෙසේ බහුල වශයෙන් පුරුදු කරණ ලද්දේද ඉන්පසු මහණ ඔබ මේ සමාධිය විතර්ක සහිතව විචාර සහිතව වඩව. අවිතර්කව විචාරයෙන් පමණක් වඩව. විතර්ක රහිතව විචාර සහිතව වඩව. ප්‍රීතිය සහිතව වඩව. ප්‍රීතිය රහිතව වඩව, සැපය සහිතව වඩව. උපෙක්ෂා සහිතව වඩව, මහණ, යම් හෙයකින් ඔබ මේ සමාධිය වඩන ලද්දේ මනාකොට පුරුදු කරණ ලද්දේ වේද, ඉන්පසු (මෙහි 2 (ii) යෙදිය යුතුයි)

5. "මා විසින් කරුණා චෙතො විමුක්තිය-මුදිතා චෙතො විමුක්තිය-උපෙක්ෂා චෙතො විමුක්තිය-පුරුදු කරන්නෙක් වන්නේය. බහුල වශයෙන් වඩන්නෙක් වන්නේය. බොහෝ පුරුදු කරන්නෙක් වන්නේය, අඩිතාලමක් මෙන් ස්ථිරව පුරුදු කරන්නෙක් වන්නේය, නොනැගිට පුරුදු කරන්නෙක් වන්නේය, බලවත්සේ ආරම්භ කරන්නෙක් වන්නේය යනුයි. (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

6. "මහණ, යම් හෙයකින් ඔබ විසින් මේ සමාධිය වඩන ලද්දේ වේද, බහුල වශයෙන් පුරුදු කරණ ලද්දේ වේද, ඉන්පසු මහණ ඔබ මේ සමාධිය විතර්ක සහිතව විචාර සහිතව වඩව, විතර්ක රහිතව විචාර රහිතව වඩව, ප්‍රීතිය සහිතව වඩව, ප්‍රීතිය රහිතව වඩව, සැපය සහිතව වඩව, උපෙක්ෂා සහිතව වඩව, මහණ, යම් හෙයකින් ඔබ විසින් මේ සමාධිය වඩන ලද්දේවේද, මනාසේ පුරුදු කරණ ලද්දේ වේද, (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

**7.** "කෙලෙස් තවන වීර්ය ඇත්තේ මහා ප්‍රඥා ඇත්තේ සිහි ඇත්තේ ලොකයෙහි දැඩි ලොභය හා දොම්නස හික්මවා කයෙහි කය අනුව බලමින් වාසය කරන්නෙමි කියායි. (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

**8.** "යම් හෙයිකින් මහණ ඔබ විසින් මේ සාමාධිය වඩන ලද්දේද බහුල වශයෙන් පුරුදු කරණ ලද්දේද, ඉන්පසු මහණ ඔබ මේ සමාධිය විතර්ක සහිතව විචාර සහිතව වඩව, විතර්ක රහිතව විචාර රහිතව වඩව, ප්‍රීතිය සහිතව වඩව, ප්‍රීතිය රහිතව වඩව, සැපය සහිතව වඩව, උපෙක්ෂා සහිතව වඩව මහණ, යම් හෙයකින් වනාහි ඔබ විසින් මේ සමාධිය මෙසේ වඩන ලද්දේ වේද, මනාකොට පුරුදු කරණ ලද්දේ වේද, (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

**9.** "කෙලෙස් තවන වීර්ය ඇත්තේ මනා ප්‍රඥා ඇත්තේ සිහි ඇත්තේ ලොකයෙහි දැඩි ලෝභය හා දොම්නස දුරු කොට වෙදනාවන්හි-සිතෙහි-ධර්මයෙහි ධර්මය අනුව බලමින් වාසය කරන්නෙමි යනු වෙනි. (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

**10.** "යම්හෙයකින් මහණ ඔබ විසින් මේ සමාධිය මෙසේ වඩන ලද්දේ වේද, බහුල වශයෙන් පුරුදු කරණ ලද්දේ වේද, ඉන්පසු මහණ ඔබ මේ සමාධිය විතර්ක සහිතව විචාර සහිතව වඩව. විතර්ක රහිතව විචාර රහිතව වඩව, විතර්ක රහිතව විචාර සහිතව වඩව, විතර්ක රහිතව විචාර රහිතව වඩව, ප්‍රීතිය සහිතව වඩව, ප්‍රීතිය රහිතව වඩව, සැපය සහිතව වඩව, උපෙක්ෂා සහගතව වඩව, මහණ යම් හෙයකින් ඔබ මේ සමාධිය වඩන ලද්දේ වේද මනාකොට පුරුදු කරණ ලද්දේ වේද ඉන්පසු මහණ, ඔබ යම් යම් කරුණකින් යේනම් පහසු පරිදිම යව, යම් යම් තැනක සිටීනම් පහසු පරිදිම සිටුව, යම් යම් තැනක හිඳගන්නෙහි නම් පහසු පරිදිම හිඳගනුව, යම් යම් තැනක නිදන්නෙහි නම් පහසු පරිදිම නිදාගනුව" යනුයි.

**11.** භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අවවාදයෙන් අවවාද කරණ ලද ඒ භික්ෂුව ඉක්බිති අස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ ප්‍රදක්ෂිණා කොට ගියේය.

12. ඉක්බිති (හෙතෙම) ඒ භික්ෂුව තනිවූයේ වෙන්වූයේ, අප්‍රමාදවූයේ කෙලෙස් තවන වීර්ය ඇත්තේ සිතින් දුරු කළ ආත්මභාවය ඇතිව වසන්නේ ටික කලකින්ම යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදි වෙද්ද බඹසර කෙළවර කොට ඇති උතුම්වූ රහත් ඵලය මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන එයට පැමිණ වාසය කෙළේය. ජාතිය (ඉපදීම) ක්ෂය කරණ ලදී. බ්‍රහ්මචරියාව වැස නිමවන ලදී. කටයුතු කොට නිමවන ලදී. කෙලෙසුන් නැසීම පිණිස තවත් භාවනාවක් නැතැයි දැන ගත්තේය. ඒ භික්ෂුව රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.”

14. **ගයාසීස සූත්‍රයः-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ගයාගම ආසන්න ගයාව ඉස්මත්තේ වැඩ වාසය කරණ සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ භික්ෂූන් ඇමතූසේක. ‘ස්වාමීනියි’ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

2. “මහණෙනි, මම සම්බොධියෙන් පෙර බුදුනුවූයේ බොධිසත්වවූයේ ආලොකය වනාහි හඳුනමි. රූප නොදකින්නෙමි. මහණෙනි, ඒ මට මේ අදහස විය. ‘ඉදින් වනාහි මම ආලොකය හඳුනන්නෙම් නම්, රූපයන් දකින්නෙම් නම්, මෙසේ මාගේ මේ ඥාන දර්ශනය පිරිසිදු වන්නේය’ යනුවෙනි. (ii) මහණෙනි, ඒ මම මෑත කාලයක ප්‍රමාද නුවූයේ කෙලෙස් තවන වීර්ය ඇත්තේ සිතින් දුරු කළ ආත්මභාව ඇතිව වාසය කරන්නේ ආලොකයද හඳුනමි. රූපයන්ද දකිමි. (iii) ඒ දේවතාවන් සමග නොසිටිමි. කථා නොකරමි. සාකච්ඡාවට නොපැමිණෙමි.

3. (i) “ඒ මට මේ අදහස විය. ‘ඉදින් වනාහි මම ආලොකය හඳුනන්නෙම් නම් රූපයන්ද දකින්නෙම් නම් ඒ දෙවතාවන් සමග සිටින්නෙම් නම්, කථා කරන්නෙම් නම් සාකච්ඡාවට පැමිණෙම් නම් (ii) මෙසේ මාගේ මේ ඥාන දර්ශනය ඉතා පිරිසිදු වන්නේය’ යනුවෙනි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි) ඒ

දෙවතාවන් සමග සිටිමි. කථා කරමි. සාකච්ඡාවට පැමිණෙමි. මේ දෙවතාවෝ අසවල් අසවල් දෙවනිකායිකයෝ යයි නොදනිමි.

4. (මෙහි 3 (i) යෙදිය යුතුයි.) මේ දෙවතාවෝ අසවල් අසවල් දෙවනිකායිකයෝයයි දැනගන්නෙම් නම් මෙසේ මාගේ ඥාන දර්ශනය පිරිසිදු වන්නේය’ යනුවෙනි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඒ දෙවතාවන් සමග සිටිමි. කථා කරමි. සාකච්ඡාවට පැමිණෙමි. මේ දෙවතාවෝ අසවල් අසවල් දෙව නිකායිකයෝ යයි දනිමි. මේ දෙවතාවෝ මේ කර්මයාගේ විපාකයෙන් මෙයින් චුතව එහි උපන්නාහු යයි නොදනිමි. මේ දෙවතාවෝ මේ කර්මයාගේ විපාකයෙන් මෙයින් චුතව එහි උපන්නාහුයයි දනිමි. මේ දෙවතාවෝ මෙසේ ආහාර ඇත්තෝ මෙසේ සුවදුක් විඳින්නෝයයි නොදනිමි. මේ දෙවතාවෝ මෙසේ ආහාර ඇත්තෝ මෙසේ සුවදුක් විඳින්නෝයයි දනිමි. මේ දෙවතාවෝ මෙසේ දීර්ඝායුෂ ඇත්තෝ මෙසේ චිරස්ථායිකයෝයයි නොදනිමි. මේ දේවතාවෝ මෙසේ දීර්ඝායුෂ ඇත්තෝ මෙසේ චිරස්ථායිකයෝයයි දනිමි. ඉදින් මම මේ දෙවතාවන් සමග පෙර වාසය කළේද නොකළේදැයි නොදනිමි.

5. (මෙහි 3 (i) යෙදිය යුතුයි.) මේ දෙවතාවෝ අසවල් අසවල් දෙවනිකායිකයෝයයි දන්නෙම් නම් මේ දෙවතාවෝ මේ කර්මයාගේ විපාකයෙන් මෙයින් චුතව එහි උපන්නාහයි දන්නෙම් නම් මේ දෙවතාවෝ මෙසේ ආහාර ඇත්තෝ මෙසේ සුවදුක් විඳින්නෝයයි දන්නෙම් නම් මේ දෙවතාවෝ මෙසේ දීර්ඝායුෂ ඇත්තෝ මෙසේ චිරස්ථායිකයෝයයි දන්නෙම් නම් ඉදින් මම මේ දෙවතාවන් සමග පෙර වාසය කළේද නොකළේදැයි දැනගන්නෙම් නම් මෙසේ මාගේ ඥාන දර්ශනය ඉතා පිරිසිදු වන්නේය යනුවෙනි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි) ඒ දෙවතාවන් සමග සිටිමි. කථා කරමි. සාකච්ඡාවට පැමිණෙමි. මේ දෙවතාවෝ අසවල් අසවල් දේවනිකායිකයෝ යයි දනිමි. මේ දෙවතාවෝ මේ කර්මයාගේ විපාකයෙන් මෙයින් චුතව එහි උපන්නාහයි දනිමි. මේ දෙවතාවෝ මෙසේ ආහාර ඇත්තෝ

මෙසේ සුවදුක් විඳින්නෝයයි දනිමි. මේ දෙවතාවෝ මෙසේ දීර්ඝායුෂ ඇත්තෝ මෙසේ චිරස්ථායිකයෝයයි දනිමි. ඉදින් මම මේ දෙවතාවන් සමග පෙර වාසය කළේද නොකළේදැයි දනිමි. මහණෙනි, මෙසේ අෂ්ට පරිවෘත්තයක් ඇති උතුම් ඥාන දර්ශනය යම්තාක් කල් මා තුළ පහළ නොවීද ඒතාක් දෙවියන් මරුන් බඹුන් සහිත ලොකයෙහි මහණ බමුණන් සහිත සත්ව වර්ගයා අතරෙහි මේ නිරුත්තර සම්‍යක් සම්බොධිය ලැබූයෙමියි ප්‍රතිඥා නොකෙළෙමි.

6. "එහෙත් මහණෙනි, යම් කලෙක මෙසේ අෂ්ටපරිවෘත්තයක් ඇති උතුම් ඥාන දර්ශනය මට පහළවීද මහණෙනි, ඉන්පසු දෙවියන් මරුන් බඹුන් සහිත ලොකයෙහි මහණ බමුණන් සහිත සත්ව වර්ගයා අතරෙහි මම නිරුත්තර සම්‍යක් සම්බොධිය ලැබීමියි ප්‍රතිඥා කළෙමි. මා තුළ දර්ශන ඥානය පහළවිය. මගේ චිත්ත විමුක්තිය වෙනස් කළ නොහැක. මේ කෙළවර අත්බවයි. දැන් මතු භවයක් නැත."

15. **අභිභායතන සූත්‍රයː-** 1. "මහණෙනි, මේ කෙලෙස් මැඩපැවැත්වූ ස්ථාන අටක් වෙති.

2. "කවර අටක්ද යත්? අධ්‍යාත්මයෙහි රූප සංඥා ඇති එක් පුද්ගලයෙක් ස්වල්පවූද සුවර්ණවූද දුර්වර්ණවූද පිටත රූපයන් දකියි. (ii) ඒවා මැඩ දනිමි. දකිමියි මෙසේ සංඥාව ඇත්තේ වෙයි. (iii) මේ ප්‍රථම කෙලෙස් මැඩපවත්වන ස්ථානයයි.

3. "අධ්‍යාත්මයෙහි රූප සංඥා ඇති එක් පුද්ගලයෙක් පිටත අප්‍රමාණවූ සුවර්ණවූද දුර්වර්ණවූද රූපයන් දකියි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි) මේ දෙවෙනි කෙලෙස් මැඩපවත්වන ස්ථානයයි.

4. "අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇති එක් පුද්ගලයෙක් පිටත ස්වල්පවූ සුවර්ණ දුර්වර්ණවූ රූපයන් දකියි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි) මේ තුන්වෙනි කෙලෙස් මැඩපවත්වන ස්ථානයයි. අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇති එක් පුද්ගලයෙක් පිටත අප්‍රමාණවූ සුවර්ණ දුර්වර්ණවූ රූපයන් දකියි. ඒවා මැඩ දනිමි.

දකිමියි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සතරවන කෙලෙස් මැඩපවත්වන ස්ථානයයි.

5. "අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇති එක් පුද්ගලයෙක් පිටත නිල්වූ නීලවර්ණ දැකුම් ඇති නීලවර්ණ ආලොකය ඇති රූපයන් දනියි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මේ පස්වෙනි කෙලෙස් මැඩපවත්වන ස්ථානයයි.

6. "අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇති එක් පුද්ගලයෙක් පිටත කහවූ කහවර්ණ දැකුම් ඇති කහවර්ණ ආලොකය ඇති රූපයන් දකියි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි) මේ සයවෙනි කෙලෙස් මැඩපවත්වන ස්ථානයයි.

7. "අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇති එක් පුද්ගලයෙක් පිටත ලේවූ ලේවර්ණ දැකුම් ඇති ලේවර්ණ ආලොකය ඇති රූපයන් දකියි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි) මේ සත්වැනි කෙලෙස් මැඩපවත්න ස්ථානයයි.

8. "අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇති එක් පුද්ගලයෙක් පිටත සුදුවූ සුදුවර්ණ දැකුම් ඇති සුදුවර්ණ ආලොකය ඇති රූපයන් දකියි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මේ අටවැනි කෙලෙස් මැඩපවත්වන ස්ථානයයි. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි)

**16. අට්ඨ විමොක්ඛ සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ මිදීම් අටක් වෙති.

2. "ඒ අට කවරහුද? රූප ඇත්තා රූපයන් දකියි. මේ පළමුවන මිදීමයි. අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇත්තේ පිටත රූපයන් දකියි. මේ දෙවන මිදීමයි. ශුභාන්තවූම මිදීම ඇත්තෙක් වෙයි. මේ තුන්වන මිදීමයි. සර්වප්‍රකාරයෙන් රූපසංඥාව ඉක්මවා පටිඝ සංඥාව අස්තංගමකොට නානත්ත සංඥාවන්ගේ මෙනෙහි නොකිරීමෙන් අනන්තවූ ආකාශයයි ආකාශානඤ්චායතනයට පැමිණ වාසය කරයි. මේ සතරවැනි මිදීමයි. සර්වප්‍රකාරයෙන් ආකාශානඤ්චායතනය දුරුකොට අනන්තවූ විඤ්ඤානයයි විඤ්ඤානඤ්චායතනයට පැමිණ වාසය කරයි. මේ පස්වන මිදීමයි. සර්වප්‍රකාරයෙන් විඤ්ඤානඤ්චායතනය දුරු කොට කිසිවක් නැතැයි

ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මේ සයවැනි මිදීමයි. සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මේ සත්වන මිදීමයි. සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වාසය කරයි. මේ අටවන මිදීමයි මහණෙනි, මේ මිදීම් අට වෙති."

**17. අනරිය වොහාර සූත්‍රය:-** 1. "මහණෙනි, මේ අනාර්ය ව්‍යවහාරයෝ අටෙකි.

2. "කවර අටක්ද යත්? නොදැකි දෙයෙහි දැක්කේ යයි කියන්නාවූ, නොඇසූ දෙයෙහි ඇසුවේයයි කියන්නාවූ, පඤ්චෙන්ද්‍රියයන්ගෙන් ස්පර්ශ නොකළ දේ ස්පර්ශ කළේයයි කියන්නාවූ, නොදැනගත් දෙයෙහි දැනගත්තේයයි කියන්නාවූ, දැකි දෙයෙහි නොදැක්කේයයි කියන්නාවූ, ඇසූදෙයෙහි නොඇසුවේයයි කියන්නාවූ, පඤ්චෙන්ද්‍රියයන්ගෙන් ස්පර්ශ කළ දෙයෙහි ස්පර්ශ නොකෙළේයයි කියන්නාවූ, දැනගත් දෙයෙහි දැන නොගත්තේයයි කියන්නාවූ යන මේ කරුණු අට මහණෙනි, අනාර්ය ව්‍යවහාරයෝ වෙති."

**18. අරිය වොහාර සූත්‍රය:-** 1. "මහණෙනි, මේ ආර්ය ව්‍යවහාරයෝ අටෙකි.

2. ඒ අට කවරහුද? නොදැකි දෙයෙහි නොදැක්කේයයි කියන්නාවූ, නොඇසූ දෙයෙහි නොඇසුවේයයි කියන්නාවූ පඤ්චෙන්ද්‍රියයන්ගෙන් ස්පර්ශ නොකළ දෙයෙහි ස්පර්ශ නොකළේයයි කියන්නාවූ, නොදැනගත් දෙයෙහි නොදැනගත්තේ යයි කියන්නාවූ, දැකි දෙයෙහි දැක්කේයයි කියන්නාවූ, ඇසූ දෙයෙහි ඇසුවේයයි කියන්නාවූ, පඤ්චෙන්ද්‍රියයන්ගෙන් ස්පර්ශ කළ දෙයෙහි ස්පර්ශ කළේයයි කියන්නාවූ, දැනගත් දෙයෙහි දැනගත්තේයයි කියන්නාවූ යන අට මහණෙනි, ආර්ය ව්‍යවහාරයෝ වෙති."

**19. අට්ඨ පරිසා සූත්‍රය:-** 1. "මහණෙනි, මේ පිරිස් අටෙකි.

2. "කවර අටක්ද? ක්ෂත්‍රිය පිරිස, බ්‍රහ්මණ පිරිස, ගෘහපති පිරිස, ශ්‍රමණ පිරිස, චාතුර්මහා රාජික පිරිස, තාවතිංශ පිරිස, මාර පිරිස, බ්‍රහ්ම පිරිසය යනුයි.

3. "මහණෙනි, මම නොයෙක් සියගණන් ක්ෂත්‍රිය පිරිස වෙත පැමිණ (ii) එහිද මා හිඳගත් බැව්ද කථාකළ බැව්ද සාකච්ඡාවට පැමිණ සිටි බැව්ද එහි ඔවුන්ගේ පැහැය යම් බඳුද මාගේ පැහැයද එබඳුම වෙයි යනුද මම දනිමි. ඔවුන්ගේ හඬ යම්බඳුද මාගේ හඬද එබඳුම වෙයි. දැහැමි කථාවෙන් දක්වමි. සමාදන් කරවමි. තෙද ගන්වමි. සතුටු කරවමි. (iii) මේ තෙමේ කවරෙක්ද කථා කරන්නාවූ මා දෙවියෙක්ද මිනිසෙක් දැයි නොදනිත්. දැහැමි කථාවෙන් දක්වා සමාදන් කරවා තෙද ගන්වා සතුටු කරවා අතුරුදහන් වෙමි. අතුරුදහන්වූ මා මේ අතුරුදහන්වූයේ කවරෙක්ද දෙවියෙක්ද මිනිසෙක් දැයි නොදනිත්. මහණෙනි, මම නොයෙක් සිය ගණන් ක්ෂත්‍රිය පිරිස දනිමි. බ්‍රාහ්මණ පිරිස, ගෘහපති පිරිස ශ්‍රමණ පිරිස, චාතුර්මහා රාජික පිරිස, තාවතිංශ පිරිසද,

4. "බ්‍රහ්ම පිරිසද වෙත පැමිණ (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) කථා කරන්නාවූ මා දෙවියෙක්ද මිනිසෙක් දැයි නොදනිත්. දැහැමි කථාවෙන් දක්වා සමාදන් කරවා තෙද ගන්වා සතුටු කරවා අතුරුදහන් වෙමි. අතුරුදහන්වූ මා මේ අතුරුදහන් වූයේ කවරෙක්ද දෙවියෙක්ද, මිනිසෙක් දැයි නොදනිත්. මහණෙනි, මේ අට පිරිස් වෙති."

**20. ආයු සංඛාරොස්සජන (හෝ) භූමිචාල හෙතු සූත්‍රයඃ-** 1. "එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විශාලා නගර ආසන්න මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වාසය කරණසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන විශාලා නගරයෙහි පිඬු පිණිස හැසුරුන සේක. විශාලාවෙහි පිඬු පිණිස හැසිර සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුනේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ඇමතූ සේක. "ආනන්දය, හිඳගන්නා ඇතිරිල්ල ගන්න චාපාල චෛත්‍යස්ථානය යම් තැනකද, දිවා විහරණය

පිණිස එහි යන්නෙමු.” “එසේය, ස්වාමීනියි” ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට ප්‍රති වචන දී, වැඩ හිඳින ඇතිරිල්ල රැගෙන භාග්‍යවතුන් වහන්සේට පිටුපසින් ගියේය.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ චාපාල චෛත්‍ය ස්ථානය යම්තැනකද, එතැන්හි වැඩිසේක. එසේ වැඩ පැනවූ අස්නෙහි වැඩ සිටිසේක. වැඩහිඳ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඇමතූසේක.

3. “ආනන්දය, විශාලාව සිත් කලුය, උදෙනී චෛත්‍යස්ථානය සිත් කලුය. ගොතමක චෛත්‍යස්ථානය සිත් කලුය බහුපුත්‍ර චෛත්‍යස්ථානය සිත් කලුය, සත්තම්බක චෛත්‍ය ස්ථානය සිත් කලුය, සාරන්දද චෛත්‍යස්ථානය සිත්කලුය, චාපාල චෛත්‍යස්ථානය සිත් කලුය, ආනන්දය, ‘යම් කිසිවකු සතර ඍද්ධි පාදයෝ වඩනාලද්දාහු බහුල වශයෙන් පුරුදු කරණ ලද්දාහු බොහෝ පුරුදු කරණ ලද්දාහු අඩි තාලමක් මෙන් කරණ ලද්දාහු නොනැගිට පුරුදු කරණ ලද්දාහුවෙත්ද, ආනන්දය, හෙතෙම ඉදින් කැමති නම් කල්පයක් හෝ ඊට වැඩිකාලයක් සිටිය හැකිය “ආනන්දය, තථාගතයන් වහන්සේ විසින් සතර (කැමැත්ත, සිත, වීර්යය, විමසීම) ඍද්ධි පාදයෝ වඩන ලදී. බහුල වශයෙන් පුරුදු කරණ ලදී. බොහෝ පුරුදු කරණ ලදී. අඩි තාලමක් මෙන් කරණ ලදී. ආනන්දය, තථාගතයන් වහන්සේ කැමති වන්නේ නම් කල්පයක් හෝ එයට වැඩියක් කල් සිටිය හැකිය.”

4. “මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඕලාරික නිමිති (ලොකු කරුණු දැක්වීම්) කරද්දී ඕලාරික ඕභාසයන් (ලොකු එළිදරවු කිරීම්) කරද්දී ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට අවබොධ කරගන්ට නොහැකි විය. උන්වහන්සේ මාරයා විසින් වසනලද සිත් ඇති බැවින් “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කල්පයක් සිටින සේක්වා ස්වාමීනි, සුගතයන් වහන්සේ කල්පයක් සිටින සේක්වා. බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස ලෝකයාට අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස යයි භාග්‍යවතුන් වහන්සේට ආරාධනා නොකෙළේය.

(5) "භාග්‍යවතුන් වහන්සේ දෙවෙනි වරටද තුන්වෙනි වරටද ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඇමතූසේක. (මෙහි 3-4 ඡෙදය යෙදිය යුතුයි.)

3. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඇමතූසේක. "ආනන්දය, යන්න, ඔබ දැන් කාලය දැනගන්න" "එසේය ස්වාමීනියි" ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ප්‍රති වචන දී, අස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ ප්‍රදක්ෂිණා කොට භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි එක්තරා ගසක් මුල හිඳ ගත්හ.

4. "ඉක්බිති පාපීවූ මාරතෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ බැහැර ගොස් ටික වේලාවකින් භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය. (ii) "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දැන් පිරිනිවන් පාන සේක්වා. සුගතයන් වහන්සේ පිරිනිවන් පාන සේක්වා. ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවෙන්නට කාලයයි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ විසින් මේ වචනය ප්‍රකාශ කරණ ලද්දේ නොවේද, (iii) එනම්, 'යම්තාක් මාගේ භික්ෂු ශ්‍රාවකයෝ (iv) ව්‍යක්තවූ විනීතවූ විශාරදවූ පැමිණි නිවණ ඇති බහුශ්‍රැතවූ ධර්මධරවූ ධර්මානුධර්ම ප්‍රතිපත්තිවූ නිවැරදි පිළිවෙත් ඇති ධර්මය අනුව හැසිරෙන්නෝ නොවෙද්ද, ස්වකීය ආචාර්යවරයාගෙන් ඉගෙණ ප්‍රකාශ නොකරද්ද දෙශනා නොකරද්ද නොපනවද්ද, නොතබද්ද, විවෘත නොකරද්ද, ප්‍රකට නොකරද්ද, උපන් අන්‍ය වාද, ධර්මානුගතව මනාසේ නිග්‍රහ කොට ප්‍රාතිහාර්ය සහිතව ධර්මය දෙශනා නොකරද්ද, ඒ තාක් මම පිරිනිවන් නොපාන්නෙමියි" යනුවෙනි. (v) ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේගේ භික්ෂු ශ්‍රාවකයෝ (vi) ව්‍යක්තවූ විනීතවූ විශාරදවූ පැමිණි නිවණ ඇති බහුශ්‍රැතවූ ධර්මධරවූ ධර්මානුධර්ම ප්‍රතිපන්නවූ නිවැරදි ප්‍රතිඥාව ඇති ධර්මය අනුව හැසිරෙන්නෝ වෙති. ස්වකීය ආචාර්යවරයාගෙන් ඉගෙණ ප්‍රකාශ නොකර දෙශනා කෙරෙති. පණවති, තබති, විවෘත කෙරෙති. ප්‍රකට කෙරෙති. උපන් අන්‍ය වාද ධර්මානුගතව මනාසේ නිග්‍රහ කොට ප්‍රාතිහාර්ය සහිතව ධර්මය දෙශනා කෙරෙති.

**5.** මෙහි 4 (ii) යෙදිය යුතුයි.) එනම් යම්තාක් මාගේ භික්ෂුනී ශ්‍රාවිකාවෝ (මෙහි 4 (iv) යෙදිය යුතුයි.) ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේගේ භික්ෂුනී ශ්‍රාවිකාවෝ (මෙහි 4 (iv) යෙදිය යුතුයි.) යම්තාක් මාගේ උපාසක ශ්‍රාවකයෝ (මෙහි 4 (vi) යෙදිය යුතුයි)

**6.** (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) එනම් යම්තාක් මාගේ උපාසක ශ්‍රාවකයෝ (මෙහි 4 (iv) යෙදිය යුතුයි.) ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේගේ උපාසක ශ්‍රාවකයෝ (මෙහි 4 (vi) යෙදිය යුතුයි.)

**7.** (මෙහි 4 (ii) යෙදිය යුතුයි) එනම් යම්තාක් මාගේ උපාසිකා ශ්‍රාවිකාවෝ (මෙහි 4 (iv) යෙදිය යුතුයි.) ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේගේ උපාසිකා ශ්‍රාවිකාවෝ (මෙහි 4 (vi) යෙදිය යුතුයි.)

**8.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පාන සේක්වා ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ වචන ප්‍රකාශ කරන ලද්දේ නොවේද? යම්තාක් මාගේ මේ බ්‍රහ්මචරියාව සමෘද්ධවූයේ නොවේද, විස්තර සහිතවූයේ නොවේද, බොහෝ දෙනාට අයත්වූයේ නොවේද, ප්‍රකටවූයේ නොවේද, යම්තාක් දෙව් මිනිසුන් විසින් ප්‍රකාශ කරණ ලද්දේ නොවේද ඒතාක් මම පිරිනිවන් නොපාන්නෙමි යනුයි.' ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේගේ බ්‍රහ්මචරියාව සමෘද්ධවූයේ වෙයි. විස්තර සහිතවූයේ වෙයි. බොහෝදෙනාට අයත්වූයේ වෙයි. ප්‍රකටවූයේ වෙයි. යම්තාක් දෙව්මිනිසුන් විසින් ප්‍රකාශ කරණ ලද්දේ වෙයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවන් පාන සේක්වා. සුගතයන් වහන්සේ පිරිනිවන් පානසේක්වා, ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවීමට කාලයයි.

**9.** "පාපීවූ මාරය, තෝ උත්සාහ නොකරව. ටිකකලකින් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවීම සිදුවන්නේය. මෙයින් තුන්මසක් ඇවෑමෙන් තථාගතයන් වහන්සේගේ පිරිනිවීම සිදුවන්නේය.

10. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ චාපාල චෛත්‍ය ස්ථානයෙහි සිහි ඇත්තේ විමසන නුවණැත්තේ ආයුසංස්කාරය හැරියේය. භාග්‍යවතුන් වහන්සේ ආයුසංස්කාරය හළ කල්හි මහා භූමි චලනයක් විය. භයජනකවූ ලොමුඩැහැගන්නාවූ අහස් ගිගුරුමක් ද ඇතිවිය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළසේක.

11. (1) "බුද්ධ මුනිතෙම පුනර්භවය (නැවත ඉපදීම) ඇති කරණ කාමාවචර රූපාවචර කර්මද අරූපාවචර කර්මද නිරාලයව හැර දැමීය. රණ බිමක මහා යොධයකු සන්නාහයක් බිඳලන්නාසේ විදර්ශනා භාවනාවේ ඇලුනේ සමථ භාවනාවෙහි යෙදුනේ ආධ්‍යාත්මික ක්ලෙශ රාශිය බිඳලීය."

12. "ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මේ අදහස විය. මේ භූමිචලනය විශාලවිය. ඒකාන්තයෙන්ම මේ භූමිචලනය මහත් එකක් විය. භය උපදවන ලොමුඩැහැගන්වන අහස් ගිගුරුමක්ද ඇතිවිය. මේ මහත් භූමිචලනයක් ඇතිවීමට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද? ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය ප්‍රකාශ කළහ. "ස්වාමීනි, මේ භූමි චලනය විශාලවිය. "ස්වාමීනි, ඒකාන්තයෙන්ම මේ භූමිචලනය මහත් එකක් විය. භය උපදවන ලොමුඩැහැගන්වන අහස් ගිගුරුමක් ඇතිවිය. ස්වාමීනි, මේ මහත් භූමි චලනයක් ඇතිවීමට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?"

13. "ආනන්දය, මහත් භූමි චලනයක් ඇතිවීමට මේ හේතු අටකි.

14. "ඒ අට කවරේද? ආනන්දය, මේ මහා පෘථිවිය ජලයෙහි පිහිටියේ වෙයි. ජලය වාතයෙහි පිහිටියේය. වාතය ආකාශගතය. ආනන්දය, කලෙක ඒ මහා වාතයෝ හමත්. මහා වාතය හමනවිට

ජලය කම්පාවෙයි, ජලය කම්පාවනවිට පෘථිවිය කම්පාවෙයි. ආනන්දය, මහත්වූ භූමි චලනයක් ඇති වීමට මේ පළමුවන හේතුවයි. පළමුවන ප්‍රත්‍යයයි.

15. "ආනන්දය, නැවතද ඍද්ධි ඇති සිත වසඟ කරගත් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මහත් ඍද්ධි ඇති මහානුභාව ඇති දෙවතාවෙක් හෝ ඔහුගේ ස්වල්පවූ පෘථිවි සංඥාව වඩන ලද්දේ වෙයි. අප්‍රමාණවූ ආපො සංඥාවෙන් හෙතෙම මේ පොළොව කම්පා කරයි. විශෙෂයෙන් කම්පා කරයි. ආනන්දය, මහා භූමි චලනයක් ඇතිවීමට මේ දෙවන හේතුවයි. දෙවන ප්‍රත්‍යයයි.

16. "ආනන්දය, නැවතද බොධිසත්වතෙම තුසිත දෙව් ලොවින් චුතව සිහි ඇතිව මහා නුවණැතිව මවුකුසට බැසගනීද, එකල්හි මේ පෘථිවිය කම්පාවෙයි. විශෙෂයෙන් කම්පා වෙයි. ආනන්දය මහා පෘථිවි චලනයක් ඇතිවීමට මේ තුන්වන හේතුවයි. තුන්වන ප්‍රත්‍යයයි.

17. "ආනන්දය, නැවතද යම්කලෙක බොධිසත්වතෙම සිහි ඇත්තේ මහා නුවණැත්තේ මවු කුසින් නික්මේද එකල්හි මේ පෘථිවිය කම්පාවෙයි. විශේෂයෙන් කම්පාවෙයි. ආනන්දය මහා භූමි චලනයක් ඇතිවීමට මේ සතරවන හේතුවයි. සතරවන ප්‍රත්‍යයයි.

18. "ආනන්දය, නැවතද තථාගත තෙම නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය මනාව අවබොධ කරගනීද, (බුදුබවලබාද) එකල්හි මේ පෘථිවිය කම්පාවෙයි. විශෙෂයෙන් කම්පාවෙයි. ආනන්දය, මහත් භූමි චලනයක් ඇතිවීමට මේ පස්වන හේතුවයි. පස්වන ප්‍රත්‍යයයි.

19. "ආනන්දය, නැවතද තථාගතතෙම නිරුත්තවූ ධර්ම චක්‍ර දෙශනාව පවත්වාද එකල්හි මේ පෘථිවිය කම්පාවෙයි. විශෙෂයෙන් කම්පාවෙයි. ආනන්දය මහත් භූමි චලනයක් ඇතිවීමට මේ සයවන හේතුවයි. සයවන ප්‍රත්‍යයයි.

20. "ආනන්දය, නැවතද තථාගත තෙම සිහි ඇත්තේ මනා නුවණැත්තේ ආයුසංස්කාරය හරීද එකල්හි මේ පෘථිවිය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කම්පාවෙයි. විශේෂයෙන් කම්පාවෙයි. ආනන්දය, මහා භූමි චලනයක් ඇතිවීමට මේ සත්වන හේතුවයි සත්වන ප්‍රත්‍යයයි.

21. "ආනන්දය, නැවතද යම්කලෙක තථාගත තෙම නිරුපධිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවේද එකල්හි මේ පෘථිවිය කම්පාවෙයි. විශේෂයෙන් කම්පාවෙයි. ආනන්දය, මහත් භූමි චලනයක් ඇතිවීමට මේ අටවන හේතුවයි, අටවන ප්‍රත්‍යයයි. (මෙහි 13 ඡෙදය යෙදිය යුතුයි.)

**(7 භූමි චාල වර්ගය නිමි.)**

---

## 8. යමක වර්ගය

21. **පඨම සද්ධා භික්ඛු සූත්‍රයඃ-** 1. "මහණෙනි, භික්ෂුව සැදැහැවත්ද සිල්වත් නොවේද මෙසේ හෙතෙම මේ කරුණින් සම්පූර්ණ නොවූවෙකි. එහෙයින් ඒ කරුණ සම්පූර්ණ කළ යුතුය. කිමෙක්ද මම සැදැහැවත් වෙම්ද සිල්වත් වෙම්ද' කියාය. (ii) මහණෙනි යම් කරුණකින් භික්ෂුව සැදැහැවත් වේද සිල්වත් වේද ඒ කරුණින් හෙතෙම සම්පූර්ණ වූයේ වේ.

2. "මහණෙනි භික්ෂුව සැදැහැවත්වේද, සිල්වත්වේද, බහුශ්‍රැත නොවේද, (ii) මෙසේ හෙතෙම මේ කරුණින් සම්පූර්ණ නොවූවෙකි. එහෙයින් ඒ කරුණ සම්පූර්ණ කළ යුතුය, (iii) 'කිමෙක්ද මම සැදැහැවත් වෙම්ද, සිල්වත් වෙම්ද, බහුශ්‍රැත වෙම්ද' කියාය. (vi) මහණෙනි, යම් මේ කරුණෙකින් භික්ෂුව සැදැහැවත් වේද සිල්වත් වේද බහුශ්‍රැත වේද, (v) ඒ කරුණින් හෙතෙම සම්පූර්ණ වූයේ වේ.

3. (මෙහි 2 (i) යෙදිය යුතුයි.) බහුශ්‍රැත වේද, (ii) ධර්ම කථික නොවේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) 'කිමෙක්ද මම සැදැහැවත් වෙම්ද, සිල්වත් වෙම්ද, බහුශ්‍රැත වෙම්ද' කියායි. (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) බහුශ්‍රැත වෙම්ද, ධර්ම කථික වේද (මෙහි 2 (v) යෙදිය යුතුයි.)

4. (මෙහි 2 (i) යෙදිය යුතුයි.) ධර්මකථික වේද, පිරිසෙහි හැසිරෙන්නේ නොවේද, (මෙහි 2 (ii) හා 2 (iii) යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ධර්මකථික වේද, පිරිසෙහි හැසිරෙන්නේ වේද, (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) ධර්මකථික වේද පිරිසෙහි හැසිරෙන්නේ වේද (මෙහි 2 (v) යෙදිය යුතුයි.)

5. (i) (මෙහි 4 (i) යෙදිය යුතුයි.) පිරිසෙහි හැසිරෙන්නේ වේද, (ii) නිර්භයව පිරිසට බණකියන්නේ නොවේද, (iii) (මෙහි 2 (ii) හා (iii) යෙදිය යුතුයි.) ධර්ම කථික වේද, පිරිසෙහි හැසිරෙන්නේ වේද නිර්භයව පිරිසට බණකියන්නේ වේද, (iv) (මෙහි 2 (v) යෙදිය යුතුයි.)

6. (i) මෙහි 5 (i) යෙදිය යුතුයි.) නිර්භයව පිරිසට බණ කියන්නේ වේද මෙලෝ වශයෙන් සැප විහරණ ඇති උසස් සිතිවිලි සතර ධ්‍යානයන් පහසුවෙන් ලබන්නේ සැප සේ ලබන්නේ, නිදුකින් ලබන්නේ (ii) නො වේද, (මෙහි 5 (iii) යෙදිය යුතුයි.) මෙලො වශයෙන් සැප විහරණ ඇති උසස් සිතිවිලිවූ සතර ධ්‍යානයන් පහසුවෙන් ලබන්නේ, සැපසේ ලබන්නේ, නිදුකින් ලබන්නේ වේද, (මෙහි 2 (v) යෙදිය යුතුයි.)

7. (i) (මෙහි 6 (i) යෙදිය යුතුයි.) වේද, ආශ්‍රවයන් ගෙවීමෙන් නිරාශ්‍රව (පව්නැති) සිතේ මිදීමටද, නුවණින් මිදීමටද මේ ආත්මයේම තෙමේ මනාව දැන, අත් දැක, එළඹ නොවෙසේද, මෙසේ ඒ කරුණින් හෙතෙම අසම්පූර්ණ වූයේ වෙයි. එහෙයින් කිමෙක්ද මම සැදැහැවත් වෙම්ද, සිල්වත් වෙම්ද, බහුශ්‍රැත වෙම්ද, ධර්ම කථික වෙම්ද, පිරිසෙහි හැසිරෙන්නේද, විශාරදව පිරිසට බණ කියන්නෙම්ද මෙලෝ වශයෙන් සැප විහරණ ඇති උසස් සිතිවිලිවූ සතර ධ්‍යානයන් පහසුවෙන් ලබන්නේ සැපසේ ලබන්නේ නිදුකින් ලබන්නේ වන්නෙම්ද පව් ගෙවීමෙන් පිරිසිදු සිතේ මිදීමටද, නුවණින් මිදීමටද, මේ ආත්මයේම තෙමේ මනාව දැන් අත් දැක එළඹ වසන්නෙම් දැයි හෙතෙම ඒ කාරණයෙන් සම්පූර්ණ විය යුතුය.

8. "මහණෙනි, යම් කරුණකින් භික්ෂුව සැදැහැවත් වේද, සිල්වත් වේද බහුශ්‍රැත වේද, ධර්ම කථික වේද, පිරිස්හි හැසිරෙන්නේද, නිර්භයව පිරිසට බණ කියාද, මෙලොව සැප විහරණ ඇති උසස් සිතිවිලිවූ සතර ධ්‍යානයන් පහසුවෙන්

ලබන්නේද, සැපසේ ලබන්නේද, නිදුකින් ලබන්නේද, පච් ගෙවීමෙන් පිරිසිදු සිතේ මිදීමටද, නුවණින් මිදීමටද, මේ ආත්මයේම තෙමේ මනාව දැන අත් දැක එළඹ වෙසේද, හෙතෙම මෙසේ ඒ කාරණයෙන් සම්පූර්ණවූයේවෙයි.

**9.** "මහණෙනි, මේ කරුණු අටින් යුත් භික්ෂුව හාත්පස පහදන්නෙක් වේ. සෑම අයුරින්ම සම්පූර්ණ වූවෙක්ද වේ"

**22. දුතිය සද්ධ භික්ඛු සූත්‍රයඃ-** 1-5. (මේ ඡේදය මේ වර්ගයේ 21 සූත්‍රයේ 1-5 ඡේද මෙන්වෙත්.) 6 (i) මෙහි 21 සූත්‍රයේ 5 (i) යෙදිය යුතුයි) නිර්භයව පිරිසට බණ කියන්නේ වේද, යම් ඒ සත්ත්ව කෙනෙක් මිදුණෝ රූප ලොක ඉක්මවා අරූපවූවෝ වෙත්ද, ඔවුන් කයින් ස්පර්ශ කොට නො වෙසේද, (ii) (මෙහි මේ වර්ගයේ 21 සූත්‍රයේ 2 (ii) (iii) යෙදිය යුතුයි.) ධර්මකථික වූයේද පිරිසෙහි හැසිරෙන්නේවේද, නිර්භයව බණ කියන්නේද, යම් ඒ සත්ත්ව කෙනෙක් ශාන්තවූවෝ මිදුණෝ රූප ලොක ඉක්මවා අරූපවූවෝ වෙත්ද ඔවුන් කයින් ස්පර්ශ කොට වෙසෙන්නේද, (iii) (මෙහි මේ වර්ගයේ 21 සූත්‍රයේ 2 (v) යෙදිය යුතුයි.)

7. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) පච් ගෙවීමෙන් පිරිසිදු සිතේ මිදීමට, නුවණින් මිදීමට මේ ආත්මයේ තෙමේ මනාව දැන අත් දැක පැමිණ (iii) නොවෙසේද මෙසේ හෙතෙම ඒ කරුණින් සම්පූර්ණ වූයේ වේ. එහෙයින් කිමෙක්ද මම සැදැහැවත් වන්නෙමි, සිල්වත් වන්නෙමි, බහුශ්‍රැත වන්නෙමි, ධර්ම කථික වන්නෙමි, පිරිස්හි එළඹෙන්නෙමි, විශාරදව පිරිසට බණ කියන්නෙමි, යම් ඒ සත්ත්ව කෙනෙක් ශාන්තවූවෝ මිදුණෝ, රූප ලොක ඉක්මවා අරූපවූවෝ වෙත් ද ඔවුන් කයින් සර්පශ කොට වසන්නෙම්ද (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) වසන්නෙම් දැයි ඒ කාරණයෙන් සම්පූර්ණ විය යුතුය.

8. "මහණෙනි, යම් හෙයකින් වනාහි භික්ෂුව සැදැහැවත්ද, සිල්වත්ද, බහුශ්‍රැතද ධර්ම කථිකද, පිරිස්හි එළඹෙන්නේද, විශාරදව පිරිසට බණ කියන්නේද, යම් ඒ සත්ව කෙනෙක් ශාන්තවූවෝ. මිදුණෝ, රූපලොක ඉක්මවා අරූපවූවෝ වෙත්ද'

ඔවුන් කයින් කය ස්පර්ශ කොට වෙසෙන්නෝ, පච් ගෙවීමෙන් (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) වෙසේද මෙසේ හෙතෙම ඒ කරුණින් සම්පූර්ණ වූයේ වේ.

**9.** (මේ ඡේදය මේ වර්ගයේ 21 සූත්‍රයේ 9 ඡේදය මෙනි)

**23. පඨම මරණ සති සූත්‍රයː-** 1. මේ සූත්‍රයේ 1, 2, 3 ඡේද ඡක්ක නිපාතයේ 2 වර්ගයේ 20 සූත්‍රයේ 1-2-3 ඡේද මෙනි.)

**4.** (i) අනෙක් භික්ෂුවක්ද භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. "ස්වාමීනි, මමත් මරණය සිහි කිරීම භාවිත කෙරෙමි" කියා ය.

"භික්ෂුව, ඔබ කෙසේ මරණය සිහි කිරීම භාවිතා කෙරෙහිද?" (ii) "ස්වාමීනි, මෙහි ලා මට (iii) අනේ ඇත්තෙන්ම මම දවසේ ජීවත් වෙම් නම් භාග්‍යවතුන්ගේ ධර්මය මෙනෙහි කරන්නෙමි. (මෙහි 3 (iii) යෙදිය යුතුයි.)

**5.** (මෙහි 4 (i) යෙදිය යුතුයි.) "ස්වාමීනි මෙහි ලා මට (ii) අනේ ඇත්තෙන් මට දවසින් අඩක් ජීවත් වන්නෙම් නම් භාග්‍යවතුන්ගේ ධර්මය සිහි කරන්නෙමි. (මෙහි 3 (iii) යෙදිය යුතුයි.)

**6.** (මෙහි 4 (i) යෙදිය යුතුයි.) "ස්වාමීනි, මෙහි ලා මට (ii) "අනේ ඇත්තෙන් යම් අතරක එකම පිණ්ඩපාතයක් වළඳම් ඒ අතර ජීවත් වෙම් නම් භාග්‍යවතුන්ගේ ධර්මය මෙනෙහි කරන්නෙමි. (ii) (මෙහි 5 (iii) යෙදිය යුතුයි.)

**7.** (මෙහි 4 (i) යෙදිය යුතුයි.) "ස්වාමීනි මෙහි ලා මට (ii) අනේ ඇත්තෙන් මම යම් අතරක පිණ්ඩපාතයෙන් අඩක් වළඳම් ද, ඒ අතරෙහි ජීවත් වන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය මෙනෙහි කරන්නෙම් (iii) (මෙහි 3 (iii) යෙදිය යුතුයි.)

**8.** (මෙහි 4 (i) යෙදිය යුතුයි.) "ස්වාමීනි, මෙහි ලා මට (ii) අනේ ඇත්තෙන් මම යම් අතරක බත් පිඩු හතරක් හෝ පහක් යම්තම් වළඳා කල් යවම් ද, ඒ අතර භාග්‍යවතුන්ගේ ධර්මය මෙනෙහි කරන්නෙමි. (iii) මෙහි 3 (iii) යෙදියයුතුයි)

9. (මෙහි 4 (i) යෙදිය යුතුයි) "ස්වාමීනි, මෙහි ලා මට අනේ ඇත්තෙන් මම යම් අතරක එක් බත් පිඩක් යම්තම් වළඳා කල් යවම්ද ඒ අතර භාග්‍යවතුන්ගේ ධර්මය මෙනෙහි කරන්නෙම් (මෙහි 3 (iii) යෙදිය යුතුයි.)

10. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) ස්වාමීනි මෙහි ලා මට අනේ ඇත්තෙන් මම යම් අතරක ආශ්වාස කොට ප්‍රශ්වාස කරම්ද, ප්‍රශ්වාස කොට ආශ්වාස කරම්ද ඒ අතර භාග්‍යවතුන්ගේ ධර්මය මෙනෙහි කරන්නෙමි. (මෙහි 3 (iii) යෙදිය යුතුයි.)

11. මෙසේ කී විට භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට මෙසේ වදාළහ. (iii) "මහණෙනි, යම් මේ භික්ෂුවක් (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) මා විසින් කටයුතු දේ ඒකාන්තයෙන් බොහෝ වන්නේයයි මරණය සිහි කිරීම කෙරේද,

12. "මහණෙනි, යම් මේ භික්ෂුවක් (මෙහි 4 (iii) යෙදිය යුතුයි.) (ii) මා විසින් කටයුතු දේ ඒකාන්තයෙන් බොහෝ වන්නේයයි මරණය සිහි කිරීම භාවිතා කෙරේද,

13. "මහණෙනි යම් මේ භික්ෂුවක් (මෙහි 5 (ii) 12 8. (ii) යෙදිය යුතුයි.)

14. "මහණෙනි, යම් මේ භික්ෂුවක් (මෙහි 6 (ii) 12 (ii) යෙදිය යුතුයි.)

15. "මහණෙනි, යම් මේ භික්ෂුවක් (මෙහි 7 (ii) 12 (ii) යෙදිය යුතුයි.)

16. "මහණෙනි, යම් මේ භික්ෂුවක් (මෙහි 8 (ii) 12 (ii) යෙදිය යුතුයි.

17. "මහණෙනි, මේ භික්ෂූහු ප්‍රමාදව වෙසෙත්යයි ද ආශ්‍රවයන් ගෙවීම පිණිස, මරණය සිහි කිරීම සෙමෙන් භාවිත කරත් යයිද, කියනු ලැබෙත්.

18. "මහණෙනි, යම් මේ භික්ෂුවක් "අනේ ඇත්තෙන් මම යම් අහරක එක් බත් පිඩක් යම්තම් වළඳා කල් යවම්ද, ඒ අතර ජීවත් වන්නෙමි. (ii) භාග්‍යවතුන්ගේ ධර්මය මෙනෙහි

කරන්නෙමි. මා විසින් කටයුතු දේ බොහෝ වන්නේ යයි මරණය සිහිකිරීම භාවිතා කෙරේද.

**19.** "මහණෙනි, යම් මේ භික්ෂුවක් "අනේ ඇත්තෙන් මම යම් අතරක හුස්ම ඇද පිට කරම්ද හුස්ම පිටකර ඇදගනිම්ද ඒ අතර (මෙහි 18 (ii) යෙදිය යුතුයි.)

**20.** "මහණෙනි, මේ භික්ෂූහු අප්‍රමාදව වෙසෙත්යයිද, ආශ්‍රවයන් ගෙවීම පිණිස තියුණු ලෙස මරණය සිහි කිරීම භාවිතා කෙරෙත්යයිද කියනු ලැබෙත්. මහණෙනි, එ බැවින් මෙහි ලා අප්‍රමාදව වසන්නමු, ආශ්‍රව ගෙවීම පිණිස තියුණු ලෙස මරණය සිහි කිරීම භාවිතා කරමුයි මෙසේ හික්මිය යුතුය. මහණෙනි, මෙසේ ම තොප විසින් හික්මිය යුතුය.

**24. දුතිය මරණ සති සූත්‍රයː-** 1 (මේ සූත්‍රය ඡක්ක නිපාතයේ 2 වර්ගයේ 19 සූත්‍රය මෙනි.)

**25. සංඛිත්ත අට්ඨ සම්පදා සූත්‍රයː-** 1 "මහණෙනි, මේ සම්පත් අටකි. කවර අටක්ද? උත්සාහ සම්පතය, ආරක්ෂා සම්පතය, කල්‍යාණ මිත්‍රයන් ඇති බවය, සමවූ ජීවිකාවය, ශ්‍රද්ධා සම්පතය, ශීල සම්පතය, ත්‍යාග සම්පතය, ප්‍රඥා සම්පතය මහණෙනි, මේ සම්පත් අටයි.

(මේ ඡේදය මේ නිකායේ 6 වර්ගයේ 4 සූත්‍රයේ 14 ඡේදය මෙනි.)

**26. විත්ථත අට්ඨ සම්පදා සූත්‍රයː-** 1-2 (මේ ඡේදය මේ වර්ගයේ 25 සූත්‍රයේ 1, 2 ඡේද මෙන් වෙත්.)

3-13 (මේ ඡේද මේ නිපාතයේ 6 වර්ගයේ 4 සූත්‍රයේ 3-13 ඡේද මෙන් වෙත්. 'ව්‍යග්ඝපජ්ජය' වෙනුවට 'මහණෙනි' යෙදිය යුතුයි.)

**27. නිරායත්ත වුත්තිච්ඡා සූත්‍රයː-** 1 "එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ "ඇවැත් භික්ෂූනි"යි භික්ෂූන් ඇමතූසේක. ඒ භික්ෂූහු 'ඇවැත්නි'යි ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේට පිළිතුරු දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේ මෙය වදාළහ.

**2-10** මේ ඡෙද මේ නිකායේ 7 වර්ගයේ 11 සූත්‍රයේ 1-9 ඡෙද මෙන් වෙත්. "මහණෙනි" වෙනුවට "ඇවැත්නි" යෙදිය යුතුයි.)

28. **බිප්පනීසන්ති සූත්‍රයඃ**- 1 (මේ ඡෙදය මේ වර්ගයේ 27 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

2-15 (මේ ඡෙද මේ නිකායේ 7 වර්ගයේ 1-14 ඡෙද මෙන් වෙත්. "මහණෙනි', වෙනුවට "ඇවැත්නි" යෙදිය යුතුයි)

29. **සෙඛ පරිහානි සූත්‍රයඃ**- 1 "මහණෙනි, මේ කරුණු අට හික්මෙන (රහත් නොවූ) භික්ෂුහට පිරිහීම පිණිස පවතී.

2. "කවර අටක්ද යත්? කටයුතුවල ඇලී සිටීමය, කථාවෙහි ඇලී සිටීමය, කාණ්ඩගැසීමෙහි ඇලී සිටීමය, ඉඳුරන්හි දොර නොරක්නා ලද බවය, අහරෙහි පමණ නොදන්නා බවය සම්බන්ධයන්හි ඇලී සිටීමය, පමාවෙහි ඇලී සිටීමය. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, මේ කරුණු අට හික්මෙන (රහත්නොවූ) භික්ෂුහට නොපිරිහීම පිණිස පවතී.

4. "කවර අටක්ද යත්? කටයුතුවල ඇලී නොසිටීමය, කථාවෙහි ඇලී නොසිටීමය, නින්දෙහි ඇලී නොසිටීමය, කාණ්ඩගැසීමෙහි ඇලී නොසිටීමය, ඉඳුරන්හි රක්නා ලද දොර ඇති බවය, අහරෙහි පමණ දන්නා බවය, සම්බන්ධයන්හි නොඇලීමය. ප්‍රමාදයෙහි නොඇලීමය. (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි)

30. **කුසීතවත්ථු සූත්‍රයඃ**- 1 "මහණෙනි, මේ කුසීත වස්තූහු (කම්මැලිකමට කරුණු) අටෙකි.

2. "කවර අටක්ද? මහණෙනි, මෙහි භික්ෂුව විසින් කටයුත්තක් කළයුතු වේද, ඔහුට මෙසේ සිතක් වෙයි. 'මා විසින් කටයුත්තක් කළයුතු වන්නේය කියාය කටයුත්ත කරන මගේ (ii) කය අනේ, වෙහෙස වෙයි. එහෙයින් මම හොවීමි. (හාන්සිවෙමි) යි' හේ හොවියි. නොපැමිණියට පැමිණීමටද, අවබොධ නොකළ දේ අවබොධ කිරීමටද, අත් නොදුටු දෙය

අත් දැකීමටද, වීර්ය පටන් නොගනීද (iii) මහණෙනි, මෙය පළමුවන කුසීත වස්තුවය.

3. "මහණෙනි, නැවතද වනාහි භික්ෂුව විසින් කටයුත්ත කරන ලද්දේ වේද, ඔහුට මේ සිත වෙයි. 'මම වනාහි කළ යුත්ත කෙළෙමි. කටයුත්ත කරන මගේ කය වෙහෙස විය. අනේ මම දැන් හාන්සි වෙමි' (කියාය) හේ හාන්සි වෙයි. වීර්ය පටන් නොගනී. නොපැමිණියට පැමිණීමටද අවබොධ නොකළ දේ අවබොධ කිරීමටද අත් නොදුටු දෙය අත් දැකීමටද වීර්යය පටන් නොගනී. මහණෙනි, මේ දෙවන කුසීත වස්තුවය.

4. "මහණෙනි, නැවතද භික්ෂුව විසින් මග යායුතුවෙයි. ඔහුට මේ සිත වෙයි. මා විසින් මග යායුතුවන්නේය' (කියාය) මග යන මාගේ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මහණෙනි මේ තුන්වන කුසීත වස්තුවයි.

"මහණෙනි, නැවතද වනාහි භික්ෂුව විසින් මග යන ලද්දේය. ඔහුට මේ සිත වෙයි. මම මග ගියෙමි. මග යන මගේ (මෙහි 2 (ii) යෙදිය යුතුයි) මහණෙනි, මේ සතරවන කුසීත වස්තුවයි.

5. "මහණෙනි, නැවතද භික්ෂුව ගම හෝ නියම් ගම හෝ පිඬු පිණිස හැසිරෙන්නේ ඔහුට ප්‍රණීත හෝ කටුක හෝ භෝජනයක් ඇති පමණ සම්පූර්ණව ලැබේද, ඒ මගේ කය බරය, වලංගු නැත. පෙගුන මෑ ඇට ගොඩක් මෙනැයි සිතමි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මේ සයවන කුසීත වස්තුවය.

6. "මහණෙනි, නැවතද වනාහි භික්ෂුවට යම්තම් ලෙඩක් ඇතිවූයේ වෙයි. ඔහුට මෙසේ සිතක් වෙයි. 'මට වනාහි මේ හාන්සිවීමට සුදුසුවූ යම්තම් ආබාධයක් උපන්නේය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි) මහණෙනි, මේ සත්වන කුසීත වස්තුවයි.

7. "මහණෙනි, නැවතද වනාහි භික්ෂුතෙම ලෙඩින් නැගිසිටියේ වෙයි. ගිලන්කමින් ළගදී නැගිටියේ වෙයි. 'ඒ මගේ ඇඟ දුබලය වලංගු නැත. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මහණෙනි මේ අටවන කුසීත වස්තුවය. මහණෙනි, මේ කුසීත වස්තු අටය.

8. "මහණෙනි, මේ වීර්යය වස්තූහු අටකි.

9. "කවර අටක්ද යත්? මහණෙනි, භික්ෂුව විසින් කටයුත්තක් කළයුතු වෙයි. ඔහුට මෙසේ සිතක් වෙයි. 'මා විසින් කටයුත්තක් කළයුතු වන්නේය. කටයුත්තක් කරන මට බුදුන්ගේ අවවාදය මෙනෙහි කරන්නට පහසු නැත. (ii) ඔව්, මම නොපැමිණියට පැමිණීමට අවබෝධ නොකළ දෙය අවබොධ කිරීමට අත්නොදුටු දේ අත්දැකීමට පළමුකොටම වීර්ය පටන්ගතිමි. හෙතෙම නොපැමිණියට පැමිණීමට අවබොධ නොකළ දෙය අවබොධ කිරීමට අත්නොදුටුදේ අත්දැකීමට වීර්ය පටන්ගනී. (ii) මහණෙනි, මේ පළමුවන වීර්ය වස්තුවයි.

10. "මහණෙනි, නැවතද වනාහි භික්ෂුව වැඩය කෙළේ වෙයි. ඔහුට මෙසේ සිතක් වේ. 'මම වැඩය කෙළෙමි. මම වැඩය කරන්නෙමි. බුදුන්ගේ අවවාදය මෙනෙහි කරන්නට නොහැකිවීමි. (මෙහි 9 (ii) යෙදිය යුතුයි) මහණෙනි, මේ දෙවන වීර්ය වස්තුවයි.

11. "මහණෙනි, නැවතද භික්ෂුව විසින් මඟ යායුතු වෙයි. ඔහුට මෙසේ සිතක් වෙයි. 'මා විසින් මඟ යායුතු වන්නේය මඟ යන්නාවූ මට බුදුන්ගේ අවවාදය මෙනෙහි කරන්නට පහසු නොවේ. මම පළමුව වීර්යය පටන් ගනිමි.' මහණෙනි, මේ තුන්වන වීර්ය වස්තුවයි.

12. "මහණෙනි, නැවතද වනාහි භික්ෂුව විසින් මඟ ගියේ වෙයි. ඔහුට මෙසේ සිතක් වෙයි. 'මම මග ගියෙමි. මම මඟ යන්නෙමි. බුදුන්ගේ අවවාදය මෙනෙහි කරන්නට නොහැකිවීමි.' (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මේ සතරවන වීර්ය පටන් ගැනීමයි.

13. "මහණෙනි, නැවතද වනාහි භික්ෂුව ගම හෝ නියම්ගම හෝ පිඬු පිණිස හැසිරෙනුයේ කටුක හෝ ප්‍රණීත භොජනයක් ඇති පමණ පුරා නොලබයි. ඔහුට මෙසේ සිතක් වෙයි. මම වනාහි ගම හෝ නියම් ගම හෝ පිඬු පිණිස හැසිරෙනුයේ කටුක හෝ ප්‍රණීත හෝ භොජනය ඇති පමණ පුරා නොලදිමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඒ මගේ ඇඟ සැහැල්ලුය. වලංගුය. (මෙහි 9 (ii) යෙදිය යුතුයි) මහණෙනි, මේ පස්වන වීර්ය වස්තුවයි.

14. "මහණෙනි, නැවතද වනාහි භික්ෂුව ගම හෝ නියම් ගම පිඬු පිණිස හැසිරෙනුයේ කටුක හෝ ප්‍රණීත හෝ භොජනය ඇති පමණ පුරා ලදිමි. ඒ මගේ ඇඟ බලවත්ය වලංගුය. (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මේ සවන වීර්ය වස්තුවයි.

15. "මහණෙනි, නැවතද වනාහි භික්ෂුවට යම්තම් ලෙඩක් වූයේවේ. ඔහුට මෙසේ සිතක් වේ. 'මට මේ යම්තම් ලෙඩක් වුණේය. මෙබඳු කරුණක් පෙනේ. යම් හෙයකින් මගේ ලෙඩ වැඩිවිය හැකිය.' (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මේ සත්වන වීර්ය වස්තුවයි.

16. "මහණෙනි, නැවතද වනාහි භික්ෂුව ලෙඩින් නැගීසිටියේ වේ. ගිලන්කමින් ළඟදී නැගිටියේ වේ. ඔහුට මෙසේ සිතක් වේ.' මම වනාහි ලෙඩින් නැගිටියෙමි. ගිලන්කමින් ළඟදී නැගිටියේ වෙමි. මෙබඳු කරුණක් පෙනේ. යම් හෙයකින් මගේ ලෙඩ නැවත මතුවිය හැකිය. (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මේ අටවන වීර්ය වස්තුවයි. මහණෙනි මේ වීර්ය වස්තු අටය.

(අටවන යමක වර්ගය නිමි)

---

## 9. සති වර්ගය

31. **සති විපන්න සූත්‍රයඃ-** "මහණෙනි, සිහි නුවණ විපරීත වූවහුට (ii) සිහි නුවණ නො පවත්නා කල්හි හිරිඔතප් දෙක නැසීමට ළංවූයේ වේ. හිරි ඔතප් දෙක විපරිත වුවහුට හිරි ඔතප් දෙක නැති කල්හි ඉඳුරන් සංවර කිරීම නැසීමට ළංවූයේ වේ. ඉඳුරන් සංවර කිරීම විපරිත වූවහුට ඉඳුරන් සංවර කිරීම නැති කල්හි ශීලය නැසීමට ළංවූයේ වේ. ශීලය විපරිත වූවහුට ශීලය නැති කල්හි මනා හිත එකමුතුකම නැසීමට ළංවූයේ වේ මනා හිත එකමුතුකම විපරිත වූවහුට මනාහිත එකමුතුකම නැති කල්හි තත්වූ පරිද්දෙන් නුවණින් දැකීම නැසීමට ළංවූයේ වේ.

තත්වූ පරිද්දෙන් නුවණින් දැකීම විපරිත වූවහුට තත්වූ පරිද්දෙන් නුවණින් දැකීම නැති කල්හි කලකිරීමෙන්වූ නොඇල්ම නැසීමට ළංවූයේ වේ. කලකිරීමෙන් වූ නොඇල්ම විපරීත වුවහුට කලකිරීමෙන්වූ නොඇල්ම නොපවත්නා කල්හි (සියලු කෙලෙසුන්ගේ) මිදීම නුවණින් දැකීම නැසීමට ළං වූයේවේ.

2. "මහණෙනි, යම් සේ ගසක්, කොළ අතු මිරිකී ගියේ (-විපරීතවූයේ) එහි පතුරුද, පිරී වැඩීමට නොයයි. පොත්තද, එළයද, අරටුවද පිරී වැඩීමට නොයයි. මහණෙනි, මෙසේම වනාහි සිහි නුවණ විපරිත වුවහුට (මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

3. "මහණෙනි, සිහි නුවණ සහිත වූවහුට (ii) සිහිනුවණ පවත්නා කල්හි හිරි ඔතප් දෙක ළංවීම් සහිත වෙයි. හිරි ඔතප් සහිත වූවහුට හිරි ඔතප් පවත්නා කල්හි ඉඳුරන් සංවර කිරීම ළංවීම් සහිත වේ. ඉඳුරන් සංවර කිරීම සහිත වූවහුට ඉඳුරන් සංවර කිරීම පවත්නා කල්හි ශීලය ළංවීම් සහිත වේ. ශීලය සහිත වූවහුට ශීලය පවත්නා කල්හි මනා සිත එකමුතුකම ළංවීම් සහිත වේ. මනා හිත එකමුතු කම සහිත වූවහුට මනා සිත එකමුතුකම පවත්නා කල්හි තත්වූ පරිද්දෙන් දැකීමේ නුවණ ළංවීම් සහිත වේ. තත්වූ පරිද්දෙන් දැකීමෙ නුවණ සහිත වූවහුට තත්වූ පරිද්දෙන් දැකිමෙ නුවණ පවත්නා කල්හි කලකිරීමෙන් වූ නොඇල්ම ළංවීම් සහිත වේ. කලකිරීමෙන් වූ නොඇල්ම සහිත වූවහුට කලකිරීමෙන්වූ නොඇල්ම පවත්නාකල්හි මිදීම දක්නා නුවණ ළංවීම් සහිතවේ.

4. "මහණෙනි, යම් සේ ගසක් අතු කොළ සහිත වූයේ එහි පතුරුද පිරී වැඩීමටයයි පොත්තද එළයද අරටුවද පිරී වැඩීමට යයි. මහණෙනි, මෙසේම වනාහි සිහි නුවණ සහිත වූවහුට (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

**32. පුණ්ණිය සූත්‍රයඃ-** 1 ඉක්බිති වනාහි ආයුෂ්මත් පුණ්ණායතෙම භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය. එකත් පසෙක හුන් ආයුෂ්මත් පුණ්ණිය තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, යමකු කරණකොට එක්දිනක

තථාගතයන්ට ධර්මදෙශනාවට සිත නැමේද එක්දිනෙක නොනැමේද, හෙතු කවරේද, කාරණය කවරේද?”

2. “පුණ්ණියය, භික්ෂු තෙමේ සැදැහැවත්ද, එළඹෙන්නේ නොවේද, ඒ තාක් තථාගතයන්ට ධර්ම (දෙශනාවට) සිත නොනැමේ. පුණ්ණිය, යම් විටෙක වනාහි භික්ෂු තෙමෙ සැදැහැත්තේද, එළඹෙන්නේද, මෙසේ තථාගතයන්ට ධර්ම (දෙශනාවට) සිත නැමේ.

“පුණ්ණිය, භික්ෂු තෙමේ සැදැහැවත්ද, එළඹෙන්නේද, ඇසුරු නොකෙරේ නම් ඒතාක් ධර්ම (දෙශනාවට) සිත නොනැමේ. ඇසුරුකෙරේද, නොවිචාරා නම් විචාරන ලද්දේද, කන් යොමු කොට බණ නොඅසා නම්, කන් යොමු කොට බණ අසාද බණ අසා ධරා නොගනී නම්, අසා බණ දරාද, ධරන ලද බණෙහි අදහස් නැවත සොයා නොබලා නම්, ධරන ලද බණෙහි අදහස් නැවත සොයා බලාද, අර්ථය දැන ධර්මය දැන ධර්මානුකූලව ධර්මයට නොබටුයේනම් ඒ තාක් තථාගතයන්ට ධර්ම (දෙශනාවට) සිත නොනැමේමය.

3. “පුණ්ණිය. යම් විටෙක වනාහි භික්ෂු තෙම සැදැහැවත්වේද, එළඹෙන්නේද, ඇසුරු කරන්නේද, විචාරන්නේද, ඇහුම්කන් දෙන්නේද, බණ අසයි නම් අසාද, ධර්මය දරන්නේ නම් දරන ලද ධර්මයන්ගේ අදහස නැවත සොයා බලා නම්, අර්ථය දැන ධර්මය දැන ධර්මානුකූලව ධර්මයට බටුයේද වේ නම් මෙසේ තථාගයන්හට ධර්ම දෙශනාවට සිත නැමේ. පුණ්ණිය මේ කරුණු අටින් යුක්තවූයේ වේද, තථාගතයන්ගේ ඒකාන්තයෙන් සිත නැමීම ඇති දහම් දෙසීමවෙයි.

**33. කිංමූලක සූත්‍රය**:- 1. “මහණෙනි, අන්‍ය තීර්ථක පැවිද්දෝ (ii) ඇවැත්ති, සියලු ධර්මයෝ කුමක් මුල් වූවෝද සියලු ධර්මයෝ කුමකින් උපදින්නෝද, සියලු ධර්මයෝ කුමක් වැඩීම කොට ඇත්තෝද, සියලු ධර්මයෝ කුමක් රැස්කරන්නෝද, සියලු ධර්මයෝ කුමක් ප්‍රධාන කොට ඇත්තාහුද, සියලු ධර්මයෝ කුමක් අධිපති කොට ඇත්තෝද, සියලු ධර්මයෝ කුමක් උතුම්

කොට ඇත්තෝද, සියලු ධර්මයෝ කුමක් හාර කොට ඇත්තෝ දැයි ඉදින් (මෙසේ විචාරත්ද, (iii) මහණෙනි, මෙසේ විචාරණ ලද තෙපි ඒ අන්‍ය තීර්ථක පැවිද්දනට කුමකැයි පිළිතුරු දෙව්ද?"

2. "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවත්හු මුල් කොට ඇත්තේය, භාග්‍යවත්හු නායක කොට ඇත්තෝය. භාග්‍යවත්හු පිළිසරණ වූවෝය. ස්වාමීනි, මේ කියමනේ අදහස භාග්‍යවතුන් වහන්සේටම වැටහේවා, භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරත්."

3. "මහණෙනි, එසේ වී නම් අසව්, මනාව මෙනෙහි කරව්, දෙසන්නෙමි."

"ස්වාමීනි, යහපතියි," ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ හට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

4. "මහණෙනි, අන්‍ය තීර්ථක පැවිද්දෝ (මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

5. "මහණෙනි, මෙසේ විචාරණ ලද තෙපි ඒ අන්‍ය තීර්ථක පැවිද්දන්ට මෙසේ පිළිතුරු දෙව්.

"ඇවැත්නි, සියලු ධර්මයෝ ඡන්දය (කැමැත්ත) මුල් වූවෝය. සියලු ධර්මයෝ මෙනෙහි කිරීමෙන් හටගන්නෝය. සියලු ධර්මයෝ ස්පර්ශයෙන් වැඩෙන්නෝය. සියලු ධර්මයෝ විඳීම රැස් කරන්නෝය. සියලු ධර්මයෝ සමාධිය ප්‍රධාන කොට ඇත්තාහ. සියලු ධර්මයෝ සිහිය අධිපති කොට ඇත්තාහ. සියලු ධර්මයෝ නුවණ උතුම් කොට ඇත්තෝය. සියලු ධර්මයෝ විදීම භාරකොට ඇත්තෝය.'

6. "මහණෙනි, මෙසේ අසන ලද තෙපි අන්‍ය තීර්ථක පැවිද්දන්ට මෙසේ පිළිතුරු දෙව්."

**34. මහා චොරංග සූත්‍රයඃ-** 1. "මහණෙනි, අංග අටකින් යුත් මහසොරා වහා අල්ලා ගනු ලැබේ. වැඩිකල් සිටින්නෙක් නොවේ.

2. "කවර අටෙකින්ද යත්? නොගසන්නහුට ගසාද, ඉතිරි නොකර ගෙනයාද, ගැහැනුන් මරාද, තරුණියන් දූෂණය කරාද,

පැවිද්දාගෙන් සොරකම් කරාද, භාණ්ඩාගාරය සොරකම් කරාද, ඉතා කිට්ටුව කටයුතු කෙරේද සැඟවූ ධනයෙහි දක්ෂ නොවේද, (කියාය.) (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, අංග අටකින් යුත් මහ හොරා වහා අල්ලා ගනු නොලැබේ. වැඩිකල් සිටින්නේ වේ.

4. "කවර අටකින්ද යත්? නොගසන්නාට නොගසාද ඉතිරි නොකර පැහැර නොගනීද; ගැහැනුන් නොමරාද, තරුණියන් දූෂණය නොකෙරේද, පැවිද්දාගෙන් සොරකම් නොකරාද, භාණ්ඩාගාරය සොරකම් නොකෙරේද, ඉතා කිට්ටුව කටයුතු නොකෙරේද, සැඟවූ ධනයට දක්ෂවේද, (යනුය.) (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

**35. තථාගතාධි වචන සූත්‍රය:-** 1. "මහණෙනි, ශ්‍රමණ යනු අර්හත්වූ සම්මාසම්බුද්ධවූ තථාගතයන්ට නමෙකි. මහණෙනි, බ්‍රාහ්මණ යනු අර්හත්වූ සම්මා සම්බුද්ධ වූ තථාගතයන්ට නමෙකි. මහණෙනි, වෙදගූ (වෙදය දත්තෝ) යනු, භිසක්ක (වෙදා) යනු, නිම්මල (කුණුනැත්තා) යනු විමල (කුණුනැත්තා) යනු, ඤාණී (දන්නෝ) යනු, විමුක්ත (මිදුණෝ) යනු අර්හත්වූ, සම්මා සම්බුද්ධ වූ තථාගතයන්ට මේ නමෙකි.

2. 1. "බ්‍රාහ්මණයකු විසින් වශීවූ ශ්‍රමණයකු විසින්, යමකට පැමිණිය යුතුද, වෙදය දත්තකු විසින්, වෙදකු විසින් අති උතුම්වූ යමකට පැමිණිය යුතුද,

2. "නිර්මලයකු විසින් විමලයකු විසින් නුවණැත්තෙකු විසින් අති උතුම්වූ යමකට පැමිණිය යුතුද,

3. "ඒ මම දිනූ යුද ඇත්තේ මිදුණේ බැඳුම්වලින් මුදමි. අතිශයෙන් ප්‍රමොද වන ශික්ෂා අවසන් කළ පිරිනිවීම් ඇත්තෙක් වෙමි."

**36. 1. මායස්ස මාගම සූත්‍රය:-** 1. "එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂු සමූහයා හා කොශල ජනපදයෙහි චාරිකාවෙහි හැසිරෙනුයේ කොසල වැස්සන්ගේ ඉච්ඡානංගල

නම් බමුණු ගමට පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේ වනාහි ඉච්ඡානංගල ගම්හි ඉච්ඡානංගල වන ලැහැබේ වසයි.

**2.** ඉච්ඡානංගල වැසි බමුණු සිටුවරු ශාක්‍ය කුලයෙන් පැවිදිවූ ශාක්‍ය පුත්‍රවූ ශ්‍රමණ භවත් ගෞතම තෙමේ ඉච්ඡානංගලයට පැමිණියේ ඉච්ඡානංගලයට පැමිණ එහි ඉච්ඡානංගල වන ලැහැබෙහි වෙසේයයි ඇසූහ. ඒ භාග්‍යවත් ගෞතමයන්ගෙන් මෙබඳු කීර්ති ඝොෂයක් පැන නැංගේය. (මෙහි 3 අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ 1 ආහුණෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 2 (ii) ඡෙදය යෙදිය යුතුයි.) එබඳුවූ රහතුන්ගේ දැකීමවේ නම් මනාමය (කියා ය.)

**3.** ඉක්බිති වනාහි ඉච්ඡානංගල වැසි බමුණු සිටුවරු ඒ රැය ඇවෑමෙන් බොහෝ කෑම් පීම් ගෙන, ඉච්ඡානංගල වන ලැහැබ කරා පැමුණුණෝය. පැමිණ උස් හඬ ඇත්තෝ මහා ශබ්ද ඇත්තෝ පිටි දොර සිටියෝය.

**4.** එ සමයෙහි වනාහි ආයුෂ්මත් නාගිත තෙම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නේ විය. ඉක්බිත්තෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නාගිතයන්ට කථා කළ සේක.

"නාගිතය, ඒ උස්වූ ශබ්ද මහත් ශබ්ද කවරේද? මස් මරන්නෝ මසුන් උදුරතියි සිතමි."

"ස්වාමීනි, මොවුහු ඉච්ඡානංගල වැසි බමුණන් හා සිටුවරුය. බොහෝ කෑම් බීම් ගෙන පිටත දොරටුයෙහි භාග්‍යවතුන් වහන්සේද, භික්ෂු සංඝයාද උදෙසා සිටියෝ"යි.

**5.** "නාගිතය, මම යසසින් වන සමාගමය නොපතමි. මා කරණ කොට යසසක්ද නොපතමි.

නාගිතය, යමෙක් වනාහි මේ (i) නිෂ්කාම (ii) මහණකමේ සැපය දැඩි විවේක සැපය, සිත සන්සිඳීමේ සැපය, මනා අවබොධයෙන්වූ සැපය පහසුවෙන් ලබන්නේ නොවේද නිදුකින් ලබන්නේ නොවේද හිරිහැර නැතිව ලබන්නේ නොවේද (iii) මම යම් ඒ නිෂ්කාම සැපය, දැඩි විවේක සැපය, සිත සන්සිඳීමේ සැපය, මනා අවබොධයෙන්වූ සැපය පහසුවෙන් ලබන්නේ

වෙම්ද, නිදුකින් ලබන්නේ වෙම්ද හිරිහැර නැතිව ලබන්නේ වෙම්ද, (iv) හෙතෙම ඒ අපවිත්‍රවූ සැපය, නිදීමේ සැපය, ලැබීම් සැලකිලි ප්‍රශංසා සැපය ඉවසන්නේය."

6. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දැන් ඉවසාවා. සුගත තෙමේ ඉවසාවා, ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේහට ඉවසීමේ කාලයයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම් යම් පරිද්දෙකින් එයට වඩින්නේද, බමුණු සිටුවරුද, නියම් ගම්මුද, ජනපද වැස්සෝද නැමුණෝම වන්නෝය.

"ස්වාමීනි, යම්සේ මහත් බින්දු ඇති වැස්ස වසිත්ම පහත් (නැමුණු) තැන් වශයෙන් ජලය පවතිත්ද, ස්වාමීනි, එසේම වනාහි භාග්‍යවතුන් වහන්සේ යම් යම් පරිද්දකින් එයට වඩින්නේද බමුණු සිටුවරු නියම් ගම්මුද ජනපද වැස්සෝද නැමුණෝවෙත්. එයට හේතු කවරේද? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ශීල ප්‍රඥාව එසේමැයි."

7. (මේ ඡෙදය 5 ඡෙදය මෙනි.)

8. "නාගිත, ඇතැම් දේවතාවෝද වනාහි (මෙහි 5 (ii) ඡෙදය යෙදිය යුතුයි) යම් ඒ නිෂ්කාම සැපය, දැඩි විවේක සැපය සිත සන්සිඳීමේ සැපය, මනා අවබෝධයෙන්වූ සැපය පහසුවෙන් ලබන්නේ වෙම්ද, නිදුකින් ලබන්නේ වෙම්ද, හිරිහැර නැතිව ලබන්නේ වෙම්ද, නාගිතය එක්ව රැස්ව කාංඩ ගැසී කල් යැවීමෙන් වසන තොපටද මෙසේ සිතෙක්වෙයි.

"මේ ආයුෂ්මත්වරු මේ (මෙහි 5 (ii), (iii) යෙදිය යුතුයි.) මම යම් මේ නිෂ්කාම සැපය, දැඩි විවේක සැපය, සිත සන්සිඳීමේ සැපය මනා අවබෝධයෙන්වූ සැපය පහසුවෙන් ලබන්නේ වේද, නිදුකින් ලබන්නේ වෙම්ද එසේය මේ ආයුෂ්මත්හු එක්ව රැස්ව කාණ්ඩ ගැසී කල් යැවීමෙන් වසත්.

9. "නාගිතය, මම මෙහි උනුන් ඇඟිලි දික්කිරීමෙන් එක්ව සිනාසෙන, එක්ව සෙල්ලම් කරන භික්ෂූන් දකිමි. නාගිතය, ඒ මට මේ සිතවෙයි.

"මේ ආයුෂ්මත්වරු (මෙහි 5 (ii) ඡේදය යෙදිය යුතුයි.) (ii) මම යම් මේ නිෂ්කාම සැපය, දැඩි විවේක සැපය, සිත සන්සිඳීමේ සැපය, මනා අවබෝධයෙන්වූ සැපය පහසුවෙන් ලබන්නේ වෙමි; නිදුකින් ලබන්නේවෙමි, හිරිහැර නැතිව ලබන්නේවෙමි' (කියාය.)

10. "නාගිතය, ඇති පමණ බඩ තදවනතුරු කා, හෝනා සැපයෙහි, පහසේ සැපයෙහි, නින්දේ සැපයෙහි නිතර යෙදුණු භික්ෂූන් මම දකිමි. නාගිත, ඒ මට මේ සිතවෙයි.

"මේ ආයුෂ්මත්වරු මේ නිෂ්කාම සැපය, දැඩි විවේක සැපය, සිත සන්සිඳීමේ සැපය අවබෝධයෙන්වූ සැපය පහසුවෙන් ලබන්නෝ ඇත්තෝ නොවෙත්ද, නිදුකින් ලබන්නෝ ඇත්තෝ නොවෙත්ද, හිරිහැර නැතිව ලබන්නෝ ඇත්තෝ නොවෙත්ද (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) එසේම මේ ආයුෂ්මත්වරු ඇති පමණ බඩ තදවන තුරු කා හෝනා සැපයේ; පහසේ සැපයේ; නින්දේ සැපයේ නිතර යෙදුණෝ වෙසෙත්. (කියාය.)

11. "නාගිත, මෙහි ගම් කෙළවර වසන සිත එකඟව හුන් භික්ෂුවක් මම දකිමි. නාගිත, ඒ මට මේ සිත වෙයි. 'දැන් මේ ආයුෂ්මත්හු අරම් වැස්සෙක්තෙමේ සොයයි. හෙරණෙක් තෙමේ හෝ ඔහු ඒ සිත එකඟ කමින් මුදවායයි' (කියාය.) නාගිත ඒ ගම්කෙළවර විසීමෙන් මම ඒ භික්ෂුවට නොසතුටුවෙමි.

12. "නාගිත, මෙහි කැලෑවෙහි නිදි කිරන අරණ්‍යවාසී භික්ෂුවක් මම දකිමි. නාගිත, ඒ මට මේ සිතවෙයි. 'දැන් මේ ආයුෂ්මත්තෙම මේ නිද්‍රා ක්ලාන්තය දුරුකර එකලාවූ කැලෑවය යන වැටහීමම මෙනෙහි කෙරේය. (යනුයි.) නාගිත, මම ඒ භික්ෂුවට ඒ කැලෑවාසයෙන් සතුටුවෙමි."

13. "නාගිත, මෙහි කැලෑවෙහි සිත එකඟකමක් නැතිව හුන් ආරණ්‍යවාසී භික්ෂුවක් මම දකිමි. නාගිත, ඒ මට මේ සිතවේ. 'දැන් මේ ආයුෂ්මත් තෙමේ එකඟ නොවූ සිත එකඟ කරන්නේ හෝ වේ. එකඟවූ සිත අනුරක්ෂා කරන්නේ වේ නාගිත, මම ඒ භික්ෂුවට ඒ කැලෑබද වාසයෙන් සතුටු වෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

14. "නාගිත, මෙහි කැලෑවෙහි සිත එකඟව හුන් ආරණ්‍යවාසී භික්ෂුවක් මම දකිමි. නාගිත ඒ මට මේ සිතවේ. 'දැන් මේ ආයුෂ්මත් තෙම නොමිදුණු සිත (කෙලෙසුන්ගෙන්) මුදන්නේය. මිදුණු සිත හෝ අනුරකින්නේය. (කියාය) නාගිත මම ඒ භික්ෂුවට ඒ කැලෑ වාසයෙන් සතුටු වෙමි.

15. "නාගිත, මම යම්විටක මහ මගට බටුයේ ඉදිරියෙහි හෝ පස්සෙහි හෝ යම්කිසිවකු නොදකිම්ද, එසමයෙහි මට යටත් පිරිසෙයින් මල මූත්‍ර කිරීමටද පහසුවක් වේ.'

37. **පත්ත නික්කුජ්ජන සූත්‍රය**:- 1. "මහණෙනි, අංග අටකින් යුත් උපාසකයාට සංඝ තෙමේ කැමැත්තේ නම් පාත්‍රය (නිග්‍රහ සඳහා) නමන්නේය.

2. "කවර අටකින්ද යත්? භික්ෂූන්ට අලාභ පිණිස තැත් කෙරේද? භික්ෂූන්ට අවැඩ පිණිස තැත්කෙරේද, භික්ෂූන්ට තැන් නැතිකිරීමට තැත්කෙරේද, භික්ෂූන්ට නින්දා පරිභව කෙරේද, භික්ෂූන් භික්ෂූන් හා බිඳවාද, බුදුන්ට නුගුණ කියාද, ධර්මයට නුගුණ කියාද, සංඝයාට නුගුණ කියාද, (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, අංග අටෙකින් යුත් උපාසකයාට සංඝ තෙමේ කැමැත්තේ නම් පාත්‍රය උඩුකුරු කරන්නේය.

4. "කවර අටෙකින්ද යත්? භික්ෂූන්ට අලාභ පිණිස තැත් නොකෙරේද, භික්ෂූන්ට අවැඩ පිණිස තැත් නොකෙරේද, භික්ෂූන්ට තැන් නැතිකිරීමට තැත් නොකෙරේද, භික්ෂූන්ට නින්දා පරිභව නොකෙරේද, භික්ෂූන් භික්ෂූන් හා නොබිඳුවාද, බුදුන් ගුණ කියාද, ධර්මයට ගුණ කියාද, සංඝයාට ගුණ කියාද (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

38. **අප්පසාද පවෙදන සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු අටකින් යුත් භික්ෂුවට උපාසකවරු කැමැත්තේ නම් අප්‍රසාදය පළකරන්නෝය.

2. "කවර අටකින්ද යත්? ගිහියන්ට අලාභය පිණිස තැත් කෙරේද? ගිහින්ට අවැඩ පිණිස තැත්කෙරේද, ගිහිනට නින්දා

පරිභව කෙරේද, ගිහීන් ගිහියන් හා භෙද කෙරේද, බුදුනට නුගුණ කියාද, ධර්මයට නුගුණ කියාද, සංඝයාට නුගුණ කියාද, නොතන්හි ඔහු දකිත්ද (යනුය.) (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු අටකින් යුත් භික්ෂුවට උපාසකවරු කැමැත්තෝ නම් ප්‍රසාදය පළකරන්නෝය.

4. "කවර කරුණු අටකින්ද යත්? ගිහියන්ට අලාභ පිණිස තැත් නොකෙරේද, ගිහියන්ට අවැඩ පිණිස තැත් නොකෙරේද, ගිහියන්ට නින්දා පරිභව නොකෙරේද, ගිහියන් ගිහියන් හා භෙද නොකෙරේද, බුදුන්ට ගුණ කියාද, ධර්මයට ගුණ කියාද, සංඝයාට ගුණ කියාද, සුදුසු තැනදී ඔහු දකීද, (යනුයි) (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

39. **පටිසාරණීය කම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු අටකින් යුත් භික්ෂුවට සංඝ තෙමේ කැමැත්තේ නම් ප්‍රතිස්මරණීය (සිහිකරවීමේ) දඬුවම කරන්නේය.

2. "කවර අටකින්ද යත්? ගිහියන්ට අලාභය පිණිස තැත් කෙරේද, ගිහියන්ට අවැඩ පිණිස තැත් කෙරේද, ගිහියන්ට නින්දා පරිභව කෙරේද, ගිහියන් ගිහියන් හා භෙද කෙරේද, බුදුන්ට නුගුණ කියාද, ධර්මයට නුගුණ කියාද, සංඝයාට නුගුණ කියාද, ගිහීන්ගේ ධාර්මිකවූද පොරොන්දුව සත්‍ය නොකෙරේද (යනුය) (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

40. **සම්මාවත්තන සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු අටකින් යුත් භික්ෂුවට සංඝ තෙමේ කැමැත්තේ ප්‍රතිස්මරණීය (සිහිකරවීමේ) දඬුවම සන්සිඳුවන්නේය.

2. "කවර කරුණු අටකින්ද යත්? ගිහියන්ට අලාභ පිණිස තැත් නොකෙරේද, ගිහියන්ට අවැඩ පිණිස තැත් නොකෙරේද, ගිහියන්ට නින්දා පරිභව නොකෙරේද? ගිහියන් ගිහියන් හා භෙද නොකෙරේද, බුදුන්ගේ ගුණ කියාද, ධර්මයේ ගුණ කියාද, සංඝයාගේ ගුණ කියාද, ගිහියන්ගේ ධාර්මිකවූ පොරොන්දුව සත්‍ය කෙරේද (යනුය.) (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, "පාපියාසිකා" නම් විනය කර්මය කරනු ලැබූ භික්ෂුව විසින් කරුණු අටක මනාව පැවතිය යුතුය.

4. "උපසම්පදා නොකළ යුතුය. ආශ්‍රය නොකළ යුතුය. සාමණෙරවරු උපස්ථාන නොකළ යුතුය. භික්ෂුණීන්ට අවවාදදීමේ සම්මුතිය බාර නොගත යුතුය. සම්මතවුවද භික්ෂුණීන්ට අවවාද නොදිය යුතුය. කිසිම සංඝ සම්මතයක් භාර නොගත යුතුය. කිසිම වෙන්තැනෙක තැබීමක් නොකළ යුතුය. ඒ මුලින් නොනැගිටවිය යුතුය. (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

(නව වන සති වර්ගය නිමි.)

---

## 10. සාමඤ්ඤ වර්ගය.

බොජ්ඣාය, සිරිමාය, පදුමාය, සුධනාය, මනුජාය, උත්තරාය, මුත්තාය, ඛෙමාය, සොමාය, සොතය, රුචිය, චුන්දිය, බිම්බිය, සුමනාය, මල්ලිකාය, තිස්සාය, තිස්සාවගේ මව්ය, සොණාය, සොණාවගේ මව්ය, කාණාය, කාණාවගේ මව්ය, උත්තරා නම් නන්ද මාතාවය, විශාඛානම් මිගාර මාතාවය බුජ්ජුත්තරා නම් උපාසිකාවය, සාමාවතීනම් උපාසිකාවය, සුප්පවාසා නම් කොළිය දූය, සුප්පියා නම් උපාසිකාවය, නකුල මාතාව නම් ගෘහපති භාර්යාය යනුයි.

(ඉහත දක්වන නාම අනුව මෙහි පහත දක්වන සූත්‍ර මෙන් සූත්‍ර සකස් කළ යුතුයි.)

1. "මහණෙනි, රාගයේ දැන ගැනීම පිණිස කරුණු අටක් වැඩිය යුතුය. කවර අටක්ද? නිවැරැදි දැක්ම, නිවැරදි වචනය, නිවැරදි කල්පනාව, නිවැරදි වෑයම, නිවැරදි කර්මාන්තය, නිවැරදි ආජීවය, නිවැරදි සිහිය, නිවැරැදි සිත එකඟකම යනුය. මහණෙනි රාගයාගේ දැන ගැනීම පිණිස මේ කරුණු අට වැඩිය යුතුය. කවර අටක්ද?

2. "ඇතුළත රූපය යන හැඟීම් ඇත්තේ පිටත කුඩාවූ, මනා නොමනා පැහැ ඇති රූප බලාද, ඒවා මැඩ දනිමියි බලමියි යන මේ හැඟීම ඇත්තේය.

3. "ඇතුළත රූපය යන හැඟීම් ඇත්තේ පිටත අප්‍රමාණවූ, මනා නොමනා පැහැ ඇති රූප බලාද, ඒවා මැඩ දනිමියි බලමියි යන මේ හැඟීම ඇත්තේය.

4. "ඇතුළත රූපය යන හැඟීම් ඇත්තේ පිටත කුඩාවූ, මනා නොමනා පැහැ ඇති රූප බලාද, ඒවා මැඩ දනිමියි බලමියි යන මේ හැඟීම ඇත්තේය.

5. "ඇතුළත රූපය යන හැඟීම් ඇත්තේ පිටත අප්‍රමාණවූ, මනා නොමනා පැහැ ඇති (ii) රූප බලාද, ඒවා මැඩ දනිමියි බලමියි යන මේ හැඟීම ඇත්තේය.

6. (i) "ඇතුළත අරූපය යන හැඟීම් ඇත්තේ පිටත (ii) නිල්වූ නිල්වන්වූ (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) 7. (මෙහි 6 (i) යෙදිය යුතුයි.) රන්වූ රන්වන්වූ (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) 8. (මෙහි 6 (i) යෙදිය යුතුයි.) ලේ වූ ලේ වන්වූ (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) 9. (මෙහි 6 (i) යෙදිය යුතුයි.) සුදුවූ සුදුවන්වූ, සුදට බඳු ආකාර ඇත්තාවූ, සුදට බඳු වැටහීම් ඇත්තාවූ රූප බලාද ඒවා මැඩ දනිමියි බලමියි යන මේ හැඟීම ඇත්තේය. මහණෙනි, රාගයේ දැන ගැණීම පිණිස මේ කරුණු අට වැඩිය යුතුය.

10. "මහණෙනි, රාගයේ දැනගැනීම පිණිස කරුණු අටක් වැඩිය යුතුය. කවර අටක්ද? රූප ඇත්තේ රූපයන් බලාද, ඇතුළත අරූපය යන හැඟීම් ඇත්තේ පිටත රූප බලාද, ශුභයයිම ඇලුණේ වේද, හැම අතින් රූපය යන හැඟීම ඉක්මවා, ද්වේෂ හැඟීම් යටපත් කොට වෙනස්කම් පිළිබඳ හැඟීම් නොසිතා අහස කෙළවරක් නැත්තේයයි ආකාසානඤ්චායතන (අහසේ තැන) නම් පළමුවන අරූප ධ්‍යානයට පැමිණ වෙසේද, හැම අතින් ආකාසානඤ්චායතනය ඉක්මවා සිත කෙළවරක් නැත්තේයයි විඤ්ඤාණඤ්චායතන (සිතේ තැන) නම් දෙවන ධ්‍යානයට පැමිණ වෙසේද, හැම අතින් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිත් නැතැයි ආකිඤ්චඤ්ඤායතන (කිසි නැති තැන) නම් තුන්වන ධ්‍යානයට පැමිණ වෙසේද, හැම අතින් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා

නාසඤ්ඤායතන (හැඟීම නොවේමය, නොහැඟීමක්ද නැත) යන සතරවන ධ්‍යානයට පැමිණ වෙසේද, හැම අතින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධ (හැඟීම්-විඳීම් නැති කළ) සමවතට පැමිණ වෙසේද,

11. "මහණෙනි, රාගය දැනගැනීම පිණිස මේ කරුණු අට වැඩිය යුතුය. මහණෙනි, රාගය පිළිබඳ (තීන්දුකොට) දැනීම පිණිස, සම්පූර්ණයෙන් ගෙවා දැමීමට, නැති කිරීමට, පහ කිරීමට, වැය කිරීමට, නොඇල්මට, නොපැවැත්වීමට හැර දැමීමට, දුරුකිරීමට මේ කරුණු අට වැඩිය යුතුය. (සාමඤ්ඤ වර්ගයේ රාගය වෙනුවට මෙහි පහත දක්වන ද්වෙෂ යනාදිය යොදනු.)

12. "ද්වෙෂය, මොහය, ක්‍රොධය, බද්ධවෛරය ගුණමකුබව, දොස්කීම, ඊර්ෂ්‍යාව, මසුරුකම මායාව, සට බව, ආඩම්බරය, එකටෙක කිරීම, මානය, අතිමානය, මදය, පමාව, මනාව දැනීමට තීන්දුකොට දැනීමට සම්පූර්ණයෙන් ගෙවීමට නැතිකිරීමට, පහකිරීමට, වැයකිරීමට, නොඇල්මට, නොපැවැත්මට, හැරදැමීමට, දුරුකිරීමට මේ කරුණු අට වැඩිය යුතුය."

(අටවන නිපාතය නිමි.)

---

# 9. නවක නිපාතය

## පළමු වෙනි පණ්ණාසකය

## 1 සම්බොධි වර්ගය

1. **සම්බොධි පක්ඛික සූත්‍රයः-** 1. "මහණෙනි, මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජෙතවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් කැඳවූහ. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට 'පින්වතුන් වහන්සැයි' පිළිතුරු දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**2.** "මහණෙනි, ඉදින් අන් තොටු පිරිවැජියෝ 'ඇවැත්නි, සිවුසස් අවබෝධයට හැකිවූ ධර්මයන් වැඩීමට කුමක් හේතුවේ දැයි' ඔබ විචාරන්නාහු නම් ඒ අන් තොටු පිරිවැජියන්ට කුමක් කියන්නහුද?"

**3.** (මේ ඡෙදය 8 නිපාතයේ 9 වර්ගයේ 33 සූත්‍රයේ 2, 3 දෙ මෙනි.)

**4.** "මහණෙනි, ඉදින් අන් තොටු පිරිවැජියෝ සිවුසස් අවබොධ කරණ ධර්මයන්ගේ වැඩීමට කවරක් හේතුවේ දැයි විචාරන්නහුද, මහණෙනි, ඔබ එසේ විචාරන්නාවූ ඒ අන් තොටු පිරිවැජියන්ට මෙසේ ප්‍රකාශ කරව. 'ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුවක් කලණ මිතුරන් ඇත්තේ වේද, කලණ මිතුරන් යහළුවන් කොට ඇත්තේවේද, යහපතට නැමුනෙක් වේද, ඇවැත්නි, සිවුසස් අවබොධ කරණ ධර්මයන්ගේ වැඩීමට මේ පළමුවන හේතුවවේ.

**5.** "ඇවැත්නි, නැවතද භික්ෂුවක් සිල්වත්වේද, පාමොක් සංවරයෙන් සංවරව වසයිද, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව සුළුවරද පවා බියෙන් දකින සුළු සිකපද සමාදන්ව වසයිද, ඇවැත්නි සිවුසස් අවබොධ කරණ ධර්මයන්ගේ වැඩීමට මේ දෙවන හේතුව වේ.

**6.** "ඇවැත්නි, නැවතද භික්ෂුවක් සිල්වත්වේද, (ii) කෙලෙස් ලිහිල් කරණ සිතේ ඉඩ ඇති වීමට හේතුවන අප්පිච්ඡ කථාවය, සන්තුට්ඨි කථාවය, උතුම් විවේකයෙහි කථාවය, අසංසග්ග කථාවය, විරියාරම්භ කථාවය, සීලකථාවය, පඤ්ඤා කථාවය, විමුත්ති කථාවය, විමුත්ති ඤාණදස්සන කථාවය යන මෙබඳු කථාවන් නිතර කැමැත්තෙන් ලබන ලද්දේ වේද, නිදුකින් ලැබීම ඇත්තේවේද, පහසුවෙන් ලැබීම ඇත්තේවේද, (iii) ඇවැත්නි, සිවුසස් අවබොධ කිරීමට පක්ෂවූ ධර්මයන්ගේ වැඩීමට මේ තුන්වන හේතුවවේ.

**7.** "ඇවැත්නි, නැවතද භික්ෂුවක් අකුසල් දහම් නැති කිරීමටද කුසල් දහම් වැඩීමටද ප්‍රාරම්භ වීර්ය ඇතුව වසයිද, ශක්තිය ඇත්තෙක් වෙයිද, දැඩි උත්සාහ ඇත්තෙක් වෙයිද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කුසල් දහම් වැඩීමෙහි නොනැවැත්තු උත්සාහ ඇත්තේ වෙයිද, (ii) ඇවැත්නි, සිවුසස් අවබොධ කරණ ධර්මයන්ගේ වැඩීමට මේ සතරවන හේතුවවේ.

8. "ඇවැත්නි, නැවතද (ii) භික්ෂුවක් ආරියවූ සසර කලකිරීම්වූ මනා කොට දුක් කෙළවර කිරීමට පමුණුවන උදයත්ථය ගාමිණී නැතිවීම ඇතිවීම දෙක අවබෝධ කරවන ලද නුවණින් යුක්තවේද, (iii) ඇවැත්නි, සිවුසස් අවබොධ කිරීමට පක්ෂවූ ධර්මයන්ගේ වැඩීමට මේ පස්වන හේතුවවේ.

9. "මහණෙනි, (ii) කලණ යහලුවන් ඇති යහපතට නැමුණු කලණ මිතුරන් ඇති භික්ෂුව සිල්වත් වන්නේය. පාමොක් සංවරයෙන් සංවරවන්නේය, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව සුළුවරද පවා බියෙන්දක්නා සුළුව ශික්ෂාපදයන් සමාදන්ව හික්මෙන්නේය යන මෙය කැමති විය යුතුය.

10. "මහණෙනි, කලණ යහළුවන් ඇති යහපතට නැමුණු කලණ මිතුරන් ඇති භික්ෂුවක් විසින් (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යන මෙය කැමති විය යුතුය. මහණෙනි, කලණ යහළුවන් ඇති යහපතට නැමුණු කලණ මිතුරන් ඇති භික්ෂුවක් විසින් අකුසල් දහම් නැතිකිරීමටද කුසල් දහම් වැඩීමටද ප්‍රාරම්භ වීර්ය ඇතුව වසයි. ශක්තිය ඇත්තෙක් වෙයි. දැඩි උත්සාහ ඇත්තෙක් වෙයි. කුසල් දහම් වැඩීමෙහි නොනැවැත්තු උත්සාහ ඇත්තෙක් වෙයි යන මෙය කැමති විය යුතුය.

11. (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) ආරියවූ නිබ්බෙධිකවූ (සසර කලකිරවන) මනා කොට දුක් කෙළවර කිරීමට පමුණුවන උදයත්ථය ගාමිනී පඤ්ඤා (ඇතිවීමේ හා නැතිවීමේ තත්ත්වය අවබොධ කරණ නුවණ) යයි කියන ලද නුවණින් යුක්තවේ යයි යන මෙය කැමති විය යුතුය.

12. "මහණෙනි, ඒ භික්ෂුව විසින් මුලින් කියන ලද පඤ්ච ධර්මයන්හි පිහිටා තව ධර්ම සතරක් වැඩිය යුතුය. එනම් රාගය නැති කිරීමට අසුභය වැඩිය යුතුය. ව්‍යාපාදය නැතිකිරීමට මෛත්‍රිය වැඩිය යුතුය. විතක්කය නැති කිරීමට ආනාපානසතිය

වැඩිය යුතුය. මමය යන හැඟීම නැතිකිරීමට අනිච්චසඤ්ඤාව වැඩිය යුතුය. මහණෙනි, අනිච්චසඤ්ඤාව ඇති භික්ෂුවට අනත්තසඤ්ඤාව පිහිටයි. අනත්තසඤ්ඤාව ඇත්තේ මේ අත්බවම නිවණයයි කියනලද මමය යන හැඟීම නැති කිරීමට පමුණුවයි."

**2. නිස්සය සම්පන්න සූත්‍රයඃ-** 1. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පැත්තක හිඳ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය. "ස්වාමීනි, නිස්සය සම්පන්නය නිස්සය සම්පන්නයයි හෙවත් (යමක් නිසා ගුණවත්වූවෙකැයි) කියයි. ස්වාමීනි, කොපමණකින් නිස්සය සම්පන්නයෙක් වේද?"

2. භික්ෂුවෙනි, ශ්‍රද්ධාව නිසා (ii) කුසලය දුරු කරයිද, කුසලය වඩයිද, ඒ නැති කළ අකුසල නැති කළාම වේද, (iii) හිරිය (ලජ්ජාව) නිසා ඔත්තප්පය (පවටබිය) නිසා (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) වීර්ය නිසා (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ප්‍රඥාව නිසා (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඒ භික්ෂුවගේ නැතිවී ගිය ඒ අකුසලය හොඳින්ම නැතිවී ගියාවේද, ඒ භික්ෂුව යමක් ආරිය නුවණින් දැක නැතිකළාද.

3. "භික්ෂුවෙනි, ඒ භික්ෂුව විසින් මේ පස් ආකාර ධර්මයන්හි පිහිටා ධර්ම සතරක් ඇසුරුකොට වාසය කළ යුතුයි ඒ සතර ධර්මයෝ කවරහුද? එක කරුණක් නුවණින් දැන සේවනය කරයි. එක කරුණක් නුවණින් දැන ඉවසයි. එක කරුණක් නුවණින් දැන දුරු කරයි. එක කරුණක් නුවණින් දැන නැති කරයි. භික්ෂුවෙනි, මෙපමණකින් භික්ෂුවක් නිස්සය සම්පන්න වෙයි."

**3. මෙඝිය සූත්‍රයඃ-** 1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ චාලිකා නුවර චාලිකා පර්වතයෙහි වැඩ වෙසෙති එකල්හි ඇවැත්වූ මෙඝිය භික්ෂුව භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායක වෙයි. ඒ කාලයෙහි ඇවැත්වූ මෙඝිය භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එසේ සිටි

ඒ මෙඝිය භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය. "ස්වාමීනි, මම ජන්තුගම පිඬු පිණිස හැසිරීමට කැමැත්තෙමි" (යනුයි.)

2. (එවිට භාග්‍යවතුන් වහන්සේ) "ඔබ යමකට කැමති නම් එයට කල් දනුවයි" වදාළහ. ඉක්බිති ඇවැත්වූ මෙඝිය භික්ෂුව පෙරවරු කාලයෙහි සිවුරු හැඳ පොරවා, පාත්‍ර සිවුරු ගෙණ ජන්තුගම පිඬු පිණිස පිවිසියේය. ජන්තුගමෙහි පිඬු පිණිස හැසිර පස්වරු පිණ්ඩපාතයෙන් වැලකීයේ කිමිකාලා නම් ගංඉවුර යම්තැනකද එහි පැමිණියේය. ඇවැත්වූ මෙඝිය භික්ෂුව කිමිකාලා නම් ගංතෙර ඔබිමොබ පයින් ඇවිදින්නේ ඉතා සිත්කලු අඹ උයනක් දැක්කේය. ඒ අඹඋයන දුටු මෙඝිය භික්ෂුවට මෙබඳු සිතක් උපන්නේය. 'මේ අඹඋයන ඉතා සිත්කලුය. (ii) කෙලෙස් නැසීමට කරණ උත්සාහයෙන් ප්‍රයෝජනය ඇති කුලපුතෙකුට මේ අඹ උයන ඉතා ප්‍රයෝජනවත්ය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ කැමතිවනසේක් නම් මේ අඹඋයනට පධන් වීර්යය (කෙලෙස් නසන වීර්යය) කිරීමට පැමිණෙන්නෙමියි' (සිතීය.)

3. ඉක්බිති ඇවැත්වූ මේඝිය තෙර භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක පැත්තක උන්නේය. එකපැත්තක හුන් මේඝියතෙර භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීය. "ස්වාමීනි, මම මෙහි පෙරවරු කල සිවුරු හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙණ ජන්තුගම පිඬු පිණිස පිවිසියෙමි. ජන්තුගමේ පිඬු පිණිස හැසිර පස්වරු පිණ්ඩපාතයෙන් වැළකියේ කිමිකාලා නම් ගංඉවුර යම්තැනකද එහි පැමිණියෙමි. ඒ කිමිකාලා නම් ගංඉවුර තෙර පයින් ඇවිදින විට ඉතා සිත්කලු අඹඋයනක් දුටුයෙමි. ඒ අඹඋයන දැක මට මෙබඳු සිතක් ඇතිවිය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) කියායි. "මේඝිය, මඳක් බලාපොරොත්තුවෙව. තනිව යාමට වඩා අනික් භික්ෂුවක්ද හමුවන තුරු බලාපොරොත්තුවෙව."

4. දෙවනුවද ඇවැත්වූ මේඝිය භික්ෂුව (ii) භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට මේ ශරීරය පිළිබඳව මත්ත ගැණ කළයුතු දෙයක් නැත.

කළදෙයක් පිළිබඳ සකස්කළයුතු තැනක්ද නැත. ස්වාමීනි, මට නම් මේ ශරීරය පිළිබඳව මත්ත ගැණ කළයුතු දෙයකුත් ඇත. කළදෙය පිළිබඳව සකස්කළයුතු තැන්ද ඇත. ඉදින් මට භාග්‍යවතුන් වහන්සේ අනුදන්නා සේක් නම් පධන්වීර්යය කිරීමට අඹවනයට යන්නෙමියි" (සිතීය.) "මේඝියය. ඔබ තනිය තව අන් භික්ෂුවක් ලැබෙනතුරු බලාපොරොත්තු වෙව."

**5.** තුන්වෙනුවද මේඝිය භික්ෂුව (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) "මේඝිය ඔබ යමකට හෙවත් යම් පධන් වීර්යයකට කල් ඉල්ලන්නේද ඒ 'පධාන වීර්යය'යි. යමෙක් යමකට කියයිනම් ඒ කුමකට කියයිද? ඉක්බිති ඇවැත්වූ මේඝිය භික්ෂුව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණුකොට ඒ අඹවනය යම්තැනකද එහි පැමිණ ඒ අඹ වනයට ඇතුල්ව එක්තරා රුකක්මුල දවල් කල් ගතකිරීමට හුන්නේය. ඉක්බිති ඒ අඹවනයෙහි වාසයකරන්නාවූ මේඝිය භික්ෂුවට කාමවිතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක යන අකුසල විතක්ක (කල්පනා තුන්දෙනෙක් සිතේ ඇතිවන්ටවූහ.

**6.** ඉක්බිති ඇවැත්වූ මේඝිය භික්ෂුවට මේ සිත ඇති විය. ආශ්චර්යයෙක පුදුමයෙක. මම ගිහිගෙන් නික්ම සස්නෙහි සැදැහැයෙන් පැවිදිවීමි. නමුත් කාමවිතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක යන තුන් සිතිවිලිවලින් ගැවසී ගත්තේය. ඉක්බිති ඇවැත්වූ මේඝිය භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එහි එළඹ උන්වහන්සේ වැඳ එක පැත්තක හිඳගත්තේය. එකපැත්තක හුන් ඇවැත්වූ මේඝිය භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීය.

**7.** "ස්වාමීනි, ඒ අඹඋයනෙහි වසන මට අකුසලවිතක්ක හෙවත් අකුසල කල්පනාවන් තුන්දෙනෙක් සිතේ හටගත්හ. ඔහු කවරහුද? කාම විතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක යන තුනය. ස්වාමීනි, එවිට මට මෙබඳු අදහසක් ඇතිවිය. ආශ්චර්යයෙකි. පුදුමයෙකි. මම සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවීමි. නමුත් මම කාමවිතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක යන තුන් ආකාර විතර්කයන්ගෙන් ගැවසී ගත්තේ වෙමි."

8. "මේඝියය, සිත අකුසලයන්ගෙන් මිදීම නොමේරූ කල්හි එය මේරීම පිණිස ධර්ම පස්දෙනෙක් වෙත්. ඒ පස කවරහුද? මේඝියෙනි, භික්ෂුවක් මේ ලෝකයෙහි කලණ මිතුරන් ඇත්තේවේද, කලණ යහලුවන් ඇත්තේවේද, යහපතට නැමුනේවේද, මේඝියෙනි, නොමේරූ චිත්ත විමුක්තියගේ මේරීම පිණිස මෙය පළමුවන ධර්මයක්ව පවතී.

9. "නැවතද, මේඝියෙනි, භික්ෂුවක් සිල්වත් වේද පාමොක් සංවරයෙන් සංවරවේද, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවේද, සුළුවරද පවා බියෙන් දක්නාසුළුව සික පද සමාදන්ව වාසයකරයිද, මේඝියෙනි, නොමේරූ චිත්ත විමුක්තියගේ මේරීම පිණිස මෙය දෙවන ධර්මයක්ව පවතී.

10. "නැවතද මේඝියෙනි, භික්ෂුවක් කෙලෙස් ලිහිල් කරණ සිතේ ඉඩ ඇතිකිරීමට හේතුවන යම් කථාවෝ වෙත්ද ඔහු කවරහුද? (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 6 ඡේදයේ "අප්පිච්ඡ කථාවය" යන තැන් සිට "පහසුවෙන් ලැබීම ඇත්තේවේද" දක්වා යෙදිය යුතුයි.) මේඝියෙනි, නොමේරූ චිත්ත විමුත්තියගේ මේරීම පිණිස මෙය තුන්වන ධර්මයක්ව පවතී.

11. (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 7 (i) යෙදිය යුතුයි. 'ඇවැත්නි' වෙනුවට 'මේඝියෙනි' යෙදිය යුතුයි.) 'මේඝියෙනි, නොමේරූ චිත්ත විමුත්තියගේ මේරීම පිණිස මෙය සතරවන ධර්මයක්ව පවතී.

12. "නැවතද මේඝියෙනි, (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 8 (ii) යෙදිය යුතුයි.) මේඝියෙනි, නොමේරූ චිත්ත විමුත්තියගේ මේරීම පිණිස මෙය පස්වන ධර්මයක්ව පවතී.

13. "මේඝියෙනි, කලණ මිතුරන් ඇති (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 9 (ii) යෙදිය යුතුයි.) (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 10 ඡේදය යෙදිය යුතුයි. "මහණෙනි" වෙනුවට "මේඝියෙනි" විය යුතුයි.)

14. "මේඝියෙනි, කලණ මිතුරන් ඇති කලණ යහලුවන් ඇති යහපතට නැමුණු භික්ෂුවක් විසින් ආර්යවූ නිබ්බෙධික

(සසර කලකිරවන) මනාකොට දුක් කෙලවර කිරීමට පමුණුවන උදයත්ථ ගාමිණිපඤ්ඤාවෙන් යුක්තවූවෙක් වන්නේය යන මෙය කැමති විය යුතුය. මේඝියෙනි, ඒ භික්ෂුව විසින් මේ පස් ආකාර ධර්මයන්හි පිහිටා සතර ධර්ම කෙනෙක් මත්තෙහි වැඩියයුතු රාගය නැතිකිරීමට අසුභය වැඩිය යුතු ව්‍යාපාද නැතිකිරීමට මෛත්‍රිය වැඩිය යුතු. විතක්කය නැති කිරීමට ආනාපාන සතිය වැඩිය යුතු. අස්මිමානය (මමය යන හැඟීම) නැතිකිරීමට අනිච්ච සඤ්ඤාව වැඩිය යුතු. මේඝියෙනි, අනිච්ච සඤ්ඤාව ඇත්තාහට අනත්ත සඤ්ඤාව පිහිටයි. අනත්ත සඤ්ඤාව ඇත්තේ මේ ආත්මයේදීම නිවන් ලැබීමයයි කියන අස්මිමානය (මමය යන හැඟීම) නැතිකිරීමට පමුණුවයි.”

4. **නන්දක සම්පන්න සූත්‍රයඃ-** 1. “එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසල අනේපිඬු සිටානන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසති. එකල්හි ආයුෂ්මත් නන්දකතෙර උපට්ඨාන ශාලාවෙහි භික්ෂූන්ට දැහැමි කථාවෙන් කරුණු දක්වයි. දැහැමි කථාවට සමාදන් කරවයි. දැහැමි කථාවෙන් සිත තියුණු කරවයි. දැහැමි කථාවෙන් සිත සතුටු කරවයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි පලසමවතින් නැගිට උපට්ඨාන ශාලාවට පැමිණියහ. ඒ උපට්ඨාන ශාලාවට පැමිණ නන්දක තෙරුන්ගේ කථා අවසානය බලාපොරොත්තු වෙමින් දොරටුවෙන් පිට සිටියහ.

2. ‘ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නන්දක තෙරුන්ගේ කථාව අවසන්වූ බව දැන උකැස (කාරා) යතුර තියෙන තැනට තට්ටු කළහ. එකල භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට දොරහළහ. එකල භාග්‍යවතුන් වහන්සේ රැස්වීම් ශාලාවට පැමිණ පනවන ලද අසුන්හි වැඩහුන්හ. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ආයුෂ්මත් නන්දක තෙරුන්ට මෙසේ කීහ.

3. “නන්දකය, භික්ෂූන්ට කළ ඔබගේ දැහැමි කථාව දිගය. ඒ කථාවේ අවසානය බලාපොරොත්තු වෙමින් දොරටුවෙන් පිටත සිටි මාගේ පිටේ රුදාව සෑදුනේය. “මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් නන්දකතෙර ඉතා කණගාටු ස්වභාවයට පැමිණ

භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය. ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේ දොරටුවෙන් පිට සිටින බවක් නොදන්නෙමු. ඉදින් අපි භාග්‍යවතුන් වහන්සේ දොරටුවෙන් පිට සිටින බවක් දන්නෙමු නම් එතරම් කථාව දික් නොකරන්නෙමු.

4. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නන්දක තෙර කණගාටුවට පැමිණි බව දැන ආයුෂ්මත් නන්දක තෙරුන්ට මේ කාරණය කීහ. "නන්දකය, සාධු, සාධු, ඔබ වැනි අය දැහැමි කථාවකින් යුක්තව හුන්නහුද? සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවූ ඔබ වැනි කුල පුතුන්ට මෙය ඉතාම සුදුසුය. නන්දකය, රැස්වූවන් විසින් දෙකක් කළ යුතුය. එනම් දැහැමි කථාව හෝ උතුම් නිශ්ශබ්ද බවයි. නන්දකය, භික්ෂුවක් සැදැහැ ඇත්තෙක්ව සිල්වත් නොවෙයිද, එසේ ඔහු ඒ කරුණෙන් සම්පූර්ණ නොවූවෙක් වෙයි. ඔහු විසින් 'මම සැදැහැවතෙක් සහ සිල්වතෙක් වූයෙම්දැයි' කියා ඒ කරුණ සම්පූර්ණ කළ යුතුය. නන්දකය, යම්හෙයකින් ඒ භික්ෂුව සැදැහැවතෙක් සහ සිල්වතෙක් වූයේද එසේ ඒ භික්ෂුව සැදැහැවතෙක් සහ සිල්වතෙක් වූයේ වෙයිද, ඒ භික්ෂුව ඒ කරුණෙන් සම්පූර්ණ වූයෙක් වෙයි. නන්දකය, යම්හෙයකින් භික්ෂුවක් සැදැහැවතෙක් සහ සිල්වතෙක්වද සිත පිළිබඳ චෙතො සමථයාගේ ලැබීම ඇත්තෙක් නොවේද මෙසේ ඔහු ඒ කරුණෙන් සම්පූර්ණ නොවූයෙක් වෙයි. ඒ භික්ෂුව විසින් 'කිම මම සැදැහැවතෙක් හා සිල්වතෙක් වීමි. සිත පිළිබඳ සිත කෙලෙස් වලින් සංසිඳවීම ලැබීම ඇත්තෙක් නොවූයෙමියි, ඒ කරුණ සම්පූර්ණ කළයුතුය. නන්දකය, භික්ෂුවක් සැදැහැවතෙක් හා සිල්වතෙක්ව සිත පිළිබඳ චෙතො සමථයාගේ ලැබීම ඇත්තෙක් වෙයිද ඔහු මෙසේ ඒ කරුණෙන් සම්පූර්ණ වූයෙක් වෙයි.

5. "නන්දකය, භික්ෂුවක් සැදැහැවතෙක්ව සිල්වතෙක්ව සිත පිළිබඳ චෙතො සමථයාගේ ලැබීම ඇත්තෙක්ව අධිපඤ්ඤ ධම්ම විපස්සනාවගේ (මගඵල දහමකගේ) ලැබීම ඇත්තෙක් නොවෙයිද, මෙසේ ඒ භික්ෂුව ඒ කරුණෙන් සම්පූර්ණ නොවූයෙක් වෙයි.

"නන්දකය, යම්සේ සිවුපා සතෙකුගේ එක පාදයක් කොට වේද ඔහු ඒ කොටසෙන් සම්පූර්ණ නොවූයෙක් වන්නේද, නන්දකය එමෙන් භික්ෂුවක් සැදැහැවතෙක් වෙයිද, සිල්වතෙක් වෙයිද, සිත පිළිබඳ චෙතො සමථයාගේ ලැබීම ඇත්තෙක් වෙයිද, අධිපඤ්ඤා ධම්ම විපස්සනාව (මගපල) නොලැබීම ඇත්තෙක් වෙයිද ඔහු ඒ කරුණෙන් සම්පූර්ණ නොවූයෙක් වෙයි. ඔහු විසින් ඒ කරුණ සම්පූර්ණ කළයුතු (කෙසේද?) 'මම සැදැහැවතෙක් වීමි. සිල්වතෙක් වීමි සිත පිළිබඳ චෙතො සමථයාගේ ලැබීම ඇත්තෙක් වීමි. නමුත් අධිපඤ්ඤ විපස්සනාවගේ ලැබීම ඇත්තෙක් නොවීමි' (කියායි) නන්දකය, යම් හෙයකින් භික්ෂුවක් සැදැහැවතෙක් වේද, සිල්වතෙක් වේද, සිත පිළිබඳ චෙතො සමථයාගේ ලැබීම ඇත්තෙක් වේද, අධිපඤ්ඤා ධම්ම විපස්සනාවගේ ලැබීම ඇත්තෙක් වේද, ඔහු ඒ කරුණෙන් සම්පූර්ණ වූයෙක් වෙයි.' භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය දෙසනා කොට ආසනයෙන් නැගිට විහාරයට වැඩියහ.

**6.** "ඉක්බිති ආයුෂ්මත් නන්දක භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ වැඩිය නොබෝ වේලාවකින් භික්ෂූන් අමතා, "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ 'නන්දකය භික්ෂුවක් සැදැහැවතෙක් වේද, ඒ භික්ෂුව ඒ කරුණෙන් සම්පූර්ණ වූයෙක් වේය (යනාදී වසයෙන්) කරුණු සතරකින් සියල්ලෙන් සම්පූර්ණ පිරිසිදු බඹසර (සාසනය) ප්‍රකාශ කොට ආසනයෙන් නැගිට විහාරයට වැඩියහ."

**7.** "ඇවැත්නි, සුදුසු කල ධර්ම සාකච්ඡාවෙහි අනුසස් පසෙකි. ඒ පස කවරහුද? මහණෙනි, මේ සාසනයෙහි භික්ෂුවක් (ii) මුල යහපත්වූ, මැද යහපත්වූ, අවසානය යහපත්වූ අර්ථ සහිත ව්‍යඤ්ජන (අකුරු) සහිත සියලු ආකාරයෙන් සම්පූර්ණ පිරිසිදු බඹසර ප්‍රකාශකරයිද, (iii) ඇවැත්නි, භික්ෂුවක් භික්ෂූන්ට යම් යම් පරිද්දෙකින් (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ඒ ඒ පරිද්දෙන් ඔහුට ශාස්තෘහු හෙවත් අනුශාසක තෙම ප්‍රිය මනාප ගරු භාවනීය වෙයි. ඇවැත්නි, සුදුසු කල දහම් ඇසීමෙහි හා ධර්ම සාකච්ඡාවෙහි මේ පළමුවන ආනිසංසයයි.

8. "ඇවැත්නි, නැවතද භික්ෂුවක් භික්ෂූන්ට (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ඇවැත්නි, භික්ෂුවක් භික්ෂූන්ට (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ඒ ඒ පරිද්දෙන් ඒ භික්ෂුව ඒ ධර්මයෙහි අර්ථය දන්නේවේද, ධර්මය දන්නේ වේද මෙම සුදුසු කල දහම් ඇසීමෙහි හා ධර්ම සාකච්ඡාවෙහි දෙවන ආනිසංසයයි.

9. "ඇවැත්නි, නැවතද භික්ෂුවක් භික්ෂූන්ට (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ඇවැත්නි, භික්ෂුවක් භික්ෂූන්ට යම් යම් පරිද්දෙකින් (මෙහි 7 (ii) යෙදිය යුතුයි. ඒ ඒ පරිද්දෙන් ඒ භික්ෂුව ඒ ධර්මයෙහි ගැඹුරු අරුත් පද නුවණින් විමසා බලයිද, ඇවැත්නි මේ සුදුසු කල දහම් ඇසීමෙහි ධර්ම සාකච්ඡා කිරීමෙහි තුන්වන ආනිසංසයයි.

10. "ඇවැත්නි, නැවතද භික්ෂුවක් භික්ෂූන්ට (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ඇවැත්නි, භික්ෂුවක් භික්ෂූන්ට යම් යම් පරිද්දෙකින් (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ඒ ඒ පරිද්දෙන් හෙවත් ඒ දෙසූ ආකාරයෙන් ඒ සබ්‍රම්සරු (භික්ෂූහු) පසුවත් ඒකාන්තයෙන් මේ ආයුෂ්මත් තෙම මගපල පැමිණියෙක් හෝ පැමිණීමට බලාපොරොත්තුවූයෙක් හෝ වේයයි වර්ණනා කරත්. ඇවැත්නි, මේ සුදුසු කල දහම් ඇසීමෙහි හා ධර්ම සාකච්ඡාවෙහි සතරවන ආනිසංසයයි.

11. "නැවතද, ඇවැත්නි, භික්ෂුවක් භික්ෂූන්ට (මෙහි 7 (ii) යෙදිය යුතුයි) ඇවැත්නි, යම් යම් පරිද්දෙකින් භික්ෂුවක් භික්ෂූන්ට (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ඒ ඒ තන්හි සේඛ (රහත් බවට නොපැමිණි, රහත් බව පතමින් වාසය කරණ) භික්ෂූහු වෙත්ද, ඒ භික්ෂූහු ඒ ධර්මය අශ්‍රු නොපැමිණි රහත් බවට පැමිණීම පිණිස, අවබෝධ නොකළ ධර්මය අවබෝධ කිරීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකළ ධර්මය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්ය කරත්. එහි යම් රහත්වූ ආසවයන් නැති කළ, බඹසර වැස නිමවූ, සතර මාර්ගයෙන් කළ යුතු කෘත්‍ය කළ, ස්කන්ධාදී බර බහා තැබූ ස්වාර්ථයවූ රහත් බවට පැමිණි, භව බන්ධන නැතිකළ මනාකොට දැන සසරින් මිදුනු රහත්හු වෙත්ද, ඔවුහු ඒ ධර්මය අසා මේ අත්බැව්හි සැප විහරණයෙහි යෙදී වසත්. ඇවැත්නි

මේ සුදුසු කල දහම් ඇසීමෙහි හා ධර්ම සාකච්ඡාවෙහි පස්වන ආනිසංසයයි ඇවැත්නි, මේ සුදුසු කල දහම් ඇසීමෙහි හා ධර්ම සාකච්ඡා වෙහි අනුසස් පසවේ.”

**5. බලසංගහවත්ථු සූත්‍රයඃ-** 1. “මහණෙනි, මේ බල සතර දෙනෙකි. කවර සතරක්ද? පඤ්ඤා බලය විරිය බලය, අනවජ්ජ බලය, සංගහ බලය යන සතරයි.

2. “මහණෙනි, පඤ්ඤාබලය කවරීද? අකුසල්වූ අකුසල නම් වූ යම් ධර්ම කෙනෙක් වෙත්ද? කුසල්වූ කුසල නම් මේ ධර්මකෙනෙක් වෙත්ද, සාවද්‍ය (වැරදි සහිත) සාවද්‍ය නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, අනවද්‍ය (වැරදි නැති) අනවද්‍ය නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, කණ්‍ණ (කලු) කණ්‍ණ නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, සුක්ක (සුදු) සුක්ක නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, අසෙවිතබ්බ (සේවනය නොකළ යුතු) අසෙවිතබ්බ නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, සෙවිතබ්බ (සේවනය කළ යුතු) සෙවිතබ්බ නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, නාලමරිය (ආර්ය භාවය කිරීමට සුදුසු බවක් නැති) නාලමරිය නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, අලමරිය (ආර්යභවය කිරීමට සුදුසු බවක් ඇති) අලමරිය නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, ඒ ධර්මයෝ ඔහුගේ ප්‍රඥාවෙන් දක්නා ලද්දාහු වෙත්ද, පුරුදු කරණ ලද්දාහු වෙත්ද, මහණෙනි, මේ පඤ්ඤාබලයයි කියනු ලැබේ.

3. “මහණෙනි, විරියබලය කවරේද? අකුසල්වූ අකුසල නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, සාවජ්ජ වැරදි සහිත සාවජ්ජ නම් යම් ධර්මකෙනෙක් වෙත්ද, කණ්හ (කලු) කණ්හ නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, අසෙවිතබ්බ (සේවනය නොකළයුතු) අසෙවිතබ්බ නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, නාලමරිය (ආර්යභාවයක් කිරීමට සමත් නොවූ) නාලමරිය නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, ඒ ධර්මයන්ගේ නැති කිරීම පිණිස කැමැත්ත උපදවයිද, ව්‍යායාම් කරයිද, වීර්ය පටන් ගනීද, සිත දැඩි කොට ගනීද, පධන් වීර්ය කරයිද, කුසල්වූ කුසල නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, අනවජ්ජ (වැරදි නැති) අනවජ්ජ නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, සුක්ක (සුදු) සුක්ක නම් යම් ධර්ම

කෙනෙක් වෙත්ද සෙවිතබ්බ (සේවනය කළයුතු) සෙවිතබ්බ නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, අලම,රිය (ආර්යභාවය කිරීමට සමත්) අලමරිය නම් යම් ධර්ම කෙනෙක් වෙත්ද, ඒ ධර්මයන්ගේ ලැබීම පිණිස කැමැත්ත උපදවයිද, ව්‍යායාම කරයිද, වීර්ය පටන් ගනීද සිත දැඩි කොට ගණීද, පධන් වීර්යය කරයිද, මහණෙනි, මේ වීර්ය බලයයි.

4. "මහණෙනි, අනවජ්ජ බලය කවරේද? මහණෙනි, මේ සාසනයෙහි අරියසාවක තෙම නිවැරැදි කාය කර්මයෙන් යුක්ත වෙයිද, නිවැරැදි වාක්කර්මයෙන් යුක්ත වෙයිද, නිවැරැදි මනොකර්මයෙන් යුක්ත වෙයිද, මහණෙනි, මේ අනවජ්ජ බලයයි කියනු ලැබේ.

5. "මහණෙනි, සංගහ බලය කවරේද? මහණෙනි, මේ සංගහ වත්ථු සතරකි. දානය, ප්‍රිය වචනය කීමය, අත්ථචරියාය සමානන්තතා (යන සතරය) මහණෙනි, දානයන් අතුරෙන් යම් මේ ධර්ම දානයක් වෙයිද, එය අග්‍රයි. මහණෙනි, ප්‍රිය වචන කීම් අතුරෙන් ප්‍රයෝජනය ඇති කන් මෙහෙය වන්නෙකුට දහම් දෙසයිද මෙය අග්‍රයි. මහණෙනි අත්ථචරියාවන් අතුරෙන් යම් මේ සැදැහැත්තෙකු සද්ධා සම්පදාවෙහි සමාදන් කරවාද යොදවාද පිහිටුවාද දුසිල්වූවෙකු සිල්සම්පදාවෙහි සමාදන් කරවාද යොදවාද පිහිටුවාද මසුරෙකු චාග සම්පදාවෙහි සමාදන් කරවාද යොදවාද, පිහිටුවාද, නුවණනැත්තෙකු පඤ්ඤා සම්පදාවෙහි සමාදන් කරවාද යොදවාද පිහිටුවාද මෙය අග්‍රයි. මහණෙනි, සමානත්තතාවන් අතුරෙන් යම්තම් සෝතාපන්නයෙක් සෝතාපන්නයෙකුට සමානත්තවේද, සකදාගාමියෙක් සකදාගාමියෙකුට සමානත්තවේද, අනාගාමියෙක් අනාගාමියෙකුට සමානත්තවේද, රහත් පුද්ගලයෙක් රහත් පුද්ගලයෙකුට සමානත්තවේද, මෙය අග්‍රයි. මහණෙනි, මේ සංගහ බලයයි. මහණෙනි, මේ බල සතර දෙන වෙත්.

6. මහණෙනි, මේ සතර බලයන්ගෙන් යුත් අරියසාවක තෙම බියපසක් ඉක්මවූයේ වෙයි. ඒ බියපස කවරහුද? ආජීවක

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

භය, අසිලෝක භය, පරිසසාරජ්ජ භය, මරණ භය, දුගති භය, (යන පසයි)

7. "මහණෙනි, ඒ අරියසාවකතෙම මෙසේ කල්පනාකරයි. මම ආජීවික ජීවත්වීමට බිය නොවෙමි, කවරහෙයින් ආජීවික භයට බියවෙම්ද, මට පඤ්ඤා බලය, විරිය බලය, අනවජ්ජ බලය, සංගහබලය, යන බල සතරක් ඇත. නුවණ නැත්තෙක් ආජීවික භයට බියවෙයි. කුසීතයෙක් ආජීවික භයට බියවෙයි. වැරදි සහිත කායකර්ම ඇත්කේ වාක්කර්ම ඇත්තෙක් මනොකර්ම ඇත්තෙක් ආජීවික භයට බියවෙයි. සංග්‍රහ නොකරන්නෙක් ආජීවක භයට බියවෙයි. මම අසිලොක (අකීර්ති) භයට බියනොවෙමි. මම පරිසසාරජ්ජ (පිරිසේ නොඇල්මට) බිය නොවෙමි. මම මරණ භයට බිය නොවෙමි. මම දුගති භයට බිය නොවෙමි. මට පඤ්ඤාබලය, විරිය බලය, අනවජ්ජ බලය, සංග්‍රහ බලය යන බල සතරක් ඇත. නුවණැත්තෙක් දුග්ගති භයට බිය වෙයි, කුසීතයෙක් දුග්ගති භයට බියවෙයි, සාවජ්ජ (වැරදි සහිත) කායකර්ම ඇත්තෙක් වාක්කර්ම ඇත්තෙක් මනො කර්ම ඇත්තෙක් දුගති භයට බියවෙයි, සංග්‍රහ නොකරන්නෙක් දුගති භයට බියවෙයි, මහණෙනි, මේ බල සතරෙන් යුත් අරිය සාවකතෙම මේ භය පස ඉක්මවූයේවෙයි."

**6. සෙවිතබ්බා සෙවිතබ්බ සූත්‍රය**:- 1. එකල්හි වනාහි ඇවැත්වූ සැරයුත්තෙරුන් වහන්සේ "ඇවැත්වූ මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. "ඇවතයයි" ඒ භික්ෂූහු ඇවැත්වූ සැරියුත් තෙරුන්ට පිළිවදන් දුන්හ. ඇවැත්වූ සැරියුත්තෙර මේ සූත්‍රය දෙසූහ.

2. "ඇවැත්නි, පුද්ගලයාද දෙයාකාරයකින් දතයුතුය. සේවනය කළ යුතු පුද්ගලයාය, සේවනය නොකළ යුතු පුද්ගලයාය, (කියායි.) (ii) ඇවැත්නි, සිවුරද දෙයාකාරයකින් දත යුතුය. පරිභොග කළ යුතු සිවුරය, පරිභොග නොකළයුතු සිවුරය (කියායි.) ඇවැත්නි, පිණ්ඩපාතයද දෙයාකාරයකින් දතයුතුය. පරිභොග කළ යුතු පිණ්ඩපාතය, පරිභොග

නොකළයුතු පිණ්ඩපාතය කියායි. ඇවැත්නි, සෙනසුනද දෙයාකාරයකින් දතයුතුය, සේවනය කළ යුතු සෙනසුනය, සේවනය නොකළ යුතු සෙනසුනය කියායි. ඇවැත්නි, ගම හා නියම්ගමද දෙයාකාරයකින් දතයුතුය. සේවනය කළ යුතුය. සේවනය නොකළ යුතුය (කියායි.) ඇවැත්නි, ජනපදයද දෙයාකාරයකින් දතයුතුය. සේවනය කළයුතු ජනපද පෙදෙසය සේවනය නොකළයුතු ජනපද පෙදෙසය (කියායි.)

3. (මෙහි 2 (i) යෙදිය යුතුයි) (ii) "එහි යම් පුද්ගලයකු ගැණ මේ පුද්ගලයා සේවනය කරන්නාවූ මාගේ අකුසල වැඩෙත්, කුසල් පිරිහෙත් යයි දන්නේද පැවිදිවූ මා විසින් සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර යන දිවිපැවැත්වීමට උවමනා පිරිකර රැස්කරගත යුතුද (iii) ඒවාද දුකසේ රැස්කරගත යුත්තාහු වෙත්ද (iv) යමක් නිසා මම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවූයෙම්ද මට ඒ පැවිද්දේ අර්ථය භාවනාවෙන් සම්පූර්ණ නොවේද, ඇවැත්නි, ඒ පුද්ගලයා විසින් අර පුද්ගලයාට රැයක හෝ දවාලක නොකියාම යා යුතුය. එලවා නොයා යුතුය.

4. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) ඒ වාද පහසුවෙන් රැස්වෙත්ද (මෙහි 3 (iv) යෙදිය යුතුයි.)

5. "එහි යම් පුද්ගලයෙකු ගැණ මේ පුද්ගලයා සේවනය කරණ මාගේ අකුසල් දහම් පිරිහෙත්. කුසල් දහම් වැඩෙත් යයි දන්නේ පැවිදිවූ මා විසින් සිවුරු පිණ්ඩපාත ගිලන්පස බෙහෙත් පිරිකර යන දිවි පැවත්වීමට උවමනා පිරිකර (ද්‍රව්‍ය) රැස්කරගත යුතුද ඒවාද පහසුවෙන් රැස්වෙත්ද යමක් නිසා මම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවූයෙම්ද, මාගේ ඒ පැවිදිවීමේ අර්ථයද භාවනා කිරීමෙන් සම්පූර්ණවීමට යෙයි. ඇවැත්නි, ඒ පුද්ගලයා විසින් (ඒ) අර පුද්ගලතෙම දිවි ඇතිතාක් ලුහුබැන්ද යුතුය. එලවාදැම්මත් නොයායුතුය. ඇවැත්නි, සේවනය කළයුතු පුද්ගලයාය සේවනය නොකළ යුතු පුද්ගලයායයි පුද්ගලයා දෙයාකාරයකින් දතයුතුයයි යමක් කියන ලද නම් එය මේ නිසා කියන ලදී.

6. "ඇවැත්නි, සිවුරු දෙයාකාරයකින් දතයුතුය. සේවනය කළයුතු සිවුරය, සේවනය නොකළයුතු සිවුරය (කියායි) මෙසේ වනාහි මෙය කියන ලද්දේය. මෙය කුමක් නිසා කියනලදද? එහි යම් සිවුරක් ගැණ මේ සිවුරු පරිභොග කරණ ලද මාගේ අකුසල් දහම් වැඩෙත්, කුසල් දහම් පිරිහෙත්යයි දන්නේද, එබඳු සිවුරක් පරිභොග නොකළ යුතුය. එහි යම් සිවුරක් ගැණ මේ සිවුර පරිභොග කරණ මාගේ අකුසල් දහම් පිරිහෙත්. කුසල් දහම් වැඩෙත්යයි දන්නේද, එබඳු සිවුරක් පරිභොග කළයුතු. ඇවැත්නි, පරිභොග කළ යුතු සිවුරය, පරිභොග නොකළයුතු සිවුරයයි මෙසේ යමක් කියන ලදද එය මේ නිසා කියන ලදී.

7. "ඇවැත්නි, පිණ්ඩපාතයද අනුභව කළයුතු පිණ්ඩපාතය අනුභව නොකළයුතු පිණ්ඩපාතයයි දෙයාකාරයකින් දතයුතුය. මෙසේ මෙය කියන ලදී. කුමක් නිසා මෙය කියන ලදද? එය යම් පිණ්ඩපාතයක් ගැණ මේ පිණ්ඩපාතය අනුභව කරන්නාවූ මාගේ අකුසල් දහම් වැඩෙත්. කුසල් දහම් පිරිහෙත්යයි දන්නේද, එබඳු පිණ්ඩපාතය අනුභව නොකළ යුතුය. එහි යම් පිණ්ඩපාතයක් ගැණ මේ පිණ්ඩපාතය අනුභව කරන්නාවූ මාගේ අකුසල් දහම් පිරිහෙත්, කුසල් දහම් වැඩෙත්යයි දන්නේද, එබඳු පිණ්ඩපාතය අනුභව කළ යුතුය. ඇවැත්නි, පිණ්ඩපාතයද අනුභව කළයුතුය, අනුභව නොකළ යුතුයයි දෙයාකාරයකින් දක්වන ලද්දේයයි මෙසේ යමක් කියන ලදද එය මේ නිසා කියන ලදී.

8. "ඇවැත්නි, සෙනසුනද සේවනය කළයුතුය, සේවනය නොකළ යුතුයයි දෙයාකාරයකින් දතයුතුය. මෙසේ මෙය කියන ලදී කුමක් නිසා මෙය කියන ලදද? එහි යම් සෙනසුනක් ගැණ මේ සෙනසුන සේවනය කරන්නාවූ මාගේ අකුසල් දහම් වැඩෙත්. කුසල් දහම් පිරිහෙත්යයි දන්නේද, එබඳු සෙනසුනක් සේවනය නොකළ යුතු එහි යම් සෙනසුනක් ගැණ මේ සෙනසුන සේවනය කරන්නාවූ මාගේ අකුසල් දහම් පිරිහෙත්. කුසල් දහම් වැඩෙත්යයි දන්නේද එබඳු සෙනසුනක් සේවනය කළයුතු. ඇවැත්නි, සෙනසුනද සේවනය කළයුතු සෙනසුනය. සේවනය නොකළයුතු සෙනසුනයයි දෙයාකාරයකින් දතයුතුයයි. මෙසේ යමක් කියන ලදද එය මේ නිසා කියන ලදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**9.** "ඇවැත්නි, ගම හා නියංගමද සේවනය කළයුතුය. සේවනය නොකළ යුතුයයි දෙයාකාරයකින් දතයුතුයයි මෙය මෙසේ කියන ලදී. මෙය කුමක් නිසා කියන ලදද? එහි යම්ගමක් හා නියංගමක් ගැණ මේ ගම හා නියංගම සේවනය කරන්නාවූ මාගේ අකුසල් දහම් වැඩෙත් කුසල් දහම් පිරිහෙත්යයි දන්නේද, එබඳු ගම් හා නියංගම්ද සේවනය නොකළ යුතුය. එහි යම් ගමක් හා නියංගමක් ගැණ මේ ගම හා නියංගම සේවනය කරන්නාවූ මාගේ අකුසල් දහම් පිරිහෙත් කුසල් දහම් වැඩෙත්යයි දන්නේද එබඳු ගම හා නියංගම සේවනය කළයුතුය. ඇවැත්නි, ගම හා නියංගම සේවනය කළයුතුය. සේවනය නොකළයුතුයයි දෙයාකාරයකින් දතයුතුයයි මෙසේ යමක් කියන ලදද එය මේ නිසා කියන ලදී.

**10.** "ඇවැත්නි, ජනපද පෙදෙසද සේවනය කළයුතුය සේවනය නොකළ යුතුයයි දෙයාකාරයකින් දතයුතුයයි මෙසේ මෙය කියන ලදී. මෙය කුමක් නිසා කියන ලදද? එහි යම් ජනපද පෙදෙසක් ගැණ මේ ජනපද පෙදෙස සේවනය කරන්නාවූ මාගේ අකුසල් දහම් වැඩෙත් කුසල් දහම් පිරිහෙත්යයි දන්නේද, එබඳු ජනපද පෙදෙස සේවනය නොකළ යුතුය. එහි යම් ජනපද පෙදෙසක් ගැණ මේ ජනපද පෙදෙස සේවනය කරන්නාවූ මාගේ අකුසල් දහම් පිරිහෙත් කුසල් දහම් වැඩෙත්යයි දන්නේද, එබඳු ජනපද පෙදෙස සේවනය කළයුතුය. ඇවැත්නි, ජනපද පෙදෙසද සේවනය කළයුතුය සේවනය නොකළ යුතුයයි දෙයාකාරයකින් දතයුතුයයි යමක් කියන ලදද, එය මේ නිසා කියන ලදී."

**7. සුතවන්ත පරිබ්බාජක සූත්‍රයඃ-** 1. "මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජ්ඣකූළු පව්වෙහි වාසය කරණසේක. එකල්හි සුතවන්ත පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවියයුතු සිහිකටයුතු කථාව නිමවා එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ සුතවන්ත පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීවේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "ස්වාමීනි, එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ මේ රජගහනුවරම ගිජ්ඣකූට නම් තැන වාසය කරති. එහිදී මවිසින් භාග්‍යවතුන් වහන්සේ සම්මුඛයෙන් මෙය අසනලදී. පිළිගන්නාලදී. එනම් යම් ඒ (ii) ඇසූපිරූ තැන් ඇති අර්හත්වූ කෙලෙසුන් නැතිකළ වැස නිමවනලද, කළ කටයුතු ඇති, බහා තැබූ බර ඇති, පැමිණි යහපත ඇති, භව බැඳුම් සිඳදැමූ විමුක්තිය මනාකොට දැනගත් ඒ භික්ෂුව පස් තැනක වැරදි සේ හැසිරෙන්නට නුසුදුසුය. කෙළෙස් නැතිකළ භික්ෂුව දැන දැන සතුන් මැරීමට නුසුදුසුය, කෙළෙස් නැතිකළ භික්ෂුව හොරකම නම් නුදුන්දෙය ගැනීමට නුසුදුසුය. කෙළෙස් නැතිකළ භික්ෂුව මෙවුන්දම් සේවනය කරන්නට නුසුදුසුය. කෙළෙස් නැතිකළ භික්ෂුව දැන දැන බොරුකීමට නුසුදුසුය. කෙළෙස් නැතිකළ භික්ෂුව පෙර ගිහි කාලයෙහි මෙන් රැස්කරණ කාමයන් පරිභොග කරන්නට නුසුදුසුය, (iii) කියායි. කිමෙක්ද? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ මේ කීම මවිසින් මනාකොට අසන ලදද, මනාකොට ගන්නාලදද, මනාකොට සිහිකරණ ලදද, මනාකොට දරාගන්නා ලදද?"

3. "සුතවන්තය, තා විසින් ඒකාන්තයෙන් එය මනාකොට අසන ලදී. මනාකොට ගන්නාලදී. මනාකොට සිහි කරණ ලදී. මනාකොට දරාගන්නා ලදී. සුතවන්තය, මම පෙරද මෙසේ කීමි. දැනුදු මෙසේම කියමි. යම් ඒ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) කෙළෙස් නැතිකළ භික්ෂුව බුදුරදුන් අතහැර දමන්ට හෝ උන්වහන්සේට විරුද්ධවීමට නුසුදුසුය. කෙළෙස් නැතිකළ භික්ෂුව ධර්මය අතහැර දමන්ට හෝ ධර්මයට විරුද්ධවීමට නුසුදුසුය. කෙළෙස් නැතිකළ භික්ෂුව සංඝයා අතහැර දමන්ට හෝ සංඝයාට විරුද්ධවන්නට නුසුදුසුය. කෙළෙස් නැතිකළ භික්ෂුව ශික්ෂාව අතහැර දමන්ට හෝ ශික්ෂාවට විරුද්ධවන්ට නුසුදුසුය. සුතවන්තය, පෙරද දැනුදු මම මෙය කියමි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඒ භික්ෂු තෙම මේ නවතැන වැරදිසේ හැසිරෙන්නට නුසුදුසුය."

8. **සජ්ඣ පරිබ්බාජක සූත්‍රයः-** 1, 2, 3, (මේ ඡෙද මේ වර්ගයේ 7 සූත්‍රයේ 1, 2, 3, ඡෙද මෙන් වෙත්. "සුතවන්ත පරිබ්‍රාජක"

වෙනුවට "සජ්ඣාපරිබ්‍රාජක" යොදාගත යුතුයි. 7 සූත්‍රයේ "කෙළෙස් නැතිකළ භික්ෂුව පෙර ගිහි කාලයෙහි මෙන් රැස්කරණ කාමයන් පරිභොග කරන්නට නුසුදුසුය" යන කාරණයේ සිට මෙසේ යොදාගත යුතුයි) "කෙළෙස් නැතිකළ භික්ෂුතෙම ඡන්දයෙන් අගතියට යාමට නුසුදුසුය. ද්වෙෂයෙන් අගතියට යාමට නුසුදුසුය, මොහයෙන් අගතියට යාමට නුසුදුසුය. භයෙන් අගතියට යාමට නුසුදුසුය, සජ්ඣය, පෙරද දැනුදු මම මෙය කියමි. ඒ භික්ෂුතෙම මේ නවතැන වැරදිසේ හැසිරෙන්නට නුසුදුසුය." යෙදිය යුතුයි)

**9. නවපුග්ගල සූත්‍රය**:- 1. "මහණෙනි, මේ පුද්ගලයෝ නවදෙනෙක් ලොකයෙහි ඇත්තාහ, ඒ නවදෙන කවරහුද?

**2.** "රහතුන් වහන්සේ, රහත් බව ලැබීමට බැසගත් පුද්ගලයා, අනාගාමී පුද්ගලයා, අනාගාමි ඵලය ලැබීමට බැස ගත් පුද්ගලයා. සකෘදාගාමි පුද්ගලයා, සකෘදාගාමී ඵලය ලැබීමට බැසගත් පුද්ගලයා, සෝවාන් පුද්ගලයා, සෝවාන් ඵලය ලැබීමට බැසගත් පුද්ගලයා, පෘථග්ජනයාද යනුයි.

3. "මහණෙනි, මේ පුද්ගලයෝ නවදෙන ලොකයෙහි ඇත්තාහ."

**10. නව ආහුණෙය්‍ය සූත්‍රය**:- 1. "මහණෙනි, මේ පුද්ගලයෝ නවදෙනෙක් (ii) පූජාවට සුදුසුය, ආගන්තුක සත්කාරයට යොග්‍යය, දන්දීමට සුදුසුය, දෙඅත් නළල මැද තබා වැඳීමට සුදුසුය.

2. "කවර නවදෙනෙක්ද? (මෙහි 9 සූත්‍රයේ 2 ඡෙදය යොදාගත යුතුයි.) "මහණෙනි, මේ පුද්ගලයෝ නවදෙන (මෙහි මේ සූත්‍රයේ 1 (ii) ඡෙදය යොදාගත යුතුයි.)

---

## 2. සීහනාද වර්ගය.

**11. සාරිපුත්ත සීහනාද සූත්‍රය**:- 1. "භාග්‍යවතුන් වහන්සේ එක්කලෙක සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. ඒ කාලයෙහි ඇවැත්වූ සැරියුත් තෙරහු භාග්‍යවතුන් වහන්සේ

යම් තැනෙක්හිද එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පැත්තක වැඩහුන්හ. එක පැත්තක වැඩහුන් ඇවැත්වූ සැරියුත් තෙරහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීහ. "ස්වාමීනි, මා විසින් සැවැත් නුවර වස් වසන ලද්දේය. ස්වාමීනි, මම ජනපද චාරිකාවෙහි හැසිරෙන්ට කැමැත්තෙමි." - "සාරිපුත්තයෙනි, දැන් ඊට කාලයයි ඔබ දන්නෙහිය."

2. ඉක්බිති ඇවැත්වූ සැරියුත් තෙරහු උන් තැනින් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට (වටේටත් වැඳ) ගියහ. ඉක්බිති සැරියුත් තෙර ගිය නොබෝ වේලාවකින් එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන්වහන්සේට මේ කරුණ කීය. "ස්වාමීනි, ඇවැත්වූ සැරියුත් තෙර මට දොස් නගා එය නිදොස් නොකොට චාරිකාවෙහි (ඇවිදීමට) ගියේය." ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා භික්ෂුවක් කැඳවූහ. "භික්ෂුවෙනි, මෙහි එව, ඇවැත්වූ සාරිපුත්තයෙනි, ශාස්තෲන් වහන්සේ ඔබ කැඳවත්' යයි මාගේ වචනයෙන් සැරියුත් තෙර කැඳවව.,-"එසේය ස්වාමීනියි" ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී ඇවැත්වූ සැරියුත් තෙර යම් තැනෙකද එහි පැමිණ 'ඇවැත්වූ සාරිපුත්තයෙනි, ශාස්තෲන් වහන්සේ ඔබ කැඳවත් ය'යි ඇවැත්වූ සැරියුත් තෙරුන්ට කීය. "එසේය අවැත්නියි" ඇවැත්වූ සැරියුත් තෙර ඒ භික්ෂුවට පිළිතුරු දුන්නේය.

3. ඒ කාලයෙහි ඇවැත් මහ මුගලන් තෙරද, ඇවැත් අනඳ තෙරද යතුරු ගෙණ විහාරයෙන් විහාරයට 'ඇවැත්නි, නික්මෙව. ඇවැත්නි, නික්මෙව, දැන් ඇවැත්වූ සැරියුත් තෙර භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි සිංහ නාදය පවත්වන්නේ යයි' කියමින් ඇවිදිත්.

4. ඉක්බිති ඇවැත්වූ සැරියුත් තෙරහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පැත්තක හුන්හ. එක පැත්තක හුන් ඇවැත්වූ සැරියුත් තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළහ. "සාරිපුත්තයෙනි, ඔබට මෙහි එක්තරා භික්ෂුවක් සමග හැසිරෙන භික්ෂුවක් දොස් කීමට පැමිණියේය. (කෙසේද?) 'ස්වාමීනි, මට ඇවැත්වූ සැරියුත්

තෙර දොස් නගා එය නිදොස් නොකොට චාරිකාවෙහි ගියේය.” (කියායි)

5. “ස්වාමීනි, යමකුට ඒකාන්තයෙන් කයෙහි කය පිළිබඳ සිහිය එළඹ නොසිටියා වන්නීද, හෙතෙම (ඒ භික්ෂුව) මෙහි එක්තරා සමඟ හැසිරෙන භික්ෂුවකට දොස් නගා ඒ දෝසය නිදොස් නොකොට චාරිකාවෙහි යන්නේ වේ. ස්වාමීනි, යම්සේ පොළොවෙහි පවිත්‍ර දෙයද දමත්, අපවිත්‍ර දෙයද දමත්, අසුචිද දමත්, මුත්‍රද දමත්, කෙළද දමත්, සැරවද දමත්, ලෙයද දමත්, එයින් පොළොව පීඩා නොවෙයි. ලජ්ජා නොවෙයි, පිළිකුල් නොකරයි. (ii) ස්වාමීනි, එමෙන් මම මහත්වූ මහත් බවට ගිය, අපමණවූ, අවෛරීවූ, හිංසා රහිත, පොළොව හා සමවූ සිතින් යුක්තව වාසය කරමි. (iii) ස්වාමීනි, යමෙකුට ඒකාන්තයෙන් කයෙහි කය ගැන සිහිය එළඹ නොසිටියා වන්නීද ඒ භික්ෂුව මෙහි එක්තරා එකට හැසිරෙන භික්ෂුවකට දොස් නගා එය නිදොස් නොකොට චාරිකාවෙහි (ඇවිදීමට) යන්නේවේ.

6. “ස්වාමීනි, යම්සේ ජලයෙහි පවිත්‍ර දෙයද සෝදත්. අපවිත්‍ර දෙයද සෝදත්. අසුචිද සෝදත්. මුත්‍රද සෝදත්. කෙළද සෝදත්, ලෙයද සෝදත්, එයින් ජලය පීඩා නොවෙයි, ලජ්ජා නොවෙයි, පිළිකුල් නොකරයි. (මෙහි 5 (ii) ජලය හා සමවූ යන්න සමග යෙදිය යුතුයි.)

7. “ස්වාමීනි, යම්සේ ගින්න පවිත්‍ර දෙයද දවයි, අපවිත්‍ර දෙයද දවයි, අසූචිද, මුත්‍රද දවයි, කෙළද දවයි, සැරවද දවයි, ලෙයද දවයි, එයින් පීඩා නොවෙයි, ලජ්ජා නොවෙයි, පිළිකුල් නොකරයි. (මෙහි 5 (ii) ගින්න හා සමවූ යන්න සමග යෙදිය යුතුයි.)

8. “ස්වාමීනි, යම්සේ වාතය පවිත්‍ර දෙයෙහිද හමයි, අපවිත්‍ර දෙයෙහිද හමයි, අසුචියෙහිද හමයි, මුත්‍රයෙහිද හමයි, කෙළෙහිද හමයි, සැරවයෙහිද හමයි, ලෙයෙහිද හමයි. එයින් වාතය පීඩා නොවෙයි, ලජ්ජා නොවෙයි, පිළිකුල් නොකරයි (මෙහි 5 (ii) වාතය හා සමවූ යන්න සමග යෙදිය යුතුයි.)

9. “ස්වාමීනි, යම්සේ දූවිලි පිස දමන රෙදි කඩ පවිත්‍ර දෙයද පිස දමයි, අපවිත්‍ර දෙයද පිස දමයි, අසුචිද පිස දමයි,

මුත්‍රද පිස දමයි, කෙළද පිස දමයි, සැරවද පිස දමයි, ලෙයද පිස දමයි, එයින් දූවිල පිස දමන රෙදි කඩ පීඩා නොවෙයි, ලජ්ජා නොවෙයි, පිළිකුල් නොවෙයි. (මෙහි 5 (ii) රෙදි කඩ හා සමවූ යන්න සමග යෙදිය යුතුයි.)

**10.** "ස්වාමීනි, යම්සේ කබලක් අතේ ඇති රෙදිකඩක් හැඳගත් සැඩොල් දරුවෙක් හෝ දැරියක් කුඩා ගමකට හෝ මහ ගමකට ඇතුල්වන්නේ යටහත්පහත් සිත ඇතිකරගනම පිවිසෙයිද, ස්වාමීනි, එමෙන් මම මහත්වූ මහත්බවට පැමිණි අපමණවූ අවෛරීවූ පීඩා රහිත සැඩොල් දරුවකුගේ සිතට බඳු සිතින් යුක්තව වාසය කරමි. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

**11.** "ස්වාමීනි, යම්සේ අං සිඳුණු කීකරු හොඳින් දැමුණු හොඳින් හික්මුණු ගොන් රජෙක් වීථියෙන් වීථියක හන්දියෙන් හන්දියක ඇවිදින්නේ පයින් හෝ අඟින් හෝ කිසිවකුට හිංසා නොකරයිද, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

**12.** "ස්වාමීනි, යම්සේ සැරසෙන ස්වභාව ඇති, හිස සිට ස්නානය කළ ළදරු තරුණ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් නයි කුණක් හෝ බලු කුණක් හෝ මිනිස් කුණක් හෝ බෙල්ලේ එල්ලන ලද්දේ පීඩාවන්නේද, ලජ්ජාවන්නේද, පිළිකුල් කරන්නේද ස්වාමීනි, එමෙන් මම මේ කුණුකය කරණකොට පීඩාවෙමි, ලජ්ජාවෙමි. පිළිකුල්කරමි. (මෙහි 5 (iii) යෙදිය යුතුයි.)

**13.** "ස්වාමීනි, යම්සේ පුරුෂයෙක් කුඩා සිදුරු ඇති මහ සිදුරු ඇතිවූ උඩින් වැගිරෙන වටින් වැගිරෙන මේද තෙල් තලියක් යම්සේ පරිහරණය කරයිද, ස්වාමීනි, එමෙන් මම කුඩා සිදුරු ඇති, මහ සිදුරු ඇති, උඩින් වැගිරෙන වටින් වැගිරෙන මේ කය පරිහරණය කරමි. ස්වාමීනි, යම් භික්ෂුවකට ඒකාන්තයෙන් කයෙහි කය පිළිබඳ සිහිය එළඹ නොසිටියා වන්නීද, මෙහි හෙතෙමේ එක්තරා එකට මහණදම් පුරණ භික්ෂුවකට දොස්නගා එය නිදොස් නොකොට චාරිකාවෙහි හැසිරෙන්නේ වේ" යයි කීහ.

**14.** ඉක්බිති ඒ භික්ෂුව හුන්තැනින් නැගිට තනිපොට සිවුර ඒකාංශකොට පොරවා භාග්‍යවතුන් වහන්සේගේ දෙපා මුල

හිස බිම තබා වැටී හිඳගෙණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, මෝඩ වූ ලෙස මුළා වූ ලෙස අකුසල් වූ ලෙස වරදවා ඉක්මවීය. (මම වරදට යටවිය) යම්බඳුවූ මම ඇවැත්වූ සැරියුත් තෙරුන්ට අසත්‍යවූ, හිස්වූ, සිදුරු නොවූ බොරුවෙන් දොස් නැගුයෙමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නැවත සංවරවීම පිණිස ඒ මගේ වරද වරද ලෙස පිළිගන්නා සේක්වා."

15. "භික්ෂුවෙනි, ඔබ මෝඩවූ ලෙස, මුළාවූ ලෙස, අකුසල්වූ ලෙස වරද ඉක්මවූයෙහිය. (වරදට යටවිය) යම්බඳු ඔබ ශාරීපුත්‍රයන්ට අසත්‍යවූ, හිස්වූ, සිදුනොවූ බොරුවෙන් දොස් නැගුයෙහිය. භික්ෂුවෙනි, ඔබ වරද වරද වශයෙන් පිළිගෙන ධර්මය වූ පරිදි පිළියම් කරයිද, ඔබගේ ඒ වරද අපි පිළිගණිමු. භික්ෂුවෙනි, යමෙක් වරද වරද වශයෙන් පිළිගෙණ නැවත සංවර වෙයිද, ධර්මය වූ පරිදි පිළියම්කරයිද එය ශාසනයෙහි දියුණුවකි."

16. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඇවැත්වූ සැරියුත් තෙරුන් කැඳවූහ. (කැඳවා) "සාරිපුත්තයෙනි, මොහුගේ හිස සත්කඩකට පැලෙන්ට මත්තෙන් මේ හිස් මිනිසාට ක්ෂමා කරව (ඉවසව)"-"ස්වාමීනි, ඉදින් ඒ ඇවැත්තෙම "මට මේ ඇවැත්තෙම කමාකරවා"යි කියයි නම් මම ඒ ඇවැත්හට ක්ෂමා වෙමියි" කීය.

12. **සළපාදිසෙස සූත්‍රය**:- 1. ඉක්බිත්තෙන් වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවාගෙන පාත්‍ර සිවුරු රැගෙන සැවැත්නුවරට පිඬු පිණිස වැඩිසේක. (ii) 'සැවතට පිඬු පිණිස යෑමට තවම කල් වැඩිය. මම අන්‍යතීර්ථක (අන්‍යාගමිකවූ) පිරිවැජියන්ගේ අරමක් කරා පැමිණෙන්නෙම් නම් ඉතා යෙහෙකැයි' (iii) ශාරීපුත්‍රායුෂ්මතුන් වහන්සේට මෙබඳු සිතක් විය. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍රයන්වහන්සේ අන්‍යතීර්ථක පිරිවැජියකුගේ ආරාමය යම්තැනෙක්හිද එතැන්හි පැමිණිසේක. පැමිණ ඒ අන්‍යතීර්ථක පිරිවැජියන් සමග සතුටු විය. සතුටුවිය යුතුවූද සිහිකටයුතුවූ ද, කථාකොට නිමවා එක්පසෙක හුන්සේක.

2. (i) එකල්හි වනාහි එකට උන්නාවූ එකට රැස්වූ ඒ අන්‍යතීර්ථක පිරිවැජියන් අතර මේ අතුරු කථාව පහළවිය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

'ඇවැත්නි, යම්කිසිවෙක් සවුපාදිශෙෂව (කෙළෙස් ඉතිරිකොට) කළුරිය කෙරෙයිද, ඒ සියලුදෙන නරකයෙන් නොමිදුනහ. තිරිසන් යෝනියෙන් නොමිදුනහ. ප්‍රෙතවිෂයයෙන් නොමිදුනහ. දුර්ගතිවූ නපුරු සේ ඇදවැටෙන අපාය දුකින් නො මිදුනාහ'යි කියායි. (ii) ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ ඒ අන්‍යතීර්ථක පිරිවැජියන්ගේ කථාවට නොම සතුටුවූහ. (එය) නොම ප්‍රතික්ෂේප කළසේක. නොම සතුටුව නොම ප්‍රතික්ෂෙපකොට හුනස්නෙන් නැගිට බුදුන් වහන්සේගේ සමීපයෙන් මේ භාෂිතයාගේ අර්ථය දැනගන්නෙමැයි වැඩිසේක.

3. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සැවැත්නුවර පිඬු පිණිස හැසිරී පසුබත්කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකුනේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණිසේක. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මනා කොට වැඳ එකත්පසෙක උන්සේක. එකත්පසෙක උන්නාවූ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළකළසේක. (එනම්) "ස්වාමීන් වහන්ස, මෙහිදී මම පෙරවරුකාලයෙහි හැඳපොරවාගෙන පාත්‍රසිවුරු රැගෙන සැවතට පිඬු පිණිස පිවිසියෙමි. ස්වාමීන් වහන්ස, ඒ මට මෙබඳු සිතක් පහළවිය. (එයනම්) (මෙහි 1 (ii) යෙදිය යුතුයි) කියායි. ඉක්බිති ස්වාමීන් වහන්ස, මම අන්‍යතීර්ථක පිරිවැජියන්ගේ අරම යම් තැනෙක්හිද එතැන්හි පැමිණියෙමි. පැමිණ, ඒ අන්‍යතීර්ථක පිරිවැජියන් සමග සතුටුවීමි. සතුටු වියයුතු කථා ද, සිහිකටයුතු කථා ද කොට නිමවා එකත්පසෙක උන්නෙමි.

4. (මෙහි 2 (i) යෙදිය යුතුයි) ඉක්බිති ස්වාමීන් වහන්ස, මම ඒ අන්‍ය තීර්ථක පරිව්‍රාජකයන්ගේ කථාවට නොම සතුටුවීමි. (එය) ප්‍රතික්ෂෙප (බැහැර) නොකෙළෙමි. සතුටු නොවී ප්‍රතික්ෂෙප නොකොට භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ භාෂිතයාගේ අර්ථය දැනගන්නෙමියි හුනස්නෙන් නැගිට ගියෙමි."

5. "ශාරීපුත්‍රය, බාලවූ අව්‍යක්තවූ අන්‍යතීර්ථක පිරිවැජියෝ කවරහුද, ඒ කවරහු සවුපාදිශෙෂය හෝ සවුපාදිශේෂය කියාද, අනුපාදිශෙෂය හෝ අනුපාදිශෙෂය කියාද දැන ගනිත්ද?

"ශාරීපුත්‍රය, මේ පුද්ගලයෝ නවදෙනෙක් (ii) සවුපාදිශෙෂව කලුරිය කරන්නාහු නිරයෙන් වැලකුණාහුය, තිරිසන් යෝනියෙන් වැලකුණාහුය. ප්‍රේතවිෂයයෙන් වැලකුණාහුය. දුර්ගතිවූ නපුරුසේ ඇද වැටෙන අපායයෙන් වැලකුණාහුය.

6. "ඒ නවදෙන කවරහුද? ශාරීපුත්‍රය (ii) මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙමේ ශීලයන් සම්පූර්ණ කරන ස්වභාව වේද, සමාධිය සම්පූර්ණ කරණ ස්වභාවවේද, ප්‍රඥාව සම්පූර්ණ කරන ස්වභාව නොවේද, ඒ පුද්ගල තෙමේ මෑත බැඳුම් පහෙන් (පඤ්චොරම්භාගිය සංයොජනයන්) ක්ෂය කිරීමෙන් (iii) අන්තරාපරිනිබ්බායී වෙයි. ශාරීපුත්‍රය මේ පළමුවෙනි පුද්ගලතෙම (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

7. "ශාරීපුත්‍රය, නැවතද අනිකක් කියමි (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) උපහච්චපරිනිබ්බායී වෙයි. ශාරීපුත්‍රය, මේ දෙවෙනි පුද්ගල තෙම (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

8. "ශාරීපුත්‍රය, නැවතද අනිකක් කියමි. (මෙහි 6 (ii) යෙදිය යුතුයි) අසංඛාරපරිනිබ්බායී වෙයි. ශාරීපුත්‍රය, මේ තුන් වෙනි පුද්ගලතෙම (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

9. "ශාරීපුත්‍රය, නැවතද අනිකක් කියමි. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) සසංඛාරපරිනිබ්බායී වෙයි. ශාරීපුත්‍රය, මේ සතර වෙනි පුද්ගලතෙමේ (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

10. "ශාරීපුත්‍රය, නැවතද, අනිකක් කියමි. (මෙහි 6 (ii) යෙදිය යුතුයි) උද්ධංසොතවූයේ අකනිට්ඨගාමී වෙයි, ශාරීපුත්‍රය, මේ පස්වෙනි පුද්ගල තෙම (මෙහි 5 (ii) යෙදිය යුතුයි,) නපුරුසේ ඇද වැටෙන අපායෙන් මිදුනේ වෙයි.

11. "ශාරීපුත්‍රය, නැවතද අනිකක් කියමි (මෙහි 6 (ii) යෙදිය යුතුයි) ඇල්ම, තරහ, මුළාව ක්ෂය කිරීමෙන් සකෘදාගාමී වෙයි. එක්වරක්ම මේ ලෝකෙට ඇවිත් දුක් කෙළවර කරන්නෙක් වෙයි. ශාරීපුත්‍රය, මේ සය වෙනි පුද්ගලතෙම (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

12. "ශාරීපුත්‍රය, නැවතද අනිකක් කියමි. මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම ශීලයන් සම්පූර්ණ කරන සුළුවේද, සමාධිය සම්පූර්ණ කරන සුළු නොවේද, ප්‍රඥාව සම්පූර්ණ කරන සුළු නොවේද, ඒ පුද්ගලතෙම තුන් සංයෝජනයන් ක්ෂය කිරීමෙන් එක බීජවෙයි. එකම මිනිස් බවක් උපදවා දුක් කෙළවර කෙරෙයි. ශාරීපුත්‍රය මේ සත්වෙනි පුද්ගලතෙම (මෙහි 5 (ii) යෙදිය යුතුය)

13. "ශාරීපුත්‍රය, නැවතද අනිකක් කියමි. මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම ශීලයන් සම්පූර්ණ කරන සුලුවේද, සමාධිය සෑහෙන පමණ කරන සුළු වුයේද ප්‍රඥාව සෑහෙන පමණ කරන සුළු වූයේද ඒ පුද්ගල තෙම තුන් සංයෝජනයන් ක්ෂය කිරීමෙන් කොලංකොල වෙයි. අත්බැව් දෙවරක හෝ තුන්වරක ඇවිද හැසිර දුක් කෙළවර කරන්නේවේ. ශාරීපුත්‍රය, මේ අටවෙනි පුද්ගල තෙම (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

14. "ශාරීපුත්‍රය, නැවතද අනිකක් කියමි. මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම ශීලයන් සම්පූර්ණකරන සුළුවේද, සමාධිය සෑහෙන පමණ කරන සුළු වේද, ප්‍රඥාව සෑහෙන පමණ කරන සුළු වේද, ඒ පුද්ගල තෙමේ තුන් සංයොජනයන් ක්ෂය කිරීමෙන් සත්තක්ඛත්තුපරමවෙයි. සත්වරක් පරම කොට දිව්‍ය මනුෂ්‍ය දෙගතියෙහි ඇවිද හැසිර දුක් කෙළවර කෙරෙයි. ශාරීපුත්‍රය, මේ නවවෙනි පුද්ගලයා 5 (ii) යෙදිය යුතුයි.)

15. "ශාරීපුත්‍රය, බාලවූ අව්‍යක්තවූ අන්‍යතීර්ථක පිරිවැජියෝ කවරහුද, ඒ කවරහු සවුපාදිශෙෂය හෝ සවුපාදිශෙෂයයි දනිද්ද, අනුපාදිශෙෂය හෝ අනුපාදිශෙෂයෙයි දනිද්ද, ශාරීපුත්‍රය, මේ කවර පුද්ගලයෝ සවුපාදිශෙෂවූවාහු කළුරිය කරන්නාහු නරකයෙන් මිදුනාහුය, තිරිසන් යොනියෙන් මිදුනාහුය. ප්‍රෙතවිෂයයෙන් මිදුනාහුය. දුර්ගතිවූ නපුරුයේ ඇදවැටෙන අපායෙන් මිදුනාහුය.

16. "ශාරීපුත්‍රය, මේ ධර්මපරියාය (ක්‍රමය) තෙම භික්ෂූන්ට ද, භික්ෂුනීන්ටද, උපාසකයන්ටද, උපාසිකාවන්ටද, ඒතාක් නොවැටහුනේමය. ඊට හෙතු කවරේද? මේ ධර්මපරියාය අසා

ප්‍රමාදය ආභරණය නොකෙරේවා, වැලිදු ශාරීපුත්‍රය, මා විසින් මේ ධර්මපරියාය ප්‍රඥාභිප්‍රායයෙන් වදාරන ලද්දේයයි" වදාළසේක.

**13. කොට්ඨිත-ශාරීපුත්ත සූත්‍රයඃ-** 1. ඉක්බිති ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් සාරීපුත්ත ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණි සේක. පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවියයුතු කථාවද සිහිකටයුතු කථාද කොට නිමවා එකත්පසෙක උන්සේක. එකත්පසෙක උන්නාවූ ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මේ කාරණය කීසේක.

2. (i) "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, කිමෙක්ද? යම් කර්මයක් (මේ ආත්මයෙහිම විඳියයුතුද), ඒ කර්මය මට පරලෙව්හිදී විඳියයුතු වේවායි මේ පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරාද?"

(ii) "ඇවැත්නි, මෙය නොවේමැයි."

3. "ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, කිමෙක්ද, යම් කර්මයක් පරලොවදී විඳියයුතුවේද, ඒ කර්මය මට මේ ආත්මයෙහි විඳිය යුතු වේවායි මේ පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරාද?"-"ඇවැත්නි, ඒ කාරණය නොවේමැයි."

4. "ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, කිමෙක්ද? යම් කර්මයක් සැපවිඳුවාද, ඒ කර්මය මට සැප විඳුවන්නක් වේවායි මේ පිණිස භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි මහණදම් පුරාද?"-"ඇවැත්නි මේ කාරණය නොවේමැයි."

5. "ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, කිමෙක්ද? යම් කර්මයක් දුක විඳුවාද ඒ කර්මය මට සැපවිඳුවන්නක් වේවායි මේ පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරාද?"-"ඇවැත්නි, මේ කාරණය නොවේමැයි."

6. "ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, කිමෙක්ද, යම් කර්මයක් පැසී විඳුවාද ඒ කර්මය මට නො පැසී විඳුවන්නක් වේවායි මේ

පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරාද?"- "ඇවැත්නි, ඒ කාරණය නොවේමැයි."

7. "ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, යම් කර්මයක් නොපැසී විඳුවාද, ඒ කර්මය මට පැසී විඳුවන්නක් වේවායි මේ පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරාද?"-"ඇවැත්නි, මේ කාරණය නොවේමැයි."

8. "ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, කිමෙක්ද, යම් කර්මයක් බොහෝ විඳියයුතුද, ඒ කර්මය මට ටිකක් විඳුවන්නක් වේවායි මේ පිණිස මහණදම් පුරාද?"-"ඇවැත්නි, මේ කාරණය නොවේමැයි."

9. "ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, කිමෙක්ද යම් කර්මයක් ටිකක් විඳුවන්නක්වේද ඒ කර්මය මට බොහෝ විඳුවන්නක් වේවායි මේ පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරාද?"- "ඇවැත්නි, ඒ කාරණය නොවේමැයි."

10. "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, කිමෙක්ද යම් කර්මයක් විඳිය යුතුද, ඒ කර්මය මට නොවිඳිය යුත්තක් වේවායි මේ පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරාද?"-"ඇවැත්නි, මේ කාරණය නොවේමැයි."

11. "ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, කිමෙක්ද යම් කර්මයක් නොවිඳින්නක් වේද, ඒ කර්මය මට විඳින්නක් වේවායි, මේ පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරාද?"- "ඇවැත්නි, මේ කාරණය නොවේමැයි."

12. "ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, (මෙහි 2 (i) යෙදිය යුතුයි.) මෙසේ විචාරනු ලබන්නේ ඇවැත්නි, 'මේ කාරණය නොවේ යයි කියන්නෙහිය.

13. "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි (මෙහි 3 (i) යෙදිය යුතුයි.) (ii) මේ කාරණය පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරාදැයි විචාරනු ලබන්නේම 'ඇවැත්නි, මේ කාරණය නොවේයයි' කියන්නෙහිය.

14. "ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, (4 (i) යෙදිය යුතුයි.) (මෙහි 13 (ii) යෙදියයුතුයි.) (මෙහි 6 (i) යෙදිය යුතුයි.) (මෙහි 13 (ii)

යෙදිය යුතුයි.) (මෙහි 8 (i) යෙදිය යුතුයි.) (මෙහි 13 (ii) යෙදිය යුතුයි.) (මෙහි 9 (i) යෙදිය යුතුයි.) (මෙහි 13 (ii) යෙදිය යුතුයි.) යම් කර්මයක් විඳිය යුතුවේද, ඒ කර්මය මට නොවිඳින්නක් වේවායි (මෙහි 13 (ii) යෙදිය යුතුයි.) යම් කර්මයක් නො විඳින්නක්වේද, මට ඒ කර්මය විඳියයුත්තක් වේවායි ඇවැත්නි, එසේනම් කුමක් පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරාද?"

15. "ඇවැත්නි, නොදන්නාලද ඉටා නොගන්නාලද නොපැමිණෙන ලද, ප්‍රත්‍යක්ෂ නොකරන ලද, අවබොධය නො කරනලද, යමක් වන්නේද, (ii) එය දැනගැනීම පිණිස (එය) දැකීම පිණිස (එයට) පැමිණීම පිණිස, (එය) ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස එය අවබොධ කිරීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරයි. (iii) යමක් දැනගැනීම පිණිස, (යමක්) දැකීම පිණිස' (යමකට) පැමිණීම පිණිස, යමක් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස, (යමක) අවබොධය පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම්පුරාද, නොපැමිණියාවූ ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දාවූ අවබෝධ නොකරන ලද්දාවූ, කුමක් නම් වන්නේද?

16. "ඇවැත්නි, මේ දුකයයි (ii) නොදන්නා ලද්දේ, බැස නොගන්නා ලද්දේ, නො පැමිණෙන ලද්දේ, ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දේ අවබොධ නොකරනලද්දේ වේද, (iii) (මෙහි 15 (ii) යෙදිය යුතුයි.)

17. "ඇවැත්නි, 'මේ දුක්ඛසමුදය'යි (මෙහි 16 (ii) සහ 15 (ii) යෙදිය යුතුයි.)

18. "ඇවැත්නි, මේ දුක්ඛනිරොධය"යි (මෙහි 16 (ii) සහ 15 (ii) යෙදිය යුතුයි.

19. "ඇවැත්නි, 'මේ දුක්ඛනිරොධ ගාමිනී ප්‍රතිපදාවය'යි (මෙහි 16 (ii) සහ 15 (ii) යෙදිය යුතුයි.)

20. "ඇවැත්නි, මෙය (මෙහි 16 (ii) සහ 15 (ii) යෙදිය යුතුයි.)

14. **සමිද්ධි සාරීපුත්ත සූත්‍රයඃ-** 1. "ඉක්බිත්තෙන් වනාහි ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර

ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණි සේක. පැමිණ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක උන්සේක. එකත්පසෙක උන්නාවූ ආයුෂ්මත් සමිද්ධිස්ථවිරයන් වහන්සේට ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මේ කාරණය වදාළසේක.

**2.** "සමිද්ධිය, කුමන අරමුණකින් පුරුෂයාට අදහස් උදහස් උපදිත්ද? "ස්වාමීන් වහන්ස, සිතට රූප ගොදුරු වීම හේතුකොට ගෙනය."

"සමිද්ධිය, ඔවුහු වනාහි කොතැන්හි නොයෙක් ආකාර බවට යෙත්ද?" "ස්වාමීන් වහන්ස, (ඇස් කන් ආදී) ධාතූන් කෙරෙහිය."

"සමිද්ධිය, ඔවුහු වනාහි කුමක් උපත කොට ඇත්තාහුද?" "ස්වාමීන් වහන්ස, ස්පර්ශය උපත කොට ඇත්තාහුය."

"සමිද්ධිය, ඔවුහු වනාහි කුමක් රැස් කිරීම කොට ඇත්තාහුද?" "ස්වාමීන් වහන්ස, විඳීම රැස් කිරීම කොට ඇත්තාහුය."

"සමිද්ධිය, ඔවුහු වනාහි කුමක් මුල් කොට ඇත්තාහුද?" "ස්වාමීන් වහන්ස, හිත එකඟකම මුල්කොට ඇත්තාහුය."

"සමිද්ධිය, ඔවුහු වනාහි කුමක් නම් නායක බැව් කොට ඇත්තාහුද?" "ස්වාමීන් වහන්ස, සිහිය නායක කොට ඇත්තාහුය."

"සමිද්ධිය, ඔවුහු වනාහි කුමක් වැදගත් කොට ඇත්තාහුද?" "ස්වාමීන් වහන්ස, (මාර්ග) ප්‍රඥාව වැදගත් කොට ඇත්තාහුය."

"සමිද්ධිය, ඔවුහු වනාහි කුමක් සාරකොට ඇත්තාහුද?" "ස්වාමීන් වහන්ස, මිදීම සාරකොට ඇත්තාහුය.

"සමිද්ධිය, ඔව්හු වනාහි කුමකට බැස ගැනීම කොට ඇත්තාහුද" "ස්වාමීන් වහන්ස නිවනට බැසගැනීම් කොට ඇත්තාහුය."

"සමිද්ධිය, පුරුෂයාගේ අදහස් උදහස් කුමක් අරමුණු කොට උපදිත්ද?" මෙසේ විචාරණ ලද්දේ වන්නේම, "ස්වාමීන් වහන්ස,

සිත් හා රූප ගොදුරු කොට ඇත්තාහුයයි" කීයෙහිය. "සමිද්ධිය, ඔවුහු වනාහි කොතැන්හි නොයෙක් ආකාර බවට යෙත්දැයි" මෙසේ විචාරණ ලද්දේ වන්නේම, "ස්වාමීන් වහන්ස, (ඇස් කන් ආදි) ධාතූන් කෙරෙහි යයි කීයෙහිය."

"සමිද්ධිය, ඔවුහු වනාහි කුමක් උපත කොට ඇත්තාහු දැ"යි මෙසේ විචාරණ ලද්දේ වන්නේම, "ස්වාමීන් වහන්ස, විඳීම් රැස් කිරීම් කොට ඇත්තාහුයයි" කීයෙහිය.

"සමිද්ධිය, ඔවුහු වනාහි කුමක් මුල්කොට ඇත්තාහුද?" මෙසේ විචාරණලද්දේ වන්නෙමි, "ස්වාමීන්වහන්ස, සමාධිය මුල්කොට ඇත්තාහුයයි" කීයෙහිය.

"සමිද්ධිය, ඔවුහු වනාහි කුමක් නායක බැව් කොට ඇත්තාහුදැයි" මෙසේ විචාරණලද්දේ වන්නේම, "ස්වාමීන් වහන්ස, සිහිය නායක කොට ඇත්තාහුයයි" කීයෙහිය.

"සමිද්ධිය, ඔවුහු වනාහි කුමක් වැදගත්කොට ඇත්තාහු දැයි" මෙසේ විචාරණලද්දේ වන්නේම, "ස්වාමීන් වහන්ස, ප්‍රඥාව වැදගත් කොට ඇත්තාහුයයි" කීයෙහිය.

"සමිද්ධිය, ඔවුහු කුමක් සාරකොට ඇත්තාහුදැයි" මෙසේ විචාරණලද්දේ වන්නේම, "ස්වාමීන් වහන්ස, මිදීම සාර කොට ඇත්තාහුයයි" කීයෙහිය.

"සමිද්ධිය, ඔවුහු වනාහි කුමක් බැසගැනීම්කොට ඇත්තාහුදැයි" මෙසේ විචාරණ ලද්දේ වන්නේම, "ස්වාමීන් වහන්ස, නිවනට බැසගැනීම් කොට ඇත්තාහුයයි" කීයෙහිය.

3. "සමිද්ධිය, ඉතා මැනව. සමිද්ධිය, නුඹ ප්‍රශ්නය විචාරණලද්දේ විසඳුයෙහි මැනව. ඒ විසඳීම කරණකොට නහමක් සිතාවා."

15. **ගණ්ඩොපම සූත්‍රයඃ-** 4. "මහණෙනි, යම්සේ නොයෙක් වර්ෂ ගණන් ඇති, ගණ්ඩයක් (ගඩගෙඩියක්) වේද, එහි නොබිඳුණු නවමුඛ ඇති වණමුඛ නවයක් වන්නාහුද (ii) එයින් යම්කිසිවක් වැගිරෙන්නේ, නම් අසූචියක්ම වැගිරෙන්නේය. දුර්ගන්ධයක්ම වැගිරෙන්නේමය. පිළිකුල් කටයුත්තක්ම වැගිරෙන්නේමය.

යම්කිසිවක් වෑස්සීම වන්නේනම් අසුචියක්ම වෑස්සෙන්නේය. දුර්ගන්ධයක්ම වෑස්සෙන්නේය. පිළිකුල් කටයුත්තක්ම වෑස්සෙන්නේය. (iii) මහණෙනි, ගණ්ඩය යනු මේ චාතුර්මහාභූතික ශරීරයටම හටගැනීම ඇත්තාවූ මවුපියන්ගේ ශුක්‍රශ්‍රොණිතයෙන් හටගැනීම ඇත්තාවූ බත්කොමුවලින් වැඩීම් ඇත්තාවූ අනිත්‍යවූ ඇඟ ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විද්වංසනය යන මෙය ස්වභාවකොට ඇති මෙම චාතුර්මහාභූතික ශරීරයට කියන නමෙකි.

2. "ඔහුගේ නවවණ මුඛවෙති, නව අභෙදන මුඛවෙති, (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, එහෙයින් මෙහි මේ ශරීරයෙහි කලකිරෙවු" යනුයි.

**16. නවසඤ්ඤා සූත්‍රය**:- 1. "මහණෙනි, මේ නව සංඥාවෝ වඩනලද්දාහු බහුල වශයෙන් කරනලද්දාහු මහත් ඵල වෙති, මහානිසංස වෙති, නිවණට බැසගත්තාහු වෙති. නිවණ අවසන්කොට ඇත්තාහු වෙති.

2. "ඒ නවය කවරහුදයත්? අසුභ සංඥාවය, මරණ සංඥාවය, ආහාරයෙහි ප්‍රතිකූලසංඥාවය, සියලු ලොකයෙහි නොඇලෙන සංඥාවය, අනිත්‍ය සංඥාවය, අනිත්‍යයෙහි දුඃඛ සංඥාවය, දුක්ඛයෙහි අනාත්ම සංඥාවය, පහාණ සංඥාවය. විරාග සංඥාවය යනුයි.

3. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**17. නවංගකුල සූත්‍රය**:- 1. "මහණෙනි, අංග නවයකින් යුක්තවූ කුලය (ගෙදර) කරා නොඑළඹ හෝ එළඹීමට හෝ නුසුදුසුය එළඹ හෝ සමීපයෙහි ඉන්ට නුසුදුසුය.

2. "කවර නම් නවයකින්ද යත්? මනාපයෙන් (හුනස්නෙන්) නොනැගිටිත්ද, මනාපයෙන් (පසඟ පිහිටුවීමෙන් නොවඳිත්ද, මනාපයෙන් අසුන් නොදෙත්ද, ඇතිදේ ඔහට වසඟ කරත්ද, බොහෝ වූයේ ටිකක් දෙත්ද, ප්‍රණීතවූයේ රූක්ෂදේ දෙත්ද, නොසකස් කොට දෙත්ද, සකස් කොට නොදෙත්ද, ධර්මශ්‍රමණය පිණිස සමීපයෙහි නොඉඳිත්ද, භාෂිතයට සතුටු නොවෙත්ද, යනුයි. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, අංග නවකින් යුක්තවූ කුලය කරා එළඹෙන්ට හෝ සුදුසුය, එළඹ හෝ වෙත ඉඳීමට සුදුසුය.

4. "කවර නම් නවයකින්ද යත් මනාපයෙන් දැක හුනස්නෙන් නැගිටිත්ද, මනාපයෙන් අභිවාදනය කෙරෙත්ද මනාපයෙන් අසුන් දෙත්ද, ඕහට ඇතිදේ නොවසත්ද, බහුලව ඇතිදේ බහුලව දෙත්ද, ප්‍රණීතදේ ප්‍රණීතව දෙත්ද, සකස් කොට දෙත්ද, නොසකස් කොට නොදෙත්ද' ධර්මශ්‍රවණය පිණිස සමීපයෙහි ඉඳිත්ද, දෙශනයට ප්‍රිය වෙත්ද (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

18. **නවංගුපොසථ සූත්‍රයඃ-** 1. "මහණෙනි, අංග නවයකින් යුක්තවූ පෙහෙවස වැස නිමවන ලද්දේ මහත් ඵල ඇත්තේ වෙයි. මහානිසංස ඇත්තේ වෙයි. මහත් බැබලීම් ඇත්තේ වෙයි මහත් පැතිරීම් ඇත්තේ වෙයි. (ii) මහණෙනි, කෙසේ නම් අංග නවයකින් යුතුව වැස නිමවන ලද පෙහෙවස තෙමේ මහත් ඵල වෙයිද මහානිසංස වෙයිද මහා බැබලීම් ඇතිවෙයිද, මහත් පැතිරීම් ඇති වෙයිද?

2. "මහණෙනි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙමේ මෙසේ කල්පනාකෙරෙයි. කෙසේද? (ii) දිවිහිම් කොට රහත්හු ප්‍රාණාතිපාතය හැර ප්‍රාණාතිපාතයෙන් වැලකුණාහු බහාපියන ලද දඬුවම් ඇතියහු බහාපියන ලද ආයුධ ඇතියහු ලජ්ජා ඇතියහු කරුණාවට පැමිණියහු සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පීව වාසය කෙරෙත්ද, (iii) අද මමද මේ රාත්‍රි කාලයද මේ දවස මුලුල්ලද ප්‍රාණාතිපාතය හැර ප්‍රාණාතිපාතයෙන් වැලකුණේ බහාපියන ලද දඬු ඇත්තේ බහාපියන ලද ආයුධ ඇත්තේ ලජ්ජා ඇත්තේ කරුණාවට පැමිණියේ වාසය කරමි කියායි. (iv) මේ කාරණයෙන්ද රහතුන් වහන්සේලාට අනුව (ක්‍රියා) කරමි. මා විසින්ද පෙහෙවස් වැස නිමවන ලද්දේ වන්නේයයි' (v) මේ පළමුවෙනි අංගයෙන් යුක්තවූයේ වෙයි.

3. "දිවිහිම් කොට රහතුන් වහන්සේලා අදින්නාදානය (-නුදුන්දේ ගැන්ම) හැර නුදුන්දෙය ගැන්මෙන් වැලකුනාහු දුන්දේ ගැනුම් සුළුවූවාහු දුන්දේ කැමතිවන සුළුවාහු සොර නොවූ

පවිත්‍රවූ ආත්මයෙන් යුක්තවූ වෙසෙත්ද, අද මමද මේ රාත්‍රි කාලයද මේ දහවල් කාලයද නුදුන් දේ ගැනීමෙන් දුරුව නුදුන් දේ ගැනීමෙන් වැලකුණේ දෙන දෙයට කැමතිවන සුළු වූයේ සොරනොවූ පවිත්‍රවූ ආත්මයෙන් යුක්තව වසමි. (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) මේ දෙවෙනි අංගයෙන් යුක්තවූයේ වෙයි.

**4.** "දිවිහිමි කොට රහතුන් වහන්සේලා අශ්‍රෙෂ්ඨ චර්යාව හැර ශ්‍රෙෂ්ඨ චර්යා ඇත්තාහු ආරාචාරීවූවෝ ග්‍රාමධර්ම සංඛ්‍යාත මෛවුන්දමින් වැලකුණාහු වෙත්ද, මමද අද මේ රාත්‍රි කාලයද මේ දවස මුලුල්ලෙහිද අශ්‍රෙෂ්ඨචර්යාව හැර බ්‍රහ්මචාරීවූයේ ආරාචාරීවූයේ (දුරාචාර නැත්තේ) ග්‍රාමධර්මසංඛ්‍යාත මෛවුන්දමින් වැලකුණේ වෙමි. (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) මේ තුන්වෙනි අංගයෙන්ද යුක්තවූයේ වෙයි.

**5.** "දිවිහිමිකොට රහතුන් වහන්සේලා බොරුකීම හැර බොරුකීමෙන් වැළකුණාහු සත්‍යවාදීවූවෝ සත්‍යයෙන් සත්‍යය ගැලපීම් ඇත්තෝ ස්ථිරවූ ඇදහිය යුතුවූවාහු ලෝකයාට බොරු නොකියන්නෝ වෙත්ද, මමද අද මේ රාත්‍රියද මේ දහවලද මුසාවාදය හැරදමා මුසාවාදයෙන් වැලකුණේ සත්‍යවාදීවූයේ සත්‍යයෙන් සත්‍යය ගැලපීම් ඇත්තේ ස්ථිරවූයේ ඇදහිය යුතු වචන ඇත්තේ ලොකයාට (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) බොරුකාර නොවූයේ වෙයි. මේ සතර වෙනි කාරණයෙන්ද යුක්තවූයේ වෙයි.

**6.** "දිවිහිමි කොට රහතුන් වහන්සේලා ප්‍රමාදයට කරුණුවූ රහමෙර මත්ද්‍රව්‍යය පානය හැරදමා ප්‍රමාදයට කරුණුවූ රහමෙර මත්ද්‍රව්‍යය පානයෙන් වැලකුණාහු වෙත්ද, අද මමද මේ රාත්‍රියෙහි මේ දහවල්හිද ප්‍රමාදයට කරුණුවූ රහමෙර මත්ද්‍රව්‍ය පානය හැර ප්‍රමාදයට කරුණුවූ රහමෙර මත්ද්‍රව්‍ය පානයෙන් වැලකුණේ වෙමි. (මෙහි 2 (iv) යෙදිය යුතුයි) මේ පස්වෙනි කාරණයෙන්ද යුක්තවූයේ වෙයි.

**7.** "දිවිහිමිකොට රහතුන් වහන්සේලා එකභක්තික (එක වේලේ වළඳන අහරකිස) වූවාහු රාත්‍රි භොජනයෙන් වැලකුණාහු විකාලභොජනයෙන් (නොකල්හි වැළඳීමෙන්) වැලකුණාහු

වෙත්ද, අද මම ද මේ රාත්‍රියෙහිද මේ දහවල්හිද එක භක්තිකවූයේ රාත්‍රි භොජනයෙහි වැලකුණේ විකල් බොජුනෙන් වැලකුණේ වෙමි. (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) මේ සයවෙනි කාරණයෙන්ද යුක්තවූයේ වෙයි.

8. "දිවිහිමි කොට රහතුන් වහන්සේලා නැටීම ගැයීම වැයීම විහුළු දර්ශනය මල්ගඳ විලවුන් දැරීම මණ්ඩණාය (සැරසීම) අලංකාරය යන මෙයින් වැලකුණාහු වෙත්ද මමද අද මේ රාත්‍රියෙහි මේ දවස්හිද නැටීම ගැයීම වැයීම මල්ගඳ විලවුන් දැරීම සැරසීම අලංකාරය යන මෙයින් වැලකුණේ වෙමි. (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) මේ සත්වෙනි කාරණයෙන්ද යුක්තවූයේ වෙයි.

9. "දිවිහිමි කොට රහතුන් වහන්සේලා උසසුන් හා මහසුන් හැර උසසුනෙන් හා මහසුනෙන් වැලකුණාහු නීච සෙයාාව (පහත්වූ අසුන්හි සයනය) කෙරෙත්ද මැස්සක හෝ තණ ඇතිරියක හෝ හොවිතිද (මෙහි 2 (iv) යෙදිය යුතුයි) මේ අටවෙනි කාරණයෙන්ද යුක්තවූයේ වෙයි.

10. "මහණෙනි. මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙම එක් දිශාවක්ද එසේම දෙවනිවූද තෙවෙනිවූද සිවුවෙනිවූද දිශාවන්ද මෛත්‍රීසහගත සිතින් පැතිරී වෙසේද මෙසේ උඩ යට සරස සැමතන්හි සැමතන්හි සියල්ල ඇත්තාවූ ලෝකයා මහත්වූ මහත්ගතවූ අප්‍රමාණවූ අවෛරීවූ අව්‍යාපාදවූ මෛත්‍රී සහගත සිතින් පැතිරී වාසය කෙරේද මේ නවවෙනි අංගයෙන් (කාරණයෙන්) යුක්තවූයේ වෙයි.

11. (මෙහි 1 (i) යෙදිය යුතුයි.)

19. **පච්ඡානුතාපිනී සූත්‍රයः-** 1. "මහණෙනි, මේ රාත්‍රියෙහි බොහෝ දෙවතාවෝ මා කරා පැමිණ මෙසේ කීවාහුය. (ii) "ස්වාමීන් වහන්ස, අප කරා පෙර මනුෂ්‍යවූ පැවිද්දෝ පැමිණියාහුය. ස්වාමීන් වහන්ස, ඒ අපි ගෙවල් පිහිටෙවුවෙමු (ii) කථාද නොකෙළෙමු. (iv) ස්වාමීන් වහන්ස, ඒ අපි නොපිරිහුන් කර්මාන්ත ඇත්තියෝ විපිළිසර වූවාහු පසුතැවිලි ඇතිවූවාහු පහත් ලෝකයකට පැමිණියාහුය."

2. "මහණෙනි, අනාවූත් බොහෝ දෙවතාවෝද මා කරා පැමිණ මේ කාරණය කීවාහුය. (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) නොම වැන්දෙමු. (මෙහි 1 (iv) යෙදිය යුතුයි.) (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) ආසන නුදුන්නෙමු. (මෙහි 1 (iv) සහ 1 (ii) යෙදිය යුතුයි.) අසුන් දුන්නෙමු. ශක්ති පමණින් බෙදා නුදුන්නෙමු. (මෙහි 1 (iv) සහ 1 (ii) යෙදිය යුතුයි) ශක්ති පරිද්දෙන් බල පරිද්දෙන් සංවිභාග (බෙදා දීම) කෙළෙමු. බණ ඇසීම පිණිස ළඟ නූන්නෙමු. බණ ඇසීම පිණිස ළඟ උන්නෙමු. නමනලද කන් ඇත්තෝව (කන් නමාගෙන) ධර්මය නොඇසූයෙමු. (මෙහි 1 (iv) සහ (ii) යෙදිය යුතුයි.) නමනලද කන් ඇත්තෝව ධර්මය ඇසුම්හ. අසාගෙන ධර්මය නොදැරූම්හ. (මෙහි 1 (iv) සහ 1 (ii) යෙදිය යුතුයි) අසා ධර්මය නොදැරූම්හ. (මෙහි 1 (iv) සහ 1 (ii) යෙදිය යුතුයි.) ධර්මය අසා දරා ගැනුම්හ. අසා දරාගන්නා ලද ධර්මයන්ගේ අර්ථය නැවත පරීක්ෂා නොකෙළෙම්හ. (මෙහි 1 (iv) සහ 1 (ii) යෙදිය යුතුයි) දරාගන්නා ලද ධර්මයන්ගේ අර්ථය නැවත පරීක්ෂා කෙළෙම්හ. අර්ථය දැනගෙන ධර්මය දැනගෙන ධර්මානුධර්මයෙන් (යුක්තව) පිළිපැද්දෙමු. ස්වාමීන් වහන්ස, පිරිපුන්නොවූ කර්මාන්ත ඇති විපිළිසරවූ පසුතැවුලි ඇතිවූ ඒ අපි ලාමක කයට පහත් ලොවකට පැමිණියෝවෙමු.

3. "මහණෙනි, අනාවූද බොහෝ දෙවතාවෝ මා කරා පැමිණ මෙසේ කීවාහුය. ස්වාමීන් වහන්ස, පෙර මනුෂ්‍යවූ පැවිද්දෝ අප කරා පැමිණියාහුය. ස්වාමීනි, ඒ අපි (දැක) හුනස්නෙන් නැගිටුම්හ වැන්දෙමු. අසුන් දුන්නෙමු. ශක්ති පමණින් බල පමණින් (සීලවන්තයන්ට) බෙදා වැළඳවූයෙමු. ධර්මශ්‍රවණය පිණිස වෙත උන්නෙමු. නමන ලද කන් ඇතුව ධර්මය ඇසුම්හ. ධර්මය අසා දරාගතුම්හ. දරාගත් ධර්මයන්ගේ අර්ථය නැවත පරීක්ෂා කෙළෙම්හ. අර්ථයත් දැන ධර්මයත් දැන ධර්මානුධර්මයට අනුව පිළිපැදුම්හ. ස්වාමීනි, පරිපූර්ණ කර්මාන්ත ඇති විපිළිසර නොවූ පසුතැවිලි නොවූ ඒ අපි ප්‍රණීතවූ කයකට උසස් ලෝකයකට පැමිණියෙමු.

4. "මහණෙනි, මේ රුක්මුල් මේ ශූන්‍යාගාරයන්හි ධ්‍යාන වඩවු. ඒ පූරිමික දෙවතාවුන් මෙන් පමා නොවවු, පසුව විපිළිසර නොවවු."

20. වෙලාම සූත්‍රයඃ- 1. "ඉක්බිති අනේපිඬු ගෘහපතිතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ අනේපිඬු ගෘහපතියන්ට භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළසේක.

2. "ගෘහපතිය, තොපගේ කුලයෙහි (ගෙදර) දන්දෙනු ලැබේද?" "ස්වාමීන්වහන්ස, මා විසින් කුලයෙහි දන්දෙනු ලැබෙති. හෙද වනාහි කාඩි දෙවෙනිකොට ඇති කුඩුහාලේ බත්ය." "ගෘහපතිය, රූක්ෂව (කටුකව) හෝ දානය දෙයිද, ප්‍රණීතව හෝ දෙයිද එය නොසකස්කොට දෙයිද, අචිත්තීකෘතව (අගෞරවයෙන්) දෙයිද, සියතින් නොදෙයිද, (ඇණවීමෙන්) දෙයිද, අහක දමනලද්දක් මෙන් දෙයිද, කම්පල නොඅදහා දෙයිද, යම් යම් තැනක ඒ දානයාගේ විපාකය නිපදවයිද, (එසේ කල්හි) උදාරවූ බොජුන් වැළඳීම පිණිස සිත නොනැමෙයි. උදාරවූ වස්ත්‍ර පරිභොගය පිණිස සිත නොනැමෙයි. උදාරවූ යාන පරිභොගය පිණිස සිත නොනැමෙයි. උදාරවූ පස්කම් පරිභොගය පිණිස සිත නොනැමෙයි. ඔහුගේ යම් ඒ පුත්‍රයෝ හෝ වෙත්ද, අඹුවෝ හෝ වෙත්ද, දාසයෝ හෝ වෙත්ද, මෙහෙකරුවෝ හෝ වෙත්ද, කම්කරුවෝ හෝ වෙත්ද, ඔවුහුද (කියන වදන්) නොඅසත් නොහොත් කීකරු නොවෙත්. (දැනගැනීම පිණිස) කන්නමා නොසිටිත්. දැනගැනීම පිණිස සිත පිහිටුවා නොතබත්. ඊට හේතු කවරේද? ගෘහපතිය, මෙසේ මෙය වනාහි නොසකස්කොට කරනලද කර්මයන්ගේ විපාකය වෙයි.

3. "ගෘහපතිය, රූක්ෂව (කටුකව) හෝ දන් දෙයිද ප්‍රණීතව හෝ දෙයිද, සකස්කොට දෙයිද, චිත්තීකෘතව ගෞරවයෙන් දෙයිද, සියතින් දෙයිද, අහක දමන ලද්දක්සේ නොදෙයිද, කම්පල අදහා දෙයිද, යම් යම් තැනක ඒ ඒ දානයාගේ විපාකය නිපදීද, උදාරවූ බොජුන් වැළඳීම පිණිස සිත (එසේ කල්හි)

උදාරවූ යාන පරිභොගය පිණිස නැමෙයි. උදාරවූ පස්කම් පරිභොගය පිණිස නැමෙයි. උදාරවූ වස්ත්‍ර පරිභොගය පිණිස සිත නැමයි. ඔහුගේ යම් ඒ පුත්‍රයෝ හෝ වෙත්ද, දාරයෝ (අඹුවෝ) හෝ වෙත්ද, මෙහෙකරුවෝ හෝ වෙත්ද, කම්කරුවෝ හෝ වෙත්ද, ඔවුහුද කීකරුවෙත්. කන් නමා තබත් දැනගැනීම පිණිස සිත එළවා තබත්. ඊට හේතු කවරේද? ගෘහපතිය, මෙසේ මෙය වනාහි සකස්කොට කරනලද කර්මයන්ගේ විපාකය වෙයි.”

4. “එකල්හි පෙර වේලාම නම් බ්‍රාහ්මණයෙක් විය. හෙතෙම මෙබඳුවූ මහත් දානයක් දුන්නේය. රිදියෙන් පිරුණු රන්තලි අසූහාර දාහක් දුන්නේය. රනින් පිරුණු රිදීතලි අසූහාර දාහක් දුන්නේය. අමුරන් පිරුණු කස්තලි අසූසාරදාහක් දුන්නේය. ස්වර්ණාලංකාර ඇති ස්වර්ණද්වජ ඇති රන් දැලින් ගැවසුනාවූ ඇතුන් අසූසාරදාහක් දුන්නේය. සිංහ සම් පිරිවරණලද, ව්‍යාඝ්‍රසමින් පිරිවරණලද, (අවුරණලද) දිවිසමින් අවුරණලද, පඬුවන් කම්බිලිවලින් අවුරණලද, රුවනින් අලංකාර කරණ ලද, ස්වර්ණධජ ඇති රන්දැලින් ගැවසී ගත්තාවූ සුවාසූදහස් රථ දුන්නේය. දුහුල් සංදර්ශන ඇති රිදීමය කිරිබඳුන් ඇති සුවාසූදහසක් දෙනුන් දුන්නේය. පැළඳගත් මිණිකොඩොල් සුවාසූදහසක් කන්‍යාවන් දුන්නේය. කොඳුපලසින් අතුරණලද්දාවූද, මෘදු සුදු එළු ලොම් ඇතිරියෙන් අතුරණ ලද්දාවූද, ඝනපුප් ඇතිරියෙන් අතුරණ ලද්දාවූද, කෙහෙල් මුවන්ගේ සමින් කරණ ලද උතුම්වූ පසතුරුණින් අතුරණ ලද උඩුවියන් සහිතවූ දෙපසින් තබනලද රතුකොට්ට ඇති සුවාසූදහක් පර්යංකයන් දුන්නේය. සියුම් කොමුය, සියුම් කෝසෙය්යය, සියුම් කම්බිලිය, සියුම් කපුය යන මොවුන් පිළිබඳ වස්ත්‍ර කෝටිසහස්‍රයන් දුන්නේය. ආහාරය, පානවර්ගය, ඛාද්‍යය, භොජ්‍යය, ලෙය්‍යය, පෙය්‍යය යන මොවුන් ගැන කියනුම කවරේද? (එය) ගලාබසින්නාවූ ගඟක් මෙන් හඟිම්ය යනුයි.

5. “ගෘහපතිය, තට ඔහු පිළිබඳ මෙවැනි අදහසක් වන්නේය. (එනම්) ‘ඒ කාලයෙහි ඒකාන්තයෙන් වේලාම බ්‍රාහ්මණයා අනිකෙක් වූයේය කියායි. හෙතෙම ඒ මහාදානය දුන්නේයයි’

ගෘහපතිය, මේ කාරණය මෙසේ නොදතයුතුය. මම ඒ කාලයෙහි වේලාම බ්‍රාහ්මණයා වීමි. මම ඒ මහා දානය දුන්නෙමි. ගෘහපතිය ඒ දානයෙහි වනාහි කිසියම් දක්ෂිණාර්හයෙක් නොවූයේය. කිසිවෙක් ඒ දක්ෂිණාව විශොධනය (පිරිසිදු බව) නොකරයි.

**6.** "ගෘහපතිය, වේලාම බ්‍රාහ්මණතෙම යම් ඒ මහා දානයක් දුන්නේද, යමෙක් එක දෘෂ්ටිසම්පන්නයෙක් (සෝවාන්වූවෙකු) වළඳවන්නේද, (ii) මෙය එයට වඩා අතිශයින් මහත්ඵල වන්නේය. (iii) ගෘහපතිය, වේලාම බ්‍රාහ්මණතෙම යම් ඒ මහාදානයක් දුන්නේද, යමෙක් දෘෂ්ටිසම්පන්න (සෝවාන්) පුද්ලයන් සියයක් වළඳවන්නේද, යමෙක් එක් සකෘදාගාමි පුද්ගලයෙක් වළඳවන්නේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි) ගෘහපතිය, වේලාම බ්‍රාහ්මණතෙම යම් ඒ මහාදානයක් දුන්නේද, යමෙක් සකෘදාගාමී පුද්ගලයන් සියයක් වළඳවන්නේද, යමෙක් එක් අනාගාමී පුද්ගලයෙකු වළඳවන්නේද, (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යමෙක් අනාගාමී පුද්ගලයන් සිය ගණනක් වළඳන්නේද මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යමෙක් එක් රහත් පුද්ගලයෙකු වළඳවන්නේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යමෙක් සියගණන් රහතුන්වහන්සේලා වළඳවන්නේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යමෙක් එක් පසේබුදුන් වහන්සේ නමක් වළඳවන්නේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යමෙක් සිය ගණන් පසේ බුදුන් වහන්සේලා වළඳවන්නේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යමෙක් තථාගතවූ අර්හත්වූ සම්‍යක් සම්බුදුන් වහන්සේ නමක් වළඳවන්නේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි) යමෙක් බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයා වළඳවන්නේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යමෙක් සතරදිගින් වඩින සංඝයා උදෙසා විහාරයක් කරවන්නේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යමෙක් පහන්සිත් ඇතිව බුදුන්ද, ධර්මයද, සංඝයාද සරණකොට යන්නේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යමෙක් පහන්සිත් ඇතිව ප්‍රාණඝාතයෙන් වැළකීම (ii) නුදුන්දෙය ගැනීමෙන් වැලකීම, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැලකීම, බොරු කීමෙන්වැලකීම, පමාවට කරුණුවූ රහමෙර මත්ද්‍රව්‍ය පානයෙන් වැලකීම යන ශික්ෂා පදයන් සමාදන් වන්නේ (v)

(මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යමෙක් පහන්සිත් ඇතිව ප්‍රාණඝාතයෙන් වැලකීම (මෙහි 6 (iv) යෙදිය යුතුයි.) (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යමෙක් යටත්පිරිසෙයින් සුවඳ පිඩක් දැඟුලෙන් ගෙන ඉසීම් පමණකුදු මෙත් සිත වඩන්නේද මෙය එයට වඩා මහත් ඵලතරය.

7. "ගෘහපතිය, වේලාම බ්‍රාහ්මණතෙම, යම් ඒ මහා දානයක් දුන්නේද යමෙක් එක් සොවාන් පුද්ගලයෙකු වළඳවන්නේද, යමෙක් සියගණන් සෝවාන් පුද්ගලයන් වළඳවන්නේද, යමෙක් එක් සකෘදාගාමී පුද්ගලයෙකු වළඳවන්නේද; යමෙක් සකෘදාගාමී පුද්ගලයන් සියගණන් වළඳවන්නේද, යමෙක් එක් අනාගාමී පුද්ගලයෙක් වළඳවන්නේද, යමෙක් අනාගාමී පුද්ගලයන් සිය ගණනක් වළඳවන්නේද, යමෙක් එක් රහත් පුද්ගලයෙකු වළඳවන්නේද, යමෙක් සිය ගණන් රහත් පුද්ගලයන් වළඳවන්නේද යමෙක් එක්පසේ බුදුන් වහන්සේ නමක් වළඳවන්නේද, යමෙක් සියගණන් පසේ බුදුන් වහන්සේලා වළඳවන්නේද, යමෙක් තථාගතවූ අර්හත්වූ සම්බුදුන් වහන්සේලා වළඳවන්නේද, යමෙක් බුදු පාමොක් බික්සඟන වළඳවන්නේද, යමෙක් සිවුදිගින් වඩින මහා සංඝයා වහන්සේ උදෙසා විහාරයක් කරවන්නේද, යමෙක් පහන්සිත් ඇතිව බුදුන්ද, ධර්මයද, සංඝයාද සරණ කොට යන්නේද, යමෙක් පහන්සිත් ඇතිව ප්‍රාණඝාතයෙන් වැළකීම, පමාවට කරුණු වූ රහමෙර පානයෙන් වැලකීම යන මේ සිකපද සමාදන් වන්නේද, යමෙක් යටත්පිරිසෙන් සුවඳ පිඩක් ඉසීම් පමණකුදු මෙත් සිත වඩන්නේද යමෙක් අසුරුසණක් ගසන පමණ කාලයකුදු අනිත්‍ය සංඥාව වඩන්නේද, මෙය එයට වඩා අතිශයින් මහත්ඵල වන්නේ යයි වදාළසේක."

**(2. සීහනාද වර්ගය නිමි.)**

## 3. සත්තාවාස වර්ගය

**21. උත්තරකුරු ධම්ම සූත්‍රයː-** 1. "මහණෙනි, කරුණු තුනකින් උතුරුකුරු දිව්වැසි මනුෂ්‍යයෝ තවුතිසාවැසි දෙවියන්ද ජම්බුද්වීපික මනුෂ්‍යයන්ද අභිබවා පවතිත්.

2. "කවර නම් තුනකින්දයත්? පහවගිය තෘෂ්ණාවෙන්ද නොහොත් නිදුකින්ද (මේ මගේයයි) අයිතියක් නොකිරීමෙන්ද, විශෙෂවූ නියත ආයුෂ විඳීමෙන්ද, යන මේ තුනෙකි. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු තුනකින් තවුතිසා වැසි දෙවියෝ උතුරුකුරු දිවයින් වැසි මිනිසුන්ද දඹදිවු වැසි මිනිසුන්ද අභිභවනය කෙරෙත්.

4. "කවර තුනකින්දයත්? දිව්‍යමය ආයුෂයෙන්ද, දිව්‍යමය වර්ණයෙන්ද දිව්‍යමය සැපයෙන්ද යන මේ තුනෙහි (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

5. "මහණෙනි, කරුණු තුනකින් දඹදිවු වැසි මනුෂ්‍යයෝ උතුරුකුරු දිවයින් වැසි මනුෂ්‍යයන්ද, තවුතිසා වැසි දෙවියන්ද, අභිභවනය කෙරෙත්.

6. "කවර තුනකින්ද යත්? සූරයෝය. සතිමත්හුය, මෙහි (දඹදිවෙහි) බ්‍රහ්මචරිය වාසය යන මේ තුනයි. (මෙහි 5 ඡෙදය යෙදිය යුතුයි.)

**22. ඛළුංකොපම සූත්‍රයː-** 1. "මහණෙනි, අශ්වපොතකයන් (අසුපැටවුන්) තිදෙනෙක්ද පුරිස පොතකයන් තිදෙනෙක්ද, අසුන් අතුරෙහි යහපත් අසුන් තිදෙනෙක්ද, පුරුෂයන් අතුරෙහි යහපත් පුරුෂයන් තිදෙනෙක්ද, සොඳුරුවූ අස්සාජානීයයන් තිදෙනෙක්ද, සොඳුරුවූ පුරුෂාජානීයන් තිදෙනෙක්ද දෙශනා කරන්නෙමි. (ii) එය මනාකොට අසවු හොඳට මෙනෙහි කරවු කියන්නෙමි" යනුයි. "ස්වාමීන් වහන්ස, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළ සේක.

2. "මහණෙනි, ඒ අශ්වපොතකයන් තිදෙනා කවරහුද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් අශ්වපොතකයෙක් (ii) ජවසම්පන්න වූයේම වේද, වර්ණසම්පන්න නොවේද ආරොහ පරිනාහසම්පන්න නොවේද, (iii) මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් අශ්වපොතකයෙක් (iv) ජවසම්පන්න වේද, වර්ණ සම්පන්න වේද, ආරොහපරිනාහ සම්පන්නනොවේද, (v) මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් අශ්වපොතකයෙක් (vi) ජවසම්පන්න වේද වර්ණසම්පන්න වේද, ආරොහපරිනාහ සම්පන්නවේද මහණෙනි මේ අශ්වපොතකයන් තිදෙනාය.

3. "මහණෙනි, පුරුෂපොතකයන් තිදෙනා කවරහුද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුරුෂපොතකයෙක් තෙම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුරුෂපොතකයෙක් තෙම (මෙහි 2 (iv) යෙදිය යුතුයි) මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුරුෂපොතකයෙක් තෙම (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

4. "මහණෙනි, කෙසේ නම් පුරුෂපොතකතෙමේ ජවසම්පන්න වේද, වර්ණසම්පන්න නොවේද, ආරොහ පරිනාහසම්පන්න නොවේද? (ii) මහණෙනි ශාසනයෙහි මහණතෙම මෙය දුකයයි තත්වූ පරිද්දෙන් දැනගනීද, මෙය දුක්ඛසමුදය යයි තත්වූ පරිද්දෙන් දැනගනීද, මෙය දුක්ඛනිරොධයයි තත්වූ පරිද්දෙන් දැනගනීද මෙය දුක්ඛ නිරොධගාමිනි ප්‍රතිපදාවයයි තත්වූ පරිද්දෙන් දැනගනීද, මෙය ඔහුගේ ජවයයි කියමි. (ii) අභිධර්මයෙහි වනාහි අභිවිනයෙහි ප්‍රශ්න විචාරණ ලද්දේ පසු බසියි. නොවිසඳයි මෙය ඔහුගේ වර්ණයෙහියයි නොකියමි චීවරය පිණ්ඩපාතය සෙනාසනය ගිලාන ප්‍රත්‍යය යන බෙහෙත් සමූහය ලබන සුළුවූයේ නොවේද, මෙය ඔහුගේ ආරොහපරිනාහ සම්පන්නයෙහි වේයයි නොකියමි මහණෙනි මෙසේ වනාහි පුරුෂපොතක තෙමේ ජවසම්පන්න වෙයි. වර්ණසම්පන්න නොවෙයි ආරොහපරිනාහ සම්පන්න නොවෙයි.

5. "මහණෙනි, කෙසේ නම් පුරුෂපොතක තෙම ජවසම්පන්නවේද, වර්ණසම්පන්නවේද ආරොහපරිනාහ

සම්පන්න නොවේද? (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) අභිධර්මයෙහි අභිවිනයෙහි වනාහි ප්‍රශ්න විචාරන ලද්දේ විසඳයිද, සංසන්දනය (එකට ගැලපීම) නොවෙයිද, මෙය ඔහුගේ වර්ණයෙහි වේයයි කියමි. චීවරය, පිණ්ඩපාතය, සෙනාසනය, ගිලානප්‍රත්‍යය යන බෙහෙත් සමූහය නොලබනසුළු වූයේවේද, මෙය ඔහුගේ ආරෝහපරිනාහයෙහි වේයයි නොකියමි. මෙසේ වනාහි මහණෙනි, පුරුෂපොතකතෙම ජවසම්පන්න වෙයි. වර්ණ සම්පන්න වෙයි ආරොහපරිනාහ සම්පන්න නොවෙයි.

6. "මහණෙනි, කෙසේ නම් පුරුෂපොතකතෙම ජව සම්පන්නවේද, වර්ණසම්පන්නවේද, ආරොහපරිනාහ සම්පන්න වේද, (ii) (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) (iii) අභිධර්මයෙහි අභිවිනයෙහි වනාහි ප්‍රශ්න අසනලද්දේ විසඳයිද, සංසන්දනය (ගැලපීම) නොවේයයිද, මෙය මොහුගේ වර්ණයෙහි වේයයි කියමි. චීවරය, පිණ්ඩපාතය, සෙනාසනය, ගිලානප්‍රත්‍යය බෙහෙත් සමූහය යන මෙය ලබන සුළුවූයේ වේද, මෙය ඔහුගේ ආරොහපරිනාහයෙහිවේයයි කියමි. මහණෙනි මෙසේ වනාහි පුරුෂපොතකතෙම ජවසම්පන්න වෙයි. වර්ණ සම්පන්න වෙයි. ආරෝහපරිනාහ සම්පන්නවෙයි. මහණෙනි, මේ පුරුෂ පොතකයන් තුන්දෙනා වෙත්යයි වදාළසේක.

7. (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි. "අශ්වපොතක" වෙනුවට "අශ්වසදශ්ව" යෙදිය යුතුයි.)

8. (මෙහි මේ සූත්‍රයේ 3 4 5 6 (i) යෙදිය යුතුයි.) "පුරුෂපොතක" වෙනුවට "පුරුෂසදශ්ව" යෙදිය යුතුයි.)

9. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ පඤ්චොරම්භාගීය (කාමලෝකය භජනය කරන සංයෝජන ධර්ම රැහැන්විය) ක්ෂය කිරීමෙන් ඕපපාතිකවූයේ එහිදී පිරිනිවන් පානාසුළු වූයේ ඒ ලෝකයෙන් (උත්පත්ති වශයෙන්) මෙහි නොඑන ස්වභාව ඇත්තේවේද, මෙය ඔහුගේ ජවයෙහි වූයේයි කියමි. අභිධර්මයෙහි අභිවිනයෙහි ප්‍රශ්න විචාරණ ලද්දේ විසඳයිද, නො සැසඳේද මෙය ඔහුගේ වර්ණයෙහි වූයේයයි කියමි. චීවරය පිණ්ඩපාතය සෙනාසනය ගිලාන ප්‍රත්‍යය බෙහෙත්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

සමූහය යන මොවුන් ලබනසුළුවූයේ වේද, මෙය ඔහුගේ ආරෝහපරිනාහයෙහි වූයේයයි කියමි. මහණෙනි මෙසේ වනාහි පුරුෂසදශ්ව තෙමේ ජවසම්පන්නද වෙයි. වර්ණ සම්පන්නද වෙයි. ආරෝහපරිනාහ සම්පන්නද වෙයි. මහණෙනි. මොවුහු වනාහි පුරුෂසදශ්වයන් තිදෙනා වෙති.

10. "මහණෙනි, සොඳුරු අශ්වාජානීයයෝ තිදෙන කවරහුද? මහණෙනි, මේ ලෝකයෙහි සොඳුරුවූ අශ්වාජානීයයෙක් තෙම ජවසම්පන්නද වේ. වර්ණ සම්පන්නද වේ. ආරොහපරිනාහසම්පන්නද වේ. මහණෙනි, මේ වනාහි සොඳුරු අශ්වාජානීයයෝ තිදෙනා වෙති.

11. "මහණෙනි" සොඳුරු පුරුෂාජානීයයෝ තිදෙනා කවරහුද? මහණෙනි. මේ ලෝකයෙහි ඇතැම් සොඳුරුවූ පුරුෂාජානීයයෙක් තෙම ජව සම්පන්නද වෙයි. වර්ණ සම්පන්නද වෙයි. ආරොහපරිනාහ සම්පන්නද වෙයි. මහණෙනි, කෙසේනම් සොඳුරුවූ පුරුෂාජානීය තෙමේ ජවසම්පන්න වේද, වර්ණ සම්පන්නවේද, ආරෝහපරිනාහ සම්පන්න වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රවරහිතවූ චෙතො විමුක්තියද ප්‍රඥා විමුක්තියද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන සාත්කොට (ප්‍රත්‍යක්ෂකොට) දැන ඊට පැමිණ වෙසේද, මෙය ඔහුගේ ජවයෙහි වේයයි කියමි.

12. "අභිධර්මයෙහි අභිවිනයෙහි වනාහි ප්‍රශ්න විචාරණ ලද්දේ විසඳයිද, නොසැසඳෙයිද (නොගැලපෙයිද) මෙය ඔහුගේ වර්ණයෙහි වූයේයයි කියමි. චීවර පිණ්ඩපාත සයනාසන ගිලානප්‍රත්‍යය බෙහෙත් සමූහය යන මොවුන් ලබන සුළුවූයේ වේද, මෙය ඔහුගේ ආරොහපරිනාහයෙහි වේයයි කියමි. මහණෙනි, මෙසේ වනාහි සොඳුරු පුරුෂාජානීයතෙමේ ජව සම්පන්නද වෙයි. වර්ණ සම්පන්නද වෙයි. ආරොහපරිනාහ සම්පන්නද වෙයි. මහණෙනි, මේ තිදෙන වනාහි සොඳුරුවූ පුරුෂාජානීයයෝ වෙතියි" වදාළසේක.

**23. නව තණ්හාමූලක සූත්‍රය:-** 1. "මහණෙනි, තෘෂ්ණා මූලික ධර්ම නවය දේශනා කරන්නෙමි. (මෙහි මේ වර්ගයේ 22 සූත්‍රයේ 1 (ii) යෙදිය යුතුයි.)

2. "මහණෙනි, තෘෂ්ණාව මුල්කොට ඇති ධර්ම නවය කවරහුද? තෘෂ්ණාව නිසා තෘෂ්ණාවෙන් භොගයන් සෙවීම වෙයි. සෙවීම නිසා ලාභය වෙයි. ලාභය නිසා මගේ යයි විනිශ්චය වෙයි. විනිශ්චය නිසා දැඩි ආශාව වෙයි. ආශාව නිසා මමය, මාගේයයි සනිටුහන් කරගැනීම වෙයි. සනිටුහන් කිරීම නිසා තෘෂ්ණාදෘෂ්ටියෙන් දැඩිව අල්ලාගැනීම වෙයි. ගැනීම නිසා මසුරුකම වෙයි. මසුරු බව නිසා ආරක්ෂා කිරීමට හේතුවෙයි. දඬුමුගුරු ගැනීම, ආයුධ ගැනීම, කලහය, විරුද්ධවාදය (නුඹය, නුඹය) යන ප්‍රියශූන්‍ය මුසාවාදවූ නොයෙක් ලාමකවූ අකුසල ධර්මයෝ ලැබීම වෙත්. මහණෙනි, මේ නවය තෘෂ්ණාව මුල්කොට ඇති ධර්මයෝය."

**24. නව සත්තාවාස සූත්‍රය:-** 1. "මහණෙනි, මොවුහු සත්වයන් වසන තැන් නවයය.

2. "කවර නවයක්ද? මිනිසුන් මෙන්ද, ඇතැම් දෙවියන් මෙන්ද, ඇතැම් දුගතියෙහි උපන්නවුන් මෙන්ද, නානාත්ම කාය ඇති නානාත්ම හා සංඥා ඇති සත්වයෝ ඇත්තාහ. මේ පළමුවෙනි සත්වාවාසයයි. මහණෙනි. කල්පයේ පළමුව පහළවූ බ්‍රහ්මකායික දෙවියන් මෙන් නානාත්ම කාය ඇති එක සමාන සංඥා ඇති සත්වයෝ ඇත්තාහුය. මෙය දෙවෙනි සත්වාවාසයයි. මහණෙනි, ආභස්සර දෙවියන් මෙන් එකසමාන කාය ඇති නානාත්ම සංඥා ඇති සත්වයෝ ඇත්තාහ. මේ තුන්වෙනි සත්වාවාසයයි. මහණෙනි සුභකිණ්හක දෙවියන් මෙන් එකසමාන කායවූ එකසමාන සඤ්ඤාවූ සත්වයෝ ඇත්තාහ. මේ සතරවෙනි සත්වාවාසයයි. මහණෙනි අසඤ්ඤසත්ත දෙවියන් මෙන් සංඥාවක් නැත්තාවූ විඳීමක් නැත්තාවූ සත්වයෝ ඇත්තාහ. මේ පස්වෙනි සත්තාවාසයයි. මහණෙනි, සර්වප්‍රකාරයෙන් රූපහැඟීම ඉක්මවීමෙන්ද, ක්‍රොධ සිතිවිලි (දුරුකිරීමෙන්) නානාත්මසංඥාවන් මෙනෙහි නොකිරීමෙන්

"ආකාශය අනන්තයයි" ගන්නා සත්වයෝ ඇත්තාහ. මේ සයවෙනි සත්තාවාසයයි.

3. "මහණෙනි, සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම විඤ්ඤාණය අනන්තයයි ගන්නා සත්වයෝ ඇත්තාහ. මේ සත්වෙනි සත්තාවාසයයි.

4. "මහණෙනි, සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම කිසිවක් නැත්තේයයි ගන්නා සත්වයෝ ඇත්තාහ. මේ අටවෙනි සත්වාවාසයයි.

5. "මහණෙනි, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම සංඥාවක් නැත, සංඥාවක් නැත්තේ නොවේය යන හැඟීම් ඇති සත්වයෝ ඇත්තාහ. මේ නවවෙනි සත්තාවාසයයි"

**25. පරිඤ්ඤාපරිචිත සූත්‍රයඃ-** 1. "මහණෙනි, යම් හෙයකින් වනාහි භික්ෂුවකගේ සිත ප්‍රඥාවෙන් මොනවට පුරුදු කරන ලද්දේවේද මහණෙනි ඒ භික්ෂුවට ජාතිය ක්ෂය වූවාය. බඹසර වැස නිමවන ලදී. සතර මාර්ගයෙන් කරන ලද කටයුතු කරනලදී. මේ ආත්මභාවය හැර අනිකක් නොදනිමියි කීම පිණිස මෙය සුදුසුය.

2. "මහණෙනි, කෙසේ නම් භික්ෂුවකගේ සිත ප්‍රඥාවෙන් පුරුදු කරන ලද්දේ වේද? මාගේ සිත පහවූ රාග ඇත්තේයයි' ප්‍රඥාවෙන් පුරුදු කරන ලද්දේ වේද, 'මාගේ සිත පහවූ ද්වෙෂ ඇත්තේයයි' ප්‍රඥාවෙන් මනාකොට පුරුදු කරන ලද්දේ වේද, 'මාගේ සිත පහවූ මෝහ ඇත්තේයයි' ප්‍රඥාවෙන් මනාකොට පුරුදුකරන ලද්දේ වේද, 'මාගේ සිත නොඇලෙන ස්වභාවය ඇත්තේයයි' ප්‍රඥාවෙන් මනාකොට පුරුදු කරන ලද්දේ වේද, 'මාගේ සිත නොකිපෙන ස්වභාව ඇත්තේ යයි' ප්‍රඥාවෙන් මනාකොට පුරුදු කරන ලද්දේ වේද, 'මාගේ සිත නුමුළා ස්වභාව ඇත්තේයයි' ප්‍රඥාවෙන් මනාකොට පුරුදු කරන ලද්දේ වේද, 'මාගේ සිත කාමභවය පිණිස නැවත නොපෙරෙළෙන ස්වභාවය ඇත්තේයයි' ප්‍රඥාවෙන් මනාකොට පුරුදු කරන ලද්දේ වේද, 'මාගේ සිත රූපභවය පිණිස නැවත නොපෙරෙළෙන ස්වභාවය ඇත්තේයයි' ප්‍රඥාවෙන් මනාකොට පුරුදු කරන ලද්දේ වේද,

'මාගේ සිත අරූපභවය පිණිස නැවත නොපෙරෙළෙන ස්වභාවය ඇත්තේයයි' ප්‍රඥාවෙන් සිත මනාකොට පුරුදු කරන ලද්දේ වේද,

3. "මහණෙනි, යම් හෙයකින් වනාහි භික්ෂුවකගේ සිත ප්‍රඥාවෙන් මනාකොට පුරුදු කරන ලද්දේ වේද, මහණෙනි, ඒ භික්ෂුවට ජාතිය ක්ෂයවූවාය. බඹසර වාසය කොට නිමවන ලද්දේය. සතර මාර්ගයෙන්වූ කටයුතු කරනලදී. මේ ආත්මභාවය හැර අනිකක් නොදනිමියි මෙය කීමට සුදුසුය.

**26. සිලායූපොපම සූත්‍රය**:- 1. "මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් චන්දිකා පුත්‍ර ස්ථවිරයන් වහන්සේද රජගහ නුවර කලන්දක නිවාප නම්වූ වෙළුවනයෙහි වැඩ වාසය කෙරෙත්. එකල්හි වනාහි ආයුෂ්මත් චන්දිකාපුත්‍ර ස්ථවිරතෙමේ ඇවැත්නි, මහණෙනි, කියා භික්ෂූන්ට ඇමතුසේක. "ඇවැත්නි" කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් චන්දිකා පුත්‍ර ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ. ආයුෂ්මත් චන්දිකා පුත්‍ර ස්ථවිරයන් වහන්සේ මේ කාරණය කීයේය.

2. "ඇවැත්නි, දෙවදත්තතෙමේ භික්ෂූන්ට මෙසේ ධර්ම දෙශනා කෙරෙයි. (කෙසේද?) 'ඇවැත්නි, යම් හෙයකින් වනාහි භික්ෂුවකගේ සිතින් සිත මනාකොට පුරදු කරන ලද්දේවේද, ජාතිය ක්ෂය වූවාය. බඹසර වැස නිමවන ලදී. සතර මාර්ගික කටයුතු කරන ලදී. 'මේ ආත්මභාවය හැර අනිකක් නොදනිමි'යි මෙය ප්‍රකාශ කරීම පිණිස සුදුසුය." කියායි ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් චන්දිකා පුත්‍ර ස්ථවිරයන්ට මේ කාරණය කීසේක.

3. "ඇවැත්නි, චන්දිකා පුත්‍රයිනි, දෙවදත්තතෙමේ භික්ෂූන්ට මෙසේ ධර්මය දෙශනා නොකෙරේය. කෙසේද? ඇවැත්නි, යම්හෙයකින් භික්ෂුවකගේ සිතින් සිත මනාකොට පුරුදු කරන ලද්දේවේද, ඒ භික්ෂුවට ජාතිය ක්ෂයවූවාය. බඹසර වැස නිමවන ලදී. සතර මාර්ගික කටයුතු කරන ලදී. මේ ආත්ම භාවය හැර අනිකක් නොදනිමියි ප්‍රකාශ කිරීම පිණිස සුදුසුය" කියායි.

**4.** "ඇවැත්නි, චන්දිකා පුත්‍රයෙනි, මෙසේ වනාහි දෙවදත්තතෙමේ භික්ෂූන්ට ධර්මය දෙශනා කෙරෙයි. කෙසේද? (ii) යම්හෙයකින් වනාහි ඇවැත්නියි භික්ෂුවකගේ සිත (තමන්ගේ) සිතින් මනාකොට පුරුදුකරන ලද්දේවේද, ඒ භික්ෂුවට ජාතිය (ඉපදීම) ක්ෂයවූවාය. බඹසර වැස නිමවන ලද්දේය. සතර මාර්ගික කටයුතු කරන ලද්දේය. මේ ආත්මභාවය හැර අනිකක් නොදනිමියි ප්‍රකාශ කිරීම පිණිස මෙය සුදුසුය. (iii) යනුයි. දෙවෙනි වරත් (මෙහි 4 (ii) ඡෙදය යෙදිය යුතුයි.)

**5.** "තෙවෙනි වරද ආයුෂ්මත් චන්ද්‍රිකාපුත්‍ර ස්ථවිරතෙමේ භික්ෂූන් ඇමතීය. 'ඇවැත්නි, දෙවදත්තෙමේ භික්ෂූන්ට මෙසේ ධර්මය දෙශනා කෙරෙයි' කෙසේද? (ii) 'ඇවැත්නි, යම් හෙයකින් භික්ෂුවගේ සිත (තමන්ගේ) සිතින් යහපත් ලෙස පුරුදු කරන ලද්දේවේද, ඒ භික්ෂුවට ජාතිය (ඉපදීම) ක්ෂය වූවාය. බ්‍රහ්මචරිය වාසය වැස නිමවනලදී (සිවුමගින් කරන ලද) කටයුතු කරනලදී. මේ ආත්මභාවය හැර අනික් ආත්මභාවයක් නොදනිමියි ප්‍රකාශකිරීම පිණිස මෙය සුදුසුය." කියායි.

"තෙවෙනි වරද ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් චන්ද්‍රිකාපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මේ කාරණය කීසේක. කුමක්ද? ඇවැත්නි, චන්ද්‍රිකා පුත්‍රයෙනි, (මෙහි 5 (ii) ඡෙදය යෙදිය යුතුයි.)

"දෙවුදත්තෙමේ භික්ෂූන්ට මෙසේ ධර්මය නොම දෙශනා කරයි කියායි. ඇවැත්නි, චන්ද්‍රිකා පුත්‍රයෙනි, (මෙහි 5 (ii) යෙදිය යුතුයි) මෙසේ දෙවදත්තතෙමේ භික්ෂූන්ට ධර්මය දෙශනා කෙරෙයි යනුයි.

**6.** "ඇවැත්නි, කෙසේ නම් භික්ෂුවකගේ සිතින් (තමන්ගේ) සිත යහපත් ලෙස පුරුදුකරන ලද්දේ වේද? මාගේ සිත පහවූ රාග ඇත්තේයයි' සිතින් (තමන්ගේ) සිත පුරුදුකරන ලද්දේවේද 'මාගේ සිත පහවූදොෂ ඇත්තේයයි' සිතින් තමන්ගේ සිත පුරුදුකරන ලද්දේවේද, 'මාගේ සිත පහවූ මොහ ඇත්තේයයි' සිතින් (තමන්ගේ) සිත පුරුදු කරන ලද්දේ වේද, 'මාගේ සිත

නොඇලෙන්නේයයි' සිතින් (තමන්ගේ) සිත පුරුදුකරන ලද්දේවේද, 'මාගේ සිත ද්වෙෂ නැත්තේයයි (තමන්ගේ) සිතින් සිත යහපත් ලෙස පුරුදුකරන ලද්දේ වේද, මාගේ සිත නොමුළාවන ස්වභාව ඇත්තේයයි සිතින් (තමන්ගේ) සිත යහපත් ලෙස පුරුදුකරන ලද්දේවේද, 'මාගේ සිත කාමභාවය පිණිස නැවත නොපෙරෙලෙන ස්වභාව ඇත්තේයයි' සිතින් තමන්ගේ සිත මොනවට පුරුදුකරන ලද්දේ වේද, 'මාගේ සිත රූපභවය පනිස නැවත නොපෙරෙලෙන 'ස්වභාව ඇත්තේයයි' සිතින් සිත මොනවට පුරුදුකරන ලද්දේවේද, මාගේ සිත අරූපභවය පිණිස නැවත නොපෙරෙලෙන ස්වභාව ඇත්තේයයි' සිතින් සිත මොනවට පුරුදු කරන ලද්දේ වේද,

7. "ඇවැත්නි, මෙසේ මනාකොට කෙලෙසුන් ගෙන් මිදුන සිත් ඇති භික්ෂුවකගේ ඇසින් දැක්ක යුතුවූ රූපයෝ අතිශයින් ඇසට හමුවීමට පැමිණෙත්ද ( (ii) ඔහුගේ සිත අල්ලා ගැනීම) නො කෙරෙත්. ඔහුගේ සිත මුසු නොකරන ලද්දේ සිටිසේ වෙයි. කම්පා රහිත භාවයට පැමිණියේ ඔහුගේ විනාශයද බලයි.

"අතිශයින් කණින් දතයුතුවූ ශබ්දයෝ කණට හමුවීමට පැමිණෙත්ද, (මෙහි 7 (ii) යෙදිය යුතුයි) නැහැයෙන් දතයුතුවූ ගඳ සුවඳ අතිශයින් නාසයට හමුවීමට පැමිණෙත්ද (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) දිවෙන් දතයුතුවූ රසයෝ අතිශයින් දිවට හමුවීමට පැමිණෙත්ද (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) (ශරීරයෙන්) දතයුතුවූ ස්පර්ශයෝ අතිශයින් ශරීරයට හමුවීමට පැමිණෙත්ද (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) (සිතින් දතයුතුවූ) ධර්මයෝ සිතට හමුවීමට පැමිණෙත්ද, ඔහුගේ සිත හාත්පසින් අල්ලාගෙන නොසිටිත්. ඔහුගේ සිත මිශ්‍ර නොකොට සිටියේ වෙයි. කම්පා නොවන බවට පැමිණියේ විනාශය දකියි.

8. "ඇවැත්නි යම්සේ සොළොස් රියන් දික්වූ ගල්කණුවක් වේද, එහි අටරියනක් (වළ) යටට ගියාහු වෙත්ද, අට රියනක් (වළෙන්) උඩට ගියාහු වෙත්ද, අනතුරුව පෙරදිගින් (ii) දැඩිවාත තදවැසි සුළඟක් එන්නේද ඒ ගල්කණු කම්පා නොකරන්නේය හොඳින් කම්පා නොකරන්නේය. කම්පා නොකරන්නේය. නො

වෙවුලන්නේය. (iii) අනතුරුව බටහිර දිගින්ද (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) උතුරු දිගින්ද (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) දකුණුදිගින්ද (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) ඊට හේතු කවරේද? ඇවැත්නි, වළ ගැඹුරු හෙයිනි, ගල්කණුව මනාකොට සිටුවන ලද බැවිනි.

**9.** "ඇවැත්නි, එපරිද්දෙන්ම මෙසේ මනාකොට මිදුණු සිත් ඇති භික්ෂුවට අතිශයින්ම ඇසින් දැක්කයුතුවූ රූපයෝ (ඇසේ) හමුවට එත්ද, (ii) ඔහුගේ සිත හාත්පසින් අල්ලා ගෙන නොසිටිත්ද, ඔහුගේ සිත මුසුනොවී සිටියේවේද, කම්පා නොවීමට පැමිණියේ ඔහුගේ විනාශයද දකියි (iii) අතිශයින් කනින් දතයුතුවූ ශබ්දයෝ කනෙන් හමුවීමට එත්ද (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) නැහැයෙන් දතයුතුවූ ගන්ධයෝ හමුවීමට එත්ද (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) දිවෙන් දතයුතුවූ රසයෝ දිවේ හමුවීමට එද්ද (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) ශරීරයෙන් දතයුතු ස්පර්ශයෝ (ශරීරයේ හමුවීමට එත්ද (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) සිතින් දතයුතුවූ ධර්මයෝ සිතට හමුවීමට පැමිණෙත්ද (මෙහි 9 (ii) යෙදිය යුතුයි.)

**27. පඨම වෙරභය සූත්‍රයː-** 1. ඉක්බිති අනේපිඬු ගෘහපතිතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ අනේපිඬු ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළසේක.

**2.** "ගෘහපතිය, යම් හෙයකින් වනාහි ආර්ය ශ්‍රාවකයාගේ වෛරීභය පස සංසිඳුනාහු වෙත්ද, සතර සෝවාන් අංගයෙන් සමන්විත වේද, හෙතෙම කැමතිවනු ලබන්නේ ක්ෂයවූ නිරය ඇත්තෙම්යයිද ක්ෂයවූ තිරිසන් යොනි ඇත්තෙම් යයිද, ක්ෂයවූ ප්‍රේතවිෂය ඇත්තෙම්යයිද, ක්ෂයවූ අපාය දුගතියේ වැටීම ඇත්තෙම්යයිද, නිරයේ වැටෙන ස්වභාව නැති නියතවූ සම්බොධිය පිහිට කොට ඇති සෝවාන්වූයේ වෙම්යයිද තෙමෙම තමා ප්‍රකාශ කරන්නේය.

3. "කවර නම්වූ වෛරීභය පසක් සංසිඳුනාහු වෙත්ද? ගෘහපතිය, පරපණ නසන සුළුවූ යමෙක් තෙම ප්‍රාණඝාත කිරීම හේතුකොට (ii) මේ ආත්මභාවයෙහිවූ යම් ඒ භය වෛරයක් ඉපදීම කෙරේද පරලෙව්හිදිවූ වෛරීභය ඉපදීම කෙරේද චෛතසික දුක් දොම්නස් විඳියිද, (iii) ප්‍රාණඝාතයෙන් වැලකුණේ (iv) මේ ආත්ම භාවයෙහිවූ වෛරීභය ඉපදීම් නොකෙරේද, සම්පරායික වෛරීභය ඉපදීම නොකෙරේද, චෛතසික දුක් දොම්නස් නොවිඳියිද, ප්‍රාණාතිපාතයෙන් වැලකුණහට මෙසේ ඒ වෛරීභය සංසිඳුනේවෙයි.

4. "ගෘහපතිය, නොදෙනලද වස්තුව ගන්නා සුළුවූ යමෙක් තෙම අදින්නාදානය හේතුකොටගෙන (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) අදින්නාදානයෙන් වැලකුණේ (මෙහි 3 (iv) යෙදිය යුතුයි.) අදින්නාදානයෙන් වැලකුණහට මෙසේ ඒ වෛරීභය සංසිඳුනේ වෙයි. කාමයන්හි වරදවා හැසිරෙන සුළුවූයේ යමෙක් තෙම කාමයන්හි වරදවා හැසිරීම හේතු කොටගෙන (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුණේ (මෙහි 3 (iv) යෙදිය යුතුයි.) කාමයන්හි වරදවා හැසිරීමෙන් වැලකුණහට මෙසේ ඒ වෛරීභය සංසිඳුනේ වෙයි. පමාවීමට කරුණුවූ රහමෙර මත්ද්‍රව්‍යය පානය කරන සුළුවූයේ පමාවට කරුණුවූ රහමෙර මත්ද්‍රව්‍යය පානය කිරීමේ හේතුවෙන් (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) පමාවට කරුණුවූ රහමෙර මත්ද්‍රව්‍යය පානය කිරීමෙන් වැලකුණේ (මෙහි 3 (iv) යෙදිය යුතුයි.) පමාවට කරුණුවූ රහමෙර මත්ද්‍රව්‍යය පානයකිරීමෙන් වැලකුණහට මෙසේ ඒ වෛරීභය සංසිඳුනේවේ. මේ වෛරී භය පස සංසිඳුනාහු වෙති.

5. "කවර නම් සතර සොවාන් අංගයෙන් යුක්තවේද, ගෘහපතිය මේ ශාසනයෙහි ආර්යශ්‍රාවකයෙක් තෙම බුදුන් කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්තවූයේ වේද, (එනම්) (3 අංගුත්තරනිකායේ දෙවන පණ්ණාසකයේ 7 මහා වර්ගයේ 14 සූත්‍රයේ 13 (ii) ඡේදය යෙදිය යුතුයි.

6. "එනම්, (3 අංගුත්තරනිකායේ ඡක්තනිපාතයේ ආහුණෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 4 (ii) ඡේදය යෙදිය යුතුයි.)

7. "සංඝයා කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයි. (එනම්) (3 අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ ආහුණෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.)

8. "(හේ වනාහි) කඩනොවූ නොසිදුරුවූ සබලනොවූ කැලැල්නොවූ නිදහස්වූ නුවනැතියන් විසින් පස්සනාලද්දාවූ පරාමර්ෂණය නොකරනලද්දාවූ සමාධිය සංවත්තනිකවූ (සමාධිය සමග පවත්නාවූ) ආර්යකාන්ත සීලයෙන් යුක්තවූයේ වෙයි. මේ සතර සොවාන් අංගයෙන් යුක්තවූයේ වේ.

9. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි)

28. **දුගතිවෙර භය සූත්‍රයː-** (මේ සූත්‍රය මේ වර්ගයේ 27 වෙනි සූත්‍රයේ 2-9 ඡේද මෙනි.) "ගෘහපතිය" වෙනුවට "මහණෙනි" යෙදිය යුතුයි.)

29. **ආඝාත වත්ථු සූත්‍රයː-** 1. "මහණෙනි, මේ ආඝාත වස්තු නවයක් වෙති

2. "කවර නවයක්ද? මට අනර්ථය පිණිස හැසුරුනේ යයි (වෛරය බඳීද, මට අනර්ථය පිණිස හැසිරේයයි වෛරය බඳීද, මට අනර්ථය පිණිස හැසිරෙන්නේයයි වෛරය බඳීද, මට පියවූ මනාපවූවහුට අනර්ථය පිණිස හැසුරුනේයයිද, අනර්ථය පිණිස හැසිරේයයිද අනර්ථය පිණිස හැසිරෙන්නේ යයිද, වෛරය බඳීද, මට අප්‍රියවූ අමනාපවූවහුට අනර්ථය පිණිස හැසුරුනේයයිද, අනර්ථය පිණිස හැසිරේයයිද, අනර්ථය පිණිස හැසිරෙන්නේයයිද, වෛරය බඳීද මහණෙනි, මේ නව ආඝාත වස්තූහු වෙති."

30. **ආඝාත විනය සූත්‍රයː-** 1. "මහණෙනි මේ නවය වෛර නැති කිරීම් වෙති."

2. "කවර නවයක්ද? 'මට අනර්ථය පිණිස හැසුරුනේය. එය මෙහි කොතනකින් ලැබිය යුතු දැයි' ආඝාතය දුරුකරයි. 'මට අනර්ථය පිණිස හැසිරේයයි එය මෙහි කොතැනකින් ලැබිය යුතුදැයි' වෛරය දුරුකරයි. 'මට අනර්ථය පිණිස හැසිරෙන්නේයයි එය මෙහි කොතැනකින් ලැබිය යුතුදැයි'

වෛරය දුරුකරයි. 'මට ප්‍රියවූ මනාපවූවහුට අනර්ථය පිණිස හැසුරුනේයයි අනර්ථය පිණිස හැසිරේයයි' අනර්ථය පිණිස හැසිරෙන්නේයයි එය මෙහි කොතැනකින් ලැබිය යුතුදැයි වෛරය දුරුකරයි, 'මට අප්‍රියවූ අමනාපවූවහුට අර්ථය පිණිස හැසුරුනේය, අර්ථය පිණිස හැසිරේය, අර්ථය පිණිස හැසිරෙන්නේයයි එය කොතැනකින් ලැබිය යුතුදැයි වෛරය දුරු කරයි. මහණෙනි, මේ වෛරය දුරුකිරීම් නවයය."

**31. අනුපුබ්බ නිරොධ සූත්‍රයː-** 1. "මහණෙනි, මේ අනුපිළිවෙළින් වන නැතිවීම් නවයෙකි.

2. "කවර නවයක්ද? ප්‍රථමධ්‍යානයට පැමිණියහුගේ කාම සංඥාව නැතිවෙයි. ද්විතීයධ්‍යානයට පැමිණියහුගේ විතර්ක විචාරයෝ නැති වෙත්. තෘතියධ්‍යානයට පැමිණියහුගේ ප්‍රීතිය නැතිවේ. චතුර්ථධ්‍යානයට පැමිණියහුගේ ආශ්වාස ප්‍රස්වාසයෝ නැති වෙත්. ආකාසානඤ්චායතනයට පැමිණියහුගේ රූප හැඟීම නැතිවේ. විඤ්ඤාණඤ්චායතනයට පැමිණියහුගේ ආකාසානඤ්චායතන හැඟීම නැතිවේ. ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියහුගේ විඤ්ඤාණඤ්චායතන හැඟීම නිරුද්ධවේ. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණියහුගේ ආකිඤ්චාඤ්ඤායතන හැඟීම නැතිවේ. නිරොධසමාපත්තියට පැමිණියහුගේ සංඥාවද වෙදනාවද නැති වෙති. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි)

**(තුන්වෙනි සත්තාවාස වර්ගය නිමි.)**

---

## 4. මහා වර්ගය

**32. අනුපුබ්බ විහාර සූත්‍රයː-** 1. "මහණෙනි, අනු පිළිවෙළින් වාසය කිරීම් නවයක් වෙත්.

2. "කිනම් නවයක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති පළමුවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි.

3. "විතර්ක විචාරයන් සන්සිඳීමෙන් තමා තුළ ප්‍රසාදය ඇති සිතේ එකඟකම ඇති විතර්ක නැති විචාර නැති, සිතේ එකඟකමින් උපන් ප්‍රීතිය හා සැපය ඇති දෙවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතියේ නොඇලීමෙන් තුන්වෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. සැපදුක් දෙක නැතිකිරීමෙන් පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ අභාවයෙන් දුක් සැප නොවූ (මධ්‍යස්ථවූ) උපෙක්ෂාස්මෘති පාරිශුද්ධියවූ චතුර්ථ ධ්‍යානයට පැමිණ වෙසේද.

සර්වප්‍රකාරයෙන් රූප සංඥාවන්ගේ ඉක්මවීමෙන් (ක්‍රොධ) සංඥාවන්ගේ (දුරලීමෙන්) (වෙන වෙන ආත්ම ඇත්තේය යන සංඥාවන්) මෙනෙහි නොකිරීමෙන් (අහසෙහි කෙළවරක් නැත්තේයයි) ආකාසානඤ්චායතනයට පැමිණ වෙසේද, සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම "විඤ්ඤාණය අනන්තයයි" විඤ්ඤාණඤ්චායතන සමවතට පැමිණ වෙසේද, සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතන සමවත ඉක්ම "කිසිවක් නැත්තේයයි" යන ආකිඤ්චඤ්ඤායතන සමවතට පැමිණ වෙසේද, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතන සමවත ඉක්මවා (සංඥාවක් නැත්තේමය, නැත්තේත් නොවේය යන, සමවතට පැමිණ වෙසේද, සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමවත ඉක්මවා නිරොධ සමවතට පැමිණ වෙසේද මහණෙනි මේ අනුපිළිවෙළින් වාසය කිරීම් නවය වෙතියි" වදාළසේක.

33. **අනුපුබ්බ සමාපත්ති සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ අනුක්‍රමයෙන් සමවැද වාසය කිරීම් නවය දෙශනා කරන්නෙමි (මෙහි 2 වර්ගයේ 22 සූත්‍රයේ 1 (ii) ඡෙදයයෙදිය යුතුයි.) මහණෙනි, අනුක්‍රමයෙන් සමවැද වාසය කිරීම් නවය කවරහුද?

2. "යම්තැනෙක්හි කාමයෝ නැති වෙත්ද යම් ඒ කාමයන් අතිශයින් නැති කරමින් වෙසෙත්ද, ඒ ආයුෂ්මත්හු ඒකාන්තයෙන් ඒකාරණයෙන් තෘෂ්ණා නැත්තාහුයයිද නිවියාහුයයිද තරණය කළාහුයයිද පරතෙර ගියාහුයයිද කියමි. කවර තැනක කාමයෝ නිරුද්ධ වෙත්ද කවරහු නම් කාමයන් අතිශයින් නිරුද්ධ කොට

වෙසෙත්ද, මම මෙය නොදනිමි, මම මෙය නොදකිමි’ කියා යමෙක් මෙසේ කියන්නේ නම් (ඔහුව) මෙසේ කිය යුතු වන්නේය. (කෙසේද?) ‘ඇවැත්නි මේ ශාසනයෙහි මහණෙක් තෙමේ කාමයන්ගෙන් වෙන්වම (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේද, මෙහි කාමයෝ නිරුද්ධ වෙත් ඔවුහු කාමයන්ද අතිශයින් නිරුද්ධ කොට වෙසෙත්ය කියායි.

“මහණෙනි, ඒකාන්තයෙන් කෛරාටික නොවූයේ මායා නැත්තේ යහපතැයි කියන ලද්දට සතුටුවන්නේද අනුමෝදන් වන්නේද, යහපතැයි (හොඳයි) කියන ලද (වචනයට) සතුටුවී අනුමෝදන්වී නමස්කාර කරමින් ඇඳිලි බැඳගනිමින් (සිටියේ) සමීපයෙහි සිටින්නේද,

**3.** (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.) “කාමයෝ” වෙනුවට “විතර්ක විචාරයෝ”ද “ප්‍රථමධ්‍යානයට” වෙනුවට ද්විතීයධ්‍යානයට” යෙදිය යුතුයි.)

**4.** (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි. “කාමයෝ” වෙනුවට “ප්‍රීතිද” “ප්‍රථමධ්‍යානයට” වෙනුවට “තෘතීයධ්‍යානයට” යෙදිය යුතුයි.)

**5.** (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදයමෙනි “කාමයෝ” වෙනුවට “උපෙක්ෂා සැප” ද, “ප්‍රථමධ්‍යානයට” වෙනුවට “චතුර්ථතාධ්‍යානයට” යෙදිය යුතුයි.)

**6.** “මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි. “කාමයෝ” වෙනුවට “රූපසංඥාවෝ” “ප්‍රථමධ්‍යානයට” වෙනුවට “නානාආත්මයයන හැඟීම මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට” යෙදිය යුතුයි.)

**7.** (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි “කාමයෝ” වෙනුවට “ආකාසානඤ්චායතනය යන හැඟීම්ද “ප්‍රථම ධ්‍යානයට” වෙනුවට “විඥානය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට” යෙදිය යුතුයි.)

8. (මේ ඡේදය 2 ඡේදය මෙනි. "කාමයෝ' වෙනුවට "විඤ්ඤාණාඤ්චායතන යන හැඟීම"ද "ප්‍රථමධ්‍යානයට" වෙනුවට "ආකිඤ්චඤ්ඤායතනයට" යෙදිය යුතුයි.)

9. (මේ ඡේදය 2 ඡේදය මෙනි. "කාමයෝ" වෙනුවට "ආකිඤ්චඤ්ඤායතන හැඟීම" ද "ප්‍රථමධ්‍යානයට" වෙනුවට "නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට යෙදිය යුතුයි.)

10. (මේ ඡේදය 2 ඡේදය මෙනි. "කාමයෝ" වෙනුවට "නෙවසඤ්ඤානාසඤ්ඤායතනය" ද "ප්‍රථමධ්‍යානයට" වෙනුවට "නිරොධ සමාපත්තියට" යෙදිය යුතුයි.) මහණෙනි, මෙය වනාහි නව අනුපුබ්බ විහාර සමාපත්තියයි" වදාළසේක.

**34. නිබ්බාණ සුඛ සූත්‍රය**:- 1. "මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් වූ වෙළුවන අරමෙහි වැඩවාසය කරනසේක. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භික්ෂූන්ට මෙසේ වදාළසේක. "ඇවැත්නි, මේ නිවණ සැපය, ඇවැත්නි, මේ නිවණ සැපය" කියායි.

2. මෙසේ කීකල්හි ආයුෂ්මත් උදායීතෙමේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මේ කාරණය කීයේය. "ඇවැත්නි, ශාරිපුත්‍ර ස්ථවීරයෙනි, මෙහි විඳියයුතුවූ යමක් නැත්නම් මෙහි කුමක්නම් වේද?" කියායි.

3. "ඇවැත්නි, මෙහි විඳියයුතු යමක් නැත්නම් මෙහි මෙයම සැපය යනුයි. ඇවැත්නි, මේ කාමගුණයෝ පසක් වෙති. කවරනම් පසක්ද? (ii) ඉටුවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය වූ ආකාර ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතු වූ (iii) ඇසින් දතයුතුවූ රූපයෝය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) කනින් දතයුතුවූ ශබ්දයෝය, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) නහයෙන් දතයුතුවූ ගන්ධයෝය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) දිවෙන් දතයුතුවූ රසයෝය (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) ශරීරයෙන් දතයුතුවූ ස්පර්ශයෝය. ඇවැත්නි, මේ පස්කම් ගුණයෝය. ඇවැත්නි, මේ පස්කම් ගුණයන් නිසා යම් ඒ සුඛ සොම්නසක් උපදීද, ඇවැත්නි, මෙය කාම සැපයයි කියනුලැබේ.

4. "ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුවක් තෙම කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්ව ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේද ඇවැත්නි මේ (ධ්‍යාන) විහරණයෙන් වාසය කරන්නාවූ ඒ භික්ෂුවට කාම සහගත සංඥා මනසිකාරයෝ පැමිණෙත්ද, එය ඔහුට ආබාධයක් වෙයි. ඇවැත්නි, යම්සේ සුවපත්වූවහුට දුකක් උපදින්නේ ඒතාක් ආබාධය පිණිස පවතින්නේද, එසේම ඕහට ඒ කාම සහගත සංඥා මනසිකාරයෝ පවතිත්, (ii) ඕහට එය ආබාධයක් වෙයි. ඇවැත්නි, යම් ඒ ආබාධයක් වේද, භාග්‍යවතුන් වහන්සේ විසින් එය දුක් යයි වදාරණ ලදී. ඇවැත්නි, මේ ක්‍රමයෙන්ද මේ නිවණ සැප වූවක්සේ දතයුතුයි.

5. "නැවතද අනිකක් කියමි. ඇවැත්නි, මහණතෙමේ විතර්ක විචාරයන් සංසිඳවීමෙන් ද්විතීයධ්‍යානයට පැමිණ වෙසේද, ඉදින් ඇවැත්නි, මේ ද්විතීයධ්‍යාන විහරණයෙන් යුක්තව වාසය කරන්නාවූ ඒ භික්ෂුවට විතර්ක සහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, ඔහුට එය ආබාධයක් වෙයි. ඇවැත්නි, යම්සේ සුවපත්වූවහුට දුක් උපදින්නේ ඒතාක් ආබාධය පිණිස වේද එසේම ඕහට ඒ විතර්ක සහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

6. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණෙක් තෙමේ ප්‍රීතියගේ නොඇලීමෙන් ප්‍රීතිය සංසිඳවීමෙන් තෘතීයධ්‍යානයට පැමිණ වෙසේද, ඇවැත්නි, ඉදින් මේ තෘතීයධ්‍යාන විහරණයෙන් යුක්තව වාසය කරන්නාවූ ඒ භික්ෂුවට ප්‍රීතිසහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, එය ඕහට ආබාධයක් වෙයි. ඇවැත්නි, යම්සේ සුවපත්වූවහුට දුක් උපදින්නේද ඒතාක් ආබාධය පිණිස වෙයි. එසේම ඔහුට ඒ විතර්ක සහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

7. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණෙක් තෙමේ සැපයාගේද ප්‍රහාණයෙන් දුක්ඛයාගේද ප්‍රහාණයෙන් චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේද, ඉදින් ඇවැත්නි, මේ චතුර්ථධ්‍යාන විහරණයෙන් යුක්තව වාසය කරන්නාවූ ඒ

භික්ෂුවට උපෙක්ෂා සහගත සංඥා මනසිකාරයෝ පවතිත්. එය ඔහුට ආබාධයක් වෙයි. ඇවැත්නි, යම්සේ සුවපත් වූවහුට දුක් උපදින්නේද ඒතාක් ආබාධය පිණිස පවතින්නේය. එසේම ඕහට ඒ උපෙක්ෂා සහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

8. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් රූපය යන සංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝ සංඥාවන් දුරුකිරීමෙන් නානා ආත්මය යන සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසේද, ඉදින් ඇවැත්නි, මේ සමාපත්ති විහරණයෙන් යුතුව වාසය කරන්නාවූ, ඒ භික්ෂුහට රූපසහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, ඕහට එය ආබාධයක් වෙයි. ඇවැත්නි, යම්සේ සුවපත්වූවහට දුක් උපදින්නේද ඒතාක් ආබාධය පිණිස පවතීද, එසේම ඕහට ඒ රූපසහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

9. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසේද ඇවැත්නි, ඉදින් මේ සමවත් විහරණයෙන් යුතුව වාසය කරන්නාවූ ඒ භික්ෂුවට ආකාසානඤ්චායතන සහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, ඔහුට එය ආබාධයක් වෙයි. ඇවැත්නි, සුවපත්වූවහුට දුක උපදින්නේද, ඒතාක් යම්සේ ආබාධය පිණිස පවතීද, එසේම ඕහට ඒ ආකාසානඤ්චායතන සංඥා මනසිකාරයෝ පවතිත්ද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

10. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම කිසිවක් නැත්තේයයි ආකිඤ්චායතනයට පැමිණ වෙසේද, ඇවැත්නි, මේ සමවත් විහරණනේ යුතුව වාසය කරන්නාවූ භික්ෂුවකට විඤ්ඤාණඤ්චායතන සහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, ඕහට එය ආබාධයක් වේ. ඇවැත්නි, සුවපත්වූවහුට දුක් උපදින්නේද ඒතාක් ආබාධය පිණිස යම්සේ පවතීද, එසේම

ඕහට ඒ විඤ්ඤාණඤ්චායතන සහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

11. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට පැමිණ වෙසේද, ඇවැත්නි, ඉදින් මේ සමවත් විහරණයෙන් යුතුව වාසය කරන්නාවූ ඒ භික්ෂුවට ආකිඤ්චඤ්ඤායතන සහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද ඕහට එය ආබාධයක්වේ. ඇවැ‍්නි, සුවපත්වූවහුට දුක් උපදින්නේද ඒතාක් ආබාධය පිණිස යම්සේ පවතින්නේද, එසේම ඕහට ඒ ආකිඤ්චඤ්ඤායතන සහගත සංඥා මනසිකාරයේ පවතිත්ද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

12. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්ම සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වෙසේද, ප්‍රඥාවෙන් දැක ඔහුගේ ආශ්‍රව පරික්ෂිණයෝ (කෙලෙස් නැතිකිරීම්) වෙත්ද, ඇවැත්නි, මේ ක්‍රමයෙන්ද මෙසේ නිවණ සැපවූසේ දතයුතුයයි" වදාළසේක.

35. **පබ්බතෙයාගාමී සූත්‍රයː-** 1. "මහණෙනි, යම්සේ පර්වතයෙහි හැසිරෙන්නාවූ බාලවූ අව්‍යක්තවූ ක්ෂේත්‍රය නොදන්නාවූ විෂමවූ පර්වතයෙහි හැසිරීමට අදක්ෂවූ දෙනක් වේද, ඈට මෙසේ සිතක් වන්නේය. (එනම්) (ii) 'මම පෙර නොගිය දිශාවක යන්නේ නම්, පෙර නොකනලද තණකොළ කන්නෙම් නම්, පෙර නොබොන ලද පැන් බොනෙම් නම්, ඉතා යෙහෙක' කියායි. (iii) ඈ පෙර පය සුපිහිටියේ නොපිහිටුවා පසුපස උදුරන්නේද ඈ පෙර නොගිය දිශාවකට නොයන්නේය. පෙර නොකන ලද තණකොළ නොකන්නේය, පෙර නොබොනලද පැන් නොබොන්නේය.

2. "ඈ යම් පියවරෙක්හි සිටි කල්හි මෙසේ සිතක් වන්නේද, (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) ඒ පෙදෙසට සැපසේ පෙරලා නොඑන්නේය. ඊට හේතු කවරේද? ඒ එසේමැයි. මහණෙනි, පර්වතයෙහි හැසිරෙන්නාවූ බාලවූ අව්‍යක්තවූ ක්ෂේත්‍රය

නොදන්නාවූ විෂමවූ පර්වතයෙහි හැසිරීමට අදක්ෂවූ ඒ දෙනක් වීද, මහණෙනි, එසේම මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් තෙමේ බාලවූයේ අව්‍යක්තවූයේ ක්ෂේත්‍රය නොදන්නේ කාමයන්ගෙන් වෙන්වම ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරන්ට අදක්ෂවූයේ වේද, හෙතෙම ඒ නිමිත්ත පුරුදු නොකෙරේද, නොවඩාද, බහුල වශයෙන් නොකෙරේද යහපත් අධිෂ්ඨානයෙන් අධිෂ්ඨාන නොකෙරේද ඕහට වෙැනි සිතක් වෙයි.

3. "මම විතර්කවිචාරයන්ගේ සංසිඳවීමෙන් විතර්ක නැති විචාර නැති සමාධියෙන් උපන් ප්‍රීති සැපය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙක කියායි. හෙතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳවීමෙන් ද්විතීයධ්‍යානයට පැමිණ වාසයකරන්නට නොහැකිවෙයි. ඕහට මෙවැනි සිතක්වෙයි 'මම කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව ප්‍රථමධ්‍යානයට පැමිණ වාසයකරන්නෙම් නම් ඉතා යෙහෙක යනුයි. කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරන්ට හෙතෙම නොහැකිවෙයි. මහණෙනි, මේ භික්ෂුව පර්වතයෙහි හැසිරෙණ බාලවූ අව්‍යක්තවූ ක්ෂේත්‍රය නොදන්නාවූ විෂම පර්වතයෙහි හැසිරෙන්ට අදක්ෂවූ ඒ දෙන මෙන් දෙපසින් ගිළිහුනේ දෙපසින් පිරිහුනේයයි කියනු ලැබේ.

4. "මහණෙනි, යම්සේ පර්වතයෙහි හැසිරෙන්නාවූ පණ්ඩිතවූ ව්‍යක්තවූ ක්ෂෙත්‍රය දන්නාවූ විෂම පර්වතයෙහි හැසිරීමට සමර්ථවූ දෙනක් වේද, ඈට මෙබඳු සිතක් වන්නේය. (එනම්) (මෙහි 1 (ii) (iii) යෙදිය යුතුයි.)

5. "ඈ යම් පියවරෙක්හි සිටිකල්හි මෙවැනි සිතක් වන්නේය. (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) ඒ පෙදෙසට සුවසේ පෙරලා එන්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, එසේම පර්වතයෙහි හැසිරෙන්නාවූ පණ්ඩිතවූ ව්‍යක්තවූ ක්ෂේත්‍රය දන්නාවූ ඒ දෙන් තොමෝ පර්වතයෙහි හැසිරෙන්ට දක්ෂවෙයි.

6. "මහණෙනි, එසේම මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් පණ්ඩිතවූයේ ව්‍යක්තවූයේ ක්ෂේත්‍රය දන්නේ කාමයන්ගෙන්

වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්ව ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරන්ට දක්ෂවූයේ වේද, (ii) හෙතෙම ඒ නිමිත්ත ආසේවනය කෙරේද, වඩාද, බහුලවශයෙන් කෙරේද මනා ඉටාගැනීමෙන් ඉටාගනීද, (iii) ඔහට මෙසේ සිතක් වෙයි. එනම් මම විතර්කවිචාරයන්ගේ සංසිඳවීමෙන් ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙක' කියායි.

7. "හෙතෙම ද්විතීය ධ්‍යානයට හිංසා නොකරන්නේ විතර්ක විචාරයන්ගේ සංසිඳවීමෙන් ද්විතීයධ්‍යානයට පැමිණ වාසයකරයි. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ඔහට මෙබඳු සිතක් වෙයි. මම ප්‍රීතියෙහි නොඇලීමෙන් තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙක' කියායි.

8. "හෙතෙම තෘතියධ්‍යානයට, හිංසා නොකරන්නේ ප්‍රීතියෙහි නොඇලීමෙන් තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ඔහට මෙබඳු සිතක් වෙයි. 'මම සැපයාගේ ප්‍රහාණයෙන් (ii) දුක්ඛයාගේ ප්‍රහාණයෙන් පූර්වයෙහිම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැතිවීමෙන් දුක් නැති සැප නැති මධ්‍යස්ථකය හා යහපත් සිහියෙන්ද පිරිසිදුවූ චතුර්ථධ්‍යානයට පැමිණ (iii) වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙක' කියායි.

9. "හෙතෙම චතුර්ථධ්‍යානයට, හිංසා නොකරන්නේ සැපයාගේ ප්‍රහාණයෙන් (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) වෙසෙයි. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ඔහට මෙබඳු සිතක් වේ. 'මම සර්වප්‍රකාරයෙන් (ii) රූප සංඥාවන්ගේ ඉක්මවීමෙන් ප්‍රතිඝ සංඥාවන්ගේ (දුරුකිරීමෙන්) නානත්තසංඥාවන්ගේ (මෙනෙහි නොකිරීමෙන්) "ආකාසය අනන්තයයි" ආකාසානඤ්චායතනයට පැමිණ (iii) වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙකැ'යි කියායි.

10. "හෙතෙම ආකාසානඤ්චායතනයට, හිංසා නොකරන්නේ සර්වප්‍රකාරයෙන් (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) වෙසෙයි. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ඔහට මෙබඳු සිතක් වෙයි. 'මම සර්වප්‍රකාරයෙන් ආකාසඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ

වෙසෙම්නම් යෙහෙකැයි කියායි. හෙතෙම විඤ්ඤානඤ්චායතනය බලාපොරොත්තු නැත්තේ සර්වප්‍රකාරයෙන් ආකාශානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤානඤ්චායතනයට පැමිණ වාසය කරයි. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ඕහට මෙබඳු සිතක් වෙයි. 'මම සර්වප්‍රකාරයෙන් (ii) විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැත්තේයයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙක' කියායි.

11. "හෙතෙම ආකිඤ්චඤ්ඤායතනයට, හිංසා නොකරන්නේ සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි (6 (ii) යෙදිය යුතුයි) ඔහුට මෙසේ සිතෙයි මම සර්වප්‍රාකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරන්නෙම් නම් යෙහෙකැයි කියායි.

"හෙතෙම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට හිංසා නොකරන්නේ සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. (මෙහි 6 (ii) යෙදිය යුතුයි) ඕහට මෙබඳු සිතක් වෙයි. 'මම සර්වප්‍රකාරයෙන් (ii) නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ (iii) වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙක' කියායි.

12. "හෙතෙම සඤ්ඤාවෙදයිත නිරොධයට හිංසා නොකරන්නේ සර්වප්‍රකාරයෙන් (නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඉක්මවා නිරොධ සමාපත්තියට පැමිණ වාසය කෙරෙයි. "මහණෙනි, යම්හෙයකින් වනාහි මහණතෙම ඒ ඒ සමවතට පැමිණේද, (එයින්) නැගීසිටීද, ඔහුගේ සිත මෘදුවෙයි. කර්මණ්‍ය වෙයි. මෘදුවූ කර්මණ්‍යවූ සිතින් අප්‍රමාණ සමාධිය මනාකොට වඩනලද්දේ වේ. හෙතෙම අප්‍රමාණවූ සුභාවිතවූ සමාධියෙන් අභිඥාවෙන් ප්‍රත්‍යක්ෂ කටයුතුවූ යම් ධර්මයකට සිත මොනවට නම්වයි.

13. "ආයතනයක් ඇතිකල්හි අභිඥා ප්‍රත්‍යක්ෂ කිරීම කරණකොටගෙන ඒ ඒ තන්හි සාක්ෂි වශයෙන් සුදුසු බවට පැමිණෙයි. ඒ මම ඉදින් කැමති වන්නෙම්නම් නන්වැදෑරුම්වූ ඍද්ධිවිධිය අනුභව කරන්නෙම්ද, (1. අංගුත්තරනිකායේ තිකනිපාතයේ දුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 10 සූත්‍රයේ 12 ඡේදයේ පවත්වන්නෙමි' යන තැන් දක්වාද 13 ඡේදයද යෙදිය යුතුයි.) ආයතන ඇති ඇති විධියට ඒ ඒ තන්හි සාක්ෂි වශයෙන් සුදුසු බවට පැමිණෙයි.

"ඒ මම ඉදින් කැමති වන්නෙම් නම් ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ චිත්ත විමුත්තියද පඤ්ඤාවිමුත්තියද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ඨ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරන්නෙම්යයි ඒ ඒ තන්හිම ඒ ඒ ආයතනයෙහි සාක්ෂි වශයෙන් සුදුසු බවට පැමිණෙමි."

**36. ඣාන නිස්සයන සූත්‍රයඃ-** 1. "මහණෙනි, මම පළමුවෙනිවූද ධ්‍යානය නිසා ආශ්‍රවයන්ගේ ක්ෂයය කියමි. මහණෙනි මම දෙවෙනිවූ ධ්‍යානය නිසා ආශ්‍රවයන්ගේ ක්ෂයය (වේයයි) කියමි. මහණෙනි මම තුන්වෙනිවූද ධ්‍යානය නිසා ආශ්‍රවයන්ගේ ක්ෂයවීම කියමි. මහණෙනි මම සතරවෙනි වූද ධ්‍යානය නිසා ආශ්‍රයන්ගේ ක්ෂයවීම කියමි මහණෙනි, මම ආකාසානඤ්චායතන සමවත නිසා ආශ්‍රවයන්ගේ ක්ෂයවීම කියමි. මහණෙනි, මම විඤ්ඤාණඤ්චායතන සමවත නිසා ආශ්‍රවයන්ගේ ක්ෂයවීම කියමි. මහණෙනි මම ආකිඤ්චඤ්ඤායතන සමවත නිසා ආශ්‍රවයන්ගේ ක්ෂයවීම කියමි මහණෙනි, මම නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමවත නිසා ආශ්‍රවයන්ගේ ක්ෂයවීම කියමි.

2. "මහණෙනි, පළමුවෙනි ධ්‍යානය නිසා මම (ii) ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වේයයි මෙසේ වනාහි මෙය වදාරන ලදී. මෙය කුමක් පිණිස වදාරන ලද්දේද? (iii) මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්වම (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 2 (ii) ඡේදයයෙදිය යුතුයි.) ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේද, (iv) හෙතෙම එහි රූපගතවූ වෙදනාගතවූ

සංඥාගතවූ සංස්කාරගතවූ විඥානගතවූ යමක්ම වේද, ඒ ධර්මයන් අනිත්‍යවශයෙන්ද දුක්වශයෙන්ද රොගවශයෙන්ද ගණ්ඩ වශයෙන්ද (උලක් වශයෙන්ද) දුක්ඛයක් වශයෙන්ද ආබාධයක් වශයෙන්ද අන්‍යවූවක් වශයෙන්ද වැනසෙන්නක් වශයෙන්ද ශූන්‍යවූවක් වශයෙන්ද අනාත්මයක් වශයෙන්ද දකියි. හෙතෙම ඒ ධර්මයන්ගෙන් සිත (නිර්වාණ වශයෙන්) නවත්වයි. හෙතෙම ඒ ධර්මවලින් සිත නවත්වා නිර්වාණ ධාතුව පිණිස බස්වයි. යම් මේ සියලු සංස්කාරයන්ගේ සංසිඳවීමක් වේද, සියලු උපධින්ගේ දුරුකිරීමක්වූ තෘෂ්ණාක්ෂයවීමක්වූ නොඇල්මක්වූ නිරුද්ධකිරීමක්වූ නිර්වාණයයි මෙය ශක්තිය මෙය ප්‍රණීතය යනුයි. හෙතෙම එහි සිටියේ ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමට පැමිණෙයි.

3. (i) "ඉදින් ආශ්‍රවයන් ක්ෂය කිරීමට නොපැමිණියේද ඒ ධර්ම රාගයෙන් ඒ ධර්මනන්දියෙන් පඤ්චොරම්භාගීය ධර්මයන් ක්ෂය කිරීමෙන් එහි පිරිනිවන් පානා සුළුවූ ඒ ලෝකයෙන් (නැවත උත්පත්ති වශයෙන්) නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතික වෙයි. (ii) මහණෙනි, යම්සේ ධනුර්ධරයෙක් හෝ ධනුර්ධර අතවැසියෙක් හෝ තෘණයෙන් කළ පුරුෂයෙක් (පඹයෙක් හෝ මැටිගොඩක් හෝ) ඉලක්ක කොට හෙතෙම පසු කාලයක මහත්වූ (සමූහයක්) පුදාලනය කරන්නාවූ දුරට ඊය යවන සුළුවූ අක්ෂණවෙධි ධනුර්ධරයෙක් වේද.

4. "මහණෙනි, එසේම මහණතෙම කාමයන්ගෙන් වෙන්වම (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේද, (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

5. (මෙහි 3 (i) යෙදිය යුතුයි.) මහණෙනි, මම පළමුවෙනි ධ්‍යානය නිසා (ii) ආශ්‍රවයන්ගේ ක්ෂයය කියමියි මෙසේ ඒ යමක් කියන ලද්දේද මෙය මේ පිණිස කියන ලදී.

6. "මහණෙනි, මම දෙවෙනි ධ්‍යානය නිසා (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම (ii) විතර්ක විචාරයන්ගේ සංසිඳවීමෙන් විතර්ක නැති විචාර නැති සමාධියෙන් උපන් ප්‍රීති සැපය ඇති, දෙවෙනි ධ්‍යානයට පැමිණ

වෙසේද (මෙහි 2 (iv) සහ 3 (i) යෙදිය යුතුයි.) මහණෙනි, එසේම මහණ තෙම (මෙහි 6 (ii) 2 (iv) යෙදිය යුතුයි.) මම දෙවෙනි ධ්‍යානය නිසා (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

**7.** "මහණෙනි, මම තුන්වෙනි ධ්‍යානය නිසා (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) තුන්වෙනි ධ්‍යානයට පැමිණ වෙසේද (මෙහි 2 (iv) සහ 3 (i) යෙදිය යුතුයි.) මහණෙනි, එසේම මහණතෙම (මෙහි 6 (ii) 2 (iv) යෙදිය යුතුයි.) මම තුන්වෙනි ධ්‍යානය නිසා (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

**8.** "මහණෙනි, මම හතරවෙනි ධ්‍යානය නිසා (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) හතර වෙනි ධ්‍යානයට පැමිණ වෙසේද (මෙහි 2 (iv) සහ 3 (i) යෙදිය යුතුයි.) මහණෙනි, එසේම මහණ තෙම (මෙහි 6 (ii) 2 (iv) යෙදිය යුතුයි.) මම සතරවෙනි ධ්‍යානය නිසා (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

**9.** "මහණෙනි, මම ආකාසානඤ්චායතන ධ්‍යානය නිසා ආශ්‍රවයන්ගේ ක්ෂයවීම කියමියි. මෙසේ වනාහි මෙය කියන ලදී. මෙය කුමක් පිණිස කියන ලද්දේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් තෙම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන් දුරුකිරීමෙන් නානාත්ම සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසේද හෙතෙම එහි වෙදනාගතවූ සංඥාගතවූ සංස්කාරගතවූ (මෙහි 4 වර්ගයේ 36 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි)

හෙතෙම පඤ්චොරම්භාගීය සංයෝජනයන්ගේ ක්ෂය කිරීමෙන් එහි පිරිනිවන් පානා සුළුවූයේ ඒ ලෝකයෙන් පෙරළා නොඑන සුළුවූයේ ඕපපාතික වෙයි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, එසේම මහණතෙම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන් දුරුකිරීමෙන් නානාත්ම සංඥාවන්

මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසේද, හෙතෙම එහි වෙදනාගතවූ සංඥාගතවූ සංස්කාරගතවූ (මෙහි 4 වර්ගයේ 36 සූත්‍රයේ 2 (iv) ඡෙදය යෙදිය යුතුයි) හෙතෙම පඤ්චොරම්භාගීය සංයෝජන ධර්මයන් ක්ෂයකිරීමෙන් ඒ ලෝකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතිකවූයේ තත්ථපරිනිබ්බායි (එහි පිරිනිවන්පානා සුළුවූයේ) වෙයි. මහණෙනි, මම ආකාසානඤ්චායතනය නිසා ආශ්‍රවයන්ගේ ක්ෂයය කියමියි මෙසේ ඒ යමක් කියන ලදද මෙය මේ නිසා වදාරන ලදී.

10. "මහණෙනි, මම විඤ්ඤාණඤ්චායතනය නිසා (ඇසුරුකොට) ආශ්‍රවයන්ගේ (ක්ලේශයන්ගේ) ක්ෂයය වේය යයි කියමි. මෙසේ වනාහි මෙය වදාරණලදී. මෙය කුමක් පිණිස වදාරණලදද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම කිසිවක් නැත්තේයයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසේද හෙතෙම එහි වෙදනාගතවූ සංඥාගතවූ සංස්කාර ගතවූ (මෙහි 4 වර්ගයේ 36 සූත්‍රයේ 2 (iv) ඡෙදය යෙදිය යුතුයි.) පඤ්චොරම්භාගිය සංයොජනයන්ගේ ක්ෂයවීමෙන් ඒ ලෝකයෙන් පෙරළා නොඑන ස්වභාව ඇත්තේ ඔපපාතිකවූයේ තත්ථපරිනිබ්බායි වූයේ (එහිදී පිරිනිවන්පානසුළුවූයේ) වෙයි. (මෙහි 36 සූත්‍රයේ 2 (i) ඡෙදය යෙදිය යුතුයි.) මහණෙනි, මම ආකිඤ්චඤ්ඤායතනය ඇසුරුකොට ආශ්‍රවයන්ගේ ක්ෂයවීම කියමියි මෙසේ ඒ යමක් කියන ලද්දේද, මෙය මේ පිණිස වදාරනලදී. මහණෙනි, මෙසේ වනාහි යම්තාක් සංඥා සමාපත්තිය වේද ඒතාක් අර්හත්ව ප්‍රතිවේධය වේ.

11. "මහණෙනි, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියද, සංඥාවෙදයිත නිරොධයද යන යම් ඒ ආයතනයෝ වෙත්ද, මහණෙනි, සමවත්හි දක්ෂවූ, සමවතින් නැගිටීමෙහි දක්ෂවූ මේ ධ්‍යාන වඩන්නන් විසින් (සමවතට) පැමිණ එයින් නැගිට සාන්තය. ප්‍රණීතයයි මනාකොට කියයුත්තාහුයයි කියමි වදාළසේක."

**37. ආනන්ද ඔකාසායිගම සූත්‍රය**:- 1. "මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම කොසඹෑනුවර ඝොෂිතාරාමයෙහි වැඩවාසය කරයි. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි, මහණෙනි, කියා භික්ෂූන්ට ඇමතූසේක. ඒ භික්ෂූහු 'ඇවැත්නි' කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට පිළිවදන් දුන්හ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මේ කාරණය කීසේක.

2. "සත්වයන්ගේ විසුද්ධිය පිණිසද ශොකපරිදේවයන්ගේ ඉක්මවීම පිණිසද දුක් දොම්නස් නැතිකිරීම පිණිසද විදර්ශනා සහිත මාර්ගයාගේ අවබොධය පිණිසද, නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද දන්නාවූ, දක්නාවූ, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවත්හු විසින් (පඤ්චකාම ගුණ) සම්බාධය ඇතිකල්හි ඔකාසයාගේ අධිගමය අවබොධ කරනලද්දේ යම්තාක්ද ඒතාක් ඇවැත්නි, මෙය ආශ්චර්යය, ඇවැත්නි මෙය අද්භූතය එයම (ප්‍රසාද) චක්ෂුස වන්නේය. ඒ රූපයන්ද ඒ ආයතනය නොදන්නේය. එයම නම් ශ්‍රොත වන්නේය. ඒ ශබ්දයන්ද, ඒ ආයතනයද, නොමදන්නේය. එයම ඝ්‍රාණය වන්නේය. ඒ ගන්ධයන්ද, ඒ ආයතනයද නොදන්නේය. එයම ජිව්හාව වන්නේය. ඒ රසයන්ද ඒ ආයතනයද නොම දන්නේය. එයම නම් කය වන්නේය. ඒ ස්පර්ශයන්ද ඒ ආයතනයද නොම දන්නේය.

3. "මෙසේ කීකල්හි ආයුෂ්මත් උදායි ස්ථවිරතෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මේ කාරණය කීයේය. ඇවැත්නි, ආනන්දයෙනි, සංඥා ඇත්තේම ඒ ආයතනය නොදනීද නොහොත් සංඥා නැත්තේම (නොදනීද) ඇවැත්නි, සංඥා ඇත්තේම ඒ ආයතනය නොදනී. සංඥා නැත්තේ නොදනී ඇවැත්නි, කවර සංඥාවකින් සංඥා ඇතුව ඒ ආයතනය නොමදනීදැයි ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන් දුරුකිරීමෙන් නානාත්ම සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාශය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසේද, ඇවැත්නි, මෙසේ සංඥා ඇත්තේම ඒ ආයතනය නොදනී.

4. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසේද ඇවැත්නි, මෙසේ සංඥා ඇත්තේම ඒ නොදනී.

5. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැත්තේයයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසේද, ඇවැත්නි, මෙසේ සංඥා ඇත්තේම ඒ ආයතනය නොදනී.

6. "ඇවැත්නි, මම එක්කාලයක සාකෙත නුවර අඤ්ජන වන නම් මෘගදාවෙහි වාසය කෙළෙමි. එකල්හි ඇවැත්නී ජටිලගහ නගර වාසීවූ භික්ෂුණියක්තොම 'මා යම් තැනෙක්හිද එහි පැමිණියාහ. පැමිණ මට වැඳ එකත්පසෙක සිටියාහ. ඇවැත්නි, එකත්පසෙක සිටියාමවූ ජටිලගහ නගරවාසීහු යම් ඒ භික්ෂුණිය මට මෙසේ කීවාය. "ස්වාමීනි, ආනන්දයෙනි, යම් ඒ සමාධියක්තොම රාග වශයෙන් නො පමුණුවන ලද්දේ වේද ද්වෙෂ වශයෙන් බැහැර නොකරන ලද්දේත්වේද, සංස්කාර වශයෙන් නිග්‍රහකොට වලක්වා සිටියේ කෙලෙසුන්ගෙන් මිදුනු හෙයින් සිටියේ සිටි බැවින් සතුටුවූයේ සතුටු බැවින් නොතැවේ."

7. "ස්වාමීනි, ආනන්දයෙනි, මේ සමාධිය භාග්‍යවතුන් වහන්සේ විසින් කිනම් ප්‍රයෝජන ඇත්තේ වදාරන ලද්දේද යනුයි." මෙසේකීකල්හි "ඇවැත්නි, මම ජටිලගෘහී භික්ෂුණියට මේ කාරණය කීවෙමි. 'නැගනිය යම් මේ සමාධියක් රාග වශයෙන් නොනැමුනේ ද්වෙෂ වශයෙන් නොනැමුනේ සප්‍රයෝග වශයෙන් ක්ලේශයන් වැලැක්වූයේ, ක්ලේශයන්ගෙන් විමුක්ත බැවින් පිහිටා සිටියේ පිහිටා සිටි බැවින් සන්තුෂ්ටවූයේ සන්තුෂිතවූ බැවින් හාත්පසින් නොතැවෙයිද, භගිනිය මේ සමාධිය භාග්‍යවතුන් වහන්සේ විසින් අර්හත්වය ප්‍රයෝජනකොට ඇත්තේයයි වදාරන ලද්දේය යනුයි. ඇවැත්නි මෙසේ සංඥා ඇත්තේම ඒ ආයතනය නොම පිළිදනීය යනුයි."

38. **ලොකායතික සූත්‍රයː-** 1. "ඉක්බිත්තෙන් වනාහි ලොකායතය හදාරන්නාවූ බ්‍රාහ්මණයෝ දෙදෙනෙක් භාග්‍යවතුන්

වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. සතුටුවිය යුතු කථාද, සිහිකටයුතු කථාද කොට නිමවා එකත්පසෙක උන්නාහුය. එකත්පසෙක උන්නාවූ ඒ බ්‍රාහ්මණයෝ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය.

2. "භවත් ගෞතමයන් වහන්ස, පූරණ කශ්‍යපතෙමේ (ii) සියල්ල දන්නේ, සියල්ල දක්නේ හැසිරෙන්නාවූද, සිටින්නාවූද නිදාගන්නාවූද නිදි දුරුකරන්නාවූද, 'මට සැමකල්හි නිරන්තරයෙන් ඤාණදර්ශනය පිහිටා සිටියේයි'. සියල්ල දැකීම ප්‍රතිඥාකෙරෙයි. හෙතෙම මෙසේ කියයි. 'මම අනන්තවූ ඤාණයෙන් අන්තවත්වූ ලෝකය දනිමින් දකිමින් වාසයකරමියි' කියායි.

3. "භවත් ගෞතමයන් වහන්ස, මේ නිඝණ්ඨනාථ පුත්‍රතෙමේ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

4. "භවත් ගෞතමයන් වහන්ස, මේ ඤාණවාද දෙක අතුරෙන් මේ එකට එක විරුද්ධ වාද දෙක අතුරෙන් කවරක් සත්‍ය නම් වේද, කවරක් මුසා නම් වීදැයි කියයිද?"

5. "බ්‍රාහ්මණවරුණි, මේ ඤාණවාද දෙක අතුරෙන් මේ අඤ්ඤමඤ්ඤ විපච්චනිකවාද දෙක අතුරෙන් කවරක් නම් සත්‍යය වේදැයි කියයිද කවරක් නම් මුසාව වේදැයි කියයිද යන මේකාරණය කම්නැත. මේ කාරණය තිබේවා, බ්‍රාහ්මණවරුනි තොපට ධර්මය දෙසන්නෙමි. එය අසව් මනාකොට මෙනෙහි කරව් කියන්නෙමි." ඒ බ්‍රාහ්මණයෝ, "එසේය, පිංවතුන් වහන්සේය" කියා භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළසේක.

6. "බ්‍රාහ්මණවරුණි, යම්සේ නම් උතුම් ගතියෙන්ද ජවයෙන්ද උතුම්වූ පදද්වීතිහාරයෙන්ද යුක්තවූ සතර දිගින් පැමිණ සිටියාවූ පුරුෂයෝ සතර දෙනෙක් වන්නාහුද, දෘඪව දුනුගෙන සිටියාවූ ධනුග්‍රාහීවූ ශික්ෂිතවූ කෘතහස්තවූ දක්වන ලද ශිල්ප ඇත්තාවූ ධනුර්ධරයෙක්තෙම සැහැල්ලු වූ ඊතලයකින් නිරායාසයෙන් තල්ගස් සෙවණක් යම්සේ ඉක්මවන්නේද

එවැනිවූම පදද්වීතිහාරයකින්ද, යම්සේ නම් පෙරදිග මුහුදින් බටහිර දිග මුහුද වේද, ඉක්බිති පෙරදිගෙහි සිටියාවූ පුරුෂයෙක්තෙම මෙසේ කියන්නේද (ii) මම පා ගමනින් ලෝකයාගේ කෙළවරට පැමිණෙන්නෙමියි' කියායි. හෙතෙම කෑම පීම, කඩා කෑම ලොවීම යන මෙයින් තොරවම මලමූත්‍ර පහකිරීමෙන් තොරවම නිද්‍රාක්ලාන්ත දුරුකිරීමෙන් තොරව සියක්වස් ආයු ඇත්තේ සියක් වසක් ජීවත්වනසුළු වූයේ වර්ෂ සියයක් මුළුල්ලෙහි ගොස් ලෝකයාගේ කෙළවරට නොපැමිණම අතරතුර කාලක්‍රියා කරන්නේය.

7. "ඉක්බිති පශ්චිම දිශාවෙහි සිටි පුරුෂයා මෙසේ කියන්නේය. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ඉක්බිති උත්තර දිශාවෙහි සිටි පුරුෂයා මෙසේ කියන්නේය. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ඉක්බිති දක්ෂිණ දිශාවෙහි සිටි පුරුෂයා මෙසේ කියන්නේය. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ඊට හේතු කවරේද? බ්‍රාහ්මණවරුනි, මම මෙබඳුවූ පා ගමනින් දුවන්නෙකුගේ ලොකයාගේ අන්තය නොදතයුතුයයි නොදැක්ක යුතුයයි නොපැමිණිය යුතුයයි කියමි. බ්‍රාහ්මණවරුනි, මම ලෝකයාගේ අන්තයට නොපැමිණ දුක්කෙළවර කරන්නේයයි නොකියමියි" වදාළසේක.

8. "බ්‍රාහ්මණවරුනි, මේ කාමගුණ පසක් ආර්යවිනයෙහි ලෝකයයි කියනු ලැබේ. කවර පසක්ද? ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වරූපවූ කාමයෙන් යුක්තවූ රජනීයවූ (ඇළුම් කටයුතුවූ) චක්ෂුර්විඥානයෙන් දතයුතුවූ රූපයෝය. ශ්‍රොතවිඥෙයවූ ශබ්දයෝය, ඝ්‍රාණයෙන් දතයුතුවූ ගන්ධයෝය, ජිහ්වාවිඥෙයවූ රසයෝය, ඉෂ්ටවූ කාන්තවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වරූපවූ කාමූපසංහිතවූ (පස්කම් ගුණයෙන් යුක්තවූ රජනීයවූ කායවිඥෙයවූ ස්පර්ශයෝය. බ්‍රාහ්මණවරුනි, මේ පඤ්චකාමගුණයෝ ආර්යවිනයෙහි ලොකයයි කියනු ලැබේ.

9. "බ්‍රාහ්මණවරුනි, මේ ශාසනයෙහි භික්ෂුවක් තෙම කාමයන්ගෙන් වෙන්වම ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේද බ්‍රාහ්මණවරුනි, මේ භික්ෂු තෙම ලෝකයාගේ කෙළවරට පැමිණ ලොකයාගේ අන්තයෙහි වෙසෙයයි කියනු ලැබේද ඕහට

අන්‍යයෝ මෙසේ කීවාහුය. මේ තෙමේද ලෝකපරියාපන්නය (ලෝකයට ඇතුළත්ය) මේ තෙමේද ලෝකයෙන් බැහැර නොකරන ලද්දේ වේය යනුයි.

**10.** "බ්‍රාහ්මණවරුනි, නැවතද අනිකක් කියමි. භික්ෂුවක් තෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් (මෙහි 32 සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි)

**11.** "බ්‍රාහ්මණවරුනි, නැවතද අනිකක් කියමි. භික්ෂුවක් තෙම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තංගමයෙන් නානාත්ම සංඥාවන්ගේ මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසේද බ්‍රාහ්මණවරුනි, මේ භික්ෂුව ලෝකයාගේ අන්තයට පැමිණ ලෝකයාගේ අන්තයෙහි වෙසේද ඕහට අන්‍යයෝ මෙසේ කීවාහුය. 'මේ තෙමේද ලොකපරියාපන්නය (ලෝකයට ඇතුළත්ය) මේ තෙමේද ලේකයෙන් බැහැර නොකරන ලද්දේ වේය' යනුයි.

**12.** "බ්‍රාහ්මණවරුනි, නැවතද අනිකක් කියමි. භික්ෂුවක් තෙම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසේද බ්‍රාහ්මණවරුනි, මෙසේ සංඥා ඇත්තේම නොදනී. සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම කිසිවක් නැත්තේයයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසේද, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසේද, බ්‍රාහ්මණවරුනි, මේ භික්ෂු තෙමේද ලෝකයාගේ අන්තයට පැමිණ ලෝකයාගේ අන්තයෙහි වෙසේද, ඕහට අන්‍යයෝ මෙසේ කීවාහුය. මේ තෙමේද ලොකපරියාපන්න වෙයි. මේ තෙමේ ලෝකයෙන් බැහැර නොකරන ලද්දේ වේය යනුයි. බ්‍රාහ්මණවරුනි, නැවතද අනිකක් කියමි. භික්ෂුවක් තෙම සර්වප්‍රාකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්ම සඤ්ඤාවේදයිත නිරොධයට පැමිණ ඔහු විසින් ප්‍රඥාවෙන් දැක ආශ්‍රවයෝ ක්ෂය කරන ලද්දාහු වෙත්ද, බ්‍රාහ්මණවරුනි,

මේ භික්ෂුව ලෝකයෙහි විසත්තිකා නම් තෘෂ්ණාව තරණය කෙළේ ලෝකයාගේ අන්තයට පැමිණ ලෝකයාගේ අන්තයෙහි වෙසේයයි කියනු ලැබේ.”

**39. දෙවාසුර සංගාම සූත්‍රයඃ-** 1. “මහණෙනි, පෙරවූ දෙයක් කියමි. දෙවාසුර යුද්ධයක් පැමිණ සිටියේවිය. මහණෙනි ඒ යුද්ධයෙහි වනාහි (ii) අසුරයෝ දිනුවාහුය. දෙවියෝ පැරදුනාහුය. මහණෙනි, පැරදුනාවූද දෙවියෝ බියවූවාහු පැන ගියාහුය. අසුරයෝ උත්තරාභිමුඛව ලුහුබැඳ ගියාහුය.

2. “මහණෙනි, ඉක්බිති දෙවියන්ට මෙබඳු සිතක් විය. ‘අසුරයෝ ලුහුබැඳ යත්ම අපි දෙවෙනි වරත් අසුරයන් සමඟ යුද්ධ කරන්නෙමු නම් ඉතා යෙහෙක’ කියායි (ii) මහණෙනි, දෙවෙනි වරත් දෙවියෝ අසුරයන් සමග යුද්ධ කළාහුය. මහණෙනි දෙවෙනි වරත් (මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

3. “මහණෙනි, ඉක්බිත්තෙන් දෙවියන්ට මෙවැනි සිතක් විය. අසුරයෝ ලුහුබැඳ යන්නාහුමය. අපි තුන්වෙනි වරත් අසුරයන් සමඟ යුද්ධ කරන්නෙමු නම් ඉතා යෙහෙක’ කියායි. මහණෙනි, තුන්වෙනි වරත් දෙවියෝ අසුරයන් සමඟ යුද්ධ කළාහුය. මහණෙනි, තෙවෙනි වරත් (මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

4. “මහණෙනි, දෙවු පුරයට ගියාවූ දෙවියන්ට මෙවැනි සිතක් විය. ‘දැන් අපි මේ කාලයෙහි බියෙන් වැලකී සිටීමට ගියාවූ ආත්මයෙන් යුක්තව අසුරයන් විසින් නොකටයුත්තෝව වාසය කරමුය’ කියායි. මහණෙනි, අසුරයන්ටද මෙවැනි සිතක් විය. එනම් ‘දැන් මේ කාලයේ දෙවියෝ බියෙන් පිළිසරණ වීමට ගියාවූ ආත්මයෙන් යුක්තව අප විසින් නොකටයුත්තෝව වාසය කෙරෙත්ය’ යනුයි.

5. “මහණෙනි, පෙරවූ දෙයක් කියමි. එකල්හි දෙවියන්ගේ සහ අසුරයන්ගේ යුද්ධයක් හටගත්තේ විය. මහණෙනි, ඒ කාලයෙහි (ii) දෙවියෝ දිනුවාහුය. අසුරයෝ පැරදුනාහුය. මහණෙනි, පැරදුනාවූද අසුරයෝ පැන ගියාහුමය. (iii) දෙවියෝ දක්ෂිණාද්වාරයෙන් ලුහුබැඳ ගියාහුය.

6. "ඉක්බිති අසුරයන්ට මෙවැනි අදහසක් විය. 'දෙවියෝ ලුහුබැඳ යන්නාහුමය. අපි දෙවෙනි වරත් දෙවියන් සමඟ යුද්ධ කරන්නෙමු නම් ඉතා යෙහෙක' කියායි. මහණෙනි, දෙවෙනි වරත් අසුරයෝ දෙවියන් සමඟ යුද්ධ කළාහුය. මහණෙනි, දෙවෙනි වරත් (මෙහි 5 (ii) (iii) යෙදිය යුතුයි.)

7. "මහණෙනි, ඉක්බිති අසුරයන්ට මෙවැනි සිතක් විය. දෙවියෝ ලුහුබැඳ යත්මය. අපි තෙවෙනි වරත් දෙවියන් සමඟ යුද්ධ කරන්නෙමු නම් ඉතා යෙහෙක' කියායි. මහණෙනි, තෙවෙනි වරත් අසුරයෝ දෙවියන් සමග යුද්ධ කළාහුය. මහණෙනි, තෙවෙනි වරත් (මෙහි 5 (ii) යෙදිය යුතුයි) මහණෙනි, අසුර පුරයට ගියාවූ අසුරයන්ට මෙබඳු සිතක් විය. 'දැන් අපි මේ කාලයෙහි භයත්‍රාණවූ (බිය පිළිසරණවූ) ආත්මයෙන් යුක්තව දෙවියන් විසින් නොකටයුත්තෝව වාසය කරමුය" කියායි.

8. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සමයෙක්හි මහණ තෙම කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේද, මහණෙනි, ඒ කාලයෙහි භික්ෂුවට මෙසේ සිතක් වෙයි. 'දැන් මේ කාලයෙහි මම මාරයා විසින් නොකටයුතුවූ භීරුත්තානගතවූ (බිය වැලකීමෙන් ප්‍රතිෂ්ඨාගතවූ) ආත්මයෙන් යුක්තව වාසය කරමිය' කියායි මහණෙනි, පාපීමත්වූ මාරයාටද මෙසේ සිතක් වෙයි. 'දැන් මේ කාලයෙහි භික්ෂුතෙම මා විසින් නොකටයුතුවූයේ භීරුත්තානගත ආත්මයෙන් යුක්තවූයේ වාසය කෙරේය' කියායි.

9. "මහණෙනි, යම් කාලයෙක්හි භික්ෂුතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 3 යෙදිය යුතුයි.) වෙසේද, ඒ කාලයෙහි භික්ෂුවට මෙසේ සිතක් වෙයි. 'දැන් මම මේ කාලයෙහි මාරයා විසින් නොකටයුතුවූ භීරුත්තානගත ආත්මයකින් යුක්තව වාසය කරමිය' කියායි. මහණෙනි, පාපීමත්වූ මාරයාට මෙසේ සිතක් වෙයි. 'දැන් මේ කාලයෙහි භික්ෂුතෙම මා විසින් (කිසිවක්) නොකටයුතුවූයේ භීරුත්තානගතවූ ආත්මයෙන් යුක්තව වාසය කෙරේය' කියායි.

10. "මහණෙනි, යම් සමයෙක්හි භික්ෂුතෙම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම ප්‍රතිඝ සංඥාවන් අස්තංගම කිරීමෙන් නානාත්ම සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසේද, මහණෙනි, මේ භික්ෂුව කෙළවර කෙළේය. පියවර නැතිසේ මාරයා නසා පාපීවූ මරුගේ මාර චක්ෂුස අදර්ශනයට පැමිණ වීය.

11. "මහණෙනි, යම් සමයෙක්හි මහණතෙමේ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසේද සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැත්තේ යයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසේද සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසේද, සර්වප්‍රකාරයනේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වෙසේද, ඔහුගේ ප්‍රඥාවෙන් දැක ආශ්‍රවයෝ ක්ෂය කරණ ලද්දාහු වෙත්ද, මහණෙනි, මේ මහණතෙම මාරයා නිෂ්පදව (නිරවශෙෂයෙන්) අන්ත කෙළේයයිද, පාපීවූ මාරයාගේ මාර චක්ෂුස අදර්ශනයට ගියේයයිද ලෝකයෙහි විසත්තිකා නම් තෘෂ්ණාව තරණය කරන ලද්දේ යයි කියනු ලැබේයයි" වදාළසේක.

40. ආරඤ්ඤක නාග (හෝ) ආකිණ්ණ විහාර සූත්‍රයඃ- 1. (i) "මහණෙනි. යම් සමයෙක්හි ඇත්තුද, ඇතිනියෝද ඇත්නාම්බෝද, ඇත්පැටවුද ගොදුරු ගැනීමෙහි යෙදුණු වනයෙහිවූ ඇතෙකුගේ ඉදිරියෙන් ඉදිරියෙන් ගොස් (ii) තණ අග්ගිස් සිඳ ගනිත්ද, මහණෙනි, ඒ කරණකොට ආරණ්‍යක හස්තියා පීඩාවෙයිද ලජ්ජාවෙයිද පිළිකුල් වෙයිද (මෙහි 1 (i) යෙදිය යුතුයි) නමන නමනලද අතු කැබලි කත්ද, මහණෙනි, ඒ කරණකොට ආරණ්‍යක හස්තියා පීඩා වෙයිද, ලජ්ජා වෙයිද, පිළිකුල් වෙයිද,

2. (i) "මහණෙනි, යම් සමයෙක්හි ඇත්තුද ඇතින්නියෝද ඇත් නාම්බෝද ඇත් පැටවුද දිය තොටට බැස්සාවූ ආරණ්‍යක

හස්තියාගේ ඉදිරියෙන් ඉදිරියෙන් ගොස් (ii) සොඬවැලෙන් වතුර කළඹවත්ද, මහණෙනි, ඒ කරණකොට ආරණ්‍යක හස්තිතෙම පීඩා වෙයිද, ලජ්ජා වෙයිද පිළිකුල් වෙයිද, මහණෙනි, යම් සමයෙක්හි දිය තොටට බැස්සාවූ ආරණ්‍යක හස්තියාගේ ඇඟෙහි ගැටෙමින් ඇතින්නියෝද, යෙත්ද, මහණෙනි ඒ කරණකොට ආරණ්‍යක ඇත්තෙම පීඩාවෙයිද ලජ්ජා වෙයිද පිළිකුල් වෙයිද?

3. "මහණෙනි, ඒ කාලයෙහි ආරණ්‍යයක හස්තියාට මෙබඳු සිතක් වෙයි. (එනම්) 'මම වනාහි දැන් ඇතුන් ගෙන්ද, ඇතිනියන් ගෙන්ද ඇත්නාම්බන් ගෙන්ද, ඇත්පැටවුන් ගෙන්ද, ආකීර්ණව වසමි. සුන්වූ අග් ඇති තණ කොළ කමි. මා විසින් කඩන කඩනලද අතු කැබලි (ඔවුහු) කති. (මම) (ඔවුන්ගෙන්) කැළඹුණාවූ පැන් බොමි. ඇතින්නියෝ දියට බැස්සාවූ මගේ සිරුර ගැටෙමින් යති. මම හුදකළාවූයෙමි. සමූහය (රැළ) කෙරෙන් වෙන්වූයෙමි වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙක' කියායි.

4. "හෙතෙම පසු කාලයක හුදකළාවූයේ සමූහයා කෙරෙන් වෙන්වූයේ මෙසේ නොසුන් අග් ඇති තණකොළ කයි. ඔහු විසින් නමන නමන ලද අතුකැබලි (ඔවුහු) නොකත්. නොකළැඹුණු දිය බොයි. ඇතින්නියෝ දියතොටට බැස්සාවූ ඔහුගේ ඇඟෙහි නොගැටෙමින් යත්ද, ඒ කාලයෙහි ආරණ්‍යක හස්තියාට මෙසේ සිතක් වෙයි. 'ඇතුන්ගෙන්ද, ඇතිනියන් ගෙන්ද, ඇත් නාම්බන් ගෙන්ද, ඇත් පැටවුන්ගෙන්ද පෙර මම වනාහි ආකීර්ණව විසුයෙමි. සුන්වූ අග් ඇති තණකොළ කෑවෙමි. මා විසින් බිඳින බිඳින ලද අතු කැබලි (ඔවුහු) කෑවාහුය. කැළඹුනාවූ පැන් බීවෙමි. ඇතින්නියෝ දියට බැසගන්නාලද මාගේ ඇඟෙහිගැටෙමින් ගියාහුය.

5. "ඒ මම මේ කාලයෙහි හුදකළාවූයෙම් ගණයා කෙරෙන් වෙන්වූයෙම් නොසුන් අග් ඇති තණකොළ කමි. මා විසින් බිඳින බිඳින ලද අතු කැබලිති (ඔහු) නොකත් නොකැළැඹුණ පැන් බොමි ඇතිනියෝ දියතොටට බැස්සාවූ මගේ සිරුර ගටමින් නොයත්ය' කියායි. 'ඒ මට සොඬින් අතු කැබලිති කඩාගෙන

අතු කැබලිත්තෙන් සිරුර පිරිමැද සතුටු සිත් ඇත්තේ කැසිල්ල දුරුකෙරෙත්."

41. **උරුවෙලකප්ප (තපුස්ස) සූත්‍රය:-** 1. "මහණෙනි, එසේම වනාහි යම් සමයෙක්හි මහණෙක් තෙම (ii) භික්ෂූන්ගෙන්ද, භික්ෂුණීන්ගෙන්ද, උපාසකයන්ගෙන්ද උපාසිකාවන්ගෙන්ද, රාජරාජ මහාමාත්‍යයන්ගෙන්ද, තීර්ථකයන්ගෙන්ද, තීර්ථක ශ්‍රාවකයන්ගෙන්ද, (iii) ආකීර්ණව වෙසේද, මහණෙනි, ඒ කාලයෙහි භික්ෂුවකට මෙසේ සිතක් වේ. 'මම වනාහි දැන් (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) ආකීර්ණව වාසය කරම්ද, මම හුදකලාවූයෙම් සමූහයා කෙරෙන් වෙන්වූයෙම් වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙක' කියායි.

2. "හෙතෙම අරණ්‍යය, වෘක්ෂමූලය, පර්වතය, කඳුරැලිය, ගිරිගුහාය, සුසානය, වනමාර්ගය, අභ්‍යවකාශය, පලාලපුංජය (පිදුරුගොඩය) යන සෙනසුන් භජනය කරයි. හෙතෙම අරණ්‍යයකට ගියේ හෝ වෘක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ පලක් බැඳ කය කෙළින් තබාගෙන ඉදිරියෙහි සිහිය පිහිටුවාගෙන හිඳියි. හෙතෙම ලොකයෙහි අභිධ්‍යාව (සන්තානයෙහි දැඩි ලොභකම) හැර පහවූ අභිධ්‍යා ඇති සිතින් යුක්තව වෙසෙයි. අභිධ්‍යාවෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාදයෙන් ප්‍රදොෂිතවූ සිත හැර අව්‍යාපාද (ව්‍යාපාදයක් නැති) සිත් ඇත්තේ සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පීව වෙසෙයි. ව්‍යාපාද ප්‍රදොෂිත සිත පිරිසිදු කෙරෙයි. ථිනමිද්ධය (කයේ අලසකම සහ සිතේ අලසකම) හැර පහවූ ථිනමිද්ධ ඇත්තේ ආලෝක සංඥා ඇත්තේ සම්‍යක් ප්‍රඥා ඇත්තේ වෙසේ. ථිනමිද්ධයෙන් සිත පිරිසිදු කෙරෙයි.

3. "උද්ධච්චකුක්කුච්චය හැර උද්ධත නොවූයේ ස්වසන්තානයෙහි සංසිඳුණු සිත් ඇත්තේ උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරෙයි. විචිකිච්ඡාව හැර තරණය කරන ලද විචිකිත්සා ඇත්තේ කුසලධර්මයන්හි කථංකථා (සැකකටයුතු කථා) නැත්තේ වාසය කෙරෙයි. විචිකිත්සාවෙන් සිත පිරිසිදු කෙරෙයි.

4. "හෙතෙම මේ පඤ්චනීවරණයන් හැර සිත පිළිබඳ උපක්ලෙශ ධර්මයන්වූ ප්‍රඥාවගේ දුර්වලකමවූ මේ පඤ්චනීවරණ ධර්මයන් හැර කාමයන්ගෙන් වෙන්වම (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේද, හෙතෙම සතුටුසිත් ඇත්තේ කණ්ඩූසනය කෙරෙත් (කසාදමත්.) විතර්කවිචාරයන්ගේ සංසිඳවීමෙන් (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 3 (i) (ii) (iii) ඡේදය යෙදිය යුතුයි) ද්විතීයධ්‍යානයට, තෘතීයධ්‍යානයට, චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේද, හෙතෙම සතුටු සිත් ඇත්තේ කණ්ඩූසනය කෙරෙත්. සර්ව ප්‍රකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන් අස්තංගම කිරීමෙන් නානාත්ම සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසේද, හෙතෙම සතුටුසිත් ඇත්තේ කණ්ඩූසනය කරත්.

5. "සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණාඤ්චායතනයට පැමිණ වෙසේද, සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම කිසිවක් නැත්තේයයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසේද, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසේද, සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්ම සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වෙසේද, ඔහුගේ ප්‍රඥාවෙන් දැක ආශ්‍රවයෝ ක්ෂයකරන ලද්දාහුවෙත්ද, හෙතෙම සතුටු සිත් ඇත්තේ කණ්ඩූසනය කෙරෙත්යයි" වදාළසේක.

42. **පඤ්චාල චණ්ඩ සූත්‍රය**:- 1. "මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මලතනම් දනව්වෙහි උරුවෙලකප්ප නම් මලත රටවාසින්ගේ නියම් ගමක් වේද (එහි) වැඩවාසය කරණසේක. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන උරුවෙලකප්පයට පිඬු පිණිස වැඩිසේක. උරුවෙල කප්පයෙහි පිඩු පිණිස වැඩ පසු බත්කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකුනේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ඇමතූසේක. "ආනන්දයෙනි, දිවාවිහරණය පිණිස මම

යම්තාක්කල් මහවනයට වැදගන්නෙම්ද, ඒතාක් කල් ඔබ මෙහිම වසනු මැනව" යනුයි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ "ස්වාමීන් වහන්ස, එසේයයි' කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

2. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහවනයට වැඩ එක්තරා රුක්මුලෙක්හි දිවාවිහරණය කිරීම පිණිස වැඩ උන් සේක. ඉක්බිත්තෙන් තපුස්ස ගෘහපති තෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ තපුස්ස ගෘහපති තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මේ කාරණය කීයේය.

3. 'ස්වාමීනි, ආනන්ද ස්ථවිරයානෙනි, (ii) කාමයෙහි සිත් ඇලවීම් ඇති, කාමයෙහි ඇලුනාවූ, කාමයෙහි මුදිතවූ, අපි කාමභොගීවූ (iii) ගිහියෝ වෙමු. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) ඒ අපට යම් මේ නෛෂ්ක්‍රම්‍යය ප්‍රපාතයක් මෙන් වැටහෙයි, ස්වාමීනි, මේ ශාසනයෙහි දහරවූ (ඉතාදහර) භික්ෂූන්ගේ සිත නෛෂ්ක්‍රම්‍යයෙහි බැසගනියි. පහදියි. මේ ශාන්තයයි සිටියි මිදෙයි යන මේ කාරණ මා විසින් අසන ලදී. ස්වාමීනි, මහජනයා හා අසදෘශවූ යම් මේ නෛෂ්ක්‍රම්‍යයක් වේද, මේ ශාසනයෙහි ඒ මේ නෛෂ්ක්‍රම්‍යය දක්නාවූ භික්ෂූන්ට මෙය ශාන්තය යනුයි."

4. "ගෘහපතිය, කථා මූලයක් ඇත්තේමය. ගෘහපතිය භාග්‍යවතුන් වහන්සේ දැකීමට යමු. භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණෙන්නෙමු. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකරන්නෙමු. භාග්‍යවතුන් වහන්සේ අපට යම්සේ ප්‍රකාශ කරන්නේද එය එසේ දරන්නෙමුයි" "ස්වාමීනි, එසේයයි" තපුස්ස ගෘහපතිතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්නේය.

5. ඉක්බිත්තෙන් ආනන්ද ස්ථවිරයන් වහන්සේ තපුස්ස ගෘහපතියා සමග භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක

හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආනන්ද ස්ථවිරයෝ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළෝය. "ස්වාමීනි, තපුස්ස ගෘහපති තෙම මෙසේ කියයි. (මෙහි මේ වර්ගයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

**6.** "ආනන්දය, ඒ කාරණය එසේය, ආනන්දය, ඒ කාරණය එසේය. ආනන්දය, චතුස්සත්‍යාවබෝධ නොකළාවූ බෝධිසත්වවූම මට සම්‍යක් සම්බොධියෙන් පූර්වයෙහිම නෛෂ්ක්‍රම්‍යය යහපත්ය. උසස්වූ විවේකය, යහපත්යයි මෙබඳු සිතක් විය. ආනන්දය, මේ ශාන්තයයි දක්නාවූ මගේ සිත නෛෂ්ක්‍රම්‍යයෙහි නොබසියි. නොපහදියි, නොසිටියි, කෙලෙසුන්ගෙන් නොමිදෙයි. ආනන්දය, ඒ මට මෙබඳු සිතක් විය. 'මා විසින් කාමයන්හි ආදීනව නොදක්නා ලද්දේය හෙද මා විසින් බහුල වශයෙන් නොකරන ලද්දේය. නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිසංසනොලබනලද්දේය හෙද මා විසින් නොසෙවුනා ලද්දේය. එහෙයින් මෙය ශාන්තයයි නෛෂ්ක්‍රම්‍යයෙහි සිත නොබසී නොපහදී, නොසිටී, කෙලෙසුන්ගෙන් නොමිදේ, ආනන්දය, ඒ මට මෙසේ සිතක් පහළවිය. 'ඉදින් වනාහි මම කාමයන්හි ආදීනව දැක එය බහුල වශයෙන් කරන්නෙම්ද නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිසංසයට පැමිණ එය සේවනය කරන්නෙම්ද එනම් යම් හෙයකින් මේ ශාන්තයයි දක්නාවූ මාගේ සිත නෛෂ්ක්‍රම්‍යයෙහි බැසගන්නේද, පහදින්නේද සිටින්නේද කෙලෙසුන්ගෙන් මිදෙන්නේද යන මේ කාරණය විද්‍යමාන වෙයි.' ආනන්දය, ඒ මම පසුකාලයක කාමයන්හි ආදීනවය දැක එය බහුල වශයෙන් කෙළෙමි. නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිසංසයට පැමිණ එය සේවනය කෙළෙමි.

**7.** "ආනන්දය, එය ශාන්තයයි දක්නාවූ මාගේ සිත නෛෂ්ක්‍රම්‍යයෙහි බැසගනී, පහදී පිහිටාසිටී. කෙලෙසුන්නේ මිදේ. ආනන්දය, ඒ මම පසු කාලයක කාමයන්ගෙන් වෙන්වම ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙම්ද, ආනන්දය මේ විහරණයෙන් යුක්තව වාසය කරන්නාවූ ඒ මට කාම සහගත සංඥාමනසිකාරයෝ පවතිත්. ආනන්දය, යම්සේ යම්තාක්

ආබාධය පිණිසද ඒතාක් සුවපත් වූවහුට දුකක් උපදින්නේද, එය ඒමට ආබාධයෙක් වෙයි. එසේම ඒමට කාමසහගත සංඥාමනසිකාරයෝ පවතිත්ද ඒමට එය ආබාධයෙක් වෙයි.

8. "ආනන්දය, ඒමට මෙබඳු සිතක් විය. 'මම විතර්ක විචාරයන් සංසිඳවීමෙන් ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරන්නෙම් නම් යෙහෙක' කියායි. ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මාගේ සිත අවිතර්කයෙහි බැස නොගනියි. නොපහදී මොනවට පිහිටා නොසිටියි. කෙලෙසුන්ගෙන් නොමිදේ. ආනන්දය, මෙය ශාන්තයයි දකින්නාවූ ඒ මට මෙබඳු සිතක්විය. 'යමක් කරණකොට මාගේ සිත අවිතර්කයෙහි බැස නොගනීද, නොපහදීද, මොනවට පිහිටා නොසිටීද, නොමිදේද, ඊට හේතු කවරේද, ඊට ප්‍රත්‍යය කවරේද?" කියායි.

9. "ආනන්දය, දක්නාවූ මට මෙබඳු සිතක් විය. 'මා විසින් විතර්කයන්හි ආදීනව නොදක්නා ලද්දේය. මා විසින් එය බහුල වශයෙන් නොකරන ලද්දේය. අවිතර්කයෙහි ආනිසංසය නොලබන ලද්දේය. මා විසින් එය පුරුදු නො කරන ලද්දේය. එහෙයින් මාගේ සිත අවිතර්කයෙහි නොබසියි නොපහදියි. මොනවට නොසිටියි. කෙලෙසුන්ගෙන් නොමිදෙයි කියායි.

10. "ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒමට මෙබඳු සිතක් විය. 'ඉදින් වනාහි මම විතර්කයන්හි ආදීනවයන් දැක එය බහුල වශයෙන් කරන්නෙම් නම් අවිතර්කයෙහි ආනිසංසයට පැමිණ එය ආසේවනය කරන්නෙම් නම් යම් හෙයකින් මාගේ සිත අවිතර්කයෙහි බැසගනීද, පහදීද මොනවට පිහිටා සිටීද මිදේද මේ කාරණය වනාහි විද්‍යමාන වෙයි. ආනන්දය ඒ මට පසු කාලයක විතර්කයන්හි ආදීනව දැක එය බහුලවශයෙන් කෙළෙමි. අවිතර්කයෙහි ආනිසංසයට පැමිණ එය සේවනය කෙළෙමි.

11. "ආනන්දය, මේ ශාන්තයයි දකින්නාවූ ඒ මාගේ සිත අවිතර්කයෙහි බැසගනී, පහදී, මොනවට පිහිටා සිටී මිදෙයි කියායි. ආනන්දය, ඒ මම පසු කාලයක විතර්ක විචාරයන් සංසිඳවීමෙන් (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 3 (i) ඡේදය යෙදිය

යුතුයි.) ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරමි. ආනන්දය, මේ විහරණයෙන් යුක්තව වාසය කරන්නාවූ ඒ මට විතර්ක සහගත සංඥාමනසිකාරයෝ පවතිත්. ඒ මට එය ආබාධයක් වෙයි. ආනන්දය, සුවපත්වූවහුට දුකක් උපදින්නේ යම්සේද එය ආබාධය පිණිස පවතින්නේද, එපරිද්දෙන්ම ඒ මට විතර්ක සහගත සංඥාමනසිකාරයෝ පවතිත්ද එය ඒ මට ආබාධයෙක් වෙයි. "ආනන්දය, මම ප්‍රීතියෙහි නොඇලීමෙන් තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරන්නෙම් නම් ඉතා යහපතැයි' මෙබඳු සිතක් විය.

12. "ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මාගේ සිත නිෂ්ප්‍රීතික (ධ්‍යාන) යෙහි බැස නොගනී, නොපහදී නොසිටියි නොමිදේ කියායි. ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ මට මෙබඳු සිතක් විය. 'යමෙක් කරණකොට මාගේ සිත නිෂ්ප්‍රීතික ධ්‍යානයෙහි බැස නොගනීද නොපහදීද, නොසිටීද, නොමිදේද, ඊට හේතු කවරේද, ඊට ප්‍රත්‍යය කවරේද? ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒමට මෙබඳු සිතක් විය. මා විසින් ප්‍රීතියෙහි ආදීනවය නොදක්නා ලද්දේද එය මා විසින් බහුල වශයෙන් නොකරන ලද්දේද නිෂ්ප්‍රීතියෙහි ආනිසංසය නොලබන ලද්දේද එය මා විසින් නොසෙවුන ලද්දේද එහෙයින් මාගේ සිත නිෂ්ප්‍රීතිකධ්‍යානයෙහි බැසනොගනී නොපහදී, නොසිටී නොමිදේ. ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ මට මේ සිතක් විය. 'ඉදින් වනාහි මම ප්‍රීතියෙහි ආදීනවය දැක එය බහුල වශයෙන් කරන්නෙම්ද නිෂ්ප්‍රීතියෙහි ආනිසංසයට පැමිණ එය සේවනය කරන්නෙම්ද, යම් හෙයකින් මාගේ සිත නිෂ්ප්‍රීතියෙහි බැසගන්නේද, පහදින්නේද, මොනවට පිහිටා සිටින්නේද (කෙලෙසුන්ගෙන්) මිදෙන්නේද, මේ කාරණය වනාහි විද්‍යමාන වෙයි. ආනන්දය, ඒ මම වනාහි පසු කාලයක ප්‍රීතියෙහි ආදීනව දැක එය බහුල වශයෙන් කෙළෙමි. නිෂ්ප්‍රීතියෙහි ආනිසංසයට පැමිණ එය සේවනය කෙළෙමි.

13. "ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මාගේ සිත නිෂ්ප්‍රීතියෙහි බැසගනී, පහදී සිටියි. මිදෙයි යනුයි. ආනන්දය ඒ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මම වනාහි පසුකාලයක ප්‍රීතියෙහි නො ඇලීමෙන් (මෙහි මේ වර්ගයේ 32 සූත්‍රයේ 3 ඡේදය ii යෙදිය යුතුයි.) තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරමි. ආනන්දය මේ විහරණයෙන් යුක්තව වාසය කරන්නාවූ ඒ මට ප්‍රීතිසහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, එය ඒ මට ආබාධයක් වෙයි. ආනන්දය, යම්සේ සුවපත්වූවහුට දුක් උපදින්නේ ඒතාක් ආබාධය පිණිස පවතින්නේද, එසේම ඒ මට ප්‍රීතිසහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, ඒ මට එය ආබාධයෙක් වෙයි. ආනන්දය, ඒ මට මෙබඳු සිතක් විය. 'මම සැපය ප්‍රහාණය කිරීමෙන් චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙක' කියායි.

14. "ආනන්දය මේ ශාන්තයයි දක්නාවූ ඒ මාගේ සිත අදුක්ඛ මසුඛයෙහි (දුක් සැප නැත්තෙහි) නො බසියි, නො පහදියි, නො සිටියි, නො මිදෙයි කියායි. ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මට මෙබඳු සිතක් විය. 'යමක් කරණකොට මාගේ සිත අදුක්ඛමසුඛයෙහි බැස නොගනීද, නො පහදීද නො සිටියිද, නො මිදෙයිද ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍යය කවරේද?" ආනන්දය එය ශාන්තයයි දක්නාවූ ඒ මට මෙබඳු සිතක් විය. 'උපෙක්ෂා සැපයෙහි මා විසින් ආදීනවය (දොෂය) නොදක්නා ලද්දේය. එය මා විසින් බහුල වශයෙන් නොකරන ලද්දේය. අදුක්ඛමසුඛයෙහි ආනිසංසයට නො පැමිණෙන ලද්දේය. එය මා විසින් සේවනය නොකරන ලද්දේය. එහෙයින් මාගේ සිත අදුක්ඛමසුඛයෙහි බැසනොගනියි. නොපහදියි, නොසිටියි, නොමිදෙයි' කියායි.

15. "ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මට මෙබඳු සිතක් විය. ඉදින් වනාහි මම උපෙක්ෂා සැපයෙහි ආදීනවය දැක එය බහුල වශයෙන් කරන්නෙම්ද අදුක්ඛම සුඛයෙහි ආනිසංසයට පැමිණ එය සේවනය කරන්නෙම්ද යම් හෙයකින් මාගේ සිත අදුක්ඛමසුඛයෙහි බසින්නේද පහදින්නේද, සිටින්නේද, මිදෙන්නේද මේ කාරණය වනාහි විද්‍යමාන වෙයි.' ආනන්දය, ඒ මම පසුකාලයක උපෙක්ෂා සැපයෙහි ආදීනවය දැක එය බහුල වශයෙන් කෙළෙමි. අදුක්ඛමසුඛයෙහි ආදීනවයට පැමිණ එය සේවනය කෙළෙමි. ආනන්දය, මෙය

ශාන්තයයි දක්නාවූ ඒ මගේ සිත අදුක්ඛම සුඛයෙහි බැස සිටියි, පහදියි. සිටියි, මිදෙයි ආනන්දය, ඒ මම පසුකාලයක සැපය ප්‍රහාණ කිරීමෙන් (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරම්ද, ආනන්දය, මේ විහරණයෙන් යුතුව වාසය කරන්නාවූ ඒ මට උපෙක්ෂාසුඛ සහගත සංඥා මනසිකාරයෝ පවතිත්. ඒ මට එය ආබාධයෙක් වෙයි. ආනන්දය යම්සේ සුව ඇත්තාහුට දුකක් උපන්නේද ඒ තාක් ආබාධය පිණිස පවතීද එසේම ඒ මාගේ උපෙක්ෂා සහගත සංඥාමනසිකාරයෝ පවතිත්ද මට එය ආබාධයක් වේ.

16. "ආනන්දය, ඒ මට මෙබඳු සිතක්විය. මම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මවා, ප්‍රතිඝ සංඥාවන් දුරුකිරීමෙන් නානාත්ම සංඥාවන් මෙනෙහි නොකිරීමෙන්, ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙක' කියායි. ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මාගේ සිත ආකාසානඤ්චායතනයෙහි බැස නොගනියි. නොපහදියි නොසිටියි. (කෙලෙසුන් ගෙන්) නොමිදෙයි.

17. "ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒමට මෙබඳු සිතක් විය. 'යමක් කරණකොට මාගේ සිත ආකාසානඤ්චායතනයෙහි බැසනොගනීද, නො පහදීද, නොසිටියිද, නොමිදෙයිද ඊට හෙතු කවරේද? ඊට ප්‍රත්‍යය කවරේද?' ආනන්දය මෙය ශාන්තයයි දක්නාවූ ඒ මට මෙබඳු සිතක්විය. 'මා විසින් රූපයන්හි ආදීනව නොදක්නා ලද්දේද, එය මා විසින් බහුල වශයෙන් නො කරනලද්දේද, ආකාසානඤ්චායතනයෙහි ආනිසංසයට නො පැමිණියේද එය මා විසින් ආසේවනය නොකරන ලද්දේද, එහෙයින් මාගේ සිත ආකාසනඤ්චායතනයෙහි නොබසී, නොපහදී, නොසිටියි නොමිදේ කියායි.

18. "ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මට මෙබඳු සිතක්විය. 'ඉදින් වනාහි මම රූපයන්හි ආදීනව දැක එය බහුල වශයෙන් කරන්නෙම්ද ආකාසානඤ්චායතනයෙහි ආනිසංසයට

පැමිණ එය සේවනය කරන්නෙම්ද, යම් හෙයකින් ආකාසානඤ්චායතනයෙහි මාගේ සිත බැසගන්නේද, පහදින්නේද, සිටින්නේද, මිදෙන්නේද, මේ කාරණය වනාහි විද්‍යමාන වෙයි' ආනන්දය, ඒ මම පසුකාලයක රූපයන්හි ආදීනවය දැක එය බහුලව කෙළෙමි. ආකාසානඤ්චායතනයෙහි ආනිසංසයට පැමිණ එය සේවනය කෙළෙමි.

**19.** "ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මාගේ සිත ආකාසානඤ්චායතනයෙහි බැසගනියි, පහදියි සිටියි, මිදේ ආනන්දය, ඒ මම පසුකාලයක සර්වප්‍රකාරයෙන් රූප සංඥාවන්ගේ ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන් දුරුකිරීමෙන් නානාත්ම සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරමි. ආනන්දය, මේ විහරණයෙන් යුතුව වාසය කරන්නාවූ ඒ මට රූපසහගත සංඥාමනසිකාරයෝ පවතිත්ද, ඒ මට එය ආබාධයෙක් වෙයි. ආනන්දය යම්සේ සුවපත් වූවහුට දුකක් උපදින්නේ ආබාධය ඇතිතාක් පවත්නේද එසේම ඒ මාගේ රූප සංඥා මනසිකාරයෝ පවතිත්ද, ඒ මට එය ආබාධයක් වෙයි. ආනන්දය, ඒ මට මෙබඳු සිතක් විය. 'මම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම විඤ්ඤාණය අනන්ත යයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙක' කියායි.

**20.** "ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ මාගේ සිත විඤ්ඤාණඤ්චායතනයෙහි බැස නොගනියි, නොපහදියි. නොමසිටියි, නොමිදෙයි, ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මට මෙබඳු සිතක් විය. 'යම්හෙයකින් මාගේ සිත විඤ්ඤාණඤ්චායතනයෙහි බැසනොගනීද, නොපහදියිද, නොසිටියිද, නොමිදෙයිද, ඊට හේතු කවරේද, ඊට ප්‍රත්‍යය කවරේද? ආනන්දය, ඒ මට මෙබඳු සිතක් විය. 'මා විසින් ආකාසානඤ්චායතනයෙහි ආදීනව නොදක්නාලද්දේද එය මා විසින් බහුල වශයෙන් නොකරනලද්දේද, විඤ්ඤාණඤ්චායතනයෙහි ආනිසංස නොලබන ලද්දේද,

එහෙයින් මෙය ශාන්තයයි බලන්නාවූ මාගේ සිත විඤ්ඤාණඤ්චායතනයෙහි නොම බැසගනී, නොම පහදියි, නොම සිටියි, නොම මිදෙයි කියායි. ආනන්දය, ඒ මට මෙබඳු සිතක් විය. 'ඉදින් වනාහි මම ආකාසානඤ්චායතනයෙහි ආදීනවය දැක එය බහුලව කරන්නෙම්ද, විඤ්ඤාණඤ්චායතනයෙහි ආනිසංසයට පැමිණ එය ආසේවනය කරන්නෙම්ද, යම්හෙයකින් මෙය ශාන්තයයි දක්නාවූ මාගේ සිත විඤ්ඤාණඤ්චායතනයෙහි බැසගන්නේද පහදින්නේද, මොනවට පිහිටා සිටින්නේද, මිදෙන්නේද මේ කාරණය වනාහි විද්‍යමාන වෙයි.

**21.** "ආනන්දය, ඒ මම පසුකාලයක සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම විඤ්ඤාණය අනන්තය"යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කෙරෙම්ද ආනන්දය, මේ විහරණයෙන් යුතුව වාසය කරන්නාවූ ඒ මට ආකාසානඤ්චායතන සංඥා මනසිකාරයෝ පවතිත්. ඒ මට එය ආබාධයක් වෙයි. ආනන්දය, යම්සේ සුවපත්වූවහුට දුකක් උපදින්නේ ආබාධය ඇතිතාක් පවතින්නේද එසේම ඒ මට ආකාසානඤ්චායතන සංඥා මනසිකාරයෝ පවතිත්ද එය මට ආබාධයෙක් වෙයි. ආනන්දය, ඒ මට මෙබඳු සිතක් වෙයි. "සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම කිසිවක් නැත්තේයයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරන්නෙම් යයි' කියායි. ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මාගේ සිත ආකිඤ්චඤ්ඤායතනයෙහි නොම බැසගනියි, නොම පහදියි නොම පිහිටා සිටියි. නොම මිදෙයි. ආනන්දය, ඒ මට මෙවැනි සිතක්විය. 'මේ ශාන්තයයි දකින්නාවූ මාගේ සිත යම්හෙයකින් ආකිඤ්චඤ්චායතනයෙහි බැසනොගනීද, නොපහදීද, නොසිටීද, නොමිදෙයිද ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍යය කවරේද?' ආනන්දය, ඒ මට මෙබඳු සිතක් විය. 'මා විසින් විඤ්ඤාණඤ්චායතනයෙහි ආදීනවය නොදක්නාලද්දේද, එයද මා විසින් බහුල වශයෙන් නොකරන ලද්දේද, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආනිසංසය නොලබන ලද්දේද, මා විසින් එය සේවනය නොකරන ලද්දේද, එහෙයින් මෙය

පටුන



ශාන්තයයි දක්නාවූ මාගේ සිත ආකිඤ්චඤ්ඤායතනයෙහි බැසනොගනියි, නොපහදියි, නොසිටියි, නොමිදෙයි' කියායි.

22. "ආනන්දය, ඒ මට මෙබඳු සිතක් විය. 'ඉදින් වනාහි මම විඤ්ඤාණඤ්චායතනයෙහි ආදීනවය දැක එය බහුලවශයෙන් කරන්නෙම්ද, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආනිසංසයට පැමිණ එය ආසේවනය කරන්නෙම්ද, යම්හෙයකින් මෙය ශාන්තයයි දක්නාවූ මාගේ සිත ආකිඤ්චඤ්ඤායතනයෙහි බැසගන්නේද, පහදින්නේද, සිටින්නේද, මිදෙන්නේද මේ කාරණය වනාහි විද්‍යමානවෙයි.' ආනන්දය ඒ මම පසු කාලයක විඤ්ඤාණඤ්චායතනයෙහි ආදීනවය දැක එය බහුලව කෙළෙමි. ආකිඤ්චඤ්ඤායතනයෙහි ආනිසංසයට පැමිණ එය සේවනය කෙළෙමි ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මාගේ සිත ආකිඤ්චඤ්ඤායතනයෙහි බැසගනියි, පහදියි, සිටියි. මිදෙයි කියායි ආනන්දය, ඒ මම පසුකාලයක සර්ව ප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැත්තේයයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසෙම්ද ආනන්දය, මේ විහරණයෙන් යුතුව වාසය කරන්නාවූ ඒ මට විඤ්ඤාණඤ්චායතන සහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, ඒ මට එය ආබාධයක් වෙයි. ආනන්දය, යම්සේ සුවපත්වූවහුට ආබාධය ඇතිතාක් දුක් උපදින්නේද, එසේම ඒ මට විඤ්ඤාණඤ්චායතන සහගත සංඥාමනසිකාරයෝ පවතිත්ද ඒ මට එය ආබාධයෙක් වෙයි.

23. "ආනන්දය, ඒ මට මෙබඳු සිතක්විය. මම සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරන්නෙමි කියායි. ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මාගේ සිත නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි බැසනොගනියි. නොපහදියි නො සිටියි, නො මිදෙයි කියායි. ආනන්දය ඒ මට මෙබඳු සිතක් විය. 'මෙය ශාන්තයයි දක්නාවූ මාගේ සිත යමක් කරණකොටගෙන නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට නොබසීද, නොපහදීද නොසිටීද නොමිදෙයිද ඊට හේතු කවරේද,

ඊට ප්‍රත්‍යය කවරේද? කියායි. ආනන්දය, ඒ මට මෙබඳු සිතක්විය. 'මා විසින් ආකිඤ්චඤ්ඤායතනයෙහි ආදීනවය නොදක්නා ලද්දේද, මා විසින් එය බහුලවශයෙන් නොකරනලද්දේද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි ආනිසංසය නොලබන ලද්දේද, මා විසින් එය නොසෙවුනා ලද්දේවේද, එහෙයින් මෙය ශාන්තයයි දක්නාවූ මාගේ සිත නෙවසඤ්ඤානා - සඤ්ඤායතනයෙහි නොබසීද, නොපහදීද, නොසිටීද, නොමිදේද, ආනන්දය ඒ මට මෙබඳු සිතක් විය. මම 'ඉදින් වනාහි ආකිඤ්චඤ්ඤායතනයෙහි ආදීනවය දැක එය බහුල වශයෙන් කරන්නෙම්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි ආනිසංසයට පැමිණ එය සේවනය කරන්නෙම්ද යම්හෙයකින් මෙය ශාන්තයයි දක්නාවූ මාගේ සිත නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයෙහි බැසගන්නේද, පහදින්නේද, සිටින්නේද මිදෙන්නේද මේ කාරණය වනාහි විද්‍යමාන වෙයි.

24. "ආනන්දය, ඒ මම පසු කාලයක ආකිඤ්චඤ්ඤායතනයෙහි ආදීනවය දැක එය බහුල වශයෙන් කෙළෙමි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි ආනිසංසයට පැමිණ එය සේවනය කෙළෙමි. ආනන්දය, එය ශාන්තයයි දක්නාවූ ඒ මාගේ සිත නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි බැස ගනියි, පහදියි, සිටියි, මිදෙයි. ආනන්දය, ඒ මම වනාහි පසුකාලයක සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වසම්ද, ආනන්දය, මේ විහරණයෙන් යුතුව වාසය කරන්නාවූ ඒ මට ආකිඤ්චඤ්ඤායතන සහගතසංඥා මනසිකාරයෝ පවතිත්ද, ඒ මට එය ආබාධයෙක් වෙයි. යම්සේ ආනන්දය සුවපත්වූවහුට යම්තාක් ආබාධය පිණිස පවතීද, ඒතාක් දුක උපදින්නේය. එසේ මට ආකිඤ්චඤ්ඤායතන සහගත සංඥා මනසිකාරයෝ පවතිත්ද, ඒ මට එය ආබාධයෙක් වෙයි.

25. "ආනන්දය, ඒ මට මෙබඳු සිතක් විය. 'මම සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤා වෙදයිත නිරොධයට පැමිණ වාසය කරන්නෙම් නම්

ඉතා යෙහෙකය' කියායි. ආනන්දය, මෙය ශාන්තයයි දක්නාවූ ඒ මගේ සිත සඤ්ඤාවෙදයිත නිරොධයෙහි බැස නොගනීද, නොපහදීද, නොසිටියිද නොමිදෙයිද, ආනන්දය, ඒ මට මෙබඳු සිතක් විය. 'නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි මා විසින් ආදීනවය නොදක්නා ලද්දේද, එයද මා විසින් බහුලව නොකරන ලද්දේද, සඤ්ඤාවෙදයිත නිරොධයෙහි ආනිසංස නොලබන ලද්දේද, එය මා විසින් නොසෙවුනා ලද්දේද එහෙයින් මෙය ශාන්තයයි' දක්නාවූ මාගේ සිත සඤ්ඤාවෙදයිත නිරොධයෙහි බැස නොගනීද, නොපහදියිද, නොසිටියිද, නොමිදෙයිද, ආනන්දය, ඒ මට මෙබඳු සිතක් විය. 'ඉදින් වනාහි මම නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයෙහි ආදීනවය දැක එය බහුල වශයෙන් කරන්නෙම් නම් සඤ්ඤාවෙදයිත නිරොධයෙහි ආනිසංසයට පැමිණ එය ආසේවනය කරන්නෙම් නම් යම් හෙයකින් මෙය ශාන්තයයි' දක්නාවූ මාගේ සිත සඤ්ඤාවෙදයිත නිරොධයෙහි බැස නොගන්නේ නම්. නොපහදින්නේ නම්, නොසිටින්නේ නම් නොමිදෙන්නේ නම්, මේකාරණය වනාහි විද්‍යමානවෙයි. ආනන්දය, ඒ මට පසුකාලයක සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වාසය කෙරෙම්ද මාගේ ප්‍රඥාවෙන් දැක ආශ්‍රවයෝ ක්ෂයවීමට ගියාහුය. ආනන්දය, මම යම්තාක් මේ නව අනුලොම විහාර සමාපත්තීන්ට මෙසේ අනුලොම පටිලොම වශයෙන් නොසමවැදුනෙම්ද, නොනැගිටියෙම්ද ආනන්දය, මම ඒතාක් දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ සත්ව ලෝකයෙහිද, මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ ප්‍රජාව ඇති කල්හි නිරුත්තරවූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙම්යයි නොම දත්තෙමි.

**26.** "ආනන්දය, යම් හෙයකින් මම මේ නව අනුපුබ්බවිහාර සමාපත්තීන්ට මෙසේ අනුලොම පටිලොම (පිළිවෙලින් පැමිණෙන) වශයෙන් සමවැදුනෙම්ද, නැගිටියෙම්ද, ඉක්බිති ආනන්දය, මම දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ ලෝකයෙහිද මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ ප්‍රජාව ඇති කල්හි නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබෝධ

කෙළෙම්යයි දැනගත්තෙමි. මට දර්ශන ඥානයද පහළ විය. මාගේ චිත්ත විමුක්තිය වෙනස් නොවේ. මේ (මාගේ) අන්තිම ජාතිය (උත්පත්තිය) වූවාය. දැන් පුනර්භවයක් (නැවත ඉපදීමක්) නැත්තේය.”

(4. මහා වර්ගය නිමි.)

---

## 5. පඤ්චාල වර්ගය

**42. පඤ්චාල චණ්ඩ සූත්‍රය:-** 1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ කොසඹෑනුවර ඝොෂිතාරාමයෙහි වැඩවාසය කරනසේක. ඉක්බිති ආයුෂ්මත් උදායී ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවියයුතු කථාද සිහිකටයුතු කථාද කොට නිමවා එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ ආයුෂ්මත් උදායී තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මේ කාරණය කීයේය.

2. “ඇවැත්නි, පඤ්චාලචණ්ඩ දිව්‍යපුත්‍රයා විසින් මේ කාරණය කියනලදී.

‘යමෙක් ධ්‍යානය අවබොධ කළසේක්ද, මහත් ප්‍රඥා ඇත්තාවූ පතිලීන නිසගවූ (උත්තමපල සමවත් ඇති) ඒ සර්වඥ මුනිතෙමේ ඒකාන්තයෙන් ධ්‍යාන සම්බාධය ඇති කල්හි ඔකාසාධිගමය වින්දේය’ යනුයි.

“ඇවැත්නි, සම්බාධක කවරේද? භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බාධයෙහි ඔකාසාධිගමය කවරේදැයි වදාරන ලද්දේද?”

3. “ඇවැත්නි, මේ පඤ්චකාම ගුණයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බාධයයි වදාරණ ලද්දේය. කවරපසක්ද? (ii) ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වරූපවූ කාමන්ගෙන් යුක්තවූ ඇළුම් කටයුතුවූ (iii) ඇසින් දතයුතු වූ රූපයෝය. (මෙහි 3

(ii) යෙදිය යුතුයි.) කනින් දැනගතයුතුවූ ශබ්දයෝය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) නහයෙන් දතයුතුවූ ගන්ධයෝය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) දිවෙන් දතයුතුවූ රසයෝය (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) කයෙන් දතයුතුවූ ස්පර්ශයෝය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ පඤ්චකාම ගුණික සම්බාධයෝ වදාරණලද්දාහුය.

4. "ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුවක්තෙම කාමයන්ගෙන් වෙන්ව (මෙහි මහාවර්ගයේ 32 සූත්‍රයේ 2 ඡේදය යොදාගත යුතුයි.) ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේද (ii) ඇවැත්නි, මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බාධයෙහි ඔකාසාධිගමය වදාරණ ලද්දේය. එහි ක්‍රමයකින්ද සම්බාධයක් ඇත එහි සම්බාධය කුමක්ද? (ii) එහි යම් ප්‍රීතියක් නිරුද්ධ නොවේද, මෙහි මේ සම්බාධය වෙයි.

5. 'ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම විතර්ක විචාරයන් සංසිඳවීමෙන් ද්විතීය ධ්‍යානයට පැමිණ වෙසේද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) එහි යම්බඳුවූම ප්‍රීතියක් නිරුද්ධ නොවේද මෙහි මේ සම්බාධය වෙයි.

6. 'ඇවැත්නි නැවතද අනිකක් කියමි. මහණතෙම ප්‍රීතියෙහි නො ඇලීමෙන් තෘතීය ධ්‍යානයට පැමිණ වෙසේද (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) එහි යම්බඳුවූ ප්‍රීතියක් නිරුද්ධ නොවේද, එහි මේ සම්බාධයයි.

7. 'ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සැපයේ ප්‍රහාණයෙන් (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) චතුර්ථ ධ්‍යානයට පැමිණ වැඩවාසය කෙරේද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) එය යම්බඳුවූ සේම නිරුද්ධ නොවේද, මෙහි මේ සම්බාධයයි.

8. 'ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මවා ප්‍රතිඝසංඥාවන් දුරු කිරීමෙන් නානාත්ම සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසේද (මෙහි

4 (ii) යෙදිය යුතුයි.) මෙහි යම්බඳුවූම විඤ්ඤාණඤ්චායතන සංඥාව නිරුද්ධ නොවේද, මෙහි මේ සම්බාධය වේ.

9. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤානඤ්චායතනයට පැමිණ වෙසේද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි) එහි යම්බඳුවූම විඤ්ඤාණඤ්චායතන සංඥාව නිරුද්ධ නොවේද, එහි මේ සම්බාධය වෙයි.

10. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. සර්වප්‍රකාරයෙන් විඤ්ඤානඤ්චායතනය ඉක්මවා කිසිවක් නැත්තේයයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසේද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) එහි ආකිඤ්චඤ්ඤායතන සංඥාවෝ නිරුද්ධ නොවෙත්ද එහි යම් මේ සම්බාධය වෙයි.

11. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසේද (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) එහි යම්බඳුවූම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෝ නිරුද්ධ නොවෙත්ද, මෙහි මේ සම්බාධය වේ.

12. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරෝධයට පැමිණ වෙසේද ඔහුගේ ප්‍රඥාවෙන් දැක ආශ්‍රවයෝ ක්ෂයකරණ ලද්දාහු වෙත්ද, ඇවැත්නි, මෙපමණකින් වනාහි නිෂ්පරියායෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බාධයෙහි ඔකාසාධිගමය වදාරණ ලද්දේයයි' වදාළසේක.

43. **කායසක්ඛි සූත්‍රයඃ-** 1. 'ඇවැත්නි, කායසක්ඛිය, කායසක්ඛියයි කියනු ලැබේ. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් කොපමණකින් වනාහි කායසක්ඛියයි කියනු ලැබේද?"

2. (i) 'ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්වම (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි) ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේද (ii) යම් යම්

ආකාරයකින් ඒ ආයතනයවේද, ඒ ඒ ආකාරයෙන් කයින් ස්පර්ශ කොට වෙසේද (ii) ඇවැත්නි, මෙපමණකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් නිෂ්පරියායෙන් කායසක්ඛියයි වදාරණ ලද්දේය.

3. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳවීමෙන් (මෙහි 4 වර්ගයේ 32 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) චතුර්ථ ධ්‍යානයට පැමිණ වෙසේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

4. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්ම ප්‍රතිඝසංඥාවන් දුරු කිරීමෙන් නානාත්ම සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසේද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) සර්වප්‍රකාරයෙන් විඤ්ඤානඤ්චායතනය ඉක්මවා 'කිසිවක් නැත්තේය'යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි. යම් යම් ආකාරයකින් ඒ (ධ්‍යාන නම්) ආයතනය වේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

5. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වෙසේද ඔහුගේ ප්‍රඥාවෙන් දැක ආශ්‍රවයෝ ක්ෂය කරණලද්දාහුද වෙත්ද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**44. පඤ්ඤා විමුත්ත සූත්‍රය**:- 1. "ඇවැත්නි, පඤ්ඤා විමුත්තය පඤ්ඤා විමුත්තයයි කියනු ලබේ. කොපමණකින් වනාහි පඤ්ඤා විමුත්තයයි කියනු ලැබේද?

2. (මෙහි මේ වර්ගයේ 43 සූත්‍රයේ 2 (i) යෙදිය යුතුයි.) (ii) ප්‍රඥාවෙන් එය දැනගනීද, ඇවැත්නි, මෙපමණකින් වනාහි

භාග්‍යවතුන් වහන්සේ විසින් පරියායෙන් පඤ්ඤා විමුත්තයයි වදාරණ ලද්දේය.

3. (4 වර්ගයේ 32 සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.) චතුර්ථ ධ්‍යානයට පැමිණ වෙසේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

4. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැමිණ වෙසේද. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

5. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වෙසේද, ඔහුගේ ප්‍රඥාවෙන් දැක ආශ්‍රවයෝ ක්ෂයකරණලද්දාහු වෙත්ද (ii) ප්‍රඥාවෙන් දැනගනීද, ඇවැත්නි, මෙපමණකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් (iii) නිෂ්පරියායයෙන් පඤ්ඤාවිමුත්තයයි වදාරණ ලද්දේයයි වදාළසේක."

**45. උභතො විමුක්ත සූත්‍රයː-** 1. "ඇවැත්නි, උභතො භාගවිමුත්තය, උභතොභාග විමුත්තයයි කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් උභතොභාග විමුත්තයයි කියනු ලැබේද?"

2. (මෙහි මේ වර්ගයේ 43 සූත්‍රයේ 2 (i) යෙදිය යුතුයි.) (ii) එය ප්‍රඥාවෙන් දැනගනීද ඇවැත්නි, මෙපමණකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් පරියායයෙන් උභතොභාග විමුත්තයයි වදාරණ ලද්දේය.

3. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි. මහණතෙම සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැමිණ වෙසේද, යම් යම් ආකාරයකින් ඒ ආයතනය වේද, ඒ ඒ ආකාරයෙන් එය කයින් ස්පර්ශ කොට වෙසේද, (මෙහි මේ සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.)

4. "ඇවැත්නි, නැවතද අනිකක් කියමි මහණතෙම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත

නිරොධයට පැමිණ වෙසේද (මෙහි මේ සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) යම් යම් ආකාරයකින් ඒ ආයතනය වේද, ඒ ඒ ආකාරයෙන් එය කයින් ස්පර්ශකොට (මෙහි මේ සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) (මේ වර්ගයේ 46 - 51 සූත්‍ර මේ වර්ගයේ 43 සූත්‍රය මෙන් යොදාගත යුතුයි. "කායසක්ඛිය" වෙනුවට "සාන්දෘෂ්ටිය ධර්මය"යනාදී වචන යොදාගත යුතුයි.)

**46. සන්දිට්ඨික ධම්ම සූත්‍රයː-** "ඇවැත්නි, සාන්දෘෂ්ටික ධර්මය, සාන්දෘෂ්ටික ධර්මයයි කියනු ලැබේ."

**47. සන්දිට්ඨික නිබ්බාණ සූත්‍රයː-** "ඇවැත්නි, සාන්දෘෂ්ටික නිර්වාණය සන්දෘෂ්ටික නිර්වාණයයි කියනු ලැබේ."

**48. නිබ්බාණපුච්ඡා සූත්‍රයː-** "ඇවැත්නි, නිර්වාණය නිර්වාණයයි කියනු ලැබේ."

**49. පරිනිබ්බාණ සූත්‍රයː-** "ඇවැත්නි, පරිනිර්වාණය පරිනිර්වාණයයි කියනු ලැබේ."

**50. තදංග නිබ්බාන සූත්‍රයː-** "ඇවැත්නි, තදංග නිබ්බාණය තදංග නිබ්බාණයයි (ඒ ඒ අංගයෙන් නිර්වාණ වේයයි ඒ ඒ අංගයෙන් නිර්වාණය වේයයි) කියනු ලැබේ."

**51. දිට්ඨධම්ම නිබ්බාණ සූත්‍රයː-** "ඇවැත්නි, දිට්ඨධම්ම නිබ්බාණයයයි කියනු ලැබේ."

**(5. පඤ්චාල වර්ගය නිමි.)**

---

## දෙවෙනි පණ්ණාසකය.

## 6. ඛෙම වර්ගය

**1. ඛෙම සූත්‍රයː-** "ඇවැත්නි, ක්ෂෙමය ක්ෂෙමයයි කියනු ලැබේ. (මේ වර්ගයේ සූත්‍ර 1 - 10 ප්‍රථම පණ්ණාසකයේ 43 සූත්‍රය මෙන් සකස්කර ගත යුතුයි. "කායසක්ඛිය" වෙනුවට "ක්ෂෙමය" යනාදී යෙදීමෙන් ඒ ඒ සූත්‍ර සකස්කර ගතයුතුයි.)

**2. ඛෙමප්පත්ත සූත්‍රයː-** "ඇවැත්නි, ක්ෂෙමප්‍රාප්තය ක්ෂෙමප්‍රාප්තයයි කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. **අමත සූත්‍රය**:- "ඇවැත්නි, අමෘතය, අමෘතයයි කියනු ලැබේ.

4. **අමතප්පත්ත සූත්‍රය**:- "ඇවැත්නි, අමෘතප්‍රාප්තය, අමෘතප්‍රාප්තයයි කියනු ලැබේ.

5. **අභය සූත්‍රය**:- "ඇවැත්නි, අභය, අභයයි කියනු ලැබේ.

6. **අභයප්පත්ත සූත්‍රය**:- "ඇවැත්නි, අභයප්‍රාප්තය අභයප්‍රාප්තයයි කියනු ලැබේ.

7. **පස්සද්ධි සූත්‍රය**:- "ඇවැත්නි, පස්සද්ධිය, පස්සද්ධියයි කියනු ලැබේ.

8. **අනුපුබ්බ පස්සද්ධි සූත්‍රය**:- "ඇවැත්නි අනුපස්සද්ධිය අනුපස්සද්ධියයි කියනු ලැබේ.

9. **නිරොධ සූත්‍රය**:- "ඇවැත්නි, නිරොධය, නිරොධයයි කියනු ලැබේ.

10. **අනුපුබ්බ නිරොධ සූත්‍රය**:- "ඇවැත්නි, අනුපුබ්බ නිරොධය අනුපුබ්බ නිරොධයයි කියනු ලැබේ.

11. **නව පහාතබ්බ සූත්‍රය**:- 1. "මහණෙනි, ධර්ම නවයක් හැර නොදමා රහත් බව ප්‍රත්‍යක්ෂ කරන්ට නුසුදුසුය.

2. "කවර නවයක්ද යත්? රාගය, දොසය, මොහය, ක්‍රොධය, බද්ධවෛරය ගුණමකුකම, අනුන්ගේ දොස්සෙවීම, ඊර්ෂ්‍යාවය, මසුරුකම යනුයි. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, ධර්ම නවයක් හැරදමා රහත් බව ප්‍රත්‍යක්ෂ කරන්ට සුදුසුය. (මෙහි මේ සූත්‍රයේ 2, 3 ඡෙද යෙදිය යුතුයි.)

**(6. ඛෙම වර්ගය නිමි.)**

---

## 7. සතිපට්ඨාන වර්ගය

12. **සික්ඛා දුබ්බල්‍ය සූත්‍රය**:- 1. "මහණෙනි, මේ පසක් ශික්ෂා දුර්බල්‍යයෝය (ශික්ෂාවගේ දුර්වලභාව කිරීම්හුය.)

2. "කවර පසෙක්දයත්? ප්‍රාණාතිපාතය, අදින්නාදානය, කාමෙසුමිච්ඡාචාරය, සුරාමෙරය මජ්ජපමාදට්ඨානය යනුයි. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, මේ පඤ්චශික්ෂා දුර්බල්‍යයන්ගේ හැර දැමීම පිණිස සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහ.

4. "කවර සතරක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම කෙළෙස් තවනවීර්ය ඇත්තේ, සම්‍යක් ප්‍රඥා ඇත්තේ සිහි ඇත්තේ ශරීරයෙහි දැඩි ආසාව හා නොසතුටු බව දුරුකොට ශරීරයෙහි ශරීරය අනුව බලන සුළුවූයේ වෙසේද වෙදනාවන්හි වෙදනාව අනුව බලන සුළුවූයේ වෙසේද සිතෙහි සිත් අනුව බලන සුළුවූයේ වෙසේද, කෙලෙස් තවන වීර්ය ඇත්තේ සම්‍යක් ප්‍රඥා ඇත්තේ සිහි ඇත්තේ වෙදනා ලොකයෙහි දැඩි ආසාව හා නොසතුටු බව සංසිඳුවා වෙදනාවන්හි වෙදනාව අනුව බලන සුළුවූයේ වෙසේද මහණෙනි, (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

13. **නීවරණ සතිපට්ඨාන සූත්‍රයː-** 1. මහණෙනි, මේ නීවරණ පසක් වෙත්.

2. "කවර පසක්දයත්? (ii) ඉෂ්ටවූ කාන්තවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වරූපවූ කාමයන්ගෙන් යුක්තවූ ඇළුම් කටයුතුවූ (iii) ඇසින් දැන ගතයුතුවූ රූපයෝය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) කනින් දැනගතයුතුවූ ශබ්දයෝය (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) නහයෙන් දැනගතයුතුවූ ගන්ධයෝය (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) දිවෙන් දැනගතයුතුවූ රසයෝය (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) කයින් දැනගතයුතුවූ ස්පර්ශයෝය මහණෙනි, මේ පඤ්චකාමගුණයෝය.

3. "මහණෙනි, මේ පස්කම් ගුණයන්ගේ හැරදැමීම පිණිස මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහුය. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි.

14. **උපදානක්ඛන්ධ සතිපට්ඨාන සූත්‍රයː-** 1. "මහණෙනි, මේ උපාදානස්කන්ධයෝ පසක් වෙත්.

2. "කවර පසක්දයත්? රූපුපාදානස්කන්ධය, වෙදනූපාදානස්කන්ධය, සඤ්ඤූපාදානස්කන්ධය,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සංඛාරූපාදානස්කන්ධය, විඤ්ඤාණූපාදානස්කන්ධය යන පසයි. මහණෙනි, මේ පඤ්චොපාදානස්කන්ධයෝය.

3. "මහණෙනි, මේ පඤ්චොපාදානස්කන්ධයන්ගේ හැර දැමීම පිණිස මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහුය. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

15. **ඕරම්භාගිය සතිපට්ඨාන සූත්‍රය**:- 1. "මහණෙනි, මේ ඔරම්භාගිය පඤ්ඤෙදාජන පසක් වෙත්.

2. "කවර පසක්දයත්? විචිකිච්ඡාවය, සක්කාය දිට්ඨිය, සීලබ්බතපරාමාසය, කාමච්ඡන්දය, ව්‍යාපාදය කියායි. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, මේ පඤ්චොරම්භාගිය සංයොජනයන්ගේ හැරදැමීම පිණිස මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහුය (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

16. **පඤ්චගති සූත්‍රය**:- 1. "මහණෙනි, මේ ගති පහක් වෙත්.

2. "කවර පසක්දයත්? නිරයය, තිරිසන්යෝනිය, ප්‍රෙත විෂයය, මනුෂ්‍යයෝය, දෙවියෝය කියායි. මහණෙනි, මේ ගති පස වෙති.

3. "මහණෙනි, මේ පඤ්චගතීන්ගේ හැර දැමීම පිණිස මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහුය. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

17. **මච්ඡරිය සතිපට්ඨාන සූත්‍රය**:- 1. "මහණෙනි, මේ මච්ඡරිය පසෙකි.

2. "කවර පසක්ද යත්? ආවාස මච්ඡරිය, කුල මච්ඡරිය, ලාභ මච්ඡරිය, වණ්ණ මච්ඡරිය, ධම්ම මච්ඡරිය කියායි. මහණෙනි, මේ පස මච්ඡරියෝ වෙති.

"මහණෙනි, මේ පඤ්චමච්ඡරියන්ගේ හැරදැමීම පිණිස මේ සතර සතිපට්ඨානයෝ වැඩියයුත්තාහුය. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

18. **උද්ධම්භාගීය සතිපට්ඨාන සූත්‍රය**:- 1. "මහණෙනි, මේ උද්ධම්භාගීය සඤ්ඤෙදාජන පසක් වෙත්.

2. "කවර පසක්ද යත්? රූප රාගය, අරූප රාගය, මානය, උද්ධච්චය, අවිජ්ජාය කියායි. මහණෙනි, මේ උද්ධම්භාගිය සඤ්ඤෝජන පස වෙති.

3. "මහණෙනි, මේ පඤ්ච උද්ධම්භාගිය සඤ්ඤෝජනයන්ගේ හැර දැමීම පිණිස මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහුය. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

**19. චෙතොඛිල සතිපට්ඨාන සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ පස චොතොඛිලයෝය.

2. "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ශාස්තෲන් වහන්සේ (ii) කෙරෙහි සැක කෙරේද, විචිකිච්ඡා කෙරේද, ස්ථිර වශයෙන් නොපිහිටා සිටීද නොපහදීද, (iii) කියායි. මහණෙනි, යම් ඒ භික්ෂුවක්තෙම ශාස්තෲන් වහන්සේ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) (iv) අධික වීර්යය පිණිසද අනුයොගය පිණිසද නිතර ක්‍රියාකිරීම පිණිසද ප්‍රධන් වීර්ය පිණිසද ඔහුගේ සිත නොනැමේද, (මෙහි 2 (iv) යෙදිය යුතුයි) යමෙකුගේ සිත නොනැමේද, මේ පළමුවෙනි චෙතොඛිලයයි.

3. "මහණෙනි, නැවතද අනිකක් කියමි. මහණතෙම ධර්මයෙහි (මෙහි 2 (ii) (iv) යෙදිය යුතුයි.) යමෙකුගේ සිත නැමේද මේ දෙවෙනි චෙතොඛිලයයි. සංඝයා කෙරෙහි (මෙහි 2 (ii), (iv) යෙදිය යුතුයි.) යමෙකුගේ සිත නැමේද, මේ තුන්වෙනි චෙතොඛිලයයි. ශික්ෂාවෙහි (2 (ii), (iv) යෙදිය යුතුයි.) යමෙකුගේ සිත නැමේද, මේ හතරවෙනි චෙතොඛිලයයි. (ii) සබ්‍රම්සරුන් කෙරෙහි කිපුනේ වෙයි. නොසතුටු සිත් ඇත්තේ වෙයි. ඇනුණු සිත් ඇත්තේ වෙයි. හටගත් කෙලෙස් ඇත්තේ වෙයි (iii) මහණෙනි, යම් භික්ෂුවක් (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) අධික උත්සාහය පිණිසද අනුයෝගය පිණිසද නිතර ක්‍රියාකිරීම පිණිසද ප්‍රධන් වීර්ය පිණිසද ඔහුගේ සිත නොනැමේද මේ පස්වෙනි චෙතොඛිලයයි. මහණෙනි, මේ පංච චෙතොඛිලයෝය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, මේ පංච චෙතොඛිලයන්ගේ හැර දැමීම පිණිස මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහුය. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

**20. විනිබන්ධ සූත්‍රය:-** 1. "මහණෙනි, චිත්තය පිළිබඳ මේ බැඳීම් පසෙකි.

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්හි පහ නොවූ රාග ඇත්තේ වෙයි. පහ නොවූ ඡන්දය ඇත්තේ වෙයි. පහ නොවූ ප්‍රේම ඇත්තේ වෙයි. පහ නොවූ (කාම) පිපාස ඇත්තේවේ. පහ නොවූ (කාම) පරිඩාහ ඇත්තේවේ. පහ නොවූ (කාම) තෘෂ්ණා ඇත්තේවේ.

3. "මහණෙනි, යම් ඒ භික්ෂුවක්තෙම කාමයන්හි පහ නොවූ රාග ඇත්තේ වේද, පහ නොවූ කාමච්ඡන්ද (කාමාසා) ඇත්තේ වේද, පහ නොවූ (කාම) ප්‍රේම ඇත්තේ නොවේද, පහ නොවූ (කාම) පිපාස ඇත්තේ නොවේද, පහ නොවූ කාම පරිඩාහ ඇත්තේ නොවේද, පහ නොවූ (කාම තෘෂ්ණා ඇත්තේ නොවේද, (iii) අධික උත්සාහය පිණිසද අනුයෝගය පිණිසද නිතර ක්‍රියා කිරීම පිණිසද ප්‍රධන් වීර්යය පිණිසද යමෙකුගේ සිත නොනැමේද, මේ පළමුවෙනි සිතේ බැඳීමයි.

4. "මහණෙනි, නැවතද අනිකක් කියමි. මහණතෙම කාමයෙහි පහ නොවූ රාග ඇත්තේ වේද, රූපයෙහි පහ නොවූ රාග ඇත්තේ වේද, ඇතිතාක් බඩ පිරෙනතුරු වළඳා සෙය්‍යසුඛයෙහි (සයන සැපයෙහි) ස්පර්ශ සැපයෙහි මිද්ධ සැපයෙහි යෙදුනේ වෙසේද, 'මම මේ සීලයෙන් හෝ මේ ව්‍රතයෙන් හෝ මේ තපසින් හෝ මේ බඹසරින් හෝ දෙවියෙක් හෝ වන්නෙමි. දෙවියන්ගෙන් එක්තරා කෙනෙක් හෝ වන්නෙමියි එක්තරා දෙව නිකායයක් ප්‍රාර්ථනාකොට බඹසර වෙසේය' කියායි.

5. "මහණෙනි, යම් ඒ මහණෙක්තෙම 'මම මේ සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බඹසරින් හෝ දෙවියෙක් හෝ වන්නෙමි. දෙවියන්ගෙන් කෙනෙක් හෝ වන්නෙමි.' එක්තරා දෙව නිකායයක් ප්‍රාර්ථනා කොට බඹසර වෙසේද, (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) ආතප්පය පිණිසද, අනුයොගය

පිණිසද, නිතර ක්‍රියා කිරීම පිණිසද, පධානය පිණිසද යමෙකුගේ සිත නොනැමේද, මේ පස්වෙනි සිතේ බැඳීමයි.

"මහණෙනි, මේ වනාහි පංච චෙතො විනිබන්ධයෝය. මහණෙනි, මේ චිත්තය සම්බන්ධ පංච විනිබන්ධයන්ගේ ප්‍රහානය පිණිස මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහ. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

(7. සතිපට්ඨාන වර්ගය නිමි.)

---

## 8. සම්මප්පධාන වර්ගය.

**21. දුබ්බල සම්මප්පධාන සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ ශික්ෂා දුර්වල පසක් වෙත්.

2. "කවර පසක්ද යත්? (මෙහි 7 වර්ගයේ 12 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ ශික්ෂා දුර්වල පසයි.

3. "මේ පංච ශික්ෂා දුර්වලයන්ගේ ප්‍රහාණය පිණිස සතර සම්‍යක් ප්‍රධානයෝ වැඩිය යුත්තාහුය. කවර සතරක්දයත්?

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නූපන්නාවූ ලාමක අකුසල ධර්මයන්ගේ නොඉපදීම පිණිස (ii) ඡන්දය උපදවයිද, ව්‍යායාම් කෙරෙයිද, වීර්ය පටන්ගනියිද, සිත ප්‍රග්‍රහණය කරයිද, මොනවට පිහිටුවයිද,

5. "උපන්නාවූ ලාමක අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

6. "නූපන් කුසල ධර්මයන්ගේ ඉපදීම පිණිස (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

7. "උපන්නාවූ කුසල ධර්මයන්ගේ ස්ථිතිය පිණිස නුමුළාව පිණිස බහුල භාවය පිණිස විපුල භාවය පිණිස භාවනාවගේ සම්පූර්ණ කිරීම පිණිස (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

8. "මහණෙනි, මේ පංච ශික්ෂා දුර්වලයන්ගේ ප්‍රහාණය පිණිස මේ සතර සම්‍යක් ප්‍රධානයෝ වැඩිය යුත්තාහුය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**22. නීවරණ සම්මප්පධාන සූත්‍රය, 23. කාමගුණ සම්මප්පධාන සූත්‍රය, 24 උපාදානක්ඛන්ධ සම්මප්පධාන සූත්‍රය, 25 ඔරම්භාගිය සම්මප්පධාන සූත්‍රය, 26 පඤ්චගති සම්මප්පධාන සූත්‍රය, 27 මච්ඡරිය සම්මප්පධාන සූත්‍රය, 28 උද්ධම්භාගිය සම්මප්පධාන සූත්‍රය, 29 චෙතොඛිල සම්මප්පධාන සූත්‍රය.**

(මේ වර්ගයේ මෙහි දැක්වූ සූත්‍ර අට 7 වර්ගයේ මේ නම්වලින් දැක්වෙන සතිපට්ඨාන සූත්‍ර මෙනි. වෙනස නම්, එහි එක එක ප්‍රහාණයට "සතර සතිපට්ඨානයෝ වැඩිය යුතුය" යන්න මේ වර්ගයේදී සතර සම්‍යක් ප්‍රධානයෝ වැඩිය යුතුය කියා වෙනස් කර ගැනීම පමණකි.)

**30. නීවරණ සම්මප්පධාන සූත්‍රය:-** 1. "මහණෙනි, මේ පසක් චිත්තයාගේ විනිබන්ධයෝය.

2. "කවර පසක්ද යත්? (මෙහි මේ පණ්ණාසකයේ 20 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ චිත්තය පිළිබඳ විනිබන්ධ පසය.

3. "මහණෙනි, මේ චිත්තය පිළිබඳ විනිබන්ධ පසේ ප්‍රහාණය පිණිස සතර සම්‍යක් ප්‍රධානයෝ වැඩිය යුත්තාහුය.

4-7. (මෙහි මේ වර්ගයේ 21 සූත්‍රයේ 4, 5, 6, 7 ඡේද යෙදිය යුතුයි.)

8. "මහණෙනි, මේ චිත්තය පිළිබඳ බැඳීම් පසේ ප්‍රහාණය පිණිස මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහුය.

8. සම්‍යක් ප්‍රධාන වර්ගය නිමි.)

---

## 9. ඉද්ධිපාද වර්ගය

31. දුබ්බල ඉද්ධිපාද සූත්‍රය:- 1. මහණෙනි, මේ ශික්ෂා දුර්වලභාවයෝ පසක්වෙත්.

2. "කවර පසක්දයත්? (මෙහි 7 වර්ගයේ 12 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි මේ පංච ශික්ෂා දුර්වලයෝය.

3. "මහණෙනි, මේ පංචශික්ෂා දුර්වලභාවයන්ගේ ප්‍රහාණය පිණිස ඍද්ධිපාද සතර වැඩිය යුත්තාහුය.

4. "කවර සතරක්දයත්? මහණෙනි; මේ ශාසනයෙහි මහණ තෙම ඡන්ද සමාධි (ii) පධාන සංඛාරසමන්නාගත ඍද්ධිපාදය වඩාද, විරිය සමාධි (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) චිත්තසමාධි (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) විමංසා සමාධි පධාන සංඛාර සමන්නාගත ඍද්ධිපාදය වඩාද මහණෙනි, මේ පංචශික්ෂා දුර්වලයන්ගේ ප්‍රහාණය පිණිස මේ සතර ඍද්ධිපාදයෝ වැඩිය යුත්තාහුය. (මේ සූත්‍රය මෙන්, නීවරණ ඉද්ධිපාද කාමගුණ ඍද්ධිපාද උපාදානක්ඛන්ධ ඉද්ධිපාද, ඕරම්භාගිය ඉද්ධිපාද, පඤ්චගති ඉද්ධිපාද, මච්ඡරිය ඉද්ධිපාද, උද්ධම්භාගිය ඉද්ධිපාද, චෙතොඛිල ඉද්ධිපාද, විනිබන්ධ ඉද්ධිපාද, යන සූත්‍ර සකස් කරගත යුතුයි.)

---

## 10. සාමඤ්ඤ වර්ගය.

41. නවසඤ්ඤා රාගාභිඤ්ඤා සූත්‍රයː- 1. මහණෙනි, රාගයාගේ අභිඥානය (විශෙෂයෙන් දැන ගැනීම) පිණිස ධර්ම නවයක් වැඩිය යුත්තාහුය.

2. "කවර නවයක්දයත්? අශුභ සංඥාවය, මරණ සංඥාවය, ආහාරයෙහි ප්‍රතික්කූල සංඥාවය, සියලු ලොකයෙහි (නොඇල්මේ) සංඥාවය, අනිත්‍ය සංඥාවය, අනිත්‍යයෙහි දුක්ඛ සංඥාවය, දුකෙහි අනාත්ම සංඥාවය, ප්‍රහාණ සංඥාවය, විරාග සංඥාවය, යන මෙයයි. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

42. නව ඣාන රාගාභිඤ්ඤා සූත්‍රයː- 1. "මහණෙනි, රාගයාගේ අභිඥානය පිණිස මේ නව ධර්මයෝ වැඩිය යුත්තාහුය.

2. "කවර නවයක්දයත්? ප්‍රථමධ්‍යානය, ද්විතීයධ්‍යානය තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය, ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය,

නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, සඤ්ඤාවෙදයිත නිරොධය යන මේ නවයයි (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

"මහණෙනි, රාගයාගේ පරිඥානය පිණිසද පරික්ෂය (ගෙවීම) පිණිසද ව්‍යය පිණිසද විරාගය පිණිසද නිරොධය පිණිසද චාගය (ඇත්හැරීම්) පිණිසද දුරුකිරීම පිණිසද මේ නවධර්මයෝ වැඩිය යුත්තාහුය. දොසයාගේද, මොහයාගේද, ක්‍රොධයාගේද, උපනාහ. (බද්ධ වෛර) යාගේද, මක්ඛයාගේද, පලාසයා අනුන් දොස් සෙවීමේද, ඊර්ෂ්‍යාවගේද, මාත්සයර්යගේද, මායාවගේද, සාඨෙය්‍යයාගේද සාරම්භයගේද, (එකට එක කිරීමේද) මානයාගේද, මදයාගේද, ප්‍රමාදයාගේද, අභිඥානය පිණිසද, පරිඥානය පිණිසද, පරික්ෂය පිණිසද ප්‍රහාණය පිණිසද, ක්ෂයය පිණිසද, ව්‍යසය පිණිසද, විරාගය පිණිසද, නිරොධය පිණිසද, චාගය පිණිසද පටිනිස්සග්ගය පිණිසද, මේ නව ධර්මයෝ වැඩිය යුත්තාහුයයි" වදාළසේක.

('රාගයාගේ පරිඥානය පිණිසද, 'පරික්ෂය පිණිස' ආදි වසයෙන් ඉහත සඳහන් වචන යොදා ඒ ඒ වචන අනුව සූත්‍ර සාදාගතයුතුයි) "භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇති ඒ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්තාහුය."

**(නවක නිපාතය නිමි.)**

---

# දසම නිපාතය

## 1. පළමුවෙනි පණ්ණාසකය.

## 1 ආනිසංස වර්ගය.

1. **කුසල සීල කිමත්ථිය සූත්‍රය:-** 1. "මා විසින් මෙසේ අසනලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසල අනේපිඬු මහසිටානන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ

යම්තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක වැඩහුන්නේය. එකත් පසෙක වැඩහුන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, නිවැරදි සිල් කුමක් ප්‍රයෝජනකොට ඇත්තාහුද? කුමක් අනුසස්කොට ඇත්තාහුද?"

2. "ආනන්දය, නිවැරදි සිල් පසුතැවිලි නොවීම ප්‍රයෝජන කොට ඇත්තාහ. පසුතැවිලි නොවීම අනුසස් කොට ඇත්තාහ."

"ස්වාමීනි, පසුතැවිලි නොවීම කුමක් ප්‍රයෝජනකොට ඇත්තේද, කුමක් අනුසස්කොට ඇත්තේද?"

"ආනන්දය, පසුතැවිලි නොවීම ප්‍රමොදය පිණිසවේ. ප්‍රමොදය අනුසසවේ."

"ස්වාමීනි, ප්‍රමොදය කුමක් ප්‍රයෝජනකොට ඇත්තේද, කුමක් අනුසස්කොට ඇත්තේද?"

"ආනන්දය, ප්‍රමොදය ප්‍රීතිය පිණිසය, ප්‍රීතිය අනුසස්කොට ඇත්තේය"

"ස්වාමීනි, ප්‍රීතිය කුමක් පිණිසද, කුමක් අනුසස්කොට ඇත්තේද?"

"ආනන්දය, ප්‍රීතිය සංසිඳීම පිණිසය. සංසිඳීම අනුසස්කොට ඇත්තේය.

'ස්වාමීනි, සංසිඳීම කුමක් සඳහාද කුමක් අනුසස්කොට ඇත්තේද?"

"ආනන්දය, සංසිඳීම සැපය සඳහාය සැපය අනුසස් කොට ඇත්තේය."

"ස්වාමීනි, සැපය කුමක් සඳහාද? කුමක් අනුසස්කොට ඇත්තේද?"

"ආනන්දය, සැපය සිත එකඟකිරීම පිණිසය, සිතඑකඟ කිරීම අනුසස්කොට ඇත්තේය."

"ස්වාමීනි සිත එකඟකිරීම කුමක් සඳහාද? කුමක් අනුසස් කොට ඇත්තේද?"

"ආනන්දය, සිත එකඟ කිරීම තරුණ විදර්ශනාව පිණිස වේ. තරුණ විදර්ශනාව අනුසස් කොට ඇත්තේවේ."

"ස්වාමීනි, තරුණ විදර්ශනාව කුමක් සඳහාද? කුමක් අනුසස්කොට ඇත්තේද?"

"ආනන්දය, තරුණ විදර්ශනාව බලවත් විදර්ශනාව හා මාර්ගය පිණිස වේ. බලවත් විදර්ශනාව හා මාර්ගය අනුසස්කොට ඇත්තේවේ."

"ස්වාමීනි, බලවත් විදර්ශනාව සහ මාර්ගය කුමක් පිණිසද, කුමක් අනුසස්කොට ඇත්තේද?"

"ආනන්දය, බලවත් විදර්ශනාව සහ මාර්ගය අර්හත් ඵලය හා ප්‍රත්‍යවෙක්ෂා ඥාණය පිණිසය.

3. "ආනන්දය, මෙසේ නිවැරදි ශීලයෝ පසුතැවිලි නොවීම ප්‍රයෝජනකොට ඇත්තාහ. පසුතැවිලි නොවීම අනුසස්කොට ඇත්තාහ. පසුතැවිලි නොවීම ප්‍රමොදය ප්‍රයෝජන කොට ඇත්තාහ. ප්‍රමෝදය අනුසස්කොට ඇත්තාහ. ප්‍රමොදය ප්‍රීතිය පිණිසය. ප්‍රීතිය අනුසස්කොට ඇත්තේය. ප්‍රීතිය සංසිඳීම පිණිසය සන්සිඳීම අනුසස්කොට ඇත්තේය. සන්සිඳීම සැපය පිණිසය. සැපය අනුසස්කොට ඇත්තේය. සැපය සිත එකඟ කිරීම පිණිසය, සිත එකඟ කිරීම අනුසස්කොට ඇත්තේය. සිත එකඟකිරීම තරුණ විදර්ශනාව පිණිසය. තරුණ විදර්ශනාව අනුසස්කොට ඇත්තේය. තරුණ විදර්ශනාව බලවත් විදර්ශනාව හා මාර්ගය පිණිසය බලවත් විදර්ශනාව හා මාර්ගය අනුසස්කොට ඇත්තේය. බලවත් විදර්ශනාව හා මාර්ගය අර්හත් ඵලය හා ප්‍රත්‍යවෙක්ෂා නුවණ පිණිසවේ. අර්හත් ඵලය හා ප්‍රත්‍යවෙක්ෂා නුවණ අනුසස්කොට ඇත්තේය. ආනන්දය, මෙසේ නිරවද්‍ය සිල් ක්‍රමයෙන් අර්හත්වය පිණිස යත්."

2. **චෙතනාකරණීය සූත්‍රය:-** 1. "මහණෙනි, සීලයෙන් යුත් සිල්වතාට 'පසුතැවිලි නොවීම මට උපදීවායි' සිතෙහි

නොකටයුතුය. මහණෙනි, යම්හෙයකින් සීලයෙන් යුත් සිල්වතාට පසුතැවිලි නොවීම උපදීද මෙය ස්වභාවයකි. මහණෙනි, පසුතැවිලි නුවූවහුට 'මට ප්‍රමෝදය උපදීවායි' සිත්හි නොකටයුතුය. පසුතැවිලි නොවන්නාහට යම් ප්‍රමොදයක් උපදීද, මෙය ස්වභාව ධර්මයකි. මහණෙනි, ප්‍රමොදයෙන් යුක්තවූවහුට 'ප්‍රීතිය මට උපදීවායි' සිත්හි නොකටයුතුය. මහණෙනි, ප්‍රමොදවූවහුට ප්‍රීතිය ඉපදීම ස්වභාවයකි. මහණෙනි, ප්‍රීතියෙන් යුත් සිත ඇත්තාහට මාගේ ශරීරය සංසිඳේවායි සිත්හිලා නොකටයුතුය. මහණෙනි, ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තාගේ ශරීරය සංසිඳේද, මෙය ස්වභාවයකි මහණෙනි, සන්හුන් සිත් ඇත්තාහට සැපක් විඳිමියි සිත්හිලා නොකටයුතුය. මහණෙනි සන්සුන් කය ඇත්තේ යම් සැපයක් විඳීද, මෙය ස්වභාවයකි. මහණෙනි, සැප ඇත්තාහට 'මාගේ සිත එකඟවේවායි' සිත්හිලා නොකටයුතුය. මහණෙනි, සැප ඇත්තාගේ සිත එකඟවේද, මෙය ස්වභාවයකි.

2. "මහණෙනි, එකඟවූ සිත් ඇත්තාහට තත්වූ පරිද්දෙන් දනිමි. දකිමියි සිත්හිලා නොකටයුතුයි. මහණෙනි, එකඟවූයේ යමක් තත්වූ පරිද්දෙන් දනීද, දකීද මෙය ස්වභාවයකි. මහණෙනි, තත්වූපරිද්දෙන් දන්නාහට දක්නාහට බලවත් විදර්ශනාවට පැමිණෙන්නෙමි. මාර්ගයට පැමිණෙන්නෙමියි' සිත්හිලා නොකටයුතුය. මහණෙනි, තරුණ විදර්ශනාවෙන් දන්නාහට දක්නාහට බලවත් විදර්ශනාවට පැමිණේද, මාර්ගයට පැමිණේද යන මෙය ස්වභාවයකි. මහණෙනි, බලවත් විදර්ශනාවට පැමිණියහුට, මාර්ගයට පැමිණියහුට අර්හත් ඵලය හා ප්‍රත්‍යවෙක්ෂා ඥාණය ප්‍රත්‍යක්ෂ කරමියි සිත්හි ලා නොකටයුතුයි. මහණෙනි, බලවත් විදර්ශනාවට පැමිණියේ මාර්ගයට පැමිණියේ අර්හත්ඵලය හා ප්‍රත්‍යවෙක්ෂා ඥාණය ප්‍රත්‍යක්ෂකරයි යන යමක් ඇද්ද, මෙය ධර්ම භාවයකි.

3. "මහණෙනි, මෙසේ වනාහි බලවත් විදර්ශනාව හා මාර්ගය අර්හත්ඵලය හා ප්‍රත්‍යවෙක්ෂා ඥාණ සඳහාය. අර්හත් ඵලය හා ප්‍රත්‍යවෙක්ෂා ඥාණය අනුසස්කොට ඇත්තාහ. තරුණ විදර්ශනාව බලවත් විදර්ශනාව හා මාර්ගය පිණිස වේ. බලවත්

විදර්ශනාව හා මාර්ගය අනුසස්කොට ඇත්තේ වේ. සිත එකඟකිරීම තරුණ විදර්ශනාව පිණිස වේ. තරුණ විදර්ශනාව අනුසස්කොට ඇත්තේවේ. සැපය සමාධිය පිණිසය සමාධිය අනුසස්කොට ඇත්තේය. සංසිඳීම සැපය පිණිසය. සැපය අනුසස්කොට ඇත්තේය. ප්‍රීතිය සන්සිඳීම පිණිසය. සන්සිඳීම අනුසස්කොට ඇත්තේය. ප්‍රමොදය ප්‍රීතිය පිණිස වේ. ප්‍රීතිය අනුසස්කොට ඇත්තේවේ. නොපසුතැවිල්ල ප්‍රමොදය පිණිසවේ. ප්‍රමොදය අනුසස්කොට ඇත්තේ වේ. නිරවද්‍ය ශීලයෝ නොපසුතැවිල්ල ප්‍රයෝජනකොට ඇත්තාහ. නොපසුතැවිල්ල අනුසස්කොට ඇත්තාහ. මහණෙනි, මෙසේ වනාහි මෙතෙර වැනි ත්‍රෛභූමික වෘත්තයෙන් පරතෙරට යාමට ධර්මයෝම ධර්මයෙහිම පවතිත්, ධර්මයෝම ධර්මයන් පුරවත්."

3. **දුස්සීල හතුපනිස සූත්‍රයඃ**- 1. "මහණෙනි, (ii) සීලයෙන් වෙන්වූ දුස්සීලයාට පසුතැවිලි නොවීම නැසුනේවේ. පසුතැවිලි නොවීම නැතිකල්හි, නොපසුතැවිල්ලෙන් වැලක්කහුට ප්‍රමෝදය නැසුනේ වේ. ප්‍රමෝදය නැතිකල්හි ප්‍රමෝදයෙන් වැලැක්කහුට ප්‍රීතිය නැසුනේවේ. ප්‍රීතිය නැතිකල්හි ප්‍රීතියෙන් වැලැක්කහුට සංසිඳීම නැසුනේවේ. සන්සිඳීම නැතිකල්හි සන්සිඳීමෙන් වැලැක්කහුට සැපයනැසුන කරුණවේ. සැපය නැතිකල්හි සැපයෙන් වැලැක්කහුට සම්‍යක් සමාධිය නැසුනේ වේ. සම්‍යක් සමාධිය නැතිකල්හි සම්‍යක් සමාධියෙන් වැලැක්කහුට තරුණ විදර්ශනාව නැසුනේ වේ. තරුණ විදර්ශනාව නැතිකල්හි තරුණ විදර්ශනාවෙන් වැලැක්කහුට බලවත් විදර්ශනාව හා මාර්ගය නැසුනේ වේ. බලවත් විදර්ශනාව හා මාර්ගය නැතිකල්හි බලවත් විදර්ශනාවෙන් හා මාර්ගයෙන් වැලැක්කහුට අර්හත් ඵලය හා ප්‍රත්‍යවෙක්ෂාඥාණය නැසුනේ වේ.

2. "මහණෙනි, (ii) අතු කොළ නැති වෘක්ෂයක් යම්සේද ඒකේ පතුරුද සම්පූර්ණ නොවෙත්. පොත්තද ඵලයද හරයද සම්පූර්ණ නොවේද, මහණෙනි, එසේම (මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

3. "මහණෙනි, (ii) සීලයෙන් යුක්ත සිල්වත්හට පසුතැවිලි නොවීම හේතුව වේ. නොපසුතැවිල්ල ඇතිකල්හි

නොපසුතැවිල්ලෙන් යුක්තවූවහුට ප්‍රමෝදය හේතුව වේ. ප්‍රමෝදය ඇතිකල්හි ප්‍රමෝදයෙන් යුක්තවූවහුට ප්‍රීතිය හේතුව වේ. ප්‍රීතිය ඇතිකල්හි ප්‍රීතියෙන් යුක්තවූවහුට සංසිඳීම හේතුව වේ. සංසිඳීම ඇතිකල්හි සංසිඳීමෙන් යුක්ත වූවහුට සැපය හේතුවවේ. සැපය ඇතිකල්හි සැපයෙන් යුක්ත වූවහුට සම්‍යක් සමාධිය හේතුව වේ. සම්‍යක් සමාධිය ඇති කල්හි සම්‍යක් සමාධියෙන් යුක්තවූවහුට තරුණ විදර්ශනාව හේතුවවේ. තරුණ විදර්ශනාව ඇතිකල්හි තරුණ විදර්ශනාවෙන් යුක්තවූවහුට බලවත් විදර්ශනාව හා මාර්ගය හේතුවවේ. බලවත් විදර්ශනාව හා මාර්ගය ඇතිකල්හි බලවත් විදර්ශනාවෙන් හා මාර්ගයෙන් යුක්තවූවහුට අර්හත්ඵල විමුක්තිය හා ප්‍රත්‍යවෙක්ෂා ඤාණය හේතුව වේ.”

4. (i) “මහණෙනි, අතු කොළ ඇති වෘක්ෂයක් යම්සේද එහි පතුරුද සම්පූර්ණවීමට යයි. පොතුද සම්පූර්ණවීමට යයි. ඵලයද සම්පූර්ණවීමට යයි. හරයද සම්පූර්ණවීමට යයි. මහණෙනි (ii) එසේම (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

4. **සාරිපුත්ත හතුපනිස සූත්‍රය:-** 1. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භික්ෂූන් ඇමතු සේක. “ඇවැත්නි, (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ 1 (ii) යෙදිය යුතුයි.)

2. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඇවැත්නි, (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ (ii) යෙදිය යුතුයි.)

3. “ඇවැත්නි, (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ (ii) යෙදිය යුතුයි.) ඇවැත්නි, (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ 4 (i) යෙදිය යුතුයි.) ඇවැත්නි, (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ 3 (ii) යෙදිය යුතුයි.)

5. **ආනන්ද හතුපනිස සූත්‍රය:-** (මේ සූත්‍රය මේ මේ වර්ගයේ 4 සූත්‍රය මෙනි. “ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වෙනුවට “ආනන්ද ස්ථවිරයන් වහන්සේ” යෙදිය යුතුයි.)

6. **සමාධි පටිලාභ සූත්‍රය:-** 1. “ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද

එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත් පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, යම්සේ පෘථුවියෙහි පෘථුවි සංඥා ඇත්තේ නොවන්නේද වතුරෙහි වතුර යන සංඥාව ඇත්තේ නොවන්නේද ගින්නෙහි ගින්න යන සංඥාව ඇත්තේ නොවන්නේද, වාතයෙහි වාතය යන සංඥාව ඇත්තේ නොවන්නේද; ආකාශනඤ්චායතනයෙහි ආකාශානඤ්චායතන සංඥාව ඇත්තේ නොවන්නේද, විඤ්ඤානඤ්චායතනයෙහි විඤ්ඤානඤ්චායතන සංඥාව ඇත්තේ නොවන්නේද, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතන සංඥාව ඇත්තේ නොවන්නේද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසංඤ්ඤානාසඤ්ඤායතන සංඥාව ඇත්තේ නොවන්නේද, මේ ලෝකයෙහි මේ ලොකය යන සංඥාව ඇත්තේ නොවන්නේද, පරලෙව්හි පරලොව යන සංඥා ඇත්තේ නොවන්නේද, සිත් ඇති සමාපත්තියක් වනාහි ඇත්තේද, එබඳු සමාධි ප්‍රතිලාභයක් වන්නේදැයි" ඇසුයේය.

2. "ආනන්දය, (ii) මහණහට යම්සේ පෘථුවියෙහි පෘථුවි යන සංඥාව ඇත්තේ නොවේද ජලයෙහි ජලය යන සංඥාව ඇත්තේ නොවේද, ගින්නෙහි ගින්න යන සංඥාව ඇත්තේ නොවේද වාතයෙහි වාතය යන සංඥාව ඇත්තේ නොවේද, ආකාශනඤ්චායතනයෙහි ආකාසානඤ්චායතන සංඥාව ඇත්තේ නොවේද, විඤ්ඤානඤ්චායතනයෙහි විඤ්ඤානඤ්චායතන සංඥාව ඇත්තේ නොවේද, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතන සංඥාව ඇත්තේ නොවේද, මේ ලොකයෙහි මේ ලොකය යන සංඥාව ඇත්තේ නොවේද, පරලෝකයෙහි පරලෝකය යන සංඥා ඇත්තේ නොවේද, සිත් ඇති සමාපත්තියෙක් ඇත්තේද? (iii) එබඳු සමාධි ප්‍රතිලාභයක් වන්නේය."

3. "ස්වාමීනි, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ස්වාමීනි මෙය කෙසේ වන්නේද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

4. "ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම යම් මේ සියලු කෙලෙස් දුරුකරන්නාවූ තෘෂ්ණාව ක්ෂයකරන්නාවූ මාර්ගයක් ඇද්ද නිරොධ සංඛ්‍යාත නිවනක් ඇද්ද සියලු සංස්කාරයන් සංසිඳුවන මේ ඵල සමාපත්තිය ශාන්තය. මේ ඵල සමාපත්තිය ප්‍රණීතයයි මෙබඳු සිත් ඇත්තේ මේ යම්සේ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) සිත් ඇති සම්පත්තියක් ඇත්තේ දැයි ආනන්දය මෙබඳු සමාධි ප්‍රතිලාභයක් වන්නේය.

7. **කිංසඤ්ඤී සූත්‍රය**:- මේ සූත්‍රයේ මුල් ඡේද 6 සූත්‍රයේ 1-2-3-4 ඡේද මෙනි, එහි "භාග්‍යවතුන් වහන්සේ, යන්න වෙනුවට මෙහි "ශාරීපුත්‍ර ස්ථවිරන් වහන්සේ, කියා යොදා ගත යුතුයි.

5. ඒ කාලයෙහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ "කුමන සංඥාවක් ඇත්තේවූයේද, ඇවැත්නි මට භවනිරොධය නිර්වාණය භව නිරොධය නිර්වාණයයි, මට අනික්ම සංඥාවක් උපදී. අනිත්ම සංඥාවක් නිරුද්ධවේ. ඇවැත්නි යම්සේ ලී කැබෙල්ලක් ගින්නෙන් දැවෙන්නේ අනෙක්ම ගින්නක් උපදීද, අනිත්ම ගින්නක් නිරුද්ධවේද, ඇවැත්නි, මෙසේම මම භවයාගේ නිරොධ නිර්වාණය භවයාගේ නිරොධය නිර්වාණයයි. අනික් සංඥාවක්ම උපදී. අනික් සංඥාවක්ම නිරුද්ධවේ. ඇවැත්නි ඒ කාලයෙහි මම භව නිරොධය නිර්වාණය යන සංඥා ඇත්තේ වූයෙමි."

8. **සමන්තපාසාදිකා සූත්‍රය**:- 1. මහණෙනි, මහණ තෙම ශ්‍රාද්ධාවත්වේද සිල්වත් නොවේද, (ii) මෙසේ හෙතෙම ඒ අංගයෙන් අසම්පූර්ණවූයේවේ. (iii) 'කිමෙක්ද මම ශ්‍රද්ධාවත්ද සිල්වත්ද වන්නෙම් නම් යෙහෙකැයි' (iv) ඒ කරුණ සම්පූර්ණ කටයුතුයි. මහණෙනි, යම් කලක පටන් මහණ තෙම (v) ශ්‍රද්ධාවත්ද සිල්වත්දවේද මෙසේ හෙතෙම ඒ අංගයෙන් සම්පූර්ණවූයේවේ.

2. (i) "මහණෙනි, මහණ තෙම ශ්‍රාද්ධාවත්වේද සිල්වත් වේද (ii) බහුශ්‍රැත නොවේද (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) 'කිමෙක්ද මම ශ්‍රද්ධාවත්ද, සිල්වත්ද, බහුශ්‍රැතද, වන්නේ නම්

යෙහෙකැයි' (මෙහි 1 (iv) යෙදිය යුතුයි.) ශ්‍රද්ධාවත්ද, සිල්වත්ද, බහුශ්‍රැතදවේද මෙසේ හෙතෙම ඒ අංගයෙන් සම්පූර්ණවූයේවේ.

**3.** (මෙහි 2 (i) යෙදිය යුතුයි.) බහුශ්‍රැතවේද, ධර්ම කථික නුවූයේද, (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) 'කිමෙක්ද, මම ශ්‍රද්ධාවත්ද, සිල්වත්ද, බහුශ්‍රැතද, ධර්ම කථිකවන්නේ නම් යෙහෙකැයි' (මෙහි 1 (iv) යෙදිය යුතුයි.) ශ්‍රද්ධාවත්ද, සිල්වත්ද, බහුශ්‍රැතද, ධර්ම කථිකවේද, (ii) මෙසේ හෙතෙම ඒ අංගයෙන් සම්පූර්ණවූයේ වේ.

**4.** (මෙහි 2 (i) යෙදිය යුතුයි.) බහුශ්‍රැතවේද, ධර්මකථික වූයේද, පිරිස්හි නොහැසිරේද, (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) 'කිමෙක්ද, මම ශ්‍රද්ධාවත්ද, සිල්වත්ද, බහුශ්‍රැතද, ධර්මකථික වන්නේද පිරිස්හි හැසිරේනම් යෙහෙකැයි.' (මෙහි 1 (iv) යෙදිය යුතුයි.) ශ්‍රද්ධාවත්ද, සිල්වත්ද, බහුශ්‍රැතද, ධර්මකථික වේද, පිරිස්හි හැසිරේද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

**5.** (මෙහි 2 (i) යෙදිය යුතුයි.) බහුශ්‍රැතවේද, ධර්මකථික වූයේද, පිරිස්හි හැසිරේද, විසාරදව පිරිස්හි ධර්මදෙශනා නොකෙරෙම්ද, (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) 'කිමෙක්ද, මම ශ්‍රද්ධාවත්ද, සිල්වත්ද, බහුශ්‍රැතද, ධර්ම කථිකවේද, පිරිස්හි හැසිරේද, විසාරදව පිරිස්හි ධර්මදේශනා කෙරෙම් නම් යෙහෙකැයි' (මෙහි 1 (iv) යෙදිය යුතුයි.) ශ්‍රද්ධාවත්ද, සිල්වත්ද, බහුශ්‍රැතද, ධර්මකථිකවේද, පිරිස්හි හැසිරේද, විසාරදව පිරිස්හි ධර්මදේශනා කෙරෙම්ද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

**6.** (මෙහි 2 (i) යෙදිය යුතුයි.) බහුශ්‍රැතවේද, ධර්ම කථික වූයේද, පිරිස්හි හැසිරේද, විසාරදව පිරිස්හි ධර්ම දේශනා කෙරෙම්ද, විනයධර නොවෙම්ද, (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) 'කිමෙක්ද මම ශ්‍රද්ධාවත්ද, සිල්වත්ද, බහුශ්‍රැතද, ධර්මකථික වෙම්ද පිරිස්හි හැසිරෙම්ද විසාරදව පිරිස්හි ධර්මදෙශනා කරෙම්ද, විනයධරවී නම් යෙහෙකැයි (මෙහි 1 (iv) යෙදිය යුතුයි.) (ii) ශ්‍රද්ධාවත්ද සිල්වත්ද, බහුශ්‍රැතද, ධර්ම කථික වේද, පිරිස්හි හැසිරේද, විසාරදව පිරිස්හි ධර්මදෙශනා කරෙම්ද විනයධරද, (iii) (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

**7.** (මෙහි 2 (i) යෙදිය යුතුයි. (ii) බහුශ්‍රැතවේද, ධර්ම කථිකවූයේද, පිරිස්හි හැසිරේද, විසාරදව පිරිස්හි ධර්ම දෙශනා කෙරෙම්ද, විනයධරවේද, ප්‍රාන්ත සෙනාසන භජනය කරණ අරණ්‍යයෙහි වාසයකරන්නෙක් නොවේද, (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) 'කිමෙක්ද මම (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ප්‍රාන්තසෙනාසන භජනය කරණ අරණ්‍යයෙහි වාසය කරන්නෙක් වීනම් යෙහෙකැයි. (මෙහි 1 (iv) යෙදිය යුතුයි.) (iii) (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ප්‍රාන්ත සෙනාසන භජනය කරන අරණ්‍යයෙහි වාසය කෙරෙම්ද, (iv) (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

**8.** 1 (මෙහි 7 (iii) යෙදිය යුතුයි.) ශ්‍රෙෂ්ඨ අධිසිතෙහිවූ මේ ආත්මයෙහිම සැප විහරණ ඇති රූපාවචර ධ්‍යාන සතර අයත්නයෙන් (ii) නොලබන්නේවේ. නිදුකින් නොලබන්නේවේ, පහසුවෙන් නොලබන්නේවේද, (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) 'කිමෙක්ද මම (මෙහි 8 (i) යෙදිය යුතුයි.) ලබන්නේවේ, නිදුකින් ලබන්නේවේ. පහසුවෙන් ලබන්නේවේ නම් යෙහෙකැයි (මෙහි 1 (iv) යෙදිය යුතුයි.) (iii) (මෙහි 8 (i) යෙදිය යුතුයි.) ලබන්නේවේ, නිදුකින් ලබන්නේවේ, පහසුවෙන් ලබන්නේවේ. (iv) මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

**9.** (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) (ii) ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් ආශ්‍රවරහිත චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය (iii) නොකරයිද, (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) කිමෙක්ද, මම (මෙහි 8 (ii) සහ 9 (ii) යෙදිය යුතුයි.) කරන්නේ නම් යෙහෙකැයි (මෙහි 1 (iv) යෙදිය යුතුයි. (මෙහි 8 (ii) සහ 9 (ii) යෙදිය යුතුයි.) කෙරෙම්ද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

**10.** මෙසේ හෙතෙම ඒ කොටස සම්පූර්ණ නොකෙළේවේ. ඔහු විසින් ඒ කොටස සම්පූර්ණ කටයුතුයි. කෙසේ මම (ii) ශ්‍රද්ධාවත්ද, සිල්වත්ද, බහුශ්‍රැතද, ධර්ම කථිකද, පිරිස්හි හැසිරෙන්නෙම්ද, විසාරදව පිරිස්හි ධර්ම දෙශනා කරන්නෙම්ද, විනයධරද ප්‍රාන්ත සෙනාසන භජනය කරණ ආරණ්‍යයෙහි

වාසය කරන්නෙම්ද, (iii) නිතර පිරිසිදුවූ මේ ආත්මයෙහි සැපවිහරණ ඇති රූපාවචරධ්‍යාන සතර කැමැතිසේ ලබන්නේවේ සුවසේ ලබන්නේවේ, වහා ලබන්නේවේ, ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රවරහිත චිත්තවිමුක්තියද ප්‍රඥාවිමුක්තියද මෙලොවම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට වාසය කරන්නෙම් නම් යෙහෙකැයි" කියායි.

**9. සබ්බාකාර පරිපූර සූත්‍රය:-** "මහණෙනි, යම්තැනක පටන් මහණතෙම (මේ වර්ගයේ 8 සූත්‍රයේ 10 (ii) යෙදිය යුතුයි.) රූපයන් ඉක්මවා අරූපවූ යම් ඒ ශාන්ත මිදීමක් ඇද්ද, ඔව්හු කයින් ස්පර්ශකොට වාසය කරයිද, ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත චිත්තවිමුක්තියද, ප්‍රඥා විමුක්තිද, මෙලොවම තෙමේ විශිෂ්ඨ ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයි මෙසේ හෙතෙම ඒ අංගයෙන් සම්පූර්ණ වූයේවේ. මහණෙනි, මේ කරුණු දසයෙන් යුක්තවූ මහණ තෙම හාත්පසින් ප්‍රසාද එලවන්නේද වේ. සර්වප්‍රකාරයෙන් සම්පූර්ණ වූයේද වේ, 2-8 (මේ ඡෙද මේ වර්ගයේ 8 සූත්‍රයේ 1-7 ඡෙද මෙන් වෙත්.)

**9.** (i) (මෙහි මේ වර්ගයේ 8 සූත්‍රයේ 7 (iii) යෙදිය යුතුයි.) රූපයන් ඉක්මවා අරූපවූ යම් ඒ ශාන්ත මිදීමක් ඇද්ද ඔව්හු කයින් ස්පර්ශ කොට වාසය (ii) නොකරයි. (මෙහි මේ වර්ගයේ 8 සූත්‍රයේ 1 (ii) යෙදිය යුතුයි.) කිමෙක්ද, මම (මෙහි මේ සූත්‍රයේ 9 (ii) යෙදිය යුතුයි.) කරන්නේ නම් යෙහෙකැයි (මෙහි මේ සූත්‍රයේ 9 (i) යෙදිය යුතුයි.) කෙරෙම්ද (මෙහි 8 සූත්‍රයේ 3 (ii) යෙදිය යුතුයි.)

**10.** (මෙහි මේ සූත්‍රයේ 9 (i) යෙදිය යුතුයි.) කෙරෙම්ද ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රවරහිත චිත්තවිමුක්තියද, ප්‍රඥාවිමුක්තියද, මෙ ලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයිද, නොකරයි. මෙසේ හෙතෙම ඒ කොටසින් අසම්පූර්ණවූයේ වේ.

**11.** "ඔහු විසින් ඒ කොටස සම්පූර්ණ කටයුතුය. 'මම (ii) ශ්‍රද්ධාවත්ද වන්නෙමි. සිල්වත්ද, බහුශ්‍රැතද, ධර්ම කථිකද, පිරිස්හි හැසිරෙන්නේද දක්ෂවූයේ පිරිස්හි ධර්මදෙශනා කරන්නෙමි.

විනයධරද, ප්‍රාන්ත සෙනාසන භජනය කරණ ආරඤ්ඤිකද වන්නෙමි. රූපයන් ඉක්මවා අරූපවූ යම් ඒ ශාන්ත මිදීමක් ඇද්ද, ඔව්හු කයින් ස්පර්ශකොට වාසය කරන්නෙමි ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් ආශ්‍රව රහිත චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද මෙලොවම තෙමේ විශිෂ්ට ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරන්නෙම්ද, ඔහු විසින් ඒ කොටසද සම්පූර්ණ කටයුතුය.”

**10. පාසාදික පරිපූර සූත්‍රය:-** 1. “මහණෙනි, යම් තැනක සිට මහණතෙම (මෙහි මේ වර්ගයේ 8 සූත්‍රයේ 10 (ii) ඡෙදය යෙදිය යුතුයි.) (ii) අනෙකප්‍රකාර පූර්වෙනිවාසය සිහිකරයිද, පිරිසිදුවූ මනුෂ්‍යත්වය ඉක්මවූවාවූ දිවැසින් (මෙහි අංගුත්තර නිකායේ දුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 8 ඡෙදය යෙදිය යුතුයි.) සත්වයන් දකීද (iii) මහණෙනි, මේ කරුණු දසයෙන් යුක්තවූ මහණතෙම ප්‍රාසාදාවහ වේ. සර්ව ප්‍රකාරයෙන් සම්පූර්ණවූයේ වේ.

2-8 (මේ ඡෙද මේ වර්ගයේ 8 සූත්‍රයේ 1-7 ඡෙද මෙන්වෙත්)

9. (i) (මෙහි මේ වර්ගයේ 8 සූත්‍රයේ 7 (iii) යෙදිය යුතුයි.) අනෙකප්‍රකාර පූර්වෙනිවාසය (ii) සිහි නොකරයි. කිමෙක්ද, මම (මෙහි මේ සූත්‍රයේ 9 (i) යෙදිය යුතුයි.) සිහි කරන්නෙම් නම් යෙහෙකැයි (මෙහි මේ වර්ගයේ 8 සූත්‍රයේ 1 (iv) යෙදිය යුතුයි.) (මෙහි මේ සූත්‍රයේ 9 (i) යෙදිය යුතුයි.) සිහි කෙරෙම්ද, (මෙහි මේ වර්ගයෙහි 8 සූත්‍රයේ 3 (ii) යෙදිය යුතුයි.)

10. (මෙහි මේ සූත්‍රයේ 9 (i) යෙදිය යුතුයි.) සිහි කරයි. මෙහි මේ වර්ගයේ 10 සූත්‍රයේ 1 (ii) යෙදිය යුතුයි.) කිමෙක්ද, මම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) දකී නම් යෙහෙකි (මෙහි මේ වර්ගයේ 8 සූත්‍රයේ 1 (iv) යෙදිය යුතුයි.) (මෙහි මේ සූත්‍රයේ 10 (ii) යෙදිය යුතුයි.) (ii) පිරිසිදුවූ මනුෂ්‍යත්වය ඉක්මවූවාවූ දිවැසින් (මෙහි අංගුත්තර නිකායේ දුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 8 ඡෙදය යෙදිය යුතුයි.) සත්වයන් (iii) නොදකී.

11. “ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් (මෙහි මේ වර්ගයේ මේ සූත්‍රයේ 10 (ii) යෙදිය යුතුයි.) ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොකරයි. මෙසේ ඔහු ඒ කොටසින් සම්පූර්ණ නොවූයේ වේ. කිමෙක්ද, මම ශ්‍රද්ධාවන්ත වන්නෙම්ද, සිල්වත් වන්නෙම්ද, බහුශ්‍රැතද, ධර්ම කථිකද, පිරිස්හි හැසිරෙන්නේද, දක්ෂවූයේ පිරිසෙහි ධර්ම දෙශනා කරන්නෙම්ද විනයධරද අනෙකප්‍රකාර පූර්වෙනිවාසය සිහිකරන්නෙමි. එක ජාතියක්ද ජාති දෙකක්ද (අංගුත්තරනිකායේ ද්‍රුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි.) මෙසේ හැඩහුරුකම් සහිත උදෙසීම් සහිත නානාප්‍රකාර පූර්වෙනිවාසය සිහි කරන්නෙමි. පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූවාවූ දිවැසින් (මෙහි අංගුත්තරනිකායේ ද්‍රුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 8 ඡෙදය යෙදිය යුතුයි.) කර්මානුරූපව පැමිණ සත්වයන් දන්නෙමි ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් (මෙහි මේ වර්ගයේ මේ සූත්‍රයේ 8 (ii) ඡෙදය යෙදිය යුතුයි.) ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරන්නෙමියි ඔහු විසින් ඒ කොටස සම්පූර්ණ කටයුතුය.

12. "මහණෙනි, යම් කලක පටන් මහණතෙම ශ්‍රද්ධාවත්වේද, සිල්වත් වේද, බහුශ්‍රැත වේද, ධර්ම කථික වේද, පිරිස්හි හැසිරෙන්නේ වේද, විසාරද වූයේ පිරිසෙහි ධර්ම දෙශනා කරයිද, විනයධර වේද, නානාප්‍රකාර පූර්වෙනිවාසය සිහි කරයිද, ඒ මෙසේය. (මෙහි අංගුත්තරනිකායේ ද්‍රුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි.) මෙසේ හැඩහුරුකම් සහිත උදෙසීම් සහිත නානාප්‍රකාර පූර්වෙනිවාසය සිහි කරයි. පිරිසිදුවූ මනුෂ්‍යත්වය ඉක්මවා සිටි දිවැසින් කම්වූ පරිදි ආ සත්වයන් දනී. ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් ආශ්‍රව රහිතඵල සමාධියද ඵල ප්‍රඥාවද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයි. මෙසේ හෙතෙම ඒ කොටසින් සම්පූර්ණයේවේ. මහණෙනි, මේ දශ ධර්මයෙන් යුක්තවූ මහණතෙම හාත්පසින් පැහැදීම ඇති කරන්නේ වේ. සර්වප්‍රකාරයෙන් සම්පූර්ණවූයේ වේ."

**(ආනිශංස වර්ගය නිමි.)**

---

# 2. නාථ වර්ගය.

11. **සෙනාසනංග සූත්‍රය**:- 1. "මහණෙනි, අංග පසකින් යුත් මහණතෙම අංගපසකින් යුත් සෙනසුනක් සේවනය කරන්නේ භජනය කරන්නේ නොබෝකලකින්ම ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රවරහිත ඵලසමාධියද ඵලප්‍රඥාවද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරන්නේය.

2. "මහණෙනි, මහණතෙමේ කෙසේ අංග පසකින් යුක්තවූයේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ශ්‍රද්ධාවත් වේද? (මෙහි 3 අංගුත්තරනිකායේ ඡක්ක නිපාතයේ ආහුනෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) තථාගතයන්වහන්සේගේ බොධිය සිහිකරයිද, ස්වල්ප ආබාධ ඇත්තේවේද, ලෙඩ අඩුවේද ඉතා සිහිල්නොවූ ඉතා උෂ්ණනොවූ භාවනාවට සුදුසු සමව පැසවන ගින්නෙන් යුක්තවේද ශාස්තෲන්වහන්සේ කෙරෙහි හෝ නුවණැති සබ්‍රම්සරුන් කෙරෙහි හෝ කෛරාටික නොවේද, මායා නැත්තේවේද, තත්වූපරිද්දෙන් තමා ප්‍රකාශකරන්නේවේද, අකුශල ධර්මයන් ප්‍රහානයකිරීම පිණිස කුශලධර්මයන් ඉපදවීම පිණිස කුශල ධර්මයන්හි ශක්තිමත්වූයේ දැඩි වීර්ය ඇත්තේ බහා නොතැබූ වැඩ ඇත්තේවේද, නුවණැත්තේ වේ. මනාකොට දුක් ක්ෂයකිරීමට යන පිරිසිදුවූ විනිවිද යන ඉපදීම විනාශය පිරිසිඳ දතහැකි නුවණින් යුක්තවූයේවේ. මහණෙනි, මෙසේ මහණතෙම අංගපසින් යුක්තවූයේ වේ.

3. "මහණෙනි, කෙසේ සේනාසන අංගපසකින් යුක්ත වූයේ වේද? මහණෙනි මේ ලොකයෙහි සේනාසන ඉතා දුර වූයේත් නොවේද, ඉතා ආසන්නවූයේත් නොවේද, යාම් ඊම් දෙකින් යුක්තද, දවල් ජනයාගෙන් පිරුනේ නොවේද, රාත්‍රියෙහි ශබ්දනැත්තේ වේද, ඝොෂා නැත්තේ වේද, ඩැහැ ලේ බොන මැස්සන්ය, මදුරුවන්ය, වාතය, අව්වය, දීර්ඝජාතීන්ගේ ස්පර්ශය නැත්තේවේද, ඒ සෙනස්නෙහි වාසය කරන්නාට නිදුකින්ම සිවුරු පිඩු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර උපදිත්ද, ඒ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සෙනස්නෙහි බහුශ්‍රැතවූ ආගම ධර්මය දත් ධර්මධර විනයධර උභයමාතෘකාධර ස්ථවිර භික්ෂූහු වාසය කරත්ද, ඔවුන්කරා කලින් කල එළඹ 'ස්වාමීනි, මෙය කෙසේද, මොහුගේ අර්ථ කවරේදැයි' විචාරයිද ප්‍රශ්නකරයිද, ඔහුට ඒ ආයුෂ්මත්වරු විවෘතනොවූවක් විවරණය කෙරෙත්ද, පහසු නොවූවක් පහසුකරත්ද, නානාප්‍රකාර සැකකටයුතු තන්හි සැක දුරුකරත්ද, මහණෙනි, මෙසේ සෙනාසනය අංග පසකින් යුක්තවූයේ වේ. මහණෙනි, අංග පසකින් යුක්ත මහණතෙම අංගපසකින් යුක්ත සෙනාසනය සේවනය කරන්නේ භජනය කරන්නේ නොබෝ කලකින් ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත ඵල සමාධියද ඵල ප්‍රඥාවද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරන්නේය."

12. **පඤ්චංග විපන්න සූත්‍රය**:- 1. "මහණෙනි, අංග පසකින් දුරුවූ අංග පසකින් යුක්තවූ මහණතෙම මේ ධර්මවිනයෙහි සියලු ගුණයෙන් යුක්තවූ වැස නිමවනලද බඹසර ඇති උතුම් පුරුෂයායයි කියනු ලැබේ.

2. "මහණෙනි, මහණතෙම කෙසේ අංග පසකින් දුරුවූයේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණහට කම්සැප විඳීමේ ආශාව ප්‍රහීනවූයේ වේද, ව්‍යාපාදය ප්‍රහීනවූයේ වේද, නිදිබරගතිය ප්‍රහීනවූයේවේද, සිත එක අරමුණක නොපිහිටන ගතිය හා කළ නොකළ සුචරිත දුශ්චරිතයෙහි කුකුස ප්‍රහීනවූයේ වේද, බුද්ධාදී අටතන්හි සැකය ප්‍රහීනවූයේ වේද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම අංගපසින් දුරුවූයේ වේ.

3. "මහණෙනි, මහණතෙමේ කෙසේ අංග පසකින් යුක්තවූයේ වේද?

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ලොකොත්තරවූ ශීල රාශියෙන් යුක්තවූයේ වේද, ලොකොත්තර සමාධි රාශියෙන් යුක්තවූයේ වේද, ලොකොත්තර ප්‍රඥා රාශියෙන් යුක්තවූයේ වේද, ලොකොත්තර ඵල ධර්මයෙන් යුක්තවූයේ වේද, ලොකොත්තර ප්‍රත්‍යවෙක්ෂා ඥාණයෙන් යුක්තවූයේ වේද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම අංග

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පසින් යුක්තවේ. මහණෙනි, අංගපසකින් දුරුවූ අංග පසකින් යුක්තවූ මහණතෙම මේ ධර්ම විනයෙහි සියලු ගුණයෙන් යුක්තවූ වැස නිමවනලද බඹසර ඇති උතුම් පුරුෂයායයි කියනු ලැබේ.

5. "මහණහට කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථීනමිද්ධය, උද්ධච්චය, විචිකිච්ඡාව සර්වප්‍රකාරයෙන් විද්‍යමාන නොවේද, ලොකොත්තර සීලයෙන්ද, ලොකොත්තර සමාධියෙන්ද, ලොකොත්තර ඵලයෙන්ද එබඳු ඥාණයෙන්ද යුක්තවූයේ වේද, හෙතෙම ඒකාන්තයෙන්ම අංග පසකින් යුක්තවූයේ අංග පසින් දුරුවූයේ මේ ධර්මවිනයෙහි සියලු ගුණයන්ගෙන් යුක්තවූයේයයි කියනු ලැබේ."

13. **දස සංයොජන සූත්‍රයः-** 1. "මහණෙනි මේ සංයොජන දසයක් වෙත්. කවර දසයක්ද යත්? කාමධාතුව භජනය කරණ සංයොජන පසකි, රූපාරූපභව භජනය කරණ සංයොජන පසකි.

2. "කාමධාතුව භජනය කරණ සංයොජන කවරහුද? ආත්මදෘෂ්ටිය, සැකය, ශීලව්‍රත දෙකින් අල්වාගැනීම, කාමආශාව, ව්‍යාපාදය යන මේ පස කාමධාතුව භජනය කරණ සංයොජනයෝයි.

3. "රූපාරූප භවයන් භජනය කරණ සංයෝජනයෝ කවරහුද? රූප ඇල්ම, අරූප ඇල්ම, මාන්නය, නොසන්සුන්කම නොදැනීම යන පස රූපාරූපභව භජනය කරණ සංයොජනයෝයි. මහණෙනි, මේ දස සංයොජනයෝයි."

14. **චෙතොඛිල විනිබද්ධ සූත්‍රයः-** 1. "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ සිතෙහි උල් පස ප්‍රහීන නොවූවාහුද සිතෙහි බැමි පස ප්‍රහීන නොවූවාහුද ඔහුට යම් රාත්‍රියක් හෝ දවාලක් හෝ පැමිණේද, කුශල ධර්මයන්හි හානියක්ම කැමති විය යුතුය. අභිවෘද්ධියක් කැමති නොවිය යුත්තාහ. සිතෙහි කවර උල් පසක් ප්‍රහීන නොවූවාහු වෙත්ද?

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කරයිද විනිශ්චය කරන්ට නොහැකි

වේද, නොමිදේද, නොපහදීද ඔහුගේ සිත කෙලෙස් තවන වීර්යය පිණිස නැවත නැවත යෙදීම පිණිස නිතර ක්‍රියාකිරීම පිණිස ප්‍රධන්වීර්ය පිණිස නොනැමෙයි. මෙසේ ඔහුට මේ පළමුවෙනි චෙතොඛිලය ප්‍රහීන නොවූයේවේ.

3. (i) "මහණෙනි, නැවත මහණ තෙම ධර්මයෙහි සැක කරයිද සංඝයා කෙරෙහි සැක කරයිද, ශික්ෂාපද කෙරෙහි සැක කරයිද, (ii) සබ්‍රම්සරුන් කෙරෙහි කිපුනේ නොසතුටු සිත් ඇත්තේ නැසුන සිත් ඇත්තේ උලක් මෙන්වූයේ (iii) මහණෙනි, යම් ඒ භික්ෂුවක් සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ නොසතුටුවූයේ නැසුන සිත් ඇත්තේ උලක්මෙන්වූයේ, ඔහුගේ සිත කෙලෙස් තවන වීර්ය පිණිස නැවත නැවත යෙදීම පිණිස නිතර ක්‍රියා කිරීම පිණිස, ප්‍රධන් වීර්ය පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙස් තවන වීර්ය පිණිස නැවත නැවත යෙදීම පිණිස නිතර ක්‍රියා කිරීම පිණිස ප්‍රධන් වීර්ය පිණිස නොනැමෙයිද, මෙසේ ඔහුට පස්වෙනි චෙතොඛිලය ප්‍රහීන නොවූයේවේ. ඔහුට මේ සිතේ උල්පස ප්‍රහීන නොවූයේවේ. ඔහුට සිතේ කිනම් බැමි පසක් නොසිඳුනේවේද.

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්හි (ii) පහනොවූ ආශා ඇත්තේවේද, පහනොවූ කැමැත්ත ඇත්තේවේද, පහනොවූ ප්‍රෙමය ඇත්තේවේද පහනොවූ පිපාසය ඇත්තේවේද, පහනොවූ දැවිල්ල ඇත්තේවේද, පහනොවූ තෘෂ්ණාව ඇත්තේවේද, මහණෙනි, යම් ඒ භික්ෂුවක් කාමයන්හි (ii) පහනොවූ ආශා ඇත්තේවේද, පහනොවූ කැමැත්ත ඇත්තේවේද, පහනොවූ ප්‍රෙමය ඇත්තේවේද, පහනොවූ පිපාසා ඇත්තේවේද, පහනොවූ දැවිල්ල ඇත්තේ වේද, පහනොවූ තෘෂ්ණාව ඇත්තේවේද, (iii) ඔහුගේ සිත කෙලෙස් තවන වීර්ය පිණිස නැවත නැවත යෙදීම පිණිස නිතර ක්‍රියා කිරීම පිණිස ප්‍රධන්වීර්ය පිණිස නොනැමෙයි. (ii) මෙසේ ඔහුට මේ පළමුවෙනි සිතේ බැඳීම සිඳුනේ නොවේ.

5. "මහණෙනි, නැවතද මහණතෙම ශරීරයෙහි (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

6. "රූපයෙහි පහවූ ආශා ඇත්තේද බඩට අල්ලන ප්‍රමාණ යම් තරමක් කැමැත්තේද, එතරම් අනුභවකොට නිදීමෙහි සතුට ස්පර්ශයෙහි සතුට හිඳීමේ සතුටට පැමිණියේ වාසය කරයිද, 'මම මේ සීලයෙන් ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යයෙන් හෝ ප්‍රසිද්ධ දෙවියෙක් හෝ අප්‍රසිද්ධ දෙවියෙක් වන්නෙමියි එක්තරා දිව්‍යනිකායක් සඳහා බ්‍රහ්මචර්යයෙහි හැසිරේද, මහණෙනි, යම් ඒ භික්ෂුවක්තෙම මම මේ ශීලයෙන් ව්‍රතයන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යයෙන් හෝ ප්‍රසිද්ධ දෙවියෙක් හෝ අප්‍රසිද්ධ දෙවියෙක් හෝ වන්නෙමියි' එක්තරා දිව්‍යනිකායක් සඳහා බ්‍රහ්මචර්යයෙහි හැසිරේද, (මෙහි 4 (iii) යෙදිය යුතුයි.) මෙසේ ඔහුට මේ පස්වෙනි බැඳීම නොසිඳුනේ වෙත්. ඔහුට සිතේ බැඳීම් පස නොසිඳුනාහු වෙත්.

6. "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ සිතෙහි මේ උල්පස ප්‍රහීන නොවූවාහුද සිතේ මේ බැම් පස නොසිඳුනාහු වෙත්ද, ඔහුට යම් රාත්‍රියක් හෝ දවාලක් හෝ එයිද කුශල ධර්මයන්හි හානියක්ම කැමතිවිය යුතුය. අභිවෘද්ධියක් කැමති නොවිය යුතුය.

7. "මහණෙනි, යම්සේ කළුවර පක්ෂයෙහි චන්ද්‍රයාගේ යම් රාත්‍රියක් හෝ දවාලක් හෝ පැමිණෙයිද, පිරිහේමය. වර්ණයෙන් පිරිහෙයි. මඬුල්ලෙන් පිරිහෙයි. ආලෝකයෙන් පිරිහෙයි. උස මහතින් පිරිහෙයි. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.)

8. (i) "මහණෙනි, යම්කිසි භික්ෂුවක් හට හෝ භික්ෂුණියකට හෝ සිත්හි උල් පස ප්‍රහීනවූවාහුද සිත් බැඳීම් පස සිඳුනාහුද ඔහුට යම් රාත්‍රියක් හෝ දවාලක් හෝ එයිද (ii) කුශල ධර්මයන්හි අභිවෘද්ධියක්ම කැමතිවිය යුතුය. පිරිහීමක් කැමති නොවිය යුතුය. ඔහුට කවර චෙතොඛිල පහක් ප්‍රහීනවූවාහු වෙත්ද.

9. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම බුදුන් කෙරෙහි සැක නොකරයිද, විනිශ්වය කටහැකිවේද, මිදේද, පහදීද, (මෙහි 8 (i) යෙදිය යුතුයි) මිදෙයි, පහදියි, මහණෙනි, යම් ඒ මහණකෙනෙක් බුදුන් කෙරෙහි සැක නොකරයිද, විනිශ්වය කටහැකිවෙයිද, මිදෙයිද, පහදියිද ඔහුගේ සිත කෙලෙස්

තවනවීර්ය පිණිස නැවත නැවත යෙදීම පිණිස, නිතර ක්‍රියාකිරීම පිණිස ප්‍රධන්වීර්ය පිණිස නැමෙයි. යමෙකුගේ සිත කෙලෙස් තවන වීර්ය පිණිස නැවත නැවත යෙදීම පිණිස නිතර ක්‍රියාකිරීම පිණිස ප්‍රධන්වීර්ය පිණිස නැමේද, මෙසේ ඔහුගේ පළමුවෙනි සිතේ හුල ප්‍රහීනවූයේවේ.' (11, 12, 13, මේ ඡෙද 9 ඡෙදය මෙනි. "බුදුන් කෙරෙහි" වෙනුවට "ධර්මයෙහි", "සංඝයා කෙරෙහි" "ශික්ෂාවෙහි" යෙදිය යුතුයි.)

**14.** "සබ්‍රම්සරුන් කෙරෙහි නොකිපුනේද, සතුටුවූයේ නැසුන සිත් ඇත්තෙක් මෙන් නොවූයේ වේද, මහණෙනි, යම් ඒ භික්ෂුවක් සබ්‍රම්සරුන්කෙරෙහි කිපියේ නොවේද, (මෙහි මේ සූත්‍රයේ 3 (iii) ඡෙදය යෙදිය යුතුයි.) මේ ඔහුට මේ පස්වෙනි චොතොබිලය ප්‍රහීනවූයේ වේ. මොහුට චෙතොබිල පස ප්‍රහීනවූවාහු වෙති. ඔහුට කවර නම් සිතේ බැමි පසක් සිඳිනලද්දාහු වෙත්ද.

**15.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම (ii) කාමයන්හි පහවූ රාග ඇත්තේවේ. පහවූ කැමැත්ත ඇත්තේවේ. පහවූ ප්‍රේමය ඇත්තේවේ. පහවූ පිපාසය ඇත්තේවේ. පහවූ දැවිල්ල ඇත්තේවේ. පහවූ තෘෂ්ණාව ඇත්තේවේ. මහණෙනි, යම් ඒ භික්ෂුවක් කාමයන්හි පහවූ ආශා ඇත්තේවේද, පහවූ කැමැත්ත ඇත්තේවේද, පහවූ ප්‍රේමය ඇත්තේවේද, පහවූ පිපාසය ඇත්තේවේද, පහවූ දැවිල්ල ඇත්තේවේද, පහවූ තෘෂ්ණාව ඇත්තේවේද, ඔහුගේ සිත කෙලෙස් තවන වීර්යය පිණිස, නැවත නැවත යෙදීම පිණිස, නිතර කිරීම පිණිස ප්‍රධන්වීර්යය පිණිස නැමෙයි යමෙකුගේ සිත කෙලෙස් තවන වීර්යය පිණිස නැවත නැවත යෙදීම පිණිස, නිතර කිරීම පිණිස, ප්‍රධන්වීර්ය පිණිස පවතීද මෙසේ ඔහුට මේ සිතෙහි මේ පළමුවෙනි සිතේ බැම්ම මනාකොට සිඳුනේවේ.

**16.** "මහණෙනි, නැවතද මහණතෙම (මෙහි මේ සූත්‍රයේ 8 ඡෙදය යෙදිය යුතුයි.) රූපයෙහි වීතරාගවේද, ඇතිතාක් බඩපුරා වළඳා සෙයයාවෙහි ඇති සැපය, ස්පර්ශයේදී ඇතිවන සැපය, නිදි දුරුකිරීමෙන් ඇතිවන සැපය යන මෙහි යෙදුනේ වාසය

කරයි. මම මේ සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යයෙන් හෝ ප්‍රසිද්ධ දෙවියෙක් හෝ අප්‍රසිද්ධ දෙවියෙක් වන්නෙමියි එක්තරා දිව්‍යනිකායක් අරමුණු කොට බ්‍රහ්මචර්යායෙහි හැසිරෙයි.

17. "මහණෙනි, යම් ඒ මහණෙක් 'මම සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යයෙන් දෙවියෙක් හෝ එක්තරා දෙවියෙක් වන්නෙමියි, එක්තරා දිව්‍ය නිකායක් අරමුණු කොට බ්‍රහ්මචර්යයෙහි හැසිරෙත්. මහණෙනි, යම් ඒ භික්ෂුවක් මම මේ සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යයෙන් හෝ ප්‍රසිද්ධ දෙවියෙක් හෝ අප්‍රසිද්ධ දෙවියෙක් හෝ වන්නෙමියි. එක්තරා දිව්‍යනිකායක් අරමුණු කොට බ්‍රහ්මචර්යයෙහි හැසිරේද, ඔහුගේ සිත කෙලෙස්තවන වීර්ය පිණිස, නැවත නැවත යෙදීම පිණිස, නිතර ක්‍රියාකිරීම පිණිස, ප්‍රධන්වීර්ය පිණිස නැමෙයි. මෙසේ ඔහුට මේ සිතේ පස්වෙනි බැම්ම සිඳුනේවේ. මොහුට සිතේ බැම් පස සිඳුනේ වෙත්.

18. "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ සිතේ මේ බැම් පස සිඳුනාහුද ඔහුට රාත්‍රියක් හෝ දවාලක් හෝ එයිද කුශලධර්මයන්හි වැඩීමක්ම කැමතිවිය යුත්තාහ. පිරිහීමක් කැමති නොවිය යුත්තාහ. මහණෙනි යම්සේ පූරපක්ෂයෙහි චන්ද්‍රයාගේ යම් රාත්‍රියක් හෝ දවාලක් එයිද වර්ණයෙන් වැඩේමය. මණ්ඩලයෙන්ද වැඩේමය. ආලෝකයෙන් වැඩේ, උසමහතින් වැඩෙයි. මහණෙනි, එසේම යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට මේ චෙතොඛිල පස ප්‍රහීනවූවාහුද සිතේ මේ බැඳීම් පස සිඳුනාහුද ඔහුට යම් දවාලක් හෝ රාත්‍රියක් හෝ එයිද කුශල ධර්මයන්හි අභිවෘද්ධියක්ම කැමතිවිය යුත්තාහ, පිරිහීමක් කැමතිනොවිය යුත්තාහ."

15. **අප්පමාද අග්ගක්ඛාන සූත්‍රය**:- 1. "මහණෙනි, පා නැති හෝ දෙපා ඇත්තාවූ හෝ සිවුපා ඇත්තාවූ හෝ බොහෝ පා ඇත්තාවූ හෝ රූප ඇත්තාවූ හෝ රූප නැත්තාවූ හෝ සංඥා ඇත්තාවූ හෝ සංඥා නැත්තාවූ හෝ සංඥාව නැත්තේමත් සංඥාව නැත්තේත් නොවූ යම්තාක් සත්වයෝ වෙත්ද. තථාගත

අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ඔවුන්ට අග්‍රයයි කියනු ලැබේ.

**2.** "මහණෙනි, එසේම මේ ලොකයෙහි යම්කිසි කුශලධර්ම කෙනෙක් වෙත්ද, ඒ සියල්ලෝ (iii) අප්‍රමාදය මුල්කොට ඇත්තාහ. අප්‍රමාදයෙහි රැස්වන්නාහ. ඒ ධර්මයන්ට අප්‍රමාදය ශ්‍රෙෂ්ඨ යයි කියනු ලැබේ.

**3.** "මහණෙනි, යම්සේ ඇවිදින ප්‍රාණීන්ගේ යම්කිසි පද සමූහයක් වේද, ඒ සියල්ල ඇත්පියෙහි අඩංගුවීමට යයිද, මහත් බැවින් ඇත්පිය ඔවුන්ට ශ්‍රෙෂ්ඨ යයි කියනු ලැබේද, මහණෙනි එසේම යම් ඒ කුශල ධර්ම කෙනෙක් වේද, ඒ සියල්ලෝ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**4.** "මහණෙනි, යම්සේ කුළුගෙයක යම්තාක් පරාල වෙත්ද, ඒ සියල්ල කූටයට නැමුනාහු කූටයට නැඹුරුවූවාහු කූටයෙහි රැස්වන්නාහු කූටය ඔවුන්ට ශ්‍රෙෂ්ඨ යයි යේද, මහණෙනි, එසේම යම්කිසි කුශල ධර්ම කෙනෙක් ඇද්ද, ඒ සියල්ලෝ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**5.** "මහණෙනි, යම්සේ යම්කිසි මුල් සුවඳක් ඇද්ද, මේ කලුවැල් ඔවුන් අතුරින් ශ්‍රෙෂ්ඨ යයි කියනු ලැබේ. මහණෙනි, එසේම යම්කිසි කුශලයක් ඇද්ද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, යම්සේ යම්කිසි හර සුවඳක් ඇත්තේද, රත්සඳුන් ඔවුන් අතුරින් ශ්‍රෙෂ්ඨ යයි, ඔවුන්ට ශ්‍රෙෂ්ඨයයි කියනු ලැබේ. මහණෙනි, එසේම යම්කිසි කුශල ධර්මයක් වේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**7.** "මහණෙනි, යම්කිසි මල් සුවඳක් වේද පිච්චමල් ඔවුන්ට ශ්‍රෙෂ්ඨ යයි කියනු ලැබේ. මහණෙනි, එසේම යම් කිසි කුශල ධර්මයක් වේද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**8.** "මහණෙනි, යම්කිසි කුඩා රජ කෙනෙක් වේද, ඒ සියල්ලෝ සක්විති රජහු අනුව යන්නාහු වෙත්ද ඔවුන්ට සක්විති රජතෙම ශ්‍රෙෂ්ඨයයි කියනු ලැබේ. මහණෙනි, එසේම යම්කිසි කුශල ධර්මයක් වේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

9. "මහණෙනි, යම්තාක් තාරකාවන්ගේ ආලොකයක් ඇද්ද, ඒ සියල්ල සඳ එළියෙන් සොළොස් කලාවෙන් සොළොස් කලාවකටවත් නොවටීද, සඳ එළිය ඔවුන්ට ශ්‍රෙෂ්ඨ යයි කියනු ලැබේ. මහණෙනි, එසේම යම්කිසි කුශල ධර්මයක්වේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

10. "මහණෙනි, යම්සේ සරත් කාලයෙහි වසින ලද අහසෙහි පහවූ වලාකුළු ඇති කල්හි සූර්යයා අහසෙහි වියල වන්නේ අහසෙහිවූ අන්ධකාරය නසා දීප්තිමත් වේ. තමාද බැබලේද, මහණෙනි, එසේම යම් කුශල ධර්මයක් වේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

11. "මහණෙනි, යම්සේ ගංගා යමුනා අචිරවති සරභූ මහී යන මහා ගංගාවෝ වෙත්ද, ඒ සියල්ලෝ මුහුදට වදනාහුද, මුහුදට නැඹුරුවූවාහුද, මුහුදට පහත්වූවාහු මුහුදට නැමුනාහු මහා සමුද්‍රය ඔවුන්ට ශ්‍රෙෂ්ඨ යයි කියනු ලැබේ. මහණෙනි, එසේම යම්කිසි කුශල ධර්ම කෙනෙක් වෙත්ද, ඒ සියල්ලෝ අප්‍රමාදය මුල්කොට ඇත්තාහ. අප්‍රමාදයෙහි රැස්වන්නාහ. ඒ ධර්මයන්ට අප්‍රමාදය ශ්‍රෙෂ්ඨයයි කියනු ලැබේ."

16. **දසාහුණෙය්‍ය සූත්‍රයː-** 1. "මහණෙනි, ඈතින් ගෙනා ආහුනයට සුදුසු ඈතට ගෙනයන පාහුනයට සුදුසු, දක්ෂිණාවට සුදුසු, ඇදිලි බැඳීමට සුදුසු ලොකයාගේ නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රවූ මේ පුද්ගලයෝ දස දෙනෙක් වෙත්.

2. "කවර දස දෙනෙක්දයත්? තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේද, නාමකාය රූපකාය දෙකින් මිදුන උභතොභාග විමුක්ත පුද්ගලයාය. ප්‍රඥාවෙන් ආශ්‍රවක්ෂය කළ ප්‍රඥා විමුක්ත පුද්ගලයාය. කායසක්ඛි පුද්ගලයාය. දිට්ඨිප්පත්ත පුද්ගලයාය, සද්ධා විමුක්ත පුද්ගලයාය ධම්මානුසාරී පුද්ගලයාය, සද්ධානුසාරී පුද්ගලයාය, ගොත්‍රභූ පුද්ගලයාය යනුයි. මහණෙනි, මේ (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

17. **පඨම නාථකරණ ධම්ම සූත්‍රයː-** 1. "මහණෙනි, පිහිට ඇතිව වසව්. පිහිට නැතිව නොවසව්. මහණෙනි, අනාථයා දුකසේ වාසය කරයි. මහණෙනි, පිහිට ඇති කරණ ධර්ම දහසකි.

2. "කවර දහයක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම (ii) සිල්වත්වේද, ප්‍රාතිමොක්ෂ සංවරශීලයෙන් සංවරව වාසය කරයිද, හැසිරීමෙන්ද අරමුණෙන්ද යුක්ත වූයේ ස්වල්පමාත්‍ර වරදෙහි බිය දක්නේ ශික්ෂාපදයන් සමාදන්ව හික්මෙයිද (ii) මහණෙනි, මහණතෙම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මේ ධර්මයද පිහිට ඇතිකරන්නේය.

3. "මහණෙනි, නැවතද (ii) මහණතෙම බහුශ්‍රැතවේද ඇසූදෙය දරන්නේවේද, ඇසූදෙය රැස්කරන්නේවේද, යම් ඒ ධර්ම කෙනෙක් මුල යහපත්ද මැද යහපත්ද, අග යහපත්ද, අර්ථ සහිතද, ව්‍යඤ්ජන සහිතද හාත්පසින් සම්පූර්ණද පිරිසිදු බ්‍රහ්මචර්ය ප්‍රකාශ කෙරෙත්ද, ඔහු විසින් එබඳු ධර්මයෝ බොහෝ අසන ලද්දාහු වෙත්. දරන ලද්දාහු වෙත්. වචනයෙන් පුරුදු කරණ ලද්දාහුවෙත්. සිතින් සිහි කරණ ලද්දාහුවෙත් දෘෂ්ටියෙන් ප්‍රතිවෙධ (iii) කරණ ලද්දාහු වෙත්. මෙහි 3 (ii) යෙදිය යුතුයි.) කරණ ලදද මේ ධර්මයද පිහිට ඇතිකරන්නේය.

4. "මහණෙනි, නැවතද මහණතෙම සීලාදී ගුණවත් මිත්‍රයන් ඇත්තේවේ. යහපත් සහායයන් ඇත්තේවේ. යහපතට නැමෙන්නේවේ. මහණෙනි, මහණතෙම යම් හෙයකින් කල්‍යාණ මිත්‍රයන් ඇත්තේවේද, යහපත් සහායයන් ඇත්තේවේද මේ ධර්මයද පිහිට ඇතිකරයි.

5. "මහණෙනි, නැවතද මහණතෙම කීකරුවේද සුවච බව ඇතිකරණ ධර්මයන්ගෙන් යුක්ත වූයේවේ. අවවාද ඉවසා පිළිගන්නේවේද, මහණෙනි, යම් හෙයකින් මහණ තෙම සුවචවේද සුවච බව ඇති කරණ ධර්මයන්ගෙන් යුක්තවූයේ වේද, ඉවසන්නේවේද, අනුශාසනා දකුණින් ගන්නේවේද, මේ ධර්මයද පිහිට ඇතිකරන්නේයි.

6. "මහණෙනි, නැවතද මහණතෙම (ii) සබ්‍රම්සරුන්ගේ යම් ඒ අසා කළයුතු උස්පහත් වැඩවෙත්ද එහි දක්ෂවේද, අලසනුවූයේවේද, එහි යාමෙහි විමසීමෙන් යුක්තවූයේවේ කරන්ට සමර්ථවේ, විධානයට සුදුසුවේ. (iii) මහණෙනි යම් හෙයකින් මහණතෙම (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) මේ ධර්මයද පිහිට ඇති කරන්නේයි.

7. "මහණෙනි, නැවතද මහණතෙම (ii) ධර්මයට ප්‍රිය කරන්නේවේ. ප්‍රිය ව්‍යවහාර ඇත්තේවේ. අභිධර්මයෙහි හා ඛන්දක පරිවාරයන්හි මහත් ප්‍රමොද ඇත්තේවේ. (iii) මහණෙනි, යම් හෙයකින් මහණතෙම (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) මේ ධර්මයද පිහිට ඇතිකරන්නේය.

8. "මහණෙනි, නැවතද මහණතෙම (ii) අකුශල ධර්මයන් ප්‍රහාණය පිණිස කුශල ධර්මයන් වැඩීම පිණිස ශක්ති ඇත්තේ දැඩි වීර්ය ඇත්තේ කුශලධර්මයන්හි බහා නොතබන වැඩ ඇත්තේ (iii) වාසය කරයි. මහණෙනි, යම් හෙයකින් මහණතෙම (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) වාසය කරයිද මේ ධර්මයද පිහිට ඇතිකරන්නකි.

9. "මහණෙනි, නැත මහණතෙම (ii) යම්කිසි සිවුරු, පිඬු සෙනසුන්, ගිලන්පස, බෙහෙත් පිරිකරින් සතුටුවූයේවේද (iii) මහණෙනි, යම් හෙයකින් මහණ තෙම (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) මේ ධර්මයද පිහිට ඇතිකරන්නේ මේ ධර්මයද පිහිට ඇතිකරන්නකි.

10. "මහණෙනි, නැවත මහණතෙම (ii) ශ්‍රෙෂ්ඨවූ සිහියේ නිපුනභාවයෙන් සිහි ඇත්තේවේද, කළ බොහෝ කල් ඇත්තාවූ කියා බොහෝ කල් ඇත්තාවූ දෙය සිහි කරන්නේවේද, නැවත සිහිකරන්නේවේද, මේ ධර්මයද පිහිට ඇතිකරන්නකි.

2. "මහණෙනි, නැවතද මහණතෙම (ii) මනාකොට දුක් ක්ෂයවීමට යන කලකිරීමට යන පහළවීමට හා අස්තයට යන ආර්යවූ නුවණින් යුක්තවූයේවේ. යම් හෙයකින් මහණ තෙම (මෙහි 11 (ii) යෙදිය යුතුයි.) මේ ධර්මයද පිහිට ඇති කරණ ධර්මයකි."

18. **දුතිය නාථකරණ ධම්ම සූත්‍රය**:- 1. (මේ ඡෙදය මේ වර්ගයේ 17 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

2. (මෙහි මේ වර්ගයේ 17 සූත්‍රයේ 2 (i) (ii) යෙදිය යුතුයි.) ඒකාන්තයෙන් මේ භික්ෂු තෙමේ සිල්වත්වේ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරව වාසය කරයි. හැසිරීමෙන්ද අරමුණෙන්ද යුක්තවූයේ ස්වල්පමාත්‍ර වරදෙහි බිය දක්නා සුලු වූයේ

ශික්ෂාපදයන් සමාදන්ව ආරක්ෂා කරයිද, ස්ථවිර භික්ෂූහුද ඒ භික්ෂුව කිවයුතු කොට සිතත් අනුශාසන කළයුතු කොට මධ්‍යම භික්ෂුහුද නවක භික්ෂුහුද ඒ භික්ෂුව කිවයුතුකොට අනුශාසනා කළ යුතු කොට නොහඟිත්, තෙරුන්වහන්සේලා විසින් අනුකම්පා කරණ ලද ඔහට කුශල ධර්මයන්හි වැඩීමක්ම කැමති විය යුත්තාහ. පිරිහීමක් කැමැති නොවිය යුත්තාහ. මධ්‍යමයන් විසින් අනුකම්පා කරණ ලද (මෙහි මේ සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි) නවකයන් විසින් අනුකම්පා කරණ ලද (මෙහි 2 (ii) යෙදිය යුතුයි) මේ ධර්මයද පිහිට ඇතිකරන්නේය.

3. "මහණෙනි, නැවතද (මෙහි මේ වර්ගයේ 17 සූත්‍රයේ 3 (i) යෙදිය යුතුයි.) කරණ ලදද ඒකාන්තයෙන් මේ (මෙහි මේ වර්ගයේ 17 සූත්‍රයේ 3 (i) යෙදිය යුතුයි.) කරණ ලද්දාහු වෙත්ද ස්ථවිරවරු ඒ භික්ෂුව කිවයුතු කොට අනුශාසනා කළ යුතු කොට හඟිත්. මධ්‍යම භික්ෂූහු ද නවක භික්ෂූහුද කිවයුතු කොට අනුශාසනා කළයුතුකොට හඟිත්, තෙරුන් විසින් අනුකම්පා කරණ ලද මධ්‍යමයන් විසින් අනුකම්පා කරණලද නවකයන් විසින් අනුකම්පා කරණලද මෙහි මේ සූත්‍රයේ 2 (ii) (iii) යෙදිය යුතුයි.)

4. "මහණෙනි, නැවතද මහණ තෙම කල්‍යාණ මිත්‍ර වේද, යහපත් සහායයන් ඇත්තේ වේද, යහපත් අයට නැමෙන්නේ වේද, ඒකාන්තයෙන් මේ මහණ තෙමේ ඒකාන්තයෙන් කල්‍යාණ මිත්‍රය, යහපත් සහායයන් ඇත්තේය. යහපත් අයට නැමෙන්නේය. (ii) ස්ථවිර භික්ෂූහුද ඒ භික්ෂුව කිවයුතුකොට අනුශාසනා කළ යුතුකොට සිතත්, මධ්‍යම භික්ෂූහුද ඒ භික්ෂුව කිවයුතුකොට අනුශාසනා කළ යුතු කොට සිතත්. නවක භික්ෂූහුද ඒ භික්ෂුව කිවයුතු කොට අනුශාසනා කටයුතු කොට සිතත්. තෙරුන් විසින් අනුකම්පා කරණ ලද මධ්‍යමයන් විසින් අනුකම්පා කරණ ලද නවකයන් විසින් අනුකම්පා කරණ ලද ඔහුට කුශල ධර්මයන්හි දියුණුවක්ම කැමති විය යුත්තාහ. පිරිහීමක් කැමති නොවිය යුත්තාහ. මේ ධර්මයද පිහිට ඇතිකරන්නේය.

**5.** "මහණෙනි, නැවතද මහණ තෙම සුවචවේ. සුවච බව කරණ කරුණු වලින් යුක්තවූයේ ඉවසන්නේවේ. අනුශාසනය ගෞරවයෙන් ගන්නේවේ. මේ මහණ තෙම ඒකාන්තයෙන් සුවච බව ඇතිකරණ ධර්මයන්ගෙන් යුක්ත වූයේ ඉවසන්නේ අනුශාසනය ගෞරවයෙන් ගන්නේ වේයයි (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, නැවතද මහණ තෙම සබ්‍රම්සරුන්ගේ යම් ඒ අසා කටයුතු ලොකු කුඩා දේ ඇත්තේවේද, එහි දක්ෂවේද, අලස නුවූයේ වේද, එහි යාමෙහි විසීමෙහි යුක්තවූයේවේ. කරන්ට සමර්ථවේ. විධානයට සුදුසුවේ. මහණෙනි, යම් හෙයකින් මහණ තෙම සබ්‍රම්සරුන්ගේ යම් අසා කළයුතු උස් පහත් දේ ඇද්ද එහි දක්ෂවේ. අලස නුවූයේවේ. එහි යාමෙන් විමසීමෙහි යුක්තවූයේ වේ. කරන්නට සුදුසුවේ විධාන කරන්ට කැමතිවේයයි. (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

**7.** "මහණෙනි, නැවතද මහණ තෙම ධර්මයට කැමැත්තේවේ. ප්‍රිය ව්‍යවහාර ඇත්තේ වේ. අභිධර්මයෙහි හා ඛන්දක පරිවාර නම්වූ විනයෙහි මහත් ප්‍රමොද ඇත්තේ වේද, මහණෙනි, යම් හෙයකින් මහණ තෙම ධර්මය කැමැත්තේවේද, ප්‍රිය ව්‍යවහාර ඇත්තේවේද ඒකාන්තයෙන් මේ මහණ තෙම ධර්මකාමීය. ප්‍රිය ව්‍යවහාර ඇත්තේවේ. අභිධර්මයෙහි හා ඛන්දක පරිවාරයන්හි මහත් ප්‍රමෝද ඇත්තේයයි. (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

**8.** "මහණෙනි, නැවතද මහණතෙම අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශල ධර්මයන්ගේ වැඩීම පිණිස පටන්ගන්නාලද වීර්ය ඇත්තේ ශක්ති ඇත්තේ දැඩි වීර්ය ඇත්තේ කුශල ධර්මයන්හි බහා නොතබන වැඩ ඇත්තේ වාසය කරයි. ඒකාන්තයෙන් මේ මහණතෙමේ අකුශල ධර්මයන් ප්‍රහීනකිරීම පිණිස කුශල ධර්මයන් වැඩීම පිණිස ශක්ති ඇත්තේ දැඩි වීර්ය ඇත්තේ කුශල ධර්මයන්හි බහා නොතබනලද වැඩ ඇත්තේ වාසය කෙරේයයි (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

**9.** "මහණෙනි, නැවතද මහණතෙම යම්කිසි සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් සතුටුවූයේ වේද,

ඒකාන්තයෙන් මේ මහණතෙම යම්කිසි සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් සතුටුවූයේයයි (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

10. "මහණෙනි, නැවතද මහණතෙම ස්මෘතිමත්වේද ශ්‍රෙෂ්ඨවූ ස්මෘතියගේ නිපුනභාවයෙන් යුක්තවූයේ වේද, කළ බොහෝකල් ඇත්තාවූද, කියා බොහෝකල් ඇත්තා වූද, දේ සිහිකරන්නේ වේද, නැවත නැවත සිහිකරන්නේ වේද, මේ මහණතෙම ඒකාන්තයෙන් සිහි ඇත්තේය. ශ්‍රෙෂ්ඨවූ සිහියේ නිපුනභාවයෙන් යුක්තය, කළ බොහෝකල් ඇති, කියා බොහෝ කල් ඇති දෙය වුවත් සිහිකරන්නේය, නැවත නැවත සිහිකරන්නේය, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

11. "මහණෙනි, නැවත මහණතෙම ඤාණවත් වේද ආර්යවූ තියුණු අවබොධය ඇති මනාකොට දුක් ක්ෂයවීමට යන, උත්පත්තිය විනාශය දක්නා නුවණින් යුක්තවූයේවේ. ඒකාන්තයෙන් මේ මහණතෙම ඤාණවන්තය ආර්යවූ තියුණු අවබොධය ඇති මනාකොට දුක් ක්ෂයවීමට ගිය උත්පත්තිය විනාශය දක්නා නුවණින් යුක්තවූයේ යයි, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, පිහිට ඇතිව වාසය කරව්, පිහිට නැතිව වාසය නොකරව්, මහණෙනි, අනාථතෙමේ දුකින් පෙළෙයි. මහණෙනි, මේ පිහිට ඇතිකරණ ධර්ම දසයයි."

19. **සංඛිත්ත අරියවාස සූත්‍රයඃ-** 1. "මහණෙනි, යමක ආර්යයෝ විසුවාහුද, වෙසෙත්ද, වසන්නාහුද මේ ආර්යවාස දසයක් වේ.

2. "කවර දසයක් වෙත්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කරුණු පසකින් දුරුවූයේ වේද, අංග සයකින් යුක්තවූයේ වේද, එක් ආරක්ෂාවක් ඇත්තේද, විමසීම් සතරක් ඇත්තේද, වෙන වෙන ඇත්තයයි කියාගත් දේ විශෙෂයෙන් ප්‍රහීනකළේද නැත්තේද, බැහැරකරණලද සියලු සෙවීම් ඇත්තේද, අවුල්නොවූ කල්පනා ඇත්තේ වේද, සංසිඳුණු කාය සංස්කාර ඇත්තේවේද, කෙලෙසුන්ගෙන් මුදුණු සිත් ඇත්තේද, කෙලෙසුන්ගෙන් මිදුණු ප්‍රඥා ඇත්තේ වේද, (ii) මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**20. විත්ථත සූත්‍රය**:- 1. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුරු රටෙහි කල්මාෂ්‍යදම්‍ය නම් කුරුන්ගේ නියම්ගමක් වේද එහි වාසය කරණසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. භික්ෂූහු 'ස්වාමීනියි', භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, යමෙක්හි ආර්යයෝ විසුවාහුද, වසත්ද, වසන්නාහුද, මේ ආර්ය වාසයෝ දසයෙකැයි වදාළසේක.

2. (මෙහි මේ වර්ගයේ 19 සූත්‍රයේ 2 (i) යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කෙසේ මහණතෙම අංග පසකින් දුරු වූයේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණහට කාමයෙහි ආශාව ප්‍රහීනවූයේ වේ. ව්‍යාපාදය, නිදිබර ගතිය, සිතේ ඇවිස්සීම, කුකුස, සැකය ප්‍රහීනවූයේවේද, මහණෙනි, මෙසේ මහණතෙම අංග පසකින් යුක්තවූයේ වේ.

4. "කෙසේ මහණතෙම අංග සයකින් යුක්තවූයේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඇසින් රූපයක් දැක (ii) සතුටුත් නොවේ, අසතුටුත් නොවේද; සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ උපෙක්ෂා ඇතිව වාසය කරයි. (iii) කනින් ශබ්දයක් අසා (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) නාසයෙන් ගඳසුවඳක් ආඝ්‍රාණය කොට (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) දිවෙන් රසයක් විඳ (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) කයින් ස්පර්ශයක් ලබා (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) සිතින් ධර්මයක් දැන (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි මහණතෙම අංග සයකින් යුක්තවූයේ වේ.

5. "මහණෙනි, කෙසේ මහණතෙම එකම ආරක්ෂාවක් ඇත්තේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සිහියෙන් ආරක්ෂාවූ සිතින් යුක්තව වාසය කරයි. මහණෙනි, මෙසේ වනාහි මහණතෙම එකම ආරක්ෂාවක් ඇත්තේවේ.

6. "මහණෙනි, කෙසේ මහණතෙම විමසීම් සතරකින් යුක්තවේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විමසා බලා එකක් පරිභොග කරයි. විමසා බලා එකක් ඉවසයි. විමසා

බලා එකක් දුරුකරයි. මහණෙනි, මෙසේ මහණතෙම විමසීම් සතරක් ඇත්තේය.

7. "මහණෙනි, කෙසේ මහණතෙම වෙන වෙන බැසගත් සත්‍ය ඇත්තේවේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණහට බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ යම් ඒ බොහෝ වෙන්වූ සත්‍යයෝ ඇද්ද ඒ කවරහුද? ලොකය ශාස්වතයයි කියාද, ලොකය අසාස්වතයයි කියාද, ලොකය කෙළවරක් ඇතැයිද, ලොකය කෙළවරක් නැතැයිද, එයම ජීවය එයම ශරීරයයිද, ජීවය අනිකක ශරීරය අනිකකැයිද, සත්වයා මරණින් මතු වේයයිද, සත්වයා මරණින්මතු නොවේයයිද, සත්වයා මරණින් මතු වේයයිද නොවේයයි කියාද, සත්වයා මරණින් මතු නොදවෙයි නොද නොවෙයි කියාද, ඒ සියල්ල දුරුකළාහු, විශෙෂයෙන් දුරුකළාහු වෙත්. අත්හැරියාහු වෙත්ද, වමාරා දැමුවාහු වෙත්ද, මුදනලද්දාහු වෙත්ද, ප්‍රහීනවූවාහු වෙත්ද, දුරුකරණ ලද්දාහු වෙත්ද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම දුරුකරණලද 'මෙම සත්‍යයයි' යන අදහස් ඇත්තේවේ.

8. "මහණෙනි, කෙසේ මහණතෙම හරනාලද සියලු සෙවීම් ඇත්තේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණහට කාමවස්තූන් සෙවීම ප්‍රහීනවූයේ වේ. භවය සෙවීම ප්‍රහීන වූයේ වේ. බ්‍රහ්මචර්ය සෙවීම සංසිඳුනේ වේද, මහණෙනි, මෙසේ මහණතෙම අත්හළ සියලු සෙවීම් ඇත්තේ වේ.

9. "මහණෙනි, කෙසේ මහණතෙම අවුල්නොවූ අදහස් ඇත්තේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණහට කාම අදහස ප්‍රහීනවූයේ වේද, ව්‍යාපාද අදහස හිංසාකිරීමේ අදහස ප්‍රහීනවූයේ වේද, මහණෙනි, මෙසේ මහණතෙම අවුල්නොවූ කල්පනා ඇත්තේ වේ.

10. "මහණෙනි, කෙසේ මහණතෙම සංසිඳුනු කායසංස්කාර ඇත්තේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සැපද ප්‍රහාණයෙන් දුක්ද ප්‍රහාණයෙන් සොම්නස් දොම්නස් දෙදෙනාගේ අස්තයට යාමට පෙරම දුක්, සැපනැති උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදු බව ඇති සතරවෙනි ධ්‍යානයට

පැමිණ වාසය කරයි. මහණෙනි, මෙසේ වනාහි මහණතෙම සංසිඳුණු කායසංස්කාර ඇත්තේ වේ.

11. "මහණෙනි, කෙසේ මහණතෙම අතිශයින් මිදුන සිත් ඇත්තේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණහුගේ සිත රාගයෙන් මිදුනේ වේ. ද්වෙෂයෙන් සිත මිදුනේ වේ. මොහයෙන් සිත මිදුනේ වේ. මහණෙනි, මෙසේ මහණතෙම අතිශයින් මිදුනු සිත් ඇත්තේ වේ.

12. "මහණෙනි, කෙසේ මහණතෙම අතිශයින් මිදුනු නුවණ ඇත්තේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම 'මාගේ රාගය නැත. (ii) මුලිනුදුරණලදී. අක්සිඳි තල් ගසක්මෙනි. අභාවය කළේය. මතු නූපදින ස්වභාව ඇත්තේ යයි දනී. (iii) මාගේ ද්වෙෂය නැත, (මෙහි 12 (ii) යෙදිය යුතුයි) මාගේ මොහය නැත, (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ මහණතෙම මිදුනප්‍රඥා ඇත්තේවේ.

13. "මහණෙනි, ඉකුත් කාලයෙහි යම්කිසි ආර්ය කෙනෙක් ආර්යවාසයෙහි විසුවාහුද ඒ සියල්ලෝ මේ ආර්ය වාස දසයෙහිම විසුවාහුය. අනාගතයෙහිත්, දැනුත් එසේය.

(2. නාථ වර්ගය නිමි.)

---

## 3. මහා වර්ගය.

21. දසබල සූත්‍රයː- 1. "මහණෙනි, මෘගරාජන්වූ සිංහයා සවස් කාලයෙහි ගුහාවෙන් නික්මෙයි. ගුහාවෙන් නික්ම කිලිපොලයි. කිලිපොලා හාත්පස සිවුදිග බලයි. හාත්පස සිවුදිග බලා තුන්වරක් සිංහනාද කරයි. තුන්වරක් සිංහනාදකර ගොදුරු පිණිස පිටත් වෙයි. ඊට හේතු කවරේද? 'මම විසම ස්ථානවල සිටින පොඩි සතුන් විනාශයට නොපමුණුවම්යි' සිතායි.

2. "මහණෙනි, සිංහ යනු අරහත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේට නමකි. මහණෙනි, තථාගතයන් වහන්සේ පිරිසෙයි යම් ධර්මයක් දේශනා කෙරේද, මෙය උන්වහන්සේගේ සිංහනාදය වෙයි.

3. "මහණෙනි, යම් බලයකින් යුක්තවූ තථාගතයන් වහන්සේ උතුම් කරුණු දන්වයිද, පිරිසෙහි සිංහනාද කරයිද, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වයිද තථාගතයන් වහන්සේගේ තථාගතබල දසයක්වේ.

4. "කවර දසයක්ද යත්? මහණෙනි, මේ ලොකයෙහි තථාගතයන් වහන්සේ ස්ථානය ස්ථානය වශයෙනුත් අස්ථානය අස්ථානය වශයෙනුත් තත්වූ පරිද්දෙන් දනී, මහණෙනි, යම් හෙයකින් තථාගතයන් වහන්සේ ස්ථාන අස්ථාන දෙක තත්වූ පරිද්දෙන් දනීද, (ii) යම් බලයකට පැමිණ තථාගතයන් වහන්සේ උසස් ස්ථානය දන්වයිද, පිරිස්හි සිංහනාද කරයිද, ධර්මචක්‍රය පවත්වයිද මේද තථාගතයන් වහන්සේගේ තථාගත බලයකි.

5. "මහණෙනි, නැවතද තථාගතතෙමේ අතීත අනාගත වර්තමානවූ කර්මයන්ගේ කරුණු වශයෙන් හේතු වශයෙන් විපාකය තත්වූ පරිද්දෙන්ම දනීද, මහණෙනි, මෙයද තථාගතයන් වහන්සේ (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

6. "මහණෙනි, නැවතද තථාගත තෙමේ සියලු ගතිවලට යන ප්‍රතිපදාව තත්වූ පරිද්දෙන් දනීද, මහණෙනි, යම් හෙයකින් තථාගතයන් වහන්සේ සියලු ගතිවලට යන ප්‍රතිපදාව තත්වූපරිදි දනීද මහණෙනි, මෙයද (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

7. "මහණෙනි, නැවතද තථාගතයන් වහන්සේ නොයෙක් ධාතූන් ඇති ධාතු ලොකය තත්වූ පරිද්දෙන් දනීද මහණෙනි, යම්හෙයකින් තථාගතයන් වහන්සේ නොයෙක් ධාතූන් ඇති ධාතු ලොකය තත්වූ පරිද්දෙන් දකීද මහණෙනි, මේ (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

8. "මහණෙනි, නැවතද තථාගතයන් වහන්සේ සත්වයන්ගේ නොයෙක් අධික ලෙස ඇලීම් තත්වූ පරිද්දෙන් දනී මහණෙනි, තථාගතයන් වහන්සේ යම්සේ සත්වයන්ගේ නොයෙක් අධික ලෙස ඇලීම් තත්වූ පරිද්දෙන්දනීද, මහණෙනි, තථාගතයන් වහන්සේ (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

9. "මහණෙනි, නැවතද තථාගතයන් වහන්සේ ප්‍රධාන සත්වයන්ගේද, හීන සත්වයන්ගේද, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ

වැඩීමද හානියද තත්වූපරිද්දෙන් දනීද, මහණෙනි, තථාගතයන් වහන්සේ (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

10. "මහණෙනි, නැවතද තථාගතයන් වහන්සේ සතර ධ්‍යානයන්ගේද අෂ්ට විමොක්ෂයන්ගේද අෂ්ට සමාපත්තීන්ගේද කෙලෙසීම්ද, පිරිසිදුවීමද නැගිටීමද තත්වූ පරිද්දෙන් දනීද මහණෙනි, තථාගතයන් වහන්සේ යම් විධියකින් ධ්‍යාන විමොක්ෂ සමාපත්තීන්ගේ කෙලෙසීමද පිරිසිදු වීමද, නැගිටීමද තත්වූ පරිද්දෙන් දනීද, තථාගතයන් වහන්සේ (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

11. "මහණෙනි, නැවතද තථාගතයන් වහන්සේ නානාප්‍රකාර පූර්වෙනිවාසය සිහිකරත්ද, ඒ මෙසේයි. එක් ජාතියක්ද (මෙහි අංගුත්තරනිකායේ දුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 4 - 5 - 6 ඡේදය යෙදිය යුතුයි.) සිහිකරත්ද මහණෙනි, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

12. "මහණෙනි, නැවතද තථාගතයන් වහන්සේ පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ (මෙහි අංගුත්තරනිකායේ දුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 9 ඡේදය යෙදිය යුතුයි.) දකීද, මහණෙනි මෙයද (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

13. "මහණෙනි, නැවතද තථාගතයන් වහන්සේ ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් ආශ්‍රව රහිත සිත නිදහස්වීමද, ප්‍රඥාව නිදහස්වීමද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරත්ද මහණෙනි, යම්හෙයකින් තථාගතයන් වහන්සේ ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් ආශ්‍රව රහිත සිත නිදහස්වීමද, ප්‍රඥාව නිදහස්වීමද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන පැමිණ වාසය කරත්ද, මහණෙනි, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

14. "මහණෙනි, යම් බලයකින් යුක්තවූ තථාගතයන් වහන්සේ උසස් ස්ථානය භජනය කරත්ද පිරිසෙහි සිංහනාද කරත්ද ධර්මචක්‍රය පවත්වත්ද මේ ඒ තථාගත බල දසයයි."

22. **අධිමුත්තිපද සූත්‍රය:-** 1. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. "ආනන්දය, අධික ලෙස යෙදුන කරුණු අතර යම් ඒ ධර්මයෝ විශෙෂඥානය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්ද ආනන්දය, මම එහි විශාරදව අවබොධය ඇතිකර ගතිමි. ආනන්දය, මේ යම් විධියකින් පිළිපන්නේ ඇති දෙය ඇතැයි දන්නේද, නැතිදෙය නැත්තේයයි දන්නේද, ලාමක දෙය ලාමකයයි දන්නේද, ප්‍රණීත දෙය ප්‍රණීතයයි දන්නේද, වැඩියත් සහිත සිත වැඩියත් සහිත සිතයයි දනී, උසස් නොවූ සිත උසස් නොවූ සිතයයි දනියි. යම් යම්පරිද්දෙකින් එය දතයුතුද, දැක්ක යුතුද ප්‍රත්‍යක්ෂ කටයුතුද එසේ හෝ දන්නේය දක්නේය. ප්‍රත්‍යක්ෂ කරන්නේ යයි මේ කාරණය විද්‍යමානවේ.

2. "ආනන්දය, මම ඒ ඒ අයට ඒ ඒ විධියෙන් ධර්ම දෙශනා කිරීමට මෙහි දක්ෂව ප්‍රතිඥා කරමි. ආනන්දය, ඒ ඒ තන්හි තත්වූ පරිදි දැනීමක් ඇද්ද, ඥාණයන්ගෙන් මෙය ශ්‍රෙෂ්ඨයයි කියනු ලැබේ. ආනන්දය, මේ ඥාණයට වඩා උතුම්වූ ශ්‍රෙෂ්ඨවූ අනික් ඥාණයක් නැතැයි කියමි. ආනන්දය, තථාගතයන් වහන්සේගේ තථාගත බලයෝ මේ දස දෙනෙක් වෙත්.

(මෙහි මේ වර්ගයේ 21 සූත්‍රයේ 3-14 ඡෙදය යෙදිය යුතුයි. එහි 'මහණෙනි' යනු මෙහි 'ආනන්දය' විය යුතුයි.)

23. **ද්වාරත්තය පහාතබ්බ සූත්‍රය**:- 1. "මහණෙනි, කයින් ප්‍රහාණ කටයුතු වචනයෙන් ප්‍රහාණය නොකටයුතු ධර්මයෝ ඇත්තාහ. මහණෙනි, කයින් නොව වචනයෙන් ප්‍රහාණය කටයුතු ධර්මයෝ ඇත්තාහ. මහණෙනි, කයින්ද වචනයෙන්ද ප්‍රහාණය නොකටයුතු ඥාණයෙන් දැක දැක ප්‍රහාණය කටයුතු ධර්මයෝ ඇත්තාහ.

2. "මහණෙනි, කවර ධර්ම කෙනෙක් වචනයෙන් නොව කයින් ප්‍රහාණය කටයුතුද?" මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම කයින් කිසියම් (ii) ඉතා ස්වල්ප අකුශලයකට පැමිණියේද, ඔහුට ඥාණවන්ත සබ්‍රහ්මචාරීහු දැන ආයුෂ්මත්

තෙමේ වනාහි (ii) කයින් කිසියම් ඉතා ස්වල්ප අකුශලයකට පැමිණියේය. ආයුෂ්මත් තෙමේ එකාන්තයෙන් කාය දුශ්චරිතය අත්හැර කාය සුචරිතය වඩන්නේ යහපතැයි' මෙසේ කීවාහුය හෙතෙම නුවණැති සබ්‍රම්සරුන් විසින් දැන කියනු ලබන්නේ කාය දුශ්චරිතය අත්හැර කාය සුචරිතය පුරයි. මහණෙනි, මේ වචනයෙන් නොව කයින් ප්‍රහීන කටයුතු ධර්මයෝයයි කියනු ලැබෙත්.

3. "මහණෙනි, කයින් නොව වචනයෙන් ප්‍රහීන කටයුතු ධර්මයෝ කවරහුද මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම වචනයෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) වචනයෙන් කිසියම් ලේෂ මාත්‍ර අකුශලයකට පැමිණියේය. ආයුෂ්මත් තෙමේ වාක්දුශ්චරිතය අත්හැර වාක්සුචරිතය වඩන්නේ යහපතැයි' කීවාහුය. ඥාණවන්ත සබ්‍රම්සරුන් විසින් දැන කියන්නේ වාක්සුචරිතය අත්හැර වාක්දුශ්චරිතය පුරයි. මහණෙනි, මේ ධර්මයෝ කයින් නොව වචනයෙන් ප්‍රහීන කටයුතු ධර්මයෝය.

4. "මහණෙනි, කවර ධර්මකෙනෙක් කයිනුත් නොව වචනයෙනුත් නොව නුවණින් දැක දැක ප්‍රහීන කටයුතුද? මහණෙනි, ලොභය (ii) කයින් හෝ වචනයෙන් ප්‍රහීන නොකට යුතුය. නුවණින් දැක දැක ප්‍රහීන කටයුතුය. (iii) මහණෙනි, ද්වෙෂය, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මොහය (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, ක්‍රොධය, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, බද්ධවෛරය (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මකුගතිය (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, එකට එකකිරීම (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මහණෙනි මසුරුකම කයිනුත් පහ නොකළ යුතුය. වචනයෙන් ප්‍රහීන නොකළයුතුය නුවණින් දැක ප්‍රහීන කටයුතුය. (ii) මහණෙනි, ලාමක ඊර්ෂයාව කයින් හෝ වචනයෙන් හෝ ප්‍රහීන නොකළ යුතුය. නුවණින් දැක දැක ප්‍රහීන කටයුතුය.

5. "මහණෙනි, ලාමක ඊර්ෂ්‍යාව කවරේද? මහණෙනි, ගෘහපතියෙකුට හෝ ගෘහපති පුත්‍රයෙකුට හෝ ධනයෙන් හෝ ධාන්‍යයෙන් හෝ රිදියෙන් හෝ රත්රනින් හෝ සමෘද්ධ වේද,

එහි එක්තරා දාසයෙකුට හෝ අමුත්තෙකුට 'ඒකාන්තයෙන් මේ ගෘහපතියාට හෝ ගෘහපති පුත්‍රයාට ධනයෙන් හෝ ධාන්‍යයෙන් හෝ රිදියෙන් හෝ රත්රනින් හෝ සමෘද්ධ නොවන්නේ නම් යහපතැයි' මෙබඳු සිතක්වේ, ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ සිවුරු, පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නේවේද, එහි එක්තරා ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට 'ඒකාන්තයෙන් මේ ආයුෂ්මත් තෙමේ සිවුරු, පිඬු, සෙනසුන්, ගිලන්පස, බෙහෙත් පිරිකර, ලබන්නේ නම් යෙහෙකැයි මෙබඳු සිතක්වේ. මහණෙනි, මේ ලාමක ඊර්ෂ්‍යාවයි. මහණෙනි, ලාමක ඊර්ෂ්‍යාව කයින් ප්‍රහානය නොකටයුතුය. වචනයෙනුත් නොව නුවණින් දැන දැන ප්‍රහීන කටයුතුය.

**6.** "මහණෙනි, ලාමක ඊර්ෂ්‍යාව කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් කෙනෙක් ආශ්‍රද්ධාවත්වූයේ 'මා ශ්‍රද්ධාවත්යයි' දැනගන්නාහුනම් කැමතිවේ. දුශ්ශීලවූයේම 'මා සිල්වත්යයි' දන්නාහු නම් යෙහෙකැයි (කැමතිවෙයි.) අල්ප ශ්‍රැතවූයේම 'මා බහුශ්‍රැතයයි' දනී නම් යෙහෙකැයි කැමතිවෙයි පිරිස් හා ගැටුනේ 'මා ප්‍රකර්ෂිවිවෙකයට ගියේ යයි' දන්නාහු යයි කැමතිවෙයි. කම්මැලිවූයේ මා පටන් ගන්නා ලද වීර්ය ඇත්තේයයි' දනීවායි කැමතිවෙයි. මුළා සිහි ඇත්තේම 'මා එළඹ සිටි සිහි ඇත්තේයයි' දන්නාහුයයි කැමතිවෙයි. නොසන්සිඳුනේ සංසිඳුනේයයි 'මා දනීවායි කැමතිවෙයි.' නුවණ නැත්තේ මා ප්‍රඥාවන්තයයි දනීවායි කැමතිවෙයි. ක්ෂීණාශ්‍රව නොවූයේම 'මා කෙළෙසුන් නැති කෙනෙකැයි' දනීවායි කැමතිවෙයි. මහණෙනි, මේ ලාමක ඊර්ෂ්‍යාවයයි කියනු ලැබේ. (මෙහි 4 (iv) යෙදිය යුතුයි.

**7.** "මහණෙනි, ඉදින් ඒ භික්ෂුව ලොභය (ii) මැඩපවත්වා වාසයකරයිද, (iii) ද්වෙෂ (මෙහි 7 (ii) යෙදිය යුතුයි) මොහය (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ක්‍රොධය (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) බද්ධවෛරය (මෙහි 7 (ii) යෙදිය යුතුයි) ගුණමකුගතිය (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) යුගග්‍රාහය (එකටඑක කිරීම) (මෙහි 7 (ii) යෙදිය යුතුයි) මසුරුකම (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ලාමක ඊර්ෂ්‍යාව (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) යට කොට වාසය

කරයිද (ii) හෙතෙම තෙමේ යම්සේ දන්නා හට ලොභය නොවේද 'මේ ආයුෂ්මත් තෙමේ එසේ නොදනී' එසේම ආයුෂ්මත් මා ලොභය (v) යටකොට වාසය නොකරයි යම්සේ දන්නාහට ද්වෙෂය නොවේද, මේ ආයුෂ්මත් තෙමේ එසේ නොදනී' මොහය, ක්‍රොධය, බද්ධවෛරය, ගුණමකුගතිය, එකටඑක කිරීම, මසුරුකම ලාමක ඊර්ෂ්‍යාව හා ලාමක බලාපොරොත්තු නොවේද එසේමැයි ආයුෂ්මත්හු ලාමක බලාපොරොත්තු මා මැඩපවත්වා ඉරියව් පවත්වයි.

8. "ඉදින් මහණෙනි, ඒ භික්ෂුව ලොභය (ii) මැඩ නොපවත්වා ඉරියව් පවත්වයිද, (iii) ද්වෙෂය (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) මොහය (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) ක්‍රොධය (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) බද්ධවෛරය, (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) ගුණමකු ගතිය, (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) එකට එකකිරීම (මෙහි 8 (ii) යෙදිය යුතුයි) මසුරුකම, (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) ලාමක ඊර්ෂ්‍යාව, (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) ලාමක බලාපොරොත්තු මැඩ පවත්වා ඉරියව් පවත්වයි' ද, හෙතෙම මෙසේ දතයුතු වන්නේය. යම්සේ දන්නාහට ලෝභය නොවේද, එසේ මේ ආයුෂ්මත්තෙමේ දනී. එසේම යම්සේ දන්නාහට ලෝභය නොවේද, එසේම ආයුෂ්මත් මා ලෝභය මැඩ නොපවත්වා ඉරියව් පවත්වයි. යම්සේ දන්නාහට ලෝභය නොවේ නම් එසේ මේ ආයුෂ්මත් තෙමේ දනී.'

9. "යම්සේ දන්නාහට ද්වෙෂය නොවේද, 'මේ ආයුෂ්මත් තෙමේ එසේ නොදනීයයි' මෙසේ දතයුතු වන්නේය. 'මා ද්වෙෂය යටකොට වාසය නොකරයිද, යම්සේ දන්නාහට ද්වෙෂය නොවේද, මේ ආයුෂ්මත් තෙම එසේ නොදනී. ආයුෂ්මත්හු ද්වෙෂය මැඩපවත්වා ඉරියව් පවත්වයි. යම්සේ දන්නා හට ද්වෙෂය නොවේනම් එසේ මේ ආයුෂ්මත් තෙමේ දනී.

10- - 11. (මේ ඡෙද මේ සූත්‍රයේ 9 ඡෙදය මෙනි. "ද්වෙෂය' වෙනුවට, ක්‍රොධය, බද්ධවෛරය, ගුණමකුගතිය, එකට එක කිරීම, මසුරුකම, ලාමක ඊර්ෂ්‍යාව, ලාමක බලාපොරොත්තු' යන වචන යෙදීමෙන් ඡෙද හත සාදාගත යුතුයි.)

**24. මහාචුන්ද - සහජාති සූත්‍රයඃ-** 1. එක්කාලයෙක්හි ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ චෙතිය නුවර සහජාතිය නම් ස්ථානයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි මහණෙනියි' කියා භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක. ඒ භික්ෂූහු 'ඇවැත්නියි' කියා ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ.

**2.** ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි, 'ධර්මය දනිමි. මේ ධර්මය දනිමියි' ඥාණවාදය කියන්නාවූ භික්ෂුව දනිමියි' කීයේය. (ii) ඇවැත්නි, ඉදින් ඒ භික්ෂුව ලෝභය මැඩපවත්වා වාසය කරයිද, ද්වෙෂය මැඩපවත්වා වාසය කරයිද, ලාමක ඊර්ෂ්‍යාව මැඩපවත්වා වාසය කරයිද, ක්‍රොධය මැඩපවත්වා වාසය කරයිද, බද්ධවෛරය මැඩපවත්වා වාසය කරයිද, ගුණමකු ගතිය මැඩපවත්වා වාසය කරයිද, එකට එක කිරීම මැඩපවත්වා වාසය කරයිද, මසුරුකම මැඩපවත්වා වාසය කරයිද, ලාමක බලාපොරොත්තු මැඩපවත්වා වාසය කරයිද, හෙතෙම මෙසේ කිවයුතු වන්නේය. 'යම්සේ දන්නාහට ලෝභය නොවේද, මේ ආයුෂ්මත් තෙමේ එසේ නොදනී. එසේම ආයුෂ්මත් මා ලෝභය යටකොට සිටී, මේ ආයුෂ්මත් තෙමේ එසේ නොදනී. එසේම ආයුෂ්මත් මා ලෝභය යටකොට නොසිටී.

**3 - 10.** (මේ ඡෙදය මේ වර්ගයේ 23 සූත්‍රයේ 9 - 16 ඡෙද මෙන් වේත්.)

**11.** 'මහණෙනි, භාවනාවාදය කියන්නාවූ මහණතෙම වඩනලද කය ඇත්තේද, වඩනලද සිල් ඇත්තේද, වඩනලද සිත් ඇත්තේද වඩනලද ප්‍රඥා ඇත්තේද, (මෙහි මේ සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.)

**12 - 19.** (මේ ඡෙද මේ වර්ගයේ 23 සූත්‍රයේ 9 - 16 ඡෙද මෙන් වේත්)

**20.** "ඇවැත්නි, මහණතෙම ඥාණවාදයද භාවනාවාදයද කියන්නේ මේ ධර්මය දනිමි, මේ ධර්මය දකිමි, වඩනලද ශරීර

ඇත්තේ, වඩනලද සිල් ඇත්තේ, වඩනලද සිත් ඇත්තේ, වඩනලද නුවණ ඇත්තේද වේ. (මෙහි මේ සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.)

21 - 28. (මෙහි ඡේද මේ වර්ගයේ 23 සූත්‍රයේ 9-15 ඡේද මෙන් වෙත්.)

29. "ඇවැත්නි, පුරුෂයෙක් යම්සේ දිළිඳුවූයේම ධනපති වාදය කියන්නේද, නිර්ධන වූයේම ධන වාදය කියන්නේද, භොග නැත්තේම වස්තු වාදය කියන්නේද, හෙතෙම ධනයෙන් කටයුතු යම්කිසි වැඩක් එළඹිකල්හි ධනය හෝ ධාන්‍ය හෝ රිදී හෝ රත්රන් හෝ බැහැරකොට දීමට නොහැකිවන්නේද ඔහු මෙසේ දන්නාහුය මේ ආයුෂ්මත්තෙමේ දිළිඳුවූයේම ආඪ්‍ය වාදය කියයි. ධන නැත්තේම ධන වාදය කියයි. භොග නැත්තේ වස්තුවාදය කියයි. ඊට හේතු කවරේද? එසේම මේ ආයුෂ්මත්තෙමේ ධනයෙන් කළයුතු යමක් පැමිණිකල්හි ධන, ධාන්‍ය, රිදී, රත්රන් හෝ බැහැර කොට දීමට නොහැකි වෙයි.

30. "ඇවැත්නි, එසේම මහණතෙමේ ඥාණ වාදය කියන්නේ භාවනාවාදය කියන්නේ 'මේ ධර්මය දනිමි. මේ ධර්ම දකිමි. වඩනලද කය ඇත්තේ වෙමි' වඩනලද සිල් ඇත්තේ, වඩනලද ප්‍රඥා ඇත්තේ, (මෙහි මේ සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.)

31 - 38. (මේ ඡේද මේ වර්ගයේ 23 සූත්‍රයේ 9-16 ඡේද මෙන් වෙත්.)

**25. කසිණායතන සූත්‍රය**:- 1. "මහණෙනි, මේ කසිනස්ථාන දසයක් වෙත්.

2. "කවර දසයක්ද යත්? එකෙක් උඩ යට සරස දෙකක් නැති අප්‍රමාණ පෘථුවියම දන්නා පෘථුවි කසිනය හඳුනයි. ඇතැම් කෙනෙක් ආපො කසිනය අඳුනයි. තෙජො, වායො නීල, පීත, ලොහිත ඔදාත, ආකාශ විඥ්ඥාණ උඩ යට සරස දෙකක් නැති අප්‍රමාණවූ විඥ්ඥාණ කසිනය ඇතැම් කෙනෙක් හඳුනයි. මහණෙනි, මේ දස කසිනායතනයෝයි."

**26. කාළී කුරරඝරිකා සූත්‍රය**:- 1. "එක් කාලයෙක්හි ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරයන් වහන්සේ අවන්ති ජනපදයෙහි

කුරරඝරයෙහි පවත්ත පර්වතයෙහි වාසය කරණ සේක. ඉක්බිති කුරරඝරික කාලි උපාසිකාතොමෝ ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ මේ තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් මහා කච්චායන තෙරුන් වැඳ එකත්පසෙක හුන්නාය.

2. "එකත්පසෙක සිටි කුරරඝරික කාලී උපාසිකා තොමෝ ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරයන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කුමාරී ප්‍රශ්නයන්හි,

> (ii) "අර්හත්ව නම් අර්ථයාගේ පැමිණීමට හෘදයේ ශාන්තිය පිණිස ප්‍රියවූ යහපත්වූ වස්තූන්හි ඇතිවෙන රාගාදී ක්ලෙශසේනාව හුදකලාව දවන්නේ සැපය අවබොධ කෙළෙමි. එහෙයින් මනුෂ්‍යයන් අතරෙහි මිත්‍ර ධර්මයක් නොකරමි. මට කිසිවකු විසින් මිත්‍ර ධර්මයක් නො සපයා යයි" වදාළසේක්ද?

"භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරණ ලද මෙහි කෙසේ විස්තර වශයෙන් අර්ථය දතයුතුද?"

3. "නැගනියෙනි, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ පෘථුවි කසින සමාපත්තිය ශ්‍රෙෂ්ඨ අර්ථයයි ගෙන අර්ථය උපදවා ගත්තාහුය. නැගනියෙනි, පෘථුවි කසින සමාපත්තියගේ උතුම් බව යම්තාක්ද භාග්‍යවතුන් වහන්සේ එය විශිෂ්ට ඥානයෙන් දැනගත්සේක. භාග්‍යවතුන් වහන්සේ එය විශිෂ්ට ඥානයෙන් දැන එය ඉපදීමට හේතුව දත්සේක. දොෂය (දුක) දැනගත් සේක. හික්මීම (නිරෝධ සත්‍යය) දත්සේක. මාර්ග අමාර්ග නුවණ දත්සේක. ඔහුගේ මුල දැකීමේ හේතුවෙන් දොෂය දැකීමේ හෙතුවෙන් නික්මීම දැකීමේ හෙතුවෙන්, මග නොමග දැකීමේ හේතුවෙන්, අර්ථයට පැමිණීම හෘදය ශාන්තියට පැමිණීම දක්නාලද්දේ විය. නැගනියෙනි, ආපො කසින, තෙජෝවායො-නීල-පීත-ලොහි- ඔදාත - ආකාශ - (මේ එක එක කසිනයක් පාසා මෙහි 3 ඡෙදය යෙදිය යුතුය) නැගණියෙනි විඤ්ඤාණ කසින සමාපත්තියගේ උතුම්බව යම්තාක්ද, භාග්‍යවතුන් වහන්සේ එය විශිෂ්ට ඥානයෙන් දත්සේක. භාග්‍යවතුන් වහන්සේ එය විශිෂ්ට ඥානයෙන් දැන එය ඉපදීමට හේතුව දත්සේක. දොෂය දත්සේක. නික්මීම දත්

සේක. මාර්ග අමාර්ග නුවණ දත්සේක. ඔහුගේ මූල දැකීමේ හේතුවෙන්, දොෂය දැකීමේ හේතුවෙන් නික්මීම දැකීමේ හේතුවෙන් මග නොමග දැකීමේ හේතුවෙන් අර්ථයට පැමිණීම හෘදය ශාන්තියට පැමිණීම දන්නා ලද්දේ විය. කුමාරි ප්‍රශ්නයෙහි (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

"යමක් වදාරණ ලද්දේද, නැඟණියෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරණලද මේ භාෂිතයාගේ අර්ථය විස්තර වශයෙන් මෙසේ දතයුතුයි."

**27. මහාපඤ්හ සූත්‍රයඃ-** 1. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනයෙහි අනේපිඬුමහ සිටුහුගේ අරමෙහි වාසය කරණසේක. ඉක්බිති බොහෝ භික්ෂූහු පූර්වාහ්න වේලාවෙහි හැඳ පොරවා පාත්‍රා සිවුරු රැගෙන සැවැත්නුවරට පිඬු පිණිස පැමිණියාහුය. ඉක්බිති ඒ භික්ෂූන්ට (ii) තවම සැවැත්නුවර පිඬු සිඟීමට කල් නොවෙයි. අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනෙක්හිද එහි යන්නෙමු නම් යෙහෙකැයි' සිතූහ.

2. ඉක්බිති ඒ භික්ෂූහු අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම්තැනෙක්හිද එහි වැඩියාහුය. වැඩ ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටුවූවාහුය. සතුටුවිය සතුටුවියයුතුවූ සිහිකටයුතු වූ කථාවකොට නිමවා එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක සිටි ඒ භික්ෂූන්ට (ii) අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ 'ඇවැත්නි, ශ්‍රමණ ගෞතමතෙම ශ්‍රාවකයන්ට 'මහණෙනි, මෙහි එව්. සියලු ධර්මය දනිව්. සියලු ධර්මය දැන දැන වාසය කරව් යයි' මෙසේ බණ කියාදැයි" ඇසුවාහුය.

3. "ඇවැත්නි, අපිද ශ්‍රාවකයන්ට 'ඇවැත්නි, තොප මෙහි එව් සියලු ධර්මය දනිව්. සියලු ධර්මය දැන දැන වාසය කරව්යයි' මෙසේ ධර්ම දෙශනා කරමු."

"ඇවැත්නි, ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ හෝ අපේ ධර්ම දෙශනාවෙන් ධර්මදේශනාවගේ හෝ අනුශාසනාවෙන් අනුශාසනයේ හෝ විශෙෂය කුමක්ද, අදහස කුමක්ද, වෙන් කිරීම කුමක්දැයි' ඇසූහ.

4. ඉක්බිති ඒ භික්ෂූහු අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ වචනයට සතුටු නොවූවාහුය. අක්‍රොශ නොකළාහුය. (ii) සතුටු නොවී ආක්‍රොශ නොකොට අස්නෙන් නැගිට "භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ වචනයාගේ අර්ථය දැනගන්නෙමුයි' ගියාහුය. (iii) ඉක්බිති ඒ භික්ෂූහු සැවැත්නුවර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලැක්කේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහුය.

5. එකත්පසෙක සිටි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, අපි මෙහි උදය වරුවෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරුගෙන සැවැත්නුවරට පිඬු පිණිස පිවිසියෙමු. ස්වාමීනි, ඒ අපට (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) අදහසක් විය. ස්වාමීනි, ඉක්බිති අපි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනෙක්හිද එහි පැමිණියෙමු. පැමිණ ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටුවීමු. සතුටු වියයුතු සිහිකටයුතු කථාවකොට නිමවා එකත්පසෙක හුන්නෙමු. ස්වාමීනි එකත් පසෙක හුන්කල්හි අපට (මෙහි 2 (ii) සහ 3 යෙදිය යුතුයි.)

6. "ස්වාමීනි ඉක්බිති අපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ වචනයට සතුටුනොවූම්හ. ආක්‍රොශ නොකළම්හ. (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

7. "මහණෙනි, මෙසේ කියන්නාවූ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ කියයුතුයි. 'ඇවැත්නි (ii) එක් ප්‍රශ්නයෙකි එක් කියාදීමකි එක් විස්තරයකි. ප්‍රශ්න දෙකකි. කියාදීම් දෙකකි. විස්තර දෙකකි. ප්‍රශ්න තුනෙකි කියාදීම තුනෙකි විස්තර තුනෙකි. ප්‍රශ්න සතරකි. කියාදීම් සතරකි. විස්තර සතරකි. ප්‍රශ්න පසකි. කියාදීම් පසකි. විස්තර පසකි. ප්‍රශ්න සයකි කියාදීම් සයකි. විස්තර සයකි. ප්‍රශ්න සතකි. කියාදීම් සතකි විස්තර සතකි. ප්‍රශ්න අටකි. කියාදීම් අටෙකි. විස්තර අටෙකි ප්‍රශ්න නවයෙකි. කියාදීම් නවයකි. විස්තර නවයකි. ප්‍රශ්න දසයකි. කියාදීම් දසයකි. විස්තර දසයකියි' මහණෙනි, මෙසේ විචාරණලද්දාවූ

අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ සම්පාදනය කොට කියන්ට නොහැකිවන්නාහ. මත්තෙහිද දුකට පැමිණෙනාහ. ඊට හේතු කවරේද? මහණෙනි, එය නොවැටහීමයි.

8. "මහණෙනි, මරුන් සහිත බඹුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙවි මිනිසුන් සහිත සත්වයන් අතරෙහි දෙවියන් සහිත ලොකයෙහි යමෙක් මේ ප්‍රශ්න ප්‍රකාශ කිරීමෙන් සිත සතුටු කරන්නේද, තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයන් හෝ මෙයින් අසා හෝ හැර ඔහු මම නොදකිමි. එක ප්‍රශ්නයෙකි. කියාදීම් එකකි. විස්තර එකකැයි මෙසේ වනාහි මෙය කියනලද්දේද එය කුමක් සඳහා කියන ලද්දේද?

9. "මහණෙනි, එකධර්මයෙක්හි මනාකොට මහණතෙම කලකිරෙන්නේ නො ඇලෙන්නේ මනාකොට මිදෙන්නේ මනාකොට කෙළවර දක්නේ සම ස්වභාවයට නුවණින් පැමිණ මෙලොවම දුක් කෙළවර කරන්නේවේ. කවර එක් ධර්මයෙක්හිද? (ii) සියලු සත්වයෝ ආහාරය නිසා සිටින්නාහුය යන, (iii) මහණෙනි, මේ එක ධර්මයෙහි මහණතෙම මනාකොට කලකිරෙන්නේ, මනාකොට නොඇලෙන්නේ, මනාකොට මිදෙන්නේ, මනාකොට කෙළවර දක්නේ, සම ස්වභාවයට නුවණින් පැමිණ මෙලොවම දුක් කෙළවර කරන්නේවේ. එක් ප්‍රශ්නයකි. එක් කියාදීමකි. එක් විස්තර කිරීමකියි, යමක් කියනලද්දේද එය මේ සඳහා කියන ලදී.

10. (මේ ඡේදය මේ සූත්‍රයේ 9 ඡේදය මෙනි. "එක් ධර්මයෙක්හි" වෙනුවට 'ධර්ම දෙකක්ද' 9 (ii) 'ආහාරය' වෙනුවට 'නාමයෙහිද රූපයෙහිද' යෙදිය යුතුයි.)

11. (මේ ඡේදය මේ සූත්‍රයේ 9 ඡේදය මෙනි. 'එක් ධර්මයෙක්හි' වෙනුවට 'ධර්ම තුනක්ද' 9 (ii) 'ආහාරය' 'වෙනුවට වෙදනාතුනෙහි' යෙදිය යුතුයි.)

12. (මේ ඡේදය මේ සූත්‍රයේ 9 ඡේදය මෙනි. එක් ධර්මයෙක්හි' වෙනුවට 'ධර්ම හතරක්ද' 9 (ii) 'ආහාරය' වෙනුවට 'ආහාර සතරෙහි' යෙදිය යුතුයි.)

13. (මේ ඡේදය මේ සූත්‍රයේ 9 ඡේදය මෙනි.) 'එක් ධර්මයෙක්හි' වෙනුවට ධර්ම පහක්ද' 9 (ii) 'ආහාරය' වෙනුවට 'උපාදාන ස්ඛන්ධ පසෙහි' යෙදිය යුතුයි.)

14. (මේ ඡේදය මේ සූත්‍රයේ 9 ඡේදය මෙනි. 'එක් ධර්මයෙක්හි' වෙනුවට 'ධර්ම හයක්ද' 9 (ii) 'ආහාරය' වෙනුවට 'ඇතුළත ඇති ආයතන සයෙහි' යනුද යෙදිය යුතුයි.) එය මේ සඳහා කියනලදී.

15. (මේ ඡේදය මේ සූත්‍රයේ 9 ඡේදය මෙනි. 'එක් ධර්මයෙක්හි' වෙනුවට 'ධර්ම හතක ද 9 (ii) 'ආහාරය' වෙනුවට 'විඤ්ඤාණ සතෙහි' යෙදිය යුතුයි.)

16. (මේ ඡේදය මේ සූත්‍රයේ 9 ඡේදය මෙනි. 'එක් ධර්මයෙක්හි' වෙනුවට 'ධර්ම අටක්' ද 9 (ii) 'ආහාරය' වෙනුවට 'ලොක ධර්ම අටෙහි' යෙදිය යුතුයි.)

17. (මේ ඡේදය මේ සූත්‍රයේ 9 ඡේදය මෙනි 'එක් ධර්මයෙක්හි' වෙනුවට 'ධර්ම නවයකද 9 (ii) 'ආහාරය' වෙනුවට 'සත්වයන් වසන තැන් නවයෙහි' යනුද යෙදිය යුතුයි.)

18. (මේ ඡේදය මේ සූත්‍රයේ 9 ඡේදය මෙනි. 'එක් ධර්මයෙක්හි' වෙනුවට 'ධර්ම දහයක'ද 9 (ii) 'ආහාරය' වෙනුවට 'දශ අකුශල ධර්මයන්හි' යනුද යෙදිය යුතුයි.)

28. **කජංගලා සූත්‍රයඃ-** 1. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කජංගලානුවර වෙළුවනයෙහි වාසය කරණසේක. ඉක්බිති කජංගලයෙහිවූ බොහෝ උපාසකවරු කජංගලා භික්ෂුණිය යම්තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ කජංගලා භික්ෂුණිය වැඳ එකත්පසෙක සිටියාහුය.

2. එකත්පසෙක සිටි කජංගලයෙහි වූ උපාසකයෝ කජංගල භික්ෂුණියට "ආර්යාවෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මහා ප්‍රශ්නයන්හි එක් ප්‍රශ්නයෙකි. එක් කියාදීමකි. එක් විස්තරයකි. ප්‍රශ්න දෙකකි. කියාදීම් දෙකකි. විස්තර දෙකකි ප්‍රශ්න තුනකි. කියාදීම් තුනකි. විස්තර තුනකි. ප්‍රශ්න සතරකි. කියාදීම් සතරකි. විස්තර සතරකි. ප්‍රශ්න පසකි. කියාදීම් පසකි. විස්තර පසකි

ප්‍රශ්න සයකි කියාදීම් සයකි විස්තර සයකි. ප්‍රශ්න සතකි. කියාදීම් සතකි. විස්තර සතකි. ප්‍රශ්න අටකි. කියාදීම් අටකි විස්තර අටකි. ප්‍රශ්න නවයකි. කියාදීම් නවයකි විස්තර නවයකි. ප්‍රශ්න දසයකි. කියාදීම් දසයකි. විස්තර දසයකියි මෙය වදාරණ ලද්දේය බුදුරජාණන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරණලද මෙහි කෙසේ විස්තර වශයෙන් අර්ථය දතයුතුද, ඇවැත්නි, මෙය භාග්‍යවතුන් වහන්සේ සමීපයෙන් නොඅසනලදී. සමීපයෙන් නොපිළිගන්නාලදී. සිත දියුණුකරණ භික්ෂූන් සමීපයෙන්ද නොඅසන ලදී. පිළිනොගන්නා ලදී.”

3. “එතකුදුවුවත් යම්සේ මෙය වැටහේද, එය අසව් මනාකොට මෙනෙහිකරව්, කියන්නෙමියි” කීවාය. ආචාර්යයන් වහන්ස, එසේ යයි’ කජංගලායෙහි වූ උපාසකයෝ කජංගලා භික්ෂුණියට ප්‍රතිවචන දුන්හ.

4. “කජංගලා භික්ෂුණිය, එක යන ප්‍රශ්නයකි. එක කියාදීමකි. එක විස්තරයකියි කියා භාග්‍යවතුන් වහන්සේ මෙසේ යමක් වදාරණ ලද්දේද? මෙය කුමක් සඳහා වදාරණ ලද්දේද?

(ii) “ඇවැත්නි, මහණතෙම එක් ධර්මයෙක්හි (iii) මනාකොට කලකිරෙන්නේ නොඇලෙන්නේ මනාකොට මිදෙන්නේ මනාකොට කෙළවර දක්නේ සම ස්වභාවයට නුවණින් පැමිණ මෙලොවම දුක් කෙළවර කරන්නේ වේ. (iv) කවර එක් ධර්මයෙක්හිද? සියලු සත්වයෝ ආහාරය නිසා සිටින්නාහුය යන මේ ධර්මයෙහියි (මෙහි 4 (ii) සහ (iii) යෙදිය යුතුයි. එක යන ප්‍රශ්නයෙකි. එක කියාදීමකි. එක විස්තර කිරීමකි. මෙසේ ඒ යමක් වදාරණ ලද්දේනම් මෙය මේ සඳහා වදාරණලදී.”

5. “ප්‍රශ්න දෙකකි කියාදීම් දෙකකි දෙක දෙක විස්තර කිරීමකියි (ii) භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ මෙය වදාරණ ලද්දේ නම් එය කුමක් සඳහා වදාරණ ලද්දේද?”

“ඇවැත්නි, මහණතෙම ධර්ම දෙකෙක්හි (මෙහි 4 (iii) යෙදිය යුතුයි.) (iii) කවර දෙකක්හිදයත්. නාමයද රූපයද යන දෙක කෙරෙහිය. (මෙහි 5 (i) එහි 4 (iii) යෙදිය යුතුයි.) (මෙහි

5 (i) යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේ නම් මෙය මේ සඳහා වදාරණ ලදී.

6. (i) "ප්‍රශ්න තුනකි, කියාදීම් තුනකි. විස්තර කිරීම් තුනකියි (ii) මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

"ඇවැත්නි, මහණතෙම ධර්ම තුනෙක්හි (මෙහි 4 (iii) යෙදිය යුතුයි.) කවර තුනෙක්හිද යත්, වේදනා තුන කෙරෙහිය (මෙහි 6 (i) එහි 4 (iii) යෙදිය යුතුයි.) (මෙහි 6 (i) යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේ නම් මෙය මේ සඳහා වදාරණ ලදී.

7. (i) ප්‍රශ්න සතරකි, කියාදීම් සතරකි, විස්තර කිරීම් සතරකියි (ii) මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

"ඇවැත්නි, මහණතෙම ධර්ම සතරෙක්හි (මෙහි 4 (iii) යෙදිය යුතුයි.) කවර සතරෙක්හිද යත්, සතිපට්ඨාන සතරෙහිය (මෙහි 7 (i) එහි 4 (iii) යෙදිය යුතුයි.) (මෙහි 7 (i) යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේනම්, මෙය මේ සඳහා වදාරණ ලදී.

8. (i) ප්‍රශ්න පහකි, කියාදීම් පහකි, විස්තර කිරීම් පහකියි (ii) මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

'ඇවැත්නි, මහණතෙම ධර්ම පසෙක්හි, (මෙහි 4 (iii) යෙදිය යුතුයි.) කවර පසක් කෙරෙහිදයත්, පඤ්චෙන්ද්‍රියයන් කෙරෙහිය (මෙහි 8 (i) එහි 4 (iii) යෙදිය යුතුයි.) (මෙහි 8 (i) යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේ නම් මෙය මේ සඳහා වදාරණ ලදී.

9. (i) ප්‍රශ්න හයකි, කියාදීම් හයකි, විස්තර කිරීම් හයකියි (ii) මෙහි 5 (ii) යෙදිය යුතුයි.

"ඇවැත්නි මහණතෙම ධර්ම හයෙක්හි, මෙහි 4 (iii) යෙදිය යුතුයි.) කවර හයක් කෙරෙහිදයත්, නිස්සාරනීය ධාතු නම් අධ්‍යාත්මික ආයතන සය කෙරෙහිය 9 (i) එහි 4 (iii) යෙදිය යුතුයි.) (මෙහි 9 (i) යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේ නම්, මෙය මේ සඳහා වදාරණ ලදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

10. (i) ප්‍රශ්න හතකි, කියාදීම් හතකි, විස්තර කිරීම් හතකි (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

"ඇවැත්නි, මහණතෙම ධර්ම හතෙක්හි (මෙහි 4 (iii) යෙදිය යුතුයි) කවර හතක් කෙරෙහිදයත්, බොජ්ඣංග සත කෙරෙහිය. (මෙහි 10 (i) එහි 4 (iii) යෙදිය යුතුයි) මෙහි 9 (i) යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේ නම්, මෙය මේ සඳහා වදාරණලදී.

11. (i) ප්‍රශ්න අටකි, කියාදීම් අටකි, විස්තර කිරීම් අටකි. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

"ඇවැත්නි, මහණතෙම ධර්ම අටෙක්හි (මෙහි 4 (iii) යෙදිය යුතුයි.) කවර අටක් කෙරෙහිදයත්, ආර්ය අෂ්ටාංගික මාර්ගය කෙරෙහිය. (මෙහි 11 (i) එහි 4 (iii) යෙදිය යුතුයි.) (මෙහි 11 (i) යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණලද්දේ නම් මෙය මේ සඳහා වදාරණලදී.

12. (i) ප්‍රශ්න නවයකි, කියාදීම් නවයකි විස්තර කිරීම් නවයකි. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

"ඇවැත්නි, මහණතෙම ධර්ම නවයෙක්හි (මෙහි 4 (iii) යෙදිය යුතුයි) කවර නවයක් කෙරෙහිදයත්, නවප්‍රකාර සත්වයන් වසන තැන්හිය. (මෙහි 12 (i) එහි 4 (iii) යෙදිය යුතුයි.) (මෙහි 12 (i) යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේ නම්, මෙය මේ සඳහා වදාරණ ලදී.

13. (i) 'ප්‍රශ්න දහයකි, කියාදීම් දහයකි, විස්තර කිරීම් දසයකි, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.

"ඇවැත්නි, මහණතෙම ධර්ම දසයෙක්හි (මෙහි 4 (iii) යෙදිය යුතුයි.) කවර දසයක් කෙරෙහිදයත්, දශකුසල ධර්ම පථයන්හි (මෙහි 13 (i) එහි 4 (iii) යෙදිය යුතුයි.) (මෙහි 13 (i) යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේනම්, මෙය මේ සඳහා වදාරණලදී.

14. "ඇවැත්නි, මේ දසධර්මයන් කෙරෙහි මහණ තෙම මනාකොට පුරුදුකරණලද සිත් ඇත්තේ මනාකොට කෙළවර

දක්නේ සම ස්වභාවයට නුවණින් පැමිණ මෙලොවම දුක්කෙළවර කරන්නේවේ. ප්‍රශ්න දසයකි, කියාදීම් දසයකි, විස්තර දසයකියි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ යමක් වදාරණ ලද්දේ නම් මහාප්‍රශ්නයෙහි එය මේ සඳහා වදාරණ ලදී.

**15.** (මෙහි මේ සූත්‍රයේ 4 (i) ඡේදය යෙදියයුතුයි. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් වදාරණ ලද්දාහු මොහුගේ මෙසේ විස්තර වශයෙන් අර්ථය දනිමි. ඇවැත්නි තෙපි කැමැත්තහු නම් භාග්‍යවතුන් වහන්සේ කරාම පැමිණ මෙහි අර්ථය අසව්. යම්සේ අපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරයිද එසේ එය දරන්නහුය"

"ආර්යයන් වහන්ස, එසේ යයි, කජංගලායෙහි උපාසකවරු කජංගලා භික්ෂුණියගේ කියමනට සතුටුව අනුමෝදන්ව හුනස්නෙන්නැගිට කජංගලා භික්ෂුණිය වැඳ පැදකුණුකොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහුය.

**16.** එකත්පසෙකසිටි කජංගල උපාසකයෝ කජංගල භික්ෂුණිය සමග යම් කථාසල්ලාපයක් වූයේද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළකළහ "ගෘහපතිවරුනි, ගෘහපති, ගෘහපති, ගෘහපතිවරුනි, කජංගලා භික්ෂුණිය පණ්ඩිතය ගෘහපතිවරුනි, කජංගලා භික්ෂුණිය මහාප්‍රාඥය, ගෘහපතිවරුනි, ඉදින් තොප මා කරා පැමිණ මේ කාරණය විචාළාහු නම් මම ද මෙය කජංගලා භික්ෂුණිය ප්‍රකාශ කළාක් මෙන් මෙසේම ප්‍රකාශ කරන්නෙමි. මෙහි අර්ථය මෙය, එය එසේම දරව්යයි" වදාළසේක.

**29. කාසිකොසල සූත්‍රය:-** 1. "මහණෙනි, කාසිකොසල දනවු වැස්සෝ යම්තාක්ද, පසෙනදි කොසොල් රජහුගේ රටෙහි රජවරු යම්තාක්ද, එහි පසේනදි කොසොල් රජු අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි, පසෙනදි කොසොල් රජුගේ වෙනස්වීමක් ඇත්තේමය. මරණයක්ද ඇත්තේමය. මහණෙනි, මෙසේ දන්නාවූ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකතෙම ඒ සමීපයෙහිද කලකිරෙයි අග්‍ර රජකමෙහිද නො ඇලෙයි, පහත් දෙයෙහි කියනුම කවරේද?

2. "මහණෙනි, දහසක් ලොකය හැමතැනම යම්තාක් චන්ද්‍ර සූර්යයෝ පරිහරණය කෙරෙත්ද බැබලීමෙන් දිශාවන් හොබවත්ද ඒ දහසක් ප්‍රමාණ ලොකයෙහි චන්ද්‍රයන් දහසෙක, සූර්යයන් දහසෙක. මහමෙර දහසෙක, දඹදිව දහසෙක, අපරගොයාන දහසෙක උතුරුකුරු දිවයින් දහසෙක, පූර්වවිදෙහ දහසෙක, මහාසමුද්‍ර සාරදහසෙක. මහරජවරු සාරදහසෙක, චාතුර්මහාරාජික දහසෙක, තව්තිසා දහසෙක, යාම දහසෙක, තුෂිත දහසෙක. නිර්මාණරතී දහසෙක. පර නිර්මිත වසවර්ති දහසෙක, බ්‍රහ්මලොක දහසෙකි, මහණෙනි සහ ශ්‍රී ලොකධාතුව යම්තාක්ද, මහාබ්‍රහ්මතෙම එහි අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි, මහා බ්‍රහ්මයාගේද වෙනස්වීමක් ඇත. මරණයක්ද ඇත. (ii) මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්යශ්‍රාවක තෙමේ එහිද කලකිරෙයි. එහි කලකිරෙන්නේ අග්‍ර පදවියෙහි කලකිරෙයි. ලාමක දෙය ගැන කියනුම කවරේද?

3. "මහණෙනි, යම් හෙයකින් මේ ලොකය නැසේද, මහණෙනි ලොකය නැසෙන කල්හි සත්වයෝ බොහෝ සෙයින් ආභස්සරයෙහි උපදින්නාහුවෙත්. ඔවුහු එහි ඉබේ දිලිසෙන්නාහු, අහස හැසිරෙන්නාහු, සුභ ස්ථානගතවූවාහු' සිතින් උපදවාගත් ප්‍රීතිය අනුභව කරන්නාහු බොහෝ වැඩි කාලයක් සිටිත්. මහණෙනි, ලොකය නැසෙන කල්හි ආභස්සරදෙවියෝ අග්‍රයයි කියනු ලැබෙත්. මහණෙනි, ආභස්සරදෙවියන්ගේද වෙනස්වීමක් ඇත මරණයක් ඇත. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) කියනුම කවරේද?

4. "මහණෙනි, මේ කසින ක්ෂෙත්‍රයෝ දසයකි. මෙය (මෙහි 3 වර්ගයේ 25 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ කසින ක්ෂෙත්‍ර දසයෙන් එකෙක් උඩයට සරස දෙකක් නැති අප්‍රමාණවූ යම් මේ විඤ්ඤාණ කසිනයක් අඳුනයිද, මහණෙනි, මෙසේ සංඥා ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. මහණෙනි, මෙබඳු සංඥා ඇති සත්වයන්ට වෙනස්වීමක් ඇත. අනිත්‍යයක් ඇත, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

5. "මහණෙනි, මේ මැඩපවත්වන කරුණු අටක් වෙත්. කවර අටක්ද යත්? කෙනෙක් තමාතුළවූ රූපය නිමිතිකොට

භාවනාව බොහෝ පුරුදු කරන්නේද, පිටත දෙය නිමිති කොට හොඳට පුරුදු කළ භාවනාවන් වශයෙන් නොවැඩූමනා වර්ණ ඇති හෝ දුර්වර්ණ රූපයන් දකී. ඔවුන් මැඩපවත්වා දනිමි දකිමියි මෙබඳු සංඥා ඇත්තේවේ. මේ ප්‍රථම අභිභායතනයයි කෙනෙක් තමා තුළවූ රූපයෙහි පරිකර්ම කරන්නේ පිටත දුර්වර්ණ වශයෙන් මහත්වූ මනාවර්ණ ඇති හෝ දුර්වර්ණ රූපයන් දකී. ඔවුන් මැඩපවත්වා දනිමි, දකිමියි, මෙබඳු සංඥා ඇත්තේවේ. මේ දෙවෙනි අභිභායතනයයි. කෙනෙක් තමා තුළ වූ අරූපයෙහි පරිකර්ම කරන්නේ පිටත අර්පණා වශයෙන් නොවැඩූ මනාවර්ණ ඇති හෝ දුර්වර්ණ ඔවුන් මැඩපවත්වා දනිමි දකිමියි මෙබඳු සංඥා ඇත්තේවේ. මේ තුන්වෙනි අභිභායතනයයි.

**6.** "කෙනෙක් තමා තුළවූ අරූපයෙහි පරිකර්ම කරන්නේ පිටත අර්පණා වශයෙන් අප්‍රමාණවූ මනාවර්ණ හෝ දුර්වර්ණවූ රූපයන් දකී. ඔවුන් මැඩපවත්වා දනිමි දකිමියි මෙබඳු සංඥා ඇත්තේවේ. මේ සතරවෙනි අභිභායතනයයි.

**7.** "කෙනෙක් තමා තුළ අරූප පරිකර්ම කරන්නේ පිටත අර්පණා වශයෙන් නිල්වූ නීලවර්ණවූ නිල් පෙනීම ඇති නිලට බබලන රූපයන් දකී උම්මා පුෂ්පය යම්සේ නිල්ද නිල්පාටද නිලට උදාහරණද, නිලෙන් බබලාද ඒ බරණැස වස්ත්‍රය යම්සේ දෙපාර්ශවයෙන් මදිනා ලද්දේද නිල්ද නිල්පාටද නිලට නිදර්ශනද නිලින් බබලාද, එසේම අධ්‍යාත්මයෙහි කෙනෙක් අරූප පරිකර්ම කරන්නේ නිල්වූ නිල්පාටවූ නිලට නිදර්ශනවූ නිලින් බබලන්නාවූ රූපයන් දකී. ඔවුන් මැඩපවත්වා දනිමි දකිමියි මෙබඳු සංඥා ඇතිවේ. මේ පස්වෙනි අභිභායතනයයි.

**8.** "කෙනෙක් තමාතුළවූ අරූපයෙහි පරිකර්ම කරන්නේ කහවූ, කහපාටවූ, කහට නිදර්ශනවූ, කහෙන් බබලන පිටත අර්පණාවශයෙන් රූප දකිත්ද කිණිහිරි මල් යම්සේ කහද, කහපාටද, කහට නිදර්ශනද කහෙන් බබලාද බරණැස් වස්ත්‍රය හෝ යම්සේ දෙපාර්ශවයෙන් මදිනා ලද්දේද කහද කහපාටද

කහට නිදර්ශනද, කහෙන් බබලාද එසේම කෙනෙක් තමාතුළ අරූපයෙහි පරිකර්ම කරන්නේ කහවූ කහපාට ඇති කහට නිදර්ශනවූ කහෙන් බබලන පිටත රූපයන් දකී. ඔවුන් මැඩපවත්වා දනිමි දකිමියි මෙබඳු සංඥා ඇත්තේවේ. මේ සවෙනි අභිභායතනයයි.

9. "කෙනෙක් තමාතුළවූ අරූපයෙහි පරිකර්ම කරන්නේ රතුවූ රතුපාට ඇති රතට නිදර්ශනවූ රතින් බබලන රූපයන් දකී. බඳුවද මල් යම්සේ ලෙයද, රතුපාටද ලෙයට නිදර්ශනද ලෙයින් බබලාද බරණැස වස්ත්‍රයක් යම්සේ දෙපාර්ශවයෙන් මදිනා ලද්දේ රතුද ලේපාටද ලෙයට නිදර්ශනද ලෙයින් බබලාද එසේම කෙනෙක් තමාතුළ අරූපයෙහි පරිකර්ම කරන්නේ රතුවූ රතුපාට ඇති ලෙයට නිදර්ශනවූ ලෙයින් බබලන රූපයන් දකීද, ඔවුන් මැඩපවත්වා දනිමි දකිමියි. මෙසේ සංඥා ඇත්තේවේ. මේ සත්වෙනි අභිභායතනයයි.

10. "කෙනෙක් තමාතුළවූ අරූපයෙහි පරිකර්ම කරන්නේ සුදුවූ සුදුපාට ඇති සුදට නිදර්ශනවූ සුදින් බබලන පිටත රූපයන් දකියි. යම්සේ දහවත් තරුව (ඔසධිතාරකාව) සුදුද, සුදුපාටද සුදට නිදර්ශනද සුදින් බබලාද බරණැස් වස්ත්‍රය හෝ යම්සේ දෙපාර්ශවයෙන් මදිනා ලද්දේද සුදුද සුදුපාටද සුදට නිදර්ශනද එසේම කෙනෙක් අධ්‍යාත්මයෙහි අරූප යන සංඥා ඇත්තේ සුදුවූ සුදුපාට ඇති සුදට නිදර්ශන වූ සුදින් බබලන රූපයන් දකී. ඔවුන් මැඩපවත්වා දනිමි දකිමි යන සංඥා ඇත්තේවේ. මේ අටවෙනි අභිභායතන යයි මහණෙනි, මේ අට අභිභායතනයෝයි.

11. "මහණෙනි, මේ අභිභායතන අටින් යම් මේ කෙනෙක් තමාතුළවූ අරූපයෙහි පරිකර්ම කරන්නේ සුදුවූ සුදුපාට ඇති සුදට නිදර්ශනවූ සුදින් බබලන රූපයන් දකීද ඔවුන් මැඩපවත්වා දනිමි. දකිමියි, යන මෙසේ සංඥා ඇත්තේ වේද, මහණෙනි, මෙබඳු සංඥා ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. මහණෙනි, මෙබඳු සංඥා ඇත්තාවූ සත්වයන්ගේ වෙනස්වීමක් ඇත. මරණයක් ඇත. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

12. "මහණෙනි, මේ ප්‍රතිපදා සතරක් වෙත්. කවර සතරක්දයත්. දුක් ප්‍රතිපදාව ප්‍රමාද අභිඥාව. දුක් ප්‍රතිපදාව වහා ලැබෙන අභිඥාව, සැප ප්‍රතිපදාව ප්‍රමාදව ලැබෙන අභිඥාව, සැපවූ ප්‍රතිපදාව වහා ලැබෙන අභිඥාව යන, මහණෙනි, මේ සතර ප්‍රතිපදාවෝය. මහණෙනි, මේ සතර ප්‍රතිපදාවන්ගෙන් යම් මේ සැපවූ ප්‍රතිපදාව වහා ලැබෙන අභිඥාය යන යමක් ඇද්ද මේ සතර ප්‍රතිපදාවන්ගෙන් මෙය ශ්‍රෙෂ්ඨයි. මහණෙනි, මෙසේ පිළිපන් සත්වයෝ ඇත්තාහ. මෙසේ පිළිපන්නාවූ සත්වයන්ගේද වෙනස් ස්වභාවයක් මරණයක් ඇත්තේය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

13. "මහණෙනි, මේ සංඥාවෝ සතරදෙනෙක් වෙත් කවර සතර දෙනෙක්ද යත්, කෙනෙක් කාමාවචරය අඳුනයි. කෙනෙක් රූපාරූපභව අඳුනයි, ලොකොත්තරය අඳුනයි, කෙනෙක් කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනය හඳුනයි, මහණෙනි, මේ සතර සංඥාවෝය. මහණෙනි, මේ සතර සංඥාවන්ගෙන් යම් මේ කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනය හඳුනයිද, මෙය ශ්‍රෙෂ්ඨයි, මහණෙනි, මෙබඳු සංඥා ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. මහණෙනි, මෙබඳු සංඥා ඇති සත්වයන්ගේ වෙනස්වීමක් ඇත්තේය, මරණයක් ඇත්තේය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

14. "මහණෙනි, බුද්ධශාසනයෙන් බැහැරවූ දෘෂ්ටීන්ගේ යම් මේ නොදවන්නෙමි. මාගේ නොවන්නේය. නොවන්නෙමි, මට නොවන්නේයයි' යන මෙය ශ්‍රෙෂ්ඨය. මහණෙනි, මෙබඳු දෘෂ්ටි ඇත්තේ භවයෙහි යම් මේ නොපිළිකුල් කමක් වේද, ඒ ඔහුට නොවේයයි භවයාගේ නිරුද්ධවීමෙහි යම් පිළිකුල් බවක් වේද, ඔහුට එය නොවන්නේයයි කැමතිවිය යුතුයි. මහණෙනි, මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. මහණෙනි, මෙබඳු දෘෂ්ටි ඇති සත්වයන්ට වෙනස්වීමක් මරණයක් ඇත්තේය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

15. "මහණෙනි, ඉතා උසස් ශුද්ධිය පනවන ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඉතා උසස් ශුද්ධිය පනවන්නවුන්

අතුරෙන් යම් මේ සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයිද මෙය ශ්‍රෙෂ්ඨයි. ඔව්හු එය විශිෂ්ඨඥානයෙන් දැන එය ප්‍රත්‍යක්ෂකිරීම පිණිස බණ කියයි. මහණෙනි, මෙසේ කියන්නාවූ සත්වයෝ ඇත. මහණෙනි, මෙසේ කියන්නාවූ සත්වයන්ට වෙනස්වීමක් ඇත්තේය. මරණයක් ඇත්තේය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**16.** "මහණෙනි, මේ ආත්මයෙහිම ශ්‍රෙෂ්ඨ නිර්වාණය පනවන ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔව්හු මේ ආත්මයෙහිම ශ්‍රෙෂ්ඨ නිර්වාණය පනවත්. මහණෙනි, මේ ආත්මයෙහිම ශ්‍රෙෂ්ඨ නිර්වාණය පනවන්නන් අතුරෙන් යම් මේ සය වැදෑරුම් ස්පර්ශයන්ගේ පහළවීමද විනාශයද ආශ්වාදයද දොෂයද නික්මීමද තත්වූ පරිද්දෙන් දැන තෘෂ්ණමාන දෘෂ්ටි වශයෙන් දැඩි කොට නොගෙන යම් මිදීමක් ඇද්ද, මෙය ශ්‍රෙෂ්ඨයි මහණෙනි, මා මෙසේ කියුම් ඇත්තේ මෙසේ කීයේයයි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නොවූ හිස් බොරු නොවූ දෙයින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කාමයන්ගේ විශෙෂ දැනීම නොපනවයි. රූපයන්ගේ විශෙෂ දැනීම නොපනවයි. වෙදනාවන්ගේ විශෙෂ දැනීම නොපනවයි' යයි මා අභිභවා කියත්. මහණෙනි, මම කාමයන්ගේ විශෙෂ දැනීම කියමි. රූපයන්ගේ විශෙෂ දැනීම කියමි. වෙදනාවන්ගේද විශෙෂ දැනීම කියමි. මේ ආත්මයෙහිම තෘෂ්ණාව දුරුකළේ නිවුනේ සිහිල්වූයේ කෙලෙස් අල්වා ගැනීම් නැති පිරිනිවීම පනවමියි වදාළසේක."

**30. පසේනදි පච්චකාර සූත්‍රය**:- 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසල අනේපිඬුසිටානන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි පසේනදි කොසොල් රජතෙම දිනන ලද යුද්ධ ඇත්තේ ලබන ලද බලාපොරොත්තු ඇත්තේ ඒ ව්‍යාජ යුද්ධයෙන් නැවතුනේවේ. ඉක්බිති පසේනදි කොසොල් රජ තෙම ආරාමය යම් තැනෙක්හිද එහි පැමිණියේය. වාහනයෙන් යායුතු බිම යම්තාක්ද එතාක් වාහනයෙන් ගොස් වාහනයෙන් බැස පාබල සෙනඟ ඇත්තේ ආරාමයට ඇතුළ්වූයේය.

**2.** එකල්හි වනාහි බොහෝ භික්ෂූහු එලිමහනෙහි සක්මන් කෙරෙත්, ඉක්බිති පසෙනදි කොසොල් රජ තෙම ඒ භික්ෂූහු යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ඒ භික්ෂූන්ට, "ස්වාමීනි, භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ දැන් කොහි වාසය කෙරෙත්ද?"

"මහරජ, මේ වසන ලද දොර ඇති විහාරයයි (ii) එහි නිශ්ශබ්දව පැමිණ ඉක්මන් නොවී පිට බරාඳයට ඇතුළ් වී කාරා අගුල තට්ටුකරව, භාග්‍යවතුන් වහන්සේ තොපට දොර හරිනසේක."

**3.** ඉක්බිති පසේනදී කොසොල් රජ තෙම වසන ලද දොර ඇති ඒ විහාරය යම් තැනෙක්හිද එහි නිශ්ශබ්දව පැමිණ ඉක්මන් නොවී පිට බරාඳයට ඇතුළ්ව කාරා අගුලට තට්ටු කළේය. භාග්‍යවතුන් වහන්සේ දොර හළ සේක. ඉක්බිති පසේනදි කොසොල් රජතෙම විහාරයට පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා මුවින්ද සිඹියි. දෙඅතින්ද පිරිමදියි, "ස්වාමීනි, මම පසේනදී කොසොල්ය. ස්වාමීනි, මම පසේනදී කොසොල්යයි" නමද අස්වයි.

**4.** "මහරජ ඔබ කවර කාරණයක් දකිමින් මේ ශරීරයෙහි අතිශය ගෞරවය කරයිද, මෛත්‍රී එලවීමක් කරයිද?"

"ස්වාමීනි, මම කෙළෙහිගුණ දැන්ම, කළගුණ සැළකීම මනාකොට දක්නේ මෙසේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු ශ්‍රෙෂ්ඨ ගෞරවයක් කරමි. මෛත්‍රී පූජාවක් පවත්වමි.

**5.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වනාහි බොහෝ දෙනාට හිත පිණිස පිළිපන්නේය. බොහෝ දෙනාට සැප පිණිස පිළිපන්නේය. බොහෝ දෙනා යම් මේ යහපත් ස්වභාවයක කුශල ධර්ම සංඛ්‍යාත ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි පිහිටවූහ. (ii) ස්වාමීනි, මම මේ කාරණයද දක්නේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු ශ්‍රෙෂ්ඨ ගෞරවයක් මෛත්‍රී එළවීමක් කරමි.

**6.** "ස්වාමීනි, නැවතද භාග්‍යවතුන් වහන්සේ සිල්වත් වූයේ වැඩුණු සිල් ඇත්තේ ශ්‍රෙෂ්ඨ සිල් ඇත්තේ නිපුණවූ සිල් ඇත්තේ, නිපුණවූ ශීලයෙන් යුක්තවූයේ වේ. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

7. "ස්වාමීනි, නැවතද භාග්‍යවතුන් වහන්සේ බොහෝ කලක් අරණ්‍යයෙහි වාසය කළේ අරණ්‍යයෙහි වන පෙදෙසෙහි පිහිටියාවූද ප්‍රාන්තයන්හි පිහිටියාවූද සෙනසුන් ආශ්‍රයකරයිද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම් හෙයකින් බොහෝ කාලයක් අරණ්‍යයෙහි විසූසේක් වනයෙහි බොහෝ ඈත පිහිටියාවූද ප්‍රාන්තයන්හි පිහිටියාවූද සෙනසුන් ආශ්‍රය කරයි (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

8. "ස්වාමීනි, නැවතද භාග්‍යවතුන් වහන්සේ ඒ ඒ සිවුරු, පිඬු, සෙනසුන්, ගිලන්පසය, බෙහෙත් පිරිකර කෙරෙහි සතුටු වෙයිද, යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ ඒ ඒ සිවුරු, පිඬු, සෙනසුන්, ගිලන්පස, බෙහෙත් පිරිකරින් සතුටුවේද, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

9. "ස්වාමීනි, නැවතද භාග්‍යවතුන් වහන්සේ පූජාවට සුදුසුය. ආගන්තුක සත්කාරයට සුදුසුය, දන්දීමට සුදුසුය. දෙඅත් හිස තබා වැඳීමට සුදුසුය. ලොකයාගේ ඉතා උසස් පින් කෙතය. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

10. "ස්වාමීනි, නැවතද භාග්‍යවතුන් වහන්සේ කෙළෙස් මනාකොට දුරුකරණ සිත පිබිදීමට සුදුසු යම් කථාවක්වේද, එනම් මද ආශා ඇතිකරණ කථාවය, සන්තොෂ කථාවය, විවේකයෙහි වටිනාකම ඇති කථාවය, කුල සංසර්ග නොවීමේ කථාවය, වීර්යාරම්භයේ කථාය, සීල කථාවය, සිත එකඟ කිරීමේ කථාවය, ප්‍රඥාව සම්බන්ධ කථාය, මාර්ග ඵල සම්බන්ධ කථාය, සිහිකිරීමේ නුවණ පිළිබඳ කථාය, මෙබඳු කථා නිරුත්සාහයෙන් ලබන්නේ වේද, නිදුකින් ලබන්නේ වේද, පහසුවෙන් ලබන්නේ වේද, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

11. "ස්වාමීනි, නැවතද භාග්‍යවතුන් වහන්සේ ශ්‍රෙෂ්ඨ සිතෙහිවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇති ධ්‍යාන සතර නිරුත්සාහයෙන් ලබන්නේ වේද, නිදුකින් ලබන්නේ වේද, පහසුවෙන් ලබන්නේ වේද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම්සේ ශ්‍රෙෂ්ඨ සිතෙහිවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇති ධ්‍යාන සතර අයත්නයෙන් ලබන්නේවේ. නිදුකින් ලබන්නේවේ, පහසුවෙන් ලබන්නේවේ. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

12. "ස්වාමීනි, නැවතද භාග්‍යවතුන් වහන්සේ (මෙහි අංගුත්තරනිකායේ දුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 4, 5, 6 ඡේදය යෙදිය යුතුයි.)

13. "ස්වාමීනි, නැවතද භාග්‍යවතුන් වහන්සේ (මෙහි අංගුත්තරනිකායේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.) (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

14. "ස්වාමීනි, නැවතද භාග්‍යවතුන් වහන්සේ ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රවරහිත සිත නිදහස්වීමද ප්‍රඥාව නිදහස් වීමද, මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයිද, ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ යම් සේ ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත සිත නිදහස්වීමද, ප්‍රඥාව නිදහස් වීමද මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට වාසය කරයි (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

"ස්වාමීනි, එසේනම් දැන් යමි. අපට බොහෝ කටයුතුය බොහෝ වැඩපලය."

"මහරජ, දැන් යම් බඳුවූ තොප කල් දනිව්" ඉක්බිති පසෙනදී කොසොල් රජතෙමේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේය."

(3 මහා වර්ගය නිමි.)

---

## 4. උපාලි වර්ගය

31. උපාලි දසත්ථවස සූත්‍රයඃ- 1. ඉක්බිති ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් උපාලිස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි' කරුණු කීයක් නිසා තථාගතයන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට සික්ෂාපදය පනවන ලද්දේද, පාමොක් උදෙසන (පෝය ගේකදී

පසළොස්වක් අමාවක් දෙදින සංඝයා මැද එක්නමක් ශික්ෂාපද කීම) ලද්දේදැයි' ඇසීය.

"උපාලිය, කරුණු දහයක් නිසා තථාගතයන් විසින් ශ්‍රාවකයන්ට ශික්ෂාපදය පනවන ලදී. පාමොක් උදෙසන ලදී. කවර දසයක්ද යත්? සංඝයාගේ යහපත් බව පිණිස, සංඝයාගේ පහසුව පිණිස, නිශ්ශබ්ද කරවීමට අපහසු පුද්ගලයන්ට නිග්‍රහකිරීම පිණිස; ශික්ෂාකාමී පුද්ගලයන්ගේ පහසු විහරණ පිණිස, මේ ආත්මයෙහි වන ආශ්‍රවයන්ගේ සංවරය පිණිස, පරලෙව්හි වන ආශ්‍රවයන්ගේ නැසීම පිණිස, අප්‍රසන්නවූවන්ගේ ප්‍රසාදය පිණිස, ප්‍රසන්නවූවන්ගේ වැඩි පැහැදීම පිණිස, සද්ධර්මයාගේ පැවැත්ම පිණිස, හික්මීමට උපකාර පිණිස, උපාලිය මේ කරුණු දහය නිසා තථාගතයන් විසින් ශ්‍රාවකයන්ට ශික්ඛාපද පනවනලදී. ප්‍රාතිමොක්ෂය උදෙසනලදී."

32. **පාතිමොක්ඛට්ඨපනා සූත්‍රය**:- 1. "ස්වාමීනි, පාමොක් නැවැත්වීම් කෙතෙක්ද?" "උපාලිය, පාමොක් නැවැත්වීම් දසයෙක. කවර දසයක්ද යත්?

2. "පාරාජිකාවූවෙක් ඒ පිරිසෙහි සිටියේ වේද පාරාජිකා කථාවක් කියා නතරකෙළේ වේද, උපසපන් නුවූවෙක් ඒ පිරිසෙහි සිටියේ වේද, අනුපසම්පන්නයකු ගැන කථාවක් කියා නතරකළේවේද, ශික්ෂා හැරදැමූවෙක් ඒ පිරිසෙහි සිටියේවේද, ශික්ෂා හැරදැමූ කථාවක් කියා නතරවූයේ වේද, නපුංසකයෙක් ඒ පිරිසෙහි සිටියේ වේද, නපුංසක කථාවක් කියා නතරවූයේ වේද භික්ෂුණීන් දූෂ්‍ය කල කෙනෙක් ඒ පිරිසෙහි සිටියේවේද, භික්ෂුණී දූසක කථාවක් කියා නතරකෙළේ වේද, උපාලිය, මේ දසය පාමොක් නැවැත්වීමය."

33. **උබ්බාහිකා සූත්‍රය**:- 1. "ස්වාමීනි, කවර ධර්මයන්ගෙන් යුක්තවූ මහණතෙමේ එසවීමකින් සම්මතකළ යුතුද? උපාලිය, ධර්ම දහයකින් යුක්තවූ මහණතෙම එසවීමකින් සම්මත කළ යුතුය. කවර දසයකින්ද යත්?

2. "උපාලිය, මේ ශාසනයෙහි මහණතෙම සිල්වත් වේද, ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙන් සංවරව වාසය කරයිද,

පිළිපැදීමෙන් හා අරමුණෙන් යුක්තද, ස්වල්පමාත්‍ර වරදෙහිත් බිය දක්නාසුළු වේද, ශික්ෂාපදයන් සමාදන්ව හික්මෙයිද ඇසූ දේ දරණ ඇසූ දේ රැස්කරණ බහුශ්‍රැතයෙක් වේද, යම් ඒ ධර්ම කෙනෙක් මුල යහපත්ද, මැද යහපත්ද, අග යහපත්ද, අර්ථ සහිතද, ව්‍යඤ්ජන සහිතද, හාත්පසින් පිරිසිදුද, පිරිසිදු බ්‍රහ්මචර්ය කියත්ද, ඔහු එබඳු ධර්මයෝ බොහෝ අසනලද්දාහු වෙත්, දරණලද්දාහු වෙත්, වචනයෙන් පුරුදුකරණ ලද්දාහුවෙත්, සිතින් බලනලද්දාහු වෙත්, දෘෂ්ටියෙන් අවබෝධ කරන ලද්දාහු වෙත්ද, ඔහු ප්‍රාතිමොක්ෂ දෙක විස්තර වශයෙන් සූත්‍ර වශයෙන් ව්‍යඤ්ජන වශයෙන් කටපාඩම් කළාහු වෙත්ද, බෙදනලද්දාහු වෙත්. පවත්වන ලද්දාහු වෙත්. විනිශ්චයකරණ ලද්දාහුවෙත්. විනයෙහි සිටියේ නොසෙල්විය හැක්කේ වේ. හිතවතුන් සතුරු දෙදෙන හඟවන්ට නැවත නැවත සිතා බලවන්ට බලන්ට පහදවන්ට දක්ෂවේ. ඇතිවන අධිකරණයන් සංසිඳවීමෙහි දක්ෂවේ. අධිකරණය දනී. අධිකරණයට හේතුව දනී. අධිකරණ තීරණය දනී. අධිකරණ තීරණය කරණ ක්‍රමය දනී උපාලිය, මේ ධර්ම දහයෙන් යුක්තවූ මහණතෙම එසවීමෙන් සම්මතකළ යුතුය."

34. **උපසම්පාදෙතබ්බ සූත්‍රයඃ-** 1. "ස්වාමීනි, කවර ධර්මයකින් යුක්තවූ මහණ විසින් උපසම්පදා කළ යුතුද? "උපාලිය, දස ධර්මයකින් යුක්තවූ මහණහු විසින් උපසම්පදා කළ යුතුය. කවර දසයකින්ද යත්?

2. "උපාලිය, මේ ශාසනයෙහි මහණතෙම සිල්වත්වේද, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරව වාසය කරයිද, පිළිපැදීමෙන් හා අරමුණෙන් යුක්තද, ස්වල්පමාත්‍ර වරදෙහි බිය දක්නාසුළු වේද, ශික්ෂාපදයන් සමාදන්ව හික්මෙයිද, ඇසූ දේ දරණ ඇසූ දේ රැස්කරණ බහුශ්‍රැතයෙක් වේද, යම් ඒ ධර්මකෙනෙක් මුල යහපත්ද මැද යහපත්ද කෙළවර යහපත්ද අර්ථසහිතද ව්‍යඤ්ජන සහිතද හාත්පසින් සම්පූර්ණද, පිරිසුදු බ්‍රහ්මචර්යය ප්‍රකාශ කෙරෙත්ද එබඳු ධර්මයෝ ඔහු විසින් බොහෝ අසනලද්දාහු වෙත්ද දරණලද්දාහු වෙත්ද, වචනයෙන් පුරුදුකරණ ලද්දාහු

වෙත්ද, සිතින් බලන ලද්දාහු වෙත්ද, දෘෂ්ටියෙන් අවබොධ කරණ ලද්දාහු වෙත්ද, ඔහු විසින් ප්‍රාතිමොක්ෂය මනාකොට විස්තර වශයෙන් බෙදන ලද්දාහු වෙත්ද, පවත්වන ලද්දාහු වෙත්ද, විනිශ්චය කරණ ලද්දාහු වෙත්ද, සූත්‍ර වශයෙන් අනුව්‍යඤ්ජන වශයෙන් කටපාඩම්කළාහු වෙත්ද, ගිලනාට උපස්ථාන කරන්නාට හෝ උපස්ථාන කරවන්නට හෝ දක්ෂවේ. නොඇල්ම සංසිඳුවන්නට හෝ සංසිඳුවන්නට හෝ දක්ෂවේ. උපන් කුකුස ධර්මයෙන් දුරුකරන්නට දක්ෂවේ. උපන් දෘෂ්ටීන් ධර්මයෙන් විවේචනය කරන්නට දක්ෂවේ. උසස් ශීලය සමාදන් කරවන්නට දක්ෂවේ. ශ්‍රෙෂ්ඨ චිත්තයෙහි සමාදන් කරවන්නට දක්ෂ වේ ශ්‍රෙෂ්ඨ ප්‍රඥාවෙහි සමාදන් කරවන්නට දක්ෂවේ. උපාලිය, මේ දසධර්මයෙන් යුක්තවූ මහණ මහණහු විසින් උපසම්පදා කළ යුතුය"

**35. නිස්සයදාන සූත්‍රයඃ-** 1. "ස්වාමීනි, කවර ධර්මයන්ගෙන් යුත් මහණහු විසින් ඇසුරුකොට විසිය යුතුද? "උපාලිය, දස ධර්මයන්ගෙන් යුත් මහණ විසින් ඇසුරු කොට විසිය යුතුය. කවර දසයකින්ද යත්? 2 (මේ ඡෙදය මේ වර්ගයේ 34 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

**36. සාමණෙරුපට්ඨාන සූත්‍රයඃ-** 1. "ස්වාමීනි, කවර ධර්මයන්ගෙන් යුත් මහණහු විසින් සාමණෙරයන් ලවා උපස්ථාන කරවාගත යුතුද? "උපාලිය, දස ධර්මයන්ගෙන් යුක්තවූ මහණහු විසින් සාමණෙරයන් ලවා උපස්ථාන කරවා ගත යුතුය. කවර දසයකින්ද යත්?

**2.** (මේ ඡෙදය මේ වර්ගයේ 34 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.) උපාලිය, මේ දස ධර්මයෙන් යුක්තවූ මහණ විසින් සාමණෙරයන් ලවා උපස්ථාන කරවාගත යුතුය."

**37. උපාලි සංඝභෙද සූත්‍රයඃ-** 1. "ස්වාමීනි, සංඝභෙදය සංඝ භෙදයයි කියයි. ස්වාමීනී, කොපමණකින් සංඝයා බිඳුනේ වේද?

**2.** "උපාලිය, මේ ශාසනයෙහි මහණතෙම අධර්මය ධර්මයයි ප්‍රකාශ කරත්ද, ධර්මය අධර්මයයි ප්‍රකාශ කරත්ද, විනය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොවූවක් විනය යයි ප්‍රකාශ කෙරෙත්ද, විනය විනය නොවේයයි ප්‍රකාශ කෙරෙත්ද, තථාගතයන් වහන්සේ විසින් නොවදාරණලද්ද නොකියනලද්ද තථාගතයන් වහන්සේ විසින් වදාරණලද්දේයයි කියනලද්දේයයි ප්‍රකාශ කරත්. තථාගතයන් වහන්සේ විසින් නොපුරුදු කරණලද්ද තථාගතයන් වහන්සේ විසින් පුරුදුකරණ ලද්දේයයි ප්‍රකාශ කරත්. තථාගතයන් වහන්සේ විසින් පුරුදුකරණ ලද්ද තථාගතයන් වහන්සේ විසින් පුරුදු නොකරණ ලද්දේයයි ප්‍රකාශ කරත්. තථාගතයන් වහන්සේ විසින් නොපනවන ලද්ද තථාගතයන් වහන්සේ විසින් පනවන ලද්දේ යයි ප්‍රකාශ කරත්. තථාගතයන් වහන්සේ විසින් පුරුදුකරණ ලද්ද තථාගතයන් වහන්සේ විසින් නොපුරුදුකරණ ලද්දේයයි ප්‍රකාශ කරත් (ii) ඔව්හු මේ දස වස්තූන්ගෙන් පස්සට හෝ ඉවතට අදී. වචනයෙන් අදිත්. වෙන් වෙන් කර්ම කරත්. වෙන් වෙන්ව ප්‍රාතිමොක්ෂ දෙසත්. උපාලිය, මෙපමණකින් සංඝයා බිඳුනේ වේ.”

38. **උපාලි සාමග්ගි සූත්‍රයː**- 1. “ස්වාමීනි, සංඝ සාමග්‍රිය සංඝ සාමග්‍රියයි කියයි. ස්වාමීනි, කොපමණකින් සංඝයා සමගි වුනේවේද?”

2. “උපාලිය, මේ ශාසනයෙහි මහණතෙම අධර්මය අධර්මයයි ප්‍රකාශ කරත්ද, ධර්මය ධර්මයයි ප්‍රකාශ කරත්ද, විනය නොවූවක් විනයයි ප්‍රකාශ නොකරත්ද, විනය විනයයි ප්‍රකාශ කරත්ද, තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්ද නොකියනලද්ද තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලදී. නොකියනලදී යයි ප්‍රකාශ කරත්. තථාගතයන් වහන්සේ විසින් කියනලද්ද ප්‍රකාශකරණලද්ද තථාගතයන් වහන්සේ විසින් කියනලදැයි ප්‍රකාශකරණලදැයි ප්‍රකාශකරත්. තථාගතයන් වහන්සේ විසින් පුරුදු නොකරණ ලද්ද තථාගතයන් වහන්සේ විසින් පුරුදු නොකරණලදැයි ප්‍රකාශ කරත්. තථාගතයන් වහන්සේ විසින් පුරුදුකරණ ලද්ද තථාගතයන් වහන්සේ විසින් පුරුදු කරණලදැයි ප්‍රකාශ කරත්. තථාගතයන් වහන්සේ විසින් නොපනවන ලද්ද තථාගතයන් වහන්සේ විසින් නොපනවන ලද්දේයයි ප්‍රකාශ කරත්. තථාගතයන් වහන්සේ විසින්

පනවනලද්ද තථාගතයන් වහන්සේ විසින් පනවන ලද්දේයයි ප්‍රකාශ කරත්. මේ දස වස්තූන්ගෙන් පස්සට හෝ ඉවතට නොඅදියි. වෙන් වෙන් කර්ම නොකරත්, වෙන් වෙන්ව ප්‍රාතිමොක්ෂය දෙශනා නොකරත්. උපාලිය, මෙපමණකින් සංඝයා සමගි වූයේ වේ.”

**39. ආනන්ද සංඝභෙද සූත්‍රයඃ-** 1. “ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට “ස්වාමිනි, සංඝභෙදය සංඝ භෙදයයි කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් සංඝයා බිඳුනේ වේද?

**2.** (මේ ඡෙදය මේ වර්ගයේ 37 සූත්‍රයේ 2 ඡෙදය මෙනි. “උපාලිය” වෙනුවට “ආනන්දය” යෙදිය යුතුයි.

**3.** “ස්වාමීනි, සමගි සංඝයා බිඳ හෙතෙම කුමක් රැස් කරයිද? - “ආනන්දය, කල්පයක් පවතින නපුරු දුකක් රැස් කරයි.

“ස්වාමීනි, කල්පස්ථායී නපුරු දුක කවරේද? - “ආනන්දය, කල්පයක් නරකයෙහි පැසීමයි.

**4.** “සංඝභෙද කර්මය අපායට යවයි, නිරයට යවයි, කොටස්හි ඇලුනු අවැඩෙහි ඇලුන තැනැත්තේ නිවණින් ඈත් වෙයි. සමගි සංඝයා බිඳ කල්පයක් නිරයෙහි පැසෙයි.”

**40. ආනන්දසාමග්ගි සූත්‍රයඃ-** 1. “ස්වාමීනි, සංඝසාමග්‍රිය සංඝ සාමග්‍රියයි කියයි. ස්වාමීනි, කොපමණකින් සංඝසාමග්‍රිය වේද?

**2.** (මේ ඡෙදය මේ වර්ගයේ 38 සූත්‍රයේ 2 ඡෙදය මෙනි. “උපාලිය” වෙනුවට “ආනන්දය” යෙදිය යුතුයි.)

**2.** “ස්වාමීනි, බිඳුනු සංඝයා සමගිකර හෙතෙම කුමක් රැස්කරයිද?

“ආනන්දය, බ්‍රහ්ම පිනක් රැස්කරයි”

“ස්වාමීනි, බ්‍රහ්ම පින කවරේද?”

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"ආනන්දය, කල්පයක් ස්වර්ගයෙහි සතුටුවීමයි."

4. "සංඝ සාමග්‍රියද සමගිවූවන්ට අනුග්‍රහ කිරීමද සැපය. සමගියෙහි ඇලුනු ධර්මයෙහි පිහිටි තැනැත්තේ නිවණින් ඈත් නොවෙයි. සංඝයා සමගිකොට කල්පයක් සවර්ගයෙහි සතුටු වේ."

(උපාලි වර්ගය නිමි.)

---

## 5. අක්කොසක වර්ගය

**41. සංඝභෙදහෙතු සූත්‍රයː-** 1. ඉක්බිති ආයුෂ්මත් උපාලි ස්ථවිරයෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටි ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි යම්කරුණකින් සංඝයා කෙරෙහි ඩබර කිරීම, කලහ කිරීම, විරුද්ධ ග්‍රහණය, විවාද උපදිත්ද, භික්ෂූහුද සුවසේ වාසය නොකරත්ද, ඊට හේතු කවරේද, ඊට ප්‍රත්‍යය කවරේද?"

2. "උපාලිය, මේ ශාසනයෙහි මහණතෙම අධර්මය ධර්මයයි ප්‍රකාශ කරත්. (මෙහි 4 වර්ගයේ 37 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) උපාලිය සංඝයා කෙරෙහි ඩබර කිරීම කලහ කිරීම විරුද්ධ ග්‍රහණය, විවාද උපදිත්ද, භික්ෂූහුද සුවසේ වාසය නොකරත්ද මේ ඊට හේතුය මේ ඊට ප්‍රත්‍යයයි" වදාළසේක.

**42. පඨම විවාදමූල සූත්‍රයː-** 1. "ස්වාමීනි, විවාදයට මුල් කොපමණද?"

2. "උපාලිය, විවාදයට මුල් දාසයකි, කවර දසයක්ද යත් උපාලිය, මේ ශාසනයෙහි මහණතෙම අධර්මය ධර්මයයි ප්‍රකාශකරත්ද, (මෙහි 4 වර්ගයේ 37 සූත්‍රයේ 2 (i) ඡේදය යෙදිය යුතුයි.) උපාලිය මේ විවාද මූලයෝ දසය වෙත්.

**43. දුතිය විවාදමූල සූත්‍රයː-** 1. "ස්වාමීනි, විවාදයට මුල් කොපමණද?"

2. "උපාලිය, විවාදයට මුල් දසයකි කවර දසයක්දයත්? උපාලිය, මේ ශාසනයෙහි මහණතෙම ඇවැත් නොවූදේ ඇවැත් යයි ප්‍රකාශ කරත්ද, ඇවත ඇවැත් නොවේ යයි ප්‍රකාශ කරත්ද, සැහැල්ලු ඇවත බර ඇවතැයි ප්‍රකාශ කෙරෙත්ද, බර ඇවත සැහැල්ලු ඇවැතැයි ප්‍රකාශ කරත්ද, නපුර ඇසුරුකළ ඇවත නපුර ඇසුරු නොකළ ඇවැතැයි ප්‍රකාශ කරත්ද, නපුර ඇසුරුකළ ඇවත නපුර ඇසුරු නොකළ ඇවත යයි ප්‍රකාශ කෙරෙත්ද, වැඩියක් ඇති ඇවත වැඩියක් නැති ඇවතයයි ප්‍රකාශ කෙරෙත්ද, වැඩියක් නැති ඇවත වැඩියක් ඇති ඇවතයයි ප්‍රකාශ කෙරෙත්ද, ප්‍රතිකර්ම සහිත ඇවත, ප්‍රතිකර්ම රහිත ඇවතයයි ප්‍රකාශ කෙරෙත්ද, ප්‍රතිකර්ම රහිත ඇවත ප්‍රතිකර්ම සහිත ඇවත යයි ප්‍රකාශ කෙරෙත්ද, උපාලිය මේ දහය විවාදයට මුල්ය."

44. **චොදක ධම්ම සූත්‍රය:-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නුවර බලිහරණ වනලැහැබෙහි වාසය කරණසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක. ඒ භික්ෂූහු 'පින්වතුන් වහන්සැයි' භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ, "මහණෙනි, අනුන්ට චෝදනා කරණු කැමති චොදක භික්ෂුව විසින් ධර්ම පසක් තමා තුළ නුවණින් සිහිකොට ධර්ම පසක් තමා තුළ පිහිටුවා අනුන්හට චොදනා කටයුතුයි. කවර ධර්ම පසක් තමා තුළ නුවණින් සිහිකටයුතුද?

2. "මහණෙනි, චොදනා කරණ භික්ෂුව විසින් අනුන්ට චොදනා කරණු කැමැත්තේ මෙසේ සිතිය යුතුයි. පිරිසිදු කායික හැසිරීම් ඇත්තෙම් සිදුරු නැති නො කැළැල් පිරිසිදු කායික හැසිරීමෙන් යුක්තවෙම්ද, මා කෙරෙහි මේ ධර්මය විද්‍යමාන වේද නොහොත් නැත්තේදැයි මෙසේ කල්පනා කටයුතුය. මහණතෙම ඉදින් පිරිසිදු කාය සමාචාර නැත්තේද නොසිදුරු නොකැළැල් පිරිසිදු කායික හැසිරීමෙන් යුක්ත නොවූයේ 'දැන් ආයුෂ්මත්තෙමේ ඒතාක් කයින් කරණ දෙයෙහි හික්මෙවයි' කියන්නාහු වෙත් මෙසේ ඔහුට කියන්නාහු වෙත්.

3. "මහණෙනි, නැවතද අනුන්ට චොදනා කරණු කැමති චොදක භික්ෂුව විසින් මෙසේ සිතිය යුතුයි. පිරිසිදු වාක් හැසිරීම්

ඇත්තෙම්ද, නො සිදුරු නො කැළැල් පිරිසිදු වාක් හැසිරීමෙන් යුක්තවෙම්ද, මා කෙරෙහි මේ ධර්මය විද්‍යමානවේද නොහොත් නොවේද, මහණෙනි ඉදින් මහණ තෙම පිරිසිදු වාක් හැසිරීම් නැත්තේද නො සිදුරු නො කැළැල් පිරිසිදු වාක් සමාචාරයෙන් යුක්ත නොවූයේද එසේ නම් දැන් ආයුෂ්මත්තෙමේ වචනයෙහි හික්මෙවයි" කියන්නාහු වන්නාහ. මෙසේ ඔහුට කියන්නාහු වෙත්.

**4.** "මහණෙනි, නැවතද අනුන්ට චොදනා කරණු කැමති චොදක භික්ෂුව විසින් මෙසේ නුවණින් සිහිකටයුතුය. සබ්‍රම්සරුන් කෙරෙහි ද්වෙෂ නොවූ මෛත්‍රී සිත එළඹ සිටියේද, මා කෙරෙහි මේ ධර්මය විද්‍යමානවේද, නැත්නම් නැත්දැයි, මහණෙනි ඉදින් භික්ෂුවට සබ්‍රහ්මචාරීන් කෙරෙහි ද්වෙෂ නොවූ මෛත්‍රී සිත එළඹ නොසිටියේවේද ඔහුට එසේ නම් ආයුෂ්මත්තෙමේ පළමුකොට සබ්‍රහ්මචාරීන් කෙරෙහි මෛත්‍රී සිත උපදවයි කියන්නාහු වන්නාහ. මෙසේ ඔහුට කියන්නාහු වෙත්.

**5.** "මහණෙනි, නැවතද අනුන්ට චොදනා කරණු කැමති චොදක භික්ෂුව විසින් මෙසේ සිතිය යුතුයි. 'ඇසූදේ දරණ ඇසූදේ රැස්කරණ බහුශ්‍රැතයෙක් වන්නෙම්ද' මුල යහපත් මැද යහපත් අවසන යහපත් අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත හාත්පසින් සම්පූර්ණ පිරිසිදු බ්‍රහ්මචර්යය ප්‍රකාශ කරණ යම් ඒ ධර්ම කෙනෙක් වෙත්ද, මා විසින් එබඳු ධර්මයෝ බොහෝ අසනලද්දාහු වෙත්. දරණලද්දාහු වචනයෙන් පුරුදු වූවාහු, සිතින් බලනලද්දාහු දෘෂ්ටියෙන් පිළිවිදින ලද්දාහු වෙත්ද, මා කෙරෙහි මේ ධර්මය විද්‍යමාන වේද නැත්නම් නැත්තේදැයි' මෙසේ නුවණින් සිහිකටයුතුය.

"මහණෙනි, ඉදින් මහණතෙම ඇසූදේ දරණ, ඇසූදේ රැස්කරණ බහුශ්‍රැතයෙක් වේද, මුල යහපත් මැද යහපත් අවසන යහපත් අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත හාත්පසින් සම්පූර්ණ පිරිසිදු බ්‍රහ්මචර්ය ප්‍රකාශ නොකරත්ද ඔහු විසින් එබඳු ධර්මයෝ බොහෝ අසනලද්දාහ. දරණලද්දාහු. වචනයෙන් පුරුදුකරණලද්දාහ. සිතින් බලනලද්දාහ. දෘෂ්ටියෙන් පිළිවිදින

ලද්දාහ. ඔහුට ආයුෂ්මත්නි පළමුකොට ආගම ඉගෙන ගන්නැයි කියන්නාහු වන්නාහ. මෙසේ ඔහුට කියන්නාහු වන්නාහ.

**6.** "මහණෙනි, අනුන්ට චොදනා කරණු කැමති චොදක භික්ෂුව විසින් මෙසේ නුවණින් සිහිකටයුතුය. 'මා විසින් ප්‍රාතිමොක්ෂ දෙක විස්තර වශයෙන් සූත්‍ර වශයෙන් අනුව්‍යඤ්ජන වශයෙන් පාඩම්කළාහු වෙත්ද, බෙදන ලද්දාහු පවත්වන ලද්දාහු තීරණය කරණලද්දාහුවෙත්ද, මේ ධර්මය මා කෙරෙහි විද්‍යමානවේද නැත්නම් නැද්ද මහණෙනි, ඉදින් මහණහට උභය ප්‍රාතිමොක්ෂය සූත්‍ර වශයෙන් අනුව්‍යඤ්ජන වශයෙන් විස්තර වශයෙන් පාඩම්කරණ ලද්දාහු වෙත්ද, බෙදන ලද්දාහු වෙත්ද, පවත්වන ලද්දාහු වෙත්ද, විනිශ්චය කරණ ලද්දාහු වෙත්ද ආයුෂ්මත්නි, මෙය තථාගතයන් වහන්සේ විසින් කොතැන්හිදී වදාරණ ලදදැයි' මෙසේ විචාරණ ලද්දේ, නොකියාද, එසේ නම් ආයුෂ්මත් තෙමේ විනයෙහි හික්මෙවයි කියන්නාහු වන්නාහ. මේ ධර්ම පස අධ්‍යාත්මයෙහි එළවිය යුතුය. කවර ධර්ම පසක් අධ්‍යාත්මයෙහි පිහිටවිය යුතුද, කාලයෙහි කියමි අකාලයෙහි නොකියමි වූ දෙයින් කියමි. නුවූ දෙයින් නොකියමි. මෘදු බසින් කියමි. තදින් නොකියමි. යහපතින් කියමි, අයහපතින් නොකියමි. මෛත්‍රී සිතින් කියමි. ද්වෙෂයෙන් නොකියමි' මේ ධර්ම පස තමන් තුළ එළවිය යුතුය. අනුන්ට චොදනා කරණු කැමති චොදක භික්ෂුව විසින් මේ ධර්ම පස තමන් තුළ නුවණින් සිතා අනුන්ට චොදනා කටයුතුය."

**45. අන්තෙ පුරප්පවෙස සූත්‍රය**:- 1. "මහණෙනි, රජු වසන ඇතුළු නුවරට ප්‍රවිෂ්ට වීමෙහි මේ දෝෂයෝ දසදෙනෙක් වෙත් කවර දසදෙනෙක්දයත්?

**2.** "මහණෙනි මෙහි රජතෙම මෙහෙසිය සමග සිටියේ වේද, මහණෙනි, එහි ප්‍රවිෂ්ට වෙයිද මෙහෙසිය හෝ භික්ෂුව දැක සිනාව පහළකරයි. භික්ෂුව හෝ මෙහෙසිය දැක සිනා පහළකරයි. එහිදී රජුට ඒකාන්තයෙන් මොවුන් විසින් වරදක් කරණ ලද්දේ හෝ වෙයි. කරන්නේ හෝ වේයයි මෙබඳු සිතක් වේ. මහණෙනි, රජුගේ ඇතුලු නුවරට ප්‍රවිෂ්ට වීමෙහි මේ පළමුවෙනි දෝෂයයි.

2. "නැවතද මහණෙනි, රජතෙම බොහෝ වැඩ ඇත්තේවේද, බොහෝ කටයුතු ඇත්තේවේද, එක්තරා ස්ත්‍රියකු කරා ගොස් සිහි නොකරයි. ඕතොමෝ ඉන් ගැබ්ගනියි. එහි රජහුට මෙහි පැවිද්දා හැර කිසිවකු ප්‍රවිෂ්ට නොවෙයි. පැවිද්දාගේ වැඩක් වන්නේයයි මෙසේ සිතයි. මහණෙනි, රජුගේ ඇතුළු නුවරට පිවිසීමෙහි මේ දෙවෙනි ආදීනවයයි.

3. "මහණෙනි, නැවතද රජුගේ ඇතුළුනුවර එක්තරා රත්නයක් නැතිවූයේ වේ. රජුට පැවිද්දා හැර මෙහි අන්කිසිවෙක් ප්‍රවිෂ්ටනොවෙයි ප්‍රව්‍රජිතයාගේ වැඩක් වන්නේ යයි මෙසේ සිතයි. මහණෙනි, රජුගේ ඇතුළු නුවරට පිවිසීමෙහි මේ තුන්වෙනි ආදිනවයයි.

4. "මහණෙනි, නැවතද රජුගේ අභ්‍යන්තරයෙහි රහස් කථාවන් පිටත දැනගනිත් එහි රජුට මෙහි ප්‍රව්‍රජිතයා හැර අන්කිසිවෙක් මෙහි ප්‍රවිෂ්ට නොවෙයි. ප්‍රව්‍රජිතයාගේ වැඩක් වන්නේයයි මෙසේ සිතයි. මහණෙනි, රජුගේ ඇතුළුනුවරට ප්‍රවිෂ්ටවීමෙහි මේ සතරවෙනි දෝෂයයි.

5. "මහණෙනි, නැවතද රජුගේ ඇතුලු නුවරෙහි පියෙක් හෝ පුතා මරන්ට කැමති වෙයි. පුතෙක් හෝ පියා මරන්ට කැමති වෙයි. ඔවුන් අතරෙහි ප්‍රව්‍රජිතයා හැර මෙහි අන්කිසිවෙක් නොවදියි. පැවිද්දාගේ වැඩක් වන්නේයයි මෙසේ සිතයි. මහණෙනි, රජුගේ වසන ඇතුළුනුවරට වැදීමෙහි මේ පස්වෙනි දෝෂයයි.

6. "මහණෙනි, නැවතද රජතෙම පහත්තැනක සිටි මෙහෙසියක් උසස් තැනක තබයි. ඊට යම්කෙනෙක් අමනාප වූයේද ඔවුන්ට රජතෙමේ වනාහි පැවිද්දා සමග ගැටී සිටී. පැවිද්දාගේ වැඩක් වන්නේයයි සිතයි. මහණෙනි, රජුගේ ඇතුළුනුවරට පිවිසීමෙහි මේ සවෙනි දොෂයයි.

7. "මහණෙනි, නැවත රජතෙම උසස් මෙහෙසියක් පහත් තැනක තබයි. යම් ඒ කෙනෙක් අමනාපවූයේද, ඔවුන්ට රජතෙමේ වනාහි පැවිද්දා සමග ගැටීසිටි පැවිද්දාගේ වැඩක්

වන්නේයයි සිතයි. මහණෙනි, රජුගේ ඇතුළු නුවරට ප්‍රවිෂ්ටවීමෙහි මේ සත්වෙනි දෝෂයයි.

8. "මහණෙනි, නැවත රජතෙම නොකල්හි සෙනාව පිටත්කරයිද යම් ඒ කෙනෙක් අමනාප වූයේද ඔවුන්ට රජ තෙමේ වනාහි පැවිද්දා සමග ගැටීසිටී පැවිද්දාගේ වැඩක් වන්නේයයි සැකකරයි. මහණෙනි, රජුගේ ඇතුළු නුවරට ප්‍රවිෂ්ටවීමෙහි මේ අටවෙනි දෝෂයයි.

9. "මහණෙනි, නැවතද රජතෙම සුදුසු කාලයෙහි සේනාව පිටත්කර හැර අතරමගදී නවත්වයි. යම්කෙනෙකු අමනාපවූයේද ඔවුන්ට රජු වනාහි පැවිද්දා සමග ගැටීසිටි පැවිද්දාගේ වැඩක් වන්නේයයි මෙසේ සිතයි. මහණෙනි, රජුගේ ඇතුළුනුවරට වැදීමෙහි මේ නවවෙනි දෝෂයයි.

10. "මහණෙනි, නැවතද රජුගේ ඇතුළුනුවර ඇතුන්ගෙන් තදබදවීම, අශ්වයන්ගෙන් තදබදවීම, රියෙන් තදබදවීම ප්‍රව්‍රජිතයන්ට නො සරුප්වූ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයෝ වෙත්ද, මහණෙනි, රජුගේ ඇතුළු නුවරට වැදීමෙහි මේ දසවෙනි දෝෂයයි."

**46. සක්‍යුපොසථ සූත්‍රය**:- 1. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් නුවර නිග්‍රොධාරාමයෙහි වාසය කරණසේක. ඉක්බිති බොහෝ ශාක්‍ය උපාසකයෝ පොහෝ දිනයෙහි භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහුය. ශාක්‍ය උපාසකයන් එකත්පසෙක හුන්කල්හි භාග්‍යවතුන් වහන්සේ 'ශාක්‍යයෙනි, කෙසේද? තෙපි අංග අටකින් යුක්තවූ ශීලය රකිව්දැයි' වදාළ සේක. 'ස්වාමීනි, අපි සමහර දවස්වල අංග අටකින් යුක්ත ශීලය රකිමු. සමහර දවස්වල නොරකිමුයි' කීවාහුය.

2. "ශාක්‍යවරුනි, යම්බඳුවූ තොපි මෙසේ ශොකයෙන් බිය ඇති ජීවිතයෙහි මරණයෙන් බිය ඇති, ජීවිතයෙහි, සමහර දවස්වල අංග අටකින් යුක්තවූ ශීලය රකිව්ද, සමහර දවස්වල නො රකිවුද, ශාක්‍යවරුනි, එය කුමකැයි හඟින්නාහුද? මේ

ලොකයෙහි පුරුෂයෙක්තෙම යම්කිසි වැඩකින් අදක්ෂවීමට නො පැමිණ දවාලට කහවණු බාගයක් සොයන්නේය. පුරුෂයා දක්ෂය, වීර්යයෙන් යුක්තයයි කීමට සුදුසුද?"

"ස්වාමීනි, එසේය."

3. "ශාක්‍යවරුනි, ඒ කුමකැයි හඟින්නේද? මේ ලොකයෙහි පුරුෂයෙක්තෙම යම්කිසි වැඩකින් අදක්ෂබවට නොපැමිණ දවාලට කහවනුවක් සොයන්නේද (ii) පුරුෂ තෙම දක්ෂය වීර්යයයෙන් යුක්තයයි කීමට සුදුසුද?"

"ස්වාමීනි. එසේය."

4. (i) "ශාක්‍යවරුනි, ඒ කුමකැයි හඟින්නාහුද? මේ ලොකයෙහි පුරුෂයෙක්තෙම යම්කිසි කර්මාන්තයකින් අදක්ෂබවට නොපැමිණ (ii) දවල් කහවණු දෙකක් සොයන්නේය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

5. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) දහවල් කහවනු තුනක් සොයන්නේය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

6. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) දහවල් කහවනු සතරක් සොයන්නේය (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

7. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) කහවනු පහක් සොයන්නේය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) හයක්, හතක් අටක්, නවයක්, දහයක්, විස්සක්, තිහක්, හතලිහක්, පනහක් සොයන්නේය. පුරුෂතෙම දක්ෂය, වීර්යයෙන් යුක්තයයි කීමට සුදුසුද?" 'ස්වාමීනි, එසේය'

8. "ශාක්‍යවරුනි, ඒ කුමකැයි හඟින්නාහුද ඒ පුරුෂ තෙම දවසක් දවසක් පාසා කහවනු සීයක්, කහවනු දාහක් සොයන්නේ, ලැබූ ලැබූ දේ බහා තබන්නේ වර්ෂ සියයක් ආයුෂ ඇත්තේ වර්ෂ සීයක් ජීවත්වන්නේ මහත් වස්තු රැසකට අයිතිකාරයෙක් වන්නේද?" - "ස්වාමීනි' එසේය"

9. "ශාක්‍යවරුනි, ඒ කුමකැයි හඟින්නේද? ඒ පුරුෂ තෙම වස්තු නිසා වස්තු නිදානකොට ගෙන වස්තු හෙතුවෙන් එක් රාත්‍රියක් හෝ එක් දවාලයක් හෝ රාත්‍රියෙන් බාගයක් හෝ

දවාලෙන් බාගයක් හෝ ඒකාන්ත සැපයක් විඳිමින් වාසය කරන්නහුද?" - 'නැත ස්වාමීනි'

'ඊට හේතු කවරේද?' - "ස්වාමීනි, කාමයෝ අනිත්‍යයහ, හිස්ය, බොරුය, මුලාකරණ ස්වභාව ඇත්තේය."

10. "ශාක්‍යවරුනි, මෙහි මාගේ ශ්‍රාවකතෙම වර්ෂ දහයක් අප්‍රමාදවූයේ කෙලෙස් තවන වීර්ය ඇත්තේ නිවණට යොමුකළ ආත්ම ඇතිව වාසය කරන්නේ මා විසින් යම්සේ අනුශාසනා කරණලද්දේද එසේ පිළිපදින්නේ වර්ෂ සීයක් වර්ෂ දහසක්, වර්ෂ දස දහසක් වර්ෂ ලක්ෂයක් ඒකාන්ත සැප විඳිමින් වාසය කරන්නේය. හෙතෙමේ සකෘදාගාමි හෝ අනාගාමි හෝ ස්ථිරවූ හෝ සෝවාන් වූවෙක්වන්නේය.

11. "ශාක්‍යවරුනි, වර්ෂ දහයක් තිබේවා, මේ ශාසනයෙහි මාගේ ශ්‍රාවකතෙම වර්ෂ නවයක්, අට වර්ෂයක්, සත් වර්ෂයක්, සය වර්ෂයක් පස් වර්ෂයක්, සතර වර්ෂයක්, තුන් වර්ෂයක් වර්ෂ දෙකක්, එක් වර්ෂයක් අප්‍රමාදවූයේ කෙලෙස් තවන වීර්ය ඇත්තේ කාය ජීවිත දෙක්හි නිරපෙක්ෂව වාසයකරන්නේ මා විසින් යම් සේ අවවාද කරණලද්දේද, එසේ පිළිපන්නේ වර්ෂ සීයක්, වර්ෂ දාහක්, වර්ෂ දසදාහක්, වර්ෂ ලක්ෂයක් ඒකාන්ත සැප විඳිමින් වාසය කරන්නේය. හෙතෙමේ වනාහී සකෘදාගාමි හෝ අනාගාමි හෝ ස්ථිරවූ හේ සෝවාන්වූවෙක් වන්නේය.

12. "ශාක්‍යවරුනි, එක් වර්ෂයක් තිබේවා මේලොකයෙහි මාගේ ශ්‍රාවකතෙම දසමාසයක් අප්‍රමාදවූයේ කෙලෙස් තවන වීර්යයෙන් යුක්තවූයේ, කාය ජීවිතදෙක්හි නිරපෙක්ෂව වාසය කරන්නේ යම්සේ මා විසින් අනුශාසනා කරණ ලද්දේද, එසේ පිළිපදින්නේ වර්ෂ සීයක්, වර්ෂ දාහක්, වර්ෂ දසදහක්, වර්ෂ ලක්ෂයක් ඒකාන්ත සැප විඳිමින් වාසය කරන්නේය. හෙතෙමේ වනාහී සකෘදාගාමි හෝ අනාගාමි හෝ ස්ථිරවූ හෝ සෝවාන්වූවෙක් වන්නේය.

13. "දසමාසයක් තිබේවා, මේ ශාසනයෙහි මාගේ ශ්‍රාවකයෙක් නව මාසයක්, අටමාසයක්, සත් මාසයක්, හමාසයක්, පස්මාසයක්, සාරමාසයක්, තුන්මාසයක්, දෙමාසයක්, එක්

මාසයක්, අඩ මසක් රෑ දාවල් දහයක්, රෑ දාවල් නවයක්, අටක්, හතක්, හයක්, පහක්, හතරක්, තුනක්, දෙකක්, එක් රැයක්, දවාලක්, අප්‍රමාදවූයේ කෙලෙස් තවනවීර්ය ඇත්තේ, කාය ජීවිත දෙක්හි නිරපෙක්ෂව වාසය කරන්නේ මා විසින් අවවාද කළ දේ අනුව පිළිපදින්නේ වර්ෂ සීයක්, වර්ෂ දාහක්, වර්ෂ දසදාහක්, වර්ෂ ලක්ෂයක්, වර්ෂ දසලක්ෂයක් ඒකාන්ත සැප විඳිමින් වාසය කරන්නේය. හෙතෙමේද සකෘදාගාමි හෝ අනාගාමි හෝ ස්ථිරවූ හෝ සෝවාන් වූවෙක් වන්නේය.

"ශාක්‍යවරුනි, දුකසේ ලැබිය හැක්කාහ. යම්බඳුවූ තොප මෙසේ ශොකයෙන් භයෙන් යුක්ත ජීවිතයෙහි සමහර දවස්වල අංග අටකින් යුක්ත ශීලයෙහි වසව්ද සමහර දවස්වල නොවසව්ද, එසේ නම් ඒ ලැබීම තොපට නො ලැබිය හැක්කාහ. - 'ස්වාමීනි, අපි අද සිට අංග අටකින් යුත් ශීලය පුරමුයි' කීවාහුය."

**47. මහාලි පාපකිරිය සූත්‍රයඃ-** 1. "එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසාලාමහනුවර මහාවනයෙහි කූටාගාර ශාලාවෙහි වාසය කරණසේක. ඉක්බිති මහාලී ලිච්ඡවී තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි මහාලී ලිච්ඡවී තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, පව්කම් කිරීමෙහි පව්කම් පැවැත්මෙහි හේතු කවරේද, ප්‍රත්‍යය කවරේදැයි" ඇසීය.

2. "මහාලිය, පව් කිරීමෙහි පව්කම් පැවැත්මෙහි ලොභය හේතුවය, ලොභය ප්‍රත්‍යය මහාලිය, පාපකර්මයාගේ කිරීමෙහි පාපකර්මයාගේ පැවැත්මෙහි ද්වේෂය හේතුවය, ද්වේෂය ප්‍රත්‍යය. පාපකර්මයාගේ කිරීමෙහි පාපකර්මයාගේ පැවැත්මෙහි, මොහය හේතුවය, මොහය ප්‍රත්‍යය. මහාළිය, පාපකර්මයාගේ කිරීමෙහි, පාපකර්මයාගේ පැවැත්මෙහි නුනුවණින් මෙනෙහිකිරීම හේතුවය ප්‍රත්‍යයය. මහාළිය, පාපකර්මයාගේ කිරීමෙහි පාපකර්මයාගේ පැවැත්මෙහි වරදවා පිහිටවූ සිත හේතුවය. වරදවා පිහිටවූ සිත ප්‍රත්‍යයය. මහාලිය පාපකර්මයාගේ කිරීමෙහි

පාපකර්මයාගේ පැවැත්මෙහි මේ හේතුවය මේ ප්‍රත්‍යය යයි වදාළසේක.

3. "ස්වාමීනි, කුශල කර්මයාගේ කිරීමෙහි කුශල කර්මයාගේ පැවැත්මෙහි හේතු කවරේද ප්‍රත්‍යය කවරේද?"

4. "(i) මහාලිය, කුශල කර්මයාගේ කිරීමෙහි කුශල කර්මයාගේ පැවැත්මෙහි (ii) අලොභය හේතුව වෙයි. අලොභය ප්‍රත්‍යය වෙයි. මහාලිය, කුශල කර්මයාගේ කිරීමෙහි කුශල කර්මයාගේ පැවැත්මෙහි අද්වෙෂය හේතුව වෙයි. අද්වෙෂය ප්‍රත්‍යයවෙයි මහාලිය, කුශල කර්මයාගේ කිරීමෙහි කුශල කර්මයාගේ පැවැත්මෙහි අමොහය හේතුව වෙයි. අමොහය ප්‍රත්‍යය වෙයි මහාලිය, කුශලකර්මයාග් කිරීමෙහි කුශල කර්මයාගේ පැවැත්මෙහි නුවණින් මෙනෙහි කිරීම හේතුවවෙයි, නුවණින් මෙනෙහිකිරීම ප්‍රත්‍යයවෙයි. මහාලිය, කුශල කර්මයා කිරීමෙහි කුශල කර්මයාගේ පැවැත්මෙහි මනාකොට තබනලද සිත හේතුව වෙයි, ප්‍රත්‍යය වෙයි. මහාලිය, කුශල කර්මයාගේ කිරීමෙහි කුශල කර්මයාගේ පැවැත්මෙහි, මහාලිය, මේ හේතුවය මේ ප්‍රත්‍යයයි වදාළසේක.

5. "මහාලිය, මේ ධර්ම දසය ලොකයෙහි විද්‍යමාන නොවන්නහු නම්, අධර්මයෙහි හැසිරීමය විෂම හැසිරීමය, ධර්මයෙහි හැසිරීමය සමව හැසිරීමය යයි කියා මෙය නොවේ, මහාලිය, යම්හෙයකින් මේ ධර්ම දහය ලොකයෙහි විද්‍යමාන වෙත්ද, එහෙයින් අධර්මචර්යාවය විෂම චර්යාවය ධර්ම චර්යාවය සමචර්යාවයයි කියා ඇත්තේ වේ."

48. දසධර්ම සූත්‍රයඃ- 1. "මහණෙනි, මේ ධර්ම දසයක් පැවිද්දා විසින් නිතර නුවණින් සිහි කළ යුත්තාහ. කවර දසයක්ද යත්.

2. "වෙනස් වර්ණයකට පැමිණෙන ලද්දෙමියි' පැවිද්දා විසින් නිතර නුවණින් සිහි කටයුතුයි 'මාගේ ජීවිකාව අනුන් පිළිබඳයයි' පැවිද්දා විසින් නිතර නුවණින් සිහි කළ යුතුයි. 'මා විසින් අන්‍ය (ගිහියන්ගෙන් වෙනස්වූ) හැසිරීමක් කටයුතුයයි' පැවිද්දා විසින් නිතර නුවණින් සිහි කළ යුතුයි. 'කිමෙක්ද මාගේ

සිත සීලයෙන් මට උපවාද නොකෙරේ දැයි' පැවිද්දා විසින් නිතර සිහි කළ යුතුයි. 'කිමෙක්ද මා විචාරා ඥාණවන්ත සබ්‍රහ්මචාරීහු සීලයෙන් පරිභව නොකෙරෙත් දැයි' පැවිද්දා විසින් නිතර සිහි කළ යුතුයි. 'මාගේ සියලු ප්‍රිය මනාප දෙයින් වෙනස්වීම වෙන්වීම වේයයි' පැවිද්දා විසින් නිතර සිහි කළ යුතුයි. 'මම කර්මය ස්වකීය කොට ඇත්තේ වෙමි. කර්මය අයිති කොට ඇත්තේ වෙමි. කර්මය උත්පත්ති ස්ථානකොට ඇත්තේ වෙමි කර්මය නෑයන් කොට ඇත්තේ වෙමි. කර්මය පිළිසරණ කොට ඇත්තේ වෙමි යහපත් හෝ අයහපත් යම් කර්මයක් කරන්නෙම්ද ඊට හිමිවන්නෙමියි' පැවිද්දා විසින් නිතර සිහි කළ යුතුයි. 'කෙසේවූ මට රෑ දාවල් ඉක්මෙත් දැයි' පැවිද්දා විසින් නිතර සිහි කළ යුතුයි. 'කිමෙක්ද මම ජනයාගෙන් හිස්වූ ප්‍රදෙශයෙහි ඇලෙන්නෙම් දැයි' පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතුයි. 'මා කෙරෙහි මනුෂය ධර්මයට මත්තෙහි ආර්ය භාවය සිද්ධ කිරීමට සුදුසු ඥාණයක් ලබන ලද්දේද, ඒ මම පසු කාලයක සබ්‍රම්සරුන් විසින් විචාරණ ලද්දේ නිශ්ශබ්ද නොවන්නෙම් දැයි පැවිද්දා විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කළ යුතුයි. මහණෙනි, මේ දසධර්මයෝ පැවිද්දා විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුත්තාහයි" වදාළ සේක.

**49. සරීරට්ඨ දසධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, ශරීරයෙහිවූ මේ කරුණු දසයක් වෙත් කවර දසයක්ද යත්.

2. "සීතය, උෂ්ණය, බඩසාය, පිපාසය, මළ, මුත්‍ර පහකිරීම කායසංවරය, වාක්සංවරය, ජීවිකාව සංවරව කිරීම, නැවත භවය ඇතිකරණ භවගාමී පින් පව්, මහණෙනි, මේ කරුණු දසය ශරීරයෙහි පිහිටියාහුය."

**50. සාමග්ගිකරණ ධම්ම සූත්‍රයඃ-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනේපිඬු මහ සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි බොහෝ භික්ෂූහු පසු බත පිණ්ඩපාතයෙන් වැලැක්කේ උපස්ථාන ශාලාවෙහි හුන්නාහු රැස්වූවාහු හටගත් ඩබර ඇත්තාහු. කොලාහල ඇත්තාහු විවාදයට බැසගත්තාහු

ඔවුනොවුන් මුඛ නමැති උල්වලින් විදිමින් වාසය කරත්. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පල සමවතින් නැගිටී සේක් උපස්ථාන ශාලාව යම් තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ පනවනලද අස්නෙහි වැඩසිටි සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිට භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක. "මහණෙනි, මෙහි දැන් කවර කථාවකින් යුක්තව හුන්නාහුද? තොප විසින් කවර කථාවක් කියා නතර කළේද?

2. "ස්වාමීනි අපි මෙහි පසු බත පිණ්ඩපාතයෙන් ආපසු ආවාහු උපස්ථාන ශාලාවෙහි වැඩ සිටි රැස්වූ හටගත් ඩබර ඇති හටගත් කලහ ඇති, පැමිණි විවාද ඇති, ඔවුනොවුන් මුඛ නමැති උල්වලින් විදිමින් වාසය කරමු."

3. "මහණෙනි, ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි මහණවූ යම් බඳුවූ තොපි හටගත් ඩබර ඇත්තාහුද, හටගත් කලහ ඇත්තාහුද, පැමිණි විවාද ඇත්තාහු ඔවුනොවුන් මුඛ නැමැති උල් වලින් විදිමින් වාසය කරන්නාහු නම් තොපට මෙය නුසුදුසුය.

4. "මහණෙනි; ප්‍රිය භාවය කරණ ගරු භාවය කරණ සිහිකටයුතු මේ කරුණු දසයක් රැස් කිරීම පිණිස විවාද නොකිරීම පිණිස සමගිය පිණිස හුදකලා බව පිණිස, පවතිත් කවර දසයක්ද යත් මහණෙනි, මේ ශාසනයේ මහණ තෙම (ii) සිල්වත් වේද, ප්‍රාතිමොක්ෂ සංවරශීලයෙන් සංවරව වාසය කරයිද, හැසිරීමෙන් හා අරමුණෙන් යුක්තවූයේ ස්වල්පමාත්‍ර වරදෙහි බිය දක්නා සුළුවූයේ ශික්ෂාපදයන් සමාදන්ව රකියිද,

5. "මහණෙනි, යම් හෙයකින් මහණ තෙම (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) (ii) ප්‍රිය භාවය කරණ ගරු භාවය කරණ මේ ධර්මයද සිහි කළ යුතුයි. රැස් කිරීම පිණිස විවාද නොකිරීම පිණිස සමගිය පිණිස එක්වීම පිණිස පවති.

6. "මහණෙනි, නැවතද මහණ තෙම ඇසූදේ දරන ඇසූදේ රැස් කරණ බහුශ්‍රැතයෙක් වේද, යම් ඒ ඒ ධර්මකෙනෙක් මුල යහපත්ද මැද යහපත්ද අග යහපත්ද අර්ථ සහිතද ව්‍යාඤ්ජන සහිතද හාත්පසින් සම්පූර්ණ පිරිසිදු බ්‍රහ්මචර්යය ප්‍රකාශ කෙරේද,

ඔහු විසින් එබඳු ධර්මයෝ බොහෝ අසන ලද්දාහ. දරණ ලද්දාහ. වචනයෙන් පුරුදු වූවාහුය සිතින් ලබන ලද්දාහ. දෘෂ්ටියෙන් ප්‍රතිවෙධ කරණ ලද්දාහ. මහණෙනි, මහණතෙම යම් හෙයකින් බහුශ්‍රැතවේද, දෘෂ්ටියෙන් ප්‍රතිවෙධ කරණ ලද්දේ වේද, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

7. "මහණෙනි, නැවතද මහණතෙම යහපත් මිත්‍රයන් ඇත්තේවේ. යහපත් සහායයන් ඇත්තේවේ යහපතට නැමෙන්නේවේ. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

8. "මහණෙනි, නැවතද මහණ තෙම කීකරුවූයේ කීකරුකම ඇතිකරණ ධර්මයන්ගෙන් යුක්තවූයේ අනුශාසනා ඉවසන්නේ, අනුශාසනාව ගෞරවයෙන් පිළිගන්නේ වේද, මහණෙනි, යම් හෙයකින් මහණ තෙම කීකරුවේද, සුවච බව ඇතිකරණ ධර්මයන්ගෙන් යුක්තවේද, අනුශාසනය ඉවසන්නේ අනුශාසනය ගෞරවයෙන් පිළිගන්නේවේද, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

9. "මහණෙනි, නැවතද මහණ තෙම සබ්‍රම්සරුන්ගේ අසා කළයුතු ලොකු කුඩා වැඩ වේද, එහි දක්ෂවේද, අලස නොවේද, එහි දක්ෂවූයේ විමසීමෙන් යුක්තවූයේ විධාන කරන්ට සුදුසුවේද, මහණෙනි, යම් හෙයකින් මහණතෙම සබ්‍රම්සරුන්ගේ ලොකු කුඩා කටයුතු අසා යම් ඒ කර්මයෝ වෙත්ද, එහි දක්ෂවේද, අලස නොවේද, විමසීමෙන් යුක්ත වූයේ විධාන කරන්ට සුදුසුවූයේ (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

10. "මහණෙනි, නැවතද මහණතෙම ප්‍රිය කථා ඇත්තේ වේද, අභිධර්මයෙහි උතුම් විනයෙහි මහත් සතුට ඇත්තේවේද, මහණෙනි, යම් හෙයකින් මහණ තෙම ප්‍රිය කථා ඇත්තේ අභිධර්මයෙහි උතුම් විනයෙහි මහත් ප්‍රමොදය ඇත්තේවේද, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

11. "මහණෙනි, නැවතද මහණතෙම අකුශල ධර්මයන් ප්‍රහීන කිරීම පිණිස කුශල ධර්මයන් ඉපදවීම පිණිස ශක්ති ඇත්තේ දැඩි කොටගත් වීර්ය ඇත්තේ කුශල ධර්මයන්හි බහා නොතබන ලද වැඩ ඇත්තේ පටන් ගන්නා ලද වීර්ය ඇත්තේ

වේද, මහණෙනි, යම් හෙයකින් මහණතෙම අකුශල ධර්මයන් ප්‍රහීන කිරීම පිණිස කුශල ධර්මයන් ඉපදවීම පිණිස ශක්ති ඇත්තේ දැඩි වීර්ය ඇත්තේ කුශල ධර්මයන්හි බහා නොතබන ලද වැඩ ඇත්තේ පටන්ගන්නා ලද වීර්ය ඇත්තේ වාසය කරයිද, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

12. "මහණෙනි, නැවතද මහණතෙම යම්කිසි සිවුරු පිඬු, සෙනසුන්, ගිලන්පස, බෙහෙත් පිරිකරින් සතුටු වූයේ වෙයි. මහණෙනි, යම් හෙයකින් මහණ තෙම යම් යම් සිවුරු, පිඬු සෙනසුන් ගිලන්පස, බෙහෙත් පිරිකරින් සතුටුවූයේ වේද, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

13. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රෙෂ්ඨවූ සිහියේ නිපුන භාවයෙන් යුක්තවේ. කළ බොහෝ කල් ඇති කියා බොහෝ කල් ඇති දෙය සිහිකරන්නේවේ. නැවත නැවත සිහිකරන්නේවේ. මහණෙනි, යම් හෙයකින් මහණතෙම ශ්‍රෙෂ්ඨ ස්මෘතියේ නිපුන භාවයෙන් යුක්ත වේද, කළ බොහෝ කල් ඇති කියා බොහෝකල් ඇති දෙය සිහි කරන්නේවේ. නැවත නැවත සිහිකරන්නේවේ. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

14. "මහණෙනි, නැවතද මහණතෙම ආර්යවූ තියුණු අවබොධය ඇති, මනාකොට දුක් ක්ෂය කිරීමට යන උත්පත්තිය මරණය දැන ගන්නා නුවණින් යුක්තවූ ඥාණවන්තයෙක් වේද මහණෙනි යම් හෙයකින් මහණතෙම ආර්යවූ තියුණු අවබෝධය ඇති මනාකොට දුක් ක්ෂය කිරීමට යන උත්පත්තිය මරණය දැනගන්නා නුවණින් යුක්තවූ ඥාණවන්තයෙක්වේද (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මේ ධර්ම දසය සිහිකටයුත්තාහ. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

**(5 අක්කොශ වර්ගය නිමි.)**

**(පළමුවෙනි ආනිශංස පණ්ණාසකය නිමි.)**

## දෙවෙනි පණ්ණාසකය.

# 6 සචිත්ත වර්ගය.

1. **සචිත්ත පරියාය සූත්‍රය:-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසල අනේ පිඬු මහ සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූසේක. "පින්වතුන් වහන්සැයි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, (ii) මහණතෙම අනුන්ගේ සිතේ ආකාරය දැනීමේ දක්ෂ නොවේ ද මහණෙනි, තමාගේ සිතේ ආකාරය දැනීමේ දක්ෂයෙක් වන්නෙමියි තොප විසින් මෙසේ හික්මිය යුතුයයි" (iii) වදාළසේක.

3. "මහණෙනි, කෙසේ මහණ තෙම තමාගේ සිතේ ආකාරය දැනීමෙහි දක්ෂවේද? මහණෙනි යම්සේ බාලවූ තරුණ වූ සැරසීමට කැමති ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ කැඩපතක හෝ පිරිසිදු බබලන දිය බඳුනක හෝ සිය මුහුන බලන්නේ ඉදින් එහි දූවිල්ලක් හෝ කිලුටක් හෝ පෙනේ ද ඒ දූවිල්ල හෝ කිලුට නැති කිරීම පිණිස වෑයම්කරයි. එහි දූවිල්ලක් හෝ කිලුටක් නොදකීද ඉන් සම්පූර්ණ අදහස් ඇත්තේ 'මට එකාන්තයෙන් ලාභයකි එකාන්තයෙන් මා පිරිසිදුය'යි සතුටු වූයේවේ.

4. "මහණෙනි, එසේම මහණහට කුශල ධර්මයන්හි නුවණින් සිහි කිරීම බොහෝ උපකාරවේ. බොහෝකොට දැඩි ලොභය බහුලකොට ඇත්තේ වාසයකරම්ද, දැඩි ලොභය බහුලකොට නැතිව වාසයකරම්ද, බොහෝකොට කොපවූ සිතින් වාසයකරම්ද, කොපනොවූ සිතින් බොහෝකොට වාසයකරම්ද, සිත කය දෙකේ මැලි ගතියෙන් මඩනා ලද්දේ බොහෝකොට වාසයකරන්නෙම්ද, සිතකය දෙකේ පහවූ මැලි ගතියෙන් වාසයකරන්නෙම්ද විසුරුණු සිතින් බොහෝකොට වාසය කරම්ද, බොහෝකොට නොවිසුරුණු සිතින් වාසය කරම්ද,

බොහෝකොට සැක ඇතිව වාසය කරම්ද, පහවූ විචිකිච්ඡා ඇතිව බොහෝසේ වාසයකරම්ද, බොහෝසේ ක්‍රොධ කරණ සුළුව වාසයකරම්ද, බොහෝසේ ක්‍රොධ නොකරණ සුළුව වාසයකරම්ද, බොහෝසේ කිලිටි සිතින් වාසයකරම්ද, බොහෝසේ නොකිලිටි සිතින් වාසය කරම්ද, දාහ සහිතවූ කයින් බොහෝකොට වාසයකරම්ද, දාහ රහිතවූ කයින් බොහෝකොට වාසයකරම්ද, බොහෝ කොට කුසීතව වාසයකරම්ද, බොහෝකොට පටන්ගත් වීර්ය ඇතිව වාසයකරම්ද, බොහෝකොට එකඟ නැතිසිත් ඇතිව වාසයකරම්ද, බොහෝකොට එකඟසිත් ඇතිව වාසය කරම්දැයි කියායි.

**5.** "මහණෙනි, ඉදින් මහණතෙම, නුවණින් සිහි කරන්නේ 'බොහෝකොට දැඩිලොභ ඇතිව වාසය කරමි. බොහෝකොට කොපවූ සිතින් වාසය කරමි. බොහෝ කොට මැලි ගතියෙන් මඩනාලදුව වාසය කරමි. බොහෝ කොට සැක ඇතිව වාසය කරමි. බොහෝකොට ක්‍රොධ කරණ සුළුව වාසය කරමි. බොහෝකොට කිලිටි සිතින් වාසය කරමි. බොහෝකොට දාහ සහිත සිතින් වාසයකරමි. බොහෝකොට කුසීතවූ සිතින් වාසයකරමි. බොහෝකොට එකඟ නැති සිතින් වාසය කරමියි මෙසේ දනී. මහණෙනි ඒ මහණ විසින් ඒ ලාමක අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස බොහෝ කැමැත්තක්ද වෑයමක්ද උත්සාහයක්ද මහත් උත්සාහයක්ද පසුනොබැසීමක්ද සිහියක්ද සම්‍යක් ප්‍රඥාවක්ද කටයුතුයි."

**6.** "මහණෙනි, යම්සේ ගිනිගත් වස්ත්‍රයක් හෝ හිසක් ඇත්තෙක් ඒ වස්ත්‍රය හෝ හිස හෝ නිවීමට බොහෝ කැමැත්තක්ද, වෑයමක්ද උත්සාහයක්ද මහත් උත්සාහයක්ද, පසුනොබැසීමක්ද, සිහියක්ද සම්‍යක් ප්‍රඥාවක්ද, කටයුතුයි.

**7.** "මහණෙනි, ඉදින් මහණතෙම නුවණින් සිහිකරන්නේ 'බොහෝකොට දැඩිලොභ නැතිව වාසය කරමි. බොහෝකොට කොප නොවූ සිතින් වාසය කරමි. බොහෝ කොට පහවූ නිදිබරගතිය ඇතිව වාසය කරමි. බොහෝ කොට නොවිසුරුණු සිතින් වාසය කරමි. බොහෝ කොට පහවූ විචිකිච්ඡා ඇතිව

වාසය කරමි. බොහෝකොට ක්‍රොධ නොකර වාසය කරමි. බොහෝකොට කිලිටි නොවූ සිත් ඇතිව වාසය කරමි. බොහෝකොට දාහ රහිත කයින් වාසය කරමි. බොහෝකොට පටන්ගන්නාලද වීර්ය ඇතිව වාසය කරමි. බොහෝකොට එකඟවූ සිත් ඇතිව වාසය කරමි. මහණෙනි, ඒ මහණ විසින් ඒ කුශල ධර්මයන්හිම පිහිටා මත්තෙහි ආශ්‍රවයන්ගේ ක්ෂය පිණිස භාවනා වැඩිය යුතුයයි' මෙසේ දනී."

2. "**සාරිපුත්ත සචිත්ත පරියාය සූත්‍රය**:- 1. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි, මහණෙනියි' කියා භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක. ඒ භික්ෂූහු 'ඇවැත්නි' ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන්ට ප්‍රතිවචන දුන්හ. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි, ඉදින් (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.)

3 - 7. (මේජෙද මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 - 7 ඡෙදමෙන් වෙත් - "මහණෙනි" වෙනුවට "ඇවැත්නි" යෙදිය යුතුයි.)

3. **ඨිති පරිහානි සූත්‍රය**:- 1. "මහණෙනි, මම කුශල ධර්මයන්හි නැවතීමද වර්ණනා නොකරමි. පිරිහීම ගැන කියනුම කවරේද? මහණෙනි මම කුශල ධර්මයන්හි වැඩීම වර්ණනා කරමි. නැවතීම වර්ණනා නොකරමි. පිරිහීම වර්ණනා නොකරමි. මහණෙනි කෙසේ වනාහි කුශල ධර්මයන්හි නැවතීම නොවේද? වැඩීම නොවේද?

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම යම් පමණක ශ්‍රද්ධාවෙන්, ශීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥාවෙන්, වැටහීමෙන් යුක්තවේද, ඔහුට ඒ ධර්මයෝ නොනවතිත්, නොවැඩෙත්, මහණෙනි කුශල ධර්මයන්හි නැවතීම නොවේ, වෘද්ධිය නොවේ, මේ හානියයයි කියමි. මහණෙනි මෙසේ වනාහි කුශලධර්මයන්හි හානියවේ. නැවතීම හා වැඩීම නොවේ.

3. "මහණෙනි, කුශල ධර්මයන්හි කෙසේ නැවතීම වේද, හානිය වෘද්ධිය නොවේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම යම්පමණ ශ්‍රද්ධාවෙන් ශීලයෙන් ශ්‍රැතයෙන්

ත්‍යාගයෙන් ප්‍රඥාවෙන් වැටහීමෙන් යුක්තවේද, ඔහුට ඒ ධර්මයෝ නොපිරිහෙත් නොවැඩෙත්, මහණෙනි කුශල ධර්මයන්හි මේ නැවතීම කියමි. හානිය නොකියමි. වෘද්ධිය නොකියමි. (ii) මහණෙනි, මෙසේ වනාහි කුශල ධර්මයන්හි නැවතීම කියමි. හානිය නොකියමි.

4. "මහණෙනි, කුශල ධර්මයන්හි කෙසේ වෘද්ධියවේද නැවතීම නොවේද? පරිහානිය නොවේද? මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම යම් පමණ ශ්‍රද්ධාවෙන් ශීලයෙන් ශ්‍රැතයෙන් ත්‍යාගයෙන් ප්‍රඥාවෙන් වැටහීමෙන් යුක්තවේද ඔහුට ඒ ධර්මයෝ නොසිටිත්, නොපිරිහෙත්, මහණෙනි, කුශල ධර්මයන්හි මේ වෘද්ධිය කියමි. නැවතීම නොකියමි. පිරිහීම නොකියමි. මහණෙනි මෙසේ වනාහි කුශල ධර්මයන්හි වෘද්ධියවේ නැවතීම නොවේ. පිරිහීම නොවේ.

4. "**චෙතොසමථලාභී සූත්‍රය**:- 1. "මහණෙනි, ඉදින් මහණතෙම අනුන්ගේ සිතේ ආකාරය දැනීමේ දක්ෂනොවේද, නැවත 'තමන්ගේ සිතේ ආකාරය දැනීමේ දක්ෂවෙමියි, මහණෙනි, තොපවිසින් මෙසේ හික්මිය යුතුයි.

2. "මහණෙනි, කෙසේ වනාහි මහණතෙම තමාගේ සිතෙහි ආකාරය දැනීමේ දක්ෂවේද?

3. "මහණෙනි, ඉදින් මහණතෙම අනුන්ගේ සිතේ ක්‍රමය දැනීමෙහි දක්ෂනොවේද, ඉක්බිති 'තමාගේ සිතෙහි ආකාරය දැනීමේ දක්ෂවන්නෙමියි' මෙසේ තොප විසින් හික්මිය යුතුය. මහණෙනි, මහණතෙම කෙසේ තමාගේ සිතෙහි ආකාරය දැනීමේ දක්ෂවේද, මහණෙනි යම්සේ බාලවූ තරුණවූ අලංකාරයට කැමැති ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ (ii) කන්නාඩියක හෝ පිරිසිදු බබලන පැහැදුන දියබඳුනක හෝ තමාගේ මුවමඬල බලන්නේ, ඉදින් එහි දූවිල්ලක් හෝ කිලුටක් හෝ දකීද ඒ දූවිල්ල හෝ කිලුට නැතිකිරීම පිණිස වෑයම් කරයි. එහි දූවිල්ලක් හෝ කිලුටක් හෝ ඉදින් නොදකීද, එයින්ම සම්පූර්ණවූ කල්පනා ඇත්තේ 'ඒකාන්තයෙන් මට ලාභයක, ඒකාන්තයෙන් මා පිරිසිදුයයි' සතුටුවූයේවේ.

4. "මහණෙනි, එසේම මහණහට තමා තුළ සිතේ එකඟකම ලබන්නෙක් වන්නෙම්ද, අධ්‍යාත්මයෙහි චිත්ත සමථය ලබන්නෙක් නොවන්නෙම්ද අධිප්‍රඥාවෙන් ධර්මයන් විදර්ශනා කිරීම ලබන්නෙක්වෙම්ද, අධිප්‍රඥාවෙන් ධර්මයන් විදර්ශනා කරන්ට ලබන්නෙක් නොවන්නෙම්දැයි, කුශල ධර්මයන්හි නුවණින් කල්පනාකිරීම බොහෝ උපකාරවේ.

5. "මහණෙනි, ඉදින් මහණතෙම සිහිකරන්නේ 'තමා තුළ සිතේ එකඟකම් ලබා ඇත්තෙමි' ශ්‍රෙෂ්ඨ නුවණින් ධර්මයන් බැලීම නැත්තේයයි මෙසේ දනී. මහණෙනි, ඒ මහණ විසින් තමා තුළ ඇති සිතේ එකඟකමෙහි පිහිටා ශ්‍රෙෂ්ඨ නුවණින් ධර්මයන් බැලීමට වීර්ය කටයුතුය. හෙතෙම මෑත භාගයෙහි තමා තුළ සිතේ එකඟකමටද ශ්‍රෙෂ්ඨ නුවණින් ධර්මයන් බැලීමටද වෑයම් කටයුතුයි.

6. "මහණෙනි, ඉදින් මහණතෙම සිහිකරන්නේ ශ්‍රෙෂ්ඨ ප්‍රඥාවෙන් ධර්මයන් බලන්නට ලබන්නෙක්වෙමි. තමා තුළ සිත් එකඟකම ලබන්නට නොහැකියයි මෙසේ දනී. මහණෙනි, ඒ මහණ විසින් ශ්‍රෙෂ්ඨ ප්‍රඥාවෙන් ධර්මයෙන් බැලීමෙහි පිහිටා තමා තුළ සිත එකඟකිරීමෙහි වෑයම් කළයුතුය. හෙතෙම මෑතභාගයෙහි ශ්‍රෙෂ්ඨ නුවණින් ධර්මයන් බැලීම ලබන්නේ. තමා තුළ සිත එකඟකිරීමටද ලබන්නේවේ.

7. "මහණෙනි, ඉදින් මහණතෙම නුවණින් සිහිකරන්නේ අධ්‍යාත්මයෙහි සිතේ එකඟකම නොලබන්නේවේද, ශ්‍රෙෂ්ඨ ප්‍රඥාවෙන් ධර්මයන් බැලීමටද නොලබන්නේයයි මෙසේ දනීද, මහණෙනි, ඒ භික්ෂුව විසින් ඒ කුශල ධර්මයන්ගේ ලැබීම පිණිස මහත් කැමැත්තක්ද වෑයමක්ද උත්සාහයක්ද, අධික උත්සාහයයක්ද නොනැවැත්මක්ද සිහියක්ද, සම්‍යක් ප්‍රඥාවක්ද කටයුතුය.

8. "මහණෙනි, ගිනිගත් වස්ත්‍ර ඇති, (ii) ගිනිගත් හිස ඇති කෙනෙක් යම්සේද ඔහුගේ වස්ත්‍රය හෝ හිස නිවීම පිණිස මහත් කැමැත්තක්ද වෑයමක්ද උත්සාහයක්ද අධික උත්සාහයක්ද නොනැවැත්මක්ද සිහියක්ද සම්‍යක් ප්‍රඥාවක්ද කරන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

9. "මහණෙනි, එසේ ඒ භික්ෂුව විසින් ඒ කුශල ධර්මයන්ගේ ලැබීම පිණිස අධික මාත්‍ර කැමැත්තක්ද වෑයමක්ද උත්සාහයක්ද අධික උත්සාහයක්ද නොනැවැත්මක්ද සිහියක්ද සම්‍යක් ප්‍රඥාවක්ද කටයුතුය. හෙතෙම මෑතභාගයෙහි අධ්‍යාත්මයෙහි සිතේ එකඟකමද, ශ්‍රේෂ්ඨ ප්‍රඥාවෙන් ධර්මයන් බැලීමද බලන්නේද වේ.

10. "මහණෙනි, ඉදින් මහණතෙම නුවණින් සිහි කරනු ලබන්නේ තමන් තුළ සිතේ එකඟකම ලබන්නේ වෙමි. ශ්‍රේෂ්ඨ ප්‍රඥාවෙන් ධර්මයන් බැලීමද ලබමියි මෙසේ දනී. මහණෙනි, ඒ මහණ විසින් ඒ කුශල ධර්මයන්හිම පිහිටා මත්තෙහි ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස භාවනා කටයුතුය.

11. "(මෙහි මේ ඡේදය නවක නිපාතයේ 1. වර්ගයේ 6 සූත්‍රයේ 2 (ii) මෙහි එහි "ඇවැත්නි," යන්න මෙහි "මහණෙනි," කියාද එහි "දෙයාකාරයකින් දතයුතුය" යනු මෙහි "දෙයාකාරයකින් කියමි" කියාද වෙනස්විය යුතුය. ඒ සූත්‍රයේ 2 ඡේදය මේ සූත්‍රයේ අන්තිම ඡේදය වියයුතුයි.)

"මහණෙනි, මම සිවුර සේවනය කළයුතුවූද සේවනය නොකළයුතුවූදැයි දෙපරිද්දෙකින් කියමි.

12. "මෙහි නවක නිපාතයේ 1. වර්ගයේ 6 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) එහි 'ඇවැත්නි' යන්න මෙහි 'මහණෙනි' විය යුතුය.

(මෙසේ පිණ්ඩපාත, සෙනසුන්, ගම්නියම්ගම් ජනපද ප්‍රදෙශ, පුද්ගලයා යන කරුණෙහිත් යොදාගතයුතු.)

5. **පරිහානධම්ම සූත්‍රයː-** 1. "එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි මහණෙනියි' කියා භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක. ඒ භික්ෂූහු 'ඇවැත්නියි' ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "පිරිහෙන ස්වභාව ඇති පුද්ගලයායයි කියනුලැබේ. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් කොපමණකින් පිරිහෙන

ස්වභාව ඇති පුද්ගලයා වදාරණ ලද්දේද? භාග්‍යවතුන් වහන්සේ විසින් කොපමණකින් නොපිරිහෙන ස්වභාව ඇති පුද්ගලයා වදාරණ ලද්දේද

3. "ඇවැත්නි, අපි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් සමීපයෙන් මේ කියමනේ තේරුම දැනගන්නට දුරසිට එන්නෙමු. මේ කියමනේ තේරුම ආයුෂ්මත් ශාරීපුත්‍රයන්ටම වැටහේවා. ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේ වෙතින් අසා භික්ෂූහු දරත් යයි" කීවාහුය. "ඇවැත්නි, එසේ නම් අසව් මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමියි"කීහ. "ඇවැත්නි, එසේයයි" ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළසේක.

4. "ඇවැත්නි, භාග්‍යවතුන්වහන්සේ විසින් කොපමණකින් පිරිහීමට යන පුද්ගලයා වදාරණ ලදද? ඇවැත්නි මේ ශාසනයෙහි මහණතෙම නො ඇසූ ධර්මය නො අසයිද, ඔහු විසින් ඇසූ ධර්මයෝ සිහි නැතිබවට යෙත්ද, යම් ධර්ම කෙනෙක් පෙර සිතට ස්පර්ශවූයේද, ඔවුන්ද භාවිත නොකරත් නොදන්නා ලද්දද නොදනියි, ඇවැත්නි, මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් පිරිහෙන ස්වභාවය ඇති පුද්ගලයා වදාරණ ලදී.

5. "ඇවැත්නි, කොපමණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් නොපිරිහෙන ස්වභාව ඇති පුද්ගලයා වදාරණලද්දේද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම නොඅසන ලද්දාවූම ධර්මය අසයි. ඔහු විසින් අසනලද ධර්මයෝ සිහි නැති බවට නොයත්. ඔහු විසින් මේ ධර්මකෙනෙක් පෙර සිතින් ස්පර්ශ කරණ ලද්දාහුද ඔවුන්ද හසුරුවත්, නොදන්නා දෙයද දනී. ඇවැත්නි, මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් පිරිහෙන ස්වභාවය ඇති පුද්ගලයා වදාරණලදී.

6. "ඇවැත්නි, ඉදින් අනුන්ගේ සිත්හි ක්‍රමය නොදක්නේද, නැවත තමාගේ සිතේ ක්‍රමය දැනීමෙහි දක්ෂවෙමියි මෙසේ තොප විසින් හික්මිය යුතුයි. ඇවැත්නි කෙසේ මහණ තෙම, තමාගේ සිතෙහි ආකාරය දැනීමේ දක්ෂවේද, ඇවැත්නි යම්සේ

සැරසීමට ප්‍රිය බාල තරුණයෙක් (මෙහි මේ වර්ගයේ 4 සූත්‍රයේ 3 (ii) යෙදිය යුතුයි.)

7. "ඇවැත්නි, එසේම මහණහට කුශල ධර්මයන්හි බොහෝසේ දැඩි ලොභ නැතිව වාසය කරම්ද (ii) මා කෙරෙහි මේ ධර්මය විද්‍යමානවේද නැත්නම් නොවේද, 'බොහෝ සේ තොපනොවූ සිතින් වාසයකරම්ද (iii) (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) බොහෝ සේ පහවූ සිත කය දෙකේ මැලි ගතියෙන් මඩනා ලද්දේ වාසය කරම්ද, (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) නොවිසුරුණු සිතින් බොහෝසේ වාසයකරම්ද, (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) බොහෝ සේ පහවූ සැක ඇති වාසය කරම්ද (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) බොහෝ සේ ක්‍රොධ නොකරණසුළුව වාසය කරම්ද (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) බොහෝ සේ නොකිලිටි සිතින් වාසය කරම්ද (මෙහි 7 (ii) යෙදිය යුතුයි) අධ්‍යාත්මයෙහි ධර්මප්‍රමොදය ලබන්නෙක් වන්නෙම්ද (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) අධ්‍යාත්මයෙහි සිතේ එකඟකම ලබන්නෙම්ද (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ශ්‍රෙෂ්ඨ ප්‍රඥාවෙන් ධර්මයන් බැලීමට ලබන්නෙම්ද, මා කෙරෙහි මේ ධර්මය විද්‍යමානවේද නොහොත් නොවේදැයි නුවණින් සිහිකිරීම බොහෝ උපකාර වන්නේය.

8. "ඉදින් ඇවැත්නි මහණතෙම නුවණින් සිහි කරණු ලබන්නේ මේ සියලු කුශල ධර්මයන් තමා කෙරෙහි ලා දකීද, ඇවැත්නි ඒ මහණ විසින් මේ සියලු කුශල ධර්මයන් ලැබීම පිණිස (ii) මහත් කැමැත්තක්ද වෑයමක්ද උත්සාහයක්ද දැඩි උත්සාහයක්ද නොනැවැත්මක්ද සිහියක්ද සම්‍යක් ප්‍රඥාවක්ද කටයුතුයි.

9. "ඇවැත්නි, යම්සේ ගිනිගත් වස්ත්‍රයක් ඇති (මෙහි මේ වර්ගයේ 4 සූත්‍රයේ 8 (ii) යෙදිය යුතුයි.)

10. "ඇවැත්නි, එසේම ඒ භික්ෂුව විසින් සියලු මේ කුශල ධර්මයන් ලැබීම පිණිස (මෙහි 8 (ii) යෙදිය යුතුයි.)

11. "ඉදින් ඇවැත්නි, මහණතෙම නුවණින් සිහිකරණු දකියි. ඇතැම් කුශල ධර්මයක් තමන් කෙරෙහි නොදකියි ඇවැත්නි, ඒ මහණ විසින් යම් කුශල ධර්මයක් තමා කෙරෙහි දකීද, ඒ

කුශල ධර්මයන්හි පිහිටා යම් කුශල ධර්මයක් තමන් කෙරෙහි නොදකීද, ඒ කුශලධර්මයන් ලැබීම පිණිස (මෙහි 8 (ii) යෙදිය යුතුයි.)

**12.** "ඇවැත්නි, යම්සේ ගිනිගත් වස්ත්‍ර ඇති ගිනිගත් හිස ඇති කෙනෙක් ඒ වස්ත්‍රයාගේ හෝ හිසේ නිවීමට මහත්වූ කැමැත්තක් වෑයමක් උත්සාහයක් මහත් උත්සාහයක් නොනැවැත්මක් සිහියක් සම්‍යක් ප්‍රඥාවක් කරන්නේය. ඇවැත්නි, එසේම ඒ මහණ විසින් යම්කුශල ධර්මයක් තමාකෙරෙහිලා දකීද, ඒ කුශල ධර්මයන්හි පිහිටා යම් කුශල ධර්මයක් තමා කෙරෙහි නොදකීද ඒ කුශල ධර්මයන් ඉපදවීම පිණිස (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) ඇවැත්නි, ඉදින් මහණතෙම නුවණින් සිහි කරන්නේ මේ සියලු කුශල ධර්මයන් තමා කෙරෙහිලා දකීද ඇවැත්නි, ඒ මහණ විසින් මේ සියලු කුශල ධර්මයන්හි පිහිටා මත්තෙහි ආශ්‍රවයන් ක්ෂයවීම පිණිස භාවනාකටයුතුයි"

**6. පඨම දසසඤ්ඤා සූත්‍රයː-** 1. "මහණෙනි, වඩන ලද බහුල වශයෙන් කරණ ලද මේ හැඟීම් දසය මහත් ඵල වෙත් මහත් ආනිශංස වෙත්, නිවනට බැසගත්තාහු වෙත්. නිවන අවසන් කොට ඇත්තාහු වෙත්.

**2.** "කවර දසයක්ද යත්? අශුභ හැඟීම, මරණ හැඟීම, ආහාරයෙහි පිළිකුල් හැඟීම, සියලු ලොකයෙහි නොඇලෙන සංඥාව, අනිත්‍ය සංඥාව, අනිත්‍යයෙහි දුක් යන සංඥාව, දුකෙහි අනාත්ම සංඥාව, ප්‍රහාන සංඥාව, නොඇලෙන සංඥාව, නිවණ යන සංඥාව, (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

**7. "දුතිය දසසඤ්ඤා සූත්‍රයː-** 1. "මහණෙනි, වඩන ලද බහුල වශයෙන් කරණ ලද මේ හැඟීම් දහය මහත් ඵලවෙත්. මහත් ආනිශංස වෙත්. නිවණට බැසගත්තාහු වෙත් නිවණ අවසන් කොට ඇත්තාහු වෙත්.

**2.** "කවර දසයක්ද යත්? අනිත්‍ය හැඟීම, අනාත්ම හැඟීම, මරණ හැඟීම, ආහාරයෙහි පිළිකුල් හැඟීම, සියලු ලොකයෙහි නොඇලෙන සංඥාව, ඇට යන සංඥාව, පණුවන්ය යන

සංඥාව, නිල්වූ යන සංඥාව, සිදුරුවූ යන සංඥාව ඉදිමුණු යන සංඥාව, (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "**සබ්බ ධම්ම කිම්මූල සූත්‍රය**:- 1. "මහණෙනි, ඉදින් අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ (ii) 'ඇවැත්නි, සියලු ධර්මයෝ කුමක් මුල්කොට ඇත්තාහුද, සියලු ධර්මයෝ කුමකින් හටගත්තාහුද කුමකින් පහළවූවාහුද, කුමක රැස්වෙත්ද, කුමක් ප්‍රධාන කොට ඇත්තාහුද, කුමක් අධිපති කොට ඇත්තාහුද, කුමක් අධික කොට ඇත්තාහුද, කුමක් හරය කොට ඇත්තාහුද, කුමකට බැසගත්තාහුද, සියලු ධර්මයෝ කුමක් අවසන් කොට ඇත්තාහු දැයි' මෙසේ විචාරන්නාහුය.

2. "මහණෙනි, මෙසේ විචාරණ ලද තොපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට කුමක් නම් ප්‍රකාශ කරන්නාහු දැයි' විචාළ සේක. "ස්වාමීනි, අපේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ අධිපති කොට ඇත්තාහ භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහ. ස්වාමීනි, මේ කියමනේ තේරුම භාග්‍යවතුන් වහන්සේටම වැටහේනම් යහපත. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහුයයි" කීවාහුය. "මහණෙනි, එසේනම් අසව්, මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමි"යි වදාළ සේක. "ස්වාමීනි, එසේයයි" භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක."

3. "මහණෙනි, ඉදින් අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ විචාරණ ලද තෙපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට, ඇවැත්නි, සියලු ධර්මයෝ කැමැත්ත මුල්කොට ඇත්තාහ. සියලු ධර්මයෝ මෙනෙහි කිරීමෙන් හටගත්තාහුය. සියලු ධර්මයෝ ස්පර්ශයෙන් පහළවූවාහුය, සියලු ධර්මයෝ වෙදනාවෙහි වැටෙන්නාහුය. සියලු ධර්මයෝ සිත එකඟ කිරීම මුල්කොට ඇත්තාහ. සියලු ධර්ම සිහිය අධිපතිකොට ඇත්තාහ. සියලු ධර්මයෝ ප්‍රඥාව මත්තෙහි කොට ඇත්තාහ. සියලු ධර්මයෝ මිදීම හරය කොට ඇත්තාහ. සියලු ධර්මයෝ නිවණට බැසගත්තාහ. සියලු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ධර්මයෝ නිවන අවසන් කොට ඇත්තාහයි’ මෙසේ ප්‍රකාශ කරව්. මහණෙනි, මෙසේ විචාරණ ලද්දාවූ තෙපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ ප්‍රකාශ කරන්නාහුය.”

9. “**පබ්බජ්ජා පරිචිත සූත්‍රයඃ**- 1. එහෙයින් මහණෙනි, මෙහි පැවිද්ද යම්සේද අපගේ සිත පුරුදු කරණ ලද්දක්ද වන්නේය. උපන් ලාමක අකුශල ධර්මයෝ සිත මැඩගෙන නොසිටිත්. අනිත්‍ය සංඥාව පුරුදු කරණ ලද අපගේ සිත වන්නේය. අනාත්ම සංඥාව පුරුදු කරණ ලද අපගේ සිත වන්නේය. අශුභ සංඥාව පුරුදු කරණ ලද අපගේ සිත වන්නේය. දොෂ සංඥාව පුරුදු කරණ ලද අපගේ සිත වන්නේය. ලොකයාගේ සම තත්ත්වයද විෂම තත්ත්වයද දැන අපගේ සිත ඒ සංඥාව පුරුදු කරණ ලද්දේ වන්නේය. ලොකයාගේ ඇතිවීමද නැතිවීමද දැන අපගේ සිත ඒ සංඥාව පුරුදු කළේ වන්නේය. ලොකයාගේ හටගැනීමද විනාශයද දැන අපගේ සිත ඒ සංඥාව පුරුදුකරණ ලද්දේ වන්නේය. ප්‍රහාණ සංඥාව පුරුදු කරණ ලද අපගේ සිත වන්නේය. නොඇලෙන සංඥාව පුරුදු කරණ ලද අපගේ සිත වන්නේය. නිවණ යන සංඥාව පුරුදු කරණලද අපගේ සිත වන්නේයයි මෙසේ හික්මිය යුතුයි.

2. “මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි. මහණෙනි, යම් තැනක සිට මහණ හට ප්‍රව්‍රජ්‍යාව පුරුදු කරණ ලද සිත වේද උපන් ලාමක අකුශල ධර්මයෝ සිත මැඩගෙන සිටිත්ද අනිත්‍ය සංඥාව පුරුදු කරණ ලද සිතවේද, උපන් ලාමක අකුශල ධර්මයෝ සිත මැඩගෙන සිටිත්ද, අනිත්‍ය සංඥාව, අනාත්ම සංඥාව, අශුභ සංඥාව, දොෂ දක්නා සංඥාව, ලොකයාගේ සම තත්ත්වයද විෂම තත්ත්වයද දැන ඒ සංඥාව පුරුදු කරණ ලද සිතවේද, ලොකයාගේ හටගැනීමද විනාශයද දැන ඒ සංඥාව පුරුදු කරණලද සිත වේද, දුරුකරණ සංඥාව පුරුදු කරණ ලද සිත වේද, නො ඇලෙන සංඥාව පුරුදු කරණ ලද සිත වේද, නිවණ යන සංඥාව පුරුදු කරණ ලද සිත වේද ඕහට මෙලොව රහත් ඵලයද ස්කන්ධයන් පැවැත්මෙහි හේතුව ඇති කල්හි අනාගාමි බව හෝ වේ”

**10. ගිරිමානන්ද සූත්‍රය**:- 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනේ පිඩු මහසිටානන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක. ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේ, ලෙඩවූයේ දුකටපත්වූයේ දැඩි ගිලන් වූයේවේ. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණි සේක. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටි සේක. එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිර තෙම ලෙඩවූයේ දුකට පත්වූයේ දැඩි ගිලන්වූයේ වෙයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිර තෙම යම් තැනෙක්හිද අනුකම්පා උපදවා එහි වඩිත්වායි කීහ."

2. "ආනන්දය, ඉදින් ඔබ ගිරිමානන්ද භික්ෂුව කරා පැමිණ දස සංඥාව කියන්නෙහිය. යම් හෙයකින් ගිරිමානන්ද භික්ෂුවට දස සංඥාව අසා ඒ ලෙඩය ක්‍රමයෙන් සංසිඳෙන්නේය, යන මේ කාරණය විද්‍යමානවේ.

3. "කවර දසයක්ද යත්? අනිත්‍ය සංඥාව අනාත්ම සංඥාව අශුභ සංඥාව දොෂ දක්නා සංඥාව දුරු කරණ සංඥාව නොඇලෙන සංඥාව, නිවණ යන සංඥාව, සියලු ලොකයෙහි නොඇලෙන සංඥාව, සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥාව, හුස්ම ඉහළ පහළ ගැනීමේ සිහිය යන දසයයි.

4. "ආනන්දය, අනිත්‍ය සංඥාව කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම වනයකට ගියේ හෝ රුකක් මුලකට ගියේ හෝ හිස් ගේකට ගියේ හෝ රූපය අනිත්‍යය, වේදනාව අනිත්‍යය, සංඥාව අනිත්‍යය, සංස්කාරය අනිත්‍යය, විඥ්ඥාණය අනිත්‍යයයි, මෙසේ ප්‍රත්‍යවෙක්ෂා (නුවනින් බැලීම) කරයි 'මෙසේ මේ මාගේයයි' ඇලීම ඇතිකරගත් ධර්ම පස කෙරෙහි අනිත්‍යය අනුව බලමින් වාසය කරයි. ආනන්දය මේ අනිත්‍ය සංඥාවය.

5. "ආනන්දය, අනාත්ම සංඥාව කවරේද, ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම වනයකට ගියේ හෝ රුකක් මුලට ගියේ හෝ හිස් ගේකට ගියේ හෝ ඇස අනාත්මය, රූපය අනාත්මය, කණ අනාත්මය, ශබ්දය අනාත්මය, නාසය අනාත්මය, ගඳ සුවඳ අනාත්මය, දිව අනාත්මය, රසය අනාත්මය, ශරීරය අනාත්මය, ස්පර්ශය අනාත්මය, සිත අනාත්මය; සිතට වැටහෙන දෙය අනාත්මයයි මෙසේ කල්පනා කරයි. මෙසේ මේ තමා තුළ පිහිටියාවූද බැහැර සිටියාවූද සතර දික් කරණ ධර්මයන් කෙරෙහි අනාත්මය අනුව බලමින් වාසය කරයි. ආනන්දය මේ අනාත්ම සංඥාවයයි කියනු ලැබේ.

6. "ආනන්දය, අශුභ සංඥාව කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණ තෙම දෙපතුලින් උඩ මස්තකයෙහි කෙශයන්ගෙන් යට සම කෙළවර කොට ඇති මේ ශරීරයෙහි නානාප්‍රකාර අශුභ දේ නුවනින් කල්පනාකරයි. මේ ශරීරයෙහි කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇටමිඳුළු, වකුගඩුව, හෘදය, අක්මාව, දළබුව, බඩදිව, පපුමස, බඩවැල, අතුනුබහන්, නොපැසුනු අහර අශුචි, පිත, සෙම්, සැරව, ලෙය, ඩහදිය, මේද තෙල කඳුළු, වුරුණු තෙල, කෙළ සොටු, ඇටමිදුළු, මුත්‍ර යන නානාප්‍රකාර අශුචිත් ප්‍රත්‍යවෙක්ෂා කරයි. ආනන්දය, මේ අශුභ සංඥායයි කියනු ලැබේ.

7. "ආනන්දය, දොෂ දක්නා සංඥාව කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම වනයකට ගියේ හෝ ගසක්මුලට ගියේ හෝ හිස් ගේකට ගියේ හෝ මේ ශරීරය බොහෝ දුක්ය. බොහෝ දොෂය, මෙසේ මේ ශරීරයෙහි යම් සේ ඇස් රොගය, කන් රොගය, නාසා රොගය, දිවේ රොගය, ශරීරයෙහි රොගය, හිසේ රොගය, කණේ රොගය, කටේ රොගය, දත් රොගය, කාශය, ශ්වාසය, පීනසය, ඩහදිය, ජරාව, බඩේ රොගය, මූර්ච්ඡාව, අතීසාරය, ශූලය, කොලරා රොගය, කුෂ්ට ගෙඩි, ලාදුරු, ක්ෂය, අපස්මාරය, දද, කැසීම කුෂ්ටය, රබසා කුෂ්ටය, රත්පිතය, දියවැඩියාව, පක්ෂාඝාත රොගය, පිළිකා, භගඅතරෙහි එන ගෙඩිය, පිතින් උපන් ලෙඩය, සෙමින් උපන් ලෙඩය, වාතයෙන්

උපන් ලෙඩය, තුන්දොස් කිපීමෙන් උපන් ලෙඩය, ඍතු විපර්යාසයෙන් උපන් ලෙඩය, වෙනස් පැවැත්මෙන් උපන් ලෙඩය, උපක්‍රමයෙන් උපන් ලෙඩය, කර්ම විපාකයෙන් උපන් ලෙඩය, සීතය, උෂ්ණය, බඩගින්නය, පිපාසය, මලය, මුත්‍රය යන නානා ප්‍රකාර ලෙඩ උපදිත්. මෙසේ මේ ශරීරයෙහි දොෂය අනුව බලන සුලුව වාසය කරයි. ආනන්දය මේ ආදීනව සංඥායයි කියනු ලැබේ.

8. "ආනන්දය, දුරුකරණ සංඥාව කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම උපන් කාම සිතිවිල්ල නොඉවසයිද, අත්හරියිද, දුරුකරයිද, කෙළවර කරයිද, අභාවයට පමුණුවයිද, උපන් ක්‍රොධ සිතිවිල්ල නොඉවසයි අත්හරියි. දුරුකරයි, කෙළවර කරයි, අභාවයට යවයි, උපන් හිංසා සිතිවිල්ල නොඉවසයි අත්හරියි, දුරුකරයි, කෙළවර කරයි, අභාවයට යවයි, උපනුපන් ලාමක අකුශල ධර්මයන් නොඉවසයි, අත්හරියි, දුරුකරයි, කෙළවර කරයි, අභාවයට යවයි, ආනන්දය මේ දුරුකරණ සංඥායයි කියනු ලැබේ.

9. "ආනන්දය, නොඇලෙන සංඥාව කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම වනයට ගියේ හෝ රුකක් මුලට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ යම් මේ සියලු සංස්කාරයන්ගේ මැඩ පැවැත්මක් වේද, සියලු තෘෂ්ණාදී කෙලෙසුන්ගේ දුරුකිරීමක් වේද, තෘෂ්ණාවගේ ක්ෂය කිරීමක් වේද, නොඇලීමක් වේද, නිරුද්ධියක් වේද, නිර්වාණයක් වේද, මෙය ශාන්තය මෙය පූර්ණයයි. මෙසේ කල්පනා කරයි. ආනන්දය, මේ නොඇලෙන සංඥාවයි කියනු ලැබේ.

10. "ආනන්දය, නිරොධ සංඥාව කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම වනයකට ගියේ හෝ ගසක් යටට ගියේ හෝ හිස් ගේකට ගියේ හෝ යම් මේ සියළු සංස්කාරයන්ගේ සන්සිඳීමක් වේද, තෘෂ්ණාදී කෙලෙසුන්ගේ දුරුකිරීමක් වේද, සියලු තෘෂ්ණාවගේ ක්ෂය වීමක් වේද, නිරුද්ධියක් වේද, නිවීමක් වේද මේ නිවණ ශාන්තය මේ නිවණ ප්‍රණීතයයි මෙසේ කල්පනා කරයි. ආනන්දය මෙය නිරොධ සංඥායයි කියනු ලැබේ.

11. "ආනන්දය, සියලු ලොකයෙහි නොඇලෙන සංඥාව කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම යමක් ලොකයෙහි පිළිවෙළින් දැඩිසේ ගන්නා සිතට වැටහෙන වැදගන්නා ඇතුළත සයනය කරණ යම් ක්ලෙශයන් වෙත්ද ඔවුන් නොගනිමින් දුරු කරමින් නොඇලෙයි. ආනන්දය මේ සියලු ලොකයෙහි නොඇලෙන සංඥාව වේ.

12. "ආනන්දය, සියලු සංස්කාරයන්හි අනිත්‍ය සංඥාව කවරීද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම සියලු සංස්කාරයන් පෙළයි. ගරහයි. පිළිකුල් කෙරෙයි. ආනන්දය, මේ සියලු සංස්කාරයන්හි අනිත්‍ය සංඥායයි කියනු ලැබේ.

13. "ආනන්දය, ආනාපාන සතිය කවරේද? ආනන්දය මේ ශාසනයෙහි මහණතෙම වනයකට ගියේ හෝ ගසක් මුලට ගියේ හෝ හිස් ගේකට ගියේ හෝ පලක් බැඳගෙන ශරීරය ඍජුව තබා සිහිය අභිමුඛයට ගෙන හෙතෙමේ සිහි ඇතිව ආශ්වාස කරයි. (හුස්ම ගැනීම) සිහි ඇතිව ප්‍රශ්වාස (හුස්ම හෙළීම) කරයි. දීර්ඝව ආශ්වාස කරන්නේ දීර්ඝව ආශ්වාස කරමියි දනියි. දීර්ඝව ප්‍රශ්වාස කරන්නේ දීර්ඝව ප්‍රශ්වාස කරමියි දනියි. හ්‍රස්වව (කොටව) ආශ්වාස කරන්නේ හ්‍රස්වව ආශ්වාස කරමියි දනියි හ්‍රස්වව ප්‍රශ්වාස කරන්නේ හ්‍රස්වව ප්‍රශ්වාස කරමියි දනියි. සියලු ආශ්වාස ප්‍රශ්වාස සමූහය දන්නේ ආශ්වාස කරයි හික්මෙයි. සියලු ආශ්වාස ප්‍රශ්වාස සමූහය දන්නේ ප්‍රශ්වාස කරමියි හික්මෙයි. කයේ ක්‍රියාකිරීමේ ශක්තිය මැඩපවත්වන්නේ ආශ්වාස කරමියි හික්මෙයි කයේ ක්‍රියා කිරීමේ ශක්තිය මැඩපවත්වන්නේ ප්‍රශ්වාස කරමියි හික්මෙයි. ප්‍රීතිය විඳින්නේ ආශ්වාස කරමියි හික්මෙයි. ප්‍රීතිය විඳින්නේ ප්‍රශ්වාස කරමියි හික්මෙයි. සැපය විඳින්නේ ප්‍රශ්වාස කරමියි හික්මෙයි. සිතේ රැස්කිරීම දන්නේ ආශ්වාස කරමියි හික්මෙයි. සිතේ රැස් කිරීම දන්නේ ප්‍රශ්වාස කරමියි හික්මෙයි. සිතේ රැස් කිරීම මැඩපවත්වන්නේ ආශ්වාස කරමියි හික්මේ. සිතේ රැස්කිරීම මැඩපවත්වන්නේ ප්‍රශ්වාස කරමියි හික්මේ. සිත දන්නේ ආශ්වාස කරමියි හික්මේ. සිත දන්නේ ප්‍රශ්වාස කරමියි හික්මේ සිත

අතිශයින් සතුටු කරන්නේ ආශ්වාස කරමියි හික්මේ. සිත අතිශයින් සතුටු කරන්නේ ප්‍රශ්වාස කරමියි හික්මෙයි. සිත තැන්පත් කරන්නේ ආශ්වාස කරමියි හික්මෙයි. සිත තැන්පත් කරන්නේ ප්‍රශ්වාස කරමියි හික්මෙයි. සිත මුදන්නේ ආශ්වාස කරමියි හික්මෙයි. සිත මුදන්නේ ප්‍රශ්වාස කරමියි සිතයි. අනිත්‍යය අනුව දක්නේ ආස්වාස කරමියි, ප්‍රශ්වාස කරමියි නොඇලීම අනුව දක්නේ ආශ්වාස කරමියි ප්‍රශ්වාස කරමියි නිරුද්ධිය අනුව දක්නේ ආශ්වාස කරමියි ප්‍රශ්වාස කරමියි දුරුකිරීම අනුව දක්නේ ආශ්වාස කරමියි හික්මෙයි දුරු කිරීම අනුව දක්නේ ප්‍රශ්වාස කරමියි හික්මෙයි. ආනන්දය, මේ ආනාපාන සතියයි කියනු ලැබේ.

**14.** "ආනන්දය, ඉදින් ඔබ ගිරිමානන්ද මහණතෙම වෙත එළඹ මේ දශසංඥාවන් කියන්නේය. මේ දශ සංඥාවන් අසා යම් හෙයකින් ගිරිමානන්ද භික්ෂුවගේ ඒ ලෙඩය ක්‍රමයෙන් යටපත් වන්නේද මේ කරුණ විද්‍යමානවේ."

**15.** ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ දස සංඥාවන් උගෙන ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණි සේක. පැමිණ ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන්ට මේ දශ සංඥාවන් කීහ. ඉක්බිති ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන්ට මේ දස සංඥාවන් අසා ඒ ආබාධය ක්‍රමයෙන් සංසිඳුනේය. ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේ ඒ ආබාධයෙන් නැගී සිටි සේක. ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන්ගේ ඒ රොගය එසේම ප්‍රහීන විය.

**(6. සචිත්ත වර්ගය නිමි.)**

---

## 7. යමක වර්ගය

**11. අවිජ්ජා පුරිමකොටි සූත්‍රයඃ-** 1. "මහණෙනි 'මින් පෙර අවිද්‍යාව (නොදැනීම) නොවූයේය නැවත පසුව පහළවූයේ යයි' අවිද්‍යාවගේ මුල් කෙළවර නොපෙනේ. මහණෙනි, එය

මෙසේ කියනු ලැබේ. එසේද වුවත් මෙය ප්‍රත්‍යයක්කොට ඇත්තේයයි පෙනේ. මහණෙනි, මම අවිද්‍යාවද ආහාර සහිතයයි කියමි. ආහාර නැතැයි නොකියමි.

2. "අවිද්‍යාවගේ ආහාරය කවරේද? එයට පංචනීවරණයෝ යයි කිවයුතුය. මහණෙනි, මම නීවරණ පසද ආහාර සහිතයයි කියමි. ආහාර රහිතයයි නොකියමි. පඤ්චනීවරණයන්ට ආහාරය කවරේද, එයට ත්‍රිවිධ දුශ්චරිතයෝ යයි කිව යුතුය. ආහාරසහිතවූ ආහාර රහිත නොවූ ත්‍රිවිධ දුශ්චරිතයන්ද කියමි. ත්‍රිවිධ දුශ්චරිතයන්ට ආහාරය කවරේද? එයට ඉන්ද්‍රිය අසංවරයයි කිවයුතුය.

3. "මහණෙනි, මම ඉන්ද්‍රිය අසංවරයද ආහාර සහිතයයි කියමි. ආහාර රහිත යයි නොකියමි. ඉන්ද්‍රිය අසංවරයට ආහාරය කවරේද? සිහිය හා මනාව නොදැනීම යයි කිවයුතුය. මහණෙනි, මම සිහිය හා මනාව නොදැනීමද ආහාර සහිත යයි කියමි. ආහාර රහිතයයි නොකියමි අසිහියට හෝ මනාව නො දැනීමට ආහාරය කවරේද? එයට නුනුවණින් මෙනෙහි කිරීමයයි කිවයුතුය. මහණෙනි, මම නුනුවණින් මෙනෙහි කිරීමද ආහාර සහිත යයි කියමි. ආහාර රහිතයයි, නොකියමි නුනුවණින් මෙනෙහි කිරීමට ආහාරය කවරේද? එයට අශ්‍රද්ධාවයයි කිවයුතුය. මහණෙනි, මම අශ්‍රද්ධාවද ආහාර සහිතයයි කියමි. ආහාර රහිතයයි නොකියමි. අශ්‍රද්ධාවට ආහාරය කවරේද? එයට සද්ධර්ම නොවූ දේ ඇසීමයයි කිව යුතුය. මහණෙනි මම සද්ධර්ම නොවූදේ ඇසීම් ආහාර සහිතයයි කියමි. ආහාර රහිතයයි නොකියමි. සද්ධර්ම නොවූ දේ ඇසීමට ආහාරය කවරේද? එයට අසත්පුරුෂ ආශ්‍රයයි කිවයුතුය.

4. "මහණෙනි. මෙසේ අසත්පුරුෂාශ්‍රය සම්පූර්ණ කළ තැනැත්තා සද්ධර්ම නොවූ දේ ඇසීම සම්පූර්ණ කරයි. සද්ධර්ම නොවූ දෙය පුරවන්නේ අශ්‍රද්ධාව පුරවයි. අශ්‍රද්ධාව පුරවන්නේ නුනුවණින් මෙනෙහි කිරීම පුරවයි නුනුවණින් මෙනෙහි කිරීම පුරවන්නේ සිහිය හා මනාව නොදැනීම පුරවයි. සිහිය හා මනාව නොදැනීම පුරවන්නේ ඉන්ද්‍රියයන්ගේ අසංවරය පුරවයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඉන්ද්‍රියයන්ගේ අසංවරය පුරවන්නේ ත්‍රිවිධ දුශ්චරිත පුරවයි ත්‍රිවිධදුශ්චරිතය සම්පූර්ණකළාහු නීවරණ ධර්ම පස පුරවත් නීවරණ ධර්මපසේ සම්පූර්ණත්වයෙන් අවිද්‍යාව පුරවයි. මෙසේ මේ අවිද්‍යාවගේ ආහාරය මෙසේද සම්පූර්ණවේ.

**5.** "මහණෙනි, යම්සේ පර්වතයක් උඩ ලොකු වැහි බින්දු ඇති වර්ෂාවක් වස්නාකල්හි වලාකුළු ගුගුරන කල්හි ඒ ජලය නිම්න කරා ගලායන්නේ පර්වත කඳුරු ඇල දොළ ශාඛා පුරවයි. පර්වත කඳුරු, ඇල දොළ ශාඛා පිරීමෙන් කුඩා වලවල් පුරවත්. කුඩා වලවල් පිරීමෙන් මහවලවල් පුරවත්. මහවලවල් පිරීමෙන් කුඩා ගංගා පුරවත්, කුඩා ගංගා පිරීමෙන් මහා ගංගා පිරෙත්ද මහා ගංගා පිරීමෙන් මහා සමුද්‍රය සාගරය පුරවත්. මෙසේ මේ මහා සමුද්‍ර නම් සාගරයාගේ ආහාරය වේ. මෙසේ සම්පූර්ණවීම වේ.

**6.** "මහණෙනි, එසේම අසත්පුරුෂ ආශ්‍රය සම්පූර්ණ කරන්නේ සද්ධර්ම නොවූ දෙය ඇසීම සම්පූර්ණ කරයි. සද්ධර්ම නොවූ දෙය ඇසීම පුරන්නේ අශ්‍රද්ධාව පුරවයි. අශ්‍රද්ධාව පුරවන්නේ නුනුවණින් මෙනෙහි කිරීම පුරවයි. නුනුවණින් මෙනෙහි කිරීම පුරවන්නේ අසිහිය හා මනාව නො දැනීම පුරවයි. අසිහිය හා මනාව නොදැනීම පුරවන්නේ ඉන්ද්‍රිය අසංවරය පුරවයි. ඉන්ද්‍රිය අසංවරය පුරවන්නේ ත්‍රිවිධ දුශ්චරිත පුරවයි. ත්‍රිවිධ දුශ්චරිතය පුරවන්නේ නීවරණ ධර්ම පස පුරවයි. නීවරණ ධර්ම පස පුරවන්නේ නොදැනීම පුරවයි. මෙසේ මේ අවිද්‍යාවගේ ආහාරය වේ. මෙසේද පිරෙන්නේවේ.

**7.** "මහණෙනි, මම විද්‍යාවන් නිසා ලබන විමුක්තියද ආහාර සහිතයයි කියමි. ආහාර රහිත යයි නොකියමි. විද්‍යාවන්ගෙන් ලබන නිදහසට ආහාරය කවරේද? බොධියෙහි අංගසතබොජ්ක්ධංගයයි කියමි. මහණෙනි, මම බොධියෙහි අංග සතද ආහාර සහිතයයි කියමි. ආහාර රහිතයයි නොකියමි. බොධියෙහි අංග සතට ආහාරය කවරේද? සතර සතිපට්ඨාන යයිකිවයුතුය. මහණෙනි, මම සතර සතිපට්ඨානයද, ආහාර සහිතයයි කියමි. ආහාර රහිතයයි නොකියමි. සතර

සතිපට්ඨානයන්ට ආහාරය කවරේද? සුචරිත තුනයයි කිව යුතුය මහණෙනි, මම සුචරිත තුනද ආහාර සහිතයයි කියමි. ආහාර රහිතයයි නොකියමි. ත්‍රිවිධ සුචරිතයන්ගේ ආහාරය කවරේද? ඉන්ද්‍රිය සංවරයයි කිවයුතුය. මහණෙනි මම ඉන්ද්‍රිය සංවරයද ආහාර සහිතයයි කියමි. ආහාර රහිතයයි නොකියමි. ඉන්ද්‍රිය සංවරයට ආහාරය කවරේද? සිහිය හා මනාව දැනීම යයි කිවයුතුය. මහණෙනි, මම සිහිය හා මනාව දැනීම ආහාර සහිතයයි කියමි. ආහාර රහිතයයි නොකියමි. සිහියට හා මනාව දැනීමට ආහාරය කවරේද? නුවණින් මෙනෙහි කිරීමයයි කිවයුතුය. මහණෙනි, මම නුවණින් මෙනෙහි කිරීමද ආහාර සහිතයයි කියමි. ආහාර රහිතයයි නොකියමි නුවණින් මෙනෙහි කිරීමට ආහාරය කවරේද? ශ්‍රද්ධාවයයි කිවයුතුය. මහණෙනි, මම ශ්‍රද්ධාවද ආහාර සහිතයයි කියමි. ආහාර රහිතයයි නොකියමි. ශ්‍රද්ධාවට ආහාරය කවරේද? සද්ධර්මශ්‍රවණයයි කිවයුතුය. මහණෙනි, මම සද්ධර්මශ්‍රවණයද ආහාර සහිතයයි කියමි. ආහාර රහිත යයි නොකියමි. සද්ධර්ම ශ්‍රවණයට ආහාරය කවරේද? සත්පුරුෂ ආශ්‍රයයි කිවයුතුය.

8. "මහණෙනි, මෙසේ සත්පුරුෂාශ්‍රය පුරන්නේ සද්ධර්මශ්‍රවණය පුරයි. සද්ධර්මශ්‍රවනය පුරන්නේ ශ්‍රද්ධාව පුරයි ශ්‍රද්ධාව පිරීමෙන් නුවණින් මෙනෙහි කිරීම පුරයි. නුවණින් මෙනෙහි කිරීම පුරන්නේ සිහිය හා මනාව දැනීම පුරයි. සිහිය හා මනාව දැනීම පුරන්නේ ඉන්ද්‍රිය සංවරය පුරයි. ඉන්ද්‍රිය සංවරය පුරන්නේ ත්‍රිවිධ සුචරිතය පුරයි. ත්‍රිවිධ සුරිත පිරුණාහු සතර සතිපට්ඨානයන් පුරත්. සතර සතිපට්ඨාන පිරීමෙන් බොධියෙහි අංග සත පුරයි. බොධියෙහි අංගසත පිරීමෙන් විද්‍යාවන් කරණකොට මිදීම පුරයි. මෙසේ මේ විද්‍යාවන් කරණකොට මිදීමට ආහාරය වේ. මෙසේද සම්පූර්ණවේ.

(මෙහි 5 වෙනි ඡෙදයද 8 වෙනි ඡෙදයද යෙදිය යුතුයි.)

**12. භවතණ්හා පුරිමකොටි සූත්‍රයः**- 1. "මහණෙනි, මින්පෙර භවතෘෂ්ණාව නොවූයේය. නැවත පසුව පහළවූයේ යයි භව තෘෂ්ණාවගේ මුල්කෙළවර නොපෙනේ (මේ සූත්‍රය මේ

වර්ගයේ 11 සූත්‍රය මෙනි. "අවිජ්ජා" වෙනුවට "භවතණ්හා" යෙදිය යුතුයි.)

13. **නිට්ඨංගත සූත්‍රය**:- 1. "මහණෙනි, යම්කිසි කෙනෙක් මා කෙරෙහි නිෂ්ටාවට ගියාහුද ඒ සියල්ලෝ සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූවාහුය. සම්‍යක් දෘෂ්ටියෙන් යුක්ත ඒ පස්දෙනකුට මේ කාම භවයෙහි නිෂ්ටාවෝ වෙත්. පස්දෙනෙකුට මෙයින් පිට චුතවී රූප භවයෙහි නිෂ්ටාවෝ වෙත්. කවර පස්දෙනකුට මෙහි නිෂ්ටාවෝ වෙත්ද? (ii) සත්වනවර රහත්වන පුද්ගලයාටද සයවෙනි වාරය දක්වා අතරදී රහත්වන කොලං කොල පුද්ගලයාටද, දෙවන වාරයේ රහත්වන එකබීජ පුද්ගලයාටද, සකෘදාගාමී පුද්ගලයාටද, යමෙක් මේ ආත්මයෙහි රහත්ද යන මේ පුද්ගලයන් පස්දෙනාට මෙහි නිෂ්ටාවෝ වෙත්"

2. "කවර පස්දෙනෙකුට මෙය හැර පිටදී නිෂ්ටාවෝ වෙත්ද? (ii) පඤ්ච ශුද්ධාවාසයෙහි ආයුෂ අර්ධයක් අවසන් නොකර පිරිනිවෙන අනන්තරාපරිනිබ්බායිද, අර්ධයක් අවසන් කොට පිරිනිවෙන උපාච්චපරිනිබ්බායීද, උත්සාහයෙන් කෙලෙස් නැති කරණ සසංඛාර පරිනිබ්බායීද, නිදුකින් ක්ලේශ පරිනිර්වාණය කරණ අසංඛාර පරිනිබ්බායීය. අවහසේයසිට අකනිෂ්ටය දක්වා ගොස් කෙලෙස් නසන උද්ධංසොත අකනිට්ඨ ගාමිනී යන මේ පස්දෙනාට මෙය හැර නිෂ්ටාවෝ වෙත්. මහණෙනි, යම්කිසි කෙනෙක් මා කෙරෙහි නිෂ්ටාවට පැමිණියාහුද, ඒ සියල්ලෝ සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූවාහුය. ඒ දෘෂ්ටියෙන් යුක්තවූ මේ පස්දෙනාට මෙහි නිෂ්ටාවෝ වෙත්. මේ පස්දෙනාට මෙය හැර නිෂ්ටාවෝ වෙත්.

14. **අවෙච්චප්පසන්න සූත්‍රය**:- 1. "මහණෙනි, යම් කෙනෙක් මා කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවූවාහුද ඒ සියල්ලෝ සොවාන්හ. ඒ සොවාන් පුද්ගලයන් පස්දෙනාට මෙහි නිෂ්ටාවෝ වෙත්, පස්දෙනෙකුට මෙය හැර නිෂ්ටාවෙත්.

2. කවර පස්දෙනකුට මෙහි නිෂ්ටාවෝ වෙත්ද? (මෙහි මේ වර්ගයේ 13 සූත්‍රයේ 1 (ii) 2 (ii) යෙදිය යුතුයි.)

**15. සාමණ්ඩකානී සූත්‍රය**:- 1. එක් කාලයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මගධ රට නාලක ගමෙහි වාසය කරණ සේක. ඉක්බිති සාමණ්ඩකානි පරිබ්‍රාජකතෙම ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත් පසෙක සිටියේය.

**2.** එකත් පසෙක සිටි සාමණ්ඩකානි පරිබ්‍රාජකතෙම ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට "ඇවැත්නි, ශාරිපුත්‍රය සැපදුක කිමෙක් දැයි" ඇසීය. "ඇවැත්නි, ඉපදීම දුකය නොඋපදීම සැපය. ඇවැත්නි, ඉපදීම ඇතිකල්හි සීත, උෂ්ණ, කනු කැමැත්ත, පිපාසය, මළමුත්‍ර පහකිරීම, ගිනිදැම, දඬු වැදීම, ආයුධ වැදීම යන මේ දුක් කැමති විය යුතුය. නෑයෝද මිත්‍රයෝද ඔහු කරා පැමිණ එක්වී දුක් යයි හඬත්. ඇවැත්නි, ඉපදීම ඇතිකල්හි මේ දුක පැමිණේ ඇවැත්නි, නොඉපදීම ඇතිකල්හි මේ සැපය බලාපොරොත්තු විය යුතුය. සීතයක් නැත; උෂ්ණයක් නැත, බඩගින්නක් නැත. පිපාසාවක් නැත, මලමුත්‍ර පහකිරීමක් නැත, ගිනිදැමක් නැත, දඬු වැදීමක් නැත, ආයුධ වැදීමක් නැත, මේ සැප කැමති විය යුතුයි. නෑයෝද මිත්‍රයෝද ඔහු වෙත පැමිණ එක්වී කණගාටු නොවෙත්. ඇවැත්නි, නොඉපදීම ඇති කල්හි මේ සැපය බලාපොරොත්තු විය යුතුයි."

**16. දුතිය සාමණ්ඩ සූත්‍රය**:- 1. (මේ ඡෙදය මේ වර්ගයේ 15 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

**2.** එකත්පසෙක සිටි සාමණ්ඩකානී පරිබ්‍රාජක තෙම ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේට "ඇවැත්නි, ශාරිපුත්‍රය, මේ ධර්ම විනයෙහි කුමක් සැපද කුමක් දුක් දැයි" ඇසීය.

"ඇවැත්නි, මේ ධර්ම විනයයෙහි නොඇලීම දුක්ය ඇලීම සැප ඇවැත්නි, නොඇලීම ඇතිකල්හි යන්නේද සැපක් යහපතක් නොලබයි. සිටියේද සැපක් යහපතක් නොලබයි. හුන්නේද සැපක් යහපතක් නොලබයි. හෝනේද, ගමට ගියේද, වනයට ගියේද, රුක්මුලට ගියේද, හිස් ගෙවලට ගියේද,

අවකාශස්ථානවලට ගියේද, සංඝයා මැදට ගියේද, සැපක් යහපතක් නොලබයි. ඇවැත්නි, නොඇලීම ඇතිකල්හි මේ දුක කැමති විය යුතුයි. (ධර්ම විනයයෙහි) ඇලීම ඇතිකල්හි මේ සැප කැමති විය යුතුයි. යන්නේද සැපක් යහපතක් ලබයි. සිටියේ හුන්නේ හෝ ගමට වැදුනේ ගෙදරට ගියේ, රුක් මුලට ගියේ හිස් ගෙවලට ගියේ අවකාශ ස්ථානයට ගියේ සඟමැදට ගියේ සැපක් යහපතක් විඳියි ඇවැත්නි ඇල්ම ඇතිකල්හි මේ සැප බලාපොරොත්තු විය යුතුයි.”

17. **නළකපාන සූත්‍රයඃ-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල් රට චාරිකාවෙහි හැසිරෙනසේක් මහත් භික්ෂු සමූහයක් සමග නළපාන නම් කොසොල් රටවාසීන්ගේ නියම් ගමක් වේද එහි විසූ සේක. එහි වනාහි භාග්‍යවතුන් වහන්සේ නළපාන ගමෙහි පලාස වනයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පොහෝ දිනයෙහි භික්ෂු සංඝයා පිරිවරා වැඩහුන්නේවේ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රාත්‍රියෙහි බොහෝ වේලාවක්ම භික්ෂූන් සමග ධාර්මික කථාවෙන් කරුණු දක්වා පෙන්වා සමාදන් කරවා තෙදගන්වා සතුටු කරවා තුෂ්ණිම්භූතවූ භික්ෂු සංඝයා බලා ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේට ආමන්ත්‍රණය කළ සේක.

2. “ශාරිපුත්‍රය, භික්ෂු සංඝයා පහවූ නිදිබර ගතියෙන් යුක්තය. ශාරිපුත්‍රය භික්ෂූන්ට ධර්ම කථාව කිරීමට ඒ ඔබට වැටහේවා මාගේ පිටරිදේ. ඒ නිසා මම නවතින්නෙමි”

“ස්වාමීනි, එසේයයි’ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සඟල සිවුර සතරට නමා දකුණු පාර්ශවයෙන් පාදයෙහි පය පිහිටුවා සිහියෙන් මනා නුවණින් නැගිටින සංඥාව මෙනෙහි කොට සිංහසෙය්‍යාව කළසේක,

3. (i) එකල්හි වනාහි “ඇවැත් භික්ෂූනී”යි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භික්ෂූන් ආමන්ත්‍රණය කළ සේක. (ii) ඒ භික්ෂූහු “ඇවැත්නියි” ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ,

"ඇවැත්නි (ii) යම් කිසි කෙනෙකුට කුශල ධර්මයන්හි ශ්‍රද්ධාව නැද්ද, ලජ්ජාවක් නැද්ද, බියක් නැද්ද, වීර්යයක් නැද්ද, ප්‍රඥාවක් නැද්ද ඕහට යම් රාත්‍රියක් හෝ දවාලක් හෝ එයිද කුශල ධර්මයන්හි හානියක්ම කැමති විය යුතුය. වැඩීමක් නොවේ. (iii) ඇවැත්නි (iv) යම්සේ කළුවර පක්ෂයෙහි චන්ද්‍රයාගේ යම් රෑ දවාලක් එයිද, වර්ණයෙන් පිරිහෙයි, වටයෙන් පිරිහෙයි. ආලොකයෙන් පිරිහෙයි. උස මහතින් පිරිහෙයි (v) ඇවැත්නි, (vi) එසේම කුශල ධර්මන්හි යම්කිසිවෙකුට ශ්‍රද්ධාවක් නැද්ද, ලජ්ජාවක් නැද්ද, බියක් නැද්ද, වීර්යයක් නැද්ද, ප්‍රඥාවක් (vii) නැද්ද ඕහට යම් රාත්‍රියක් හෝ දවාලක් එයිද කුශල ධර්මයන්හි හානියක්ම කැමති විය යුතුය. වැඩීමක් නොවේ.

**4.** "ඇවැත්නි, අශ්‍රද්ධාවත් පුරුෂ පුද්ගලයාය යන මෙය පිරිහීමකි. ලජ්ජා නැති පුරුෂ පුද්ගලයාය යන මෙය පිරිහීමකි. බිය නැති පුරුෂ පුද්ගලයාය යන මෙය පිරිහීමකි. කම්මැලි, නුවණ නැති. ක්‍රොධ කරණ, බද්ධ වෛරය ඇති ලාමක බලාපොරොත්තු ඇති පාපමිත්‍රයන් ඇති වැරදි දෘෂ්ටි ඇති පුරුෂ පුද්ගලයාය යන මෙය පිරිහීමකි.

**5.** "ඇවැත්නි, යම් කිසිවෙකුට කුශල ධර්මයන්හි ශ්‍රද්ධාවක් ඇත්ද (පවට) ලජ්ජාවක් ඇත්ද, පවට බියක් ඇත්ද, වීර්යයක්, ප්‍රඥාවක් ඇත්ද, ඔහුට යම් රාත්‍රියක් හෝ දවාලක් ඒද කුශල ධර්මයන්හි අභිවෘද්ධියක්ම කැමති විය යුතුය. පිරිහීමක් නොවේ. ඇවැත්නි යම්සේ පුර පක්ෂයෙහි චන්ද්‍රයාගේ යම් රෑ දාවාලක් ඒ ද වැඩේමය, පාටින් වැඩෙයි. වටයෙන් වැඩෙයි, ආලොකයෙන් වැඩෙයි, උසමහතින් වැඩෙයි, ඇවැත්නි, එසේම යම් කිසිවෙකුට කුශල ධර්මයන්හි ශ්‍රද්ධාවක් ඇද්ද (පවට) ලජ්ජාවක් ඇද්ද, (පවට) බියක් ඇද්ද, වීර්යයක් ප්‍රඥාවක් ඇද්ද, ඔහුට යම් රාත්‍රියක් හෝ දවාලක් එයිද කුශල ධර්මයන්හි වැඩීමක්ම කැමති විය යුතුය. පිරිහීමක් නොවේ.

**6.** "ඇවැත්නි, ශ්‍රද්ධාවත් පුරුෂ පුද්ගලයාය යන මෙය නොපිරිහීමකි, ලජ්ජා ඇති, බිය ඇති, පටන්ගත් වීර්ය ඇති, නුවණ ඇති, ක්‍රොධ නොකරණ, බද්ධ වෛර නැති, වැඩි

බලාපොරොත්තු නැති, යහපත් මිතුරන් ඇති, සම්‍යක් දෘෂ්ටික පුරුෂ පුද්ගලයාය යන මෙය. ඇවැත්නි නොපිරිහීමකි."

7. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නැගිට ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට ආමන්ත්‍රණය කළ සේක. "ශාරිපුත්‍රය, යහපත, ශාරිපුත්‍රය, (මෙහි 3 (ii) යෙදිය යුතුයි) ශාරිපුත්‍රය, (මෙහි 3 (iv) යෙදිය යුතුයි) ශාරිපුත්‍රය, (මෙහි 3 (vi) යෙදිය යුතුයි.) 8. 9. 10. (මේ ඡේද මේ සූත්‍රයේ 4. 5. 6. ඡේද මෙන් වෙත්. "ඇවැත්නි" වෙනුවට "ශාරිපුත්‍රය" යෙදිය යුතුයි)

18. **පලාසවන සූත්‍රය:** 1. 2. (මේ ඡේද මේ වර්ගයේ 17. සූත්‍රයේ 1. 2. ඡේද මෙන් වෙත්.)

3. (මෙහි මේ වර්ගයේ 17 සූත්‍රයේ 3 (i) යෙදිය යුතුයි.) ඇවැත්නි, යම්කිසිවෙකුට කුශල ධර්මයන්හි ශ්‍රද්ධාවක් නැත්තේද, පවට ලජ්ජාවක් නැත්තේද, බියක් නැත්තේද, වීර්යයක්, ප්‍රඥාවක්, කන්යොමුකිරීමක්, බණදැරීමක්, අර්ථ සෙවීමක්, දහම් අනුව හැසිරීමක්, කුශලධර්මයන්හි අප්‍රමාදයක් නැත්තේද, ඕහට යම් රාත්‍රියක් හෝ දවාලක් එයිද කුශල ධර්මයන්හි හානියක්ම කිවයුතුය. වැඩීමක් කැමති නොවියයුතුය.

4. "ඇවැත්නි, කළුවර පක්ෂයෙහි චන්ද්‍රයාගේ යම් රාත්‍රියක් හෝ දවාලක් එයිද පිරිහේ එය පාටින් පිරිහෙයි, අවටින් පිරිහෙයි, ආලොකයෙන් පිරිහෙයි, උසමහතින් පිරිහෙයි, ඇවැත්නි එසේම යම්කිසිවෙකුට කුශලධර්මයන්හි ශ්‍රද්ධාවක්නැද්ද ලජ්ජාවක්, බියක්, වීර්යයක්, ප්‍රඥාවක්, කන්යොමු කිරීමක්, බණදැරීමක් අර්ථය පරීක්ෂාකිරීමක්, බණ අනුව පිළිපැදීමක් කුශලධර්මයන්හි නොපමාවක් නැත්තේද, ඔහුට යම් රාත්‍රියක් හෝ දවාලක් ඒ ද කුශල ධර්මයන්හි පිරිහීමට කැමතිවිය යුතුය. වැඩීම නොවේ.

5. "ඇවැත්නි, යම්කිසිවෙකුට කුශල ධර්මයන්හි ශ්‍රද්ධාවක් ඇත්තේද පවට ලජ්ජාවක් ඇත්තේද, පවට බියක් ඇත්තේද, වීර්යයක් ඇත්තේද, ප්‍රඥාවක්, කන්යොමුකිරීමක්, බණදැරීමක් අර්ථපරීක්ෂාවක් ධර්මය අනුව පිළිපැදීමක් කුශල ධර්මයන්හි අප්‍රමාදයක් ඇත්තේද, ඔහුට යම් රාත්‍රියක් හෝ දවාලක් එයිද කුශල ධර්මයන්හි අභිවෘද්ධියමක් කැමති වියයුතුය. පිරිහීමක්

කැමති නොවිය යුතුය. ඇවැත්නි, පුරපක්ෂයෙහි චන්ද්‍රයාගේ යම්රාත්‍රියක් හෝ දවාලක් එයිද, පාටින් වැඩෙයි, අවටින් වැඩෙයි, ආලොකයෙන් වැඩෙයි, උසමහතින් වැඩෙයි, ඇවැත්නි, එසේම යම් කිසිවෙකුට කුශලධර්මයන්හි ශ්‍රද්ධාවක් ඇද්ද (පවට) ලජ්ජාවක් ඇද්ද (පවට) බියක් ඇද්ද වීර්යයක් ඇද්ද, ප්‍රඥාවක්, කන්යොමුකිරීමක්, බණදැරීමක් අර්ථ සෙවීමක් බණ අනුව පිළිපැදීමක් ඇද්ද කුශල ධර්මයන්හි අප්‍රමාදයක් ඇද්ද ඔහුට යම් රාත්‍රියක් හෝ දවාලක් එයිද කුශල ධර්මයන්හි අභිවෘද්ධියක්ම කැමතිවිය යුතුය. පිරිහීමක් නොවේ."

**6.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නැගිට ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේට ඇමතූසේක.

(මෙහි මේ සූත්‍රයේ 3, 4, 5 ඡේද යෙදිය යුතුයි.) "ඇවැත්නි" වෙනුවට "ශාරිපුත්‍රය" යෙදිය යුතුයි.)

**19. දසකථාවත්ථු සූත්‍රයː-** 1. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසල අනේ පිඬුමහ සිටානන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි බොහෝ භික්ෂූහු පසුබත පිණ්ඩපාතයෙන් වැලැක්කාහු. උපස්ථාන ශාලාවෙහි හුන්නාහු රැස්වූවාහු නන්වැදෑරුම් තිරිසන් කථාවෙන් යෙදීවාසය කරත්, ඒ කෙසේද, (ii) රජුන් පිළිබඳ කථා, සොරුන් පිළිබඳ කථා, මහාමාත්‍යයන් පිළිබඳ කථා, සෙනාවන් පිළිබඳ කථා, බියවීම පිළිබඳ, යුද්ධ පිළිබඳ, ආහාර පිළිබඳ, පානය පිළිබඳ, වස්ත්‍ර පිළිබඳ, නිදීම පිළිබඳ, මල්පිළිබඳ, ගඳසුවඳ පිළිබඳ, ඤාතීන් පිළිබඳ, යානාපිළිබඳ, ගම්පිළිබඳ, නියම්ගම් පිළිබඳ, නුවර පිළිබඳ, දනවු පිළිබඳ, ස්ත්‍රීන් පිළිබඳ, සූරකම් පිළිබඳ, මාර්ග පිළිබඳ, වතුරගෙනයන තැන් පිළිබඳ පූර්ව ප්‍රේතයන් පිළිබඳ, නොයෙක් ආකාර ඇති, ලොකයේ අග මුල ගැන, මුහුදේ අගමුලගැන, භවයෙන් භවය පිළිබඳ කථා, යන මෙසේයි.

**2.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි පලසමවතින් නැගී සිටිසේක් උපස්ථාන ශාලාව යම්තැනෙක්හිද එහි වැඩිසේක, වැඩ පැනවූ අස්නෙහි වැඩ සිටිසේක,

භාග්‍යවතුන් වහන්සේ වැඩ සිට "මහණෙනි, දැන් කවර කථාවකින් යුක්තව සිටියාහුද, තොප විසින් කවර කථාවක්කොට නතර කරණ ලද්දීදැයි" භික්ෂූන් ඇමතූසේක.

3. "ස්වාමීනි මෙහි අපි බතින් පසු පිණ්ඩපාතයෙන් වැලැක්කාහු උපස්ථාන ශාලාවෙහි හුන්නාහු රැස්වූවාහු නානාප්‍රකාර තිරිසන් කථාවෙන් යුක්තවූවාහු වසමු. ඒ කවරේද? (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) මෙසේයයි කියායි.

4. "මහණෙනි, ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදිවූ යම් බඳුවූ තෙපි (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) නානාප්‍රකාර කථාවෙන් යුක්තව වාසය කරව්ද, මෙය තොපට නුසුදුසුය.

5. "මහණෙනි, මේ කථාවස්තු දසයක්වෙත්. කවර දසයක්ද යත්, ආශා අඩු කථාය, ලද දෙයින් සතුටුවන කථාය, විවේක පිළිබඳ කථාය, නොඇලීම පිළිබඳ කථාය, වීර්යය පටන් ගැනීම් පිළිබඳ කථාය, ශීලය පිළිබඳ කථාය, සිත එකඟ කිරීම පිළිබඳ කථාය, ප්‍රඥාව පිළිබඳ කථාය, කෙලෙසුන්ගෙන් මිදීම පිළිබඳ කථාය, ප්‍රත්‍යවෙක්ෂා ඥාණ පිළිබඳ කථාය, මහණෙනි මේ දසකථා වස්තුහුවෙත්, මහණෙනි, තෙපි මේ දසකථා වස්තු ගනිමින් ගනිමින්ම කථා කියව්, මෙසේ මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ චන්ද්‍ර සූර්යයන්ගේ තමතෙදින් ඒ තෙද යටකරව් අන්‍යතීර්ථක ශ්‍රමණ බ්‍රාහ්මණයන් මැඩපැවැත්වීම ගැන, කියනුම කවරේද?"

**20. පාසංසට්ඨාන සූත්‍රය**:- 1. "මහණෙනි, ප්‍රශංසා කටයුතු මේ ස්ථාන දශයක් වෙති. ii "කවර දශයක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම තමාද අල්පෙච්ඡවෙයි, භික්ෂූන්ටද අල්පෙච්ඡකථාව කරන්නේවෙයි. අල්පෙච්ඡ භික්ෂුව භික්ෂූන්ට අල්පෙච්ඡකථාවද කරන්නේවේද මේ කාරණය ප්‍රශංසාවට සුදුසුය.

2. "තමාද ලදදෙයින් සතුටුවේ, භික්ෂූන්ට සතුට පිළිබඳ කථා කරන්නේවේ, සතුටු භික්ෂුව සතුට පිළිබඳ කථා කරන්නේවේද මේ කාරණය ප්‍රශංසාවට සුදුසුය.

3. "තමාද විවෙකයට ගියේවේ. භික්ෂූන්ට විවේක කථාව කියයි, විවෙකයට ගිය මහණතෙම භික්ෂූන්ට විවේක කථාව කරන්නේවේද, මේ කාරණය ප්‍රශංසාවට සුදුසුය.

4. "තමා නොගැටුණේවේ, භික්ෂූන්ට නොගැටීමේ කථා කියන්නේවේ, නොගැටුණු මහණ භික්ෂූන්ට නොගැටීමේ කථාව කියයිද, මේ කාරණය ප්‍රශංසාවට සුදුසුය.

5. "තෙමේ පටන්ගන්නාලද වීර්ය ඇත්තේවේ. භික්ෂූන්ට වීර්යකිරීම පිළිබඳ කථාව කියන්නේවේ. පටන්ගන්නාලද වීර්ය ඇති මහණතෙම භික්ෂූන්ට වීර්ය පිළිබඳ කථා කියන්නේවේද මේ කාරණය ප්‍රශංසාවට සුදුසුය.

6. "තමාද ශීලයෙන් යුක්තවේ. භික්ෂූන්ට සීලසම්පත්ති කථාව කියන්නේවේ, ශීලයෙන්යුත් මහණතෙම භික්ෂූන්ට ශීලසම්පත්ති කථාව කියයිද මේ කාරණය ප්‍රශංසාවට සුදුසුය.

7. "තමාද සිත එකඟ කිරීමෙන් යුක්තවූයේවේ, භික්ෂූන්ට සිත එකඟ කිරීමෙහි කථා කියන්නේවේ, සිත එකඟ කිරීමෙන් යුක්ත මහණතෙම භික්ෂූන්ට සිත එකඟ කිරීමෙහි කථාකරන්නේවේද මේ කාරණය ප්‍රශංසාවට සුදුසුය.

8. "තමාද ප්‍රඥාවත්වේ, භික්ෂූන්ට ප්‍රඥා සම්පත්තියෙහි කථා කියන්නේවේ, ප්‍රඥාවත් මහණතෙම භික්ෂූන්ට ප්‍රඥා සම්පත්තියෙහි කථා කියන්නේවේද, මේ කාරණය ප්‍රශංසාවට සුදුසුය.

9. "තමාද කෙලෙසුන් මිදීමෙන් යුක්තවූයේවේ, භික්ෂූන්ට කෙලෙසුන්ගෙන් මිදීමෙහි කථා කියන්නේවේ, මිදීමෙන්යුත් මහණතෙම භික්ෂූන්ට මිදීමෙහි කථාකියයිද මේ කාරණය ප්‍රශංසාවට සුදුසුය.

10. "තමාද ප්‍රත්‍යවෙක්ෂා ඤාණයෙන් යුක්තවූයේවේ, භික්ෂූන්ට ප්‍රත්‍යවෙක්ෂා ඤාණ පිළිබඳ කථා කරන්නේවේ. ප්‍රත්‍යවෙක්ෂා ඤාණයෙන් යුත් මහණතෙම භික්ෂූන්ට ප්‍රත්‍යවෙක්ෂාඤාණ පිළිබඳ කථා කියයිද මේ කාරණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රශංසාවට සුදුසුය, මහණෙනි මේ දශය ප්‍රශංසා කටයුතු කාරණයෝය.”

(7 යමක වර්ගය නිමි.)

---

## 8. ආකංඛ වර්ගය

21. ආකංඛෙය්‍ය සූත්‍රය:- 1. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසල අනේපිඬු මහසිටාණන් විසින් කරවනලද, ජේතවන නම් ආරාමයෙහි වාසය කරණසේක, එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි කියා භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක, ‘පින්වතුන් වහන්සැයි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, ශීලයෙන් යුක්තව වාසයකරව්. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරව වාසය කරව්, මනා හැසිරීමෙන් හා අරමුණින් යුක්තව ස්වල්පමාත්‍ර වරදෙහි පවා බිය දක්නා සුලුව වාසය කරව්, ශික්ෂාපදයන් සමාදන්ව හික්මෙව්.

3. “මහණෙනි, ඉදින් මහණතෙම සබ්‍රම්සරුන්ට ප්‍රියයෙක්ද මනාපයෙක්ද ගරුවූවෙක්ද, සම්භාවනා කටයුත්තෙක්ද වන්නෙමියි කැමතිවන්නේනම් (ii) තමා තුළ සිතෙහි කෙලෙස් යටපත් කිරීමෙහි යෙදුණේ දුරු නොකළ ධ්‍යාන ඇත්තේ විදර්ශනාවෙන් යුක්තවූයේ ශූන්‍යාගාරයෙහි භාවනා වඩන්නේ ශීලයම සම්පූර්ණ කරන්නේය.

4. “මහණෙනි, ඉදින් මහණතෙම සිවුරු පිඬු, සෙනසුන්, ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නෙක් වන්නේ නම්, (3 - (ii) ඡේදය යොදනු)

5. “මහණෙනි, ඉදින් මහණතෙම යම්කෙනෙකුගේ සිවුරු, පිඬු, සෙනසුන්, ගිලන්පස බෙහෙත් පිරිකර පරිභොග කරන්නෙම්ද, ඔවුන්ගේ ඒ උපකාරයෝ මහත්ඵල මහත් ආනිසංස වෙත්වායි කැමැත්තේ නම්, (3 (ii) ඡේදය යෙදියයුතුයි.)

6. "මහණෙනි, ඉදින් මහණතෙම මාගේ යම්නෑයෙක්, සහලේ නෑයෙක් කලුරියකළාහුද පරලොවගියාහුද ඔව්හු ප්‍රසන්න සිතින් සිහිකරත්ද, ඔවුන්ට එය මහත්ඵල මහත් ආනිශංසවේවායි කැමතිවන්නේ නම්, (3 (ii) ඡේදය යෙදිය යුතුයි.)

7. "මහණෙනි, ඉදින් මහණතෙම උසස් පහත් සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් සතුටුවූවෙක් වන්නෙමියි කැමැත්තේ නම්, (3 (ii) ඡේදය යෙදිය යුතුයි.)

8. "මහණෙනි, ඉදින් මහණතෙම ශීත උෂ්ණ බඩසා, පිපාසය, ඩැහැලේ බොනසත්තුය, මදුරුවෝය, වාතය, අව්වය, සර්ප ජාතීන්ගේ ස්පර්ශය නපුරුකොට කියනලද නපුරුකොට පැමිණිවාක් මාර්ගයන් ඉවසන්නෙක් වන්නේද දුක්වූ තියුණුවූ කෘරවූ කටුකවූ අයහපත්වූ අප්‍රියවූ දිවිපැහැර ගන්නාවූ ශාරීරික වෙදනාවන් ඉවසන සුලුවූවෙක් වන්නට කැමැත්තේනම්, (3 (ii) ඡේදය යෙදිය යුතුයි.)

9. "මහණෙනි, ඉදින් මහණතෙම නොඇලීම හා ඇලීම ඉවසන්නෙක්වෙමි, නොඇලීම හා ඇලීම මා නොඉවසන්නේය. උපන් නොඇලීම ඇලීම මැඩ මැඩවාසය කරන්නෙමියි කැමැත්තේ නම්, (3 (ii) ඡේදය යෙදිය යුතුයි.)

10. "මහණෙනි, ඉදින් මහණතෙම බිය හා භයානක අරමුණු ඉවසන්නෙක් වන්නෙමි, බිය හා භයානක අරමුණු මා නොඉවසන්නේය. උපන් බිය හා භයානක අරමුණු මැඩ මැඩ වාසය කරන්නෙමියි කැමැත්තේ නම්, (3 (ii) ඡේදය යෙදිය යුතුයි.)

11. "මහණෙනි, ඉදින් මහණතෙම ශ්‍රෙෂ්ඨ සිත්වූ මේ ආත්මයෙහි සැපවිහරණ ඇති ධ්‍යාන සතර අයත්නයෙන් ලෙහෙසියෙන් ලබන්නෙම් නම් පහසුවෙන් ලබන්නෙම් නම් නිදුකින් ලබන්නෙම් නම් යෙහෙකැයි ඉදින් කැමති වන්නේ නම්, (3 (ii) ඡේදය යෙදිය යුතුයි.)

12. "මහණෙනි ඉදින් මහණතෙම ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත සිතින් කෙලෙසුන්ගෙන් මිදීමද,

නුවණින් කෙලෙසුන්ගෙන් මිදීමද, මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරන්නෙමියි කැමැත්තේ නම් තමා තුළ සිතෙහි කෙලෙස් යටපත් කරණ දුරුනොකළ ධ්‍යාන ඇති විදර්ශනාවෙන් යුක්ත ශුන්‍යාගාරයෙහි භාවනා වඩන ශීලයම සම්පූර්ණ කරන්නෙක් වන්නේය.

13. "මහණෙනි, ශීලයෙන් යුක්තව වාසයකරව් ප්‍රාතිමොක්ෂයෙන් යුක්තව වාසය කරව්. ප්‍රාතිමොක්ෂ ශීලයෙන් සංවරව වාසය කරව්. මනා හැසිරීමෙන් හා අරමුණින් යුක්තව ස්වල්පමාත්‍ර වරදෙහි පවා බිය දක්නාසුළුව වාසය කරව්. ශික්ෂා පදයන් සමාදන්ව හික්මෙව්යයි මෙසේ ඒ යමක් වදාරණ ලද්දේද, මෙය මේ සඳහා වදාරණ ලදී."

**32. සද්ද කණ්ටක සූත්‍රය:-** 1. "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලා නුවර මහ වනයෙහි කූටාගාර ශාලාවෙහි ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ස්ථවිර ශ්‍රාවකයන්වූ ආයුෂ්මත් චාල; උපචාල; කක්කට; කටිම්භ; කට, කටිස්සංග යන තෙරුන් හා අන්‍යවූත් ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ස්ථවිර ශ්‍රාවකයන් සමග වාසය කරණ සේක. ඒ කාලයෙහි වනාහි බොහෝ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ලිච්ඡවීහුද තරුණයන් පිරවූ යහපත් යානාවන්ගෙන් උස් හඬ ඇත්තාහු මහත් හඬ ඇත්තාහු භාග්‍යවතුන් වහන්සේ දක්නට මහා වනයට වදිත්. ඉක්බිති ඒ ආයුෂ්මත්වරුන්ට (ii) මේ බොහෝ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ලිච්ඡවීහුද වර තරුණයන් පිරවූ යහපත් යානාවන්ගෙන් උස් හඬින් මහා හඬින් භාග්‍යවතුන්වහන්සේ දක්නට මහා වනයට වදිත්.

2. "භාග්‍යවතුන් වහන්සේ විසින් 'ධ්‍යානයන්ට ශබ්දය කටුවකැයි' වදාරණ ලදී. 'අපි ගොසිංග ශාලා වනලැහැබ යම් තැනෙක් හිද එහි පැමිණෙමු නම් යෙහෙක. එහි අපි ශබ්ද ඇත්තාහු ගැවසීම් ඇත්තාහු සුවසේ වසමෝ නම් යෙහෙකැයි' කියායි.

3. "ඉක්බිති ඒ ආයුෂ්මත්වරු ගොසිංග ශාල වන ලැහැබ යම්තැනෙක්හිද එහි පැමිණියාහුය. එහි ඒ ආයුෂ්මත්වරු ශබ්ද ඇත්තාහු ගැවසීම් නැත්තාහු සුවසේ වසත්.

**4.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, චාල කොහිද, උපචාල කොහිද, කක්කට කොහිද, කටිම්බ කොහිද කටිස්සංග කොහිද, මහණෙනි, ඒ ස්ථවිරවූ ශ්‍රාවකයෝ කොහි ගියාහුදැයි" භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි, මෙහි ඒ ආයුෂ්මතුන්ට (මෙහි 1 (ii) සහ 2 යෙදිය යුතුයි.)

**5.** "ස්වාමීනි, (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, යහපත, යහපත, මනාව ප්‍රකාශ කරන සේ මහා ශ්‍රාවකයෝ මනාව ප්‍රකාශ කරන්නාහුය. මහණෙනි, මා විසින් ධ්‍යානයෝ ශබ්ද නැමැති කටු ඇත්තාහයි කියන ලදී. මහණෙනි, මේ කටු දහයක් වෙත්. කවර දසයක්ද යත්.

**7.** "උසස් විවේකයෙහි ඇලුනහුට සමූහය මැද ඇලෙන බව කටුවකි. අශුභ නිමිති භාවනාවෙහි යෙදුනහුට ශුභ නිමිත්තෙහි යෙදීම කටුවකි. ඉන්ද්‍රියයන්හි වසනලද දොර ඇත්තහුට විසුළු දැකීම කටුවකි. බ්‍රහ්මචාරී පුද්ගලයාට ස්ත්‍රීන් පිරිවැරීම කටුවකි. ප්‍රථමධ්‍යානයට ශබ්දය කටුවකි. දෙවෙනි ධ්‍යානයට විතර්කය හා විචාරය (සිත යෙදීම හැසිරවීම) කටුවකි. තුන්වෙනි ධ්‍යානයට ප්‍රීතිය කටුවකි. සතරවෙනි ධ්‍යානයට ආශ්වාශ ප්‍රශ්වාශයෝ කටුය. හැඟීම් හා විඳීම් නැති කිරීමේ සමවතට සංඥාවද වෙදනාවද කටුමෙනි. රාගය කටුවකි. ද්වෙෂය කටුවකි. මොහය කටුවකි.

**8.** "මහණෙනි, කටු නැත්තෝව වාසය කරව්, මහණෙනි, නොකටුව වාසය කරව්. කටු නැත්තෝවද නොකටුවද වාසය කරව්. මහණෙනි, රහත්හු කටු නැත්තෝය. මහණෙනි, රහත්හු නොකටු වූවෝය. මහණෙනි, රහත්හු කටු නැති නොකටු වූවෝය."

**23. දුල්ලභ දස ධම්ම සූත්‍රය:-** 1. "මහණෙනි, යහපත්වූ, කාන්තවූ, මන වඩන්නාවූ, ලොකයෙහි දුර්ලභවූ, මේ ධර්ම දහයක් වෙත්

**2.** "කවර දහයක්ද යත්. භොගයෝ (ii) යහපත්ය, කාන්තය මන වඩන්නේය, ලොකයෙහි දුර්ලභය, (iii) වර්ණය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) නිරෝගි කම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

ශීලය (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) බ්‍රහ්මචර්යය (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මිත්‍රයෝ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) බහුශ්‍රැත භාවය (මෙහි 2 (ii) යෙදිය යුතුයි. ප්‍රඥාව (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ධර්මයෝ (මෙහි 2 (ii) යෙදිය යුතුයි. 1 ස්වර්ගයෝ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) (මෙහි මේ සූත්‍රයේ) 1 ඡේදයයෙදිය යුතුයි.)

**3.** "මහණෙනි, යහපත්වූ කාන්තවූ මන වඩන්නාවූ ලොකයෙහි දුර්ලභවූ මේ ධර්ම දසයට උවදුරු ධර්මද දසයක් වෙත්.

**4.** "අලස බව, නොනැගිටීම භොගයන්ට උවදුරය. නොසැරසීම, ආභරණ නැතිබව හෙවත් නො සැරසීම වර්ණයට උවදුරය, නොගැලපෙන ක්‍රියා නිරොගීකමට උවදුරය. දුෂ්ට මිත්‍රයන් ශීලයට උවදුරුය. ඉන්ද්‍රිය අසංවරය බ්‍රහ්මචර්යයට උවදුරය. බොරුකීම මිත්‍රයන්ට උවදුරකි. නොහැදෑරීම බහුශ්‍රැත භාවයට උවදුරය. මනාකොට ඇහුම්කන් නොදීම, ප්‍රශ්න නොඇසීම, ප්‍රඥාවට උවදුරකි. නොයෙදීම ප්‍රත්‍යවෙක්ෂා නොකිරීම, ධර්මයන්ට උවදුරකි. වැරදි ප්‍රතිපත්තිය ස්වර්ගයට උවදුරකි. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**5.** "මහණෙනි, යහපත්වූ කාන්තවූ මන වඩන්නාවූ ලොකයෙහි දුර්ලභවූ මේ ධර්ම දහයකට ධර්ම දසයක් ආහාර වෙත්.

**6.** "අලස නොවන බව, වීර්යය, භොගයන්ට ආහාරය, සැරසීම, අලංකාර ආභරණ වර්ණයට ආහාරය, ගැලපෙන ක්‍රියා නිරොගිකමට ආහාරය, යහපත් මිත්‍රයන් ඇතිබව ශීලයට ආහාරය, ඉඳුරන් හසුරුවා ගැනීම බ්‍රහ්මචර්යයට ආහාරය, බොරු නොකීම මිත්‍රයන්ට ආහාරය, අවබෝධ කිරීම බහුශ්‍රැත භාවයට ආහාරය, ඇහුම්කන් දීම, ප්‍රශ්න කිරීම, ප්‍රඥාවට ආහාරය, යෙදීම, සිහි කිරීම, ධර්මයන්ට ආහාරය, යහපත් ප්‍රතිපත්තිය ස්වර්ගයට ආහාරය. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**24. දස අරියවඩ්ඪි සූත්‍රය:-** 1. "මහණෙනි, වැඩීම් දහයකින් වැඩෙන්නාවූ ආර්ය ශ්‍රාවකතෙම ආර්ය වැඩීමෙන් වැඩෙයි. ශරීරයාගේ හරය ගන්නේද ලාභය ගන්නේද වේ.

2. "කවර දහයකින්ද යත්? කෙත්වත් වලින් වැඩෙයි. ධන ධාන්‍යයෙන් වැඩෙයි. අඹු දරුවන්ගෙන් වැඩෙයි. දාසකම්කරු පුරුෂයන්ගෙන් වැඩෙයි. සිවුපා සතුන්ගෙන් වැඩෙයි, ශ්‍රද්ධාවෙන් වැඩෙයි, ශීලයෙන් වැඩෙයි, ඇසීමෙන් වැඩෙයි, ත්‍යාගයෙන් වැඩෙයි, ප්‍රඥාවෙන් වැඩෙයි. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

> 3. "යමෙක්තෙම මේ ලොකයෙහි ධනයෙන්ද ධාන්‍යයෙන්ද අඹු දරුවන්ගෙන්ද සිවුපා සතුන්ගෙන්ද ඥාති මිත්‍රයන්ගෙන්ද නැවතද රජුන්ගෙන්ද වැඩේද, යසස ඇත්තාවූ පුදන ලද්දාවූ හෙතෙම වස්තු ඇත්තේ වේ යම් කෙනෙක් මේ ලොකයෙහි ශ්‍රද්ධාවෙන් වැඩේද, ශීලයෙන් වැඩේද, ප්‍රඥාවෙන් ත්‍යාගයෙන්ද යන දෙකින් වැඩේද එබඳු ඥාණවන්ත සත්පුරුෂ හෙතෙමේ මෙලොවම දෙලෙවින් වැඩෙයි."

25. **මිගශාලා සමගතික සූත්‍රයඃ** 1. "එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනේපිඬු මහ සිටානන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ පෙරවරුවෙහි හැඳ පෙරවා පාත්‍ර සිවුරු ගෙන මිගශාලා නම් උපාසිකාවගේ ගෘහය යම්තැනෙක් හිද, එහි වැඩිසේක. වැඩ පනවන ලද අස්නෙහි වැඩහුන්සේක. ඉක්බිති මිගශාලා නම් උපාසිකාතොමෝ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක් හිද එහි පැමිණියාය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වැඳ එකත්පසෙක සිටියාහ.

2. "එකත්පසෙක සිටි මිගශාලා උපාසිකාව ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට 'ස්වාමීනි ආනන්ද ස්ථවිරයන් වහන්ස, (ii) භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණ ලද මේ ධර්මය කෙසේ කෙසේනම් දැනගත යුත්තේද, යම් පරිද්දෙකින් පරලෙව්හිදී බ්‍රහ්මචාරී තෙමේද අබ්‍රහ්මචාරී තෙමේද දෙදෙන පරලොව සමාන ගති ඇත්තාහු වෙත්ද? ස්වාමීනි, මාගේ පුරාණ පියතෙම මෛථුනයෙන් ග්‍රාම ධර්මයෙන් දුරුවූ වෙන්වූ බ්‍රහ්මචාරී පුද්ගලයෙක් වූයේය හෙතෙම කලුරිය

කෙළේය. සකෘදාගාමී සත්වතෙම තුෂිත දිව්‍ය ලොකයෙහි උපන්නේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලදී. ස්වාමීනි, මාගේ ඉසිදත්ත නම් පියවරයාද බ්‍රහ්මචර්යාවෙන් වෙන්වූයේ වේ. ස්වකීය භාර්යාව සහිතව සතුටු වූයේ හෙතෙමේද කළුරිය කළේය. සකෘදාගාමී සත්වතෙම තුෂිත දිව්‍ය ලොකයෙහි උපන්නේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණලද මේ ධර්මය කෙසේ කෙසේනම් දතයුතුද? යම් හෙයකින් බ්‍රහ්මචාරී පුද්ගලයාද අබ්‍රහ්මචාරී පුද්ගලයාද දෙදෙන පරලෙව්හිදී සමාන ගති ඇතිවන්නාහුද,

3. "නැගණියනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය මෙසේ ප්‍රකාශ කරණ ලද්දේය."

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මිගශාලා උපාසිකාවගේ ගෘහයෙහි පිණ්ඩපාතය ගෙන හුනස්නෙන් නැගිට වැඩිසේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ පසුබත පිණ්ඩපාතයෙන් වැලැක්කේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටිසේක.

4. එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි, මම මෙහි පෙරවරු වේලාවෙහි හැඳ පොරවා පා සිවුරු රැගෙන මිගශාලා උපාසිකාවගේ නිවෙස යම්තැනෙක්හිද එහි පැමිණියෙමි. පැමිණ පනවන ලද අස්නෙහි වැඩ සිටියෙමි. ස්වාමීනි, ඉක්බිති මිගශාලා උපාසිකාව මා යම්තැනෙක්හිද එහි පැමිණියාය. පැමිණ මා වැඳ එකත්පසෙක සිටියාය. ස්වාමීනි, එකත්පසෙක සිටි මිගශාලා උපාසිකාව, මට ආනන්ද ස්ථවිරයෙනි, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඇසුවාය. ස්වාමීනි මෙසේ කී කල්හි මම මිගශාලා උපාසිකාවට නැගණියෙනි මෙසේ වනාහි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ යයි මෙසේ කීවෙමි."

5. "ආනන්දය, බාලවූ අව්‍යක්තවූ ළදරු මවක්වූ ළදරු ප්‍රඥා ඇති මිගශාලා උපාසිකාව කවරීද? පුරුෂ පුද්ගලයන්ගේ උස්

පහත් නුවණ කවරේද? ආනන්දය ලොකයෙහි මේ පුද්ගලයන් දස දෙනෙක් විද්‍යමාන වෙත්. කවර දස දෙනෙක්ද යත්.

6. "ආනන්දය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීල වේද, ඒ සිතින් දැක කෙලෙසුන්ගෙන් මිදීමද නුවණින් දැක කෙලෙසුන්ගෙන් මිදීමද තත්වූ පරිද්දෙන් නොදනී. යම් තැනෙක්හි ඒ දුශ්ශීල බව ඉතිරි නොකර නිරුද්ධ වේද, ඇසීමෙන් පවා නොකරණ ලද්දේවේ. බහුශ්‍රැත භාවයෙන්ද නොකරණ ලද්දේවේ. දෘෂ්ටියෙන්ද ප්‍රතිවෙධ නොකරණ ලද්දේවේ. තාවකාලික විමුක්තියක්ද නොලබයි, හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු පිරිහීමට යයි. උසස්වීමකට නොයයි. පිරිහීමට යන ස්වභාව ඇත්තේ වේ. උසස්වීමකට නොයන සුළුවේ.

7. "ආනන්දය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීලවේද, ඒ සිතේ මිදීමද නුවණින් මිදීමද තත්වූ පරිද්දෙන් දනීද, යම් තැනෙක්හි ඒ දුශ්ශීල භාවය ඉතිරි නොකර නිරුද්ධ වේද, ඇසීමෙන් පවා එය කරණ ලද්දේවේද, බහුශ්‍රැතභාවයෙන් කරණ ලද්දේවේද, දෘෂ්ටියෙන් අවබොධ කරණ ලද්දේ වේද, තාවකාලික විමුක්තියක්ද ලබයි. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු දියුණුවට උත්සාහ කරයි. පිරිහීමට උත්සාහ නොකරයි. දියුණුවට යන ස්වභාව වේ. පිරිහීමට නොයන ස්වභාව වේ.

8. "ආනන්දය, මොහු කෙරෙන් මේ ධර්මයෝමය. අනිකෙකු කෙරෙන්ද, මේ ධර්මයෝමය. ඔවුන් අතුරෙන් එකෙක් හීනය. එකෙක් ප්‍රණීතයයි. ප්‍රමාණ කරන්නෝ ප්‍රමාණ කරත්. ආනන්දය, එය ඔවුන්ට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස වේ. ආනන්දය, එහි යම් මේ පුද්ගලයෙක් දුශ්ශීල වේද ඒ සිතේ මිදීමද නුවණින් මිදීමද තත්වූ පරිද්දෙන් දනීද, (ii) යම් තැනෙක්හි ඔහුට දුශ්ශීල භාවය ඉතිරි නැතිව නිරුද්ධ වේ. එය ඇසීමෙන් කරණ ලද්දේ වේ. බහුශ්‍රැතභාවයෙන් කරණ ලද්දේ වේ. දෘෂ්ටියෙන් ප්‍රතිවෙධ කරණ ලද්දේ වේ. තාවකාලික විමුක්තියක්ද ලබයි. ආනන්දය, මේ පුද්ගලතෙම මේ පූර්ව පුද්ගලයාට වඩා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අතිශයින් යහපත්ද, ප්‍රණීතද වේ. ඊට හේතු කවරේද? ආනන්දය, ධර්ම ශ්‍රොතය මේ පුද්ගලයා පා කරයිද ඊට අනතුරු මේ පුද්ගලයා තථාගතයන් වහන්සේ හැර කවරෙක් දන්නේද? (iii) ආනන්දය, එසේහෙයින් මෙහි පුද්ගලයන් කෙරෙහි ප්‍රමාණ වශයෙන් ගන්නාහු නොවව්. පුද්ගලයන් කෙරෙහි ප්‍රමාණයක් නොගනිව්. පුද්ගලයන් කෙරෙහි ප්‍රමාණයක් ගන්නාවූ පුද්ගලයෙක් කොහිද? ආනන්දය, මමද යමෙක් මා වැනි වේද, පුද්ගලයන් කෙරෙහි ප්‍රමාණයක් ගන්නෙමි.

9. "ආනන්දය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සිල්වත් වේද ඒ සිතේ මිදීමද නුවණින් මිදීමද තත්වූ පරිද්දෙන් නොදනීද, (ii) යම් තැනෙක්හි ඒ ශීලය ඉතිරි නොකොට නිරුද්ධ වේද, ඔහු විසින් ඇසීමෙන් පවා නොකරණ ලද්දේ වේද, බහුශ්‍රැත භාවයෙන්ද නොකරණ ලද්දේ වේද, දෘෂ්ටියෙන්ද ප්‍රතිවෙධ නොකරණ ලද්දේ වේද, තාවකාලික විමුක්තිය නොලබයිද හෙතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු පිරිහීමට යයි. දියුණුවට නොයයි. පිරිහීමට යන්නේ හෝ වේ. දියුණුවට නොයන්නේ වේ.

10. "ආනන්දය, මෙහි ඇතැම් පුද්ගලයෙක් සිල්වත් වේද, ඒ සිතේ මිදීමද නුවණින් මිදීමද තත්වූ පරිද්දෙන් දනීද (ii) ඒ ශීලය යම් තැනෙක්හි ඉතිරි නොකොට නිරුද්ධවේද, ඔහු විසින් ඇසීමෙන්ද බහුශ්‍රැත භාවයෙන්ද කරණ ලද්දේ වේද, දෘෂ්ටියෙන් අවබොධ කරණ ලද්දේ වේද, තාවකාලික විමුක්තිය ලබයිද, හෙතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු දියුණුව පිණිස යයි පිරිහීමට නොයයි. දියුණුවට යන්නේ වේ. පිරිහීමට නොයන්නේ වේ. (මෙහි 8 (ii) යෙදිය යුතුයි) ආනන්දය, මමද යම් කෙනෙක් වනාහි මා වැනි වේද, පුද්ගලයන් කෙරෙහි ප්‍රමාණ කිරීමකට යන්නෙමි.

11. "ආනන්දය, නැවතද මෙහි ඇතැම් පුද්ගලයෙක් තියුණු රාග ඇත්තේ වේද, ඒ සිතේ මිදීමද නුවණින් මිදීමද තත්වූ පරිද්දෙන් නොදනීද, (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) "ශීලය" වෙනුවට "රාගය" යෙදිය යුතුයි.) මෙහි 8 (ii) යෙදිය යුතුයි.)

12. "ආනන්දය, මෙහි ඇතැම් පුද්ගලයෙක් තියුණු රාග ඇත්තේ වේද, ඒ චිත්ත විමුක්තිය ප්‍රඥා විමුක්තිය තත්වූ පරිද්දෙන් දනීද, (මෙහි 8 (ii) (iii) යෙදිය යුතුයි.) "ශීලය" වෙනුවට "රාගය" යෙදිය යුතුයි.)

13. "ආනන්දය, මෙහි ඇතැම් පුද්ගලයෙක් ක්‍රොධ කරණ සුළුවේද ඒ සිතේ මිදීමද නුවණින් මිදීමද තත්වූ පරිද්දෙන් නොදනීද, (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) "ශීලය" වෙනුවට "ක්‍රොධය" යොදනු.) (මෙහි 8 (iii) යෙදිය යුතුයි.)

14. "ආනන්දය, මෙහි ඇතැම් පුද්ගලයෙක් ක්‍රොධ කරණ සුළුවේද, ඒ සිතේ මිදීමද නුවණින් මිදීමද තත්වූ පරිද්දෙන් දනීද, (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) ("ශීලය" වෙනුවට "ක්‍රොධය" යොදනු.) (මෙහි 8 (ii) යෙදිය යුතුයි.)

15. "ආනන්දය, මෙහි ඇතැම් පුද්ගලයෙක් උඩගු සිත් ඇත්තේ වේද, ඒ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද තත්වූ පරිද්දෙන් නොදනීද, (මෙහි 9 (ii) ඡෙදය යෙදිය යුතුයි.) "ශීලය" වෙනුවට "උඩගුව" යොදනු.) (මෙහි 8 (iii) යෙදිය යුතුයි.)

16. "ආනන්දය, මෙහි ඇතැම් පුද්ගලයෙක් උඩගු සිත් ඇත්තේ වේද, ඒ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද තත්වූ පරිද්දෙන් දනීද, (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) "ශීලය" වෙනුවට "උඩගුව" යොදනු.) (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

17. "ආනන්දය, බාලවූ අව්‍යක්තවූ ළදරු මවු කෙනෙක් වූ ළදරු නුවණක් ඇති මිගශාලා උපාසිකාව කවරේද? පුරුෂ පුද්ගලයන්ගේ උස් පහත් නුවණ කවරේද? ආනන්දය ලොකයෙහි මේ පුද්ගලයන් දස දෙනෙක් විද්‍යමාන වෙත් ආනන්දය, පුරාණතෙම යම්බඳු ශීලයකින් යුක්තවූයේ වේද එබඳු ශීලයකින් ඉසිදත්තතෙම යුක්තවූයේ වන්නේය මෙහි පුරාණතෙම ඉසිදත්තගේ ගතියෙන් අතිකක් නොවේ. ආනන්දය, යම්කිසි ශීලයකින් පුරාණතෙමේ යුක්තවූයේද එබඳු ශීලයකින් ඉසිදත්තතෙමේ යුක්තවූයේ වන්නේය. මෙහි පුරාණතෙම

ඉසිදත්තගේ ගතියෙන් අනිකක් නොවේ. ආනන්දය, මෙසේ මේ පුද්ගලයෝ දෙපක්ෂයෙන් එක් කරුණකින් අඩුය”

**26. තයො ධම්ම සූත්‍රයː-** 1. “මහණෙනි, මේ ධර්ම තුනක් ලොකයෙහි නොවන්නාහු නම් අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි නූපදින්නාහුය. තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරණලද ධර්මය ලොකයෙහි නොබබළන්නේය.

2. “කවර තුනක්දයත්? ඉපදීමද, ජරාවද, මරණයද යන තුනයි. මහණෙනි, මේ ධර්ම තුන ලොකයෙහි විද්‍යමාන නොවන්නාහු නම් අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ ලොකයෙහි නූපදින්නාහුය. තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරණලද ධර්මය ලොකයෙහි නො බබලන්නේය. මහණෙනි, යම් හෙයකින් වනාහි මේ ධර්ම තුන ලොකයෙහි විද්‍යමාන වෙත්ද, එසේ හෙයින් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ ලොකයෙහි උපදිත්. තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශකරණලද ධර්මය ලොකයෙහි බබළයි.

3. “මහණෙනි, ධර්ම තුනක් දුරු නොකර ඉපදීම දුරුකරන්ට, ජරාව දුරුකරන්ට, මරණය දුරුකරන්ට නොහැකිය.

4. “කවර තුනක්ද යත්? රාගය දුරුනොකර, ද්වෙෂය දුරුනොකර, මොහය දුරුනොකර යනුයි. මහණෙනි, මේ කරුණු තුන දුරු නොකර ඉපදීම දුරුකරන්ට ජරාව දුරු කරන්ට මරණය දුරුකරන්ට නොහැක. මහණෙනි, ධර්ම තුනක් දුරු නොකොට රාගය, ද්වෙෂය, මොහය දුරුකරන්ට නොහැකිය. සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, අත්නොහැර රාග, දොෂ, මොහ දුරුකළ නොහැක. නුනුවණින් මෙනෙහිකිරීම, නොමගයාම, සිතේ මැලිබව අත්නොහැර, සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, ශීලබ්බත පරාමාස, දුරුකළ නොහැක. මුළා සිහිය, මනාව නොදැනීම, සිතේ නොසන්සුන් බව, අත්නොහැර නුනුවණින් මෙනෙහි කිරීම, නොමගයාම, සිතේ මැලි බව දුරුකළ නොහැක. ආර්යයන් දක්නට නොකැමති බව, ආර්ය ධර්මය අසන්ට නො කැමති බව, දොෂාරෝපණ සිත අත්නොහැර මුළාසිහිය, මනාව

නොදැනීම සිතේ නොසන්සුන්බව දුරුකළ නොහැක. සිතේ නොසන්සුන්කම සංවර නැතිකම, දුසිල්බව අත්නොහැර ආර්යයන් දක්නට නො කැමතිබව, ආර්ය ධර්මය අසන්නට නොකැමැතිබව, දොෂාරොපන සිත දුරුකළ නොහැක. අශ්‍රද්ධාව නොදෙනසුළුබව, කුසීතකම අත්නොහැර සිතේ නොසන්සුන්කම සංවර නැතිකම, දුසිල් බව දුරුකළ නොහැක. නො සැලකිලිබව, නොකීකරුබව, පාප මිත්‍රයන් ඇතිබව දුරුනොකර, අශ්‍රද්ධාව, නො දෙනසුළුබව කුසීතකම දුරුකළ නොහැක පාපයට ලජ්ජා නැතිබව, භය නැතිබව, ප්‍රමාදය අත්නොහැර නොසැලකිල්ල, නොකීකරුබව, පාප මිත්‍රයන් ඇතිබව දුරු කළ නොහැක.

"මහණෙනි, පාපයට ලජ්ජානැති, භය නැති මේතෙමේ ප්‍රමාදවූයේවේ. හෙතෙම ප්‍රමාදවූයේම නොසැලකිල්ල, නොකීකරුකම පාප මිත්‍රයන් ඇතිබව දුරුකරන්නට නුසුදුසුය.

4. "හෙතෙම පාප මිත්‍රයන් ඇත්තේ අශ්‍රද්ධාව, නොදෙන සුලුබව, කුසීතකම දුරුකළ නොහැක. හෙතෙම කුසීතවූයේ සිතේ නොසන්සුන්බව, අසංවරය, දුස්සීලබව දුරුකළ නොහැක. හෙතෙම දුස්සීලවූයේ ආර්යයන් නොදකිනු කැමැත්ත ආර්ය ධර්මය ඇසීමට නොකැමැත්ත, දොෂාරොපන හිත දුරුකළ නොහැක. හෙතෙම දොෂාරොපන සිත් ඇත්තේ මුළා සිහිය මනාව නොදැනීම, සිතේ අවුල දුරුකළ නොහැක. හෙතෙම සිතේ අවුල් ඇත්තේ නුවණින් මෙනෙහි නොකිරීම වැරදි මාර්ග සේවනය, සිතේ මැලිබව දුරුකළ නොහැක. හෙතෙම සිතේ මැලිබව ඇත්තේ ආත්ම දෘෂ්ටිය, සැකය, අන්‍යශීල ව්‍රතයන් ගැනීම, දුරුකළ නොහැක හෙතෙම සැක ඇත්තේ රාගය දුරුකරන්නට ද්වෙෂය දුරුකරන්නට, මොහය දුරුකරන්නට නුසුදුසුය. රාගය දුරුනොකොට, ද්වෙෂය දුරුනොකොට මොහය දුරුනොකොට ජාතිය දුරුකරන්නට ජරාව දුරුකරන්නට, මරණය දුරුකරන්නට නුසුදුසුය. රාගය, ද්වෙෂය, මොහය දුරුනොකර ජාති ජරා මරණ දුරු කළ නොහැක.

5. "මහණෙනි, ධර්ම තුනක් අත්හැර ජාති ජරා මරණ දුරුකිරීමට සුදුසුය. කවර තුනක්දයත්? රාගය අත්හැර ද්වෙෂය

අත්හැර මොහය අත්හැරය. මහණෙනි, මේ ධර්ම තුන අත්හැර ජාති, ජරා, මරණ දුරුකිරීමට සුදුසුය. (මෙසේ මුලින් දැක්වූ කොටස් සියල්ලෙහිම 'නුසුදුසුය' යන්නට මෙහි 'සුදුසුය' කියා යොදාගත යුතුයි.)

6. "මහණෙනි, පාපයට ලජ්ජා ඇති, භය ඇති මේ තෙමේ ප්‍රමාදනුවූයේවේද, අප්‍රමාද වූ හෙතෙමේ නොසැලකිල්ල නොකීකරුබව පාපමිත්‍රයන් ඇතිබව දුරුකරන්ට සුදුසුය. (මෙසේ මුලින් දැක්වූ කොටසෙහි මෙන් මෙහිද, 'නුසුදුසුය' යන්නට 'සුදුසුය' කියා යොදාගත යුතුය.)

27. "**කාකාසද්ධම්ම සූත්‍රය**:- 1. "මහණෙනි, කපුටුතෙම අයහපත් ස්වභාව දහයකින්, යුක්තය.

2. "කවර දසයකින්දයත්? බිය සැක නැත්තේය. බුහුටිය. තෘප්තනුවූයේය. බොහෝ කන්නේද වේ. රෞද්‍රය, කරුණානැත්තේය. දුර්වලය, නපුරුකොට හැඬීම කරන්නේය. මුළා සිහි ඇත්තේය. නරක දුක් විඳින්නේය. මහණෙනි, කපුටු තෙම අයහපත් ස්වභාව දසයෙන් යුක්තවුයේය.

3. "මහණෙනි, එසේම පවිටු භික්ෂුව අයහපත් ස්වභාව දසයකින් යුක්තවූයේවේ.

4. "කවර දසයකින්දයත්, බිය සැක නැත්තේය බුහුටිද තෘෂ්ණාවූයේද බොහෝ කන්නේදවේ, රෞද්‍රය, කරුණා නැත්තේය. දුර්වලද නපුරුකොට හැඬීම කරන්නේද වේ, මුළාසිහි ඇත්තේය නරක දුක්විඳින්නේදවේ මහණෙනි, පවිටු භික්ෂුව මේ අයහපත් ස්වභාවයෙන් යුක්තවූයේ වේ.

28. **නිඝණ්ඨාසද්ධම්ම සූත්‍රය**:- 1. "මහණෙනි, නිඝණ්ඨයෝ මේ අයහපත් ස්වභාව දසයකින් සමන්විත වෙත්.

2. "කවර දසයකින්ද යත්? මහණෙනි, නිඝණ්ඨයෝ ශ්‍රද්ධාව නැත්තාහ. මහණෙනි, නිඝණ්ඨයෝ දුශ්ශීලයහ. මහණෙනි, නිඝණ්ඨයෝ ලජ්ජා නැත්තාහ. මහණෙනි, නිඝණ්ඨයෝ බිය නැත්තාහ. මහණෙනි නිඝණ්ඨයෝ අසත්පුරුෂයන්ට භක්ති ඇත්තාහ. මහණෙනි, නිඝණ්ඨයෝ තමන් උසස් කරන්නාහ.

අනුන් පහත්කරන්නාහ. මහණෙනි නිඝණ්ඨයෝ තමාගේ දෘෂ්ටිය අල්ලාගත්තාහුය. තදින් ගත්තාහ. මහණෙනි, නිඝණ්ඨයෝ නැතිගුණ පෙන්වන්නාහ. මහණෙනි, නිඝණ්ඨයෝ ලාමක බලාපොරොත්තු ඇත්තාහ. මහණෙනි නිඝණ්ඨයෝ වැරදි හැඟීම් ඇත්තාහුය. මහණෙනි නිඝණ්ඨයෝ මේ කරුණු දහයෙන් යුක්තවූවාහුය.

**29. දසාඝාතවත්ථු සූත්‍රයඃ-** 1. "මහණෙනි, වෛර කාරණා මේ දසයක් වෙත්."

**2.** "කවර දසයක්ද යත්? මට අනර්ථයක හැසුරුණේයයි වෛරය බඳියි. මට අනර්ථයක හැසිරේයයි වෛරය බඳී. මට අනර්ථයක හැසිරෙන්නේ යයි වෛරය බඳී. මාගේ ප්‍රියයාට මනාපයාට අනර්ථයක හැසුරුණේය. හැසිරෙන්නේයයි වෛරය බඳී. මාගේ අප්‍රියයාට අමනාපයාට අර්ථයක හැසුරුනේය. හැසිරෙයි හැසිරෙන්නේයයි වෛරය බඳී. අස්ථානයෙහිද කිපෙයි. මහණෙනි, මේ වෛර කාරණා දසයෙකි.

**30. දසාඝාත පටිවිනය සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ වෛරය හික්මවන කරුණු දහයක් වෙති.

**2.** "කවර දසයක්දයත්? මට අනර්ථයක හැසුරුණේය. එය මෙහි කොහෙන් ලැබිය හැක්කේදැයි' වෛරය සංසිඳුවයි. 'මට අනර්ථයක හැසිරෙයි. එය මෙහි කොහෙන් ලැබිය හැක්කේදැයි, වෛරය සංසිඳුවයි. 'මට අනර්ථයක හැසිරෙන්නේය' එය කොහෙන් ලැබියහැක්කේදැයි වෛරයසංසිඳුවයි. 'මාගේ ප්‍රියයාට මනාපයාට අනර්ථයක හැසුරුණේය. හැසිරෙයි, හැසිරෙන්නේය එය මෙහි කොහෙන් ලැබිය හැක්කේදැයි වෛරය සංසිඳුවයි. 'මාගේ අප්‍රියයාට අමනාපයාට යහපතක හැසුරුනේය, හැසිරෙයි. හැසිරෙන්නේයයි මෙහි එය කොහෙන් ලැබියහැක්කේදැයි' වෛරය සංසිඳුවයි අස්ථානයෙහිද නොකිපෙයි. මහණෙනි, මේ දශය වෛරය සංසිඳුවන කරුණු වෙත්."

**(8. ආකංඛ වර්ගය නිමි.)**

---

# 9. ථෙර වර්ගය.

(i) 31. බාහුන (වාහන) සූත්‍රයː- 1. එක්කාලයෙක් භාග්‍යවතුන් වහන්සේ චම්පානුවර ගග්ගරා පොකුණුතෙර වාසය කරණසේක. ඉක්බිති ආයුෂ්මත් බාහුන ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් බාහුන ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, කරුණු කීයකින් තථාගත තෙමේ බැහැරවී සිටියේ වෙන්වී සිටියේද මිදුණේද සීමාරහිත සිතින් වාසය කරයිද?"

2. "බාහුනය, තථාගතතෙම ධර්ම දහයකින් යුක්තවූයේ බැහැර සිටියේය, වෙන්ව සිටියේය, මිදුණේය, සීමා ඉක්මවූ සිතින් වාසය කරයි. කවර දසයකින්ද යත්?

3. "බාහුනය තථාගතයන් වහන්සේ රූපයෙන් බැහැර සිටියේය, වෙන්ව සිටියේය, මිදුණේය, සීමාවවූ සිතින් වෙසෙයි වෙදනාවෙන්, සංඥාවෙන්, සංස්කාරයෙන්, විඥ්ඥාණයෙන්, ඉපදීමෙන්, ජරාවෙන්, මරණයෙන්, දුක්වලින්, කෙලෙස්වලින් බාහුනය, තථාගතයන් වහන්සේ බැහැර සිටියේ, වෙන්ව සිටියේය, මිදුණේය, සීමා ඉක්මවූ සිතින් වෙසෙයි.

4. "බාහුනය, යම්සේ ජලයෙහි හටගත් ජලයෙහි වැඩුණු උපුලක් හෝ පියුමක් හෝ හෙළ පියුමක් හෝ දිය හා නොගැටී දියෙන් උඩට පැනසිටීද, බාහුනය, එසේම තථාගත තෙම මේ දශධර්මයන්ගෙන් බැහැරව සිටියේ, වෙන්ව සිටියේ මිදුණේ සීමාඉක්මවූ සිතින් වෙසෙයි."

32. සාසන වුද්ධි සූත්‍රයː- 1. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැද එකත්පසෙක සිටියේය.

2. එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ, "ආනන්දය, ඒකාන්තයෙන් අශ්‍රද්ධාවෙන්යුත් ඒ භික්ෂුව (ii) මෙ ධර්මවිනයෙහි වැඩීමට,

නැගීමට මහත් බවට පැමිණෙන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. (iii) දුශ්ශීලවූ ඒ භික්ෂුව (මෙහි 2 (ii) ඡෙදය යුතුයි.) අල්පශ්‍රැතවූ ඒ භික්ෂුව (මෙහි 2 (ii) ඡෙදය යුතුයි) අකීකරු ඒ භික්ෂුව (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) දුෂ්ට මිත්‍රයන් ඇති ඒ භික්ෂුව (මෙහි 2 (ii) යෙදිය යුතුයි) කුසීතවූ භික්ෂුව (මෙහි 2 (ii) යෙදිය යුතුයි) මුළා සිහි ඇති භික්ෂුව (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ලද දෙයින් සතුටුනුවූ භික්ෂුව (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ලාමක අදහස් ඇති භික්ෂුව (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මිථ්‍යා දෘෂ්ටි ඇති භික්ෂුව (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ආනන්දය මේ ධර්ම දහයෙන් යුක්තවූ ඒ මහණ තෙම මේ ධර්ම විනයෙහි වැඩීමට නැගීමට මහත් බවට පැමිණෙන්නේය යන මේ කරුණ විද්‍යමාන නොවේ.

3. "ආනන්දය, ඒ භික්ෂුව වනාහි ශ්‍රද්ධා ඇත්තේ (ii) මේ ධර්ම විනයෙහි වැඩීමට, නැගීමට, මහත් බවට පැමිණෙන්නේය යන මේ කාරණය විද්‍යමානවේ. ශ්‍රද්ධාවත් භික්ෂුව සිල්වත් 'බහුශ්‍රැත, කීකරු, යහපත් මිත්‍රයන් ඇති පටන්ගත් වීර්ය ඇති එළඹ සිටි සිහි ඇති, ලදදෙයින් සතුටුවන අල්පෙච්ඡ, සම්‍යක් දෘෂ්ටික, භික්ෂුව මේ ධර්ම විනයෙහි වැඩීමට නැගීමට මහත් බවට පැමිණෙන්නේය යන මේ කාරණය විද්‍යමානවේ."

33. **පුණ්ණිය සූත්‍රයඃ-** 1. ඉක්බිති ආයුෂ්මත් පුණ්ණිය ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් පුණ්ණිය ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට, "ස්වාමීනි, සමහර දිනයෙක්හි යම්කරුණකින් තථාගතයන් වහන්සේට ධර්ම දෙශනාවෙහි සිත නැමෙයිද සමහර දවසක සිත නොනැමේදැයි" ඇසීය.

2. "පුණ්ණිය භික්ෂුව ශ්‍රද්ධාවත්වේද නොඑළඹෙන්නේවේද (ii) ඒතාක් තථාගතයන් වහන්සේට ධර්මදෙශනාවෙහි සිත නොනැමෙයි. (iii) පුණ්ණිය යම් තැනක පටන් මහණ තෙම ශ්‍රද්ධාවත්වේද, එළඹෙනසුළුත්වේද (iv) මෙසේ තථාගතයන්ට ධර්ම දෙශනාවෙහි සිතනැමෙයි.

3. "පුණ්ණිය භික්ෂුව ශ්‍රද්ධාවත්වූවත් එළඹෙන සුළු වුවත් ආශ්‍රය නැද්ද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ආශ්‍රය ඇතත්, අසනස්වභාවය නැද්ද, ඇසුවත්, යොමුකරණලද කන් ඇතිව බණ නොඅසයිද, යොමුකරණලද කන් ඇතිව ඇසුවත් අසා බණ නොදරයිද, දරණලද ධර්මයන්ගේ අර්ථය පරීක්ෂා නොකරයිද දරණලද ධර්මයන්ගේ අර්ථය පරීක්ෂා කළත් අර්ථය දැන ධර්මය දැන පිළිපැද්දත් යහපත් ප්‍රකාශකිරීම් ඇත්තේ නොවේද, යහපත් ප්‍රකාශකිරීම් ඇතත් හඬසහිත කෙළතොළු නොවූ අර්ථය අඟවන නාගරික වචනයෙන් සුන්දර වචන ඇත්තේ නොවේද, හඬ සහිත, කෙළතොලු නොවූ, අර්ථය අඟවන නාගරික වචනයෙන් සුන්දර වචන ඇත්තේ සබ්‍රම්සරුන්ට මනාව නොදක්වන්නේවේද, සමාදන් නොකර වන්නේවේද, තෙද නොගන්වන්නේවේද, සතුටු නො කරන්නේවේද, ඒතාක් තථාගතයන් වහන්සේට ධර්මදෙශනාවෙහි සිත නොනැමෙයි.

4. "පුණ්ණිය, යම්තැනක සිට මහණතෙම ශ්‍රද්ධාවත් වේද, එළඹෙන්නේවේද, ආශ්‍රය කරන්නේවේද, අසන්නේ වේද, කන්යොමුකෙරේද අසා ධර්මය දරයිද, දැරූ ධර්මයන්ගේ අර්ථය පරීක්ෂාකරයිද, අර්ථය දැන ධර්මය දැන ධර්මය අනුව පිළිපදියිද යහපත් වචන ඇත්තේවේද හඬසහිත කෙළතොළු නොවූ, අර්ථය හඟවන නාගරික වචනයෙන් සබ්‍රම්සරුන් මනාකොට පෙන්වන්නේ සමාදන් කරවන්නේ, තෙදගන්වන්නේ, සතුටු කරන්නේවේද, පුණ්ණිය, මේ ධර්ම දහයෙන් යුක්තවූ ධර්මදෙශනාවෙහි තථාතයන් වහන්සේට ඒකාන්තයෙන් සිත නැමෙන්නේවේ."

34. **අඤ්ඤා ව්‍යාකරණ සූත්‍රය**:- 1. එකල්හි වනාහී ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ (ii) 'ඇවැත්නි' මහණෙනියි' භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. (iii) ඒ භික්ෂූහු 'ඇවැත්නියි' ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්ට පිළිවදන් දුන්හ. ආයුෂ්මත් මහා මොග්ගල්ලාන තෙම මෙය වදාළසේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "ඇවැත්නි මේ ශාසනයෙහි මහණතෙම 'ඉපදීම ක්ෂය විය. බඹසර වැස නිමවන ලදී, කළයුත්ත කරණලදී. මින් ඉදිරියට අනිකක් නැතැයි දනිමියි' රහත්කම ප්‍රකාශ කරතියි' කීසේක. ඒ ඔහුට (ii) ධ්‍යාන කරණ, සමවැදීමේ දක්ෂ අනුන්ගේ සිත් දැකීමේ දක්ෂ අනුන්ගේ ක්‍රමයෙහි දක්ෂ, තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙක් හෝ (iii) ප්‍රශ්න කෙරේ, විමසයි, සාකච්ඡා කරයි. හෙතෙම ධ්‍යානකරන සමවැදීමෙහි දක්ෂ අනුන්ගේ සිත් දැනීමේ දක්ෂ අනුන්ගේ සිත් පැවැත්මේ දක්ෂ තථාගතයන් වහන්සේ විසින් හෝ තථාගත ශ්‍රාවකයන් විසින් හෝ ප්‍රකාශ කරණු ලබන්නේ විමසනු ලබන්නේ සාකච්ඡා කරනු ලබන්නේ, නිසරුබවට පැමිණේද හානියට පැමිණේද අක්‍රමයට පැමිණේද ව්‍යසනයට පැමිණේද, ඒ මොහු ධ්‍යාන කරණසුළු සමවැදීමෙහි දක්ෂ අනුන්ගේ සිත දැනීමේ දක්ෂ අනුන්ගේ සිතේ පැවැත්මේ දක්ෂ, තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙකු හෝ මෙසේ සිතින් සිත පතුරුවා මෙනෙහි කෙරෙයි."

3. (i) "කිමෙක්ද මේ ආයුෂ්මත් තෙමේ උත්පත්තිය ක්ෂයවිය; බඹසර වැස නිමවනලදී; කටයුත්ත කරණ ලදී; මින්මතුවට අනිකත් නැතැයි දනිමි"යි කුමක් නම් ප්‍රකාශ කෙරේද? (මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) මෙසේ සිතින් සිත පතුරුවා දැන දනියි.

(ii) "මේ ආයුෂ්මත් තෙමේ ක්‍රොධ ඇත්තේ බොහෝ සේ ක්‍රොධයෙන් මැඩගත් සිතින් වාසය කරයි. මේ ක්‍රොධයෙන් මඩැ ගැනීම, වනාහි තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරණලදද ධර්ම විනයෙහි පිරිහීමකි.

(iii) මේ ආයුෂ්මත් තෙමේ බද්ධවෛරයෙන් යුක්තය බොහෝසේ බද්ධවෛරයෙන් යටකොටගත් සිතින් වාසය කරයි. බද්ධ වෛරය නැගීම වනාහි තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරණලදද ධර්ම විනයෙහි පිරිහීමකි.

4 - 10 (මේ ඡෙද මේ සූත්‍රයේ:- 3 (iii) ඡෙදයමෙනි "බද්ධ වෛරය" වෙනුවට, "ගුනමකුකම" ශ්‍රෙෂ්ඨයන් තමා සමකොට සිතීම, ඊර්ෂ්‍යාව මසුරුකම, කෛරාටිකකම, මායාව, පවට

කැමැත්ත යන වචන ඒ ඒ ඡෙදයෙහි යෙදීමෙන් සකස් කළ යුතුයි.)

11. "මේ ආයුෂ්මත් තෙමේ සිහිමුළාව ඇත්තේ මතුවට කළ යුත්තෙහි අල්පමාත්‍රවූ විශෙෂ මාර්ග ඵලාවබොධයක් නොලැබ අතරතුර අවසනට පැමිණියේය. අතරතුර අවසනට පැමිණීමය යන මෙය වනාහි තථාගතයන් වහන්සේ විසින් වදාරණලද ධර්මයෙහිලා පිරිහීමකි.

12. "ඇවැත්නි, ඒකාන්තයෙන් ඒ මහණතෙම මේ ධර්ම දහය අත්හැර මේ ධර්ම විනයෙහි වැඩීමට, උසස්වීමට, මහත්ත්වයට පැමිණෙන්නේය යන මේ කාරණය විද්‍යමානවේ."

35. **කත්ථි විකත්ථිය සූත්‍රය:** 1. එක්කාලයෙක්හි ආයුෂ්මත් මහා චුන්දස්ථවිරයන් වහන්සේ චෙදී ජනපදයෙහි සහජාති නම් ගම වාසය කරණසේක. එකල්හි වනාහි ආයුෂ්මත් මහා චුන්දස්ථවිරයන් වහන්සේ (මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයේ (ii) ඡෙදය යෙදිය යුතුයි.)

2. "ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ, 'ඇවැත්නි මේ ශාසනයෙහි මහණතෙම (ii) 'මම ප්‍රථම ධ්‍යානයට සම වදිමියිද නැගිටිමියිද, මම ද්විතීයධ්‍යානයට සම වදිමියයිද නැගිටිමියිද, තුන්වෙනි ධ්‍යානයට, සතරවෙනි ධ්‍යානයට, ආකාශානඤ්චායතනයට, විඤ්ඤාණඤ්චායතනයට, ආකිඤ්චඤ්ඤායතනයට, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට, හැඟීම් හා විඳීම් නැති කිරීමේ සමවතට සමවදිම් නැගිටිමියිද (iii) අධිගමයන් කෙරෙහි තමා උසස් කොට කියාද, විශෙෂයෙන් උසස් කොට කියයිද, ඔහුට ධ්‍යානයන්ට සමවැදීමෙහි දක්ෂ අනුන්ගෙ සිත් දැනීමේ දක්ෂ, අනුන්ගේ සිතේ පැවැත්ම දැනීමෙහි දක්ෂ තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙක් හෝ ප්‍රශ්න කෙරෙහි විමසයි. සාකච්ඡා කරයි.

3. "ධ්‍යාන කරණ සමවැදීමට දක්ෂ අනුන්ගේ සිත් දැනීමෙහි දක්ෂ, අනුන්ගෙ සිත්හි පැවැත්මෙහි දක්ෂ (ii) තථාගතයන් වහන්සේ විසින් හෝ තථාගත ශ්‍රාවකයන් විසින් ප්‍රශ්න කරණු ලබන්නේ විමසනු ලබන්නේ, කථා කරණු ලබන්නේ නිසරු

බවට පැමිණේද, හානියට පැමිණේද, අක්‍රමයට පැමිණේද, විපත්තියට පැමිණේද, ඒ මොහු (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) ධ්‍යාන කරණ සුළු තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙක් හෝ මෙසේ සිතින් සිත පතුරුවා දැන මෙනෙහි කරයි. කිමෙක්ද? මේ ආයුෂ්මත් තෙමේ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) කියා අධිගමයන්හි තමා උසස් කර කියයිද, විශෙෂයෙන් උසස් කර කියයිද, (iii) ඒ ඔහු (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයෙක් හෝ මෙසේ සිතින් සිත පතුරුවා දනී.

4. "මේ ආයුෂ්මත්තෙමේ බොහෝ කාලයක් ශීලයන්හි බිඳීම කරන්නේය. සිදුරු කරන්නේය. පුල්ලි තබන්නේය. කිලුටු කරන්නේය. නිතර නොරක්නේය, නිතර පැවැත්මක් නැත. මේ ආයුෂ්මත්තෙමේ දුශ්ශීලය. දුසිල් බව වනාහි තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද ධර්ම විනයෙහි ලා පිරිහීමකි."

5 - 7. (මේ ඡෙද මේ සූත්‍රයේ 4 ඡෙදය මෙනි. "ශීලයන්හි බිඳීම කරන්නේය." වෙනුවට "අශ්‍රද්ධා බව, බොහෝ ඇසූ පිරූ තැන් නැති බව, ආචාරශීලී නොවීම යන වචන ඒ ඒ ඡෙදවලට යොදා සකස් කරගත යුතුයි.)

8. "මේ ආයුෂ්මත්තෙමේ අකීකරුය. අකීකරුකම තථාගතයන් වහන්සේ විසින් වදාරන ලද ශාසනයෙහිලා පිරිහීමකි.

9 - 13. (මේ ඡෙද මේ සූත්‍රයේ 8 ඡෙදයමෙනි. "අකීකරු" වෙනුවට ලාමක මිත්‍රයන් ඇති බව කුසීතකම, සිහිමුළාව නැති ගුණ පෙන්වීම, වැරදි පොෂණ යන වචන ඒ ඒ ඡෙදයට යෙදිය යුතුයි.)

10. "මේ ආයුෂ්මත්තෙමේ නුවණ නැත්තේය, නුවණ නැති බව යන මෙය වනාහි තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද ධර්මයෙහි ලා පිරිහීමකි."

11. "ඇවැත්නි, යම්සේ යහළුවෙක් යහළුවාට 'යහළුව, යම්කලෙක තොපට ධනයෙන් කටයුතු වැඩක් වන්නේ නම්

මගෙන් ධනය ඉල්වන්නෙහිය, ඔබට ධනය දෙන්නෙම්' මෙසේ කියන්නේය. ධනයෙන් කටයුතු යමක් පැමිණි කල්හි යහලු තෙම යහළුවාට, 'යහළුව මට ධනයෙන් වැඩ ඇත්තේය මට ධනය දෙවයි මෙසේ කියන්නේය.' හෙතෙම 'එසේ නම් මෙහි හාරවයි කියන්නේය.

හෙතෙම එහි කණින්නේ නොලබන්නේ නම් හෙතෙම 'යහළුවාට මෙහි කණවයි. මට බොරුවක් කීයේය. යහළුව මට හිස් දෙයක් කීවේ යයි' කියන්නේය. හෙතෙම 'යහළුව' මම බොරුවක් නොකියමි. හිස් දෙයක් නොකියමි. යහළුව, එසේනම් මෙහි හාරවයි' මෙසේ කියන්නේය. හෙතෙම එහිද කණින්නේ නොලබන්නේ නම් හෙතෙම 'යහළුව, මට බොරුවක් කීයෙහිය. යහළුව මට මෙහි කණවයි බොරුවක් කීයෙහිය. හිස් දෙයක් කීයෙහිය'යි මෙසේ කියන්නේය. හෙතෙම 'යහළුව, මට බොරුවක් නොකීමි. හිස්වූවක් නොකීමි. යහළුව, එසේනම් මෙහි හාරව'යි මෙසේ කියන්නේය. හෙතෙම එහිද කණින්නේ නොලබන්නේ නම් 'යහළුව, මෙහි හාරවයි, මට බොරුවක් කීයෙහිය, හිස් දෙයක් කීයෙහිය'යි මෙසේ කියන්නේය. හෙතෙම, 'යහළුව මම බොරුවක් නොකීමි. හිස්වූවක් නොකීමි.' එතකුදු වුවත් මම පිස්සුවට, සිතේ විපර්යාසයට පැමිණියෙමියි' මෙසේ කියන්නේය.

12. "මහණෙනි, එසේම මහණතෙම (ii) 'මම ප්‍රථම ධ්‍යානයට සමවදිමි නැගිටිමි, දෙවෙනි, තුන්වෙනි සතරවෙනි, ආකාශානඤ්චායතන, විඤ්ඤානඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට නිරෝධ සමාපත්තියට සමවදිමි නැගිටිමියි අධිගමයෙන් තමා උසස් කර, විශෙෂයෙන් උසස් කර කියයිද ඔහුට ධ්‍යාන ඇති සමවැදීමෙහි දක්ෂ අනුන්ගේ සිත් දැනීමෙහි දක්ෂ, අනුන්ගේ සිත්හි පැවැත්මෙහි දක්ෂ තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙක් හෝ ප්‍රශ්න කරණු ලබන්නේ කථා කරණු ලබන්නේ විමසනු ලබන්නේ නිසරු බවට පැමිණේද, හානියට පැමිණේද, අක්‍රමයට පැමිණේද, විපත්තියකට පැමිණේද, ඒ ඔහු ධ්‍යාන

කරන සමවැදීමෙහි දක්ෂ අනුන් සිත දැනීමෙහි දක්ෂ, අනුන් සිතෙහි පැවැත්ම දක්නා තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙක් හෝ සිතින් සිත පතුරුවා දැන මෙනෙහි කරයි.

"කිමෙක්ද? මේ ආයුෂ්මත්තෙමේ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

"ඇවැත්නි, ඒකාන්තයෙන් ඒ මහණ මේ ධර්ම දහය පහ නොකර මේ ධර්ම විනයෙහි වෘද්ධියට වැඩීමට විපුලත්වයට පැමිණේ යයි යන මේ කාරණය විද්‍යමාන නොවේ. ඇවැත්නි, ඒකාන්තයෙන් මහණතෙම මේ ධර්ම දහය අත්හැර මේ ධර්ම විනයෙහි අභිවෘද්ධියට වැඩීමට විපුලත්වයට පැමිණෙන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ."

**36. අධිමානී සූත්‍රයː-** 1. එක්කාලයෙක්හි ආයුෂ්මත් මහාකාශ්‍යපයන් වහන්සේ රජගහනුවර ලෙහෙනුන්ට අහර දුන් වෙළුවනයෙහි වාසය කරණ සේක. එකල්හි ආයුෂ්මත් මහාකාශ්‍යපයන් වහන්සේ "ඇවැත්නි මහණෙනි" කියා භික්ෂූන් ඇමතු සේක, ඒ භික්ෂූහු "ඇවැත්නි" ආයුෂ්මත් මහා කාශ්‍යපයන් වහන්සේට උත්තර දුන්හ.

**2.** "ආයුෂ්මත් මහා කාශ්‍යපයන් වහන්සේ "ඇවැත්නි මේ ශාසනයෙහි මහණතෙම (ii) ඉපදීම ක්ෂයවිය. (මෙහි මේ වර්ගයේ 24 - සූත්‍රයේ ඡෙද 3 (i) යෙදිය යුතුයි.) අනිකක් ප්‍රකාශ කරයි. මෙසේ සිතින් පතුරුවා සිත දැන ගනියි මේ ආයුෂ්මත් තෙමේ මාර්ගඵල නොලබා ලැබුයේයයි සිතන (අධිමානික) කෙනෙකි. අධිමානය සත්‍යය කොට සිතන්නෙකි. නොපැමිණි දෙයෙහි පැමිණියේය යන හැඟීම ඇත්තේය. නොකළ දෙයෙහි කළ හැඟීම ඇත්තෙකි. නොලැබූ දෙයෙහි ලද්දේය යන හැඟීම ඇත්තේය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි)

**3.** "මේ ආයුෂ්මත් තෙමේ බහුශ්‍රැතය. ඇසූදේ දරන්නේය. ඇසූදේ එක්කරන්නේය. යම් ඒ ධර්ම කෙනෙක් මුල මැද, අග, යහපත්ද අර්ථ සහිතද අකුරු සහිතද හාත්පසින් සම්පූර්ණද පිරිසිදුවූද බ්‍රහ්මචර්යය ප්‍රකාශ කරත්ද, එබඳු ධර්මයෝ බොහෝ අසන ලද්දාහු, දරණ ලද්දාහු, වචනයෙන් පුරුදුවූවාහු සිතින්

යොමු කොට බලන ලද්දාහු දෘෂ්ටියෙන් තේරුම් ගන්නා ලද්දාහු වෙත්. එහෙයින් මේ ආයුෂ්මත්තෙමේ අධික මානයෙන් යුක්තය. අධිමානයෙන් සත්‍යය දන්නේය කියා ගන්නා කෙනෙක. නොපැමිණි දෙයෙහි පැමිණියේය යන සංඥා ඇත්තේය. නොකළ දෙයෙහි කළ සංඥා ඇත්තේය. නොලැබූ දෙයෙහි ලැබූයේය යන සංඥා ඇත්තේය. අධිමානයෙන් ජාතිය ක්ෂය විය බඹසර වැසනිමවන ලදී. කළයුත්ත කරණ ලදී මත්තට යමක් නැතැයි දනිමියි රහත් කම ප්‍රකාශ කරයි. ධ්‍යාන ඇති සමවැදීමෙහි දක්ෂ අනුන් සිත්හි දක්ෂය. අනුන් සිතේ පැවැත්මෙහි දක්ෂය. තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවක හෝ "මේ ආයුෂ්මත්තෙමේ තෘෂ්ණා බහුල කොට ඇත්තේය.

4. බොහෝ සේ තෘෂ්ණාවෙන් යටකොට ගත් සිතින් වෙසෙයි. තෘෂ්ණාවෙන් යටවීම (ii) වනාහි තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද ධර්මවිනයෙන් පිරිහීමකි. (iii) මේ ආයුෂ්මත් තෙමේ ක්‍රොධ ඇත්තෙකි. ක්‍රොධයෙන් මේ ආයුෂ්මත් තෙමේ සිත කය දෙකේ ගිලන් භාවයෙන් යුක්තය. සිත කය දෙකේ ගිලන්කමින් (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මේ ආයුෂ්මත්තෙමේ ඇවිස්සුණු සිතින් යුක්තය. ඇවිස්සුණු සිතින් යුක්තවීම (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මේ ආයුෂ්මත්තෙමේ සැකය ඇත්තෙක සැකය (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මේ ආයුෂ්මත් තෙමේ කර්මාන්තවල ඇලුනෙක. කර්මාන්තවල ඇලීම (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මේ ආයුෂ්මත් තෙමේ වැඩි කථාවෙහි ඇලුනෙක වැඩිකථාවෙහි ඇලීම (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මේ ආයුෂ්මත්තෙමේ නිදීමෙහි ඇලුනෙක. නිදීමෙහි ඇලීම (මෙහි 4 (ii) යෙදිය යුතුයි. මේ ආයුෂ්මත් තෙමේ පිරිස හා ඇලුනෙක. පිරිසෙහි ඇලීම (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මේ ආයුෂ්මත් තෙමේ මතු කළ යුත්තෙහි මුළා සිහි ඇත්තෙක. මතුකළ යුත්තෙහි මුළාසිහිය (මෙහි 4 (ii) යෙදිය යුතුයි) අල්ප මාත්‍ර විශෙෂයකට පැමිණීමෙන් අතරෙහි අවසාන කළේය. අතරෙහි අවසන් කිරීම වනාහි තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්ම විනයෙන් පිරිහීමකි.

5. "ඇවැත්නි, ඒකාන්තයෙන් ඒ මහණතෙම මේ ධර්ම දහය අත් නොහැර මේ ධර්ම විනයෙහි අභිවෘද්ධියට වැඩීමට විපුලත්වයට පැමිණේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. ඇවැත්නි, ඒ කාන්තයෙන් ඒ මහණතෙම මේ ධර්ම දහය අත්හැර මේ ධර්ම විනයෙහි අභිවෘද්ධියට වැඩීමට විපුලත්වයට පැමිණෙත්ය යන මේ කාරණය විද්‍යමානවේ."

37. **අධිකරණික සූත්‍රය**:- 1. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ කලන්දක භික්ෂු අරභයා "මහණෙනියි" කියා භික්ෂූන්ට ඇමතූ සේක. ඒ භික්ෂූහු "පින්වතුන් වහන්සැයි" කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

2. "භාග්‍යවතුන් වහන්සේ, "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නඩුවිසඳන්නෙක් වේද, නඩු සමාදානයෙහි ගුණ නොකියයිද, මහණෙනි යම් හෙයකින් මහණතෙම නඩු විසඳන්නෙක් වේද, නඩු සමාදානයෙහි ගුණ නොකියයිද (ii) මේ කාරණයද ප්‍රිය බව පිණිස නොවේ. ගරුත්වය පිණිස නොවේ. දියුණුව පිණිස නොවේ. සමාන බව පිණිස නොවේ. සමගිය පිණිස නොවේ.

3. "මහණෙනි, නැවතද මහණතෙම ශික්ෂාකාමී නොවේද ශික්ෂා සමාදානයෙහි ගුණ නොකියයිද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

4. මහණෙනි, නැවතද මහණතෙම ලාමක බලාපොරොත්තු ඇත්තේ වේද, කැමැත්ත සංසිඳවීමෙහි ගුණ නොකියයිද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

5. "මහණෙනි, නැවතද මහණතෙම ක්‍රොධ කරන්නේ වේද ක්‍රොධයට පත් කිරීමෙහි ගුණ නොකියයිද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

6. "මහණෙනි, නැවතද මහණතෙම ගුණමකුවේද ගුණමකුකම සංසිඳවීමෙහි ගුණ නොකියයිද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

7. "මහණෙනි, නැවතද මහණතෙම කෛරාටිකවූයේද කෛරාටිකකම නැති කිරීමෙහි ගුණ නොකියයිද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

8. "මහණෙනි, නැවතද මහණතෙම මායා දන්නේ වේද මායා සංසිඳවීමෙහි ගුණ නොකියාද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

9. "මහණෙනි, නැවතද මහණතෙම ධර්මයන් නොඅසන සුළුවේද බණ ඇසීමෙහි ගුණ නොකියයිද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

10. "මහණෙනි, නැවතද මහණතෙම එලසමවතෙහි නොඇලුනේ වේද එලසමවතෙහි ඇලීමේ ගුණ නොකියයිද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

11. "මහණෙනි, නැවතද මහණතෙම සබ්‍රම්සරුන් හා පිළිසඳර කථා, නොකරන්නේ වේද පිළිසඳර කථා කරන්නාට ගුණ නොකියයිද, මහණෙනි, යම් හෙයකින් මහණතෙම සබ්‍රම්සරුන් හා පිළිසඳර කථා නොකරන්නේවේද (පිළිසඳර කථා කරන්නාට ගුණ නොකියයිද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

12. "මහණෙනි, මෙබඳු භික්ෂුවට හුදෙක් මට සබ්‍රම්සරහු සත්කාර කරන්නාහු නම් ගරු කරන්නාහු නම් සලකන්නාහු නම් පුදන්නාහු නම් යෙහෙකැයි මෙසේ කැමැත්තක් ඇතිවන්නේය. වැලිදු ඔහුට සබ්‍රම්සරහු සත්කාර නොකරත්. ගරුනොකරත්, නොසළකත්, නොපුදත් ඊට හෙතුව කවරේද? මහණෙනි එසේමැයි ඥාණවන්ත සබ්‍රම්සරහු ඔහුගේ ප්‍රහීන නොවූ ලාමක අකුශල ධර්මයන් දනිත්.

13. "මහණෙනි, යම්සේ පහත් අශ්වයාට ඒකාන්තයෙන් ම මනුෂ්‍යයෝ ආජානෙය අශ්වයාගේ ස්ථානයෙහි තබන්නාහු නම් ආජානෙය, භොජනයද කවන්නාහු නම් ආජානෙය පිරිමැදීමෙන් පිරිමදින්නාහු නම් යෙහෙකැයි මෙසේ කැමැත්තක් වන්නේය. නැවත මනුෂ්‍යයෝ ඔහු ආජානෙය ස්ථානයෙහි නොතබත්. ආජානෙය අශ්වයාගේ කෑම නොකවත්. ආජානෙය අශ්වයාගේ පිරිමැදීමෙන් නොපිරිමදිත්. ඊට හේතු කවරේද, මහණෙනි

එසේමය ඤාණවන්ත මනුෂ්‍යයෝ ඔහුගේ කුළුගති කපටිකම් ඇදකම් වක්ගති දනිත්.

**14.** (මේ ඡේදය මේ සූත්‍රයේ 12 ඡේද මෙනි)

**15.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නඩු නොවිසඳන්නේ වේද, නඩු සමාදානයෙහි ගුණ කියයිද, මහණෙනි මහණතෙම යම්හෙයකින් නඩු නොවිසඳන්නේ වේද නඩු සංසිඳීමෙහි ගුණ කියයිද (ii) මේ ධර්මය ප්‍රිය බව පිණිස, ගරුත්වය පිණිස, දියුණුව පිණිස සමාන බව පිණිස සමගිය පිණිසවේ. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

**16.** "මහණෙනි නැවතද (ii) මහණතෙම ශික්ෂාපද ගරු කරන්නේ වේද ශික්ෂාපද සමාදන්වීමෙහි ගුණ කියයිද, (iii) යම් හෙයකින් (මෙහි 16 (ii) ද 15 (ii) ද යෙදිය යුතුයි.)

**17.** "මහණෙනි, නැවතද (ii) මහණතෙම තෘෂ්ණා නැත්තේවේද, තෘෂ්ණාව තුනී කිරීමෙහි ගුණ කියයිද (iii) යම් හෙයකින් (මෙහි 17 (ii) ද 15 (ii) යෙදිය යුතුයි.)

**18.** "මහණෙනි, නැවතද (ii) මහණතෙම ක්‍රොධ නොකරණ ස්වභාව ඇත්තේද ක්‍රොධය සංසිඳීමෙහි ගුණ කියයිද (iii) යම් හෙයකින් (මෙහි 18 (ii) ද 15 (ii) යෙදිය යුතුයි.)

**19.** "මහණෙනි, නැවතද (ii) මහණතෙම ගුණමකු නොවේද ගුණමකුකම සංසිඳවීමෙහි ගුණ කියයිද (iii) යම් හෙයකින් (මෙහි 19 (ii) ද 15 (ii) ද යෙදිය යුතුයි.

**20.** "මහණෙනි, නැවතද (ii) මහණතෙම කෛරාටික නොවේද, කෛරාටිකකම සංසිඳවීමෙහි ගුණ කියයිද යම් හෙයකින් (මෙහි 20 (ii) ද 15 (ii) යෙදිය යුතුයි.)

**21.** "මහණෙනි, නැවතද (ii) මහණතෙම මායා නැත්තේද මායාව සංසිඳවීමෙහි ගුණ කියයිද යම් හෙයකින් මෙහි 21 (ii) ද 15 (ii) ද යෙදිය යුතුයි.)

**22.** "මහණෙනි, නැවතද (ii) මහණතෙම ධර්මය අසන ස්වභාව ඇත්තේ වේද, බණ ඇසීමෙහි ගුණ කියයිද (iii) යම් හෙයකින් (මෙහි 22 (ii) ද 15 (ii) ද යෙදිය යුතුයි.)

**23.** "මහණෙනි, නැවතද (ii) මහණතෙම විවේකයට ගියේ වේද විවේකයෙහි ගුණ කියයිද (iii) යම්හෙයකින් (මෙහි 23 (ii) ද 15 (ii) ද යෙදිය යුතුයි.)

**24.** "මහණෙනි, නැවතද මහණතෙම සබ්‍රම්සරුන් සමග පිළිසඳර කථා කරන්නෙක් වේද පිළිසඳ කථා කරන්නාගේ ගුණ කියයිද (iii) යම් හෙයකින් (මෙහි 24 (ii) ද 15 (ii) යෙදිය යුතුයි.)

**25.** (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදයෙහි 'උපදින්නේය' යන්නට 'නූපදින්නේය' කියාද 'ප්‍රහීන නොවූ' යන්නට 'ප්‍රහීනවූ' කියාද වෙනස් කර යොදාගත යුතුයි.)

**26.** "(මෙහි මේ සූත්‍රයේ 13 ඡේදයේ 'පහත් අශ්වයා යන්නට' 'උසස් ආජානෙය අශ්වයා' කියාද 'නොතබත්' යන්නට 'තබත්' කියාද 'ප්‍රහීන නොවූ' යන්නට 'ප්‍රහීනවූ' කියාද, 'උපදින්නේය' යන්නට 'නූපදින්නේය' කියාද 'නොකරත්' යන්නට 'කරත්' වෙනස් කර යොදාගත යුතුය.

**38. දසව්‍යසන සූත්‍රය**:- 1. "මහණෙනි, යම් ඒ භික්ෂුවක් ආර්යයන්ට දොස් කියන්නේ සබ්‍රම්සරුන්ට ආක්‍රොශ කරන්නේ වේද, බණින සුළු වේද, යම්හෙයකින් හෙතෙම විපත්ති දහය අතුරෙන් එක්තරා විපත්තියකට නොයන්නේය යන මේ කාරණය සිදු නොවේ. කවර දසයකටද යත්. ලැබූ ගුණධර්මයක් නො ලබයි. ලබන ලද්දාහු පිරිහෙත්. සද්ධර්මයාගේ හෝ සද්ධර්මය තුළ පිරිසිදු බව නැතැයි අධිමානය ඇත්තේවේ. නො ඇලුනේ බ්‍රහ්මචර්යයෙහි හැසිරෙන්නේ හෝ එක්තරා කිලිටි ඇවතකට පැමිණෙන්නේ හෝ වේ. දැඩි ලෙඩක් රොගයක් වැළඳෙයි. සිත් අවුලට හෝ උමතුවට හෝ පැමිණෙයි. මුළාවී කළුරිය කරයි. කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ දුර්ගතිවූ නපුරුකොට ඇද වැටෙන නරකයෙහි උපදී. මහණෙනි, යම් ඒ භික්ෂුවක් ආර්යයන්ට දොස් කියන්නේ සබ්‍රම්සරුන්ට ආක්‍රොශ කරන්නේ බණින්නේ වේද, හෙතෙමේ යම් හෙයකින් මේ දස විපත් අතුරෙන් එක්තරා විපතකට නොපැමිණෙන්නේය යන මේ කාරණය සිදු නොවීමට ඉඩක් නැත."

**39. කොකාලික සූත්‍රය:-** 1. ඉක්බිති කොකාලික මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි කොකාලික මහණතෙම භාග්‍යවතුන් වහන්සේට (ii) 'ස්වාමීනි, සැරියුත් මුගලන් දෙදෙන පවිටු අදහස් ඇත්තෝය. පවිටු අදහස්වලට වසඟ වූවාහුය.

2. "කොකාලිකය, එසේ නැත. කොකාලිකය, එසේ නැත. සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත පහදව. සැරියුත් මුගලන් දෙනම සිල්වත්යයි" වදාළසේක.

3. "දෙවනුවත් (ii) කොකාලික මහණතෙම භාග්‍යවතුන් වහන්සේට (ii) මෙසේ කීය.

"ස්වාමීනි; කිමෙක්ද භාග්‍යවතුන් වහන්සේ මා අදහන්නේය. විශ්වාස කරන්නේය (මෙහි 1 (ii) සහ 2 යෙදිය යුතුයි.)

4. "තුන්වෙනුවත් මෙසේ කීය.

5. ඉක්බිති කොකාලික මහණතෙම ආසනයෙන් නැගිට බුදුන් වැඳ පැදකුණුකොට ගියේය. ගිය නොබෝ වේලාවකින් කොකාලික මහණහුගේ අබ ඇට පමණ පිළිකාවලින් මුළු සිරුර වැසුණේවේ. අබ ඇට පමණ වී මුං ඇට පමණවිය. මුං ඇට පමණ වී කොල්ලු ඇට පමණ විය. කොල්ලු ඇට පමණ වී ඩෙබර ඇට පමණවිය. ඩෙබරඇට පමණ වී ඩෙබර ගෙඩි පමණවිය. ඩෙබර ගෙඩි පමණ වී නෙල්ලි පමණ විය. නෙල්ලි පමණ වී, බෙලි ගැට පමණ විය. බෙලිගැට පමණ වී බෙලි පමණවිය. බෙලි පමණ වී බිඳුණේය සැරවද, ලෙයද වැගුරුණේය. විෂගිලින ලද මසෙකු මෙන් මේ තෙමේ කෙසෙල් කොළවල සයනය කරයි.

6. "ඉක්බිති තුදු නම් ශුද්ධාවාස බ්‍රහ්මතෙමේ කොකාලික මහණ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ අහසෙහි සිට කොකාලික මහණහට "කොකාලිකය, සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත පහදින්න. සැරියුත් මුගලන් දෙනම සිල්වත් යයි" කීයේය. - "ඇවැත්නි, ඔබ කවරෙක්දැ?" "මම තුදු නම් ශුද්ධාවාස බ්‍රහ්මයෙක්මි." "ඇවැත්නි, ඔබ අනාගාමී යයි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දේ නොවේද?

"මෙහි පැමිණ කොහි හැසිරෙහිද?"

"තොපගේ මේ අපරාධය පළමුකොට බලව. ඉක්බිති කොකාලික මහණහට තුදු නම් ශුද්ධාවාස බ්‍රහ්මතෙම මේ ගාථාවන් කීයේය.

1. "නපුරු වචන කියන්නාවූ බාලතෙම තමන් යමකින් සිඳීද උපන් මනුෂ්‍යයාගේ කටේ එබඳු කෙටේරියක් ඇත.

2. "යමෙක් නින්දා කළයුත්තෙකුට ප්‍රශංසා කෙරේද? යමෙක් ප්‍රශංසාර්හද ඔහුට හෝ නින්දාකරයිද හෙතෙම මුවින් පාපයක් රැස්කරයි. ඒ පාපයෙන් සැපක් නොවිඳී.

3-4. "දූ කෙළියෙන් යම් ධන පිරිහීමක් ඇද්ද, මේ වරද ස්වල්පමාත්‍රය. යමෙක් බුදුරජාණන් වහන්සේ කෙරෙහි සිත දූෂ්‍ය කරන්නේද තමා සමග සියල්ලන්ට මෙය මහත් පාපයකි. ලාමක සිතද වචනයද පිහිටුවා ආර්යයන්ට ගරහා අබ්බුද ලක්ෂ ගණන්ද, නිරබ්බුද තිසක්ද පසක්ද නරකයට යයි.

8. ඉක්බිති කොකාලික මහණතෙම ඒ අසනීපයෙන්ම කළුරිය කෙළේය. කළුරිය කළ කොකාලික මහණතෙම සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත වෛර බැඳ පදුම නරකයෙහි ඉපදුනේය.

9. ඉක්බිති සහම්පතී බ්‍රහ්මතෙම රාත්‍රිය පැමිණි කල්හි මනහර ප්‍රභා ඇතිව මුළු ජේතවනාරාමය ආලෝකකොට භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි යහම්පතී බ්‍රහ්මතෙම, භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, කොකාලික මහණතෙම කළුරිය කෙළේය. ස්වාමීනි, කළුරිය කළ කොකාලික මහණතෙම සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත වෛරබැඳ පදුම නිරයෙහි උපන්නේයයි" කීයේය. සහම්පති බ්‍රහ්මතෙම මෙය කීයේය. මෙය කියා භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහිම අතුරුදහන් වූයේය.

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රියගේ ඇවෑමෙන් භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, සහම්පතී බ්‍රහ්මතෙම රාත්‍රිය

පැමිණිකල්හි මනහර වර්ණයෙන් යුක්තව මුළු ජේතවනය ආලොකකර මම යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ මා වැඳ එකත්පසෙක සිටියේය. මහණෙනි, එකත්පසෙක සිටි සහම්පතී බ්‍රහ්මතෙම "ස්වාමීනි, කොකාලික මහණතෙම කළුරිය කළේය. ස්වාමීනි කළුරිය කළ කොකාලික මහණතෙම සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත වෛර බැඳ පදුම නම් නරකයෙහි උපන්නේයයි කීයේය. මහණෙනි, සහම්පතී බ්‍රහ්මතෙම මෙය කීයේය. මෙය කියා මා වැඳ පැදකුණුකොට ගියේයයි" වදාළසේක.

11. "මෙසේ වදළකල්හි එක්තරා මහණෙක් තෙම භාග්‍යවතුන් වහන්සේට, "ස්වාමීනි, පදුම නරකයෙහි ආයුෂ ප්‍රමාණය කොපමණ දිගදැයි" ඇසීය. 'මහණ, පදුම නරකයෙහි ආයුෂ ප්‍රමාණය මෙතෙක් වර්ෂ යයි කියා හෝ මෙතෙක් වර්ෂ සියයකැයි කියා හෝ මෙතෙක් වර්ෂ දහසකැයි කියා හෝ මෙතෙක් වර්ෂ ලක්ෂයකැයි කියා හෝ ගණන් කරන්නට පහසු නොවේ." - "ස්වාමීනි, උපමාවක් කරන්නට හැක්කේ දැයි' ඇසීය. "මහණ, හැකියයි" භාග්‍යවතුන්වහන්සේ වදාළසේක.

12. "මහණ විසි කිරියක් ඇති (කිරිය කුරුණි 16) කොසොල් රට තල ගැලක් පුරුෂයෙක්තෙම ඉන් වර්ෂ සියයකට, වර්ෂ සියයකට වරක් එක එක තල ඇටක් ගන්නේය. මහණ ඒ විසි කිරියක් ඇති ඒ කොසොල් රට තල ගැල මේ උපක්‍රමයෙන් ගෙවීමට ඉතිරි නොවීමට යන්නේ යම්සේද, එක් අබ්බුද නරකයක් (ආයුෂ) ගෙවීමට නොයයි, මහණ යම්සේ අබ්බුද නරක විස්සක් එක් නිරබ්බුද නරකයක් වේද, මහණ යම්සේ නිරබ්බුද නරක විස්සක් එක් අබබ නරකයක්වේද, මහණ යම් අබබ නරක විස්සක් එක් අහහ නිරයක්වේද, මහණ යම්සේ අහහ නිරය විස්සක් එක් අටට නිරයක් වේද, මහණ, යම්සේ අටට නරක විස්සක් එක් කුමුද නරකයක්වේද, මහණ යම්සේ කුමුද නරක විස්සක් එක් සොගන්ධික නරකයක්වේද, මහණ යම්සේ සොගන්ධික නරක විස්සක් එක් උත්පලක නරකයෙක්වේද, මහණ යම්සේ උත්පලක නරක විස්සක් මෙසේ එක් පුණ්ඩරීක නරකයක්වේද, මහණෙනි විසි පුණ්ඩරීක

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නරකයක් එක් පදුම නිරයකි. මහණ, කොකාලික මහණතෙම සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත වෛර බැඳ පදුම නම් නරකයෙහි උපන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. මෙය වදාරා නැවතද අනිකක් වදාළසේක."

40. "දසඛීණාසව බල සූත්‍රයඃ- 1. "ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ, "යම් බලයකින් යුක්තවූ ක්ෂීණාශ්‍රව භික්ෂුව 'මාගේ පව් ගෙවුණේ යයි පව් ගෙවුණු බව දන්වයිද, ශාරීපුත්‍රය පව් ගෙවුණු (-රහත්) භික්ෂුවගේ බල කෙතෙක් දැයි" ඇසූසේක.

2. "ස්වාමීනි, යම් බලයකින් යුක්ත ක්ෂීණාශ්‍රවතෙම මාගේ පව් ගෙවුණහයි' පව් ගෙවුණු බව දන්වයිද, ස්වාමීනි, ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බල දශයක් වෙත්. කවර දශයක්ද යත්?

3. "ස්වාමීනි, මේ ශාසනයෙහි පහවූ කෙලෙස් ඇති භික්ෂුව, විසින් සියලු සංස්කාරයෝ මනා නුවණින් අනිත්‍ය වශයෙන් තත්වූ පරිද්දෙන් දක්නා ලද්දාහුවෙත්, මහණෙනි, යම් හෙයකින් පහවූ කෙලෙස් ඇති භික්ෂුව සියලු සංස්කාරයන් අනිත්‍ය වශයෙන් මනා නුවණින් දක්නා ලද්දාහු වෙත්ද. කෙලෙස් ගෙවීම කළ භික්ෂුව යම් බලයකට පැමිණ මාගේ කෙලෙසුන් ගෙවුණහයි කෙලෙස් නැතිකිරීම ප්‍රතිඥා කරයිද, ස්වාමීනි, මෙයද ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බලයක් වෙයි.

4. "ස්වාමිනි, නැවතද ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් අඟුරු වලකට උපමා ඇති කාම වස්තු තත්වූ පරිද්දෙන් මනා නුවණින් දක්නා ලද්දාහුවෙත්ද, මහණෙනි, යම් හෙයකින් පහවූ කෙලෙස් ඇති භික්ෂුව අඟුරු වලකට උපමා ඇති කාමයන් තත්වූ පරිද්දෙන් මනා නුවණින් දක්නා ලද්දාහු වෙත්. යම් බලයකට පැමිණ පහවූ කෙලෙස් ඇති භික්ෂුව මාගේ ආශ්‍රවයෝ ගෙවුණහයි පව් ගෙවුණු බව ප්‍රතිඥා කරයිද මෙය කෙලෙස් ගෙවීම ඇති භික්ෂුවගේ බලයක් වේ.

5. "ස්වාමීනි, නැවතද කෙලෙස් ගෙවූ භික්ෂුවගේ සිත හැම අතින් පව් වලට කරුණුවූ ධර්මයන්ගෙන් විශෙෂයෙන් කෙළවරට ගියේද, විවේකය කරා නැමුණේද, විවේකය කරා අතිශයින් නැමුණේද, විවේකය කරා බරවූයේද, විවේකයෙහි සිටියේය. කෙලෙසුන්ගෙන් නික්මීමෙහි ඇලුනේද, ස්වාමීනි, යම් හෙයකින් කෙලෙස් පහකළ භික්ෂුවගේ සිත හැම අතින් කෙලෙසුන්ට හෙතු කරුණු වලින් විශෙෂයෙන් කෙළවරට ගියේද, විවේකය කරා නැමුණේද, විවේකය කරා අතිශයින් නැමුණේද, විවේකය කරා බරවූයේද, විවේකයෙහි සිටියේද, කෙලෙසුන්ගෙන් නික්මීමෙහි ඇලුනේද, ස්වාමීනි, යම් බලයකට පැමිණ පහකළ කෙලෙස් ඇති භික්ෂුව මාගේ කෙලෙස් පහවූහයි කෙලෙස් පහවුණු බව කියාද මෙයද පහකළ කෙලෙස් ඇති භික්ෂුවගේ බලයක් වෙයි.

6. "ස්වාමීනි, නැවතද පහකළ කෙළෙස් ඇති භික්ෂුව විසින් සතර සතිපට්ඨානයෝ වඩන ලද්දාහු වෙත්. මොනවට වඩන ලද්දාහුවෙත්. (ii) ස්වාමීනි, යම්හෙයකින් පහකළ කෙලෙස් ඇති භික්ෂුව විසින් සතර සතිපට්ඨානයෝ වඩන ලද්දාහු විශෙෂයෙන් වඩන ලද්දාහු වෙත්, ස්වාමීනි, පහකළ කෙලෙස් ඇති භික්ෂුව 'මාගේ පව් පහ වූයේයයි කෙලෙසුන්ගේ විනාශය දන්වයිද, ස්වාමීනි, මෙයද ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බලයකි.

7. "ස්වාමීනි, නැවතද පහකළ කෙලෙස් ඇති භික්ෂුව විසින් සතර සම්‍යක් ප්‍රධානයෝ (නිවැරැදි වෑයම් කිරීම) පුරුදු කරණ ලද්දාහු අතිශයින් පුරුදු කරණ ලද්දාහු වෙත්. (මෙහි 6 (ii) ඡෙදය යෙදිය යුතුයි.) සතර ඍද්ධි පාද, පඤ්ච ඉන්ද්‍රිය, පඤ්ච බල, සප්තබොජ්ක්ධංග, ආර්ය අෂ්ටාංගික මාර්ගය පුරුදු කරණ ලද්දාහු විශෙෂයෙන් වඩන ලද්දාහු වෙත්. ස්වාමීනි, යම්හෙයකින් පහකළ කෙලෙස් ඇති භික්ෂුව ආර්ය අෂ්ටාංගික මාර්ගය පුරුදු කරණ ලද්දේ විශෙෂයෙන් වඩන ලද්දේවේද, ස්වාමීනි, යම් බලයකට පැමිණ කෙලෙස් පහකළ භික්ෂුව මාගේ පව් ගෙවුණහයි පව් ගෙවුණු බව කියයිද, මහණෙනි, මෙයද ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බලයකි. ස්වාමීනි, යම් බලයකින් යුක්ත

රහත් භික්ෂුව මාගේ පව ගෙවුණහයි පව් ගෙවීම කියයිද, ස්වාමීනි, මේ දහය ක්ෂීණාශ්‍රව භික්ෂුහුගේ බල දශයයි"

(9. ථෙර වර්ගය නිමි.)

---

## 10. උපාසක වර්ගය.

41. **දස කාමභොගී සූත්‍රය:**- 1. "එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනේපිඬු මහ සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. ඉක්බිති අනේපිඬු සිටුතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක් හිද, එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි අනේපිඬු සිටුහට භාග්‍යවතුන් වහන්සේ, "ගෘහපතිය, මේ කාමභොගීන් දස දෙනෙක් ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්යයි" වදාළසේක.

2. "ගෘහපතිය, මේ ලොකයෙහි ඇතැම් කාමභොගියෙක් අධර්මයෙන් දරුණු කමින් වස්තුව සොයයි. අධර්මයෙන් සැහැසි කමින් වස්තුව සොයා තමන් (ii) සුවපත් නොකෙරෙයි. නොපිනවයි. කොටස් නොකරයි. පින් නොකරයි. (iii) (මෙහි 2 (i) යෙදිය යුතුයි.) සුවපත් කෙරෙයි. පිනවයි. කොටස් නොකරයි පින් නොකරයි. (මෙහි 2 (i) යෙදිය යුතුයි.) සුවපත් කෙරෙයි. පිනවයි. කොටස් කරයි. පින් කරයි.

3. (i) "ගෘහපතිය, මේ ලොකයෙහි ඒ මේ කාමභොගිතෙම (ii) ධර්මයෙන් හා අධර්මයෙන්ද සැහැසි කමින්ද සාමයෙන්ද වස්තුව සොයයි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) (iii) සොයා තමන් සුවපත් නොකරයි. නොපිනවයි, කොටස් නොකරයි පින් කරයි. (මෙහි 3 (i) (ii) යෙදිය යුතුයි.) තමන් සුවපත් කරයි. පිනවයි. කොටස් නොකරයි. පින් නොකරයි. (මෙහි 3 (i) (ii) යෙදිය යුතුයි.) ඇතැම් කෙනෙක් තමන් සුවපත් කරයි. පිනවයි. කොටස් කරයි, පින් කරයි.

4. "ගෘහපතිය, මේ ලොකයෙහි ඇතැම් කාම භොගියෙක් (ii) ධර්මයෙන් නොසැහැසිකමින් වස්තුව සොයයි. සොයා

තමන් (iii) සුවපත් නොකරයි. නොපිනවයි කොටස් නොකරයි. පින් නොකරයි. (මෙහි 4 (i) (ii) යෙදිය යුතුයි.) තමා සුවපත් කරයි. පිනවයි. කොටස් නොකරයි. පින් නොකරයි.

5. (මෙහි 4 (i) (ii) යෙදිය යුතුයි.) (i) තමා සුවපත් කරයි. පිනවයි. කොටස් කරයි. පින් කරයි. (ii) ඉතා ඇලුනේ මුසපත් වූයේ බැසගත්තේ දොස් නොදක්නේ හික්මීමෙහි නුවණක් නැතිව ඒ වස්තූන් පරිභොග කරයි. (මෙහි 4 (i) (ii) (iii) යෙදිය යුතුයි.) (iii) නොඇලුනේ මුසපත් නොවූයේ බැස නොගත්තේ දොස් දක්නේ නික්මීමෙහි නුවණ ඇතිව ඒ වස්තූන් පරිභොග කරයි.

6. "ගෘහපතිය, එහි ඒ මේ කාමභොගීතෙම අධර්මයෙන්ද සැහැසිකමින්ද වස්තුව සොයයි. අධර්මයෙන්ද සැහැසිකමින්ද වස්තුව සොයා (ii) තමා සුවපත් නොකරයි. නොපිනවයි. බෙදා නොදෙයි. පින් නොකරයි. ගෘහපතිය, මේ කාමභොගීතෙමේ (iii) කරුණු තුනකින් ගැරහිය යුතුය. අධර්මයෙන් සැහැසිකමින් වස්තුව සොයයයි මේ පළමුවැනි කරුණින් ගැරහිය යුතුවෙයි. (iv) තමා සුවපත් නොකරයි, නොපිනවයි, යන මේ දෙවෙනි කරුණින්ද ගැරහිය යුතුවෙයි. (v) බෙදා නොදෙයි. පින්නොකරෙයි යන මේ තුන්වෙනි කරුණින්ද ගැරහිය යුතුවේ. මේ කාමභොගීතෙමේ වනාහි මේ කරුණු තුනින් ගැරහිය යුතුය. (මෙහි 5 (i) යෙදිය යුතුයි.) තමා සුවපත් කරයි පිනවයි, බෙදානොදෙයි පින් නොකරයි. මේ කාමභොගීතෙම කරුණු දෙකකින් ගැරහිය යුතුයි. එක් කරුණකින් පැසසිය යුතුයි. අධර්මයෙන් සැහැසි කමින් වස්තුව සොයායයි යන මේ පළමුවෙනි කරුණින් ගැරහිය යුතුය. තමා සුවපත් කරයි. පිනවයි යන මේ එක් කරුණින් පැසසිය යුතුයි. බෙදා නොදෙයි. පින් නොකරයි යන මේ දෙවෙනි කරුණින් ගැරහිය යුතුය. මේ එක කරුණින් පැසසිය යුතුය.

7. (මෙහි 4 (i) (ii) යෙදිය යුතුයි.) තමා සුවපත් කරයි. පිනවයි. බෙදාදෙයි. පින් කරයි. (ii) ගෘහපතිය, මේ කාම භොගීතෙම එක් කරුණකින් ගැරහිය යුතුය. කරුණු දෙකකින්

පැසසිය යුතුය. අධර්මයෙන්ද, සැහැසිකමින්ද වස්තුව සොයයි. යන එක් කරුණින් ගැරහිය යුතුයි. තමා සුවපත් කරයි. පිනවයි බෙදාදෙයි. පින්කරයි. ගෘහපතිය, මේ කාමභොගීතෙම එක් කරුණකින් ගැරහිය යුතුය. දෙ කරුණින් පැසසිය යුතුය අධර්මයෙන්ද සැහැසිකමින්ද වස්තුව සොයයි, යන මේ එකකරුණකින් ගැරහිය යුතුය. තමා සුවපත් කරයි. පිනවයි යන මේ පළමු කරුණින් පැසසිය යුතුය. බෙදා දෙයි පින්කරයි යන මේ දෙ කරුණින් පැසසිය යුතුය. ගෘහපතිය මේ කාමභොගීතෙම මේ එක් කරුණින් ගැරහිය යුතුය. මේ දෙකරුණින් පැසසියයුතුය.

8. (i) "ගෘහපතිය, එහි ඒ මේ කාමභොගීතෙම ධර්මයෙන් හා අධර්මයෙන්ද, සැහැසිකමින් හා නොසැහැසිකමින්ද වස්තුව සොයයි. (ii) තමා සුවපත් නොකරයි, නොපිනවයි. බෙදා නොදෙයි. පින් නොකෙරෙයි. ගෘහපතිය, මේ කාමභොගීතෙම එක් කරුණකින් පැසසිය යුතුය. තුන් කරුණකින් ගැරහිය යුතුය.

9. (මෙහි 7 (i) යෙදිය යුතුයි.) සොයා තමා සුවපත් කෙරෙයි, පිනවයි. බෙදා නොදෙයි. පින්නොකරයි. ගෘහපතිය මේ කාමභොගීතෙම දෙ කරුණින් පැසසිය යුතුය. දෙකරුණින් ගැරහිය යුතුය. ධර්මයෙන් හා නො සැහැසිකමින් වස්තුව සොයයි නම් මේ පළමු කරුණින් පැසසිය යුතුය. අධර්මයෙන් හා සැහැසිකමින් වස්තුව සොයයි යන මේ පළමු කරුණින් ගැරහිය යුතුය. තමා සැපවත් කරයි, පිනවයි යන මේ දෙවන කරුණින් පැසසිය යුතුය. බෙදා නොදෙයි. පින් නොකරයි යන මේ දෙවන කරුණින් ගැරහිය යුතුය. ගෘහපතිය, මේ කාමභොගීතෙම මේ දෙ කරුණින් පැසසිය යුතුය. මේ දෙ කරුණින් ගැරහිය යුතුය.

10. (මෙහි 7 (i) යෙදිය යුතුයි.) සොයා තමා සුවපත් කරයි. පිනවයි, බෙදාදෙයි පින්කරයි. ගෘහපතිය, මේ කාමභොගීතෙම තුන් කරුණින් පැසසිය යුතුය, එක් කරුණින් ගැරහිය යුතුය. ධර්මයෙන්ද නො සැහැසිකමින්ද වස්තුව සොයයි යන මේ පළමු කරුණින් පැසසිය යුතුයි. අධර්මයෙන්ද සැහැසිකමින්ද

වස්තුව රැස්කරයි. මේ එක්කරුණින් ගැරහිය යුතුය. තමා සැපවත් කරයි. පිනවයි යන මේ දෙවන කරුණින් පැසසිය යුතුයි. බෙදා දෙයි, පින් කරයි යන මේ තුන්වන කරුණින් පැසසිය යුතුය. ගෘහපතිය, මේ කාම භොගීතෙම මේ තුන් කරුණින් පැසසිය යුතුය, මේ එක් කරුණින් ගැරහිය යුතුය.

11. "ගෘහපතිය, එහි ඒ මේ කාමභොගීතෙම ධර්මයෙන්ද නො සැහැසිකමින්ද වස්තුව සොයයි. සොයා තමා සුවපත් නොකරයි. නො පිනවයි. බෙදා නොදෙයි පින් නො කරයි. ගෘහපතිය, මේ කාමභොගීතෙම එක්කරුණින් පැසසිය යුතුය. දෙ කරුණින් ගැරහිය යුතුය. ධර්මයෙන් නො සැහැසිකමින් වස්තුව සොයයි යන මේ එක් කරුණින් ගැරහිය යුතුය. ධර්මයෙන්ද නො සැහැසිකමින්ද වස්තුව සොයයි යන මේ එක් කරුණින්ද පැසසිය යුතුය. තමා සුවපත් නො කෙරෙයි. පිනවයි යන මේ පළමු කරුණින් ගැරහිය යුතුය. බෙදා නොදෙයි. පින් නොකරයි යන මේ දෙවන කරුණින් ගැරහිය යුතුය. ගෘහපතිය, මේ කාමභොගීතෙම මේ එක් කරුණින් පැසසිය යුතුය. මේ දෙකරුණින් ගැරහිය යුතුය.

12. "ගෘහපතිය, එහි, ඒ මේ කාමභොගීතෙම (4 (ii), 5 (i) යෙදිය යුතුයි.) ගෘහපතිය, මේ කාමභොගීතෙම තුන් කරුණින් පැසසිය යුතුය, එක් කරුණින් ගැරහිය යුතුය. ධර්මයෙන් හා නො සැහැසිකමින් වස්තුව සොයයි යන මේ පළමු කරුණින් පැසසිය යුතුය. තමා සුවපත්කරයි. පිනවයි යන මේ දෙවන කරුණින් පැසසිය යුතුය. බෙදා දෙයි පින් කරයි යන මේ තුන්වන කරුණින් පැසසිය යුතුය. 5 (ii) කොටස යොදනු) යන මේ එක් කරුණින් ගැරහිය යුතුය. ගෘහපතිය, මේ කාමභොගීතෙම මේ තුන් කරුණින් පැසසිය යුතුය. මේ එක් කරුණින් ගැරහිය යුතුය.

13. "ගෘහපතිය, එහි ඒ මේ කාමභොගීතෙම ධර්මයෙන් නො සැහැසිකමින් වස්තුව සොයයි, සොයා තමා සුවපත් කරයි, පිනවයි, බෙදා දෙයි පින්කරයි. (5 (ii) යෙදිය යුතුයි. ගෘහපතිය, මේ කාමභොගීතෙම කරුණු සතරින් පැසසිය යුතුය.

ධර්මයෙන්ද, නො සැහැසි කමින්ද, වස්තුව සොයයි. මේ පළමු කරුණින් පැසසිය යුතුය. තමා සුවපත් කරයි, පිනවයි යන මේ දෙවන කරුණින් පැසසිය යුතුය. බෙදා දෙයි, පින් කරයි යන මේ තුන්වන කරුණින් පැසසිය යුතුය. (5 (ii) යෙදිය යුතුය.) යන මේ සතරවන කරුණින් පැසසිය යුතුය.

"ගෘහපතිය, මේ කාමභොගීතෙම මේ සතර කරුණින් පැසසිය යුතුය. ගෘහපතිය, ලොකයෙහි පවත්නා වූ පෙනෙන්නාවූ දසකාම භොගීහුය.

14. "ගෘහපතිය, මේ දසකාමභොගී පුද්ගලයන් අතුරින් ඒ මේ කාමභෝගියෙක් නො සැහැසිකමින් දැහැමෙන් භොගයන් සොයයිද නො දරුණු කමින් දැහැමෙන් සෙමෙන් වස්තුව සොයා තමා සුවපත් කරයිද, පිනවයිද, බෙදා දෙයිද පින්කරයිද නොඇලුනේ මුසපත් නුවූයේ බැස නොගත්තේ දොස් දක්නේ නික්මීමේ නුවණක් නැතිව ඒ වස්තූන් පරිභොග කරයිද, මේ තෙමේ මේ දසවිධ පුද්ගලයන්ට වඩා අග්‍රද, ශ්‍රෙෂ්ඨද, ප්‍රමුඛද උතුම්ද, ප්‍රවරද වේ.

15. "ගෘහපතිය, යම්සේ දෙනගෙන් කිරිද, කිරෙන් දී ද දී වලින් වෙඬරුද, වෙඬරු වලින් ගිතෙල්ද, ගිතෙල් වලින් පිරිසිදු ගිතෙල්ද, අග්‍රයයි යේද, ගෘහපතිය, එසේම මේ කාමභොගී පුද්ගලයන් දස දෙනා අතුරින් යම් මේ කාමභොගී පුද්ගලයෙක් ධර්මයෙන් සැහැසිකමින් භොගයන් සොයයිද, ධර්මයෙන් නො සැහැසිකමින් වස්තුවසොයා තමන් සුවපත් කරයි. බෙදාදෙයි, පින්කරයි, නො ඇලුනේ මුසපත් නුවූයේ බැසනොගත්තේ, දොෂ දක්නේ, නික්මීමේ නුවණ ඇතිව ඒ වස්තූන් පරිභොග කරයි. මේතෙමේ මේ කාමභොගී පුද්ගලයන් දශදෙනා, අතුරින් අග්‍රද, ශ්‍රෙෂ්ඨද, ප්‍රමුඛද, උත්තමද, ප්‍රවරද වන්නේය."

42. **වුපසන්ත පඤ්ච භය සූත්‍රයඃ-** 1. ඉක්බිති අනේපිඬු ගෘහපතිතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත් පසෙක සිටි අනේපිඬු ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ "ගෘහපතිය, යම් තැනක සිට ආර්ය ශ්‍රාවකයාට භය

වෛර පස සන්සිඳුනාහු වෙත්ද සොතාපත්ති අංග සතරින් යුක්තවූයේ වේද, ආර්ය ධර්මය ප්‍රඥාවෙන් මනාව දක්නා ලද්දේ වේද, අවබොධ කරණ ලද්දේ වේද, ක්ෂය කළ නිරය ඇත්තේවෙමි. ක්ෂය කළ තිරිසන් අපාය ඇත්තේවෙමි. ප්‍රේත ලොකය ක්ෂය කෙළේවෙමි. ක්ෂය කළ අපාය සංඛ්‍යාත දුගතියෙහි වැටීම ඇත්තේවෙමි. වහා වැටෙන සමභාව නැති අපායෙහි නොවැටෙන ස්වභාව ඇති සුගති නියතවූ රහත් බව පරම පිහිට කොට ඇති සෝවාන් වූවෙක් වීමියි මතු ඵලයන් බලාපොරොත්තුවෙමින් තෙමේම තමා ගැන ප්‍රකාශ කරන්නේය. කවර පඤ්ච වෛරයක් බියක් සන්සිඳුනාහු වෙත්ද?

2. "ගෘහපතිය, සතුන් මරන්නා සතුන් මැරීමේ හෙතුවෙන් (ii) මෙලොවද බියක් වෛරයක් රැස්කරයි. පරලොවද බියක් වෛරයක් රැස් කරයි. සිතෙහිවූ දුකක් දොම්නසක් විඳියි. (iii) සතන් මැරීමෙන් වෙන්වූවහුට (iv) මේ ආත්මයෙහි බියක් වෛරයක් රැස් නොකරයි. පරලොව බියක් වෛරයක් රැස් නොකරයි සිතෙහිවූ දුකක් දොම්නසක් නොවිඳියි. (v) සතුන් මැරීමෙන් වෙන්වූවහුට මෙසේ ඒ බිය වෛර සන්සිඳුනේවේ.

3. "ගෘහපතිය, නුදුන් දේ ගන්නේ වේද නුදුන්දේ ගත් හේතුවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) නුදුන්දේ ගැන්මෙන් වෙන්වූවහුට (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) නුදුන්දේ ගැන්මෙන් වෙන්වූවහුට බිය වෛරය සන්සිඳුනේවේ.

4. "ගෘහපතිය, කාමයන්හි වරදවා හැසිරෙන්නේවේද, කාමයන්හි වරදවා හැසිරීම් හේතුවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවහුට (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවහුට මෙසේ ඒ බිය වෛර සන්සිඳුනේවේ.

5. "ගෘහපතිය, බොරුකියන්නේ වේද, බොරු කීමේ හේතුවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) බොරුකීමෙන් වෙන්වූවහුට (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) බොරුකීමෙන් වෙන්වූවහුට මෙසේ ඒ බිය වෛර සංසිඳුනේ වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

6. "ගෘහපතිය, මදයට හා ප්‍රමාදයට කරුණු වන රහමෙර බොන්නේ වේද, මදයට හා ප්‍රමාදයට හෙතු රහ මෙර පීමේ හෙතුවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මදයට හා ප්‍රමාදයට හෙතුවූ රහමෙර බීමෙන් වෙන්වූයේ (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) මදයට හා ප්‍රමාදයට හෙතුවන රහමෙර බීමෙන් වැලැක්කාහට මෙසේ ඒ භය වෛර පස සන්සිඳුනාහු වෙත්.

7. "කවර සෝවාන් අංග සතරකින් යුක්තවූයේ වේද? ගෘහපතිය මේ ශාසනයෙහි මහණතෙම ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙනුදු අර්හත්ය, සම්‍යක් සම්බුද්ධය, අෂ්ටවිද්‍යා පසළොස්චරණයෙන් යුක්තය, සුගතය, තුන්ලෝ දත් සේක. තමාහට වැඩිහිටියෙක් නැත. දමනය නොකොටහැකි පුද්ගලයන් හික්මවන සේක. දෙවි මිනිසුන්ට අනුශාසනා කරණ සේක චතුරාර්යසත්‍යය දත්සේක. භාග්‍ය ඇතිසේකැයි බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වේද (ii) භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දෙශනා කරණ ලදී. තමා විසින්ම දැක්ක යුතුයි. කල් නොයවා දෙන විපාක ඇත්තේය. ඇවිත් මේ බලව යන විධියට සුදුසුය, පැමිණීමට සුදුසුය, නුවණැත්තවුන් විසින් තම තමන් කෙරෙහි ලා දත යුතුයයි ධර්මයෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්තවේද (iii) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම මනාව පිළිපන්නේය. ඍජු මධ්‍යම ප්‍රතිපත්තියෙන්, යුක්තය නිවන් සඳහා පිළිපන්නේය නිවණට අනුකූලවූ පිළිවෙතට පිළිපන්නේය. යම් මේ සතර පුරිස් යුගලයක් ඇද්ද මේ අෂ්ට පුරුෂ පුද්ගල කෙනෙක් ඇද්ද බුදුන්ගේ මේ ශ්‍රාවක සංඝ තෙමේ දුරිනුදු ගෙනෙන ප්‍රත්‍යයට සුදුසුය. පඬුරු පිළිගන්ට සුදුසුය. පරලොව අදහා දෙන දන් පිළිගන්ට සුදුසුය. දොහොත් මුදුන්දී වැඳීමට සුදුසුය. ලෝකයාගේ උතුම් පින් හටගන්නා කෙතයයි සංඝයා කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වේද,

8. නොකඩවූ සිදුරුනොවූ කබර නොගැසුනු කිළිටි නොවූ නිදහස් නුවණැත්තන් විසින් ප්‍රශංසා කරණ ලද තෘෂ්ණාමාන දෘෂ්ටි වශයෙන් ස්පර්ශ නොවූ සිත එකඟ කිරීමට පවතින

ආර්යයන් විසින් උතුම්යයි සලකනලද ශීලයෙන් යුක්ත වූයේ වේද, යන මේ සෝවාන් අංග සතරින් යුක්ත වූයේ වේ.

**9.** ඔහුට කවර ආර්ය මාර්ග ප්‍රඥාවෙන් දක්නා ලද්දේ වේද, අවබොධවන ලද්දේ වේද ගෘහපතිය, මේ ලොකයෙහි ආර්ය ශ්‍රාවක තෙම මෙසේ මෙය ඇති කල්හි මෙයවේ. මොහුගේ ඉපදීමෙන් මෙයවේ මෙය නැති කල්හි මෙය නොවේය. මොහුගේ නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධවේ. යම් මේ අවිද්‍යාවගේ ප්‍රත්‍යයෙන් සංස්කාර කෙනෙක් වෙත්ද, සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණයක් වේද, විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූපයක් උපදී. නාම රූප පහළවීමෙන් ආයතන සය වෙත් ආයතන සය ප්‍රත්‍යවීමෙන් ස්පර්ශයවේ ස්පර්ශය ප්‍රත්‍යවීමෙන් වේදනා පහළ වේ. වේදනා පහළවීමෙන් තෘෂ්ණාව පහළවේ. තෘෂ්ණාව ප්‍රත්‍යයවීමෙන් දැඩිසේ ගැනීම වේ. දැඩිසේ ගැනීමෙන් භවයවේ. භවය ප්‍රත්‍යය වීමෙන් උත්පත්තියවේ. උත්පත්තිය ප්‍රත්‍යවීමෙන් ජරාව, මරණය, ශොකය වැලපීම කායික දුක දොම්නස බලවත් සිත් තැවුල පහළවෙත්ද මෙසේ මේ සියලු දුක්ගොඩ පහළවීමවේ.

**10.** "අවිද්‍යාවගේම ශෙෂ නොකොට නිරුද්ධ කිරීමෙන් සංස්කාරයන්ගේ නිරුද්ධියවේ. සංස්කාරයන්ගේ නිරුද්ධියෙන් විඤ්ඤාණයාගේ නිරුද්ධියවේ. විඤ්ඤාණයාගේ නිරුද්ධවීමෙන් නාම රූපයන්ගේ නිරුද්ධිය (නැතිවීම) වේ. නාමරූපයන්ගේ නිරුද්ධියෙන් ආයතන සය නිරුද්ධවේ. ආයතන සය නිරුද්ධවීමෙන් ස්පර්ශය නිරුද්ධවේ. ස්පර්ශය නිරුද්ධවීමෙන් වේදනාව නිරුද්ධවේ. වේදනාව නිරුද්ධවීමෙන් තෘෂ්ණාව නිරුද්ධවේ. තෘෂ්ණාව නිරුද්ධ වීමෙන් දැඩිසේ ගැන්ම නිරුද්ධවේ. දැඩිසේ ගැන්ම නිරුද්ධවීමෙන් භවය නිරුද්ධවේ. භවය නිරුද්ධවීමෙන් උත්පත්තිය නිරුද්ධවේ. උත්පත්තිය නිරුද්ධවීමෙන් ජරා, මරණ ශොක, වැළපීම, කායික දුක දොම්නස, බලවත් සිත් තැවුල නිරුද්ධවෙත්, මෙසේ මේ සියලු දුක්ගොඩ නිරුද්ධවේ. ඔහු මේ ආර්ය මාර්ග ප්‍රඥාව නුවණින් දැක්කේ වෙයි. මනා කොට අවබොධ කරණ ලද්දේ වෙයි මෙසේ සියලු දුක්ගොඩ නිරුද්ධවූයේවේ.

11. "ගෘහපතිය, යම් තැනෙක සිට ආර්ය ශ්‍රාවකයාට මේ පඤ්චභය වෛර පස සන්සිඳුනාහු වෙත්ද, මේ සෝවාන්හුගේ අංග සතරින් යුක්තවූයේ වේද, මොහු විසින් ආර්ය සත්‍යය, ප්‍රඥාවෙන් දක්නා ලද්දේ වේද, ප්‍රතිවෙධ කරණ ලද්දේවේද හෙතෙම ක්ෂය කළ නිරය ඇත්තේ වෙමි. ක්ෂය කළ තිරිසන් අපාය ඇත්තේවෙමි. ක්ෂය කළ ප්‍රෙත ලොකය ඇත්තේ වෙමි. ක්ෂය කළ වහා වැටෙන දුගති හා අපාය ඇත්තේ වෙමි. අපායෙහි නොවැටෙන සුගති නියතවූ අර්හත්වය කරා නැමුණු සෝවාන් පුද්ගලයෙක් වීමියි. තෙමේම තමා ගැන ප්‍රකාශ කරන්නේය."

43. **කිංදිට්ඨික සූත්‍රය**:- 1. (මේ ඡේදය මේ වර්ගයේ 4 සූත්‍රයේ 1 ඡේදය මෙනි.) ඉක්බිති අනේපිඬු ගෘහපති තෙම කල් ඇතිව භාග්‍යවතුන් වහන්සේ දක්නට නික්මුනේය. ඉක්බිති අනේපිඬු ගෘහපතියාට තවම භාග්‍යවතුන් වහන්සේ දක්නට නොකල්ය. භාග්‍යවතුන් වහන්සේ පල සමවතට සමවන් සේක. සිත වඩන භික්ෂූන් කරාද යාමට අකාලයය. සිත වඩන භික්ෂූහුද පලසමවත් වලට සමවැදුනාහ. අන්‍යතීර්ථක පරිබ්‍රාජිකයන්ගේ ආරාමය යම්තැනෙක්හිද එහි පැමිණෙන්නෙම් නම් යෙහෙකැයි සිතුයේය. ඉක්බිති අනේපිඬු ගෘහපති තෙම අන්‍ය තීර්ථය පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනෙක්හිද එහි පැමිණියේය.

2. එකල්හි වනාහි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ එක්ව රැස්ව උස්හඬ නගන්නාහු උස්හඬ ඇත්තාහු මහත් හඬ ඇත්තාහු නානාප්‍රකාර තිරිසන් කථාවන් කියමින් හුන්නාහු වෙත්. ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ එන්නාවූ අනාථ පිණ්ඩික ගෘහපතියා දුරදීම දැක්කාහුය. දැක ඔවුනොවුන් ඇඟවූවාහුය. 'පින්වත්නි ශබ්ද නොකරව්, පින්වත්නි ශබ්ද නොකරව් ශ්‍රාවකවූ මේ අනේපිඬු ගෘහපතිතෙම එයි. ශ්‍රමණ ගෞතමයන්ගේ යම් පමණ ගිහිවූ සුදු ඇඳුම් අඳන්නාවූ යම් ශ්‍රාවකයෝ සැවැත් නුවර වසත්ද, මේ අනාථ පිණ්ඩික ගෘහපතිතෙම ඔවුන්ගෙන් කෙනෙකි. ආයුෂ්මත්නි ඔව්හු නිශ්ශබ්ද භාවය කැමැත්තෝය. නිශ්ශබ්දව හික්මුනාහ, නිශ්ශබ්ද බවෙහි ගුණ කියන්නාහ, නිශ්ශබ්ද පිරිස

දැක එළඹෙන්ට සිතෙන්නේ නම් යෙහෙකැයි' කීහ. ඉක්බිති ඒ පරිබ්‍රාජකයෝ නිශ්ශබ්ද වූහ.

3. ඉක්බිති අනාථ පිණ්ඩික ගෘහපති තෙම ඒ පරිබ්‍රාජකයෝ යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටු විය. සතුටු විය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත් පසෙක සිටියේය.

4. ඒ පරිබ්‍රාජකයෝ එකත් පසෙක සිටි අනේපිඬු ගෘහපතියාට, "ගෘහපතිය, ශ්‍රමණ ගෞතම තෙම කවර කවර දෘෂ්ටියක් ඇත්තේ දැයි" කියව "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ සියලු දෘෂ්ටි නොදනිමියි" කීයේය, "ගෘහපතිය, ඔබ ශ්‍රමණ ගෞතමයන්ගේ සියලු දෘෂ්ටි නොදන්නේ නම් ගෘහපතිය, කියව භික්ෂූහු කුමන දෘෂ්ටි ඇත්තාහුද?' - "ස්වාමීනි, මම භික්ෂූන්ගේ සියලු දෘෂ්ටි නොදනිමි." - "ඔබ කුමන දෘෂ්ටි ඇත්තේද?" - "ස්වාමීනි, අපි මේ දෘෂ්ටිකයෝ යයි ප්‍රකාශ කිරීම දුෂ්කරය." - "එසේනම් ආයුෂ්මත්හු පළමුකොට ස්වකීය දෘෂ්ටි ප්‍රකාශ කෙරෙත්වා. නැවත අප විසින්ද අපි අසවල් දෘෂ්ටිකයෝයයි ප්‍රකාශකරන්ට දුෂ්කර නොවන්නේය."

5. "මෙසේ කී කල්හි එක්තරා පරිබ්‍රාජකයෙක් අනේපිඬු ගෘහපතියාට, "ගෘහපතිය, මම 'ලොකය ශාස්වතය. (ii) 'මෙයම ඇත්තය, අනිත් ඒවා හිස්යයි' මෙබඳු දෘෂ්ටි ඇත්තෙක්මියි" මෙය කීයේය. (iii) අනික් පරිබ්‍රාජකයෙක්ද අනේපිඬු ගෘහපතියාට (iv) 'ගෘහපතිය, මම 'ලොකය සදාකාලික නොවේ. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) අනිත් පරිබ්‍රාජකයෙක්ද අනේපිඬු ගෘහපතියාට, "ගෘහපතිය, මම 'ලොකය කෙළවරක් ඇත්තේය, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) අනිත් පරිබ්‍රාජකයෙක්ද අනේපිඬු ගෘහපතියාට "ගෘහපතිය, ලොකය කෙළවරක් නැත්තේය, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

(මෙහි 5 (iii) යෙදිය යුතුයි) ගෘහපතිය, මම, ඒ ජීවමය ඒ ශරීරමය (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

(මෙහි 5 (iii) යෙදිය යුතුයි.) ගෘහපතිය, මම, ජීවය අනිකකි ශරීරය අනිකකි (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

(මෙහි 5 (iii) යෙදිය යුතුයි) ගෘහපතිය, මම, සත්වයන් මරණින් මතු වෙයි (මෙහි 5 (ii) යෙදිය යුතුයි.

(මෙහි 5 (iii) යෙදිය යුතුයි) ගෘහපතිය, මම, සත්වයන් මරණින් මතු නොවෙයි (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

(මෙහි 5 (iii) යෙදිය යුතුයි) ගෘහපතිය, මම, සත්වයන් මරණින් මතු වේද නොවේද වේ (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

(මෙහි 5 (iii) යෙදිය යුතුයි) ගෘහපතිය, මම, සත්වයන් මරණින් මතු නොවෙයි, නොවන්නේද නොවේ. මෙයම සත්‍යය අනික්වා හිස්යයි' මෙබඳු දෘෂ්ටි ඇත්තෙක්මියි" කීයේය.

**6.** මෙසේ කීකල්හි අනේපිඬු ගෘහපතිතෙම ඒ පරිබ්‍රාජකයන්ට, "ස්වාමීනි, යම් මේ ආයුෂ්මත් කෙනෙක් 'ගෘහපතිය, මම ලොකය ශාස්වතය. මෙයම ඇත්තය. අනිත්වා බොරු යයි මෙබඳු දෘෂ්ටි ඇත්තේයයි' (ii) මෙසේ කීවේද, ආයුෂ්මත්හුගේ මේ දෘෂ්ටිය තමාගේ හෝ නුනුවණින් මෙනෙහි කිරීම හේතුවෙන් උපන්නීය. අනුන්ගෙන් ඇසීම් හේතුවෙන් හෝ උපන්නීය. මේ දෘෂ්ටිතොමෝ වනාහී ඇත්තය. හේතුවෙන් සකස්කරණ ලද්දීය. සිතන ලද්දීය. හේතුවෙන් ප්‍රත්‍යයෙන් උපන්නීය. එය අනිත්‍යය. යමක් අනිත්‍යනම් එය දුකය. යමක් දුකනම් ඒ ආයුෂ්මත්තෙමේ එහිම ඇලුනේය. එහිම ඒ ආයුෂ්මත්තෙමේ බැසගන්නා ලදී.

**7.** "ස්වාමීනි, යම් මේ ආයුෂ්මත් කෙනෙක් 'ලොකය අශාස්වතය (ii) මෙයම සත්‍යය අනික්වා හිස්ය. ගෘහපතිය, මම මෙසේ දෘෂ්ටි ඇත්තෙමියි' (iii) (මෙහි (ii) යෙදිය යුතුයි.)

**8.** "ස්වාමීනි, යම් මේ ආයුෂ්මත් කෙනෙක් ලොකය අන්තයක් ඇත්තකි (මෙහි 7 (ii) ද, 6 (ii) ද යෙදිය යුතුයි.)

**15.** "ස්වාමීනි, යම් මේ ආයුෂ්මත් කෙනෙක් සත්වයා මරණින් මතු නොවෙයි නොවන්නේද නොවෙයි, (මෙහි 7 (ii) ද, 6 (ii) ද යෙදිය යුතුයි.)

**9.** "ස්වාමීනි, යම් මේ ආයුෂ්මත් කෙනෙක් ලෝකය අන්තයක් නැත්තකි (මෙහි 7 (ii) ද 6 (ii) ද යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**10.** "ස්වාමීනි, යම් මේ ආයුෂ්මත් කෙනෙක්, එය ජීවය එය ශරීරය (මෙහි 7 (ii) ද 6 (ii) ද යෙදිය යුතුයි.)

**11.** "ස්වාමීනි, යම් මේ ආයුෂ්මත් කෙනෙක්, ජීවය අනිකකි ශරීරය අනිකකි (මෙහි 7 (ii) ද 6 (ii) ද යෙදිය යුතුයි.)

**12.** "ස්වාමීනි, යම් මේ ආයුෂ්මත් කෙනෙක්, සත්වයා මරණින් මතු වේය (මෙහි 7 (ii) ද 6 (ii) ද යෙදිය යුතුයි.)

**13.** "ස්වාමීනි, යම් මේ ආයුෂ්මත් කෙනෙක්, සත්වයා මරණින් මතු නොවේය, (මෙහි 7 (ii) ද 6 (ii) ද යෙදිය යුතුයි.)

**14.** "ස්වාමීනි, යම් මේ ආයුෂ්මත් කෙනෙක්, සත්වයා මරණින් මතු වේය, නොවේය. (මෙහි 7 (ii) ද 6 (ii) ද යෙදිය යුතුයි.")

**15.** මෙසේ කීකල්හි ඒ පරිබ්‍රාජකයෝ අනේපිඬු ගෘහපතියාට 'ගෘහපතිය, අප හැමදෙනා විසින්ම ස්වකීය දෘෂ්ටි යම්තාක්ද, ඒවා ප්‍රකාශකරණ ලද්දාහ. ගෘහපතිය, ඔබ කුමන දෘෂ්ටි ඇත්තේදැයි ප්‍රකාශ කරවයි' කීවාහුය.

**16.** "ස්වාමීනි, හටගත් සකස්වූ සිත් ඇති නිසා උපන් යමක් ඇත්තේද, එය අනිත්‍යයද යමක් අනිත්‍යද එය දුකය, යමක් දුකනම් 'මෙය මගේ නොවේ. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ යයි, ස්වාමීනි, මම මෙබඳු දෘෂ්ටි ඇත්තෙක් වෙමියි' කීයේය.

**17.** "ගෘහපතිය, යම් කිසිවක් හටගත්තේද සකස්වීම් ඇත්තේද, සිත් සහිත ද හෙතු ප්‍රත්‍යයෙන් උපන්නේද, එය අනිත්‍යය, යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුකනම් ගෘහපතිය එයම ඔබ අල්ලාගත්තේය. ගෘහපතිය, ඔබ එහිම බැසගත්තේය."

**18.** "ස්වාමීනි, යමක් හටගත්තේද සකස්වීම ඇත්තේද, සිත සහිතද, නිසා උපදින ලද්දේද, එය අනිත්‍යය, යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුක් නම් 'මෙය මගේ නොවේ. ඒ මම නොවෙමි. මේ මගේ ආත්මය නොවේයයි' මෙසේ එය තත්වූපරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දක්නා ලද්දේය. ඔහුගේ මත්තෙහි මිදීම තත්වූ පරිද්දෙන් දනිමියි" කීයේය. මෙසේ කීකල්හි

ඒ පරිබ්‍රාජකයෝ පරිද්දෙන් දනිමියි’ කීයේය. මෙසේ කීකල්හි ඒ පරිබ්‍රාජකයෝ තුෂ්ණිම්භූත වූවාහු, නැමුණු පිට ඇත්තාහු, මුව යටිකුරු කළාහු, සිතමින් නො වැටහෙමින් සිටියාහුය.

**19.** ඉක්බිති අනේපිඬු ගෘහපතිතෙම තුෂ්ණිම්භූතවූ මුඛ අකුලාගත් නමාගත් පිට ඇති, යටිකුරුකළ මුහුණු ඇති, සිතන්නාවූ, නොවැටහෙන්නාවූ, ඒ පරිබ්‍රාජකයන් දැන අස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි අනේපිඬු ගෘහපතිතෙම ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් සමග යම්තාක් කථාසල්ලාපයක් වූයේද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළකෙළේය. ‘ගෘහපතිය, යහපත යහපත, ගෘහපතිය මෙසේ වනාහි තොප විසින් ඒ හිස් පුරුෂයන් කලින් කල කරුණු සහිතව යටපත් කොට නිග්‍රහ කටයුත්තාහ.

**20.** ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ අනේපිඬු ගෘහපතියා ධාර්මික කථාවෙන් මනාසේ පෙන්වූයේය. සමාදන් කරවූයේය. තෙදගැන්වූයේය. සතුටු කෙළේය. ඉක්බිති අනේපිඬු ගෘහපතිතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් ධාර්මික කථාවෙන් මනාසේ පෙන්වූයේ සමාදන් කරවූයේ, තෙද ගැන්වූයේ, සතුටු කෙළේ අස්නෙන් නැගිට බුදුන් වැඳ පැදකුණුකොට ගියේය.

**21.** “ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනේපිඬු ගෘහපතියා ගිය නොබෝ වේලාවකින් භික්ෂූන් ඇමතූසේක. ‘මහණෙනි, මේ ධර්ම විනයෙහි උපසපන්වී වර්ෂ සියයක් නමුදු පසුවූ මහණ කෙනෙක්වේද, හෙතෙමේද යම්සේ ඒ අනේපිඬු ගෘහපතියා විසින් නිග්‍රහ කරණලද්දේද, අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් කරුණු සහිතව මනාකොට යටපත්කොට නිග්‍රහ කරන්නේයයි වදාළසේක.”

**44. සබ්බ ගරහන වජ්ජියමහිත සූත්‍රය**:- 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ චම්පානුවර ගග්ගරා පොකුණු තෙර වාසය කරණසේක. ඉක්බිති ‘වජ්ජියමහිත’ නම් ගෘහපතිතෙම කල් ඇතුවම භාග්‍යවතුන් වහන්සේ දැකීමට චම්පා නුවරින් පිටත්වූයේය. ඉක්බිති වජ්ජියමහිත ගෘහපතියාට ‘තවම

භාග්‍යවතුන් වහන්සේ දක්නට යාමට නොකල්ය. භාග්‍යවතුන් පලසමවතට සමවැදුනේය. සිත වඩන (භාවනා කරන) භික්ෂූන් ලඟට යාමට ද නොකල්ය. සිතවඩන භික්ෂූහුද පලසමවතට සමවැදුනාහ. අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනෙක්හිද එහි පැමිණෙන්නෙමු නම් යෙහෙකැයි සිතූහ.

2. ඉක්බිත්තෙන් වනාහි වජ්ජියමහිත ගෘහපතිතෙම තීර්ථකයන්ගේ ආරාමයට ගියේය. (මේ වර්ගයේ 43 සූත්‍රයේ 3 ඡෙදය 'අනේපිඬුසිටු' යන්න 'වජ්ජියමහිත ගෘහපති' යයි වෙනස්කොට යොදනු.)

"ගෘහපතිය ශ්‍රමණ ගෞතමතෙමේ සියලු තපස්කම්වලට ගරහයි දුකසේ ජීවත්වන සියලු තපස්ඇත්තන්ට ඒකාන්තයෙන් නින්දාකරයි. දොස්කියයි යන මෙය ඇත්තදැ'යි ඇසීය. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සියලු තපස් නොගරහයි. සියලු රූක්ෂව ජීවත්වන තපස් ඇත්තන්ට ඒකාන්තයෙන් නින්දා නොකරයි. දොස් නොකියයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ගැරහිය යුත්තාට ගරහයි, පැසසිය යුත්තාට පසසයි, ස්වාමීනි ගැරහිය යුත්තාට ගරහන්නාවූ පැසසියයුත්තාට පසසන්නාවූ භාග්‍යවතුන් වහන්සේ විභජ්ජවාදීය. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කරුණෙහිලා ඒකාන්තවාදියෙක් නොවෙතියි" මෙසේ කීවේය.

3. මෙසේ කීකල්හි එක්තරා පරිබ්‍රාජකයෙක් වජ්ජියමහිත ගෘහපතියාට 'ගෘහපතිය, ඔබ පහවෙව, ඔබ යම්බඳුවූ ශ්‍රමණ ගෞතමයන්ගේ ගුණ කියන්නෙහිද, ඒ ශ්‍රමණ ගෞතමතෙමේ නාස්තිකවාදියෙකි. පැණවීමක් නැත්තෙකියි' කීයේය. 'ස්වාමීනි, මම මෙහිලා ආයුෂ්මතුන්ට කරුණු සහිතව කියමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙය කුශලයයි පණවන ලදී. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙය අකුශලයයි පණවන ලදී, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් කුශලය හා අකුශලය, පණවනු ලබන්නේ භාග්‍යවතුන් වහන්සේ පැණවීම් සහිතය, භාග්‍යවතුන් වහන්සේ නාස්තිකවාදියෙක් නොවේ. පැනවීම් නැත්තෙක් නොවේයයි" කීයේය.

**4.** මෙසේ කී කල්හි ඒ පරිබ්‍රජකයෝ තුෂ්ණිම්භූතවූවාහු මුහුණ හැකුලුනාහු, නැමුණු පිට ඇත්තාහු යටිකුරුවූ මුහුණ ඇත්තාහු, සිතමින් නොවැටහෙමින් සිටියාහුය. ඉක්බිති වජ්ජියමහිත ගෘහපතිතෙම තුෂ්ණිම්භූතවූ මුහුණු හැකුලුණු නැමුණු පිට ඇති, යටිකුරුවූ මුව ඇති සිතමින්හුන් නොවැටහුණු ඒ පරිබ්‍රාජකයන් දැක හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත් පසෙක සිටි වජ්ජියමහිත ගෘහපතිතෙම ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් සමග යම්තාක් කථාසල්ලාපයක් වූයේද ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළකෙළේය.

**5.** "ගෘහපතිය, යහපත, යහපත මෙසේ තොප විසින් ඒ හිස් පුරුෂයෝ කලින් කල කරුණු සහිතව යටත් කළයුත්තාහ නිග්‍රහ කළයුත්තාහ. ගෘහපතිය, මම සියලු තපස් තැවිය යුතුයයි නොකියමි. ගෘහපතිය, මම සියලු තපස් නොතැපිය යුතුයයි නො කියමි. ගෘහපතිය, මම සියලු ගැනීම් ගතයුතුයයි නොකියමි. ගෘහපතිය, මම සියලු ගැනීම් නො ගතයුතුයයි නොකියමි. ගෘහපතිය මම සියලු භාවනාකිරීම් භාවනාකටයුතුයයි නොකියමි. ගෘහපතිය, මම සියලු භාවනා කිරීම් භාවනා නොකටයුතුයයි නොකියමි ගෘහපතිය, මම සියලු දුරුකිරීම් දුරුකටයුතුයයි නොකියමි. ගෘහපතිය, මම සියලු දුරුකිරීම් දුරුනොකටයුතුයයිද නොකියමි. ගෘහපතිය මම සියලු මිදීම් මිදිය යුත්තාහයි නොකියමි. ගෘහපතිය, මම සියලු මිදීම් නොමිදිය යුත්තාහයිද නොකියමි.

**6.** "ගෘහපතිය, යම් තපසක් තපින්නාහට අකුශල ධර්මයෝ වැඩෙත් නම් කුශල ධර්මයෝ පිරිහෙත් නම් මෙබඳු තපස නො තැපිය යුතුයයි කියමි. ගෘහපතිය, යම් තපසක් තපින්නාහට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, මෙබඳු තපස තැපිය යුතුයයි කියමි.

**7.** "ගෘහපතිය, යම් ගැනීමක් ගන්නාහට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳු ගැනීමක්

නොගතයුතුයයි කියමි. ගෘහපතිය, යම් ගැනීමක් ගන්නාහට අකුසල් පිරිහෙත්ද කුසල් වැඩෙත්ද එබඳු ගැනීමක් ගතයුතුයයි කියමි.

8. "ගෘහපතිය, යම් භාවනාවක් වැඩීමෙන් අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳු භාවනාවක් වැඩියයුත්තාහයි නොකියමි. ගෘහපතිය, යම් භාවනාවක් වඩන්නාහට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳු භාවනාවක් වැඩිය යුතුයයි කියමි.

9. "ගෘහපතිය, යම් අත්හැරීමක් අත්හරින්නාහට අකුශල ධර්මයෝ වැඩෙත්ද කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳු දුරුකිරීමක් දුරු නොකටයුතු යයි කියමි. යම් අත්හැරීමක් අත්හරින්නාහට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳු අත්හැරීමක් අත්හළ යුතුයයි කියමි.

10. "ගෘහපතිය, යම් මිදීමකින් මිදෙන්නාහට අකුශල ධර්මයෝ වැඩෙත්ද කුශල ධර්මයෝ පිරිහෙත්ද එබඳු මිදීම නොමිදිය යුතුයයි කියමි. ගෘහපතිය, යම් මිදීමක් මිදෙන්නාහට අකුශලධර්මයෝ පිරිහෙත්ද කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳු මිදීම මිදිය යුතුයයි කියමියි" වදාළසේක.

11. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් කරුණු සහිතව දක්වන ලද සමාදන් කරවනලද තෙදගන්වනලද සතුටු කරණලද වජ්ජියමහිත ගෘහපතිතෙම අස්නෙන් නැගිට බුදුන් වැඳ පැදකුණුකොට ගියේය.

12. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වජ්ජියමහිත ගෘහපතියා ගිය නොබෝ වේලාවකින් භික්ෂූන් ආමන්ත්‍රණය කළ සේක. "මහණෙනි, යම් ඒ මහණෙක් බොහෝ කලක් මේ ධර්ම විනයෙහි කෙලෙස් රජස් නැත්තේද හෙතෙමේ යම්සේ ඒ වජ්ජියමහිත ගෘහපතියා විසින් පෙළන ලද්දේද මෙසේ ම අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් කරුණු සහිතව මනාකොට පෙළන ලද්දවුන්කොට නිග්‍රහ කරන්නේයයි" වදාළසේක.

**45. උත්තිය පරිබ්බාජක සූත්‍රය:-** 1. ඉක්බිති උත්තිය පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි

පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය, සතුටු වියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත් පසෙක සිටියේය. එකත්පසෙක සිටි උත්තිය පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේට, 'භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? ලෝකය ශාශ්වතද, මෙයම සත්‍යයද, අනිත්වා හිස්දැයි' ඇසීය. 'උත්තිය මා විසින් ලෝකය ශාස්වතය, මෙයම සත්‍යය අනිත්වා හිස්යයි ප්‍රකාශ නොකරණලදී."

2. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, ලොකය අශාස්වතද (ii) මෙයම සත්‍යයද අනිත්වා හිස්දැ"යි ඇසීය. (iii) උත්තිය, මා විසින් ලොකය අශාස්වතය මෙයම සත්‍යය, අනිත්වා හිස් යයි මෙයද මා විසින් ප්‍රකාශ නොකරණලදී

3. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, ලෝකය අන්තයක් ඇත්තේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) උත්තිය, මා විසින් ලොකය අන්තයක් ඇත්තේද (මෙහි 2 (i) යෙදිය යුතුයි.) භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, එය ජීවයද එය ශරීරයද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) උත්තිය මා විසින් එය ජීවයද, එය ශරීරයද, (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, ජීවය අනිකෙක්ද, ශරීරය අනිකෙක්ද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) උත්තිය, මා විසින් ජීවය අනිකෙක්ය, ශරීරය අනිකෙක්ය (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, සත්වයා මරණින් මතු වේද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) උත්තිය, මා විසින් සත්වයා මරණින් මතු වේය (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, සත්වයා මරණින් මතු නොවේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) උත්තිය, මා විසින් සත්වයා මරණින් මතු නොවේය (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) භවත් ගෞතමයන් වහන්ස කිමෙක්ද, සත්වයා මරණින් මතු වේද, නොවේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) උත්තිය මා විසින් සත්වයා මරණින් මතු වේද නොවේද (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

"සත්වයා මරණින් මතු නොවෙයිද, නොද නොවෙයිද, මෙයම සත්‍යයද අනිත්වා හිස්දැයි' ඇසීය, උත්තිය, සත්වයා

මරණින් මතු නොදවෙයි නොද නොවෙයි මෙයම ඇත්තය අනික්වා හිස්යයි යන මෙයද මා විසින් ප්‍රකාශ නොකරණලදී"

4. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද ලෝකය ශාස්වතද (ii) මෙයම සත්‍යයද අනික්වා හිස්දැයි මෙසේ විචාරණ ලද්දේ (iii) 'උත්තිය, ලොකය ශාස්වතය (iv) මෙයම සත්‍යය අනිත්වා හිස්යයි මා විසින් මෙයද ප්‍රකාශ නොකරණ ලද්දේයයි' කීයෙහිය.

භාග්‍යවතුන් වහන්ස, කිමෙක්ද ලොකය කෙළවරක් ඇත්තේද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි) උත්තිය, ලොකය කෙළවරක් ඇත්තේය (මෙහි 4 (iv) යෙදිය යුතුයි) ලොකය කෙළවරක් නැත්තේද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි) උත්තිය ලොකය කෙළවරක් නැත්තේය (මෙහි 4 (iv) යෙදිය යුතුයි) එය ජීවයද, එය ශරීරයදැයි (මෙහි 4 (ii) යෙදිය යුතුයි) උත්තිය එය ජීවයය එය ශරීරයය, (මෙහි 4 (iv) යෙදිය යුතුයි) ශරීරය අනිකක්ද, ජීවය අනිකක්ද (මෙහි 4 (ii) යෙදිය යුතුයි) උත්තිය ශරීරය අනිකක්ය, ජීවය අනිකක්ය (මෙහි 4 (iv) යෙදිය යුතුයි) සත්වයා මරණින් මතු වේද (මෙහි 4 (ii) යෙදිය යුතුයි) උත්තිය, සත්වයා මරණින් මතු වේය (මෙහි 4 (iv) යෙදිය යුතුයි) සත්වයා මරණින් මතු නොවේද (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) උත්තිය, සත්වයා මරණින් මතු නොවේය (මෙහි 4 (iv) යෙදිය යුතුයි) සත්වයා මරණින් මතු වේද, නොවේද (මෙහි 4 (ii) යෙදිය යුතුයි) උත්තිය, සත්වයා මරණින් මතු වේය, නොවේය (මෙහි 4 (iv) යෙදිය යුතුයි)

"සත්වයා මරණින් මතු නොදවෙයිද නොද නොවෙයිදැයි ද මෙයම සත්‍යයද අනිත්වා බොරුදැයි මෙසේ විචාරණ ලද්දේම උත්තිය, සත්වයා මරණින් මතු නොදවෙයි නොදනොවෙයි මෙයද තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරණ ලද්දේයයි" කීයෙහිය. එසේනම් භවත් ගෞතමයන් වහන්සේ විසින් කුමක් ප්‍රකාශකරණ ලද්දෙහිද?"

5. "උත්තිය, මම විශිෂ්ට ඥානයෙන් දැන සත්වයන්ගේ විශුද්ධිය පිණිස, ශොක වැලපීම් දෙක ඉක්මවීම පිණිස දුක් දොම්නස් දෙක අස්තවීම පිණිස, ආර්ය අෂ්ටාංගික මාර්ගය

ලබා ගැනීම පිණිස, නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස, ශ්‍රාවකයන්ට ධර්මය දෙශනා කරමි.”

“භවත් ගෞතමයන් වහන්සේ යමක් විශිෂ්ට ඥානයෙන් දැන සත්වයන්ගේ විශුද්ධිය පිණිස ශ්‍රාවකයන්ට ධර්මය දෙශනා කරයිද ඉන් සියලු ලොකය පමුණුවන්නේද අර්ධයක්ද, භාගයක් දැයි” ඇසීය, මෙසේ කීකල්හි භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම්භූතවූසේක.

**6.** ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ‘උත්තිය පරිබ්‍රාජක තෙම, මෙබඳු ලාමක දෘෂ්ටියක් නොලබාවා, සියලු දෙනා තමන්ම උසස් වන ප්‍රශ්නයක් විචාරණලද්දේ මාගේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ නොවිසඳයි. ඒකාන්තයෙන් නොඉවසිය හැකියයි’ මෙබඳු සිතක් විය. එය උත්තිය පරිබ්‍රාජකයාට බොහෝ කලක් අහිත පිණිස දුක පිණිස වන්නේය.

**7.** ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ උත්තිය පරිබ්‍රාජකයාට ‘ඇවැත්නි, උත්තිය, තොපට උපමාවක් කරන්නෙමි. මේලොකයෙහි ඇතැම් ඤාණවන්ත පුරුෂයෝ උපමාවෙන්ද භාෂිතයාගේ අර්ථය දනිත්. ඇවැත්නි, උත්තිය, යම්සේ පිටතින් බැඳි බැම් ඇති දැඩි ප්‍රාකාර හා තොරන් ඇති එකදොරක් ඇති රජුගේ ප්‍රත්‍යන්ත නගරයක් යම්සේද එහි පණ්ඩිතවූ ව්‍යක්තවූ නුවණැති නොදන්නවුන් වලක්වන්නාවූ, දන්නවුන් ප්‍රවෙශකරන්නාවූ දොරටුපාලයෙක් වන්නේය. හෙතෙම ඒ නගරයේ හාත්පස ඇවිද මාර්ගය ගෙවන්නේ බළලෙකු පිටවන තරම් පවුරු මුල්ලක් හෝ පවුරු විවරයක් හෝ නොදක්නේය. ඔහුට මෙතෙක් ප්‍රාණීහු මේ නුවරට ප්‍රවෙශවෙත්යයි කියා හෝ නික්මෙත්යයි කියා හෝ මෙබඳු දැනීමක් නොවේද, යම්කිසි මහත් ප්‍රාණී කෙනෙක් මේ නගරයට ප්‍රවිෂ්ට වෙත් හෝ නික්මෙත් හෝ ඒ සියල්ලෝ මේ දොරටුවෙන් ප්‍රවෙශවෙත් කියා හෝ නික්මෙත්ය කියා හෝ මෙසේ සිතයි.

**8.** “ඇවැත්නි, උත්තිය, එසේම එය තථාගතයන් වහන්සේට වෙහෙසක්නොවේ. උන්වහන්සේ විසින් සියලු ලොකයා බාගයක් හෝ කොටසක් හෝ පමුණුවන්නේය. ඉක්බිත්තෙන් තථාගතයන්

වහන්සේට මෙහිලා අදහස වෙයි. යම් කිසි කෙනෙක් ලොකයෙන් පමුණුවනු ලද්දාහුද, පමුණුවනු ලබත්ද, පමුණුවනු ලබන්නෝද ඒ සියල්ලෝ චිත්තොපක්ලේශයන්වූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ පඤ්චනීවරණයන් අත්හැර සතර සතිපට්ඨානයන්හි මනාකොට පිහිටි සිත් ඇත්තාහු සප්ත බොජ්ක්ධංගයන් තත්වූ පරිද්දෙන් වඩා මෙසේ මොවුහු ලොකයෙන් පමුණුවන ලද්දාහුද, පමුණුවනු ලබත්ද පමුණුවනු ලබන්නාහුද වෙත්. ඇවැත් උත්තිය, ඔබ භාග්‍යවතුන් වහන්සේගෙන් යම් ප්‍රශ්නයක් විචාළේද, ඒ ප්‍රශ්නයම ඒ භාග්‍යවතුන් වහන්සේගෙන් අනික් ක්‍රමයකින් විචාළෙහිය. එහෙයින් එය තොපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ නොකළ සේකැයි" කීය.

**46. කොකනද සූත්‍රයඃ-** 1. එක්කාලයෙක ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ රජගහනුවර තපොදාරාමයෙහි වාසය කරණසේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ රාත්‍රියෙහි අලුයම නැගිට තපොදාව යම්තැනෙක් හිද, ඇඟ සේදීම පිණිස වැඩිසේක. තපොදාවෙහි ඇඟ සෝදා ගොඩවී ඇඟ වේලමින් එක සිවුරෙන් සිටියේය. කොකනද පරිබ්‍රාජක තෙමේද රාත්‍රියෙහි අළුයම් වේලාවෙහි නැගිට තපොදාව යම්තැනෙක්හිද ඇඟ සේදීමට එහි පැමිණියේය. කොකනද පරිබ්‍රාජකතෙම ඈත සිට එන ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ දැක ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට, "ඇවැත්නි, මෙහි සිටින ඔබ කවරෙක්දැයි" ඇසීය. "ඇවැත්නි, මම භික්ෂු කෙනෙක් වෙමියි" කීයේය. "ඇවැත්නි, කවර භික්ෂූන් අතරෙහිදැ"යි ඇසීය. "ඇවැත්නි ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන් අතරේයයි" කීයේය.

**2.** "ඉදින් ප්‍රශ්නයක් ප්‍රකාශකිරීමට ආයුෂ්මත්තෙමේ අවකාශ දේනම් අපි ආයුෂ්මතුන්ගෙන් කිසියම් කරුණක් අසමුයි" කීයේය. "ඇවැත්නි, අසව, අසා දැනගන්නෙමියි" කීයේය.

**3.** "පින්වත, කෙසේද? පින්වත්තෙමේ ලොකය ශාස්වතය, මෙම සත්‍යය සෙස්ස හිස්ය යන දෘෂ්ටි ඇත්තේද?" ඇවැත්නි, මම ලොකය ශාස්වතය, මෙම සත්‍යය, අනිත්වා හිස්යයි මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමි."

4 - 12 (මේ ඡේද මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි "ලොකය ශාස්වතය' වෙනුවට මෙහි පහත දක්වන වචන යොදා ඒ ඒ ඡේද යොදා ගත යුතුයි. 'ලෝකය අශාස්වතය' ලෝකය කෙළවරක් ඇත්තේය.' 'ලෝකය කෙළවරක් නැත්තේය' 'එය ජීවය එය ශරීරය' 'ජීවය අනිකකි ශරීරය අනිකකි' 'සත්ත්වතෙමේ මරණින් මතුවේ' 'සත්ත්වතෙමේ මරණින්මතු නොවේ' 'සත්ත්වතෙමේ මරණින්මතු වේද නොවේදවේ' 'සත්ත්ව තෙමේ මරණින්මතු' නොවේමය නොවේද නොවේ'

13. "එසේනම් පින්වත් තෙමේ නොදනියි, නොදකියි" "ඇවැත්නි, මම නොදන්නෙම් නොදක්නෙම් නොවෙමි. ඇවැත්නි මම දනිමි දකිමියි" කීයේය.

14. (මේ ඡේදය මේ වර්ගයේ 45 සූත්‍රයේ 2 ඡේදය මෙනි) වෙනස "භවත් ගෞතමයන් වහන්සේ" වෙනුවට 'පින්වත්' යන්න හා "ප්‍රකාශ නොකරණ ලදී" යන්නට "කීයේය" යෙදිය යුතුයි.) එසේවී නම් පින්වත්තෙමේ නොදනී නොදකී යයි" මෙසේ විචාරණලද්දේ 'ඇවැත්නි, මම නොදන්නෙම් නොදක්නෙම් නොවෙමි. ඇවැත්නි මම දනිමි දකිමියි' කීයෙහිය. ඇවැත්නි කෙසේ වනාහි මේ භාෂිතයාගේ අර්ථය දතයුතුයි" ඇසීය.

15. "ඇවැත්නි, ලොකය ශාස්වතය මෙම සත්‍යය අනිත්වා හිස්යයි යන මෙය වැරදි අවබොධයකි. ලොකය අශාස්වතය (ii) මෙම සත්‍යය, අනිත්වා හිස්යයි යන මෙය වැරදි අවබොධයකි (iii) ලෝකය කෙළවරක් ඇත්තේය, (මෙහි 15 (ii) යෙදිය යුතුයි) ලෝකය කෙළවරක් නැත්තේය (මෙහි 15 (ii) යෙදිය යුතුයි) එය ජීවය එය ශරීරය (මෙහි 15 (ii) යෙදිය යුතුයි. ජීවය අනිකකි ශරීරය අනිකකි (මෙහි 15 (ii) යෙදිය යුතුයි) සත්ත්වතෙමේ මරණින්මතුවේ (මෙහි 15 (ii) යෙදිය යුතුයි) සත්ත්වතෙමේ මරණින්මතු නොවේ (මෙහි 15 (ii) යෙදිය යුතුයි) සත්ත්වතෙමේ මරණින්මතු වේද නොවේද වේ (මෙහි 15 (ii) යෙදිය යුතුයි) සත්ත්වතෙමේ මරණින්මතු නොවේමය, නොවේද නොවේ.

16. "ඇවැත්නි, යම්තාක් වැරදි අවබොධවේද, යම්තාක් වැරදි කරුණු වෙත්ද ඒතාක් එහි පිහිටීමය, මැඩගැනීම, හටගැන්ම, හැපීම වේ. එය මම දනිමි. එය මම දකිමි. එය මම දන්නෙම් දක්නෙම් නොදනිමි නොදකිමියි කවරෙකුට කියන්නෙම්ද, ඇවැත්නි 'මම දනිමි. දකිමියි' කීයේය. ආයුෂ්මත්තෙමේ කිනම් නමක් ඇත්තෙහිද? සබ්‍රම්සරහු ආයුෂ්මතුන් කෙසේ දනිද්දැයි" ඇසීය.

17. "ඇවැත්නි, මම ආනන්ද නමි. සබ්‍රම්සරහු මා ආනන්ද කියා දනිත්යයි" කීයේය. "ඒකාන්තයෙන් මහාචාර්යයකු හා කථා කරන්නේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ යයි නොදතුම්හ. ඉදින් අපි ආයුෂ්මත් ආනන්දයයි දනිමු නම් අපට මෙපමණකුදු ඇසීමට නොසිතෙන්නේය. ආයුෂ්මත් තෙමේ මට කමාවේවා."

47. දස ආහුණෙයය ධම්ම සූත්‍රය:- 1. "මහණෙනි, දස ධර්මයකින් යුක්තවූ මහණතෙම ආහුණෙයයවේ. පාහුණෙයය වේ, දක්ඛිණෙයය වේ. අඤ්ජලිකරණීය වේ, ලොකයාගේ නිරුත්තර පින්කෙත වේ.

2. "කවර දස ධර්මයකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සිල්වත් වේද, ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙන් සංවරව වාසය කරයිද, හැසිරීමෙන් හා සෙවීමෙන් යුක්ත වූයේද, ස්වල්ප මාත්‍ර වරදෙහි බියදක්නා සුළුවූයේ ශික්ෂාපදයන් සමාදන්ව හික්මෙයි. ඇසූදේ දරණ ඇසූදේ රැස්කරණ බහුශ්‍රැතයෙක් වේ.

2. "යම් ඒ ධර්ම කෙනෙක් මුල යහපත්ද, මැද යහපත්ද, අග යහපත්ද, අර්ථ සහිතද, ව්‍යඤ්ජන සහිතද, හාත්පසින් සම්පූර්ණද, පිරිසිදු බ්‍රහ්මචර්යාව කියත්ද, එබඳු ධර්මයෝ බොහෝ අසන ලද්දාහු වෙත්. දරණ ලද්දාහු වෙත්. වචනයෙන් පුරුදුවූවාහු වෙත්. සිතින් බලන ලද්දාහු වෙත්. දෘෂ්ටියෙන් අවබොධකරන ලද්දාහු වෙත්.

4. "යහපත් මිත්‍රයන් සහායකොට ඇති යහපත් මිත්‍රයන්ට නැමෙන්නාවූ කල්‍යාණ මිත්‍රයෙක් වේ. යහපත් දැකීමෙන් යුක්තවූ සම්‍යක් දෘෂ්ටිකයෙක් වේ. නානාප්‍රකාර ඍද්ධි ප්‍රභෙදයන් විඳියි. එකෙක්ව බොහෝ වෙයි. බොහෝව එකෙක් වෙයි අහසෙහි

මෙන් ප්‍රකට භාවයට, සරසට, බිත්තියෙන් පිටතට, ප්‍රාකාරයෙන් පිටතට පර්වතයෙන් පිටතට නොගැටෙමින් යයි. ජලයෙහි සේම පෘථුවියෙහිද මතුවීම ගැලීම කරයි. පෘථිවියෙහි සේම ජලයෙහිද නොබිඳෙමින් යයි. පියාපත් ඇති කුරුල්ලන් මෙන් අහසෙහිද පර්යංකයෙන් යයි මෙසේ මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ චන්ද්‍ර සූර්යයන්ද අතින් ස්පර්ශකරයි. පිරිමදී. බ්‍රහ්මලොකය දක්වා කයින් වසඟයට පමුණුවයි.

5. "පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ දිව කණින් දිව්‍යමයවූද මනුෂ්‍යවූද ඈත්වූද, ළංවූද දේ ශබ්දයන් අසයි. තමන් සිතින් අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත පිරිසිඳ දනියි. රාග සහිත සිත රාග සහිත සිතයයි දනියි. පහවූ රාග ඇති සිත පහවූ රාග ඇති සිත යයි දනියි. ද්වෙෂ සහිත සිත ද්වෙෂ සහිත සිතයයි දනියි. පහවූ ද්වෙෂ සහිත සිත පහවූ ද්වෙෂ සහිත සිතයයි දනියි. මොහ සහිත සිත මොහසහිත සිතයයි දනියි. පහවු මොහ සහිත සිත පහවූ මොහ සහිත සිත යයි දනී. පහවූ මොහ ඇති සිත පහවූ මොහ ඇති සිතයයි දනියි. හැකුළුනු සිත හැකුළුනු සිතයයි දනියි. විසුරුණු සිත විසුරුණු සිත යයි දනියි. මහත් බවට නොපැමිණි සිත මහත් බවට නොපැමිණි සිතයයි දනියි. මහත්ත්වයට පැමිණි සිත මහත්ත්වයට පැමිණි සිතයයි දනියි. වැඩියක් සහිත සිත වැඩියක් සහිත සිතයයි දනියි. වැඩියක් රහිත සිත වැඩියක් රහිත සිතයයි දනියි. එකඟ නොවූ සිත එකඟනොවූ සිතයයි දනියි. එකඟවූ සිත එකඟවූ සිතයයි දනියි. නොමිදුනු සිත නොමිදුනු සිතයයි දනියි. මිදුනු සිත මිදුනු සිතයයි දනී.

6. "නානාප්‍රකාර පූර්වෙනිවාසය එකජාතියක් ජාති දෙකක් ජාති තුනක් ජාති සතරක් ජාති පහක් ජාති දහයක් ජාති විස්සක්-ජාති තිහක්-ජාති හතලිහක්-ජාති පණහක් ජාති සීයක්-ජාති දාහක්-ජාති දසදාහක්- නොයෙක් නැසෙන කල්ප-නොයෙක් වැඩෙන කල්ප-නොයෙක් නැසෙන වැඩෙන කල්ප සිහිකරයි. අසවල් තැන මෙබඳු නමක් ගොත්‍රයක් මෙබඳු වර්ණයක් මෙබඳු ආහාරක් මෙබඳු සැපත් දුකත් වින්දෙමි. මෙබඳු ආයුෂයක් අවසන්කොට ඈත්තේය. හෙතෙම ඉන් චුතවූයේ අසවල් තැන

ඉපදුනෙමි. එහිද මෙබඳු නමක් වූයේය. මෙබඳු ගොත්‍රයක් මෙබඳු වර්ණයක් මෙබඳු ආහාරයක් මෙබඳු සැපක් දුකක් විඳින සුළුවූයෙමි. මෙබඳු ආයුෂ ප්‍රමාණයක් වූයේය. හෙතෙම ඉන් චුතවූයේ මෙහි උපන්නේයයි මෙසේ ආකාර සහිත නම් කීම් සහිත නානාප්‍රකාර පූර්වෙනිවාසය සිහිකරයි.

7. "පිරිසිදුවූ මිනිසැස ඉක්ම සිටි දිවැසින් චුතවන්නාවූ උපදින්නාවූ පහත්වූ උසස්වූ මනා වර්ණ ඇති දුර්වර්ණ ඇති යහපත් ගති ඇති අයහපත් ගති ඇති කම්වූ පරිදි උපන් සත්වයන් දනී. පින්වත්නි එකාන්තයෙන් මේ සත්වයෝ කාය සුචරිතයෙන් යුක්තවූවාහුය. වාක් සිත්හි ආර්යයන්ට දොස් කියන්නාහුය. මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහ. මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවාහ. ඔව්හු කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති නපුරු ගති ඇති නපුරුකොට ඇදවැටෙන නරකයෙහි උපන්නාහුය. පින්වත්නි මේ සත්වයන් කාය සුචරිතයෙන් යුක්තවූවාහුය. වචනයේ සුචරිතයෙන් සිතේ සුචරිතයෙන් යුක්තවූවාහුය. ආර්යයන්ට දොස් නොකියන්නාහ. සම්‍යක් දෘෂ්ටි ඇත්තාහ. සම්‍යක් දෘෂ්ටික කර්ම සමාදන්වූවාහුය ඔව්හු කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලොකයෙහි උපන්නාහයි මෙසේ පිරිසිදු මිනිසැස ඉක්ම පවත්නා දිවැසින් චුතවන උපදින පහත් උසස් මනා වර්ණ ඇති දුර්වර්ණ යහපත් ගති ඇති දුගති ඇති කම්වූ පරිදි උපන් සත්වයන් දකී.

8. "ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත සිතින් මිදීමද ප්‍රඥාව කරණකොට මිදීමද මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයි. (මෙහි මේ සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

48. දසථෙරධම්ම සූත්‍රයː- 1. "මහණෙනි, ධර්ම දහයකින් යුක්තවූ ස්ථවිර භික්ෂුව යම් යම් දිශාවක වාසය කරයිද සුවසේ වාසය කරයි.

2. "කවර දසයකින්ද යත්, බොහෝ කල් දන්නා (වැඩිවයස් වූ) පැවිදිවූ බොහෝ කල් ඇති සිල්වතෙක් වේ. ශික්ෂා පදයන් සමාදන්ව රකී. බොහෝ ඇසූපිරූ තැන් ඇත්තේ වේ. දෘෂ්ටියෙන්

ප්‍රතිවේධ කළාහුවෙත්. ප්‍රාතිමොක්ෂ දෙක සූත්‍ර වශයෙන් අකුරු වශයෙන් විස්තරව පාඩම්කළාහු වෙත් බෙදන ලද්දාහු, පවත්වන ලද්දාහු, විනිශ්චය කරණ ලද්දාහු වෙත්. ඇතිවන නඩු සංසිඳුවීමේ දක්ෂවේ. ප්‍රිය වචන කථාකරණ ධර්මකාමියෙක් වේ. ශ්‍රෙෂ්ඨ ධර්මයෙහි ශ්‍රෙෂ්ඨ විනයෙහි මහත් සතුට ඇත්තේවේ. එක් එක් සිවුරු පිඬු සෙනසුන්, ගිලන්පස, බෙහෙත් පිරිකරින් සතුටුවූයේවේ. ඉදිරියට යාමෙහි ආපසු ඊමෙහි ප්‍රසාද එළවන්නේ වේ. ඇතුළුනුවර හිඳීමෙහිද සංවර වූයේ වේ. ශ්‍රෙෂ්ඨ සිතට අයත් මේ ආත්මයෙහි සැප විහරණ ඇති ධ්‍යාන සතර ඉබේ ලබන්නේවේ. පහසුවෙන් ලබන්නේවේ. නිදුකින් ලබන්නේ වේ. ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත සිතින් කෙලෙසුන්ගෙන් මිදීමද ප්‍රඥාවෙන් මිදීමද මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන අත්දැකීමට උසස්බවට පැමිණ වාසය කරයි. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**49. උපාලි වනපත්ථ සූත්‍රය**:- 1. ඉක්බිති ආයුෂ්මත් උපාලි ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි' මම ඈත වනයෙහි දුර සෙනසුන් ආශ්‍රයකරන්ට කැමැත්තෙමියි' කීයේය. උපාලිය, අරණ්‍යයෙහි ඈත වනයෙහි දුර සෙනසුන් නො ලැබිය හැකිවෙයි. උතුම් විවේකය දුෂ්කරය. එකග බවෙහි නො ඇලෙයි. සමෘද්ධිය නොලබන භික්ෂුවගේ සිත් වනයෝ ගනිත් යයි සිතමි. උපාලිය, යම්කිසි කෙනෙක් මම එකගකම නොලබමින් අරණ්‍යයෙහි දුරවනයේ දුර සෙනාසන සේවනය කරමියි මෙසේ කියන්නේය, කිඳෙන්නේය, පාවන්නේය. යන මෙය ඔහු විසින් කැමැතිවිය යුතුයි.

**2.** "උපාලිය, මහ වතුර විලක් යම්සේ වේද, ඉක්බිති සත් රියනක් හෝ අට රියනක් ඇති ඇත් රජෙක් එන්නේද, ඔහුට මේ දිය විලට බැස කණ සේදීමේ ක්‍රීඩාව කරන්නේනම් පිට සෝදන ක්‍රීඩාව කරන්නේ නම් යහපතැයි සිතයි. කණ සේදීමේ,

පිට සේදීමේ කෙළි කෙළ, නා, බී, ගොඩවී යම් තැනක් කැමැත්තේද යන්නේය. හෙතෙම ඒ දිය විලට බැස කණ, පිට සෝදන කෙළි කෙළින්නේය. කණ පිට සෝදන කෙළි කෙළ නා, බී, ගොඩවී යම් තැනක් කැමැත්තේ නම් එහි යන්නේද, ඊට හේතු කවරේද? උපාලිය, ශරීරය ගැඹුරේ නො ගැඹුර විඳියි."

3. "ඉක්බිති හාවෙක් හෝ බළලෙක් හෝ එන්නේය. ඔහුට 'මම කවරෙක්ද? ඇත් රජා කවරෙක්ද? මම මේ දිය විලට බැස කණ, පිට, සෝදන ක්‍රීඩා කෙළින්නෙමි, කණ, පිට, සෝදන ක්‍රීඩාකොට නා, බී, ගොඩවී යම් තැනෙක්හි කැමැත්තේ නම් එහි යන්නේය'යි මෙබඳු සිතක් වන්නේය. හෙතෙම ඒ දිය විල කරා පැමිණ වහා කල්පනා නොකර පනින්නේය. ඔහු කිඳෙන්නේය, පාවෙන්නේය යන මෙය කැමතිවිය යුතුයි. ඊට හේතු කවරේද? උපාලිය, ශරීරය කුඩාය. ගැඹුරෙහි නොගැඹුරු බවක් නොලබයි. උපාලිය, එසේම යමෙක් 'මම සිතේ එකඟකම නොලබා 'අරණ්‍යයෙහි ඈත වනයේ දුර සෙනසුන් සේවනය කරන්නෙමියි මෙසේ කියන්නේ නම් කිඳෙන්නේය. පාවෙන්නේය. යන මෙය ඔහු විසින් බලාපොරොත්තු විය යුතුයි.

4. "උපාලිය, යම්සේ කුඩාවූ උඩුකුරුව සයනය කරණ ළදරු කුමරෙක් ස්වකීය මල මුත්‍ර සමඟ කෙළීද, උපාලිය ඒ කුමකැයි සිතන්නේද? මෙය සම්පූර්ණයෙන් පිරුණු ළදරු සෙල්ලමක් නොවේද?" "ස්වාමීනි, එසේය." "උපාලිය ඒ කුමාරතෙම මෑතභාගයෙහි වැඩීමට පැමිණ ඉන්ද්‍රියයන් මේරීමට පැමිණ කුමරුවන්නේ සෙල්ලම් බඩු දේ ඈද්ද, ඒ මෙසේයි. බිලීකටුය, කුඩා කළය, රූංපෙත්ත, චිංගුලකය, පත්තාළ්හකය, කුඩා රථය, කුඩා දුන්න යන මෙයින් ක්‍රීඩා කරයි. උපාලිය, ඒ කිමකැයි සිතන්නේද? මේ ක්‍රීඩා පෙර ක්‍රීඩාවලට වඩා අතිශයින් යහපත් නොවේද, අතිශයින් ප්‍රණීත නොවේද?" - "ස්වාමීනි, එසේය."

5. "උපාලිය, ඒ කුමාරතෙම මෑත කාලයෙහි වැඩිවිය පැමිණ ඉඳුරන් මේරීමට පැමිණ පස් කම් ගුණයෙන් යුක්ත වූයේ යෙදුනේ යහපත්වූ කාන්තවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වරූප ඇති

කාමයට හේතුවන ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූපයන් පිරිවරයි. නාසයෙන් දතයුතු ගන්ධයන්, දිවින් දතයුතු රසයන්, කයින් දතයුතු ස්පර්ශයන් පිරිවරයි. උපාලිය මේ ක්‍රීඩා පෙර ක්‍රීඩාවලට වඩා අතිශයින් යහපත්ද ප්‍රණීතදැයි සිතන්නෙහිද?” - “ස්වාමීනි, එසේය.”

**6.** “උපාලිය, මේ ලොකයෙහි නව අරහාදී බුදුගුණයෙන් යුත් තථාගතයන් වහන්සේ ලොකයෙහි උපදී. උන්වහන්සේ මාරයා සහිත බ්‍රහ්මයා සහිත ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත දෙවි මිනිසුන් සහිත ප්‍රජාව විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට බණ කියයි. හෙතෙම මුල, මැද, අග යහපත් තේරුම් සහිත අකුරු සහිත හාත්පසින් සම්පූර්ණ ධර්මය දෙශනාකරයි. පිරිසිදු බ්‍රහ්මචර්යය ප්‍රකාශ කරයි.

ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ එක්තරා කුලයක උපන්නෙක් හෝ ඒ ධර්මය අසයි. හෙතෙම ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ඇදහීම ලබයි. හෙතෙම ඒ ඇදහීමෙන් ගිහිගෙයි විසීම හිරිහැර සහිතය. පව්වලට මඟය. පැවිද්ද එලිමහනෙකි. ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්තයෙන් සම්පූර්ණ ඒකාන්තයෙන් පිරිසිදු ලියවනලද සක්ගෙඩියක් මෙන් පිරිසිදු බ්‍රහ්මචර්යයෙහි හැසිරෙන්නට නොහැකියයි මෙසේ කල්පනා කරයි. ‘මම කෙස්, රැවුල් බා කහ රෙදි හැඳ ගිහිගෙන් නික්ම අනගාරික සස්නෙහි පැවිදිවන්නේ නම් හොඳයයි’ සිතයි.

**7.** “හෙතෙම මෑතභාගයෙහි ස්වල්පවූ හෝ වස්තුව හැර මහත්වූ හෝ වස්තුව හැර ස්වල්ප වූ හෝ ඥාති සමූහයා අත්හැර මහත්වූ හෝ ඥාති සමූහයා අත්හැර හිසකෙස් රැවුල් බා කහරෙදි හැඳ ගිහිගෙන් නික්ම අනගාරික නම් ශාසනයෙහි පැවිදිවෙයි. හෙතෙම මෙසේ පැවිදිවූයේම- (මෙතැනට ගතයුතු චුල්ල - මධ්‍යම-මහා ශීලයන් දික්සඟි සාමඤ්ඤඵල සූත්‍රයේ 30 වෙනි ඡේදය යෙදිය යුතුයි.)

**8.** “හෙතෙම කයින් පරිහරණය කරණ සිවුරින්, කුසින් පරිහරණය කරණ පිණ්ඩපාතයෙන් සතුටුවූයේ වේ. යම් යම් තැනකට යන්නේ පාත්‍ර සිවුරු රැගෙනම යයි. යම්සේ පියාපත්

ඇති පක්ෂිතෙමේ යම් යම් තැනකට පියාඹයිද, පියාපත් බර ඇත්තේම පියාඹායේද, එසේ (පාත්‍ර සිවුරු) රැගෙනම යයි. මහණතෙම එසේම කයින් පරිහරණය කරණ සිවුරෙන්ද කුසින් පරිහරණය කරණ පිණ්ඩපාතයෙන් සතුටු වූයේ වේ. යම් යම් තැනකට යයිද රැගෙනම යයි. හෙතෙම මේ ආර්යශීල රාශියෙන් යුක්තවූයේවේ. අධ්‍යාත්මයෙහි නිවැරදි සැපක් විඳියි. (මෙතැනට සාමඤ්ඤඵල සූත්‍රයේ 45, 46 ඡේද යොදාගන්න.)

**9.** "හෙතෙම මේ ආර්ය ශීලස්ඛන්ධයෙන් යුක්තවූයේ මේ ආර්ය ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූයේ මේ ආර්ය සිහියෙන් හා සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ වනයක්, රුක් මුලක්, පර්වතයක්, කඳුරක්, පර්වත ගුහාවක් සොහොනක්, වනබිමක්, එළිමහනක්, පිදුරු ගොඩක් යන විවේක සෙනසුනක් ආශ්‍රය කරයි. හෙතෙම අරණ්‍යයට ගියේ හෝ වෘක්ෂමූලයකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පලක් බැඳ ශරීරය ඍජුව තබා සිහිය ඉදිරිපත්කොට පලක් බැඳ වාඩිවෙයි.

**10.** "හෙතෙම පඤ්චස්කන්ධ ලෝකයෙහි තෘෂ්ණාව අත්හැර පහවූ තෘෂ්ණා ඇති සිතින් වාසය කරයි. සිත තෘෂ්ණාවෙන් පිරිසිදු කරයි. ක්‍රොධය, ද්වෙෂය අත්හැර ව්‍යාපාදයට නොපැමිණි සිතින් වාසය කරයි. සියලු ප්‍රාණීන් භූතයන්ට හිතයෙන් අනුකම්පාවෙන් වාසය කරයි. ව්‍යාපදයෙන් ද්වෙෂයෙන් සිත පිරිසිදුකරයි. සිතේ කයේ නිදිබරකම අත්හැර පහවූ ථීනමිද්ධ ඇතිව ආලොක සංඥාව ඇත්තේ සිහි ඇතිව සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තව වාසය කරයි. සිතේ කයේ නිදිබර ගතියෙන් සිත පිරිසිදු කරයි.

**11.** "එක අරමුණක සිත නොපවත්නා බැවින්ද කළ නොකළ සුචරිත, දුශ්චරිතයන්හි කුකුස අත්හැර උද්ධච්ච නොවූයේ අධ්‍යාත්මයෙහි නොවූයේ සංසිඳුණු සිත් ඇත්තේ විසුරුණු බැවින් හා කුකුසෙන් සිත පිරිසිදු කරයි. සැකය අත්හැර තරණය කළ සැක ඇතිව කුශල ධර්මන්හි කෙසේ දැයි කථා නැතිව වාසය කරයි. සැකයෙන් සිත පිරිසිදු කරයි. හෙතෙම සිතට කිළිටිවූ ප්‍රඥාව දුර්වල කරණ මේ පඤ්චනීවරණ ධර්මයන් අත්හැර

කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. උපාලිය, ඒ කුමකැයි හඟින්නේද? මේ වාසය පෙර වාසයන්ට වඩා අතිශයින් යහපත්ද ප්‍රණීතද නොවන්නේද?" - "ස්වාමීනි එසේය."

12. "උපාලිය, මාගේ ශ්‍රාවකයෝ මේ ධර්මයද තමා කෙරෙහි ලා දකින්නේ වනයෙහි වනගත ප්‍රාන්ත සෙනසුන් ආශ්‍රය කරත්. යම්තාක් නොපැමිණි ස්වාර්ථය ඇත්තෝ වාසය නොකරත්ද, ඒතාක්ය.

13. "උපාලිය, නැවතද මහණතෙම විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් දෙවෙනි ධ්‍යානයට පැමිණ වාසය කෙරේද-

14. "උපාලිය, නැවතද මහණතෙම ප්‍රීතිය පහවීමෙන් තුන්වෙනි ධ්‍යානයට පැමිණ වාසය කෙරේද-

15. "උපාලිය, නැවතද මහණතෙම සැපයාගේ පහවීමෙන්ද- සතරවෙනි ධ්‍යානයට පැමිණ වාසයකෙරේද-

16. "උපාලිය, නැවතද මහණතෙම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ ඉක්මවීමෙන් ක්‍රොධසංඥාවන්ගේ අස්තයට යැවීමෙන් නානාත්ම සංඥාවන්ගේ නො මෙනෙහි කිරීමෙන් ආකාශය අනන්තයයි ආකාශානඤ්චායතනයට පැමිණ වාසය කෙරේද,

17. (මෙහි 9 නිපාතයේ 1 පණ්ණාසකයේ 34 සූත්‍රයේ 8 ඡේදයේ "ඉදින්" යන තැන්හි සිට 12 ඡේදය අවසානය දක්වා යෙදිය යුතුයි. "ඇවැත්නි" වෙනුවට "උපාලිය" විය යුතුයි.)

18. "උපාලිය, ඒ කුමකැයි හඟින්නේද? පූර්ව විහරණයන්ට වඩා මේ විහරණය අතිශයින් යහපත්ද, අතිශයින් ප්‍රණීතද නොවන්නේද?" - "එසේ ස්වාමීනි" "උපාලිය, මගේ ශ්‍රාවකයෝ මෙයද තමා කෙරෙහි දකිමින් වනයෙහි වනගත ප්‍රාන්ත සෙනසුන් ආශ්‍රය කරත්. යම්තාක් නොපැමිණි ස්වාර්ථය ඇතිව වාසය කරත්ද, ඒතාක්ය. උපාලිය දැන් ඔබ සංඝයා කෙරෙහි වාසය කරව. තොපට සංඝයා අතුරෙහි වාසය කිරීමෙන් පහසුවන්නේය."

**50. දස පහාතබ්බධම්ම සූත්‍රය**:- 1. "මහණෙනි, මේ දස ධර්මය අත්නොහැර අර්හත්වය ප්‍රත්‍යක්ෂ කරන්නට නුසුදුසුය.

2. "කවර දසයක්දයත්? රාග, ද්වෙෂ, මොහ, ක්‍රොධ බද්ධවෛර, ගුණමකුකම, උතුමන් තමාට සමකිරීම, ඊර්ෂ්‍යාව, මසුරුකම, මාන්නය යන මේ දසධර්මය අත්නොහැර අර්හත්වය ප්‍රත්‍යක්ෂ කරන්නට නුදුසුය.

3. "මහණෙනි, මේ දස ධර්මය අත්හැර අර්හත්වය ප්‍රත්‍යක්ෂ කරන්නට සුදුසුය.

4. "කවර දසධර්මයක්ද යත්? රාගය, ද්වෙෂය, මොහය ක්‍රොධය, බද්ධවෛරය, ගුණමකුගතිය උතුමන් තමහට සමකර සිතීම, ඊර්ෂයාව, මසුරුකම, මාන්නය, යන මේ ධර්ම දහය අත්හැර අර්හත්වය ප්‍රත්‍යක්ෂ කරන්නට සුදුසුය."

(10 උපාසක වර්ගය නිමි.)

(දෙවෙනි පණ්ණාසකය නිමි.)

---

## තුන්වෙනි පණ්ණාසකය

# 11. සමණ සඤ්ඤා වර්ගය.

**1. සමණ සඤ්ඤා සූත්‍රය**:- 1. මහණෙනි මේ ශ්‍රමණ සංඥා තුනක් වඩන ලද්දාහු බහුල වශයෙන් කරණ ලද්දාහු ධර්ම සතක් සම්පූර්ණ කරත්. කවර තුනක්ද යත්. "වෙනස් වර්ණයකට පැමිණියෙමි. මාගේ ජීවිකාව අනුන් අයත්ය. මා විසින් අනික් ආකාරයක් කටයුතුය.

2. "මහණෙනි, මේ ශ්‍රමණ සංඥා තුන වඩන ලද්දාහු බහුල වශයෙන් කරණ ලද්දාහු ධර්ම සතක් පුරවත්. කවර සතක්ද යත්? නිතර සන්සුන් කටයුතු කරන්නෙක්වේ. සීලයන්හි සන්සුන් පැවැත්ම ඇත්තේවේ. තෘෂ්ණා බහුල කොට නැත්තේවේ, ව්‍යාපාද නැත්තේවේ. අතිමාන්නය නැත්තේවේ. ශික්ෂා කැමැත්තේ වේද, ජීවිතයන්හි හෝ පරිෂ්කාරයන්හි මේ ප්‍රයෝජන

යයි ඔහුට අදහස්වේ. පටන් ගන්නා ලද වීර්ය ඇතිව වාසය කරයි. මහණෙනි, මේ ශ්‍රමණ සංඥා තුන වඩන ලද්දාහු බහුල වශයෙන් කරණ ලද්දාහු මේ ධර්ම සත පුරවත්යයි" වදාළ සේක.

2. **බොජ්ක්ධංග තෙවිජ්ජා සූත්‍රයඃ-** 1. "මහණෙනි, වඩන ලද බහුල වශයෙන් කරණ ලද මේ බොජ්ක්ධංග සත ත්‍රිවිද්‍යාවන් සම්පූර්ණ කරයි. කවර සතක්ද යත්? අවබොධයට කාරණාවූ සිහිය අවබොධයට උපකාරවූ ප්‍රඥාව, අවබොධයට කාරණාවූ වීර්යය, අවබොධයට කාරණාවූ ප්‍රීතිය, සිත කය දෙකේ බර ඇරීම එකඟකම, මැදහත් බව, යන සතයි. වඩන ලද බහුල වශයෙන් කරණ ලද මේ බොජ්ක්ධංය සත ත්‍රිවිද්‍යාවන් සම්පූර්ණ කරත්.

2. කවර විද්‍යාතුනක්ද යත්.? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නානාප්‍රකාර පෙරවිසූ කඳ පිළිවෙළ සිහි කරයි. (මෙහි දසකනිපාතයේ 1 වර්ගයේ 10 සූත්‍රයේ 12 ඡෙදයේ "දනී" යන වචනය දක්වා යෙදිය යුතුයි.)

3. "ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත ඵල සමාධියද ඵල ප්‍රඥාවද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයි. මහණෙනි, මේ වඩන ලද බහුල වශයෙන් කරණ ලද මේ බොජ්ක්ධංග සත මේ ත්‍රිවිද්‍යාවන් සම්පූර්ණ කරත්."

3. **ආරාධන විරාධනා සූත්‍රයඃ-** 1. "මහණෙනි, බොරු බව හෙතුකොටගෙණ වැලැක්ම වේ. සම්පූර්ණවීම නොවේ.

2. "මහණෙනි, කෙසේ බොරුබව හෙතුකොටගෙන වැලැක්ම වේද සම්පූර්ණ වීම නොවේද? මහණෙනි, (ii) වැරදි දැනීම ඇත්තාට වැරදි කල්පනාව සම්පූර්ණවේ. වැරදි කල්පනා ඇත්තාට වැරදි වචන සම්පූර්ණවේ. වැරදි වචන ඇත්තාට වැරදි කර්මාන්ත සම්පූර්ණවේ. වැරදි කර්මාන්ත ඇත්තාට වැරදි ජීවිකාව සම්පූර්ණ වේ. වැරදි ජීවිකාව ඇත්තාට වැරදි වෑයම සම්පූර්ණවේ. වැරදි වෑයම් ඇත්තාට වැරදි එකඟකම සම්පූර්ණවේ. වැරදි එකඟකම් ඇත්තාට වැරදි නුවණ

සම්පූර්ණවේ. වැරදි නුවණ ඇත්තාට වැරදි මිදීම සම්පූර්ණවේ. (iii) මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, පුරණ ලද බව හේතුකොටගෙන සම්පූර්ණවීමවේ. වැලැක්ම නොවේ. මහණෙනි, පුරණ ලද බව හෙතුකොට ගෙන කෙසේ සම්පූර්ණ වේද වැලැක්ම නොවේද? මහණෙනි, (ii) සම්‍යක් දෘෂ්ටිකයාට සම්‍යක් කල්පනාව සම්පූර්ණවේ. සම්‍යක් කල්පනාව ඇත්තාට සම්‍යක් වචන සම්පූර්ණවේ. සම්‍යක් වචන ඇත්තාට සම්‍යක් කර්මාන්ත සම්පූර්ණවේ. සම්‍යක් කර්මාන්ත ඇත්තාට සම්‍යක් ජීවිකාව සම්පූර්ණවේ, සම්‍යක් ජීවිකාව ඇත්තාට සම්‍යක් වෑයම සම්පූර්ණවේ, සම්‍යක් වෑයම ඇත්තාට සම්‍යක් එකඟකම සම්පූර්ණවේ. සම්‍යක් එකඟකම ඇත්තාට සම්‍යක් නුවණ සම්පූර්ණවේ, සම්‍යක් නුවණ ඇත්තාට සම්‍යක් මිදීම සම්පූර්ණවේ, (ii) මහණෙනි, පුරණ ලද බව හේතුකොට ගෙන සම්පූර්ණවීමවේ වැලැක්ම නොවේ."

4. **බීජොපම සූත්‍රයː**- 1. "මහණෙනි, වැරදි දැනීම ඇති වැරදි කල්පනා ඇති වැරදි වචන ඇති වැරදි කර්මාන්ත ඇති වැරදි ජීවිකාව ඇති වැරදි වෑයම් ඇති වැරදි සිහිය ඇති වැරදි එකඟ බව ඇති වැරදි නුවණ ඇති වැරදි මිදීම ඇති පුරුෂ පුද්ගලයා විසින් යම් කාය කර්මයක් දෘෂ්ටිය අනුව පුරණලද්දේවේද, සමාදන් වන ලද්දේවේද, යම් වාක්කර්මයක් දෘෂ්ටිය අනුව පුරණ ලද්දේවේද සමාදන් වන ලද්දේවේද යම් මනඃ කර්මයක් දෘෂ්ටිය අනුව පුරණ ලද්දේවේද, සමාදන්වන ලද්දේවේද යම් චේතනාවක් යම් ප්‍රාර්ථනාවක් යම් සිත පිහිටුවීමක් යම් සංස්කාරයක්වේද, (ii) ඒ සියලු ධර්මයෝ අයහපත පිණිස අකාන්ත බව පිණිස, නොමනාප බව පිණිස, අහිත පිණිස, දුක් පිණිස පවතිත්. ඊට හෙතු කවරේද මහණෙනි, දෘෂ්ටිය ලාමක බැවිනි.

2. "මහණෙනි, යම්සේ කොසඹ බීජයක් හෝ වැටකොළු බීජයක් හෝ තිත්තලබු බීජයක් හෝ තෙත් පෘථුවියෙහි බහලන ලද්දේ යම් බඳු පෘථුවි රසයක් ඇද ගනීද යම් දියර රසයක්

ඇදගනීද, ඒ සියල්ල තිත්ත බව පිණිස කුළු රස පිණිස අයහපත් බව පිණිස පවතී ඊට හෙතු කවරේද? මහණෙනි, බීජය ලාමකය මහණෙනි, එසේම මිත්‍ථ්‍යාදෘෂ්ටික පුරුෂ පුද්ගලයා විසින් මිත්‍ථ්‍යා කල්පනා සහිත වැරදි වචන ඇති වැරදි කර්මාන්ත ඇති වැරදි ජීවිකාව ඇති වැරදි වෑයම් ඇති වැරදි සිහිය ඇති වැරදි එකග බව ඇති වැරදි නුවණ ඇති වැරදි මිදීම ඇති පුරුෂ පුද්ගලයා විසින් යම් කාය - වාක් - මනඃ කර්මයක් යම් චෙතනාවක් යම් ප්‍රාර්ථනාවක් යම් සිත පිහිටුවීමක් යම් සංස්කාරයක් සම්පූර්ණ කරණ ලද්දේද සමාදන්වන ලද්දේද, (ii) (මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

3. "මහණෙනි, සම්‍යක් දෘෂ්ටික පුරුෂ පුද්ගලයා විසින්- සම්‍යක් සංකල්ප, සම්‍යක් වාචා, සම්‍යක් කර්මාන්ත සම්‍යක් ආජීව, සම්‍යක් වායාම, සම්‍යක් සති, සම්‍යක් සමාධි සම්‍යක් ඤාණ, සම්‍යක් විමුක්ති ඇති පුරුෂ පුද්ගලයා විසින් යම් කාය, වාක්, මනඃ කර්මයක් සම්පූර්ණ කරණ ලද්දේද, සමාදන්වන ලද්දේද, යම් චෙතනාවක් යම් ප්‍රාර්ථනාවක් යම් සිත පිහිටුවීමක් යම් සංස්කාරයක්වේද, ඒ සියලු ධර්මයෝ යහපත පිණිස, කාන්ත බව පිණිස, මනවඩන බව පිණිස හිත පිණිස, සැප පිණිස පවතිත්. ඊට හෙතුව කවරේද? මහණෙනි, දෘෂ්ටිය යහපත් බැවිනි.

"මහණෙනි, යම්සේ උක් කරටියක් හෝ හැල් බීජයක් හෝ මිදි ඇටයක් හෝ තෙත් පොළොවෙහි බහාලන ලද්දේ යම් පෘථුවි රසයක්ගනීද, දියරගතියක්ගනීද, ඒ සියල්ල යහපත් බව පිණිස, මිහිරිබව පිණිස, ඉසියයුතු බවට පැමිණේද,. ඊට හෙතුකවරේද? මහණෙනි, බීජයේ යහපත් බවයි, මහණෙනි එසේම සම්‍යක් දෘෂ්ටියෙන්යුත් (මෙහි 3 යෙදිය යුතුයි.)

**5. පුබ්බංගම ධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, අකුශල ධර්මයන්ට අවිද්‍යාව පෙරටුවයයි. ලජ්ජානැතිකම හා භය නැතිකම සමාපත්තිය අනුවවේ. මහණෙනි අවිද්‍යාවට බැසගත් මෝඩයාට මිත්‍ථ්‍යා දෘෂ්ටිය සම්පූර්ණවේ. (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.)

2. "මහණෙනි, කුශල ධර්මයන්ට විද්‍යාව පෙරටුවේ. ලජ්ජාභය දෙක සමවැදීමට අනුවයි. මහණෙනි, විද්‍යාවට අසුවූ ඤාණවන්තයාට සම්‍යක් දෘෂ්ටිය සම්පූර්ණවේ. (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.)

**6. නිජ්ජර වත්ථු සූත්‍රය**:- 1. "මහණෙනි, මේ විනාශ කරණ ධර්ම දහයක්වෙත්. කවර දහයක්ද යත්.

2. "මහණෙනි, සම්‍යක් දෘෂ්ටිකයා විසින් මිත්‍ථ්‍යා දෘෂ්ටිය, විනාශ කරණ ලද්දේවේ. මිත්‍ථ්‍යාදෘෂ්ටි හෙතුවෙන් නොයෙක් යම්ලාමක අකුශල ධර්මකෙනෙක් හටගනිද්ද, ඔහුට ඔවුන්ද විනාශවූවාහු වෙත්. සම්‍යක් දෘෂ්ටි හෙතුවෙන් නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණ බවට යත් 3 - 11 (මෙසේද මේ සූත්‍රයේ 2 ඡෙදය මෙන් වෙත්. "දෘෂ්ටික" වෙනුවට "සංකල්ප," "වාචක," "කම්ම," "ජීවික," "වායාම්," "සති" "නුවණ," "මිදීම," යෙදීනේ ඒ ඒ ඡෙද සකස්කර ගතයුතුයි. මහණෙනි මේ දසය විනාශකාරී ධර්ම දහයයි."

**7. අරිය ධොවන සූත්‍රය**:- 1. "මහණෙනි, දක්ෂිණ ජනපදයන්හි ධොවන නම් නුවරක් ඇත. එහි ආහාර, පාන, කෑම්, බීම්, ලෙවීම්, පෙවීම් නැවීම් ගීකීම් වැයීම් ඇත්තේය. ධොවනයෙහි මෙය නැත්තේ නොවේයයි කියමි. මහණෙනි, මේ ධොවන නම් නුවරක් ඇත. මහණෙනි, ඒ ධොවනයද ලාමකය, ග්‍රාම්‍යය, පෘථග්ජනයන්ට අයත්ය. ආර්යයන්ට අයත් නොවේ. අනර්ථය මිශ්‍රය, කලකිරීම පිණිසවේ. නොඇලීම පිණිස නොවේ. නිරුද්ධිය පිණිස නොවේ. සංසිඳීම පිණිස නොවේ. විශිෂ්ට ඥානය පිණිස නොවේ. සම්බොධිය පිණිස නොවේ, නිර්වාණය පිණිස නොපවතී.

2. "මහණෙනි, මම වනාහි යම් සේදීමක් එකාන්තයෙන් සසර කලකිරීම පිණිස නොඇලීම පිණිස, නිරුද්ධිය පිණිස ක්ලෙශ ව්‍යපසමය පිණිස, විශිෂ්ට ඤාණය පිණිස මනා අවබොධය පිණිස, නිවණ පිණිස පවතීද, ඒ ආර්ය ධොවනය ප්‍රකාශකරමි. යම් සේදීමකට පැමිණ ඉපදීම ස්වභාවකොට ඇති

සත්වයෝ ඉපදීමෙන් මිදෙත්ද, ජරාව ස්වභාවකොට ඇති සත්වයෝ ජරාවෙන් මිදෙත්ද, මරණය ස්වභාවකොට ඇති සත්වයෝ මරණයෙන් මිදෙත්ද, ශොකය වැළපීමය කායිකදුක මානසික දොමනස දැඩිවෙහෙස ස්වභාව කොට ඇති සත්වයෝ ශොකය, වැළපීම, දුක්, දොම්නස් දැඩි ශොකවලින් මිදෙත්ද, එය අසව් මනාකොට මෙනෙහි කරව් කියන්නෙමියි" වදාළසේක. "ස්වාමීනි එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

3. "මහණෙනි, යම් සේදීමක් ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරුද්ධිය පිණිස කෙලේශ ව්‍යපසමය පිණිස විශිෂ්ට ඥානය පිණිස, මනා අවබොධය පිණිස නිර්වාණය පිණිස පවතීද, යම් සේදීමකට පැමිණ ඉපදීම ස්වභාවකොට ඇති සත්වයෝ ඉපදීමෙන් මිදෙත්ද, ජරාව ස්වභාවකොට ඇති සත්වයෝ ජරාවෙන් මිදෙත්ද, මරණය ස්වභාවකොට ඇති සත්වයෝ මරණින් මිදෙත්ද, ශොකය වැළපීමය කායික දුක මානසික දොම්නස, දැඩිවෙහෙස ස්වභාව කොට ඇති සත්වයෝ ශොක වැළපීම් දුක් දොම්නස් දැඩි ශොකවලින් මිදෙත්ද, ඒ ආර්ය ධොවනය කවරේද?

4. "මහණෙනි, සම්‍යක් දෘෂ්ටිකයාට මිත්‍ථ්‍යා දෘෂ්ටිය පිරිසිදු කරන්නීවේ. මිත්‍ථ්‍යා දෘෂ්ටි හෙතුවෙන් (ii) යම් නොයෙක් ලාමක අකුශල ධර්මයෝ උපදිත්ද. ඔහුට ඔවුන්ද පිරිසිදුවූවාවේ (iii) සම්‍යක් දෘෂ්ටි හෙතුවෙන්ද (iv) නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන් පිරීමට යත්.

5. "මහණෙනි, යහපත් කල්පනා ඇත්තාහට වැරදි කල්පනාව පිරිසිදුවූයේවේ වැරදි කල්පනාවේහේතුවෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) යහපත් කල්පනාවේ හේතුවෙන් (මෙහි 4 (iv) යෙදිය යුතුයි.)

6. "මහණෙනි, යහපත් වචන ඇත්තාහට වැරදිවචන පිරිසිදුවූවාවේ. වැරදි වචනයන්ගේ හේතුවෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) යහපත් වචනයන්ගේ හේතුවෙන් (මෙහි 4 (iv) යෙදිය යුතුයි.)

7. "මහණෙනි, යහපත් කර්මාන්ත ඇත්තාහට වැරදි කර්මාන්ත පිරිසිදු වූයේවේ. වැරදි කර්මාන්තයන්ගේ හේතුවෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) යහපත් කර්මාන්තයන්ගේ හේතුවෙන් (මෙහි 4 (iv) යෙදිය යුතුයි.

8. "මහණෙනි, යහපත් ජීවිකාව ඇත්තාහට වැරදි ජීවිකාව පිරිසිදුවූයේවේ. වැරදි ජීවිකාවේ හේතුවෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) යහපත් ජීවිකාවේ හේතුවෙන් (මෙහි 4 (iv) යෙදිය යුතුයි.)

9. "මහණෙනි, යහපත් වීර්ය ඇත්තාහට වැරදි වීර්ය පිරිසිදුවූයේවේ. වැරදි වීර්යයේ හේතුවෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) යහපත් වීර්යයේ හේතුවෙන් (මෙහි 4 (iv) යෙදිය යුතුයි.)

10. "මහණෙනි, යහපත් සිහිය ඇත්තාහට වැරදි සිහිකිරීම් පිරිසිදුවූයේවේ. වැරදි සිහිකිරීමේ හේතුවෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි. යහපත් සිහිකිරීමේ හේතුවෙන් (මෙහි 4 (iv) යෙදිය යුතුයි.)

11. "මහණෙනි, යහපත් සමාධිය ඇත්තාහට වැරදි සමාධිය පිරිසිදුවූයේවේ. වැරදි සමාධියේ හේතුවෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) යහපත් සමාධියේ හේතුවෙන් (මෙහි 4 (iv) යෙදිය යුතුයි.)

12. "මහණෙනි, යහපත් නුවණ ඇත්තාහට වැරදි නුවණ පිරිසිදුවූයේවේ. වැරදි නුවණේ හේතුවෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) යහපත් නුවණේ හේතුවෙන් (මෙහි 4 (iv) යෙදිය යුතුයි.)

13. "මහණෙනි, යහපත්මිදීම ඇත්තාහට වැරදිමිදීම පිරිසිදුවූවාවේ. වැරදි මිදීම් හේතුවෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) යහපත් මිදීම් හෙතුවෙන් (මෙහි 4 (iv) යෙදිය යුතුයි.)

14. "මහණෙනි, යම් දෙවීමක් එකාන්තයෙන් කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරුධිය පිණිස ක්ලෙශ ව්‍යපසමය පිණිස විශිෂ්ටඥානය පිණිස මනා අවබොධය පිණිස නිර්වාණය පිණිස පවතීද යම් සේදීමකට පැමිණ ඉපදීම ස්වභාවකොට ඇති සත්වයෝ ඉපදීමෙන් මිදෙත්ද, ජරාව ස්වභාවකොට ඇති

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සත්වයෝ ජරාවෙන් මිදෙත්ද, මරණය ස්වභාවකොට ඇති සත්වයෝ මරණින් මිදෙත්ද, ශොකය වැළපීමය කායිකදුක මානසික දොම්නස දැඩි වෙහෙස ස්වභාවකොට ඇති සත්වයෝ ඉන් මිදෙත්ද, මහණෙනි මේ ආර්ය ධොවනයයි."

8. **අරිය විරෙචන සූත්‍රය**:- 1. "මහණෙනි, පිතින් උපන් ලෙඩ සංසිඳවීම පිණිසද, සෙමෙන් උපන් ලෙඩ සංසිඳවීම පිණිසද, වාතයෙන් උපන් ලෙඩ සංසිඳවීම පිණිසද වෛද්‍යවරයෝ විරේක දෙත්. මහණෙනි, මේ විරේකය ඇතැයි කියමි. මෙය නැතැයි නොකියමි. මහණෙනි, ඒ විරේචනය හරියයිද වේ, වරදියිද වේ. මහණෙනි, මම යම් විරේකයක් හරියාද නොවරදීද, යම් විරේකයකට පැමිණ ඉපදීම ස්වභාව කොට ඇති සත්වයෝ ඉපදීමෙන් මිදෙත්ද, ජරාව, මරණය ස්වභාවකොට ඇති සත්වයෝ ඉන් මිදෙත්ද, ඒ ආර්ය විරේචනය දෙසන්නෙමි. එය අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි" වදාළසේක. "ස්වාමීනි එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම් විරේකයක් හරියාද නොවරදීද යම් විරේකයකට පැමිණ ඉපදීම ස්වභාවකොට ඇති සත්වයෝ ඉපදීමෙන් මිදෙත්ද, ජරාවෙන්, මරණයෙන් මිදෙත්ද ඒ ආර්ය විරේචනය කවරේද?

3. "මහණෙනි, සම්‍යක් දෘෂ්ටිකයාට මිත්‍ථ්‍යා දෘෂ්ටිය විරේකවූයේ වේ. මිත්‍ථ්‍යාදෘෂ්ටි හේතුවෙන් (ii) යම් නොයෙක් අකුශල ධර්ම පහළවෙත්ද, ඔවුන්ද ඔහුට විරේකවූවාහු වෙත්. (iii) සම්‍යක් දෘෂ්ටි හේතුවෙන් (iv) නොයෙක් කුශල ධර්මයන්ද වැඩීමෙන් සම්පූර්ණ වෙත්.

4. "මහණෙනි, යහපත් කල්පනා ඇත්තාහට වැරදි කල්පනාව විරේකවූයේ වේ. වැරදි කල්පනාවේ හේතුවෙන් (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) යහපත් කල්පනාවේ හේතුවෙන් (මෙහි 3 (iv) යෙදිය යුතුයි.)

5. "මහණෙනි, යහපත් වචන ඇත්තාහට වැරදි වචන විරේකවූයේ වේ. වැරදි වචනයන්ගේ හේතුවෙන් (මෙහි 3 (ii)

යෙදිය යුතුයි.) යහපත් වචනයන්ගේ හේතුවෙන් (මෙහි 3 (iv) යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, යහපත් කර්මාන්ත ඇත්තාහට වැරදි කර්මාන්ත විරේකවූයේ වේ. වැරදි කර්මාන්තයන්ගේ හේතුවෙන් (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) යහපත් කර්මාන්තයන්ගේ හේතුවෙන් (මෙහි 3 (iv) යෙදිය යුතුයි.)

**7.** "මහණෙනි, යහපත් ජීවිකාව ඇත්තාහට වැරදි ජීවිකාව විරේකවූයේ වේ. වැරදි ජීවිකාවේ හේතුවෙන් (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) යහපත් ජීවිකාවේ හේතුවෙන් (මෙහි 3 (iv) යෙදිය යුතුයි.)

**8.** "මහණෙනි, යහපත් සිහිය ඇත්තාහට වැරදි සිහිය විරේකවූයේ වේ. වැරදි සිහියේ හේතුවෙන් (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) යහපත් සිහියේ හේතුවෙන් (මෙහි 3 (iv) යෙදිය යුතුයි.)

**9.** "මහණෙනි, යහපත් සමාධිය ඇත්තාහට වැරදි සමාධිය විරේකවූයේ වේ. වැරදි සමාධියේ හේතුවෙන් (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) යහපත් සමාධියේ හේතුවෙන් (මෙහි 3 (iv) යෙදිය යුතුයි.)

**10.** "මහණෙනි, යහපත් නුවණ ඇත්තාහට වැරදි නුවණ විරේකවූයේ වේ. වැරදි නුවණේ හේතුවෙන් (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) යහපත් නුවණේ හේතුවෙන් (මෙහි 3 (iv) යෙදිය යුතුයි.)

**11.** "මහණෙනි, යහපත් මිදීම ඇත්තාහට වැරදි මිදීම විරේකවූයේ වේ. වැරදි මිදීම් හේතුවෙන් (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) යහපත් මිදීම් හේතුවෙන් (මෙහි 3 (iv) යෙදිය යුතුයි.)

**12.** "මහණෙනි, යම් විරේකයක් හරියාද, හරිනොයාද, යම් විරේකයකට පැමිණ ඉපදීම ස්වභාවකොට ඇති සත්වයෝ ඉපදීමෙන් මිදෙත්ද ජරාව, මරණය, ශෝකය, වැළපීම, දුක, දොම්නස, දැඩි ආයාස ස්වභාව කොට ඇති සත්වයෝ ඉන් මිදෙත්ද, මේ ඒ ආර්ය විරේචනයයි.

**9. අරියවමන සූත්‍රයඃ-** (මේ සූත්‍රය 8 සූත්‍රය මෙනි. එහි "විරේක" වෙනුවට "වැමෑරීම්" යෙදිය යුතුයි.)

**10. නිද්ධමනීයධම්ම සූත්‍රය**:- 1. මහණෙනි, මේ පිට කළයුතු ධර්ම දහයක් වෙත්. කවර දහයක්ද යත්?

**2.** "මහණෙනි, සම්‍යක් දෘෂ්ටිකයාහට මිත්‍ථ්‍යාදෘෂ්ටිය පිටකළා වේ මිත්‍ථ්‍යාදෘෂ්ටි හේතුවෙන් (ii) යම් නොයෙක් ලාමක අකුශල ධර්මයෝ පහළ වෙත්ද, ඔවුන්ද ඔහු විසින් පහකළාහුවෙත් (iii) සම්‍යක් දෘෂ්ටි හේතුවෙන් (iv) නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණවීමට යත්.

**3.** "මහණෙනි, යහපත් කල්පනා ඇත්තාහට වැරදි කල්පනාව පිටකළා වේ. වැරදි කල්පනාවේ හේතුවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) යහපත් කල්පනාවේ හේතුවෙන් (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

**4.** "මහණෙනි, යහපත් වචන ඇත්තාහට වැරදි වචන පිටකළා වේ. වැරදි වචනයන්ගේ හේතුවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි) යහපත් වචනයන්ගේ හේතුවෙන් (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

**5.** "මහණෙනි, යහපත් කර්මාන්ත ඇත්තාහට වැරදි කර්මාන්ත පිටකළාවේ. වැරදි කර්මාන්තයන්ගේ හේතුවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි) යහපත් කර්මාන්තයන්ගේ හේතුවෙන් (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, යහපත් ජීවිකාව ඇත්තාහට වැරදි ජීවිකාව පිටකළා වේ. වැරදි ජීවිකාවේ හේතුවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි) යහපත් ජීවිකාවේ හේතුවෙන් (මෙහි 2 (iv) යෙදිය යුතුයි.

**7.** "මහණෙනි, යහපත් වීර්යය ඇත්තාහට වැරදි වීර්යය පිටකළා වේ. වැරදි වීර්යයේ හේතුවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) යහපත් වීර්යයේ හේතුවෙන් (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

**8.** "මහණෙනි, යහපත් සිහිය ඇත්තාහට වැරදි සිහිය පිටකළා වේ. වැරදි සිහියේ හේතුවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි) යහපත් සිහියේ හේතුවෙන් (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

**9.** "මහණෙනි, යහපත් සමාධිය ඇත්තාහට වැරදි සමාධිය පිටකළා වේ. වැරදි සමාධියේ හේතුවෙන් (මෙහි 2 (ii) යෙදිය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යුතුයි.) යහපත් සමාධියේ හේතුවෙන් (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

**10.** "මහණෙනි, යහපත් නුවණ ඇත්තාහට වැරදි නුවණ පිටකළා වේ. වැරදි නුවණේ හේතුවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) යහපත් නුවණේ හේතුවෙන් (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

**11.** "මහණෙනි, යහපත් මිදීම ඇත්තාහට වැරදි මිදීම පිටකළා වේ. වැරදි මිදීම් හේතුවෙන් නොයෙක් ලාමක අකුශල ධර්මයෝ පහළවෙත්ද, ඔවුන්ද ඔහු විසින් පිටකළාහු වෙත්. යහපත් මිදීම් හේතුවෙන්ද නොයෙක් කුශලධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණවීමට යත්. මහණෙනි, මේ දසය පිටකළ යුතු ධර්මයෝය.

**11. දස අසෙක්ඛ ධම්ම සූත්‍රය:-** 1. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේට, "ස්වාමීනි, අශෛඛය අශෛඛයයි කියයි. ස්වාමීනි, කොපමණකින් අශෛඛවේදැයි" ඇසීය.

2. "මහණ, මේ ශාසනයෙහි මහණතෙම අශෛක්ෂ (ශික්ෂාව අවසන්කළ) සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූයේ වේද, අශෛක්ෂ සම්‍යක් සංකල්පනාවෙන් යුක්තවූයේ වේද, අශෛක්ෂ සම්‍යක් වචනයෙන් යුක්තවූයේ වේද, අශෛක්ෂ සම්‍යක් කර්මාන්තයෙන් යුක්තවූයේ වේද, අශෛක්ෂ සම්‍යක් ජීවිකාවෙන් යුක්තවූයේ වේද, අශෛක්ෂ සම්‍යක් වෑයමින් යුක්තවූයේ වේද, අශෛක්ෂ සම්‍යක් සමාධියෙන් යුක්තවූයේ වේද අශෛක්ෂ සම්‍යක් ඤාණයෙන් යුක්තවූයේ වේද, අශෛක්ෂ සම්‍යක් මිදීමෙන් යුක්තවූයේ වේ. මහණෙනි මෙසේ වනාහි මහණතෙම අශෛක්ෂ වේයයි වදාළසේක."

**12. දස අසෙඛිය ධම්ම සූත්‍රය:-** 1. "මහණෙනි, මේ අශෛක්ෂ ධර්ම දහයෙකි. කවර දසයක්ද යත්? අශෛක්ෂ සම්‍යක් දෘෂ්ටිය, අශෛක්ෂ සම්‍යක් සංකල්පනාවය, අශෛක්ෂ සම්‍යක් වචනය, අශෛක්ෂ සම්‍යක් කර්මාන්තය, අශෛක්ෂ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සම්‍යක් ආජීවය, අශෛක්ෂ සම්‍යක් වීර්‍යය, අශෛක්ෂ සම්‍යක් ස්මෘතිය, අශෛක්ෂ සම්‍යක් සමාධිය, අශෛක්ෂ සම්‍යක් ඥානය, අශෛක්ෂ මිදීමය යන මේ දශය මහණෙනි, අශෛක්ෂ ධර්මයෝයි.”

(පළමුවෙනි සංඥා වර්ගය නිමි.)

---

## 12. පච්චෝ රෝහණී වර්ගය.

13. **අධම්මානත්ථ සූත්‍රය:-** 1. “මහණෙනි අධර්මයද අනර්ථයද දතයුතුය, ධර්මයද අර්ථයද දතයුතුයි. අධර්මයද අනර්ථයද දැන, ධර්මයද අර්ථයද දැන, ධර්මය යම්සේද අර්ථය යම්සේද එසේ පිළිපැදිය යුතුයි.

2. “මහණෙනි, අධර්මයද, අනර්ථයද කවරේද? වැරදි දැකීම වැරදි සිතීම, වැරදි කතාව වැරදි ක්‍රියාව, වැරදි පැවැත්ම, වැරදි වෑයම, වැරදි සිහිය, වැරදි සමාධිය, වැරදි දැනුම, වැරදි මිදීමය, මහණෙනි, මේ අධර්මයද අනර්ථයදවේ.

3. “මහණෙනි, ධර්මයද අර්ථයද කවරේද? නිවැරදි දැකීම, නිවැරදි සිතීම, නිවැරදි කථාව, නිවැරදි ක්‍රියාව, නිවැරදි පැවැත්ම, නිවැරැදි වෑයම්, නිවැරැදි සිහිය, නිවැරැදි සිත එකඟකම, නිවැරැදි දැනුම, නිවැරැදි මිදීම යන මේ මහණෙනි, ධර්මයද අර්ථයදැයි කියනු ලැබේ.

4. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.) මෙසේ ඒ යමක් කියන ලද්දේද මෙය ඒ සඳහා කියනලදී.

14. **ධම්මාධම්ම සූත්‍රය:-** 1. “මහණෙනි, අධර්මයද ධර්මයද දතයුතුය. අනර්ථයද අර්ථයද දතයුතුය. අධර්මයද ධර්මයද දැන අනර්ථයද අර්ථයද දැන, ධර්මය අනුව අර්ථය අනුව එසේ පිළිපැදිය යුතුය.

2. “මහණෙනි, අධර්මය කවරේද ධර්මය කවරේද? අනර්ථය කවරේද අර්ථය කවරේද? මහණෙනි, වැරදි දැකීම අධර්මයයි. නිවැරැදි දැකීම ධර්මයමයි. වරදවා දැකීම නිසා නොයෙක්

ලාමක අකුශල ධර්මයෝ පහළවෙත්. මේ අනර්ථයයි. නිවැරැදි දැකීම නිසා නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණවීමට යත්. මේ අර්ථයයි.

3. "මහණෙනි, වැරදි සිතීම අධර්මයයි. නිවැරැදි සිතීම ධර්මයයි. වැරදි සිතීම නිසා නොයෙක් ලාමක අකුශල ධර්මයෝ පහළවෙත් මේ අනර්ථයයි. නිවැරැදි සිතීම නිසා නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණභාවයට යත්, මේ අර්ථයයි.

4. "මහණෙනි, කථාව අධර්මයයි. නිවැරැදි කථාව වැරදි ධර්මයමය. නිවැරදි කථාව නිසා නොයෙක් ලාමක අකුශලධර්මයෝ පහළවෙත්. මේ අනර්ථයයි. නිවැරදි කථාව නිසා නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන්, සම්පූර්ණ බවට යත්. මේ අර්ථයයි.

5. "මහණෙනි, වැරදි ක්‍රියාව අධර්මයයි. යහපත් ක්‍රියාව ධර්මයමයි. වැරැදි ක්‍රියාව නිසා නොයෙක් ලාමක අකුශල ධර්මයෝ පහළවෙත්. මේ අනර්ථයයි. නිවැරැදි ක්‍රියාව නිසා නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණ බවටයත්. මේ අර්ථයයි.

6. "මහණෙනි, වැරදි පැවැත්ම අධර්මයයි, නිවැරදි පැවැත්ම ධර්මයයි. වැරදි පැවැත්ම නිසා නොයෙක් ලාමක අකුශල ධර්මයෝ පහළවෙත්. මේ අනර්ථයයි. නිවැරදි පැවැත්ම නිසා නොයෙක් කුශලධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණ වීමට යත්. මේ අර්ථයයි.

7. "මහණෙනි, වැරදි වෑයම අධර්මයයි. නිවැරදි වෑයම ධර්මයමයි. වැරදි වෑයම නිසා නොයෙක් ලාමක අකුශල ධර්මයෝ පහළවෙත්. මේ අනර්ථයයි නිවැරදි වෑයම නිසා නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණ භාවයට යත්. මේ අර්ථයයි.

8. "මහණෙනි, වැරදි සිහිය අධර්මයයි. නිවැරදි සිහිය ධර්මයයි. වැරදි සිහිය නිසා නොයෙක් ලාමක අකුශල ධර්මයෝ පහළවෙත්. මේ අනර්ථයයි. නිවැරැදි සිහිය නිසා නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණ බවට යත්. මේ අර්ථයයි.

**9.** "මහණෙනි, නිවැරැදි සිත එකඟකිරීම අධර්මයයි, නිවැරැදි සිත එකඟකිරීම ධර්මයයි, වැරදි සිත එකඟකිරීම නිසා නොයෙක් ලාමක අකුශල ධර්මයෝ පහළවෙත්. මේ අනර්ථයයි, නිවැරදි සිත එකඟකිරීම නිසා නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණ බවට යත්. මේ අර්ථයයි.

**10.** "මහණෙනි, වැරැදි නුවණ අධර්මයයි. නිවැරදි නුවණ ධර්මයයි. වැරැදි නුවණ නිසා නොයෙක් ලාමක අකුශල ධර්මයෝ උපදිත්. මේ අර්ථයයි නිවැරදි නුවණ නිසා නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණ වීමට යත්. මේ අර්ථයයි.

**11.** "මහණෙනි, වැරදි මිදීම අධර්මයයි යහපත් මිදීම ධර්මයයි. වැරැදි මිදීම නිසා නොයෙක් ලාමක අකුශලධර්මයෝ පහළවෙත්. මේ අනර්ථයයි නිවැරදි මිදීම නිසා නොයෙක් කුශල ධර්මයෝ පහළවෙත් මේ අර්ථයයි.

**12.** (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.) මෙසේ යමක් කියන ලද්දේද එය මේ සඳහා කියන ලදී.

**13.** "මහණෙනි, අධර්මයද ධර්මයද දතයුතුය, අනර්ථයද අර්ථයද දතයුතුය, අධර්මයද ධර්මයද දැන අනර්ථයද අර්ථයද දැන ධර්මය යම්සේද අර්ථය යම්සේද එසේ පිළිපැදිය යුතුයි" භාග්‍යවතුන් වහන්සේ වදාළසේක, මෙය වදාරා අස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.

**15. ආනන්ද ධම්මාධම්ම සූත්‍රයː-** 1. ඉක්බිති, භාග්‍යවතුන් වහන්සේ වැඩ නොබෝ වේලාවකින් ඒ භික්ෂූන්ට මෙබඳු සිතක් විය. ඇවැත්නි අපට (ii) භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, අධර්මයද දත යුතුය ධර්මයද දතයුතුය. අනර්ථයද අර්ථයද දතයුතුය. අධර්මයද ධර්මයද දැන, අනර්ථයද අර්ථයද දැන, අධර්මය යම්සේද අර්ථය යම්සේද එසේ පිළිපැදිය යුතුයයි යන යමක් සංක්ෂේපයෙන් වදාරා විස්තර වශයෙන් තේරුම්කර නොදී අස්නෙන් නැගිට විහාරයට වැඩිසේක්ද, (iii) භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් වදාරන ලද විස්තර වශයෙන් අර්ථය නොබෙදන ලද මෙහි අර්ථය කවරෙක් විස්තර වශයෙන් බෙදන්නේ දැයි කියාය.

2. "ඉක්බිති මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ විසින්මද මනාව වර්ණනා කරන ලද්දේය. සම්භාවනා කරන ලද්දේය. භාග්‍යවතුන් වහන්සේ විසින් විස්තර වශයෙන් අර්ථය නොබෙදන ලද කොටින් වදාරන ලද ධර්මයෙහි විස්තර වශයෙන් නුවණැති සබ්‍රම්සරුන්ට අර්ථය බෙදා දක්වන්නට සුදුසුය. ඒකාන්තයෙන් අපි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණෙන්නෙමු; පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගෙන් මේ කාරණය විචාරන්නෙමු නම් යෙහෙකැයි සිතූහ. අපට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම්සේ ප්‍රකාශ කරන්නේද එසේ අපි දරන්නෙමුයි,' කීවාහුය.

3. ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවූවාහුය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක සිටි ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ඇවැත්නි ආනන්දයෙනි, අපට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, අධර්මයද දතයුතුය, ධර්මයද දතයුතුය, අනර්ථයද අර්ථයද දතයුතුය; අධර්මයද ධර්මයද දැන, අනර්ථයද අර්ථයද දැන, ධර්මය අර්ථය යම්සේද, එසේ පිළිපැදිය යුතුයයි. කොටින් වදාරා විස්තර වශයෙන් අර්ථය නොබෙදා ආසනයෙන් නැගිට විහාරයට ඇතුළුවූ සේකැයි" කීවාහුය.

4. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ වැඩ නොබෝ වේලාවකින් අපට "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ ධර්මයද අධර්මයද දතයුතුයයි- කොටින් වදාරා විස්තර වශයෙන් අර්ථය බෙදා නොදී අස්නෙන් නැගිට විහාරයට ඇතුළුවූ සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් වදාරණලද විස්තර වශයෙන් නොබෙදන ලද, මෙහි අර්ථය කවරෙක් විස්තර වශයෙන් බෙදන්නේදැයි මේ සිත විය.

5. "ඇවැත්නි, අපට මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන්වහන්සේ විසින්මද වර්ණනාකරණ ලදී. ප්‍රශංසා

කරණ ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් දෙශනා කරණ ලද විස්තර වශයෙන් අර්ථය නොබෙදන ලද, ධර්මයෙහි අර්ථය නුවණැති සබ්‍රම්සරුන්ට විස්තර වශයෙන් බෙදන්නට සුදුසුය එකාන්තයෙන් අපි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණෙන්නෙමු පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගෙන් මේ කාරණය විචාරන්නෙමු නම් යෙහෙකැයි' සිතූහ. "ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අපට ප්‍රකාශ කරන්නේයම්සේද එසේ අපි දරන්නෙමුයි කීවාහුය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ බෙදා දක්වන සේක්වායි" කීහ.

**6.** "ඇවැත්නි, හරයෙන් ප්‍රයොජන ඇති හරය සොයන පුරුෂයෙක් යම්සේ හරසෙවීමෙහි හැසිරෙන්නේ පවත්නාවූ හර ඇත්තාවූ මහත් වෘක්ෂයක්හුගේ මුල ඉක්මවා කඳ ඉක්මවා අතුකොළ ඉක්මවා හරය සෙවීම යුතුකොට සිතන්නේය. මේ කාරණය එසේ දතයුතුයි. ආයුෂ්මතුන්ට බුදුන් හමුවෙහි ඒ භාග්‍යවතුන් වහන්සේ ඉක්මවා අපගෙන් මේ කාරණය ඇසිය යුතු කොට සිතව්ද, ඇවැත්නි, ඇසවූ නුවණවූ ධර්මයවූ බ්‍රහ්මවූ වාදීවූ නියාමකවූ අර්ථය තීරණය කරන්නාවූ අමෘතය දෙන්නාවූ ධර්මයට ස්වාමිවූ තථාගතවූ ඒ භාග්‍යවතුන් වහන්සේ දත යුත්ත දනී. දැක්ක යුත්ත දකී. තෙපි භාග්‍යවතුන් වහන්සේ කරාම පැමිණ මෙය විචාරන්නාහු නම් එයට එම කාලය විය අපගේ භාග්‍යවතුන් වහන්සේ ඔබහට ප්‍රකාශ කරන්නේ යම්සේද එසේ එය දරව් යයි" කීයේය.

**7.** "ඇවැත්නි, ආනන්ද ස්ථවිරයෙනි ඇසවූ නුවණවූ ධර්මයවූ බ්‍රහ්මවූ වාදීවූ නියාමකවූ අර්ථය තීරණය කරන්නාවූ අමෘතය දෙන්නාවූ ධර්ම ස්වාමීවූ තථාගතවූ භාග්‍යවතුන් වහන්සේ එකාන්තයෙන් දතයුත්ත දනී. දැක්ක යුත්ත දකී. යම් බඳුවූ අපි භාග්‍යවතුන් වහන්සේ කරාම පැමිණ මෙයම විචාරන්නෙමු නම් එයට මෙම කාලය වන්නේය. භාග්‍යවතුන් වහන්සේ අපට ප්‍රකාශ කරන්නේ යම්සේද එය එසේ දරන්නෙමු.

**8.** "එතකුදු වුවත් ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින්මද මනාව වර්ණනා කරණ ලද්දේ,

ප්‍රශංසාකරණ ලද්දේය. ආයුෂ්මත් ආනන්ද තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් විස්තර වශයෙන් අර්ථය නොබෙදන ලද කොටින් වදාරන ලද ධර්මයෙහි අර්ථය නුවණැති සබ්‍රම්සරුන්ට විස්තර වශයෙන් බෙදන්නට සුදුසුය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ බරක් කොට නොගෙන බෙදා දක්වත්වායි" කීවාහුය.

**9.** "ඇවැත්නි, එසේ නම් අසව්, හොඳට මෙනෙහි කරව්. කියන්නෙමියි" වදාළ සේක. "ඇවැත්නි, 'එසේය'යි ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්තවිරයන්ට පිළිතුරු දුන්හ.

**10.** "ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම "ඇවැත්නි, අපගේ භාග්‍යවතුන් වහන්සේ යමක් කොටින් වදාරා විස්තර නොකොට අස්නෙන් නැගිට විහාරයට වැඩි සේක්ද. (මෙහි මේ වර්ගයේ 14 සූත්‍රයේ 1 සිට 11 තෙක් ඡේද යෙදිය යුතුයි.) 'මහණෙනි' වෙනුවට 'ඇවැත්නි'යි යොදාගත යුතුයි.)

**11.** ඇවැත්නි, (මේ සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) භාග්‍යවතුන් වහන්සේ කොටින් වදාළ විස්තර වශයෙන් අදහස නො බෙදූ මේ දෙශනාවේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දනිමි. ඇවැත්නි, බලාපොරොත්තු වන්නාවූ තෙපිද භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් මේ කාරණය අසවු. භාග්‍යවතුන් වහන්සේ යම්සේ විස්තර කරන සේක් ද එසේ දරවු.

**12.** 'ඇවැත්නි, එසේය'යි ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්දයන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව, හුන් අසුන්වලින් නැගිට භාග්‍යවතුන් වහන්සේ කරා ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ,

**13.** "ස්වාමීනි, (15 සූත්‍රයේ 1 (ii) 2 ඡේද යෙදිය යුතුයි.)

**14.** "ස්වාමීනි, ඉක්බිත්තෙන් වනාහි අපි, ආයුෂ්මත් ආනන්දයන් කරා ගොස් මේ කාරණය විචාළෙමු. ස්වාමීනි, ඒ අපට ආයුෂ්මත් ආනන්දයන් විසින් මේ ආකාරයෙන් මේ පදයෙන් මේ අකුරින් අදහස මනාව බෙදන ලද්දේය.

15. "මහණෙනි, යහපත; මහණෙනි, යහපත; මහණෙනි, ආනන්ද තෙමේ පණ්ඩිතය. ආනන්ද තෙමේ මහත් ප්‍රඥා ඇත්තේය. මහණෙනි, තෙපි මා කරා පැමිණ විචාළාහු නම් මමද මේ කාරණය ආනන්දයන් ප්‍රකාශ කළාසේ ප්‍රකාශ කරන්නෙමි. මෙහි අදහස මෙය මය. මෙය එසේ දරවුයැයි වදාළ සේක."

**16. අජිත පරිබ්බාජක සූත්‍රයඃ-** 1. ඉක්බිති අජිත පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථා, කොට නිමවා එකත් පසෙක සිටියේය. එකත් පසෙක සිටි අජිත පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස අපගේ පණ්ඩිත නම් සබ්‍රහ්මචාරී (සමාන පැවිදි) කෙනෙක් ඇත. ඔහු විසින් යමකින් අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ පරද්දන ලද්දාහු පැරදුණුමුයි දනිත්ද පන්සියයක් පමණ සිතේ ස්වභාවයන් සිතන ලද්දාහයි" කීයේය.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි, තොපි පණ්ඩිත වස්තූන් ඉගෙණ ගනිව්." 'යමක් භාග්‍යවතුන් වහන්සේ වදාරණ සේක් නම්, 'භාග්‍යවතුන් වහන්ස, ඊට කාලයයි. සුගතයන් වහන්ස, ඊට කාලයයි භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරත්යයි' කීවාහුය. "මහණෙනි, එසේ නම් අසව්. හොඳට මෙනෙහි කරව් කියන්නෙමියි" වදාළසේක. "ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

3. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් අධාර්මික වාදයෙන් අධාර්මික වාදය නිග්‍රහ කරයිද පෙළයිද, ඉන් අධාර්මික පිරිස සතුටු කරයිද එසේ හෙයින් ඒ අධාර්මික පිරිස 'පින්වත ඒකාන්තයෙන් පණ්ඩිතයෙක පින්වත ඒකාන්තයෙන් පණ්ඩිතයෙකැයි උස්හඬ ඇත්තාහු මහත් හඬ ඇත්තාහු වෙති.

මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් අධාර්මික වාදයෙන් ධාර්මික වාදය නිග්‍රහ කරයිද පෙළයිද ඉනුත් අධාර්මික පිරිස

සතුටු කරයිද එයින් ඒ අධාර්මික පිරිස උස්හඬ ඇත්තාහු මහත් හඬ ඇත්තාහු ‘ඒකාන්තයෙන් පණ්ඩිතය ඒකාන්තයෙන් පණ්ඩිතයයි’ කියන්නාහ මහණෙනි මේ ලොකයෙහි ඇතැමෙක් අධාර්මික වාදයෙන් ධාර්මික වාදයද අධාර්මික වාදයද නිග්‍රහ කරයිද පෙළයිද ඉන් අධාර්මික පිරිස සතුටු කරයිද ඒ කරණකොටගෙන අධාර්මික පිරිස ඒකාන්තයෙන් පින්වත් තෙමේ පණ්ඩිතයයි උස්හඬ ඇත්තාහු මහත් හඬ ඇත්තාහුවෙත් මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් ධාර්මික වාදයෙන් ධාර්මික වාදයද අධාර්මික වාදය ද නිග්‍රහ කරයිද පෙළයිද ‘ඒකාන්තයෙන් පණ්ඩිතය ඒකාන්තයෙන් පණ්ඩිතයයි’ ඒ අධාර්මික පිරිස උස්හඬ මහත්හඬ ඇත්තාහු වෙත්. මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් ධාර්මික වාදයෙන් ධාර්මික වාදය නිග්‍රහ කරයිද පෙළයිද ඉන් ධාර්මික පිරිස සතුටුකරවයිද ඉන් ඒ ධාර්මිකපිරිස ‘ඒකාන්තයෙන් පින්වතා පණ්ඩිතය ඒකාන්තයෙන් පින්වතා පණ්ඩිතයයි’ උස්හඬ මහා හඬ ඇත්තාහු වෙත්.

“මහණෙනි අධර්මයද දතයුතුය, ධර්මයද දතයුතුය- (මෙය මේ වර්ගයේ 13 සූත්‍රයෙහි 2 ඡෙදය මෙනි)

**17. සංගාරව ඔරපාර සූත්‍රයː-** 1. ඉක්බිති සංගාරව බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත් පසෙක සිටියේය. එකත් පසෙක සිටි සංගාරව බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට, “භවත් ගෞතමයන් වහන්ස, මෙතෙර කවරේද, එතෙර කවරේදැයි’ ඇසීය.

2. “බමුණ (ii) වැරදි දැකීම මෙතෙරය නිවැරදි දැකීම එතෙරය. වැරදි සිතීම මෙතරය නිවැරදි සිතීම එතෙරය වැරදි වචන මෙතරය නිවැරදි වචන එතරය වැරදි කර්මාන්තය මෙතරය, නිවැරදි කර්මාන්තය එතරය. වැරදි ජීවිකාව මෙතරය, නිවැරදි ජීවිකාව එතරය. වැරදි වෑයම මෙතරය. නිවැරදි වෑයම එතරය, වැරදි සිහිකිරීම මෙතරය නිවැරදි සිහිකිරීම එතරය,

වැරදි සිත එකඟ කිරීම මෙතරය, නිවැරදි සිත එකඟ කිරීම එතරය, වැරදි නුවණ මෙතරය, නිවැරදි නුවණ එතරය, වැරදි මිදීම මෙතරය, නිවැරදි මිදීම එතරය,

3. "මනුෂ්‍යයන් අතුරෙහි යම් ජන කෙනෙක් පරතෙර යන්නාහුද ඔව්හු ස්වල්පයහ. නැවත මේ සෙසු ප්‍රජාව වෙරළ කරාම දුවයි.

4. "යම් කිසිකෙනෙක් මනා කොට ප්‍රකාශ කරණ ලද ධර්මයෙහි ධර්මය අනුව පවත්නාහුද, ඒ මනුෂ්‍යයෝ එතරවීමට ඉතා බැරි, මාරයාට අයත් පෙදෙසින් එතෙර වෙත්.

5. පණ්ඩිත තෙමේ කලුවූ පාප ධර්මය හැර සුදුවූ පින් දහම් වඩන්නේය. යම් තැනෙක්හි විවෙකයෙහි ඇලීමට අපහසු වේද වාසස්ථානවූ සසරින් වාසස්ථාන නැති නිවනට පැමිණ

6. "කාමයන් කිසිවක් ඉතිරනොකොට එහි ඇලීම කැමති වන්නේය. නුවණැත්තා සිතෙහි ඇතිවන ක්ලෙශයන්ගෙන් තමන් පිරිසිදු වන්නේය.

7. "මනා අවබොධයේ අංගවන ධර්මයන්හි යමකුගේ සිත මනාකොට වඩන ලද්දේද, යම් කෙනෙක් අල්ලා ගැනීම දුරුකිරීම යන දෙකෙහි නොබැඳීමෙන් යුක්ත වූවාහුද ලොකයෙහි බබළන ඒ ක්ෂීණාශ්‍රවයෝ ක්ලෙශ පරිනිර්වාණයෙන් නිවුණාහ.

18. **අප්පක පාරගාමී සූත්‍රය**:- 1. "මහණෙනි, තොපට එතෙර දෙසන්නෙමි මෙතර දෙසන්නෙමි. එය අසව් මනාව මෙනෙහි කරව්"-"එසේය ස්වාමීනියි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

(මෙහි මේ වර්ගයේ 17 සූත්‍රයේ 2 (ii) සහ 3-7 ඡේදය යෙදිය යුතුයි.)

19. **පච්චොරොහණී සූත්‍රය**:- 1. එකල්හි වනාහි ජානුස්සොනි බ්‍රාහ්මණ තෙම එම පොහෝ දිනයෙහි නහා අළුත් පට්ටාවලින්

වියූ වස්ත්‍ර දෙකක් ඇඳ තෙත් කුසතණ මිටක් ගෙන භාග්‍යවතුන් වහන්සේ ලඟ එකත් පසෙක සිටියේය. භාග්‍යවතුන් වහන්ස, එසේ සිටි ජානුස්සොනි බ්‍රාහ්මණයා දැක "බමුණ කිමෙක්ද? ඔබ මේ පෝය දිනයෙහි අළුත් පට්ටා වස්ත්‍ර දෙකක් හැඳ තෙත් කුසතණ මිටක් ගෙන එකත් පසෙක සිටියේ අද බමුණු ගෙදර කුමක් දැයි" ඇසූ සේක.

2. "භවත් ගෞතමයන් වහන්ස, අද බමුණු ජාතියට නැවත බැසීමය" - 'බමුණ, ඒ කෙසේ වනාහි බමුණන්ගේ පෝය දිනයෙහි හිස පටන් නහා, අලුත් කොමු පිළිදෙකක් ඇඳ තෙත් ගොම්න් පොළොව පිසදමා නිල් කුසතණ අතුරා ගිනිහල් ගෙටත් මලුවටත් අතර සයනය කරත්. ඔවුහු ඒ රාත්‍රියෙහි තුන්වරක් නැගිට ඇදිලි බැඳ 'පින්වතා නැවත බසීවා පින්වත් තෙමේ නැවත බසීවායි' ගිනි දෙවියාට නමස්කාර කරත්. බොහෝ ගිතෙල් තලතෙල් වෙඬරුවලින් ගින්න පොෂණය කරයි. ඒ රාත්‍රිය ගේ ඇවෑමෙන් ප්‍රණීතවූ කෑයුතු බුදිය යුතු දෙයින් බමුණන් සතුටු කරවත්. භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයන්ගේ පච්චොරෝහණිය (නැවත බැසීම) වේ.

3. "බමුණ, බමුණන්ගේ පච්චොරෝහණිය අනික් ප්‍රකාරයකින්වේ. ආර්යවිනයෙහි පච්චොරෝහණිය අනික් ක්‍රමයකින් වේ"-"භාග්‍යවත් ගෞතමයන් වහන්ස, ආර්යයන් වහන්සේගේ ධර්මයෙහි පච්චොරෝහණිය කෙසේද? භවත් ගෞතමයන් වහන්සේ මට ආර්යවිනයෙහි පච්චොරෝහණිය යම්සේ වේද එසේ බණ කියන්නේ නම් යහපතැයි" කීයේය, බමුණ, එසේ නම් අසව, යහපත් කොට මෙනෙහි කරව. කියන්නෙමියි" වදාළසේක. "පින්වතුන් වහන්ස, එසේ ය"යි ජානුස්සොනි බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

4. "බමුණ, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙම වැරදි දැකීමේ ලාමක විපාකය මෙලොවදී පරලොවදී වෙතියි මෙසේ සලකයිද හෙතෙම මෙසේ සලකා වැරදි දැකීම අත්හරියි වැරදි දැකීමෙන් වැරදි සිතීමේ සිතීම දුරලයි. වැරදි සිතීමෙන් බසියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5-14 (මේ ඡේද මේ සූත්‍රයේ 4 ඡේදය මෙන් වෙත්. එහි "දැකීම" වෙනුවට සිතීම, වචන, කර්මාන්තය, ජීවිකාව වෑයම, සිහිකිරීම, සිත එකඟ කිරීම, නුවණ, මිදීම යන වචන යොදා ඒ ඒ ඡේද සකස් කරගත යුතුයි)

**15.** "භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයන්ගේ බැසගැන්ම අන් විධියකින්වේ. ආර්යයන් වහන්සේගේ විනයෙහි බැසීම අන් විධියකින්වේ. භවත් ගෞතමයන් වහන්ස, ආර්ය විනයෙහි බැසගැන්මෙන් බමුණන්ගේ බැසගැන්ම සොළොස් කලාවෙන් කලාවටවත් නොඅගනේය, භවත් ගෞතමයන් වහන්සේ, යහපත (මෙහි අංගුත්තර නිකායේ 7 නිපාතයේ 7 වර්ගයේ 13 සූත්‍රයේ 27 ඡේදය යෙදිය යුතුයි.) අදපටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු කොට මා දරණ සේක්වා."

**26. අරිය පච්චොරෝහණි සූත්‍රයː-** 1. "මහණෙනි, තොපට ආර්ය බැසගැනීම දෙසන්නෙමි එය අසව්, මනාකොට මෙනෙහි කරව්යයි" වදාළසේක. "මහණෙනි, ආර්ය බැසගැන්ම කවරේද?

**2.** "මහණෙනි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. කෙසේද වැරදි දැකීමේ ලාමක විපාකය මෙලොවදීද පරලොවදීදවේ. හෙතෙම මෙසේ සලකා වැරදි දැකීම අත්හරියි. වැරදි දැකීමෙන් බසියි. 3-11 (මේ ඡේද මේ සූත්‍රයේ 2 ඡේදය මෙන් වෙත්. එහි "දැකීම" වෙනුවට සිතීම, වචනය, කර්මාන්තය, ජීවිකාව, වෑයම, සිහිකිරීම සිත එකඟ කිරීම, නුවණ, මිදීම, යන වචන යොදා ඒ ඒ ඡේද සකස් කරගත යුතුයි.)

**21. උදය පුබ්බංගම සූත්‍රයː-** "මහණෙනි, සූර්යයාගේ උදාවට යම්මේ අරුණ නැඟීමක් ඇද්ද, මෙය පෙර ගමනයි. පෙරනිමිත්තයි.

**2.** "මහණෙනි, එසේම යම් මේ නිවැරදි දැකීමක් ඇද්ද, කුශල ධර්මයන්ට එය පෙර ගමනයි. එය පෙරනිමිත්තයි. මහණෙනි, මනා දැකීමෙන් මනා සිතීම ශක්තිමත්වෙයි. 3-11 (මේ ඡේද මේ සූත්‍රයේ 2 ඡේදය මෙන් වෙත්. එහි "දැක්ම" වෙනුවට, සිතීම, වචන, කර්මාන්තය, ජීවිකාව, වෑයම, සිහිකිරීම, සිත එකඟකිරීම, නුවණ, මිදීම, යන වචන ද 'සිතීම' වෙනුවට,

වචන, කර්මාන්තය, ජීවිකාව යනාදී වචන යොදා ඒ ඒ ඡෙද සකස්කරගතයුතුයි.)

**22. "දස ආසවක්ඛය ධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ ධර්ම දහය වඩන ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ පව් ගෙවීම පිණිස පවතී. කවර දසයක්ද යත් (මනා දැකීම, මනා සිතීම, මනා වචන, මනා කර්මාන්තය, මනා ජීවිකාව, මනා වෑයම, මනා සිහිකිරීම මනා සිත එකඟ කිරීම, මනා නුවණ, මනා මිදීම, වෙත්) "මහණෙනි, මේ දශධර්මයෝ වඩන ලද්දාහු බහුල කරණ ලද්දාහු පව්ගෙවීම පිණිස පවතිත්."

**(12. පච්චොරෝහණී වර්ගය නිමි.)**

---

## 13. පරිසුද්ධ වර්ගය.

**23. පරිසුද්ධ ධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, පිරිසිදු බබළන මේ ධර්මයෝ දශදෙන සුගත විනයෙහි විනා අන්තැනක නැත්තේය.

2. 'මනාදැකීම, මනාසිතීම, මනාවචන, මනාකර්මාන්ත, මනාජීවිකාව, නොවෑයම, මනාසිහිකිරීම, මනාසිත එකඟ කිරීම, මනානුවණ, මනාමිදීමවෙත්. 3-11 (මේ ඡෙද සූත්‍රයේ 2 ඡෙදය මෙන් වෙත්. එහි "දැකීම" වෙනුවට, සිතීම, මනස, කර්මාන්තය, ජීවිකාව, වෑයම, සිහිකිරීම සිත එකඟ කිරීම, නුවණ, මිදීම, යන වචනයොදා ඒ ඒ ඡෙද සකස්කරගතයුතුයි)

**24. අනුප්පන්න ධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, නූපන්නාවූ ධර්ම දහයක් උපදිත්, සුගත විනයෙහි විනා අන් තැනක නැත්තේය.

2. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡෙදයමෙනි.)

**25. "මහප්ඵල ධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, මහත්ඵල මහානිසංසවූ ධර්මදහයක්, සුගතවිනයෙහි හැර අන් තැනෙක නැත්තේය.

2. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**26. කිලෙස විනය ධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ ධර්ම දහයක් රාගය හික්මවීම අවසන්කොට ඇත්තාහ. ද්වේෂය, මොහය, හික්මවීම අවසන්කොට ඇත්තාහ. සුගත විනයෙහි හැර අන්තැනක නැත්තේය.

**2.** (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡේදය මෙනි)

**27. එකන්ත නිබ්බාන සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ ධර්ම දහයක් ඒකාන්තයෙන් කලකිරීම පිණිස, නොඇලීම පිණිස නිරොධය පිණිස, සංසිඳීම පිණිස, විශිෂ්ට ඥානය පිණිස, අවබොධය පිණිස, නිවණ පිණිස පවතිත්. සුගතවිනයෙහි හැර අන්තැනෙක නැත්තේය. (මෙහි මේ වර්ගයේ 1. සූත්‍රයේ 2. ඡෙදය යෙදිය යුතුයි.)

**28. භාවනානුප්පන්න සූත්‍රයඃ-** 1. "මහණෙනි, වඩනලද බහුල වශයෙන් කරණලද නූපන් මේ ධර්ම දහයක් උපදිත්. සුගත විනයෙහි හැර අන්තැනක නැත්තේය. (මෙහි මේ වර්ගයේ 1. සූත්‍රයේ 2. ඡෙදය යෙදිය යුතුයි.)

**29. භාවිත මහප්ඵල සූත්‍රයඃ-** 1. "මහණෙනි, වඩන ලද බහුල වශයෙන් කරණලද මේ ධර්ම දහයක් මහත් ඵල වෙත්. සුගත විනයෙහි හැර අන්තැනෙක නැත්තේය (මෙහි මේ වර්ගයේ 1. සූත්‍රයේ 2. ඡෙදය යෙදිය යුතුයි.)

**30. භාවිත රාග විනය සූත්‍රයඃ-** 1. "මහණෙනි, වඩන ලද බහුල වශයෙන් කරණලද මේ ධර්ම දහයක් රාගවිනය, ද්වෙෂවිනය, මොහවිනය අවසන්කොට ඇත්තාහ. සුගත විනයෙහි හැර අන්තැනක නැත්තේය. (මෙහි මේ වර්ගයේ 1. සූත්‍රයේ 2. ඡෙදය යෙදිය යුතුයි.)

**31. "භාවිත එකන්ත නිබ්බිදා සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ ධර්ම දහයක් පුරුදු කරණ ලද්දාහු බහුල වශයෙන් කරණ ලද්දාහු එකාන්තයෙන් කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරුද්ධිය පිණිස සංසිඳීම පිණිස විශිෂ්ට ඥාණය පිණිස අවබොධය පිණිස නිවන පිණිස පවතිත්. සුගත විනයෙහි හැර අන්තැනක නැත.

**2.** (මෙහි මේ වර්ගයේ 1. සූත්‍රයේ 2. ඡෙදය යෙදිය යුතුයි.)

**22. දසමිච්ඡත්ත සූත්‍රය**:- 1. "මහණෙනි, මේ බොරු දහයක් වෙත්. කවර දහක්ද යත්? (ii) වැරදි දෘෂ්ටිය, වැරදි සිතීම, වැරදි කතාව, වැරදි ක්‍රියාව, වැරදි පැවැත්ම, වැරදි වෑයම, වැරදි සිහිය, වැරදි ලෙස සිත එකඟකම, වැරදි නුවණ, වැරදි මිදීමය.

2. "මහණෙනි, මෙය වැරදි දේ යයි කියනු ලැබේ.

33. **දසසම්මත්ත සූත්‍රය**:- "මහණෙනි, මේ සත්‍ය දහයක් වෙත්.

2. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡේදය මෙහි (iii) "මහණෙනි, මේ දශය සත්‍යදේයයි කියනු ලැබේ

(13 පරිසුද්ධ වර්ගය නිමි.)

## 14. සාධු වර්ගය.

34. **සාධූ අසාධූ සූත්‍රය**:- 1. "මහණෙනි, තොපට යහපතද අයහපතද දෙශනා කරන්නෙමි. එය අසව්, මනාකොට මෙනෙහිකරව්, දෙසන්නෙමියි" වදාළසේක. "ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, අයහපත කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 11. සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.)

"මහණෙනි, මෙය අයහපතැයි කියනු ලැබේ."

3. "මහණෙනි, යහපත කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23. සූත්‍රයේ 2. ඡේදය යෙදිය යුතුයි.) 'මහණෙනි, මෙය යහපතැයි. කියනු ලැබේ."

35. "**අරියානරිය සූත්‍රය**:- 1. "මහණෙනි, තොපට ආර්යයන්ට අයත් ධර්මයද අනාර්යයන්ට අයත් ධර්මයද පෘථග්ජන (යන්ට අයත්) ධර්මය ද දෙශනා කරන්නෙමි. (ii) එය හොඳට අසව්, මෙනෙහි කරවු. (iii) මහණෙනි අනාර්යයන්ට අයත් ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය අනාර්ය ධර්මයයි කියනු ලැබේ.

**2.** "මහණෙනි, ආර්ය ධර්මය කවරේ ද? (මෙහි මේ පණ්ණාසකයේ 23. සූත්‍රයේ 2. ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය ආර්ය ධර්මයයි කියනු ලැබේ."

**36. කුසලාකුසල සූත්‍රය:-** 1. "මහණෙනි, තොපට කුශලය ද අකුශලය ද දෙසන්නෙමි. එය හොඳට අසවු, මෙනෙහි කරව්. මහණෙනි, අකුශලය කවරේ ද? (මෙහි මේ පණ්ණාසකයේ 32. සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) "මහණෙනි, මෙය කුශලයයි කියනු ලැබේ.

**2.** "මහණෙනි, කුශලය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23. සූත්‍රයේ 2. ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, මෙය කුශලයයි කියනු ලැබේ."

**37. අත්ථානත්ථ සූත්‍රය:-** 1. "මහණෙනි, තොපට අර්ථය ද, අනර්ථය ද දෙසන්නෙමි. (එය හොඳට අසවු මෙනෙහි කරවු) "මහණෙනි, අනර්ථය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) "මහණෙනි, මෙය අනර්ථයයි කියනු ලැබේ.

**2.** "මහණෙනි, අර්ථය කවරේ ද? (මෙහි මේ පණ්ණාසකයේ 23. සූත්‍රයේ 2. ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය අර්ථයයි කියනු ලැබේ."

**38. ධම්මාධම්ම සූත්‍රය:-** 1. "මහණෙනි, තොපට ධර්මය ද අධර්මය ද දෙසන්නෙමි. (එය හොඳට අසවු, මෙනෙහි කරව්) මහණෙනි, අධර්මය කවරේ ද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, මෙය අධර්මයයි කියනු ලැබේ.

**2.** "මහණෙනි, ධර්මය කවරේ ද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, මෙය ධර්මයයි කියනු ලැබේ."

**39. සාසවානාසව සූත්‍රය:-** 1. "මහණෙනි, කෙලෙස් සහිත ධර්මය ද කෙලෙස් රහිත ධර්මය ද දෙසන්නෙමි. (එය හොඳට අසවු, මෙනෙහිකරව්) මහණෙනි, කෙලෙස් සහිත ධර්මය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, මෙය කෙලෙස් සහිත ධර්මයයි කියනු ලැබේ.

**2.** "මහණෙනි, කෙලෙස් රහිත ධර්මය කවරේද? (මෙය මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදයමෙනි.) මහණෙනි, මෙය කෙලෙස් රහිත ධර්මයයි කියනු ලැබේ.)

**40. සාවජ්ජානවජ්ජ සූත්‍රයː-** 1. "මහණෙනි, තොපට වැරදි සහිත ධර්මයද වැරදි රහිත ධර්මයද දෙසන්නෙමි. එය හොඳට අසවු, මෙනෙහි කරවු, මහණෙනි, වැරදි සහිත ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය වැරදි සහිත ධර්මයයි කියනු ලැබේ.

**2.** "මහණෙනි, වැරදි රහිත ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය වැරදි රහිත ධර්මයයි කියනු ලැබේ."

**41. තපනීයාතපනීය සූත්‍රයː-** 1. "මහණෙනි, තැවිය යුතු ධර්මයද නොතැවිය යුතු ධර්මයද තොපට දෙසන්නෙමි. එය හොඳට අසවු, මෙනෙහි කරව්. මහණෙනි, නොතැවිය යුතු ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය නොතැවිය යුතු ධර්මයයි කියනු ලැබේ. මහණෙනි, තැවිය යුතු ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය තැවියයුතු ධර්මයයි කියනු ලැබේ."

**42. ආචයාපචයගාමී සූත්‍රයː-** 1. "මහණෙනි, තොපට රැස් කිරීමේ ධර්මයද රැස් නොකිරීමේ ධර්මයද, දෙසන්නෙමි. (එය හොඳට අසවු, මෙනෙහි කරවු) මහණෙනි, රැස් කිරීමේ ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය රැස් කිරීමේ ධර්මයයි කියනු ලැබේ.

"මහණෙනි, රැස් නොකිරීමේ ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි මෙය රැස් නොකිරීමේ ධර්මයයි කියනු ලැබේ."

**43. සුඛ දුක්ඛුද්‍රය සූත්‍රයː-** 1. "මහණෙනි තොපට සුව ගෙනදෙන ධර්මයද දුක් ගෙනදෙන ධර්මයද දෙසන්නෙමි. (එය හොඳට අසවු, මෙනෙහි කරවු.) මහණෙනි, දුක් ගෙන දෙන ධර්මය කෙසේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය දුක් ගෙන දෙන ධර්මයයි කියනු ලැබේ.

**2.** "මහණෙනි, සුව ගෙන දෙන ධර්මය කෙසේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය සුව ගෙන දෙන ධර්මයයි කියනු ලැබේ."

**44. සුඛ දුක්ඛ විපාක සූත්‍රයː-** 1. "මහණෙනි, තොපට සැප විපාක ඇති ධර්මයද දුක් විපාක ඇති ධර්මයද දෙසන්නෙමි (එය හොඳට අසවු. මෙනෙහි කරවු) මහණෙනි, දුක්ඛ විපාක ඇති ධර්මය කෙසේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.)

**2.** "මහණෙනි, සුව විපාක ඇති ධර්මය කෙසේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය සැප විපාක ඇති ධර්මයයි කියනු ලැබේ."

(14 සාධු වර්ගය නිමි.)

---

## 15. අරිය වර්ගය.

**45. අරියානරිය මග්ග සූත්‍රයː-** 1. "මහණෙනි, තොපට ආර්ය ධර්මයද අනාර්ය ධර්මයද දෙසන්නෙමි. (එය හොඳට අසවු, මෙනෙහි කරවු.) මහණෙනි, අනාර්ය මාර්ගය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය අනාර්ය මාර්ගයයි.

**2.** "මහණෙනි, ආර්ය මාර්ගය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය ආර්ය මාර්ගයයි කියනු ලැබේ."

**46. කණ්හසුක්ක මග්ග සූත්‍රයː-** 1. "මහණෙනි, තොපට සුදුවූ කුසල් මඟද කළුවූ අකුසල් මගද දෙසන්නෙමි (එය හොඳට

අසවු, මෙනෙහි කරවු.) මහණෙනි, කළුවූ අකුසල් මග කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, මෙය කලුවූ අකුසල් මග යයි කියනු ලැබේ.

2. "මහණෙනි, සුදුවූ කුසල් මඟ කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය සුදුවූ කුසල් මග යයි කියනු ලැබේ."

**47. සද්ධම්මාසද්ධම්ම සූත්‍රයː-** 1. "මහණෙනි, තොපට සද්ධර්මයද අසද්ධර්මයද දෙන්නෙමි. (එය හොඳට අසවු, මෙනෙහි කරවු.) මහණෙනි, අසද්ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය අසද්ධර්මයයි කියනු ලැබේ.

2. "මහණෙනි, සද්ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය සද්ධර්මයයි කියනු ලැබේ."

**48. සප්පුරිස ධම්ම සූත්‍රයː-** "මහණෙනි, තොපට සත්පුරුෂ ධර්මයද අසත්පුරුෂ ධර්මයද දෙසන්නෙමි. (එය හොඳට අසවු මෙනෙහි කරවු) මහණෙනි, අසත්පුරුෂ ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, මෙය අසත්පුරුෂ ධර්මයයි කියනු ලැබේ.

2. "මහණෙනි, සත් පුරුෂ ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය සත්පුරුෂ ධර්මයයි කියනු ලැබේ."

**49. උප්පාදෙතබ්බ සූත්‍රයː-** 1. මහණෙනි, තොපට ඉපදවිය යුතු ධර්මයද නොඉපදවිය යුතු ධර්මයද දෙසන්නෙමි. (එය හොඳට අසවු, මෙනෙහි කරවු.) මහණෙනි, නොඉපදවිය යුතු ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය නොඉපදවිය යුතු ධර්මයයි කියනු ලැබේ. මහණෙනි, ඉපදවිය යුතු ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය ඉපදවිය යුතු ධර්මයයි කියනු ලැබේ."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**50. ආසෙවිතබ්බ සූත්‍රය:-** 1. "මහණෙනි, තොපට පුරුදු කළයුතු ධර්මයද පුරුදු නොකළ යුතු ධර්මයද දෙසන්නෙමි (එය හොඳට අසවු, මෙනෙහි කරවු.) මහණෙනි, පුරුදු නොකළ යුතු ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි මෙය පුරුදු නොකළ යුතු ධර්මයයි කියනු ලැබේ. මහණෙනි පුරුදු කළ යුතු ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය පුරුදු කළයුතු ධර්මයයි කියනු ලැබේ."

**51. භාවෙතබ්බ සූත්‍රය:-** 1. "මහණෙනි, තොපට වැඩිය යුතුවූද නොවැඩිය යුතුවූද ධර්මය දෙසන්නෙමි. (එය හොඳට අසවු, මෙනෙහි කරවු) මහණෙනි, නොවැඩිය යුතු ධර්මය කෙසේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය නොවැඩිය යුතු ධර්මයයි කියනු ලැබේ. මහණෙනි, වැඩිය යුතු ධර්මය කෙසේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය වැඩිය යුතු ධර්මයයි කියනු ලැබේ.

**52. බහුලීකාතබ්බ සූත්‍රය:-** 1. "මහණෙනි, තොපට බහුල කළ යුතු ධර්මයද බහුල නොකළ යුතු ධර්මයද දෙසන්නෙමි. (එය හොඳට අසවු, මෙනෙහි කරවු.) මහණෙනි, බහුල නොකළ යුතු ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය බහුල නොකළ යුතු ධර්මයයි කියනු ලැබේ."

2. "මහණෙනි, බහුල කළයුතු ධර්මය කෙසේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය බහුල කළයුු ධර්මයයි කියනු ලැබේ."

**53. අනුස්සරි තබ්බ සූත්‍රය:-** 1. මහණෙනි, තොපට සිහි කටයුතු ධර්මයද සිහි නොකටයුතු ධර්මයද දෙසන්නෙමි (එය හොඳට අසවු, මෙනෙහි කරවු.) මහණෙනි සිහි නොකටයුතු ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය සිහි නොකටයුතු ධර්මයයි කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "මහණෙනි, සිහි කටයුතු ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය සිහි කටයුතු ධර්මයයි කියනු ලැබේ."

**54. සච්ඡිකාතබ්බ සූත්‍රයː-** 1. "මහණෙනි, තොපට අත් දැකිය යුතු ධර්මයද අත් නොදැකිය යුතු ධර්මයද දෙසන්නෙමි. (එය හොඳට අසවු, මෙනෙහි කරවු) මහණෙනි, අත් නොදැක්ක යුතු ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙය අත් නොදැක්ක යුතු ධර්මයයි කියමි. මහණෙනි, අත් දැකිය යුතු ධර්මය කවරේද? (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ අත් දැකිය යුතු ධර්මය කියමි."

(15. ආර්ය මාර්ග වර්ගය නිමි.)
(තුන්වන පණ්ණාසකය නිමි.)

---

## හතරවෙනි පණ්ණාසකය

## 16. සම්මා දිට්ඨි වර්ගය

**1. නසෙවියතබ්බ සූත්‍රයː-** 1. "මහණෙනි, ධර්ම දහයකින් යුක්තවූ පුද්ගලයා ආශ්‍රය නොකටයුතුය. කවර දසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, මේ දසධර්මයෙන් යුක්තවූ පුද්ගලයා ආශ්‍රය නොකළ යුතුය.

"මහණෙනි, ධර්ම දහයකින් යුක්තවූ පුද්ගලයා ආශ්‍රය කටයුතුය. කවර දසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ අංග දහයෙන් යුත් පුද්ගලයා ආශ්‍රයකටයුතු"

**2. නභජිතබ්බ සූත්‍රයː-** 1. "මහණෙනි, ධර්ම දහයකින් යුක්ත පුද්ගලයා භජනය නොකට යුතුය.

2. "කවර දසයක්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය සහ මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, ධර්ම දහයකින් යුක්ත පුද්ගලයා භජනය කටයුතුයි.

4. කවර දසයකින්ද යත්? (මෙහි 3 පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය සහ මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

3. **නපයුරුපාසිතබ්බ සූත්‍රය**:- 1. "මහණෙනි, ධර්ම දසයකින් යුක්ත පුද්ගලයා පයුරුපාසනය නොකළ යුතුය.

2. "කවර දසයක්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය සහ මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, ධර්ම දහයකින් යුක්තවූ පුද්ගලයා පයුරුපාසනය කළයුතුයි.

4. "කවර දසයක්දයත්? (මෙහි 3 වෙනි පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය සහ මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

4. **නපුජ්ජ සූත්‍රය**:- 1. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා නොපිදිය යුතුයි.

2. "කවර දසයක්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය සහ මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා පිදිය යුතුයි.

4. "කවර දසයකින්දයත්? (මෙහි 3 වෙනි පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය සහ (මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

5. **නපාසංස සූත්‍රය**:- 1. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා නො පැසසිය යුතුයි.

2. "කවර දසයකින්දයත්, (මෙහි 3 පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය සහ මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි)

3. "මහණෙනි, ධර්ම දශයකින් යුක්තවූ පුද්ගලයා පැසසිය යුතුයි.

4. "කවර දසයකින්දයත්? (මෙහි 3 වෙනි පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය සහ මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

**6. අගාරව සූත්‍රය**:- 1. "මහණෙනි, ධර්ම දශයකින් යුක්තවූ පුද්ලයා ගරු නොකටයුතුයි.

2. "කවර දසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය සහ මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි)

3. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා ගරුකටයුතුය.

4. "කවර දසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය සහ මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි)

**7. අප්පතිස්සව සූත්‍රය**:- 1. "මහණෙනි, ධර්ම දහයකින් යුක්තවූ පුද්ගලයා නුසුදුසුයි.

2. "කවර දසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 31 සූත්‍රයේ 1 (ii) ඡේදය සහ මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි)

3. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා සුදුසුයි.

4. "කවර දසයකින්ද යත් (මෙහි 3 පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය සහ මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි)

**8. අනාරාධක සූත්‍රය**:- 1. මහණෙනි ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා සතුටු නොකරවන්නේයි.

2. "කවර දසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය සහ මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි)

3. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා සතුටු කරවන්නේය.

4. "කවර දසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය සහ මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි)

**9. නවිසුජ්ඣති සූත්‍රය**:- 1. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා පිරිසිදු නොවෙයි.

2. "කවර දසයකින්ද යත්? (මෙහි 3 පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය සහ මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි)

3. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා පිරිසිදුවෙයි.

4. "කවර දසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය සහ මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි)

**10. මානංනාධිභොති සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා මාන්න යටපත් නොකෙළේ වේ.

2. "කවර දසයකින්දයත්2 (මෙහි 3 පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය සහ මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි)

3. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා මාන්නය යටපත්කෙළේ වේ.

4. "කවර දසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය සහ මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි)

**11. පඤ්ඤාවඩ්ඪන සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා නුවණින් නොවැඩේ.

2. "කවර කරුණු දසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය සහ මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි)

3. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා නුවණින් වැඩේ.

4. "කවර දසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය සහ මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි)

**12. අපුඤ්ඤපසවන සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා බොහෝ අකුසල් රැස්කරයි.

2. "කවරදසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 32 සූත්‍රයේ 1 (ii) ඡේදය සහ මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි)

3. "මහණෙනි, ධර්ම දසයකින් යුක්තවූ පුද්ගලයා කුසල් රැස්කරයි.

4. "කවර දසයකින්දයත්? (මෙහි 3 පණ්ණාසකයේ 23 සූත්‍රයේ 2 ඡේදය සහ මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

---

## 17. යමක වර්ගය

13. පච්චොරෝහණී සූත්‍රය:- 1. (මෙය තතිය පණ්ණාසකයේ 2 වර්ගයේ 17 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. බ්‍රාහ්මණය, මෙහි ආර්යශ්‍රාවක තෙම මෙසේ සලකයි. සතුන් මැරීමේ ලාමක විපාකය මෙලොවදීත් පරලොවදීත් වේ, හෙතෙම මෙසේ සලකා සතුන් මැරීම දුරුකරයි. සතුන් මැරීමෙන් බසී. නුදුන් දෙය ගැනීමේ, කාමයන්හි වැරදි හැසිරීමේ, බොරු කීමේ, කේළාම් කීමේ, පරුෂ වචන කීමේ හිස් වචන කීමේ, විෂම ලෝභයේ, ක්‍රොධයේ, වැරදි දැකීමේ ලාමක විපාකය මෙලොවදීත් පරලොවදීත්වේ.

3. "හෙතෙම මෙසේ සලකා සතුන් මැරීම දුරුකරයි. සතුන් මැරීමෙන් බසී. නුදුන් දෙය ගැනීම දුරුකරයි. නුදුන් දෙය ගැනීමෙන් බසී. කාමයන්හි වැරදි හැසිරීම දුරුකරයි. කාමයන්හි වැරදි හැසිරීමෙන් බසී. බොරුකීම දුරුකරයි. බොරු කීමෙන් බසී. කේළාම් කීම දුරුකරයි. කේළාම් කීමෙන් බසී. පරුෂ වචන කීම දුරු කරයි. පරුෂ වචන කීමෙන් බසී. හිස් වචන කීම දුරුකරයි. හිස් වචන කීමෙන් බසී. විෂම ලොභය දුරුකරයි. විෂම ලොභයෙන් බසී. ක්‍රොධය දුරුකරයි. ක්‍රොධයෙන් බසී. වැරදි දැකීම දුරු කරයි. වැරදි දැකීමෙන් බසී. බ්‍රාහ්මණය, මෙසේ වනාහි ආර්යයන් වහන්සේගේ විනයෙහි පච්චොරෝහණිය (බැස ගැනීම) වේ. (මෙහි තතිය පණ්ණාසකයේ 2 වර්ගයේ 19 සූත්‍රයේ 15 ඡේදය යෙදිය යුතුයි.)

14. **අරිය පච්චොරෝහණී සූත්‍රය**:- 1. "මහණෙනි, තොපට ආර්යවූ පච්චොරෝහණිය (බැස ගැන්ම) දෙසන්නෙමි. එය හොඳට අසවු මෙනෙහි කරවු, භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. මහණෙනි, ආර්යවූ පච්චොරෝහණිය කවරේද?

2 - 3. (මේ ඡේදය මේ වර්ගයේ 13 සූත්‍රයේ 2 - 3 ඡේද මෙන් වෙත්.) මහණෙනි, මෝතොමෝ ආර්යවූ පච්චොරෝහණියයි.

15. "**සංගාරව ඔරපාර සූත්‍රය**:- 1. (මෙහි තතිය පණ්ණාසකයේ 2 වර්ගයේ 17 සූත්‍රයේ 1 ඡේදය මෙනි)

**2.** "බ්‍රාහ්මණය, සතුන් මැරීම මෙතෙරයි. සතුන් මැරීමෙන් වෙන්වීම එතරයි. නුදුන් දෙය ගැන්ම මෙතරයි. නුදුන් දෙය ගැන්මෙන් වෙන්වීම එතරයි. කාමයන්හි වැරදි හැසිරීම මෙතරයි. කාමයන්හි වැරදි හැසිරීමෙන් වෙන්වීම එතරයි. බොරු කීම මෙතරයි. බොරු කීමෙන් වෙන්වීම එතරයි. කේලාම් කීම මෙතරයි. කේලාම් කීමෙන් වෙන්වීම එතරයි. පරුෂ වචන කීම මෙතරයි. පරුෂ වචන කීමෙන් වෙන්වීම එතරයි. හිස් වචන කීම මෙතරයි හිස් වචන කීමෙන් වෙන්වීම එතරයි. විෂම ලොභය මෙතරයි. විෂම ලොභයන් නොවීම එතෙරයි. ක්‍රොධය මෙතරයි. ක්‍රොධය නොවීම එතරයි වැරදි දැක්ම මෙතරයි. නිවැරදි දැකීම එතරයි

**3.** "බ්‍රාහ්මණය, මේ මෙතරයි. මේ එතරයි.

**4.** (මේ ඡේදය තතිය පණ්ණාසකයේ 2 වර්ගයේ 17 සූත්‍රයේ 3 - 7 ඡේද මෙනි.)

**16. ඔරිම පාරමිතීර සූත්‍රයඃ-** 1. මහණෙනි, තොපට මෙතරද එතෙරද දෙසන්නෙමි. මහණෙනි, මෙතර කවරේද? එතර කවරේද?

**2.** "(මේ ඡේදය මේ වර්ගයේ 15 සූත්‍රයෙ 2 ඡේදය මෙනි) මහණෙනි, මෙය වනාහි මෙතෙරද එතරද වේ.

(මෙහි තතිය පණ්ණාසකයේ 2 වර්ගයෙ 17 සූත්‍රයේ 3 - 7 ඡේද යෙදිය යුතුයි.)

**17. අධම්මානත්ථ සූත්‍රයඃ** 1. "මහණෙනි; අධර්මය හා අනර්ථයද ධර්මය හා අර්ථයද දත යුතුය. අර්ථය අධර්මය හා අනර්ථය දැන ධර්මය හා අර්ථය දැන ධර්මය පරිද්දෙන් පිළිපැදිය යුතුය. (ii) මහණෙනි, අධර්මයද අනර්ථයද කවරේද?

**2.** "සතුන් මැරීම, නුදුන් දෙය ගැනීම, කාමයන්හි වැරදි හැසිරීම, බොරුකීම, කේලාම්කීම, පරුෂ වචනකීම, හිස් වචනකීම, විෂම ලොභය, ක්‍රොධය, වැරදි දැකීමද වෙත් මහණෙනි, මෙය අධර්මය හා අනර්ථය යයි කියනු ලැබේ.

**3.** "මහණෙනි, ධර්මය හා අර්ථය කවරේ ද? සතුන් මැරීමෙන් වෙන්වීම, නුදුන් දෙය ගැනීමෙන් වෙන්වීම, කාමයන්හි

වැරදි හැසිරීමෙන් වෙන්වීම, බොරු කීමෙන් වෙන්වීම, කේලාම් කීමෙන් වෙන්වීම, පරුෂ වචන කීමෙන් වෙන්වීම, හිස් වචන කීමෙන් වෙන්වීම, විෂම ලොභය නොවීම, ක්‍රොධය නොවීම, නිවැරදි දැකීමද වෙත්.

4. "මහණෙනි, මෙය ධර්මය හා අර්ථයයි කියනු ලැබේ.

"මහණෙනි, අධර්මයද දතයුතුය අනර්ථයද ධර්මයද දතයුතුය. අර්ථයද ධර්මයද දැන අර්ථය යම්සේද ධර්මය යම්සේද එසේ පිළිපැදිය යුතුය. යන යමක් වදාළෝද මෙයම නිසා වදාරණ ලද්දේය.

18. **අධම්මා ධම්ම සූත්‍රය:-** 1. "මහණෙනි, අධර්මයද දතයුතුය. ධර්මයද අනර්ථයද දතයුතුය. අර්ථයද අධර්මයද දැන ධර්මයද අනර්ථයද දැන අර්ථයද දැන අර්ථය යම්සේද ධර්මය යම්සේද එසේ පිළිපැදිය යුතුය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සුගතයන් වහන්සේ මෙය වදාරා හුනස්නෙන් නැගිට වෙහෙරට වැඩිසේක. (මෙහි තතිය පණ්ණාසකයේ 2 වර්ගයේ 15 සූත්‍රයේ 2-15 ඡේද යෙදිය යුතුයි,

"ආනන්ද" යන්න 'මහාකච්චානයැයි' වෙනස් කොට යෙදිය යුතු.)

19. **අත්ථානත්ථ සූත්‍රය:-** (මෙහි 1 ඡේදය මේ වර්ගයේ 18 සූත්‍රයේ 1 ඡේදය මෙනි.) ඇවැත්නි, සතුන් මැරීම අධර්මයයි. සතුන් මැරීමෙන් වෙන්වීම ධර්මයයි. සතුන් මැරීම නිසා යම් ඒ නොයෙක් ලාමක අකුශල ධර්ම කෙනෙක් හටගනිත්ද මේ අනර්ථයයි. සතුන් මැරීමෙන් වෙන්වීම නිසා නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණත්වයට යත්ද මේ අර්ථයයි.

3 - 11 (මේ සූත්‍රයේ 2 ඡේදයේ "සතුන් මැරීම" වෙනුවට, නුදුන්දේ ගැනීම, කාමයන්හි වරදවා හැසිරීම, බොරුකීම, කේලාම්කීම, ඵරුෂවචනකීම, ප්‍රලාප දෙඩීම, තෘෂ්ණාව, ක්‍රොධය, වැරදිදැකීම, යන වචනයෙදීමෙන් ඒ ඒ ඡේද සකස් කර ගතයුතුයි.)

12. "මහණෙනි, අධර්මයද දතයුතුය. ධර්මයද දත යුතුය. අනර්ථයද දතයුතුය අර්ථයද දතයුතුය. අධර්මයද ධර්මයද දැන අනර්ථයද අර්ථයද දැන ධර්මයවූ පරිදි අර්ථයවූ පරිදි පිළිපැදිය යුතුයයි, මෙසේ යමක් වදාරණලද නම් එය මේ සඳහාම වදාරණලදී.

**20. තිවිධ පාණාතිපාත සූත්‍රයඃ-** 1. "මහණෙනි, මම සතුන් මැරීමද (ii) ලොභය හෙතු කොටත්, ද්වෙෂය හෙතු කොටත්, මොහය හෙතු කොටත්යයි තුන් වැදෑරුම් කොට කියමි.

2. "නුදුන් දෙය ගැනීමද (මෙහි 1 (ii) යෙදියයුතුයි) කාමයන්හි වැරදි හැසිරීමද (මෙහි 1 (ii) යෙදියයුතුයි) බොරු කීමද (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) කේලාම් කීමද (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) පරුෂ වචන කීමද (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) හිස් වචන කීමද (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) දැඩි ලෝබකමද (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) ක්‍රොධයද (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) වැරැදි දැකීමද (මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

3. "මහණෙනි, මෙසේ වනාහි ලොභය කර්මයන්ට මුල්වේ. ද්වෙෂය කර්මයන්ට මුල්වේ. මොහය කර්මයන්ට මුල්වේ.

"ලොභය නැතිවීමෙන් කර්මයන්ගේ මුල නැතිවීමවේ. ද්වෙෂය නැතිවීමෙන් කර්මයන්ගේ මුල නැතිවීමවේ. මොහය නැතිවීමෙන් කර්මයන්ගේ මුල නැතිවීමවේයයි" වදාළසේක.

21. "**සපරික්කමන ධම්ම සූත්‍රයඃ-** 1. මහණෙනි, මේ ධර්මය පරික්‍රමණ සහිතය. මේ ධර්මය පරික්‍රමණ රහිතවේ. මහණෙනි, කෙසේ නම් මේ ධර්මය පරික්‍රමණ සහිතවේද, පරික්‍රමණ රහිතවේද?

2. "මහණෙනි, සතුන් මරන්නාට සතුන් මැරීමෙන් වෙන්වීම පරික්‍රමණයවේ. නුදුන් දෙය ගන්නාට නුදුන් දෙය ගැනීමෙන් (ii) වෙන්වීම පරික්‍රමණයවේ (iii) කාමයන්හි වැරදි හැසිරීම ඇත්තාට කාමයන්හි වැරදි හැසිරීමෙන් (මෙහි 2 (ii) ඡෙදය යෙදිය යුතුයි.) බොරු කියන්නාට බොරු කීමෙන් (මෙහි 2 (ii) ඡෙදය යෙදිය යුතුයි.) කේලාම් කියන්නාට කේලාම් කීමෙන්

(මෙහි 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) ඵරුෂ වචන කියන්නාට ඵරුෂ වචනයෙන් (මෙහි 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) හිස් වචන කියන්නාට හිස් වචන කීමෙන් (මෙහි 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) දැඩි ලෝභකම ඇත්තාට දැඩි ලෝබකම නොවීම පරික්‍රමණයවේ. ක්‍රොධ ඇත්තාට ක්‍රොධය නොවීම පරික්‍රමණයවේ. වැරදි දැකීම් ඇත්තාට නිවැරදි දැකීම පරික්‍රමණය වේ"

**22. චුන්දසොවෙය්‍ය සූත්‍රය:-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ පාවානුවර චුන්ද නම් කර්මාර (ලෝකරු) පුත්‍රයාගේ අඹවනයෙහි වාසය කරණසේක. ඉක්බිති චුන්ද කර්මාර පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත්පසෙක සිටි චුන්ද කර්මාර පුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ, "චුන්දය, ඔබ කවරෙකුගේ පිරිසිදුකම් රුචි කෙරෙහිදැයි" ඇසූසේක. "ස්වාමීනි, පසුබිම්හි සිටින (ද්විජව උපන්) කෙණ්ඩි දරණ සෙවෙල් මල් දම් ඇති ගිනි දෙවියා පුදන දියෙහි ගිලෙන, බමුණෝ පිරිසිදුකම් පණවත්ද මම ඒ ඔවුන්ගේ පිරිසිදුකම් රුචිකරමියි" කීයේය.

**2.** "චුන්දය, පසුබිම්හි සිට කෙණ්ඩි දරණ, සෙවෙල් මාලා ඇති ගිනි පුදන, දියේ ගිලෙන බමුණෝ කෙසේ වනාහි පිරිසිදුකම් පනවත්දැයි" ඇසූසේක. "ස්වාමීනි, පසුබිම්හි සිටි කෙණ්ඩි දරණ සෙවෙල් මාලාකොට ඇති, ගිනිපුදන දියෙහි ගැලෙන, ඒ බ්‍රාහ්මණයෝ ශ්‍රාවකයන් මෙසේ සමාදන් කරවත්

'එම්බා පුරුෂය, ඔබ මෙහි එව, කලින්ම සයනයෙන් නැගිටින්නේම පෘථුවිය ස්පර්ශ කරන්නෙහිය, ඉදින් පෘථුවිය ස්පර්ශ නොකරන්නෙහිනම් තෙත් ගොම ස්පර්ශ කරන්නෙහිය. ඉදින් තෙත්ගොම ස්පර්ශ නොකරන්නෙහි නම් අමු තණ ස්පර්ශකරන්නෙහිය. ඉදින් අමු තණ ස්පර්ශ නොකරන්නෙහි නම් ගිනි පුදන්නේය. ඉදින් ගිනි නොපුදන්නේ නම් ඇඳිලි බැඳ හිරු වඳින්නේය. ඇඳිලිබැඳ හිරු නොවඳින්නේ නම්, සවස් කාලය තුන්වෙනි කොට ජලයෙහි ගිලෙන්නෙහිය' ස්වාමීනි

මෙසේ වනාහි පසුබිම්හි සිටි කෙණ්ඩි දරණ සෙවෙල් මාලා ඇති ගිනි පුදන දියෙහි ගිලෙන බමුණෝ පිරිසිදුකම පනවත්. මම ඔවුන්ගේ පිරිසිදුකම රුචිකරමියි” කීයේය.

3. “චුන්දය, පසුබිම්හි සිටි කෙණ්ඩි දරණ සෙවෙල් මාලා කොට ඇති ගිනි පුදන දියේ ගිලෙන, බ්‍රාහ්මණයෝ අන් පරිද්දෙකින් පිරිසිදුකම පණවත් ආර්ය විනයෙහි අන්පරිද්දෙකින් පිරිසිදු බව වේ.” - ‘ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ආර්ය විනයෙහි පිරිසිදු බව යම් පරිද්දෙකින් වේද, එසේ ධර්ම දෙශනා කරණු මැනවි.’

“චුන්දය එසේ නම් අසව, යහපත්කොට මෙනෙහි කරව කියන්නෙමියි” වදාළසේක. ‘ස්වාමීනි, එසේයයි’ චුන්ද කර්මාර පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

4. “චුන්දය, තුන්පරිද්දෙකින් කයින් අපිරිසිදුබවවේ. සතර පරිද්දෙකින් වචනයෙන් අපිරිසිදුබව වේ. තුන්පරිද්දෙකින් සිතින් අපිරිසිදුකම වේ. චුන්දය, කෙසේ කයින් ත්‍රිවිධ අපිරිසිදුබව වේද, චුන්දය, මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් සියලු සතුන් කෙරෙහි රෞද්‍රවූයේ ලේවැකුණු අත්ල ඇත්තේ ගැටීමෙහි, ගැලීමෙහි, ඇළුනේ දයාවට නොපැමුණුනේ සතුන් මරන්නේ වෙයි. ගමට අයත්වූද වනයට අයත්වූද අනුන්ගේ යම් වස්තුවක් උපකරණයක් වේද, නොදෙනලද්දේ එය සොර සිතින් ගනියිද, නුදුන් දෙය ගන්නේවේ. මව රක්නා, පියා රක්නා, සහෝදරයා රක්නා, සහෝදරිය රක්නා, ඤාතීන් රක්නා ධර්මය රක්නා, ස්වාමියන් ඇති, දඬුවම් නියමකළ, යටත් පිරිසෙයින් මල්වැල නමුත් පළඳවන ලද, යම් ඒ තැනැත්තියක්වේද, එබඳුවූවන් කෙරෙහි හැසිරීමට පැමිණෙන්නේ කාමයන්හි වැරදි හැසිරීම් ඇත්තේවේද, චුන්දය, මෙසේ වනාහි කයින් තුන්වැදෑරුම් අපිරිසිදුකම දතයුතුය.

5. “චුන්දය, කෙසේ වචනයෙන් සතරවැදෑරුම් අපිරිසිදුකම වේද, චුන්දය, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් බොරු කියන්නේවේද, සභාවකට ගියේ හෝ පිරිසකට ගියේ හෝ නෑයන්

මැදකට ගියේ හෝ පිරිස් මැදකට ගියේ හෝ රජ කුලයක් මැදට ගියේ හෝ පමුණුවන ලද්දේ හෝ එම්බා පුරුෂය, එව යමක් දන්නෙහි නම් එය කියන්නෙහියයි කියයි හෙතෙම නොදන්නේ හෝ දනිමියි කියයි දන්නේ හෝ නොදනිමියි කියයි. නොදක්නේ හෝ දකිමියි කියයි. දන්නේ හෝ නොදන්නෙමියි කියයි. මෙසේ තමන් හේතු කොට ගෙන හෝ අන්‍යයන් හේතුකොටගෙන හෝ ආමිසාදී කිසිවක් බලාපොරොත්තුවෙන් හෝ දැන දැන බොරු කීවා වේද,

**6.** "පිසුණු කියන්නේවේද, මොවුන්ගේ බිඳීම පිණිස මෙයින් අසා අසවල් තැන කියන්නේවේ. ඔවුන්ගේ බිඳීම පිණිස අසවල් තැන අසා මොවුන්ට කියන්නේවේ. මෙසේ සමඟිවූවන් බිඳුවන්නේ බිඳුනවුන්ට උදවු දෙන්නේ කොටස් කිරීමෙහි නියුක්තවූයේ කොටස් කිරීමෙහි ඇලුනේ කොටස් කරණ වචන කියන්නේවේ.

**7.** "ඵරුෂවචන කියන්නේවේ. යම් ඒ වචනයක් ගැට සහිතද, අනුන්ට කටුකද, අනුන් ගැටෙන්නේද ක්‍රොධයට කිට්ටුද, එකඟකමට විරුද්ධද එබඳු වචන කියන්නේවේ.

**8.** "ප්‍රලාප දොඩන්නේවේ. නොකල්හි කියන්නේ නොවූ දේ කියන්නේ, අයහපතින් කියන්නේ, අධර්මයෙන් කියන්නේ, නොහික්මීමෙන් කියන්නේ සිතේ තබානොගත යුතු නොකල්හි කරුණු රහිතව සීමාවක් නැති අයහපත මිශ්‍ර වචන කියන්නේවේ. චුන්දය, මෙසේ වනාහි වචනයේ සිවුවැදෑරුම් අපිරිසිදු බව වේ.

**9.** "චුන්දය, කෙසේ සිතින් තුන්වැදෑරුම් අපිරිසිදුබව වේද? චුන්දය, මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් තද තෘෂ්ණා ඇත්තේ වේද, අනුන්ගේ යම් ඒ වස්තූපකරණයක් වේද, යම් හෙයකින් අනුන් ගේ එය 'මට වන්නේ නම් යහපතැයි' එය දැඩි ලෙස ආශාකරණ ලද්දේවේද,

**10.** "මේ සත්වයෝ නසිත්වා, බඳිත්වා, නැතිවෙත්වා විනාශ වෙත්වායි නොවෙන්නාහු හෝ වෙත්වායි දූෂිතවූ චිත්ත සංකල්පනා ඇත්තේ පෙරළුනු සිත් ඇත්තේවේද,

11. "දුන්දෙයෙහි විපාක නැත. පුදනලද්දේ විපාක නැත. හෝමකරණ ලද්දේ විපාක නැත. යහපත්කොට කරණලද කර්මයන්ගේ ඵලයක් විපාකයක් නැත. මෙලොව නැත. පරලොව නැත. මවු නැත, පියා නැත, ඖපපාතික සත්වයෝ නැත. යමෙක් මෙලොවද පරලොවද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට දන්වත්ද එබඳු ලෝකයෙහි යහපත් මාර්ගයට ගියාවූ යහපත් මාර්ගයට පැමිණි ශ්‍රමණ බ්‍රාහ්මණයන් නැතැයි පෙරළුනු දැකීම් ඇති මිත්ථ්‍යාදෘෂ්ටිකයෙක්වේද, චුන්දය, මෙසේ වනාහි සිතේ ත්‍රිවිධ අපිරිසිදුකම දතයුතුයි.

12. "චුන්දය, මේ දශ අකුශල කර්මපථයෝය. චුන්දය මේ අකුශලකර්ම පථ දහයෙන් යුක්තවූයේ කල් ඇතුවම සයනයෙන් නැගිටින්නේ ඉදින් පෘථිවිය අතගායිද, අපිරිසිදුමවේ. ඉදින් පෘථිවිය අතනොගෑවේද අපිරිසිදුමවේ. ඉදින් තෙත් ගොම ඇල්ලුයේද අපිරිසිදුමවේ. නිල් තෘණ ඇල්ලුවේද අපිරිසිදුමවේ. ඉදින් ගිනිපිදූයේද අපිරිසිදුමවේ. ඉදින් ගිනි නොපිදුයේද අපිරිසිදුම වේ. ඉදින් ඇදිලිබැඳ හිරු වැන්දේද අපිරිසිදුම වේ. ඉදින් ඇදිලිබැඳ හිරු නොවැන්දේද අපිරිසිදුම වේ. ඉදින් සවස තුන්වැනිකොට ජලයෙහි ගිලෙයිද අපිරිසිදුම වේ. ඉදින් සවස තුන්වෙනි කොට ජලයෙහි නො ගිලුනේද අපිරිසිදුම වේ. ඊට හේතුව කවරේද, චුන්දය, මේ දශ අකුශල කර්මපථයෝ අපිරිසිදුම වෙත්. අපිරිසිදු බව කරන්නාහුද වෙත්. චුන්දය, මේ දසඅකුශල කර්මපථයන්ගෙන් යුක්තවීම් හේතුවෙන් නිරය පෙනෙයි. තිරිසන් යොනිය පෙනෙයි. ප්‍රෙත ලොකය පෙනෙයි. අනිකුදු යම් දුගතීහු පෙනෙත්.

13. "චුන්දය, කයින් පිරිසිදුබව තුන්වැදෑරුම් වේ. වචනයෙන් පිරිසිදු බව සතර වැදෑරුම් වේ. සිතින් පිරිසිදුබව තුන් වැදෑරුම්වේ, චුන්දය, ත්‍රිවිධ කයින් පිරිසිදුබව කෙසේවේද? චුන්දය, මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් සතුන් මැරීම අත්හැර සතුන් මැරීමෙන් වෙන්වූයේවේ. බහාතබනලද දඬු ඇත්තේ බහාතබනලද ආයුධ ඇත්තේ, පාපයට බිය ඇත්තේ දයාවට පැමිණියේ, සියළු ප්‍රාණීන් කෙරෙහි හිතවත් අනුකම්පාවෙන් වාසය කරයි.

"නුදුන්දෙය ගැනීම අත්හැර නුදුන්දෙය ගැනීමෙන් වෙන්වූයේවේ ගමෙහි හෝ අරණ්‍යයෙහි හෝ අනුන්ගේ යම් තමා නොඅයත් වස්තුවක් හෝ උපකරණයක් හෝ වේද, නුදුන් සොරකම් කළයුතු එය නොගන්නේ වේ. කාම මිත්‍ථ්‍යාචාරය අත්හැර කාමමිත්‍ථ්‍යාචාරයෙන් වෙන්වූයේ වේ. යම් ඒ මව විසින් රකින පියා විසින් රකින ස්ත්‍රිය සහෝදරයා විසින් සහෝදරිය විසින්, ඤාතීන් විසින් රකින ස්ත්‍රිය, ධර්ම රකින ස්ත්‍රිය, ස්වාමියා ඇති ස්ත්‍රිය, දඬුවම් කළ ස්ත්‍රිය, යටත් පිරිසෙයින් මල්මාලාවකින් වෙන්කළ ස්ත්‍රිය යන එබඳු ස්ත්‍රීන් කෙරෙහි හැසිරීමට නොපැමිණියේ වේ, චුන්දය මෙසේ වනාහි තුන් වැදෑරුම්වූ කායික පිරිසිදු කමවේ.

14. "චුන්දය, කෙසේ වචනයෙන් සතර වැදෑරුම් පිරිසිදුකම වේද? චුන්දය, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් බොරු නොකියන්නේ වේද, සභාවකට ගියේ හෝ පිරිසකට ගියේ හෝ නෑයන් මැදකට ගියේ හෝ පිරිස් මැදකට ගියේ හෝ රජ කුලයක් මැදට ගියේ හෝ පමුණුවන ලද්දේ හෝ 'එම්බා පුරුෂය, එව යමක් දන්නෙහි නම් එය කියන්නෙහි යයි' කියයි. හෙතෙම නොදන්නේ හෝ නොදනිමියි කියයි. දන්නේ හෝ දනිමියි කියයි. නොදක්නේ හෝ නොදකිමියි කියයි. දක්නේ හෝ දක්නෙමියි කියයි. මෙසේ තමන් හේතුකොට ගෙන හෝ, අන්‍යයන් හේතුකොට ගෙන හෝ ආමිසාදි කිසිවක් බලාපොරොත්තුවෙන් හෝ දැන දැන බොරු නොකියන්නේ වේද?

15. "පිසුණු නොකියන්නේ වේද, මොවුන්ගේ බිඳීම පිණිස මෙයින් අසා අසවල් තැන නොකියන්නේ වේ. ඔවුන්ගේ බිඳීම පිණිස අසවල් තැන අසා මොවුන්ට නොකියන්නේ වේ. මෙසේ සමගි වූවන් නොබිඳුවන්නේ බිඳුනවුන්ට උදවු නොදෙන්නේ, කොටස් කිරීමෙහි නොඇලුනේ, කොටස් කිරීමෙහි යුක්ත නුවූයේ, කොටස් කිරීමෙහි නොඇලුනේ, කොටස් කරණ වචන නොකියන්නේ වේ.

16. "පරුෂ වචන නොකියන්නේ වේ. යම් ඒ වචනයක් ගැට සහිතද, අනුන්ට කටුකද, අනුන් ගැටෙන්නේද, ක්‍රොධයට කිට්ටුද, එකඟකමට විරුද්ධද එබඳු වචන නොකියන්නේ වේ.

17. "ප්‍රලාප දොඩන්නේ නොවේ. නොකල්හි නොකියන්නේ, නොවූ දේ නොකියන්නේ, අයහපතින් නොකියන්නේ, අධර්මයෙන් නොකියන්නේ, නොහික්මීමට නොකියන්නේ, සිතේ තබා නොගතයුතු නොකල්හි කරුණු රහිතව සීමාවක් නැති, අයහපත හා මිශ්‍ර වචන නොකියන්නේ වේ. චුන්දය, මෙසේ වනාහි වචනයේ සිවු වැදෑරුම් පිරිසිදු බව වේ.

18. "චුන්දය, කෙසේ සිතින් තුන් වැදෑරුම් පිරිසිදු බව වේද? චුන්දය, මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් තද තෘෂ්ණා ඇත්තේ නොවේද, අනුන්ගේ යම් වස්තූපකරණයක් වේද යම් හෙයකින් අනුන්ගේ දෙය 'මට වන්නේ නම් යහපතැයි' එය දැඩි ලෙස ආශා නොකරණ ලද්දේවේද,

19. "මේ සත්වයෝ නසිත්වා, බඳිත්වා නැති වෙත්වා, විනාශ වෙත්වායි, නොවෙන්නාහු හෝ වෙත්වායි දූෂිතවූ චිත්ත සංකල්පනා නැත්තේ පෙරළුනු සිත් නැත්තේ වේ.

20. "දුන් දෙයෙහි විපාක නැත. පුදන ලද්දේ විපාක නැත හොම කරණ ලද්දේ විපාක නැත. යහපත් කොට කරණලද නපුරු කොට කරණලද කර්මයන්ගේ ඵලයක් විපාකයක් නැත. මෙලොව නැත. පරලොව නැත මවු නැත, පියා නැත, ඕපපාතික සත්වයෝ නැත. යමෙක් මෙලොවද පරලොවද තෙමේ විශිෂ්ට ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට දන්වත්ද, එබඳු ලෝකයෙහි යහපත් මාර්ගයට ගියාවූ යහපත් මාර්ගයට පැමිණි ශ්‍රමණ බ්‍රාහ්මණයන් නැතැයි පෙරළුනු දැකීම් ඇති මිත්‍ථ්‍යාදෘෂ්ටිකයෙක් නොවේද, චුන්දය, මෙසේ වනාහි සිතේ ත්‍රිවිධ පිරිසිදුකම දත යුතුයි.

21. "චුන්දය, මේ දස කුශල කර්ම පථයෙන් යුක්ත වීම හෙතුකොට ගෙන දෙවියෝ පෙනෙත්, මනුෂ්‍යයෝ පෙනෙත්. යම් අන් කිසි සුගතීහු පෙනෙත්. මෙසේ වදාළ කල්හි චුන්ද කර්මාර පුත්‍රතෙම (මෙහි 3 අංගුත්තර නිකායේ 7 නිපාතයේ 7 වර්ගයේ 13 සූත්‍රයේ 27 ඡේදය යෙදිය යුතුයි.)

23. **(ජාණුස්සොණි) පෙතදාන සූත්‍රයඃ-** 1. "ඉක්බිති ජානුස්සොණි බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම්

තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ජාණුස්සොණි බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට "පින්වත් ගෞතමයන් වහන්ස, අපි බ්‍රාහ්මණයෝ වෙමු. 'මේ දානය පරලොව ගිය නෑ සහලේ නෑයන්ට පැමිණේවා. මේ දානය පරලොව ගිය නෑ සහලේ නෑයෝ වළඳත්වායි' දන්දෙමු, මතකබත් දෙමු. පින්වත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, ඒ දානය පරලොව ගිය නෑ සහලේ නෑයන්ට පැමිණේද, කිමෙක්ද පරලොව ගිය ඒ නෑ සහලේ නෑයන්ට ඒ දානය පැමිණේදැයි" ඇසීය.

2. "බමුණ, ස්ථානයෙහි ලැබෙයි. අස්ථානයෙහි නොලැබේයයි" වදාළසේක. "භවත් ගෞතමයන් වහන්ස, ස්ථානය කවරේද, අස්ථානය කවරේදැයි" ඇසූයේය (ii) "බමුණ මේලෝකයෙහි ඇතැම් කෙනෙක් සතුන් මරන්නේවේද, නුදුන් දේ ගන්නේවේද, කාමයෙහි වරදවා හැසිරෙන්නේවේද, බොරු කියන්නේවේද, කේලාම් කියන්නේවේද, ඵරුෂ වචන කියන්නේවේද, ප්‍රලාප දොඩන්නේවේද, දැඩි ලෝභකම ඇත්තේවේද, කෝපවූ සිත් ඇත්තේ වේද, මිත්ථ්‍යාදෘෂ්ටිකවේද (ii) හෙතෙම කරජකායයාගේ (ශරීරය) බිඳීමෙන් මරණින් මතු නරකයෙහි උපදී. නරකයෙහි සත්වයන්ගේ යම් ආහාරයක් වේද, ඉන් හෙතෙම එහි යැපෙයි. ඉන් හෙතෙම එහි සිටියි. යම් තැනක සිටියහුට ඒ දානය නොලැබේද, බමුණ, මෙයද අස්ථානයයි.

3. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) හෙතෙම ශරීරය බිඳීමෙන් මරණින් මතු තිරිසන් අපායෙහි උපදී. තිරිසන් යොනියෙහි සත්වයන්ට (ii) යමක් ආහාරවේද ඉන් හෙතෙම එහි යැපෙයි. ඉන් ඔහු එහි සිටියි. යම් තැනක සිටියහුට ඒ දානය නොලැබෙයිද, බමුණ මෙයද අස්ථානයකි.

4. (i) බමුණ, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් සතුන් මැරීමෙන් වෙන්වූයේවේද නුදුන් දේ ගැනීමෙන් වෙන්වූයේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූයේවේද, බොරු කීමෙන් වෙන්වූයේවේද, කේලාම් කීමෙන් වෙන්වූයේවේද ඵරුෂ වචනයෙන් වෙන්වූයේවේද, ප්‍රලාප දෙඩීමෙන් වෙන්වූයේ වේද,

දැඩිලෝබකම නැත්තේවේද; ක්‍රොධසිත් නැත්තේ වේද, සම්‍යක්දෘෂ්ටිකද (ii) හෙතෙම ශරීරය බිඳීමෙන් මරණින් මතු මනුෂ්‍යයන් අතර උපදී. මනුෂ්‍යයන්ගේ (මෙහි 3 (ii) යෙදිය යුතුයි)

**5.** (මෙහි 4 (i) යෙදිය යුතුයි) හෙතෙම ශරීරය බිඳීමෙන් මරණින් මතු දෙවියන් හා සහවාසයට යයි. දෙවියන්ගේ (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

**6.** (මෙහි 2 (ii) යෙදිය යුතුයි) හෙතෙම ශරීරය බිඳීමෙන් මරණින් මතු ප්‍රෙත ලෝකයෙහි උපදී. ප්‍රෙත ලෝකයට ගිය සත්වයන්ගේ ආහාරය යමක්ද ඉන් හෙතෙම එහි යැපෙයි. ඉන් හෙතෙම එහි සිටියි. ඔහුගේ මිත්‍රයෙක් අමාත්‍යයෙක් හෝ නෑයෝ හෝ සහලේ නෑයෝ හෝ මෙයින් යමක් පමුණුවත්ද, ඉන් හෙතෙම එහි යැපෙයි. ඉන් හෙතෙම එහි සිටී, යම්කිසි තැනක සිටියහුට ඒ දානය ලැබේද, බමුණ මේ වනාහි ඒ ස්ථානයයි."

**7.** "භවත් ගෞතමයන් වහන්ස, ඉදින් නෑ සහලේ නෑ ඒ ප්‍රෙතතෙම එතැනට නොපැමිණියේ නම් කවරෙක් ඒ දානය වළඳාදැයි" ඇසීය. "බමුණ ඔහුගේ අනිකුත් නෑ සහලේ නෑ ප්‍රෙතයෝ එතැනට පැමිණියාහුද, ඔව්හු ඒ දානය වළඳත් යයි" වදාළසේක.

"භවත් ගෞතමයන් වහන්ස, ඉදින් නෑ සහලේ නෑ ඒ ප්‍රෙතතෙමේද එතැනට නොපැමිණියේවේද, නෑ සහලේ නෑ අනිකුදු ප්‍රෙතයෝ එතැනට නොපැමිණියාහුවෙත්ද කවරෙක් ඒ දානය වළඳාදැයි" ඇසීය. "බමුණ, මෙපමණ දීර්ඝ කාලයකින් යම් මේ නෑ සහලේ නෑ ප්‍රෙතයන්ගෙන් යම් ඒ තැන හිස්වූයේවේද, මෙය නොසිදුවන්නකි. එයට ඉඩක් නැත. බ්‍රාහ්මණය; ඇරත් දායකයාටද නිෂ්ඵල නොවන්නේය."

**8.** "පින්වත් ගෞතමයන් වහන්සේ නොතැනද අදහස කියයිද?"

"බමුණ, මම නොතැනත් අදහස කියමි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) (ii) හෙතෙම ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට

හෝ ආහාරපාන, වස්ත්‍ර, යාන, වාහන, මල්ගඳ විලවුන්, සයනාසන, ආවාස, පහන් දෙන්නේ වේද (iii) හෙතෙම ශරීරය බිඳීමෙන් මරණින් මතු ඇතුන් අතරෙහි උපදී. හෙතෙම එහිදී ආහාරපාන නොයෙක් මල්මාලා සැරසීම් ලබන්නේවේ.

**9.** "බමුණ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) (ii) හෙතෙම ඉන් කායයාගේ බිඳීමෙන් මරණින් මතු ඇතුන් අතරෙහි උපදීද, (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) ඉන් හෙතෙම එහි ආහාරපාන නොයෙක් මල්මාලා සැරසීම් ලබන්නේවේ.

**10.** (මෙහි 2 (ii) සහ 8 (ii) යෙදිය යුතුයි) (ii) හෙතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු අශ්වයන් අතරෙහි උපදී.

**11.** (මෙහි 2 (ii) සහ 8 (ii) යෙදිය යුතුයි) ගවයන් අතර උපදී. (මෙහි 10 (ii) යෙදිය යුතුයි.)

**12.** (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඒ කරණ කොටගෙන හෙතෙම බල්ලන් හා උපදී. (මෙහි 8 (ii) යෙදිය යුතුයි.)

**13.** "(i) බමුණ, මේ ලොකයෙහි ඇතැම්කෙනෙක් සතුන් මැරීමෙන් වෙන්වූයේ වේද, නුදුන් දෙය ගැනීමෙන් වෙන් වූයේ වේද, කාමයන්හි වැරදි හැසිරීමෙන් වෙන්වූයේ වේද, බොරු කීමෙන් වෙන්වූයේ වේද, කේළාම් කීමෙන් වෙන් වූයේ වේද, එරුෂ වචන කීමෙන් වෙන්වූයේ වේද, හිස් වචන කීමෙන් වෙන්වූයේ වේද, දැඩි ලෝබකම නැත්තේ වේද, ක්‍රොධ සිත් නැත්තේ වේද, නිවැරැදි දැකීම ඇත්තේ වේද, එයින් හෙතෙම ශරීරය බිඳීමෙන් මරණින් පසු (ii) මිනිසුන් හා සමව උපදී (iii) හෙතෙම මහණ බමුණන්ට යම් කෑමක්, බීමක්, වස්ත්‍රයක්, වාහනයක්, මල්-සුවඳ විලවුන් ඇඳන්, ගෙවල්, පහන් දෙන්නේ වේද, එයින් හෙතෙම එහි (iv) මනුෂ්‍යවූ පස්-කම් ගුණ ලබන්නේවේ. (මෙහි මේ සූත්‍රයේ 13 (iii) දක්වා යොදාගත යුතුයි.)

**14.** "දෙවියන් හා සමව උපදී. දිව්‍යවූ පස්-කම් ගුණ ලබන්නේවේ. බ්‍රාහ්මණය, ඇරත් දායකයාටද නිෂ්ඵල නොවේ.

**15.** "පින්වත් ගෞතමයන් වහන්ස, පුදුමයි. අද්භූතයි. පින්වත් ගෞතමයන් වහන්ස, යමකදී දායක තෙමේ නිෂ්ඵල වූයෙක්වේද,

(එවැනි) දානයන් දීමෙන් කම් නැත්මය. මළවුන් පිදීමෙන් කම් නැත. බ්‍රාහ්මණය, මෙය මෙසේමයි. බ්‍රාහ්මණය, මෙය මෙසේමයි බ්‍රාහ්මණය දායකයාත් නිෂ්ඵලවූවෙක් නොවේ.”

**16.** “පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, පින්වත් ගෞතමයන් වහන්ස, (මෙහි 3 අංගුත්තරනිකායේ 7 නිපාතයේ 7 වර්ගයේ 13 සූත්‍රයේ 27 ඡේදය යෙදිය යුතුයි)

---

## 18. සාධු වර්ගය

**24. සාධූ අසාධු සූත්‍රයඃ-** 1. “මහණෙනි, තොපට යහපතද අයහපතද දෙසන්නෙමි. (ii) එය හොඳට අසව්. මෙනෙහි කරවු, කියන්නෙමි.” “ස්වාමීනි, එසේය”යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** “මහණෙනි, අයහපත කවරේද? (ii) සතුන් මැරීම, හොරකම්, කාමයන්හි වැරදි හැසිරීම, බොරුකීම, කේළාම් කීම, ඵරුෂ වචන කීම, හිස් වචන කීම, දැඩි ලෝබකම, ක්‍රෝධය, වැරදි දැකීමයි. (iii) “මහණෙනි, මෙය අයහපත යයි කියනු ලැබේ.

**3.** “මහණෙනි, යහපත කවරේද? (ii) සතුන් මැරීමෙන් වෙන්වීම, හොරකමින් වෙන්වීම, කාමයන්හි වැරදි හැසිරීමෙන් වෙන්වීම, බොරු කීමෙන් වෙන්වීම, කේළාම් කීමෙන් වෙන්වීම, ඵරුෂ වචන කීමෙන් වෙන්වීම, හිස්වචන කීමෙන් වෙන්වීම, තද ලෝබකම නොවීම, ක්‍රෝධය නොවීම, නිවැරදි දැකීමයි. (iii) මහණෙනි, මෙය යහපත යයි කියනු ලැබේ.”

**25. අරියානරිය සූත්‍රයඃ-** 1. “මහණෙනි, තොපට ආර්යධර්මයද අනාර්ය ධර්මයද දෙසන්නෙමි. (මෙහි මේ වර්ගයෙ 24 සූත්‍රයේ 1 (ii) යෙදිය යුතුයි.)

**2.** “මහණෙනි, අනාර්ය ධර්මය කෙසේද? (මෙහි මේ වර්ගයේ 24 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මෙය අනාර්ය ධර්මය කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, ආර්ය ධර්මය කෙසේද? (මෙහි මේ වර්ගයේ 24 සූත්‍රයේ 3 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මෙය ආර්ය ධර්මයයි කියනු ලැබේ.

3. "මහණෙනි, ආර්ය ධර්මය කෙසේද? (මෙහි මේ වර්ගයේ 24 සූත්‍රයේ 3 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මෙය ආර්ය ධර්මයයි කියනු ලැබේ.

(මෙහි 25 අරියානරිය, 26 කුසලාකුසල, 27 අත්ථානත්ථ, 28 ධම්මාධම්ම, 29 සාසවානාසව, 30 සාවජ්ජානවජ්ජ, 31 තපනීයාතපනීය, 32 ආචයාපචයගාමි, 33 සුඛදුක්ඛුද්‍රාය, 34 සුඛදුක්ඛ විපාක සූත්‍ර මේ වර්ගයේ 24 සූත්‍රය මෙන් සකස් කරගත යුතුයි.)

18 සාධු වර්ගය නිමි.

---

## 19. අරියමග්ග වර්ගය

35. අරියානරියමග්ග සූත්‍රයː- 1. "මහණෙනි, තොපට ආර්ය මාර්ගයද අනාර්ය මාර්ගයද දෙසන්නෙමි. (මෙහි 18 වර්ගයේ 24 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.)

2. "මහණෙනි, අනාර්ය මාර්ගය කවරේද? (18 වර්ගයේ 24 සූත්‍රයේ 2 (ii) ඡේදය යුතුයි.) මහණෙනි, මෙය අනාර්ය මාර්ගයයි කියනු ලැබේ.

3. "මහණෙනි, ආර්ය මාර්ගය කවරේද? (මෙහි 18 වර්ගයේ 24 සූත්‍රයේ 3 (ii) ඡේදය යෙදිය යුතුයි) මහණෙනි මෙය ආර්ය මාර්ගයයි කියනු ලැබේ.

"මහණෙනි, මේ ධර්ම දශයෙන් යුක්තවූ පුද්ගල තෙම සෙවනය කළ යුතුයි.

(මෙහි 36 කණ්හසුක්කමග්ග, 37 සද්ධම්මාසද්ධම්ම 38 සප්පුරිස ධම්ම, 39 උප්පාදෙතබ්බ ධම්ම, 40 ආසෙවිතබ්බ ධම්ම, 41 භාවෙතබ්බ ධම්ම, 42 බහුලීකාතබ්බ ධම්ම, 43 අනුස්සරි

තබ්බ ධම්ම, 44 සච්ඡිකාතබ්බ ධම්ම සූත්‍ර මේ වර්ගයේ 35 සූත්‍රය මෙන් සකස් කරගත යුතුයි.

(19 අරිය මග්ග වර්ගය නිමි.)

---

## 20. පුද්ගල වර්ගය

**45. නසෙවිතබ්බ පුග්ගල සූත්‍රයඃ-** 1. "මහණෙනි ධර්ම දශයකින් යුත් පුද්ගල තෙමේ සෙවනය නොකළ යුතුයි.

2. "කවර දශයකින්ද යත්? (මෙහි 18 වර්ගයේ 24 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, මේ ධර්ම දශයෙන් යුත් පුද්ගල තෙමේ සෙවනය නොකළ යුතුය.

3. "මහණෙනි, ධර්ම දශයකින් යුත් පුද්ගල තෙමේ සෙවනය කළ යුතුයි. කවර දශකින්ද යත්?

(මෙහි 18 වර්ගයේ 24 සූත්‍රයේ 3 (ii) ඡේදය යෙදිය යුතුයි.) (මෙහි 46 නභජිතබ්බ පුග්ගල, 47 නපයුරූපාසිතබ්බ පුග්ගල 48. නපුජ්ජ පුග්ගල, 49 නපාසංස පුද්ගල 50 අගාරව පුග්ගල 51 අප්පතිස්ස පුග්ගල 52 අනාරාධක පුග්ගල, 53 අවිසුද්ධ පුග්ගල, 54 නමානාභිභූ පුග්ගල, 55. නපඤ්ඤා වඩ්ඪක පුග්ගල 56 අපුඤ්ඤ පසවක පුග්ගල සූත්‍ර මේ වර්ගයේ 45 සූත්‍රය මෙන් සකස් කරගත යුතුයි.

20. වෙනි පුග්ගල වර්ගය නිමි.
(සතර වන පණ්ණාසකය නිමි.)

---

## 21. කරජකාය වර්ගය.

**1. පඨම දසධම්ම සමන්නාගත සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්ම දශයකින් යුක්ත වූයේ ගෙන එන ලද්දක් බහා තබන්නා සේ මෙසේ නරකයෙහි වේ.

2. "කවර දශයකින්ද යත්? මහණෙනි, මෙහි ඇතැම් කෙනෙක් (ii) මෙහි චතුත්ථ පණ්ණාසකයේ 22 සූත්‍රයේ 4 (ii)

5 (ii) 6, 7, 8 (ii) 9, 10, 11. ඡේද යෙදිය යුතුයි) (iii) මහණෙනි, මේ ධර්ම දශයෙන් යුක්ත වූයේ ගෙන එන ලද්දක් බහා තබන්නාසේ මෙසේ නරකයෙහි උපදී.

3. "මහණෙනි, ධර්ම දශයකින් යුක්ත වූයේ ගෙන එන ලද්දක් බහා තබන්නාසේ මෙසේ ස්වර්ගයෙහි උපදී.

4. "කවර දශයකින්ද යත්? මහණෙනි මෙහි ඇතැම් කෙනෙක් (ii) (මෙහි චතුත්ථ පණ්ණාසකයේ 21 සූත්‍රයේ 13 (ii) 14 (ii) 15, 16, 17 18 (ii), 19, 20 ඡේද යෙදිය යුතුයි.) (iii) මහණෙනි, මේ ධර්ම දශයෙන් යුක්ත වූයේ ගෙන එන ලද්දක් බහා තබන්නාසේ මෙසේ නරකයෙහි වේ."

2. **දුතිය පඨම දසධම්ම සමන්නාගත සූත්‍රයː-** 1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "කවර දශයකින්ද? මහණෙනි, මෙහි එකෙක් (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) කාමයන්හි වැරදි හැසිරීම ඇත්තේ වේද, බොරු කියාද, කේලාම් කියාද, එරුෂ වචන කියාද, හිස් වචන දොඩාද, දැඩි ලෝබ කම ඇත්තේ වේද, ක්‍රොධ සිත් ඇත්තේ වේද, වැරදි දැකීම ඇත්තේ වේද, දෙන ලද්දේ නැත, පරිත්‍යාග කරණ ලද්දේ නැත, පුදන ලද්දේ නැත පින් පව් යන කර්මයන්ගේ ඵලයක් විපාකයක් නැත. මෙලොවක් නැත. පරලොවක් නැත මවක් නැත, පියෙක් නැත. ඉබේ පහළ වන සත්තු නැත. යමෙක් මෙලොවත් පරලොවත් තුමූ, දැන, අත් දැක, දැනුම් දෙත්ද, එබඳු, හොඳ දත්, හොඳට පිළිපන් මහණ බමුණෝ ලොව නැත්තාහයි විපරිත දැකුම් ඇත්තේ වේද, (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙහි එකෙක් (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 4 (ii) ඡේදය යෙදිය යුතුයි.)

3. **දස මාතුගාම ධම්ම සූත්‍රයː-** 1. "මහණෙනි, ධර්ම දශයකින් යුක්ත ස්ත්‍රිය ගෙන එන ලද්දක් බහා තබන්නාසේ මෙසේ නිරයෙහි උපදී.

2. "කවර දශයකින්ද යත්? සතුන් මරන්නේ වේ. සොරකම් කරන්නේ වේ. කාමයන්හි වැරදි හැසිරීම් ඇත්තේ වේ. බොරු කියන්නේ වේ. කේලාම් කියන්නේ වේ. ඵරුෂ වචන ඇත්තේ වේ. හිස් වචන දොඩන්නේ වේ. දැඩි ලෝබකම ඇත්තේ වේ. ක්‍රොධ සිත් ඇත්තේ වේ. වැරදි දැකීම් ඇත්තේ වේ. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, ධර්ම දශයකින් යුත් ස්ත්‍රිය ගෙන එන ලද්දක් බහා තබන්නාසේ මෙසේ ස්වර්ගයෙහි උපදී. කවර දශයකින්ද යත්?

4. "සතුන් මැරීමෙන් වෙන්වූයේ වේ. සොර කමින් වෙන්වූයේ වේ, කාමයන්හි වැරදි හැසිරීමෙන් වෙන්වූයේ වේ. බොරු කීමෙන් වෙන්වූයේ වේ. කේලාම් කීමෙන් වෙන්වූයේ වේ. ඵරුෂ වචනයෙන් වෙන්වූයේ වේ. හිස් වචනයෙන් වෙන්වූයේ වේ. තද ලෝබ කම නැත්තේ වේ. ක්‍රොධ සිත් නැත්තේ වේ. නිවැරැදි දැකීම ඇත්තේ වේ. (ii) (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

4. **දස උපාසිකා ධම්ම සූත්‍රයඃ**- 1. "මහණෙනි, ධර්ම දශයකින් යුත් උපාසිකාව ගෙන එන ලද්දක් බහා තැබුවාසේ මෙසේ නිරයේ උපදී.

3. (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ ධර්ම දශයෙන් යුත් උපාසිකාව ගෙන එන ලද්දක් බහා තැබුවා සේ මෙසේ නිරයේ උපදී."

3. "මහණෙනි ධර්ම දශයකින් යුත් උපාසිකාව ගෙන එන ලද්දක් බහා තැබුවා සේ මෙසේ නිරයේ උපදී. කවර දශයකින්ද යත්? (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි.) මහණෙනි, ධර්ම දශයෙන් යුත් උපාසිකාව ගෙන එන ලද්ද බහා තැබුවා සේ මෙසේ ස්වර්ගයේ උපදී.'

5. **අවිසාරදුපාසිකා සූත්‍රයඃ**- 1. "මහණෙනි, ධර්ම දශයකින් යුත් උපාසිකාව භය සහිතව ගිහිගෙයි වසයි.

2. "කවර දශයකින්ද යත්? (මෙහි මේ වර්ගයේ - 3 සූත්‍රයේ 2 (i), (ii), ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ ධර්ම දශයෙන් යුත් උපාසිකාව භය සහිතව ගිහි ගෙයි වසයි.

3. "මහණෙනි, ධර්ම දශයකින් යුත් උපාසිකාව භය සහිතව ගිහිගෙයි වසයි. කවර දශයකින්ද යත් (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ 4 (i) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ ධර්ම දශයෙන් යුත් උපාසිකාව භය සහිතව ගිහිගෙයි වසයි."

6. **සංසප්පනිය පරියාය සූත්‍රයː-** 1. "මහණෙනි, තොපට (සර්පයකුමෙන්) බඩගායාමේ පිළිවෙළ නම්වූ ධර්ම ක්‍රමයක් දෙශනා කරන්නෙමි. (ii) එය අසව්, මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමියි" වදාළසේක. "ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, බඩගායන ක්‍රමයවූ ඒ ධර්ම ක්‍රමය කවරේද? (iii) මහණෙනි, සත්වයෝ කර්මය ස්වකීයකොට ඇත්තාහ. කර්මය දෑවැද්දකොට ඇත්තාහ. කර්මය උත්පත්ති ස්ථානකොට ඇත්තාහ. කර්මය නෑයන්කොට ඇත්තාහ. කර්මය පිළිසරණකොට ඇත්තාහ. යහපතක්වූ හෝ අයහපත්කවූ හෝ යම් කර්මයක් කරත්ද, ඊට හිමිවූවෝ වෙත්යයි" වදාළසේක.

3. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් සතුන් මරන්නේවේද, රෞද්‍රවූයේ ලේවැකුණු අත් ඇත්තේ, නැසීමෙහි බැසගත්තේ සියලු ප්‍රාණීන් භූතයන් කෙරෙහි දයා නැත්තේ, වේද හෙතෙම කයින් බඩගායයි. වචනයෙන් බඩගායයි. සිතින් බඩගායයි. ඔහුගේ කාය කර්මය ඇදවේ. වාක්කර්මය ඇදවේ. මනොකර්මය ඇදවේ. පරලොව ගමන ඇදවේ, උත්පත්තිය ඇදවේ. මහණෙනි, මෙම ඇදගති ඇත්තාහට, ඇද උත්පත්තිය ඇත්තාහට, ඒකාන්ත දුක්වූ නිරය හා යම් ඒ බඩගා යන තිරිසන්යෝනිය යන දෙගතීන් අතුරෙන් එක්තරා ගතියක් කියමි. මහණෙනි, ඒ බඩගායන තිරිසන්යෝනිය කවරීද? නාගය, ගෝනුසුය. පත්තෑය, මුගටිය, බළල්ලුය මීයෝය, බකමූණෝය. කිසියම් අනෙකුත් තිරිසන්ගත සත්වයෝ මිනිසුන් දැක

බඩගායත්ද, මහණෙනි, මෙසේ වූවාහු වනාහි මෙසේ වූවහුගේ උත්පත්තියවේ. යමක් කරයිද එයින් උපදී, උපන් මොහු ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්. මහණෙනි, මෙසේද සත්වයෝ කර්මය දායාදකොට ඇත්තෝයයි කියමි.

**4.** "මහණෙනි, මේලොකයෙහි ඇතැම් කෙනෙක් නුදුන්දේ ගන්නේවේද (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) කාමයන්හි වරදවා හැසිරෙන්නේවේද (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) බොරු කියන්නේවේද (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) කේලාම් කියන්නේවේද (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) එරුෂ වචන කියන්නේවේද (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) ප්‍රලාපදොඩන්නේ වේද (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) තද ලෝබකම ඇත්තේ වේද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) ක්‍රොධ සිත් ඇත්තේ වේද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) වැරැදි දැකීම් ඇත්තේවේද, දුන්දේ විපාක නැත. පුදන ලද්දේ විපාක නැත. ත්‍යාග කරන ලද්දේ විපාක නැත. යහපත්කොට කරණලද නපුරු කොට කරණලද කර්මයන්ගේ ඵලයක් විපාකයක් නැත. මෙලොව නැත, පරලොව නැත, මවු නැත, පියා නැත, ඉබේ පහළවන සතුන් නැත යමෙක් මෙලොවද පරලොවද තුමූ හොඳට දැන, අත්දැක දන්වත්ද, ලොකයෙහි (එබඳු) මහණ බමුණෝ නැත, යනුවෙන් විපරිත දැකුම් ඇත්තේවේද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

"තුමූ කයින්ද දඟලයි. වචනයෙන්ද දඟලයි. සිතින්ද දඟලයි. ඔහුගේ කායකර්මය ඇදවේ. වාක්කර්මය ඇදවේ. මනඃකර්මය ඇදවේ. ගතිය ඇදවේ. ඉපදීම ඇදවේ. මහණෙනි, මම ඇදගති ඇත්තහුට ඇද උත්පත්තියක් ඇත්තහුට එකාන්ත දුක්වූ නරකය හෝ බඩගායන සතුන් අයිති තිරිසන් යෝනිය හෝ යන දෙගතීන් අතුරින් එක් ගතියක් කියමි.

**5.** "මහණෙනි, ඒ බඩගායන ස්වභාව ඇති, තිරිසන් යෝනිය කවරේද, නාගය, ගෝනුසුය, පත්තෑය, මුගටිය, බලල්ලුය, මීයෝය, බකමූණෝය, කිසියම් අනෙකුත් තිරිසන් ගත සත්වයෝ වෙත්ද, මිනිසුන් දැක බියවෙත්. මහණෙනි, මෙසේ වූවාහු වනාහි සත්වයාගේ උත්පත්තියවේ. යමක් කරයිද එයින් උපදී. උපන්

මොහුට ස්පර්ශයෝ ස්පර්ශය කරත්. මහණෙනි, මෙසේද සත්වයෝ කර්මය දායාදකොට ඇත්තාහ. මහණෙනි, සත්වයෝ කර්මය දායාදකොට ඇත්තාහ. මහණෙනි, සත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ. කර්මය දායාදකොට ඇත්තාහ. කර්මය උත්පත්ති ස්ථානකොට ඇත්තාහ. කර්මය බන්ධූන් කොට ඇත්තාහ. කර්මය පිළිසරණ කොට ඇත්තාහ. යහපතක් හෝ අයහපතක් හෝ යම් කර්මයක් කරත්ද ඊට හිමිවෙත්.

**6.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් සතුන් මැරීම අත්හැර සතුන් මැරීමෙන් වෙන් වූයේවේ. බහාතබනලද දඬු ඇත්තේ බහාතබනලද ආයුධ ඇත්තේ පාපයෙහි ලජ්ජාවූයේ දයාවට බැසගත්තේ සියලු ප්‍රාණීන් කෙරෙහි දයාවෙන් අනුකම්පාවෙන් යුක්තව වාසය කරයි. (ii) හෙතෙම කයින් බඩගානොයයි. වචනයෙන් බඩගා නොයයි. සිතින් බඩගා නොයයි. ඔහුගේ කායකර්මය ඍජු වෙයි. වාක්කර්මය ඍජුවෙයි. මනඃකර්මය ඍජුවෙයි. ගතිය ඍජුවෙයි. උත්පත්තිය ඍජුවෙයි. මහණෙනි, මම ඍජුගති ඇත්තාහට ඍජු උත්පත්තිය ඇත්තාහට ඒකාන්ත සුඛවූ ස්වර්ගය හෝ යම් ඒ ක්ෂත්‍රිය මහාසාර කුලයෝ හෝ බ්‍රාහ්මණ මාහාසාර කුල හෝ ගෘහපති මහාසාර කුල හෝ ආඪ්‍යවූ මහත් ධන ඇත්තාවූ මහත් වස්තු ඇත්තාවූ බොහෝ රන්රුවන් බොහෝ වස්තු උපකරණ බොහෝ ධනධාන්‍ය ඇති උසස් කුල හෝ යන දෙවැදෑරුම්ගති අතුරින් එක්තරා ගතියක් කියමි. මහණෙනි, මෙසේවූවාහු වනාහි මෙසේ වූවාහුගේ උත්පත්තියවේ. යමක් කරයිද ඉන් උපදී. උපන් මොහුට ස්පර්ශයෝ ස්පර්ශවෙත්. මහණෙනි, මම මෙසේද සත්වයෝ කර්මය දායාදකොට ඇත්තාහයි කියමි.

**7.** "මහණෙනි, මෙලොකයෙහි ඇතැම්කෙනෙක් නුදුන් දේ ගැනීම අත්හැර නුදුන්දේ ගැනීමෙන් වෙන්වූයෙ වේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) කාමමිත්ථ්‍යාචාරය අත්හැර කාමමිත්ථ්‍යාචාරයෙන් වෙන්වූයේවේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි) බොරුකීම අත්හැර බොරුකීමෙන් වෙන්වූයේවේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) කේලාම්කීම අත්හැර කේලාම් කීමෙන්

වෙන්වූයේවේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි) ඵරුෂ වචනය අත්හැර ඵරුෂ වචනයෙන් වෙන්වූයේවේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි) ප්‍රලාප දෙඩීම අත්හැර ප්‍රලාප දෙඩීමෙන් වෙන්වූයේවේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) තද ලෝබකම නැත්තේවේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) ක්‍රොධ සිත් නැත්තේවේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) නිවැරැදි දැකීම් ඇත්තේවේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි) දෙන ලද්දේ විපාක ඇත. පුදන ලද්දේ විපාක ඇත. ත්‍යාගකරණ ලද්දේ විපාක ඇත. යහපත්කොට කරණලද නපුරුකොට කරණලද කර්මයන්ගේ ඵලයක් විපාකයක් ඇත. මෙලොව ඇත පරලොව ඇත. මවු ඇත පියා ඇත ඉබේ පහළවන සත්තු ඇත. යමෙක් මෙලොවද පරලොවද තෙමේ හොඳට දැන අත්දැක දන්වත්ද, යහපත් මාර්ගයෙහි ගිය යහපත් මාර්ගයෙහි පිළිපන් මහණ බමුණෝ ලොකයෙහි ඇතැයි විපරිත නොවූ (නොපෙරළුණු) දැකීම් ඇත්තේවේද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.)

8. "මහණෙනි, සත්වයෝ කර්මය ස්වකීයකොට ඇත්තාහ. කර්මය දායාදකොට ඇත්තාහ. කර්මය උත්පත්ති ස්ථාන කොට ඇත්තාහ. කර්මය බන්ධුන්කොට ඇත්තාහ. කර්මය පිළිසරණකොට ඇත්තාහ. යහපත් හෝ නපුරුවූ යම් කර්මයක් කරයිද එයට හිමිවෙත්. මහණෙනි, ඒ බඩගායාමේ පිළිවෙළ නම්වූ ධර්ම ක්‍රමයකි.

7. **සඤ්චෙතනික කම්ම සූත්‍රය**:- 1. "මහණෙනි, මම කරණලද රැස් කරණලද දැන දැන කළ කර්මයන්ගේ විපාක නොවිඳ අවසන් වීම නොකියමි. එයද මෙලොවද පරලෙච්හි හෝ අතරින් පතර ආත්ම භාවයේ හෝ වේ. මහණෙනි, මම දැන දැන කරණලද රැස් කරණලද කර්මයන්ගේ නොවිඳ දුක් කෙළවර කිරීමක් නොකියමි. මහණෙනි, එහි කාය කර්ම නම් විපත්තිවූ අකුසල් සිතිවිලිවූ දුක් උපදවන දුක් විපාකයෝ ත්‍රිවිධ වෙත්. වාක් කර්ම නම් විපත්තීවූ අකුසල් සිතිවිලිවූ දුක් උපදවන දුක් විපාකයෝ සතර වැදෑරුම් වෙත්. මනා කර්ම නම් විපත්තිවූ අකුසල් සිතිවිලිවූ දුක් උපදවන දුක් විපාකයෝ ත්‍රිවිධ වෙත්.

2\. "මහණෙනි, කෙසේ නම් කාය කර්ම නම් විපත්තිවූ, අකුසල් සිතිවිලිවූ දුක්නොදෙන, දුක් විපාකයෝ ත්‍රිවිධ වෙත්ද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් සතුන් මරන්නේ වේද, (ii) (මෙහි චතුත්ථ පණ්ණාසකයේ 17 වර්ගයේ 22 සූත්‍රයේ 4 ඡෙදයේ 'සියලු සතුන් කෙරෙහි' 'තැන් සිට ඇත්තේ වේද,' දක්වා යෙදිය යුතුයි.) (iii) මහණෙනි, මෙසේ වනාහි කාය කර්ම නම් විපත්තිවූ අකුසල් සිතිවිලිවූ දුක් උපදවන දුක් විපාකයෝ ත්‍රිවිධ වෙයි.

3\. "මහණෙනි, කෙසේ නම් වාක් කර්ම නම් විපත්තිවූ, අකුසල් සිතිවිලිවූ, දුක් උපදවන දුක් විපාකයෝ සතර වැදෑරුම් වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් බොරු කියන්නේ වේද, (ii) (මෙහි චතුත්ථ පණ්ණාසකයේ 17 වර්ගයේ 22 සූත්‍රයේ 5 ඡෙදයේ "සභාවකට ගියේ" යන තැන සිට 8 ඡෙදය දක්වා යෙදිය යුතුයි.) වචන කියන්නේ වේ. (iii) මහණෙනි, මෙසේවනාහි වාක්කර්ම නම් විපත්තිවූ අකුසල් සිතිවිලිවූ දුක් උපදවන දුක් විපාකයෝ සතර වැදෑරුම් වෙත්.

4\. "මහණෙනි, කෙසේ නම් මනඃකර්ම නම් විපත්තිවූ, අකුසල් සිතිවිලිවූ, දුක් උපදවන දුක් විපාකයෝ ත්‍රිවිධ වෙත්ද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් තද ලෝබකම් ඇත්තේ (ii) (මෙහි 17 වර්ගයේ 22 සූත්‍රයේ 9 ඡෙදයේ සිට 11 දක්වා යෙදිය යුතුයි) (iii) මහණෙනි, මෙසේ වනාහි මනඃ කර්ම නම් විපත්තිවූ අකුසල් සිතිවිලිවූ දුක් උපදවන, දුක් විපාකයෝ ත්‍රිවිධ වෙත්.

5\. (i) "මහණෙනි, ත්‍රිවිධ කාය කර්ම විපත්තිවූ අකුශල සිතිවිලි හෙතුවූ හෝ සත්වයෝ (ii) කායයාගේ බිඳීමෙන් මරණින් මතු (අය නම්) සැපයෙන් පහවූ දුගතිවූ නපුරු සේ ඇදවැටෙන නරකයෙහි උපදිත්. (iii) මහණෙනි, චතුර්විධ වාක් කර්ම නම් විපත්තිවූ අකුශල සිතිවිලි හෙතුවූ හෝ සත්වයෝ (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ත්‍රිවිධවූ මනඃ කර්ම විපත්තිවූ අකුශල සිතිවිලි හෙතුවූ සත්වයෝ (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

6. "මහණෙනි, යම්සේ නිර්දෝෂ මැණිකක් උඩට විසිකළේ යම් යම් තැනක පිහිටාද, මනාව පිහිටියේ වේද, මහණෙනි, එසේම (මෙහි 5 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මම කරණලද රැස් කරණලද දැන දැන කළ කර්මයන්ගේ විපාක නොවිඳ කෙළවර වීම නොකියමි. එයද මෙලොව හෝ දෙවෙනි ආත්ම භාවය හෝ අතරින් පතර ආත්ම භාවයක හෝ වේ.

7. "මහණෙනි, කරණලද රැස් කරණලද දැන දැන කළ කර්මයන්ගේ විපාක නොවිඳ, දුක් කෙළවර කිරීමක් මම නොකියමි. මහණෙනි, ඒ ඒ ත්‍රිවිධ කාය කර්ම සම්පත්තියෙන් සැප උපදවන සැප විපාක ඇති කුසල් සිතිවිලි වේ. චතුර්විධ වාක් කර්ම සම්පත්තියෙන් සැප උපදවන සැප විපාක ඇති කුසල් සිතිවිලි වේ. ත්‍රිවිධ මනඃ කර්ම සම්පත්තියෙන් සැප උදවන සැප විපාක ඇති කුසල් සිතිවිලි වේ.

8. "මහණෙනි, කෙසේ වනාහි ත්‍රිවිධ කාය කර්ම සම්පත්තියෙන් සැප උදවන සැප විපාක ඇති කුසල් සිතිවිලි වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් සතුන් මැරීම අත්හැර (ii) (මෙහි 17 වර්ගයේ 22 සූත්‍රයේ 13 ඡේදයේ "සතුන් මැරීමෙන්" සිට නොපැමිණියේ වේ. යන්න දක්වා යෙදිය යුතුයි.) (iii) හැසිරීමට නොයත්ද මහණෙනි, මෙසේ වනාහි සැප උදවන සැප විපාක ඇති කුසල් උපදවන කාය කර්ම සම්පත්තිය වේ.

9. "මහණෙනි, කෙසේ වනාහි සැප උපදවන සැප විපාක ඇති කුසල් උපදවන චතුර්විධ වාක් කර්ම සම්පත් වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් බොරුකීම අත්හැර (ii) (මෙහි 17 වර්ගයේ 21 සූත්‍රයේ 14 ඡේදයේ "සභාවකට" තැන්සිට 17 නොකියන්නේවේ. දක්වා යෙදිය යුතුයි.) (iii) මහණෙනි, මෙසේ වනාහි සැප උපදවන සැප විපාක ඇති කුසල් උපදින සතරවැදෑරුම් වාක් කර්ම සම්පත්තියවේ.

10. "මහණෙනි, කෙසේ වනාහි සැප උපදවන සැප විපාක ඇති කුසල් උපදවන ත්‍රිවිධ මනඃ කර්ම සම්පත්තිය වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් තද ලෝභකම

බහුලකොට ඇත්තේ නොවේද, (මෙහි 17 වර්ගයේ 22 සූත්‍රයේ 18 ඡේදයේ "අනුන්ගේ යම්" තැන්සිට 20 ඡේදයේ "නොවේද" දක්වා යෙදිය යුතුයි) ප්‍රකාශ කරත්ද මහණෙනි, මෙසේ වනාහි සැප උපදවන සැප විපාක ඇති කුසල් උපදවන ත්‍රිවිධ මනඃ කර්ම සම්පත්තිය වේ.

**11.** "මහණෙනි, කුසල් උපදවනා ත්‍රිවිධ කායකර්ම සම්පත්ති හෙතුවෙන් හෝ (ii) සත්වයෝ මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපදිත්. වාක්කර්ම සම්පත්ති හෙතුවෙන් හෝ (මෙහි 11 (ii) යෙදිය යුතුයි.) මනොකර්ම සම්පත්ති හෙතුවෙන් හෝ සත්වයෝ (කරජ) කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ගලොකයෙහි උපදිත්.

**12.** "මහණෙනි, යම්සේ නිර්දොෂ මැණිකක් උඩවිසි කෙළේ නම් යම් තැනෙක පිහිටාද, මොනවට පිහිටියේ වේද, මහණෙනි, එසේම කුසල් උපදවන ත්‍රිවිධ කායකර්ම සම්පත්ති හෙතුවෙන් හෝ සත්වයෝ (මෙහි 11 ඡේදය යෙදිය යුතුයි) වාක්කර්ම මනොකර්ම හෙතුවෙන් හෝ සත්වයෝ (කරජ) කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලොකයෙහි උපදිත්.

**8. දුතිය සඤ්චෙතනික කම්ම සූත්‍රයː-** 1. "මහණෙනි, මම කරණ ලද රැස්කරණ ලද දැන දැන කළ කර්මයන්ගේ විපාක නොවිඳ අන්තයට යාමක් නොකියමි. එයද මෙලොව හෝ දෙවෙනි ආත්ම භාවයෙහි හෝ අතරින් පතර ආත්මභාවයක හෝ වේ. මහණෙනි, මම කරණ ලද රැස්කරණ ලද දැන දැන කළ කර්මයන්හි විපාක නොදී දුක් කෙළවර කිරීමක් නොකියමි.

**2.** "මහණෙනි, මම කරණලද රැස්කරණ ලද දැන දැන කළ කර්මයන්ගේ විපාකනොවිඳ අවසන්වීම නොකියමි. එයද මොලොව හෝ පරලොව හෝ අතරින් පතර ආත්මභාවයක හෝ වේ. මහණෙනි, මම කරණ ලද රැස්කරණ ලද දැන දැන කළ කර්මයන්ගේ විපාක නොදී දුක් කෙළවර කිරීමක් නොකියම්මය. මහණෙනි, එහි ත්‍රිවිධකාය නමැති කර්ම විපත්තිවූ (ii) අකුශල් සිත් දුක් උපදවන්නේය. දුඃඛ විපාක ඇත්තේය. චතුර්විධ වාක් කර්ම නැමැති විපත්තිවූ අකුසල් සිත් දුක්

උපදවන්නේය. දුඃඛ විපාක ඇත්තේය. ත්‍රිවිධ මනඃ කර්ම නැමැති විපත්තිවූ අකුසල් සිත් දුක් උපදවන්නේය දුඃඛ විපාක ඇත්තේය.

3. "මහණෙනි, කෙසේ වනාහි ත්‍රිවිධ කායකර්ම නැමැති විපත්තිවූ අකුසල් සිත් දුක් උපදවන්නේද දුක් විපාක ඇත්තේද? මහණෙනි, මෙසේ වනාහි කාය කර්ම නැමැති විපත්තිවූ අකුසල් සිත් දුක් උපදවයි. දුඃඛ විපාක ඇත්තේය.

4. "මහණෙනි, කෙසේ වනාහි ත්‍රිවිධ වාක් කර්ම නැමැති විපත්තිවූ අකුසල් සිත් දුක් උපදවයිද දුඃඛ විපාක ඇත්තේ වේද? (මෙහි මේ වර්ගයේ 7 සූත්‍රයේ 3 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි සතර වැදෑරුම් වාක්කර්ම නම් විපත්තිවූ අකුසල් සිත් දුක් උපදවයි. දුඃඛ විපාක ඇත්තේවේ.

5. "මහණෙනි, කෙසේ වනාහි තුන් වැදෑරුම් මනඃකර්ම විපත්තිවූ අකුසල් සිත් දුක් උපදවයිද? දුඃඛ විපාක ඇත්තේ (ii) (මෙහි 17 වර්ගයේ 22 සූත්‍රයේ 18 ඡේදයේ 'සිතින්' යන තැන සිට යෙදිය යුතුයි.) (iii) මහණෙනි, මෙසේ වනාහි තුන් වැදෑරුම් මනඃ කර්ම නම් අකුසල් සිත් දුක් උපදවයි, දුඃඛ විපාක ඇත්තේ වේ.

6. "මහණෙනි, තුන් වැදෑරුම් කාය කර්ම (ii) නම් විපත්තිවූ අකුසල් සිත් හෙතුවූ හෝ සත්වයෝ කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති දුගතිවූ නරකයෙහි උපදිත්. (iii) සතර වැදෑරුම් වාක්කර්ම (මෙහි 6 (ii) ඡේදය යෙදිය යුතුයි) අකුසල් උපදවන තුන් වැදෑරුම් මනඃ කර්ම (මෙහි මේ සූත්‍රයේ 6 (ii) ඡේදය යෙදිය යුතුයි)

7. මහණෙනි, (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, කෙසේ නම් තුන් වැදෑරුම් කාය කර්ම සම්පත්තිවූ කුසල් සිත් සුව ගෙන දෙන්නේද, සැප විපාක ඇත්තේද? (මෙහි මේ වර්ගයේ 7 සූත්‍රයේ 8 (ii) ඡේදය යෙදිය යුතුයි)

8. "මහණෙනි, මෙසේ තුන් වැදෑරුම් කාය කර්ම සම්පත්තිවූ කුසල් සිත් සුව ගෙන දෙන්නේ වේ.

9. "මහණෙනි, කෙසේ නම් සතර වැදෑරුම් වාක් කර්ම සම්පත්තිවූ කුසල් සිත්, සුවගෙන දෙන්නේද? (මෙහි මේ වර්ගයේ

7 සූත්‍රයේ 9 (ii) ඡේදය යෙදිය යුතුයි) සැපවිපාක ඇත්තේද? (මෙහි මේ වර්ගයේ 7 සූත්‍රයේ 8 (ii) ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, මෙසේ වනාහි සතර වැදෑරුම් වාක්කර්ම සම්පත්තිවූ කුසල් සිත්, සුව ගෙන දෙන්නේ වේ. සැප විපාක ඇත්තේවේ.

**10.** "මහණෙනි, කෙසේනම් ත්‍රිවිධ මනඃකර්ම සම්පත්තිවූ අකුසල් සිත් සුව ගෙන දෙන්නේද? සැප විපාක ඇත්තේ වේද? (මෙහි මේ සූත්‍රයේ 5 (ii) ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, ත්‍රිවිධ මනඃ කර්ම සම්පත්තිවූ කුසල් සිත් සැප ගෙන දෙන්නේවේ. සැප විපාක ඇත්තේවේ.

**11.** මහණෙනි, (මෙහි මේ වර්ගයේ 7 සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි)

**9. කරජකායානුග සූත්‍රයඃ-** 1. "මහණෙනි, මම කරනලද රැස්කරනලද දැන දැන කළ, කර්මයන්ගේ විපාකනොදී අවසන්වීමක් නොකියමි. එයද මෙලොව හෝ දෙවෙනි ආත්ම භාවයෙහි හෝ අනික් අනික් ආත්ම භාවයෙක්හි හෝ වේ, මහණෙනි, කරණලද රැස්කරනලද, දැන දැන කළ කර්මයන්ගේ විපාකනොදී අන්කෙළවර කිරීමක් නොකියමි.

**2.** "මහණෙනි, ඒ මේ ආර්ය ශ්‍රාවකතෙම මෙසේ පහවූ තද ලෝභකම ඇත්තේ, පහවූ ක්‍රොධ ඇත්තේ, නොමුළා වූයේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ, මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙදිශාවක් තුන් දිශාවක් සතර දිශාවක් මෙසේ උඩයට සරස හැමතැනම සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත ලොකය මහත්වූ මහත් භාවයට පැමිණි අප්‍රමාණවූ, වෛරනැති, ක්‍රොධනැති, මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසයකරයි. හෙතෙම පෙරවනාහි මාගේ මේ සිත ස්වල්පය දියුණු නැතිවිය. දැන් වනාහි මාගේ සිත උසස්ය, වඩන ලද්දේය ප්‍රමාණ කරණලද යම්කිසි කර්මයක් වේද, එය එහි ඉතිරි නොවේ. එය එහි නොසිටියයි' මෙසේ දනී මහණෙනි, ඒ කුමකැයි හඟින්නේද? මේ කුමාරතෙම ළදරුකාලයේම මෛත්‍රී චිත්ත විමුක්තිය වඩන්නේ නම් කිමෙක්ද? පවුකම් කරන්නේද? "ස්වාමීනි, නැත" "පව්කම් නොකරන්නේ දුක් ස්පර්ශ

කරන්නේද?" "නැත ස්වාමීනි, ස්වාමීනි, පවුකම් නොකරන්නේ දුක් කොයින් ස්පර්ශ කරන්නේද"

3. "මහණෙනි, මේ මෛත්‍රි චිත්ත විමුක්තිය (මෛත්‍රි සිත කරණකොට පවින් මිදීම) (ii) ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් වැඩියයුතුය. මහණෙනි, ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් මේ ශරීරය රැගෙන නොයන සුලුය. මහණෙනි, මේ සත්වතෙම යම්හෙයකින් මා විසින් මේලොකයෙහි පෙර මේ ශරීරයෙන් කිසියම් පාපකර්මයක් කරණ ලද්දේද, එය මෙහිදී වින්ද යුතුය, එය අනුව නොයන්නේයයි, මෙසේ දනීද එය එක්තරා සිතෙකි. මහණෙනි, මේ ශාසනයෙහි මත්තෙහි මිදීම ප්‍රතිවෙධ නොකරන්නාවූ මහණහට මෙසේ වඩනලද මෛත්‍රී චිත්ත විමුක්තිය අනාගාමී බව පිණිස පවතී.

4. "කරුණා සහගත සිතින්, මුදිතා සහගත සිතින්, උපෙක්ෂා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිශාවක් තුන් දිශාවක් සතර දිශාවක් මෙසේ උඩයට සරස හැමතැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත ලොකයා මහත්වූ මහත් භාවයට පැමිණි අප්‍රමාණවූ වෛර නැති ක්‍රොධ නැති මෛත්‍රී සහගතවූ සිතින් පතුරුවා වාසය කරයි. හෙතෙම පෙර වනාහි මාගේ සිත සුලුය, නොදියුණුය. දැන් වනාහි මාගේ මේ සිත උසස්ය. වඩනලද්දේය. ප්‍රමාණ කරණලද යම්කිසි කර්මයක්වේද, එය එහි ඉතිරි නොවේ. එය එහි නොසිටියයි' මෙසේ දනී. මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? මේ කුමාරතෙම ළදරුකාලයේම උපෙක්ෂා චිත්ත විමුක්තිය වැඩුයේ නම් කිමෙක්ද, පවුකම් කරන්නේද?" "නැත ස්වාමීනි, පවුකම් නොකරන්නහු දුක් ස්පර්ශ කරන්නේද, ස්වාමීනි නැත. ස්වාමීනි, පවුකම් නොකරන්නේ දුක් කොයින් ස්පර්ශ කරන්නේද?"

"මහණෙනි මේ උපෙක්ෂා චිත්ත විමුක්තිය (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

**10. අධම්ම ධම්ම චරිය සූත්‍රයː-** ඉක්බිති එක්තරා බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක

සිටියේය. එකත්පසෙක සිටි ඒ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට, "පින්වත් ගෞතමයන් වහන්ස, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ (ශරීරයාගේ) බිඳීමෙන් මරණින් මතු සැපනැති, දුගතිවූ, නපුරුව ඇද වැටෙන, නරකයෙහි උපදිත්ද, ඊට හෙතු කවරේද? ඊට ප්‍රත්‍යය කවරේදැයි' ඇසීය.

**2.** "බමුණ, අධර්ම හැසිරීමෙන් විෂම හැසිරීමෙන් මෙසේ මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ (ශරීරයාගේ) බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරුගති ඇති නපුරුව ඇද වැටෙන නරකයෙහි උපදිත්."

**3.** "පින්වත් ගෞතමයන් වහන්ස, යම්කාරණයකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදිත්ද, ඊට හෙතුකවරේද, ඊට ප්‍රත්‍යය කවරේද?"

"බමුණ, ධර්මචර්යාව සමචර්යාව හෙතුකොටගෙන මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත්ගති ඇති ස්වර්ගලොකයෙහි උපදිත්.

**4.** "පින්වත් ගෞතමයන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් වදාරණලද මේ කියමනේ විස්තරාර්ථ නොදනිමි. භවත් ගෞතමන් වහන්සේ මට යම් මේ පින්වත් ගෞතමයන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් වදාරණලද මේ භාෂිතයාගේ විස්තර වශයෙන් අර්ථය දනිම්ද, එසේ බණ වදාරණසේක්වා."

**5.** "බමුණ, එසේ නම් අසව යහපත්ව මෙනෙහි කරව කියන්නෙමියි" වදාළසේක. "පින්වතුන්වහන්ස, එසේ යයි" ඒ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**6.** "බමුණ, කයින් ත්‍රිවිධ අධර්මචරියාව විෂමචරියාවවේ. වචනයෙන් සිවුවැදෑරුම් අධර්මචරියාව විෂමචරියාවවේ. සිතින් තුන්වැදෑරුම් අධර්මචර්යාව විෂමචරියාවවේ. බමුණ, කයින් ත්‍රිවිධවූ අධර්මචරියාව කෙසේ විෂමචර්යාවවේද, (මෙහි මේ

වර්ගයේ 7 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) වචනයෙන් සතර වැදෑරුම් අධර්මචර්යාව කෙසේ විෂමචර්යාව වේද, (මෙහි මේ වර්ගයේ 7 සූත්‍රයේ 4 (ii) ඡේදය යෙදිය යුතුයි.) සිතින් තුන් වැදෑරුම් අධර්මචරියාව කෙසේ විෂම චරියාවවේද, (මෙහි 17 වර්ගයේ 22 සූත්‍රයේ 18 ඡේදය යෙදිය යුතුයි.) බමුණ මෙසේ වනාහී සිතින් ත්‍රිවිධවූ අධර්මචරියාව, විෂමචරියාවවේ. බමුණ, මෙසේ අධර්මචර්යා විෂමචර්යා හේතුවෙන් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරුගති ඇති නපුරුව ඇදවැටෙන නරකයෙහි උපදිත්.

**7.** "බමුණ, කයින් ත්‍රිවිධවූ ධර්මචර්යාව සමචර්යාවවේ. වචනයෙන් සතරවැදෑරුම් ධර්මචර්යාව සමචර්යාවවේ. සිතින් තුන්වැදෑරුම් ධර්මචර්යාව සමචර්යාවවේ. බමුණ කෙසේ වනාහි කයින් ත්‍රිවිධ ධර්මචර්යාව සමචර්යාවවේද, (මෙහි 17 වර්ගයේ 22 සූත්‍රයේ 13 ඡේදය යෙදිය යුතුයි.) බමුණ මෙසේ වනාහි කයින් ත්‍රිවිධ ධර්මචර්යාව සමචර්යාවවේ. බමුණ, කෙසේ වනාහි වචනයෙන් සතර වැදෑරුම් ධර්මචරියාව සමචර්යාව වේද? (මෙහි 17 වර්ගයේ 22 සූත්‍රයේ 14-17 ඡේද යෙදිය යුතුයි) මෙසේ වනාහි වචනයෙන් සතර වැදෑරුම් ධර්මයෙහි හැසිරීම සමව හැසිරීමවේ. බමුණ, කෙසේනම් සිතින් ත්‍රිවිධවූ ධර්මයෙහි හැසිරීම සමව හැසිරීමවේද? (මෙහි 17 වර්ගයේ 22 සූත්‍රයේ 18 ඡේදය යෙදිය යුතුයි.) බමුණ මෙසේ වනාහි සිතින් තුන්වැදෑරුම් ධර්මචර්යාව සමචර්යාවවේ.

**8.** "බමුණ, මෙසේ ධර්මචර්යා සමචර්යා හෙතුවෙන් මේලොකයෙහි ඇතැම් සත්වයෝ කායයාගේ බිඳීමෙන් මරණින්මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදිත්යයි" වදාළසේක.

**9.** "පින්වත් ගෞතමයන් වහන්ස, (මෙහි 3 අංගුත්තර නිකායේ 7 නිපාතයේ 7 වර්ගයේ 13 සූත්‍රයේ 27 ඡේදය යෙදිය යුතුයි.)

**(කරජකාය වර්ගය නිමි.)**

---

## 22. සාමඤ්ඤ වර්ගය.

11. **දසසුගති දුග්ගති ධම්ම සූත්‍රය**:- 1. "මහණෙනි ධර්ම දශයකින් යුක්තවූ තැනැත්තා ගෙණඑන ලද්දක් බහා තබන ලද්දක් මෙන් නරකයෙහි වේ.

2. "කවර දශයකින්ද යත්? සතුන් මරන්නේවේද, නුදුන්දේ ගන්නේවේද, කාමයන්හි වරදවා හැසිරෙන්නේ වේද, බොරුකියන්නේවේද, කේලාම් කියන්නේවේද, ඵරුෂ වන කියන්නේවේද, ප්‍රලාප දොඩන්නේවේද, තද ලෝබකම ඇත්තේවේද, ක්‍රොධසිත් ඇත්තේවේද, මිසදිටුවේද, මහණෙනි, මේ ධර්ම දශයෙන් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහාතබන ලද්දක්මෙන් නරකයෙහිවේ.

3. "මහණෙනි, ධර්ම දශයකින් යුක්තවූ තැනැත්තා ගෙන එන ලද්දක් බහාතබන ලද්දක්මෙන් ස්වර්ගයෙහිවේ.

4. (මෙහි 21 වර්ගයේ 1 සූත්‍රයේ 4 (ii) ඡෙදය යෙදිය යුතුයි.) (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

12. **වීසති ධම්ම සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු විස්සකින් යුක්තවූයේ ගෙන එනලද්දක් බහාතබන ලද්දක් මෙන් නරකයෙහිවේ.

2. "කවර විස්සකින්ද යත්? තමාද සතුන්මරන්නේ වේද, අනුන්ද සතුන් මැරීමෙහි සමාදන් කරවයිද තමාද නුදුන්දේ ගන්නේ වේද, අනුන්ද නුදුන්දේ ගැනීමෙහි සමාදන් කරවයිද, තමාද කාමයන්හි වරදවා හැසිරීමෙහි යෙදෙයිද, අනුන්ද කාමයන්හි වරදවා හැසිරීමෙහි යොදවයිද, තමන් බොරුකියයිද, අනුන්ද බොරුකීමෙහි යොදවයිද, තමන් කේලාම් කියයිද, අනුන්ද කේලාම් කීමෙහි යොදවයිද, තමන් ප්‍රලාප දොඩාද, අනුන්ද ප්‍රලාප දෙඩීමෙහි යොදවයිද, තමන් තෘෂ්ණා බහුලකොට ඇත්තේද, අනුන්ද තෘෂ්ණා බහුලබවෙහි යොදවයිද, තමන් ක්‍රොධසිත් ඇත්තේවේද, අනුන්ද ක්‍රොධයෙහි යොදවයිද, තමන් මිසදිටුවේද, අනුන්ද මිසදිටුයෙහි යොදවයිද, මහණෙනි, මේ විසි ධර්මයන්ගෙන් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහා තබන ලද්දක්මෙන් නරකයෙහිවේ.

3. "මහණෙනි, කරුණු විස්සකින් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහාතබන ලද්දාක්මෙන් ස්වර්ගයෙහිවේ.

4. "කවර විස්සකින්ද යත්? තමන් සතුන් මැරීමෙන් වලකින්නේවේද, අනුන්ද සතුන් නොමැරීමෙහි සමාදන් කරවයිද, තමන් නුදුන්දේ ගැනීමෙන් වලකීද, අනුන්ද නුදුන්දේ නොගැන්මෙහි සමාදන්කරවයිද, තමාද කාමයන්හි වරදවා හැසිරීමෙහි නොයෙදෙයිද, අනුන්ද කාමයන්හි වරදවා නොහැසිරීමෙහි සමාදන් කරවයිද, තමන් බොරු නොකියයිද, අනුන්ද බොරු නොකීමෙහි සමාදන් කරවයිද, තමන් කේලාම් නොකියයිද, අනුන්ද කේලාම් නොකීමෙහි සමාදන් කරවයිද, තමන් ප්‍රලාප දොඩවයිද, අනුන්ද ප්‍රලාප නොකීමෙහි සමාදන් කරවයිද, තමන් තෘෂ්ණා බහුලකොට නැත්තේද, අනුන්ද තෘෂ්ණා බහුල නොවීමෙහි සමාදන් කරවයිද, තමන් ක්‍රොධසිත් ඇත්තේ නොවේද, අනුන්ද ක්‍රොධසිත් ඇති නොකිරීමේ සමාදන්කරවයිද, තමන් මිසදිටු නොවේද, අනුන්ද මිසදිටු නොවීමේ සමාදන්කරවයිද, (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

13. **තිංස ධම්ම සූත්‍රයඃ**- 1. "මහණෙනි, ධර්ම තිහකින් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහා තබන ලද්දාක් මෙන් නරකයෙහි වේ. තමාද සතුන් නැසීමෙන් යුක්තවූයේ වේ. අනුන්ද සතුන් නැසීමෙහි සමාදන් කරවයි, සතුන් නැසීමෙහි එකඟවූයේ වෙයි. නුදුන් දෙය ගැණීමෙන්, කාමයන්හි වැරදි හැසිරීමෙන් බොරු කීමෙන්, කේලාම් කීමෙන්, ඵරුෂ වචන කීමෙන් හිස් වචන දෙඩීමෙන්, තද ලොභ කමින්, ක්‍රොධයෙන් යුක්තවූයේ වේද, අනුන්ද සමාදන් කරවයිද, එකඟවූයේ වේද තමාද වැරදි දැකීම් ඇත්තේ වේද, අනුන්ද වැරදි දැකීමට සමාදන් කරවයිද, අනුන්ද වැරදි දැකීමට එකඟවූයේ වේද, මහණෙනි, මේ ධර්ම තිහෙන් යුක්ත වූයේ ගෙනඑන ලද්ද බහා තබන ලද්දාක් මෙන් මෙසේ නරකයෙහි වේ.

2. "මහණෙනි, තිස් ධර්මයකින් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහා තබන ලද්දක්මෙන් ස්වර්ගයෙහි උපදී.

3. "කවර තිසකින්ද යත්? තමාද සතුන් නැසීමෙන් වෙන්වූයේ වේ. අනුන්ද සතුන් මැරීමෙන් වෙන්වීමට සමාදන් කරවයි. සතුන් මැරීමෙන් වෙන් වීමට එකඟ වූයේ වේ. නුදුන් දෙය ගැන්මෙන්, කාමයන්හි වැරදි හැසිරීමෙන්, බොරු කීමෙන්, කේලාම් කීමෙන්, ඵරුෂ වචනයෙන්, හිස් වචන දෙඩීමෙන්, තද ලෝබ කමින්, ක්‍රොධයෙන්, වෙන්වූයේ වේද, අනුන්ද සමාදන් කරවයිද, එකඟ වූයේ වේද, තමාද නිවැරැදි දැකීම් ඇත්තේ වේද, නිවැරැදි දැකීමට සමාදන් කරවයිද, නිවැරැදි දැකීමට එකඟවූයේ වේද, මහණෙනි, මේ ධර්ම තිහෙන් යුක්තවූයේ ගෙන එන ලද්ද බහා තබන ලද්දාක් මෙන් මෙසේ ස්වර්ගයෙහි වේ."

14. **චත්තාළීස ධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්ම සතළිහකින් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහා තැබුවා සේ නරකයෙහි වේ.

2. "කවර සතළිසකින්ද යත්? තමාද සතුන් මරන්නේ වේ. අනුන්ද සතුන් මැරීමෙහි සමාදන් කරවයි. සතුන් මැරීමෙහි එකඟ වෙයි. සතුන් මැරීමෙහි ගුණද කියයි. (මෙසේ සතර ආකාරයෙන් අනික් කොටස්වලට යොදාගත යුතුයි.)

3. "මහණෙනි, ධර්ම සතළිහකින් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහා තැබූයේ යම්සේද එසේ ස්වර්ගයෙහි වේ.

4. "කවර සතලිහකින්ද යත්? තමන්ද සතුන් මැරීමෙන් වෙන්වූයේ වේ. අන්‍යයන්ද සතුන් මැරීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි, සතුන් මැරීමෙන් වෙන්වීමට එකඟ වන්නේ වේ. සතුන් මැරීමෙන් වෙන්වීමෙහි ගුණ කියයි. (මෙසේ සතර ආකාරයෙන් දස කුසලයේ අනික් කොටස්වලට යොදාගත යුතුයි.)

15. **දස ඛතූපහත ධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, දස ධර්මයකින් යුක්තවූයේ සාරා දමනලද ගුණ ඇති නසනලද ගුණ ඇති ආත්මයක් පරිහරණය කරයි. (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ ධර්ම දසය යොදාගත යුතුයි.) සාරා නොදමන ලද ගුණ ඇති නොනසන ලද ගුණ ඇති, ආත්මයක් පරිහරණය

කරයි (මෙහි මේ වර්ගයේ 4 සූත්‍රයේ ධර්ම දසය යොදාගත යුතුයි.)

**16. වීසති බතුපහත ධම්ම සූත්‍රයः-** "මහණෙනි, ධර්ම විස්සකින් යුක්තවූයේ සාරා දමනලද ගුණ ඇති නසන ලද ගුණ ඇති ආත්මයක් පරිහරණය කරයි. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි) මහණෙනි ධර්ම විස්සකින් යුක්තවූයේ සාරා නොදමන ලද ගුණ ඇති නොනසන ලද ගුණ ඇති ආත්ම භාවයක් පරිහරණය කරයි. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

**17. තිංස තිබතුපහත ධම්ම සූත්‍රයः-** "මහණෙනි, ධර්ම තිහකින් යුක්තවූයේ සාරා දමන ලද ගුණ ඇති නසන ලද ගුණ ඇති ආත්මයක් පරිහරණය කරයි. (මෙහි මේ වර්ගයේ 13 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, ධර්ම තිහකින් යුක්තවූයේ සාරා නොදමන ලද ගුණ ඇති නොනසන ලද ගුණ ඇති ආත්ම භාවයක් පරිහරණය කරයි. (මෙහි මේ වර්ගයේ 13 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

**18. චත්තාළිස බතුපහත ධම්ම සූත්‍රයः-** මහණෙනි, ධර්ම සතළිසකින් යුක්තවූයේ සාරා දමන ලද ගුණ ඇති නසනලද ගුණ ඇති ආත්මයක් පරිහරණය කරයි. (මෙහි මේ වර්ගයේ 14 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, ධර්ම සතළිසකින් යුක්තවූයේ සාරා නොදමන ලද ගුණ ඇති නොනසන ලද ගුණ ඇති ආත්ම භාවයක් පරිහරණය කරයි. (මෙහි මේ වර්ගයේ 14 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

**19. දස අපායුපග ධම්ම සූත්‍රයः-** "මහණෙනි, ධර්ම දශයකින් යුක්තවූ මේ ලොකයෙහි වසන ඇතැම් පුද්ගලයෙක් කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති නපුරු කොට ඇද වැටෙන නරකයෙහි උපදියි. (මෙහි මේ වර්ගයේ 11 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, ධර්ම දශයකින් යුක්තවූ මේ ලොකයෙහි වසන ඇතැම් පුද්ගලයෙක් කායයාගේ බිඳීමෙන් යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදියි. (මෙහි මේ වර්ගයේ 11 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

**20. වීසති අපායුපග ධම්ම සූත්‍රය**:- "මහණෙනි, ධර්ම විස්සකින් යුක්තවූ මේ ලොකයෙහි වසන ඇතැම් පුද්ගලයෙක් කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති නපුරු කොට ඇද වැටෙන නරකයෙහි උපදියි. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, ධර්ම විස්සකින් යුක්තවූ මේ ලොකයෙහි වසන ඇතැම් පුද්ගලයෙක් කායයාගේ බිඳීමෙන් යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදියි. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

21. "**තිංසති අපායුපග ධම්ම සූත්‍රය**:- "මහණෙනි, ධර්ම තිසකින් යුක්තවූ මේ ලොකයෙහි වසන ඇතැම් පුද්ගලයෙක් කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති නපුරු කොට ඇද වැටෙන නරකයෙහි උපදියි (මෙහි මේ වර්ගයේ 13 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, ධර්ම තිසකින් යුක්තවූ මේ ලෝකයෙහි වසන ඇතැම් පුද්ගලයෙක් යහපත් ගති ඇති සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපදියි. (මෙහි මේ වර්ගයේ 13 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

22. "**චත්තාළීසති අපායුපග ධම්ම සූත්‍රය**:- "මහණෙනි, ධර්ම සතළිසකින් යුක්තවූ මේ ලොකයෙහි වසන ඇතැම් පුද්ගලයෙක් කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති නපුරු කොට ඇද වැටෙන නරකයෙහි උපදියි. (මෙහි මේ වර්ගයේ 14 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, ධර්ම සතළිසකින් යුක්තවූ මේ ලොකයෙහි වසන ඇතැම් පුද්ගලයෙක් කායයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදියි. (මෙහි මේ වර්ගයේ 14 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

**23. දස බාල ධම්ම සූත්‍රය**:- 1. "මහණෙනි, දස ධර්මයකින් යුක්තවූ බාලයා දතයුතුයි. දස ධර්මයකින් යුක්තවූ පණ්ඩිතයා දතයුතුයි. මහණෙනි, විසි ධර්මයකින් යුක්තවූ බාලයා දතයුතුයි. මහණෙනි, විසි ධර්මයකින් යුක්තවූ පණ්ඩිතයා දතයුතුයි. මහණෙනි, තිස් ධර්මයකින් යුක්තවූ බාල දතයුතුයි. මහණෙනි,

තිස් ධර්මයකින් යුක්තවූ පණ්ඩිතයා දතයුතුයි. මහණෙනි, සතලිස් ධර්මයකින් යුක්තවූ බාලයා දතයුතුයි. මහණෙනි, මේ සතලිස් ධර්මයෙන් යුක්තවූ පණ්ඩිතයා දත යුතුයි. (මේ ධර්ම ඉහත සූත්‍රයේ මෙනි.)

**23. අසුභසඤ්ඤා රාගාභිඤ්ඤා සූත්‍රය**:- 1. "මහණෙනි, රාගය හොඳට දැන ගැනීම පිණිස ධර්ම දහයක් වැඩිය යුතුය. කවර දසයක්ද යත්? අශුභය යන හැඟීම, මැරේය යන හැඟීම, අහරෙහි පිළිකුල් හැඟීම, සියලු ලොකයෙහි නොඇලෙන හැඟීම, අනිත්‍ය හැඟීම, අනිත්‍යයෙහි දුක් යන හැඟීම, දුකෙහි අනාත්මය යන හැඟීම, දුරුකරණ සංඥාව, නොඇලෙන සංඥාව, නිවණ යන හැඟීම යන දසයයි මහණෙනි, රාගය හොඳට දැන ගැනීම පිණිස මේ ධර්ම දහය වැඩිය යුත්තාහ."

**24. අනිච්ච සඤ්ඤා පරිඤ්ඤා සූත්‍රය**:- 1. "මහණෙනි, රාගයාගේ හොඳට දැනගැනීම පිණිස ධර්ම දහයක් වැඩිය යුත්තාහ. කවර දසයක්ද යත්? අනිත්‍යය යන හැඟීම, අනාත්මය යන හැඟීම, ආහාරයෙහි පිළිකුල් හැඟීම, සියලු ලොකයෙහි නොඇලෙන හැඟීම, ඇට යන හැඟීම, පණුවන් යන හැඟීම, නිල්ය යන හැඟීම, පූයාය යන හැඟීම, සිදුරු සහිතය යන හැඟීම, ඉදිමුණේය යන හැඟීම යන දසයයි. මහණෙනි, රාගයාගේ හොඳට දැනීම පිණිස මේ ධර්ම දහය වැඩිය යුත්තාහ."

**25. දස ධම්ම රාග සඤ්ඤා සූත්‍රය**:- 1. "මහණෙනි, රාගය හොඳට දැන ගැනීම පිණිස (ii) ධර්ම දහයක් වැඩිය යුත්තාහ. කවර දහයක්ද යත්? නිවැරැදි දැකීම, නිවැරැදි සිතීම, නිවැරැදි වචන, නිවැරැදි ක්‍රියා, නිවැරැදි ජීවිකාව, නිවැරැදි වෑයම, නිවැරැදි සිහිය, නිවැරැදි සිතේ එකඟකම, නිවැරැදි නුවණ, නිවැරැදි මිදීම යන දසයයි. මහණෙනි, රාගය හොඳට දැනීම පිණිස මේ ධර්ම දහය වැඩිය යුත්තාහ."

**26. දස ධම්ම පරිඤ්ඤා සූත්‍රය**:- 1. "මහණෙනි, රාගයාගේ පිරිසිඳ දැනීම පිණිස, ක්ෂය කිරීම පිණිස, ප්‍රහාණය පිණිස, ක්ෂය වීම පිණිස, විනාශය පිණිස, නොඇලීම පිණිස, නිරුද්ධිය

පිණිස, සංසිඳීම පිණිස, අත් හැරීම පිණිස, දුරු කිරීම පිණිස, (මෙහි මේ වර්ගයේ 25 සූත්‍රයේ 1 (i) ඡේදය යෙදිය යුතුයි.) මේ ධර්ම දහය වැඩිය යුතුය. ද්වෙෂය, මොහය, ක්‍රොධය, බද්ධ වෛරය, ගුණමකුකම, උතුමන් සමකර සිතීම, ඊර්ෂ්‍යාව, මසුරුකම, මායාව, කෛරාටිකකම, තදකම, එකට එක කිරීම, මාන්නය අතිමාන්නය, මදය, ප්‍රමාදය යන මොවුන් හොඳට දැනීම පිණිස, පිරිසිඳ දැනීම පිණිස, ක්ෂය කිරීම පිණිස, ප්‍රහාණය පිණිස, ක්ෂයවීම පිණිස, විනාශය පිණිස, නොඇලීම පිණිස, නිරුද්ධිය පිණිස, සංසිඳීම පිණිස, අත්හැරීම පිණිස, දුරුකිරීම පිණිස (මෙහි මේ වර්ගයේ 25 සූත්‍රයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) මේ ධර්ම දහය වැඩිය යුත්තාහ. (ඉහත සඳහන් වචන යෙදීමෙන් ඒ ඒ සූත්‍ර සකස් කර ගතයුතුයි.)

(දසක නිපාතය නිමි.)

---

# එකොළොස්වෙනි නිපාතය.

## 1. නිස්සය වර්ගය.

1. **ආනන්ද කුසලසීල සූත්‍රයඃ-** 1. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය. “ස්වාමීනි, නිරවද්‍යවූ සීලයෝ කුමක් ප්‍රයෝජනකොට ඇත්තාහුද, කිනම් අනුසස් ඇත්තාහුදැයි” (විචාළේය.)

2. “ආනන්දය, නිරවද්‍යවූ සීලයෝ නොවිපිළිසරවීම ප්‍රයෝජනකොට ඇත්තාහුය. නොවිපිළිසරවීම අනුසස්කොට ඇත්තාහුයයි” (වදාළේය.)

“ස්වාමීනි, නොවිපිළිසරවීම කුමක් ප්‍රයෝජනකොට ඇත්තේද, කිනම් අනුසස්කොට ඇත්තේද?”

"ආනන්දය, නොවිපිළිසරවීම වනාහි සතුටුවීම ප්‍රයෝජන කොට ඇත්තේය. සතුටුවීම අනුසස්කොට ඇත්තේය."

"ස්වාමීනි, සතුටුවීම වනාහි කුමක් ප්‍රයෝජනකොට ඇත්තේද කිනම් අනුසස් ඇත්තේද?" "ආනන්දය, සතුටුවීම වනාහි ප්‍රීතිය ප්‍රයෝජනකොට ඇත්තේය. ප්‍රීතිය අනුසස් කොට ඇත්තේය."

"ස්වාමීනි, ප්‍රීතිය වනාහි කුමක් ප්‍රයෝජනකොට ඇත්තීද, කිනම් අනුසස් ඇත්තීද?" "ආනන්දය, ප්‍රීතිය වනාහි සැහැල්ලුබව ප්‍රයෝජනකොට ඇත්තීය, සැහැල්ලුබව අනුසස්කොට ඇත්තීය."

"ස්වාමීනි, සැහැල්ලුබව වනාහි කුමක් ප්‍රයෝජනකොට ඇත්තීද, කිනම් අනුසස් ඇත්තීද?" "ආනන්දය, සැහැල්ලු බව වනාහි සැපය ප්‍රයෝජනකොට ඇත්තීය. සැපය අනුසස් කොට ඇත්තීය."

3. "ස්වාමීනි, සැපය වනාහි කුමක් ප්‍රයෝජනකොට ඇත්තේද, කිනම් අනුසස් ඇත්තේද?" "ආනන්දය, සැපය වනාහි සමාධිය ප්‍රයෝජනකොට ඇත්තේය. සමාධිය අනුසස් කොට ඇත්තේය."

"ස්වාමීනි, සමාධිය වනාහි කුමක් ප්‍රයෝජනකොට ඇත්තේද? කිනම් අනුසස් ඇත්තේද?"

"ආනන්දය, සමාධිය වනාහි තත්වූ පරිදි නුවණින් දැකීම ප්‍රයෝජනකොට ඇත්තේය. තත්වූ පරිදි නුවණින් දැකීම අනුසස්කොට ඇත්තේය."

4. "ස්වාමීනි තත්වූපරිදි නුවණින් දැකීම වනාහි කුමක් ප්‍රයෝජනකොට ඇත්තේද, කිනම් අනුසස් ඇත්තේද?" "ආනන්දය, තත්වූපරිදි නුවණින් දැකීම වනාහි කලකිරීම ප්‍රයෝජනකොට ඇත්තේය. කලකිරීම අනුසස්කොට ඇත්තේය."

"ස්වාමීනි, කලකිරීම වනාහි කුමක් ප්‍රයෝජනකොට ඇත්තීද, කිනම් අනුසස් ඇත්තීද?" "ආනන්දය, කලකිරීම වනාහි නො ඇල්ම ප්‍රයෝජනකොට ඇත්තීය. නොඇල්ම අනුසස්කොට ඇත්තීය."

5. "ස්වාමීනි නොඇල්ම වනාහි කුමක් ප්‍රයෝජනකොට ඇත්තේද කිනම් අනුසස් ඇත්තේද?" "ආනන්දය, නොඇල්ම වනාහි විමුක්තිඥාන දර්ශනය හෙවත් කෙලෙසුන්ගෙන් මිදීම නුවණින් සැළකීම ප්‍රයෝජනකොට ඇත්තේය විමුක්තිඥාන දර්ශනය අනුසස්කොට ඇත්තේය."

6. "ආනන්දය, මෙසේ වනාහි නිරවද්‍යවූ සීලයෝ නොවිපිළිසරවීම ප්‍රයෝජනකොට ඇත්තාහුය. නොවිපිළිසරවීම අනුසස්කොට ඇත්තාහුය. නොවිපිළිසරවීම සතුට ප්‍රයෝජන කොට ඇත්තේය. සතුට අනුසස්කොට ඇත්තේය. සතුට ප්‍රීතිය ප්‍රයෝජනකොට ඇත්තේය. ප්‍රීතිය අනුසස්කොට ඇත්තේය. ප්‍රීතිය සැහැල්ලු බව ප්‍රයෝජනකොට ඇත්තීය. සැහැල්ලුබව අනුසස්කොට ඇත්තීය. සැහැල්ලු බව සැපය ප්‍රයෝජනකොට ඇත්තීය. සැපය අනුසස්කොට ඇත්තීය. සැපය සමාධිය ප්‍රයෝජනකොට ඇත්තේය. සමාධිය අනුසස් කොට ඇත්තේය. සමාධිය තත්වූ පරිදි නුවණින් දැකීම ප්‍රයෝජනකොට ඇත්තේය. තත්වූ පරිදි නුවණින් දැකීම අනුසස්කොට ඇත්තේය. තත්වූ පරිදි නුවණින් දැකීම කලකිරීම ප්‍රයෝජනකොට ඇත්තේය. කලකිරීම අනුසස්කොට ඇත්තේය. කලකිරීම නොඇල්ම ප්‍රයෝජනකොට ඇත්තීය. නො ඇල්ම අනුසස්කොට ඇත්තීය. නොඇල්ම කෙලෙසුන්ගෙන් මිදීම නුවණින් සැලකීම ප්‍රයෝජනකොට ඇත්තේය. කෙළෙසුන්ගෙන් මිදීම නුවණින් සැලකීම් අනුසස්කොට ඇත්තේය. ආනන්දය, මෙසේ වනාහි නිරවද්‍යවූ සීලයෝ පිළිවෙළින් රහත්බවට පමුණුවත් යයි" වදාළේය.

2. **චෙතනාකරණීය සූත්‍රය**:- 1. "මහණෙනි, සීලයෙන් යුක්තවූ සිල්වත්හුගේ 'මට නොවිපිළිසරවීම උපදීවායි' සිතීමෙන් කටයුතු නොවේ. මහණෙනි, සීලසම්පන්නවූ සිල්වත්හට නොවිපිළිසරවීම උපදී යන යමක්වේද, මෝතොමෝ ධර්ම ස්වභාවයවේ. මහණෙනි, නොවිපිළිසර ඇත්තාහට 'මට සතුට උපදීවායි' සිතීමෙන් කටයුත්තක් නොවේ. මහණෙනි, විපිළිසර නැත්තාහට සතුට උපදී යන යමක් ඇද්ද මෝතොමෝ ධර්ම ස්වභාවයි. මහණෙනි, සතුට ඇත්තාහට 'මට ප්‍රීතිය උපදිවායි' සිතීමෙන්

කටයුත්තක් නොවේ, මහණෙනි, සතුට ඇත්තාහට ප්‍රීතිය උපදී යන යමක්වේද; මෝතොමෝ ධර්මතායි, මහණෙනි, ප්‍රීති සිත් ඇත්තාහට 'මාගේ කය සැහැල්ලුවේවායි' සිතීමෙන් කටයුත්තක් නොවේ. මහණෙනි, ප්‍රීති සිත් ඇත්තහුගේ කය සැහැල්ලුවෙයි යන යමක් ඇද්ද, මෝතොමෝ ධර්මතායි මහණෙනි, සැහැල්ලුවූ කය ඇත්තහුගේ සැපය විඳිමියි සිතීමෙන් කටයුත්තක් නොවේ. මහණෙනි, සැහැල්ලු කය ඇත්තේ සැපය විඳීයයන යමක්වේද මෝතොමෝ ධර්මතායි. මහණෙනි, සැප ඇත්තහු ගේ 'මගේ සිත එකඟ වේවායි සිතීමෙන් කටයුත්තක් නොවේ. මහණෙනි, සැප ඇත්තහුගේ සිත එකඟවේ, යන යමක් වේද, මෝතොමෝ ධර්මතායි මහණෙනි, එකඟවූ සිත් ඇත්තහුගේ තත්වූ පරිද්දෙන් දනිමි. දකිමියි සිතීමෙන් කටයුත්තක් නොවේ. මහණෙනි, එකඟවූ සිත් ඇත්තේ තත්වූ පරිද්දෙන් දනී, දකී යන යමක්වේද, මෝතොමෝ ධර්මතායි. මහණෙනි, තත්වූපරිද්දෙන් දන්නහුගේ දක්නහුගේ කලකිරෙමියි සිතීමෙන් කටයුත්තක් නොවේ. මහණෙනි, තත්වූපරිද්දෙන් දන්නේ දක්නේ කලකිරේය යන යමක්වේද, මෝතොමෝ ධර්මතායි. මහණෙනි, කලකිරුණහුගේ නො ඇලෙමියි සිතීමෙන් කටයුත්තක් නොවේ. මහණෙනි, කලකිරුනේ නො ඇලෙයි යන යමක් වේද, මෝතොමෝ ධර්මතායි. මහණෙනි, නො ඇලුනහුගේ විමුක්තිඥාන දර්ශනය ප්‍රත්‍යක්ෂ කරමියි සිතීමෙන් කටයුත්තක් නොවේ. මහණෙනි, නො ඇලුනේ විමුක්තිඥාන දර්ශනය ප්‍රත්‍යක්ෂ කෙරෙයි යන යමක්වේද, මෝතොමෝ ධර්මතායි.

2. "මහණෙනි, මෙසේ වනාහි විරාගයතෙම විමුක්ති ඥාන දර්ශනය ප්‍රයෝජනකොට ඇත්තේය. විමුක්තිඥාන දර්ශනය අනුසස්කොට ඇත්තේය. නිබ්බිදාතොමෝ විරාගය ප්‍රයෝජනකොට ඇත්තීය. විරාගය අනුසස්කොට ඇත්තීය. යථාභූතඥාන දර්ශනය නිබ්බිදාව ප්‍රයෝජනකොට ඇත්තේය. නිබ්බිදාව අනුසස්කොට ඇත්තේය සමාධිතෙම යථාභූතඥාන දර්ශනය ප්‍රයෝජනකොට ඇත්තේය, යථාභූත ඥානදර්ශනය අනුසස්කොට ඇත්තේය. සැපය සමාධිය ප්‍රයෝජනකොට ඇත්තේය. සමාධිය අනුසස්කොට ඇත්තේය. සන්සිඳුම සැපය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රයෝජනකොට ඇත්තීය. සැපය අනුසස්කොට ඇත්තීය. ප්‍රීතිය, සන්සිඳුම ප්‍රයෝජනකොට ඇත්තීය. සන්සිඳුම අනුසස්කොට ඇත්තීය. ප්‍රමොද්‍යය ප්‍රීතිය ප්‍රයෝජන කොට ඇත්තේය, ප්‍රීතිය අනුසස්කොට ඇත්තේය, නොපිළිසරවීම ප්‍රමොද්‍යය ප්‍රයෝජනකොට ඇත්තේය. ප්‍රමොද්‍යය අනුසස්කොට ඇත්තේය. නිරවද්‍යවූ සීලයෝ නොවිපිළිසරවීම ප්‍රයෝජනකොට ඇත්තාහුය. නොවිපිළිසරවීම අනුසස් කොට ඇත්තාහුය. මහණෙනි, මෙසේ වනාහි මෙතෙරින් එතෙරයාම පිණිස හෙවත් සසරින් නිවණට පැමිණීම පිණිස ධර්මයෝ ධර්මයෙහි පවතිත්. ධර්මයෝද ධර්මයන් සම්පූර්ණ කෙරෙත්යයි’ වදාළේය.”

3. **හතුපනිස දුස්සීල සූත්‍රය**:- 1. “මහණෙනි, සීල විපත්තියට පැමිණියාවූ දුශ්ශීලයාගේ නොවිපිළිසරවීම නසන ලද කරුණු ඇත්තේ වෙයි. කරුණු රහිතව නොවිපිළිසරවීම නැති කල්හි ප්‍රමුදිත භාවයාගේ විපතට පැමිණියහුගේ ප්‍රීති තොමෝ නසනලද කරුණු ඇත්තී වෙයි. ප්‍රීතිය නැති කල්හි ප්‍රීතියෙන් විපතට පැමිණියහුගේ සන්සිදීම තොමෝ නසනලද කරුණු ඇත්තීවේ. සන්සිදීම නැති කල්හි සන්සිදීමෙන් විපතට පැමිණියහුගේ සැපය නසන ලද කරුණු ඇත්තේවේ. සැපය නැතිකල්හි සැපයෙන් විපතට පැමිණියහුගේ සම්‍යක් සමාධිය නසනා ලද කරුණු ඇත්තේවේ. සම්‍යක් සමාධිය නැතිකල්හි සම්‍යක් සමාධියෙන් විපතට පැමිණියහුගේ යථාභූත ඥාන දර්ශනය නසන ලද කරුණු ඇත්තේවේ. යථාභූත ඥාන දර්ශනය නැති කල්හි යථාභූත ඥානයෙන් විපතට පැමිණියහුගේ කලකිරීම් නසන ලද කරුණු ඇත්තී වෙයි. කලකිරීම නැති කල්හි කලකිරීමෙන් විපතට පැමිණියහුගේ නොඇල්ම නසනලද කරුණු ඇත්තේ වෙයි. නොඇල්ම නැතිකල්හි නොඇල්මෙන් විපතට පැමිණියහුගේ කෙලෙසුන්ගෙන් මිදීම නුවණින් සැළකීම නසන ලද කරුණු ඇත්තේ වෙයි.

2. “මහණෙනි, යම්සේ වෘක්ෂය තෙම අතුපතරින් විපතට පැමිණියේ ඒ වෘක්ෂයාගේ පතුරුද සම්පූර්ණවීමට නො පැමිණේද පොත්තද එලයද හරයද සම්පූර්ණවීමට නොපැමිණේද (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, සීල සම්පන්නවූ සිල්වත්හුගේ නොවිපිළිසරවීම කරුණු සහිතවේ. නොවිපිළිසරවීම ඇතිකල්හි නොවිපිළිසරවීමෙන් යුක්තවූවහුගේ ප්‍රමොදය කරුණු සහිතවේ. ප්‍රමොද්‍යය ඇතිකල්හි ප්‍රමුදිතභාවයෙන් යුක්ත වූවහුගේ ප්‍රීතිය කරුණු සහිතවේ. ප්‍රීතිය ඇති කල්හි ප්‍රීතියෙන් යුක්තවූවහුගේ සන්සිඳීම කරුණු සහිතවේ. සන්සිඳීම ඇතිකල්හි සන්සිඳීමෙන් යුක්තවූවහුගේ සැපය කරුණු සහිතවේ. සැපය ඇතිකල්හි සැපයෙන් යුක්තවූවහුගේ සම්‍යක් සමාධිය කරුණු සහිතවේ. සම්‍යක් සමාධිය ඇති කල්හි සම්‍යක් සමාධියෙන් යුක්තවූවහුගේ තත්වූ පරිදි නුවණින් දැකීම කරුණු සහිතවේ. තත්වූ පරිදි නුවණින් දැකීම ඇතිකල්හි තත්වූ පරිදි නුවණින් දැකීමෙන් යුක්තවූවහුගේ කලකිරීම කරුණු සහිතවේ. කලකිරීම ඇතිකල්හි කලකිරීමෙන් යුක්තවූවහුගේ නොඇල්ම කරුණු සහිතවේ. නොඇල්ම ඇතිකල්හි නොඇල්මෙන් යුක්තවූවහුගේ කෙලෙසුන්ගෙන් මිදීමට නුවණින් දැකීම කරුණු සහිතවේ.

4. "මහණෙනි, යම්සේ වෘක්ෂය තෙම අතුපතරින් ගැවසීගත්තේ ඒ වෘක්ෂයාගේ පතුරුද සම්පූර්ණ බවට පැමිණේද, පොත්තද, එලයද, හරයද සම්පූර්ණවීමටයේද, මහණෙනි, එපරිද්දෙන්ම සීල සම්පන්නවූ සිල්වත්හුගේ නොවිපිළිසරවීම කරුණු සහිතවේ. නොවිපිළිසරවීම ඇති කල්හි නොවිපිළිසරවීමෙන් යුක්තවූවහුගේ ප්‍රමුදිත භාවය කරුණු සහිතවේ. (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

4. **සාරිපුත්ත හතුනිස සූත්‍රය**:- 1. එකල්හි වනාහි ආයුෂ්මත් සාරීපුත්‍ර ස්ථවිරතෙම "ඇවැත් මහණෙනි, කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කෙළේය. "කිමෙක්ද? ඇවැත්නියි" ඒ භික්ෂූහු ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන්ට උත්තර දුන්හ. ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරතෙම මෙය ප්‍රකාශ කෙළේය.

2 - 5. (මේ ඡේද මේ වර්ගයේ 3 සූත්‍රයේ 1 - 4 ඡේද මෙන් වෙත් "මහණෙනි, වෙනුවට "ඇවැත්නි" යෙදිය යුතුයි.)

5. **ආනන්ද හතුනිස සූත්‍රය**:- 1. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම "ඇවැත්නි මහණෙනි" කියා භික්ෂූන්ට

ආමන්ත්‍රණය කෙළේය. "ඇවැත්නි" ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට උත්තර දුන්හ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම මෙය ප්‍රකාශ කළේය. 2-5 (මේ ඡේද මේ වර්ගයේ 3 සූත්‍රයේ 1-4 ඡේදමෙන් වෙත්. "මහණෙනි, වෙනුවට "ඇවැත්නි" යෙදිය යුතුයි.)

**6. ඒකාදස ව්‍යසන සූත්‍රයඃ-** 1. "මහණෙනි, යම් ඒ භික්ෂුවක් තෙම සමාන බඹසර ඇත්තවුන්ට ආක්‍රොෂ පරිභව කරන්නේ ආර්යයන්ට දොස් කියන්නේවේද හෙතෙම එකොළොස් වැදෑරුම් ව්‍යසනයන් අතුරෙන් එක්තරා ව්‍යසනයකට නොපැමිණෙන්නේය යන යමක්වේද මෙයට කරුණු රහිතයි අවකාශ නැත්තේය.

2. "කවරනම් එකොළසකටදයත්? නො ලබනලද්ද නොලබයි, ලබනලද්දෙන් පිරිහෙයි. සද්ධර්මය පැහැදිළි නොවෙයි. සද්ධර්මයන්හි හෝ අධික මාන ඇත්තේ වෙයි. නො ඇළුනේ හෝ බඹසර හැසිරෙයි. එක්තරා කිළුටුවූ ඇවතකට හෝ පැමිණෙයි. ශික්ෂාව හැරදමා ගිහිබවට පැමිණෙයි. දැඩිවූ රෝගාබාධයක් හෝ ස්පර්ශ කරයි. චිත්ත වික්ෂේප ඇත්තාවූ උමතුබවට හෝ පැමිණෙයි. අතිශයින් මුළාවූයේ කළුරිය කරයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැත්තාවූ දුකට පිහිටවූ විවසව පතිතවන්නාවූ නරකයෙහි උපදියි.

3. "මහණෙනි, යම් ඒ භික්ෂුවක්තෙම ආර්යොපවාද ඇත්තේ සමාන බඹසර ඇත්තවුන්ට ආක්‍රොෂ පරිභව කරන්නේවේද, හෙතෙම මේ එකොළොස් වැදෑරුම් ව්‍යසනයන් අතුරෙන් එක්තරා ව්‍යසනයකට නොපැමිණෙන්නේය යන යමක්වේද, මෙයට කරුණු රහිතවේ අවකාශ රහිතවේ යයි වදාළසේක."

**7. ආනන්ද සමාධි පටිලාභ සූත්‍රයඃ-** 1. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය. "ස්වාමීනි, යම් පරිද්දකින් පෘථිවියෙහි පෘථිවිය යන සංඥා

ඇත්තේ නොවන්නේද, ජලයෙහි ජලය යන සංඥා ඇත්තේ නොවන්නේද, තෙජසෙහි තෙජසයන සංඥා ඇත්තේ නොවන්නේද වායුවෙහි වායුව යන සංඥා ඇත්තේ නොවන්නේද, ආකාශානඤ්චායතනයෙහි ආකාශානඤ්චායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, විඤ්ඤානඤ්චායතනයෙහි විඤ්ඤානඤ්චායතන යන සංඥා ඇත්තේ නොවන්නේද, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, මේ ලොකයෙහි උපදනා ධ්‍යානයෙහි මේ ලෝකයෙහි උපදනා ධ්‍යානය යන සංඥා ඇත්තේ නොවන්නේද පරලොව උපදනා ධ්‍යානයෙහි පරලොව උපදනා ධ්‍යානය යන සංඥා ඇත්තේ නොවන්නේද? යම්බඳුවූ මේ දක්නාලද්දය, අසනලද්දය, ස්පර්ශ කරණ ලද්දය, දැනගන්නා ලද්දය, පැමිණෙන ලද්දය. සොයන ලද්දය සිතින් අනුව හැසිරෙන ලදය, යන යමක් වේද, එහිදු සංඥා ඇත්තේ නොවන්නේද? එතකුදුවුවත් සංඥාව ඇත්තේත් වන්නේද, එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට වන්නේදැයි” ඇසුවේය.

2. “ආනන්දය, යම්සේ පෘථිවියෙහි පෘථිවිය යන සංඥා ඇත්තේ නොමවන්නේද, ජලයෙහි ජලය යන සංඥා ඇත්තේ නොවන්නේද, තෙජස්හි තෙජසය යන සංඥා ඇත්තේ නොවන්නේද, වාතයෙහි වාතය යන සංඥා ඇත්තේ නොවන්නේද ආකාශානඤ්චායතනයෙහි ආකාශානඤ්චායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, විඤ්ඤානඤ්චායතනයෙහි විඤ්ඤානඤ්චායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, මෙලොව උපදනා ධ්‍යානයෙහි මෙලොව උපදනා ධ්‍යාන සංඥා ඇත්තේ නොවන්නේද, පරලොව උපදනා ධ්‍යානයෙහි පරලොව

උපදනා ධ්‍යාන සංඥා ඇත්තේ නොවන්නේද, දක්නා ලදය අසන ලදය, ස්පර්ශ කරණ ලදය, දැනගන්නා ලදය, පැමිණෙන ලදය. සොයන ලදය, සිතින් අනුව හැසිරෙන ලදය යන මේ යමකුත් වේද, එහිද සංඥා ඇත්තේ නොවන්නේද, එතකුදුවුවත් එහිද සංඥා ඇත්තේත් වන්නේද, එබඳුවූ සමාධිප්‍රතිලාභයෙන් භික්ෂුවට ඒ කෙසේ නම් වන්නේ දැයි ස්වාමීනි, යම්සේ පෘථිවියෙහි පෘථිවිය යන සංඥා ඇත්තේ නොමවන්නේද, ජලයෙහි ජලය යන සංඥා ඇත්තේ නොවන්නේද, තෙජස්හි තෙජස යන සංඥා ඇත්තේ නොවන්නේද, වායුව කෙරෙහි වායුව යන සංඥා ඇත්තේ නොවන්නේද, ආකාශානඤ්චායතනයෙහි ආකාශානඤ්චායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, විඤ්ඤානඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, මෙලොව උපදනා ධ්‍යානයෙහි මෙලොව උපදනා ධ්‍යානය යන සංඥා ඇත්තේ නොවන්නේද පරලොව උපදනා ධ්‍යානයෙහි පරලොව උපදනා ධ්‍යානය යන සංඥා ඇත්තේ නොවන්නේද, දක්නාලද අසනලද ස්පර්ශ කරණලද දැනගන්නා ලද පැමිණෙන ලද සොයන ලද සිතින් අනුව හැසිරෙන ලද මේ යමකුත් වේද, එහිදු සංඥා ඇත්තේ නොවන්නේද එතකුදුවුවත් සංඥා ඇත්තේත් වන්නේද එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට ඒ කෙසේ නම් වන්නේදැයි" (විචාළේය.)

3. "ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂු තෙම යම් මේ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමවූ සියලු කෙළෙසුන්ගේ දුරලීමවූ තෘෂ්ණාව නැසීමවූ නොඇල්මවූ නිරොධයවූ නිවණක් වේද, මෙය ශාන්තය, මෙය ප්‍රණීතයයි මෙබඳු සංඥා ඇත්තේ වේද, ආනන්දය, යම්සේ පෘථිවියෙහි පෘථිවිය යන සංඥා ඇත්තේ නොමවන්නේද (ii) ජලයෙහි ජලය යන සංඥා ඇත්තේ නොවන්නේද, තෙජස්හි තෙජස යන සංඥා ඇත්තේ නොවන්නේද, වාතයෙහි වාතය යන සංඥා ඇත්තේ

නොවන්නේද, ආකාශානඤ්චායතනයෙහි ආකාශානඤ්චායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතන යන සංඥා ඇත්තේ නොවන්නේ ද, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, මෙලොව උපදනා ධ්‍යානයෙහි මෙලොව උපදනා ධ්‍යානය යන සංඥා ඇත්තේ නොවන්නේද, පරලොව උපදනා ධ්‍යානයෙහි පරලොව උපදනා ධ්‍යානය යන සංඥා ඇත්තේ නොවන්නේද, (iii) දක්නාලදය අසනලදය ස්පර්ශ කරණලදය දැනගන්නාලදය පැමිණෙනලදය සොයන ලදය සිතින් අනුව හැසිරෙනලදය යන මේ යමකුත්වේද, එහිදු සංඥා ඇත්තේ නොවන්නේද, එතකුදුවුවත් සංඥා ඇත්තේත් වන්නේද, මෙසේ වනාහි භික්ෂුහට එබඳු සමාධි ප්‍රතිලාභයෙක් වන්නේය"යි වදාළේය.

8. **සාරිපුත්ත සමාධි පටිලාභ සූත්‍රයː**- 1. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම, භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට පැමිණ වැඳ, පැදකුණුකොට, ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් සාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවූයේය. සතුටු වියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත් පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ආයුෂ්මත් සාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය සැළ කෙළේය.

2. "ආයුෂ්මත් සාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, යම්සේ පෘථිවියෙහි පෘථිවිය යන සංඥා ඇත්තේ නොවන්නේද (මෙහි මේ වර්ගයේ 7 සූත්‍රයේ 3 (ii) ඡෙදය යොදන්න.) දක්නා ලදය, අසන ලදය ස්පර්ශකරණ ලදය, දැනගන්නා ලදය, පැමිණෙන ලදය, සොයන ලදය, සිතින් අනුව හැසිරෙන ලදය යන මේ යමකුත් ඇද්ද එහිදු සංඥා ඇත්තේ නොවන්නේද? එතකුදු

වුවත් සංඥා ඇත්තේත් වන්නේද? එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට වන්නේද?"

3. "ආයුෂ්මත්වූ ආනන්දය, යම්සේ පෘථිවියෙහි පෘථිවිය යන සංඥා ඇත්තේ නොම වන්නේද (මෙහි මේ වර්ගයේ 7 සූත්‍රයේ 3 (ii) ඡේදය යෙදිය යුතුයි.) දක්නා ලද අසන ලදය ස්පර්ශ කරණ ලදය දැනගන්නා ලදය පැමිණෙන ලදය සොයන ලදය සිතින් අනුව හැසිරෙන ලදය යන මේ යමකුත් ඇද්ද එහිඳු සංඥා ඇත්තේ නොවන්නේද එතකුදුවුවත් සංඥා ඇත්තේත් වන්නේද, එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට වන්නේයයි" කීයේය.

4. "ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, යම්සේ පෘථිවියෙහි පෘථිවිය යන සංඥා ඇත්තේ නොවන්නේද? (මෙහි මේ වර්ගයේ 7 සූත්‍රයේ 3 (ii) ඡේදය යෙදිය යුතුයි) දක්නා ලදය අසන ලදය ස්පර්ශ කරණ ලදය, දැනගන්නා ලදය, පැමිණෙන ලදය, සොයන ලදය, සිතින් අනුව හැසිරෙන ලදය, යන මේ යමකුත් ඇද්ද, එහිඳු සංඥා ඇත්තේ නොවන්නේද, එතකුදුවුවත් සංඥා ඇත්තේත් වන්නේද? එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට ඒ කෙසේ නම් වන්නේදැයි" විචාළේය.

"ආයුෂ්මත්වූ ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂුතෙම මෙබඳු සංඥා ඇත්තේවේ. එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම ඇති සියලු කෙලෙසුන්ගේ දුරලීම ඇති තෘෂ්ණාවගේ ක්ෂය කිරීම ඇති නොඇල්ම ඇත්තාවූ නිරොධයවූ නිවණක්වේද, මෙය ශාන්තය මෙය ප්‍රණීතය කියායි. ආයුෂ්මත්වූ ආනන්දය, යම්සේ පෘථිවියෙහි පෘථිවිය යන සංඥා ඇත්තේ නොමවන්නේද (මෙහි මේ වර්ගයේ 7 සූත්‍රයේ 3 (ii) ඡේදය යෙදිය යුතුයි.) දක්නා ලදය අසන ලදය. ස්පර්ශ කරණ ලදය දැනගන්නා ලදය, පැමිණෙන ලදය. සොයන ලදය. සිතින් අනුව හැසිරෙන ලදය යන මේ යමකුත්වේද? එහිඳු සංඥා ඇත්තේ නොවන්නේද, එතකුදු වුවත් සංඥා ඇත්තේත් වන්නේද, එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂූහට මෙසේ වනාහි වන්නේය"යි කීයේය.

**6.** "ආයුෂ්මත්නි, යම් ශාසනයෙක්හි ශාස්තෘහුගේද ශ්‍රාවකයන්ගේද අර්ථය සමග අර්ථය තේරුමෙන් තේරුම ඛ්‍යඤ්ජයන් සමග ඛ්‍යඤ්ජනය අකුරින් අකුර යම් මේ නිවණෙක්හි සංසන්දනය වන්නේද, සමානවන්නේද විරුද්ධනොවන්නේද, මෙය ආශ්චර්යයයි අද්භූතයෙකි ආයුෂ්මත්නි, මම දැන් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මේ කරුණ විචාළෙමි. භාග්‍යවතුන් වහන්සේද මට මේ පදවලින්ම මේ ඛ්‍යඤ්ජනවලින්ම මේ කරුණ වදාළ සේක. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරතෙමේ යම්සේද එමෙනි. යම් ශාසනයෙක්හි නම් ශාස්තෘහුගේද ශ්‍රාවකයාගේද අර්ථය සමග අර්ථය ඛ්‍යඤ්ජනය සමග ඛ්‍යඤ්ජනය යම් මේ නිවණෙක්හි සංසන්දනය වන්නේද සමාන වන්නේද විරුද්ධ නොවන්නේද ආයුෂ්මත්නි මෙය ආශ්චර්යය, ආයුෂ්මත්නි, මෙය අද්භූතයයි කීයේය."

**9. අමනසිකරණ සමාධි සූත්‍රයඃ-** 1. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය. 'ස්වාමීනි, යම්සේ ඇස මෙනෙහි නොකරන්නේද, රූපය මෙනෙහි නොකරන්නේද කණ මෙනෙහි නොකරන්නේද, ශබ්දය මෙනෙහි නොකරන්නේද, නාශය මෙනෙහි නොකරන්නේද, ගඳ මෙනෙහි නොකරන්නේද, දිව මෙනෙහි නොකරන්නේද, රස මෙනෙහි නොකරන්නේද, කය මෙනෙහි නොකරන්නේද, ස්පර්ශකළයුත්ත මෙනෙහි නොකරන්නේද, පෘථිවිය මෙනෙහි නොකරන්නේද, ජලය මෙනෙහි නොකරන්නේද, තෙජස මෙනෙහි නොකරන්නේද, වාතය මෙනෙහි නොකරන්නේද, ආකාශානඤ්චායතනය මෙනෙහි නොකරන්නේද, විඤ්ඤාණඤ්චායතනය මෙනෙහි නොකරන්නේද, ආකිඤ්චඤ්ඤායතනය මෙනෙහි නොකරන්නේද, මෙලොව උපදනා ධ්‍යානය මෙනෙහි නොකරන්නේද, පරලොව උපදනා ධ්‍යානය මෙනෙහි නොකරන්නේද, දක්නාලදය, අසනලදය, ස්පර්ශ කරණලදය,

දැනගන්නාලදය, පැමිණෙනලදය, සොයනලදය, සිතින් අනුව හැසිරෙන ලදය. යනමේ යමකුත් ඇද්ද, එයද මෙනෙහි නොකරන්නේද, එතකුදු වුවත් මෙනෙහි කරන්නේත් වන්නේද, එබඳුවූ සමාධි ප්‍රතිලාභයක් භික්ෂුහට වන්නේදැයි” ඇසීය.

**2.** “ආනන්දය, (ii) යම්සේ ඇස මෙනෙහි නොකරන්නේද, රූපය මෙනෙහි නොකරන්නේද කන මෙනෙහි නොකරන්නේද ශබ්දය මෙනෙහි නොකරන්නේද, නාසය මෙනෙහි නොකරන්නේද ගඳ මෙනෙහි නොකරන්නේද, දිව මෙනෙහි නොකරන්නේද, රශය මෙනෙහි නොකරන්නේද, කය මෙනෙහි නොකරන්නේද, ස්පර්ශ කළයුත්ත මෙනෙහි නොකරන්නේද, පෘථිවිය මෙනෙහි නොකරන්නේද ජලය මෙනෙහි නොකරන්නේද තෙජස මෙනෙහි නොකරන්නේද, වාතය මෙනෙහි නොකරන්නේද, ආකාශානඤ්චායතනය, මෙනෙහි නොකරන්නේද, විඤ්ඤාණඤ්චායතනය මෙනෙහි නොකරන්නේද, ආකිඤ්චඤ්ඤායතනය මෙනෙහි නොකරන්නේද, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය මෙනෙහි නොකරන්නේද, මෙලොව උපදනා ධ්‍යානය මෙනෙහි නොකරන්නේද, පරලොව උපදනා ධ්‍යානය මෙනෙහි නොකරන්නේද, දක්නාලදය, අසනලදය ස්පර්ශ කරණලදය, දැනගන්නාලදය, පැමිණෙන ලදය, සොයන ලදය, සිතින් අනුව හැසිරෙනලදය. යන මේ යමකුත් ඇද්ද, එයද මෙනෙහි නොකරන්නේද, (iii) එතකුදු වුවත් මෙනෙහි කරන්නේත් වන්නේද, එබඳුවූ සමාධිප්‍රතිලාභයෙක් භික්ෂුහට වන්නේයයි” වදාළේය.

**3.** “ස්වාමීනි (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) එතකුදුවුවත් මෙනෙහි කරන්නේත් වන්නේද, එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට ඒ කෙසේනම් වන්නේදැයි’ ඇසීය.

**4.** “ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂුතෙම යම් මේ සියලු සංස්කාරයන්ගේ සංසිඳීම් ඇත්තාවූ සියලු කෙලෙසුන්ගේ දුරලීම ඇත්තාවූ තෘෂ්ණාවගේ ක්ෂය කිරීම ඇත්තාවූ නොඇල්ම ඇත්තාවූ නිරුද්ධවීම ඇත්තාවූ නිවණක්වේ, මෙය ශාන්තය

මෙය ප්‍රණීතයයි මෙසේ මෙනෙහිකරයි. ආනන්දය, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) එතකුදුවුවත් මෙනෙහිකරන්නේත් වන්නේද, මෙසේ වනාහි භික්ෂුහට එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් වන්නේයයි" වදාළේය."

**10. ආජානීයඣායින සූත්‍රයඃ-** 1. "එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ නාදික නම් ගම ගිඤ්ජකාවසථ නම් ප්‍රාසාදයෙක්හි (ගඩොළු ගෙයක) වැඩවසනසේක. එකල්හි වනාහි ආයුෂ්මත් සන්ධ නම් ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූම ආයුෂ්මත් සන්ධ ස්ථවිරයන්ට මෙය වදාළසේක.

2. "සන්ධය, කාරණා කාරණා දත් ආජානීය සෛන්ධවයකු සිතන පරිද්දෙන් වනාහි සිතව්. කොටළුවෙකු සිතන පරිද්දෙන් නොසිතව්. සන්ධය, කොටළුවාගේ සිතීම කෙසේ නම් වේද,

3. "සන්ධය, අස්සඛළුංකතෙම (කොටළුවා) වනාහි යවවී ඔරුව සමීපයෙහි බඳනාලද්දේ, 'යව ඇත යව ඇතැයි' සිතයි. ඊට හේතු කවරේද? සන්ධය යවවී ඔරුව සමීපයෙහි බඳනාලද, කොටළුවාට මෙබඳු සිතක් නොමවේ. 'අද මට අශ්වයන් හික්මවන අස්ගොව්වා කිනම් කාරණයක් කරන්නේද? මම ඔහුට කුමක් විරුද්ධව කරම්දැයි කියාය. හෙතෙම ඔරුව සමීපයෙහි බඳනාලද්දේ 'යව ඇත යව ඇතැයි' සිතාද?

4. "සන්ධය, මෙපරිද්දෙන්ම මේ ශාසනයෙහි ඇතැම් මිනිස් කොටළුවෙක්තෙම වනයට ගියේද, ගසක්මුලට ගියේද, හිස්ගෙයකට ගියේද, කාම රාගයෙන් පෙළුණාවූ කාමරාගයෙන් මඩනාලද සිතින් යුක්තව වාසය කරයි. උපන්නාවූද කාම රාගයාගේ දුරුකිරීම තත්වූ පරිද්දෙන්ම නොදනියි. හෙතෙම කාම රාගයම ඇතුළත්කොට සිතයි. නොයෙක් ආකාරයෙන් සිතයි. නිරතුරු සිතයි නැවත නැවත සිතයි. ව්‍යාපාදයෙන් මඩනාලද සිතින් යුක්තව වාසය කරයි. ථිනමිද්ධයෙන් මඩනා ලද සිතින් යුක්තව වාසය කරයි. උද්ධච්චකුක්කුච්චයෙන් මඩනාලද සිතින් යුක්තව වාසය කරයි. විචිකිච්ඡාවෙන්

පෙළුණාවූ විචිකිච්ඡාවෙන් මඩනාලද සිතින් යුක්තව වාසය කරයි. උපන්නාවූ විචිකිච්ඡාවගේද, දුරුකිරීම තත්වූ පරිද්දෙන් නොදනියි. හෙතෙම විචිකිච්ඡාවට ඇතුළත්කොට සිතයි. නොයෙක් ආකාරයෙන් සිතයි. නිරන්තරයෙන් සිතයි නැවත නැවත සිතයි. හෙතෙම පෘථිවියද ඇසුරුකොට සිතයි. ජලයද ඇසුරුකොට සිතයි. තේජසද ඇසුරුකොට සිතයි. වාතයද ඇසුරුකොට සිතයි, ආකාශානඤ්චායතනයද ඇසුරු කොට සිතයි. විඤ්ඤාණඤ්චායතනයද ඇසුරුකොට සිතයි. ආකිඤ්චඤ්ඤායතනයද ඇසුරුකොට සිතයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයද ඇසුරුකොට සිතයි. මෙලොව උපදනා ධ්‍යානයද ඇසුරුකොට සිතයි. පරලොව උපදනා ධ්‍යානයද ඇසුරු කොට සිතයි. දක්නාලදය, අසනලදය, ස්පර්ශකරණ ලදය. දැනගන්නාලදය, පැමිණෙන ලදය, සොයනලදය, සිතින් අනුව හැසිරෙනලදය යන මේ යමකුත් ඇද්ද, එයද ඇසුරුකොට සිතයි. සන්ධය මෙසේ වනාහි මිනිස් කොටළුවාගේ සිතීමවේ.

**5.** "සන්ධය, කෙසේනම් ආජානීය සෛන්ධවයාගේ සිතීම වේද? සන්ධය, යහපත්වූ ආජානීය අශ්වතෙම වනාහි යවවී ඔරුව සමීපයෙහි බඳනාලද්දේ 'යව ඇත යව ඇතැයි' නොසිතයි. ඊට හේතුකවරේද? සන්ධය යවවී ඔරුව සමීපයෙහි බඳනාලද යහපත්වූ ආජානීය අශ්වයාට වනාහි මෙබඳු සිතක් වෙයි. 'අද මට අශ්වදම්මසාරථී (අසුන් හික්මවන්නා) තෙම කිනම්කාරණයක් කරන්නේද, මම ඔහුට කිනම් ප්‍රතික්‍රියාවක් කරම්ද කියායි. හෙතෙම ඔරුව සමීපයෙහි බඳනාලද්දේ 'යව ඇත යව ඇතැයි' නො සිතයි. සන්ධය, යහපත්වූ ආජානීය අශ්වතෙම වනාහි කය යම්සේද බැඳීම යම්සේද, පිරිහීම යම්සේද අපරාධය යම්සේද, එපරිද්දෙන් කෙවිටි මෙහෙයීම දකියිද

**6.** "සන්ධය, එපරිද්දෙන්ම යහපත්වූ පුරුෂාජානීය තෙම වනයට ගියේද, ගසක් මුලට ගියේද, හිස් ගෙයකට ගියේද, කාම රාගයෙන් (කැමැත්තට ඇලීමෙන්) පෙළුණාවූ කාම රාගයෙන් මඩනාලද සිතින් යුක්තව වාසය නොකරයි. උපන්නාවූද කාම රාගයාගේ දුරුකිරීම තත්වූ පරිද්දෙන්ම

දැනගනියි. ව්‍යාපාදයෙන් (ක්‍රොධයෙන්) මඩනාලද සිතින් යුක්තව වාසය නොකරයි. ථිනමිද්ධයෙන් (අලසකමින් හා නිදිමතින්) මඩනාලද සිතින් යුක්තව වාසය නොකරයි. උද්ධච්චකුක්කුච්චයෙන් (සිත නොසන්සුන්කමින්) හා පසුතැවිල්ලෙන් මඩනාලද සිතින් යුක්තව වාසය නොකරයි. විචිකිච්ඡාවෙන් (සැකයෙන්) පෙළුණාවූ විචිකිච්ඡාවෙන් මඩනාලද සිතින් යුක්තව වාසය නොකරයි. උපන්නාවූද විචිකිච්ඡාවගේ දුරුකිරීම තත්වූ පරිද්දෙන් දැනගනියි.

7. "හෙතෙම පෘථිවිය ඇසුරුකොට නොම සිතයි. ජලය ඇසුරුකොට නොසිතයි. තෙජස ඇසුරුකොට නොසිතයි. වාතය ඇසුරුකොට නොසිතයි. ආකාශානඤ්චායතනය ඇසුරුකොට නොසිතයි. විඤ්ඤානඤ්චායතනය ඇසුරුකොට නොසිතයි. ආකිඤ්චඤ්ඤායතනය ඇසුරුකොට නොසිතයි. නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඇසුරුකොට නොසිතයි. මෙලොව උපදනා ධ්‍යානය ඇසුරුකොට නොසිතයි. පරලොව උපදනා ධ්‍යානය ඇසුරුකොට නොසිතයි. දක්නාලදය, අසන ලදය, ස්පර්ශකරණලදය, දැනගන්නාලදය, පැමිණෙනලදය, සොයනලදය, සිතින් අනුව හැසිරෙනලදය යන මේ යමකුත් ඇද්ද, එයද ඇසුරුකොට නොසිතයි. එතකුදුවුවත් සිතන්නේද වෙයි. සන්ධය, මෙසේ සිතන්නාවූද යහපත්වූ පුරුෂාජානියයාට වනාහි ශක්‍රයා සහිතවූ, බ්‍රහ්මයා සහිතවූ, ප්‍රජාපතී සහිතවූ දෙවියෝ දුරසිටම නමස්කාර කරත්. 'යමකුන් ඇසුරුකොට ධ්‍යාන කරන්නෙහිදැයි යම්බඳුවූ නුඹවහන්සේගේ ධ්‍යානය නොදනිම්ද, පුරුෂාජානියයන් වහන්ස, ඒ ඔබ වහන්සේට අපගේ නමස්කාරය වේවා. පුරුෂොත්තමයන් වහන්ස, නුඹවහන්සේට අපගේ නමස්කාරය වේවා" කියායි.

8. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් සන්ධස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. 'ස්වාමීනි, කෙසේ නම් ධ්‍යානකරන්නාවූ යහපත්වූ පුරුෂාජානීයතෙම ධ්‍යානකෙරේද, හෙතෙම පෘථිවිය ඇසුරුකොට නොමධ්‍යාන කෙරේද, ජලය ඇසුරුකොට ධ්‍යාන නොකෙරේද, තේජස ඇසුරුකොට ධ්‍යාන නොකෙරේද, වාතය ඇසුරුකොට ධ්‍යාන නොකෙරේද,

ආකාශානඤ්චායතනය ඇසුරුකොට ධ්‍යාන නොකෙරේද, විඤ්ඤානඤ්චායතනය ඇසුරුකොට ධ්‍යාන නොකෙරේද, ආකිඤ්චඤ්ඤායතනය ඇසුරුකොට ධ්‍යාන නොකෙරේද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඇසුරුකොට ධ්‍යාන නොකෙරේද, මෙලොව උපදනා ධ්‍යානය ඇසුරුකොට ධ්‍යාන නොකෙරේද, පරලොව උපදනා ධ්‍යානය ඇසුරුකොට ධ්‍යාන නොකෙරේද, දක්නාලදය, අසනලදය, ස්පර්ශකරණලදය, දැනගන්නාලදය, පැමිණෙනලදය, සොයනලදය, සිතින් අනුව හැසිරෙනලදය යන මේ යමකුන් ඇද්ද එයද ඇසුරු කොට ධ්‍යාන නොකෙරේද, එතකුදු වුවත් ධ්‍යානකරන්නේ වේද? ස්වාමීනි, කෙසේ ධ්‍යානකරන්නාවූ යහපත්වූ පුරුෂාජානීයයාට වනාහි ශක්‍රයා සහිතවූ බ්‍රහ්මයාසහිතවූ ප්‍රජාපති සහිතවූ දෙවියෝ දුර සිටම නමස්කාර කෙරෙද්ද? 'යමකුන් ඇසුරුකොට ධ්‍යාන කරන්නෙහියයි, යම්බඳුවූ ඔබවහන්සේගේ ධ්‍යානය නොදනිම්ද, පුරුෂාජානීයය, ඒ නුඹවහන්සේට අපගේ නමස්කාරය වේවා. පුරුෂොත්තමය, ඔබට නමස්කාර වේවා" කියායි.

**9.** "සන්ධය, මේ ශාසනයෙහි යහපත්වූ පුරුෂාජානීයයා හට පෘථිවියෙහි පෘථිවි සංඥාතොමෝ ප්‍රකටවේ. ජලයෙහි ජලය යන සංඥාතොමෝ ප්‍රකටවේ. තෙජසෙහි තෙජස් යන සංඥාතොමෝ ප්‍රකට වේ. වායුවෙහි වායෝ සංඥාතොමෝ ප්‍රකටවේ. ආකාශානඤ්චායතනයෙහි ආකාශානඤ්චායතන සංඥාතොමෝ ප්‍රකටවේ. විඤ්ඤානඤ්චායතනයෙහි විඤ්ඤානඤ්චායතන සංඥාතොමෝ ප්‍රකටවේ. ආකිඤ්චායතනයෙහි ආකිඤ්චඤ්ඤායතන සංඥාතොමෝ ප්‍රකටවේ. නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සංඥාතොමෝ ප්‍රකටවේ. මෙලොව උපදනා ධ්‍යානයෙහි මෙලොව උපදනා ධ්‍යාන සංඥාතොමෝ ප්‍රකටවේ. පරලොව උපදනා ධ්‍යානයෙහි පරලොව උපදනා ධ්‍යාන සංඥාතොමෝ ප්‍රකටවේ. දක්නාලදය, අසනලදය ස්පර්ශ කරණලදය, දැනගන්නාලදය පැමිණෙන ලදය, සොයනලදය සිතින් අනුව හැසිරෙනලදය, යන මේ යමකුත් ඇද්ද, එහිදු සංඥාතොමෝ ප්‍රකටවේ.

**10.** "සන්ධය, මෙසේ ධ්‍යානකරන්නාවූම යහපත්වූ පුරුෂාජානියතෙම පෘථිවිය ඇසුරුකොට නොම ධ්‍යානකරයි. ජලය ඇසුරුකොට ධ්‍යාන නොකරයි. තේජස ඇසුරුකොට ධ්‍යාන නොකරයි. වාතය ඇසුරුකොට ධ්‍යාන නොකරයි. ආකාශානඤ්චායතනය ඇසුරුකොට ධ්‍යාන නොකරයි. විඤ්ඤාණඤ්චායතනය ඇසුරුකොට ධ්‍යාන නොකරයි. ආකිඤ්චඤ්ඤායතනය ඇසුරුකොට ධ්‍යාන නොකරයි. නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඇසුරුකොට ධ්‍යාන නොකරයි. මෙලොව උපදනා ධ්‍යානය ඇසුරුකොට ධ්‍යාන නොකරයි. පරලොව උපදනා ධ්‍යානය ඇසුරුකොට ධ්‍යාන නොකරයි. දක්නාලදය, අසනලදය, ස්පර්ශ කරණලදය, දැනගන්නාලදය, පැමිණෙනලදය, සොයනලදය, සිතින් අනුව හැසිරෙනලදය යන මේ යමකුත් ඇද්ද, එයද ඇසුරු කොට ධ්‍යාන නොකරයි. එතකුදුවුවත් ධ්‍යාන කරන්නේද, වෙයි. සන්ධය, මෙසේ ධ්‍යාන කරන්නාවූද, යහපත්වූ පුරුෂාජානීයයාට වනාහි ශක්‍රයා සහිතවූ බ්‍රහ්මයා සහිතවූ ප්‍රජාපතියා සහිතවූ දෙවියෝ දුර සිටම නමස්කාර කරත්.

"යමකුත් ඇසුරුකොට ධ්‍යාන කරන්නෙහියයි යම්බඳු වූ ඔබගේ ධ්‍යානය නොදනිමුද, පුරුෂාජානියය, ඒ ඔබට නමස්කාර වේවා පුරුෂොත්තමය. ඒ ඔබට නමස්කාර වේවා.

**11. මොරනිවාප සූත්‍රයඃ-** 1. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර මොරනිවාප නම් වූ පිරිවැජි ආරාමයෙහි වැඩවසනසේක එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන්ට අඬගා වදාළසේක. 'කිමෙක්ද? පින්වතුන්වහන්සැයි' ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**2.** "මහණෙනි, ධර්ම තුනකින් යුක්තවූ භික්ෂුතෙම ඒකාන්ත නිෂ්ටා ඇත්තේ ඒකාන්ත යොගක්ෂෙම (බැඳුම්වලින් නිදහස) ඇත්තේ ඒකාන්ත බ්‍රහ්මචර්යා (මහණදම්) ඇත්තේ ඒකාන්ත කෙළවර ඇත්තේ දෙවි මිනිසුන්ට උතුම්වූයේ වෙයි. (ii) කවර ධර්ම තුනකින්ද යත්? භික්ෂු අවසන් ශීලස්කන්ධයෙන්ද, භික්ෂු

අවසන් සමාධිස්කන්ධයෙන්ද, හික්මී අවසන් ප්‍රඥා ස්කන්ධයෙන්ද යන තුනෙනි. (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

3. “මහණෙනි, අනිකුදු (ii) ධර්මතුනකින් යුක්තවූ භික්ෂුතෙම ඒකාන්ත නිෂ්ඨා ඇත්තේ ඒකාන්ත යොගක්ෂෙම ඇත්තේ ඒකාන්ත බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තේ ඒකාන්ත පර්‍ය්‍යාවසාන (කෙළවර) ඇත්තේ දෙව් මිනිසුන්ට ශ්‍රෙෂ්ඨවූයේ වෙයි. (ii) කවර ධර්ම තුනකින්දයත්? ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යයෙන්ද ආදෙශනා (ප්‍රකාශ කිරීමේ) ප්‍රාතිහාර්‍ය්‍යයෙන්ද, අනුශාසනී ප්‍රාතිහාර්‍ය්‍යයෙන්ද යන තුනෙනි. මහණෙනි, මේ (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.)

4. “මහණෙනි, අනිකුදු (ii) ධර්ම තුනකින් යුක්තවූ භික්ෂුතෙම ඒකාන්ත නිෂ්ඨා ඇත්තේ ඒකාන්ත යොගක්ෂෙම ඇත්තේ ඒකාන්ත බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තේ, ඒකාන්ත පර්‍ය්‍යාවසාන ඇත්තේ දෙව්මිනිසුන්ට ශ්‍රෙෂ්ඨවූයේ වෙයි. (iii) කවර තුනකින්දයත්? සම්‍යක් දෘෂ්ටියෙන්ද සම්‍යක්ඥානයෙන්ද, සම්‍යක් විමුක්තියෙන්ද යන තුණෙනි. මහණෙනි, මේ (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

5. “මහණෙනි, (ii) ධර්ම දෙකකින් යුක්තවූ භික්ෂුතෙම ඒකාන්ත නිෂ්ඨා ඇත්තේ ඒකාන්ත යොගක්ෂෙම ඇත්තේ ඒකාන්ත බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තේ ඒකාන්ත පර්‍ය්‍යාවසාන ඇත්තේ දෙව් මිනිසුන්ට ශ්‍රෙෂ්ඨවූයේ වෙයි. (ii) කවර දෙකකින්දයත්? විද්‍යායෙන්ද, චරණයෙන්ද යන දෙකෙනි. මහණෙනි, මේ (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

“මහණෙනි, සනත්කුමාර නම් වූ බ්‍රහ්මයා විසින්ද මේ ගාථාව කියනලදී.

“ජනසමූහයා අතර යම් කෙනෙක් ගොත්‍ර නාමය අස්වන්නාහුද, ඔවුන්ගෙන් ක්ෂත්‍රියතෙම ශ්‍රෙෂ්ඨවේ. යමෙක් අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස්චරණ ධර්මයෙන් යුක්තවේද, දෙව්මිනිසුන් අතර හෙතෙම උතුම්වේයයි’

6. “මහණෙනි, ඒ මේ ගාථාව වනාහි සනත්කුමාර නම් වූ බ්‍රහ්මයා විසින් යහපත්කොට කියනලද්දීය. අයහපත් කොට කියනලද්දී නොවෙයි. යහපත්කොට ගයනලද්දීය. අයහපත්කොට

ගයනලද්දී නොවෙයි. අර්ථයෙන් යුක්ත වූවාය. අනර්ථයෙන් යුක්තවූවක් නොවෙයි. මා විසින් අනුමත කරණලද්දීය. මහණෙනි, මමද මෙසේ කියමි.

"ජනසමූහයා අතර යම් කෙනෙක් ගොත්‍ර නාමය අස්වන්නාහුද ක්ෂත්‍රියතෙම ශ්‍රෙෂ්ඨවේ. යමෙක් අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තවේද, හෙතෙම දෙව් මිනිසුන් අතර ශ්‍රෙෂ්ඨවේයයි වදාළේය."

(පළමුවෙනි නිශ්‍රය වර්ගය නිමි.)

---

## 2 අනුස්සති වර්ගය

12. පඨම නානාවිහරණ සූත්‍රයඃ- 1. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්හි කිඹුල්වත් පුරයෙහිවූ නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. නිමවන ලද චීවර කර්මය ඇති භාග්‍යවතුන් වහන්සේ තුන් මසක් ඇවෑමෙන් සැරිසරා වඩින්නේයයි එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට සිවුරු කටයුතු කරත්. මහානාම ශාක්‍ය රජ තෙම බොහෝවූ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට චීවර කර්මයක් කෙරෙත්. නිමවන ලද සිවුරුකම් ඇති භාග්‍යවතුන් වහන්සේ තුන් මසක් ඇවෑමෙන් සැරිසරා වඩින්නේයයි ඇසුවේමය. (ii) ඉක්බිති, මහානාම ශාක්‍ය රජතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට සකස් කොට වැද එකත්පස්ව හුන්නේය. එකත් පස්ව හුන්නාවූම මහානාම නම් ශාක්‍ය රජ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීන්වහන්ස, බොහෝවූ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට සිවුරු කටයුතු කෙරෙත්. නිමවන ලද සිවුරු ඇති භාග්‍යවතුන් වහන්සේ තුන් මසක් ඇවෑමෙන් සැරිසරා වඩින්නේය. යන මෙය මා විසින් අසන ලදී. ස්වාමීන් වහන්ස, නොයෙක් විහරණ වලින් යුක්තව වාසය කරන්නාවූ ඒ අපට කිනම් විහරණයකින් යුක්තව වාසය කටයුතු වන්නේ දැ"යි.

2. "මහානාමය, යහපත, යහපත, මහානාමය තෙපි යමක් තථාගතයන් වෙත පැමිණ විචාරන්නාහුද, මෙය වනාහි කුලපුත්‍රවූ තොපට සුදුසුවේ" "ස්වාමීනි, නොයෙක් විහරණවලින් යුක්තව වාසය කරන්නාවූ ඒ අප කිනම් විහරණයකින් යුක්තව වාසය කටයුතු වන්නේද' යනුයි. මහානාමය, ශ්‍රද්ධා ඇත්තේ වනාහි සම්පාදනය කරන්නේ වෙයි. ශ්‍රද්ධා නැත්තේ සම්පාදනය නොකෙරෙයි. පටන්ගන්නා ලද වීර්ය ඇත්තේ සම්පාදනය කරන්නේ වෙයි. කුශීතවූයේ සම්පාදනය නොකෙරෙයි. එළඹ සිටි සිහි ඇත්තේ සම්පාදනය කරන්නේ වෙයි. මුළාවූ සිහි ඇත්තේ සම්පාදනය නොකෙරෙයි. එකඟවූ සිත් ඇත්තේ සම්පාදනය කරන්නේ වෙයි. එකඟවූ සිත් නැත්තේ සම්පාදකයා නොවෙයි. ප්‍රඥා ඇත්තේ සම්පාදකයාවේ. ප්‍රඥා නැත්තේ සම්පාදකයා නොවෙයි. මහානාමය, ඔබ මේ පඤ්ච ධර්මයන්හි පිහිටා පඤ්චධර්මයන් මත්තෙහි වඩන්නෙහිය.

3. "මහානාමය, මෙහි ඔබ තථාගතයන් සිහි කරන්නෙහි; ඒ භාග්‍යවත් තෙම මේ කාරණයෙන්ද අර්හත්ය. සම්‍යක් සම්බුද්ධය. අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තය. සුගතය ලෝකවිදූය නිරුත්තරවූයේ, පුරුෂයන් දමනය කිරීමෙහි ඇදුරුය. දෙවිමිනිසුන්ට අනුශාසනා කරන්නෙක්ය. චතුස්සත්‍යය අවබොධ කෙළේය, භාග්‍යවත්ය" කියායි.

4. "මහානාමය, යම් කලෙක්හි ආර්යශ්‍රාවක තෙම තථාගතයන් සිහිකෙරේද, එකල්හි ඔහුට රාගයෙන් මඩනා ලද සිතක් නොමවෙයි. ද්වෙෂයෙන් මඩනා ලද සිතක් නොවෙයි. මොහයෙන් මඩනාලද සිතක් නොවෙයි. එකල්හි ඔහුට ඍජුව ගියාවූම සිතක් වෙයි. මහානාමය, තථාගතයන් අරභයා ඍජුව ගියාවූම සිත් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ අර්ථය නිසා සතුට ලබයි. ධර්මය නිසා සතුට ලබයි. ධර්මයෙන් යුක්තවූ ප්‍රමොද්‍යය ලබයි. හටගත් ප්‍රමොද ඇත්තහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තාහුගේ කය සැහැල්ලු වෙයි. සැහැල්ලු කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි. මහානාමය, මේ ආර්ය ශ්‍රාවකතෙම විෂම බවට පැමිණියාවූ ප්‍රජාවෙහි සම බවට පැමිණියේ වාසය කෙරෙයි. දුක් සහිතවූ ප්‍රජාවෙහි නිදුක්වූයේ

වාසය කරයි. ධර්මශ්‍රොතයට පැමිණියේ බුද්ධානුස්මෘතිය වඩායයි කියනු ලැබේ.

**5.** "මහානාමය, නැවත අනිකක්දවේ. ඔබ ධර්මය සිහි කරන්නෙහිය. "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දෙශනා කරණලදී. මේ ආත්මයෙහි දැක්ක හැකි විපාක ඇත්තේය. කල්නොයවා දෙන විපාක ඇත්තේය. එව බලව, යන විධියට සුදුසුය. නිවණට පමුණුවන්නේය. නුවණැත්තන් විසින් තමන් කෙරෙහි ලා දතයුතුයයි. කියාය. මහානාමය, යම් කලෙක්හි ආර්යශ්‍රාවක තෙම ධර්මය සිහි කෙරේද, එකල්හි ඔහුට රාගයෙන් මඩනාලද සිතක් නොමවෙයි. ද්වෙෂයෙන් මඩනාලද සිතක් නොවෙයි. මොහයෙන් මඩනාලද සිතක් නොවෙයි. එකල්හි ඔහුට ඍජුව ගියාවූම සිතවෙයි. මහානාමය, ධර්මය අරභයා ඍජුව ගියාවූ සිත් ඇති ආර්යශ්‍රාවක තෙමේ වනාහි, අර්ථය නිසා සතුට ලබයි. ධර්මය නිසා සතුට ලබයි. ධර්මයෙන් යුක්තවූ ප්‍රමුදිත භාවය ලබයි. ප්‍රමුදිතවූවහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සැහැල්ලු වෙයි. සැහැල්ලු කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟවෙයි. මහානාමය, මේ ආර්යශ්‍රාවක තෙම විෂම බවට ගිය ප්‍රජාවෙහි සම බවට පැමිණියේ වාසය කරයි. දුක් සහිත ප්‍රජාවෙහි නිදුක්වූයේ වාසය කරයි. ධර්ම ශ්‍රොතයට පැමිණියේ ධර්මානුස්මෘතිය වඩා යයි කියනු ලැබේ.

**6.** "මහානාමය, නැවත අනිකක්ද කියමි. ඔබ සංඝයා සිහි කරන්නෙහිය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම මනාව පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම ඍජුව පිළිපන්නේය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසංඝ තෙම න්‍යායවූ පරිදි පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම සුදුසු පිළිවෙතෙහි පිළිපන්නේය. යම් මේ පුරුෂ යුග සතරක් (අට දෙනෙක්) වෙද්ද, පුරුෂ පුද්ගලයන් අටදෙනෙක් වෙද්ද, භාග්‍යවත්හුගේ මේ ශ්‍රාවක සංඝ තෙම පූජාවට සුදුසුය. දුරසිට ගෙනෙන ලද පූජාවට සුදුසුය. දක්ෂිණාවට සුදුසුවේ. දෑත් හිසතබා වැඳීමට සුදුසුය. ලෝකයාහට නිරුත්තරවූ පින් කෙතයයි' මහානාමය, යම් කලෙක්හි ආර්ය ශ්‍රාවක තෙම සංඝයා

සිහි කෙරේද, එකල්හි ඔහුට රාගයෙන් මඩනාලද සිතක් නොමවෙයි. ද්වෙෂයෙන් මඩනා ලද සිතක් නොවේ. මොහයෙන් මඩනාලද සිතක් නොවේ. එකල්හි ඔහුට ඍජුව ගියාවූම සිතවේ. මහානාමය, සංඝයා අරහයා ඍජුව ගියාවූ සිත් ඇති ආර්යශ්‍රාවක තෙමේ වනාහි අර්ථය නිසා සතුට ලබයි. ධර්මය නිසා සතුට ලබයි, ධර්මයෙන් යුක්තවූ ප්‍රමුදිත භාවය ලබයි, ප්‍රමුදිතවූවහුට ප්‍රීතිය උපදියි. ප්‍රීතිසිත් ඇත්තහුගේ කය සැහැල්ලුවෙයි. සැහැල්ලුවූ කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි. මහානාමය, මේ ආර්ය ශ්‍රාවක තෙම විෂම බවට ගියාවූ ප්‍රජාවෙහි සම බවට පැමිණියේ වාසය කරයි. දුක් සහිතවූ ප්‍රජාවෙහි නිදුක්වූයේ වාසය කරයි. ධර්ම ශ්‍රොතයට පැමිණියේ සංඝානුස්මෘතිය වඩායයි කියනු ලැබේ.

7. "නැවත අනිකක්ද කියමි. මහානාමය, ඔබ කඩ නොවූ, සිදුරු නොවූ, කබර සහිත නොවූ, තිත් සහිත නොවූ, දාස බැවින් මිදුණාවූ නුවණැත්තන් විසින් පසස්නා ලද්දාවූ තෘෂ්ණා දෘෂ්ටීන් පරාමර්ෂණය නොකරණ ලද්දාවූ සමාධිය පිණිස පවත්නාවූ තමන්ගේ ශීලයන් සිහි කරන්නෙහිය. මහානාමය, යම් කලෙක්හි ආර්යශ්‍රාවක තෙම සීලය සිහිකෙරේද, එකල්හි ඔහුට රාගයෙන් මඩනා ලද සිතක් නොමවෙයි. ද්වෙෂයෙන් මඩනා ලද සිතක් නොවෙයි. මොහයෙන් මඩනා ලද සිතක් නොවෙයි. එකල්හි ඔහුට ඍජුව ගියාවූම සිතවෙයි. මහානාමය, සීලය අරහයා ඍජුව ගියා වූ සිත් ඇති ආර්යශ්‍රාවක තෙමේ වනාහි අර්ථයෙන් සතුට ලබයි. ධර්මයෙන් සතුට ලබයි. ධර්මයෙන් යුක්තවූ ප්‍රමුදිත භාවය ලබයි. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සැහැල්ලුවේ. සැහැල්ලුවූ කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟවෙයි. මහානාමය, මේ ආර්යශ්‍රාවකතෙම විෂම බවට ගියාවූ ප්‍රජාවෙහි සම බවට පැමිණියේ වාසය කරයි. දුක් සහිතවූ ප්‍රජාවෙහි නිදුක්වූයේ වාසය කරයි. ධර්ම ශ්‍රොතයට පැමිණියේ ශීලානුස්මෘතිය වඩායයි කියනු ලැබේ.

8. "නැවත අනිකක්ද කියමි. මහානාමය, නුඹ යම් බඳුවූ මෙම මසුරුමලින් මඩනාලද ප්‍රජාවෙහි පහවූ මසුරුමල ඇති

සිතින් යුක්තව මුදනලද ත්‍යාග සිත් ඇත්තේ පවිත්‍රවූ අත් ඇත්තේ ත්‍යාගයෙහි ඇළුණේ ඉල්වීමට සුදුසුවූයේ දන් බෙදීමෙහි ඇළුණේ ගිහිගෙයි වාසය කෙරෙම්ද, ඒකාන්තයෙන් මෙය මට මහත් ලාභයෙකි. ඒකාන්තයෙන් මා විසින් මනාකොට ලබන ලදැයි තමාගේ ත්‍යාගය සිහි කරන්නෙහිය. මහානාමය, යම් කලෙක්හි ආර්යශ්‍රාවකතෙම ත්‍යාගය සිහි කෙරේද, එකල්හි ඔහුට රාගයෙන් මඩනාලද සිතක් නොමවෙයි. ද්වෙෂයෙන් මඩනාලද සිතක් නොවෙයි. මොහයෙන් මඩනාලද සිතක් නොවෙයි. එකල්හි ඔහුට ඍජුව ගියාවූම සිතවෙයි. මහානාමය, ත්‍යාගය අරබයා ඍජුව ගියාවූ සිත් ඇති ආර්යශ්‍රාවක තෙමේ වනාහි අර්ථයෙන් සතුට ලබයි. ධර්මයෙන් සතුට ලබයි. ධර්මයෙන් යුක්තවූ ප්‍රමුදිතභාවය ලබයි. ප්‍රමුදිතවූවහුට ප්‍රීතිය උපදියි, ප්‍රීති සිත් ඇත්තහුගේ කය සැහැල්ලුවෙයි. සැහැල්ලුවූ කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි. මහානාමය, මේ ආර්ය ශ්‍රාවක තෙම විෂම බවට ගියාවූ ප්‍රජාවෙහි සම බවට පැමිණියේ වාසය කරයි. දුක්සහිතවූ ප්‍රජාවෙහි නිදුක්වූයේ වාසය කරයි. ධර්ම ශ්‍රොතයට පැමිණියෙක්ව ත්‍යාගානුස්මෘතිය වඩායයි කියනු ලැබේ.

8. "නැවත අනිකක්ද කියමි. මහානාමය, නුඹ දෙවතාවන් සිහිකරන්නෙහිය. "චාතුමහාරාජික නම් දෙවියෝ ඇත. (ii) තාවතිංශ නම් දෙවියෝ ඇත. යාම නම් දෙවියෝ ඇත. තුෂිත නම් දෙවියෝ ඇත. නිර්මාණරතී නම් දෙවියෝ ඇත පරනිර්මිත වශවර්ති නම් දෙවියෝ ඇත. බ්‍රහ්ම කායික නම් දෙවියෝ ඇත. (iii) ඉන් මත්තෙහිවූ දෙවියෝ ඇත. යම් බඳුවූ ශ්‍රද්ධාවකින් යුක්තවූ ඒ දෙවියෝ මෙයින් චුතවූවාහු එහි උපන්නාහුද මාගේද එබඳුවූ ශ්‍රද්ධාව පවතියි. යම්බඳු සීලයකින් යුක්තවූ ඒ දෙවියෝ මෙයින් චුතවූවාහු එහි උපන්නාහුද මාගේද එබඳු ශීලය පවතියි. යම් බඳුවූ ශ්‍රැතයකින් යුක්තවූ ඒ දෙවියෝ මෙයින් චුතවූවාහු එහි උපන්නාහුද, මාගේද එබඳුවූ ශ්‍රැතය පවතියි. යම් බඳුවූ ත්‍යාගයකින් යුක්තවූ ඒ දෙවියෝ මෙයින් චුතවූවාහු එහි උපන්නාහුද, මාගේද එබඳුවූ ත්‍යාගය පවතියි. යම් බඳුවූ ප්‍රඥාවකින් යුක්තවූ ඒ දෙවියෝ මෙයින් චුතවූවාහු එහි

උපන්නාහුද, මාගේද එබඳුවූ ප්‍රඥාව පවතීය' කියායි. මහානාමය, යම් කලෙක්හි ආර්‍ය ශ්‍රාවක තෙම තමාගේද ඒ දෙවතාවන්ගේද ශ්‍රද්ධාවද ශීලයද ශ්‍රැතයද ත්‍යාගයද ප්‍රඥාවද, සිහි කෙරේද, එකල්හි ඔහුට රාගයෙන් මඩනා ලද සිතක් නොමවෙයි. ද්වෙෂයෙන් මඩනා ලද සිතක් නොවෙයි. මොහයෙන් මඩනා ලද සිතක් නොවෙයි. එකල්හි ඔහුට ඍජුව ගියාවූම සිත වෙයි. මහානාමය, දෙවතාවන් අරබයා ඍජුව ගියාවූ සිත් ඇති ආර්‍ය ශ්‍රාවක තෙමේ වනාහි අර්ථයෙන් සතුට ලබයි. ධර්මයෙන් සතුට ලබයි. ධර්මයෙන් යුක්තවූ ප්‍රමුදිත භාවය ලබයි. ප්‍රමුදිතයාහාට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සැහැල්ලුවේ. සැහැල්ලුවූ කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි. මහානාමය, මේ ආර්‍ය ශ්‍රාවකතෙම විෂම බවට ගියාවූ ප්‍රජාවෙහි සම බවට පැමිණියේ වාසය කරයි. දුක් සහිතවූ ප්‍රජාවෙහි නිදුක්වූයේ වාසය කරයි. ධර්ම ශ්‍රොතයට පැමිණියෙක්ව දෙවතානුස්මෘතිය වඩායයි කියනු ලැබේ."

13. **දුතිය නානාවිහරණ සූත්‍රයඃ-** 1. "එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්වෙහි කිඹුල්වත් පුර නුවර නිග්‍රොධාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි වනාහි මහානාම නම් ශාක්‍ය රජතෙම ලෙඩින් නැගිට්ටේ, ලෙඩෙන් සිටි නොබෝ කල් ඇත්තේ වෙයි. එකල්හි වනාහි බොහෝවූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ සිවුරු කටයුතු කෙරෙත්. නිමවන ලද සිවුරු ඇති භාග්‍යවතුන් වහන්සේ තුන් මසක් ඇවෑමෙන් සැරිසරා වඩින්නේ යයි. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 1 (ii) යෙදිය යුතුයි.)

2. "මහානාමය, යහපත, යහපත, මහානාමය, 'ස්වාමීනි, නොයෙක් විහරණ වලින් යුක්තව වාසය කරන්නාවූ ඒ අපට කවර විහරණයකින් වාසය කටයුතු වන්නේදැයි' යන යමක් තෙපි තථාගතයන් වෙත පැමිණ විචාරන්නාහුද, මෙය වනාහි කුල පුත්‍රවූ තොපට සුදුසු වේ. මහානාමය, ශ්‍රද්ධාව ඇත්තේ වනාහි සම්පාදනය කරන්නේ වෙයි. ශ්‍රද්ධා නැත්තේ සම්පාදක නොවෙයි. පටන් ගන්නාලද වීර්‍ය ඇත්තේ සම්පාදක වෙයි. කුසීතතෙම නොවෙයි. පැමිණ සිටි සිහිය ඇත්තේ සම්පාදක

වෙයි. මුළා සිහි ඇත්තේ නොවෙයි. එකඟවූ සිත් ඇත්තේ සම්පාදක වෙයි. එකඟ නොවූ සිත් ඇත්තේ නොවෙයි. ප්‍රඥා ඇත්තේ සම්පාදක වේ. දුෂ්ප්‍රාඥතෙම නොවෙයි. මහානාමය, නුඹ මේ පඤ්චධර්මයන්හි පිහිටා ධර්ම සයක් මත්තෙහි වඩන්නෙහිය.

3. "මහානාමය, මෙහි නුඹ තථාගතයන් සිහි කරන්නෙහිය. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 3 යෙදිය යුතුයි.) මහානාමය, යම් කලෙක්හි ආර්ය ශ්‍රාවකතෙම තථාගතයන් සිහිකෙරේද, එකල්හි ඔහුට රාගයෙන් මඩනාලද සිතක් නොමවෙයි. ද්වෙෂයෙන් මඩනාලද සිතක් නොවෙයි. මොහයෙන් මඩනාලද සිතක් නොවෙයි. එකල්හි ඔහුට ඍජුව ගියාවූම සිත වෙයි. මහානාමය, තථාගතයන් අරබයා ඍජුව ගියාවූ සිත් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ වනාහි අර්ථය පිළිබඳ සතුට ලබයි. ධර්මය පිළිබඳ සතුට ලබයි. ධර්මයෙන් යුක්තවූ ප්‍රමුදිත භාවය ලබයි. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තාගේ කය සැහැල්ලු වෙයි. සැහැල්ලුවූ කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟවෙයි. මහානාමය, නුඹ මේ බුද්ධානුස්මෘතිය ගමන් කරන්නේද, වඩන්නෙහිය. සිටියේද වඩන්නෙහිය. හුන්නේද වඩන්නෙහිය. සයනය කරන්නේද වඩන්නෙහිය. කර්මාන්ත අධිෂ්ඨාන කරන්නේද වඩන්නෙහිය. පුත්‍ර සම්බාධ සයනයෙහි (දරු හිරිහැර ඇතිව) වසන්නේද, වඩන්නෙහිය.

4. "නැවත අනිකක්ද කියමි. මහානාමය, ඔබ ධර්මය සිහි කරන්නෙහිය. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි) සංඝයා සිහි කරන්නෙහිය (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) තමාගේ ශීලයන් සිහි කරන්නෙහිය. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) තමාගේ ත්‍යාගය සිහි කරන්නෙහිය. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 7 ඡේදය යෙදිය යුතුයි.) දෙවතාවන් සිහිකරන්නෙහිය. චාතුර්මහාරාජික නම් දෙවියෝ ඇත්තාහ. (මෙහි මේ වර්ගයේ 12 සූත්‍රයේ 8 (ii) ඡේදය යෙදිය යුතුයි.) ඉන් මත්තෙහිවූ දෙවියෝ ඇත්තාහ. යම් බඳුවූ ඒ දෙවතාවෝ යම්බඳු ශ්‍රද්ධාවකින් මෙයින් චුතවූවාහු එහි උපන්නාහුද මාගේද එබඳුවූ ශ්‍රද්ධාතොමෝ

විද්‍යමානවේ. යම්බඳුවූ ශීලයකින් ශ්‍රැතයකින් ත්‍යාගයකින් ප්‍රඥාවකින් යුක්තවූ ඒ දෙවියෝ මෙයින් චුතවූවාහු එහි උපන්නාහුද, මාගේද එබඳුවූ ප්‍රඥාව විද්‍යමානවේයයි. මහානාමය, යම් කලෙක්හි ආර්ය ශ්‍රාවකතෙම තමාගේද ඒ දෙවතාවන්ගේද ශ්‍රද්ධාවද ශීලයද ශ්‍රැතයද ත්‍යාගයද ප්‍රඥාවද සිහි කෙරේද, එකල්හි ඔහුට රාගයෙන් මඩනාලද සිතක් නොමවෙයි. ද්වෙෂයෙන් මඩනා ලද සිතක් නොවෙයි. මොහයෙන් මඩනා ලද සිතක් නොවෙයි. එකල්හි ඔහුට ඍජුව ගියාවූම සිත වෙයි.

5. "මහානාමය, දෙවතාවන් අරබයා ඍජුව ගියාවූ සිත් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ වනාහි අර්ථය පිළිබඳ සතුට ලබයි. ධර්මය පිළිබඳ සතුට ලබයි. ධර්මයෙන් යුක්තවූ ප්‍රමුදිත භාවය ලබයි. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සැහැල්ලු වෙයි. සැහැල්ලුවූ කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකග වේ. මහානාමය, ඔබ මේ දෙවතානුස්මෘතිය වනාහි යමින්ද වඩන්නේය. සිටිමින්ද වඩන්නෙහිය. හිඳිමින්ද වඩන්නෙහිය. හොවිමින්ද වඩන්නෙහිය. කර්මාන්තයෙහි යෙදෙමින්ද වඩන්නෙහිය අඹු දරු පීඩා ඇති ශයනයෙහි වෙසෙමින්ද වඩන්නෙහියයි," වදාළේය.

**14. නන්දිය සක්ක සූත්‍රයః-** 1. "එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් පුර නුවර නිග්‍රොධාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වස් විසීමට පැමිණෙනු කැමැත්තේ වෙයි. නන්දිය නම් ශාක්‍ය රජතෙම භාග්‍යවතුන් වහන්සේ වනාහි සැවැත් නුවර වස් විසීමට පැමිණෙනු කැමැත්තේ යයි ඇසූයේමය. ඉක්බිති නන්දිය නම් ශාක්‍ය රජහට මේ සිත විය. 'මමද සැවැත් නුවර වැසි කාලයෙහි විසීමට පැමිණෙන්නෙම් ඉතා යෙහෙක. එහි කර්මාන්තයන්ද පිහිටුවන්නෙමි. භාග්‍යවතුන් වහන්සේද කලින් කල දක්නට ලබන්නෙමි' කියායි.

2. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වැසි කාලය විසීමට පැමිණිසේක. නන්දිය නම් ශාක්‍ය රජ තෙමේද සැවැත් නුවර වැසි කාලය වැසීමට පැමිණියේය. එහි

කර්මාන්තද අධිෂ්ඨාන කෙළේය. භාග්‍යවතුන් වහන්සේද කලින් කල දක්නට ලැබීය. එකල්හි වනාහි බොහෝවූ භික්ෂූහු 'නිමවන ලද සිවුර ඇති භාග්‍යවතුන් වහන්සේ තුන් මසක් ඇවෑමෙන් සැරිසරා වඩින්නේය'යි භාග්‍යවතුන් වහන්සේට, සිවුරු කටයුතු කරත්. නන්දිය නම් ශාක්‍ය රජතෙම "බොහෝවූ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට චීවර කර්මාන්තය කරත්. නිමවන ලද සිවුර ඇති භාග්‍යවතුන් වහන්සේ තුන් මසක් ඇවෑමෙන් චාරිකාවට වඩින්නේය"යි ඇසූයේමය.

3. ඉක්බිති නන්දිය නම් ශාක්‍ය රජතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට සකස්කොට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූම නන්දිය නම් ශාක්‍ය රජ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, බොහෝවූ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට චීවර කර්මාන්තය කරත්. නිමවන ලද සිවුරු ඇති භාග්‍යවතුන් වහන්සේ තුන් මසක් ඇවෑමෙන් චාරිකාවට වඩිනසේකැයි යන මෙය මා විසින් අසන ලදී. ස්වාමීනි, නොයෙක් විහරණ වලින් යුක්තව වාසය කරන්නාවූ ඒ අප කවර විහරණයකින් වාසය කටයුතු වන්නේ දැ"යි ඇසීය.

4. "නන්දියය, යහපත, යහපත, නන්දියය, තෙපි තථාගතයන් වෙත පැමිණ 'ස්වාමීනි, නොයෙක් විහරණ වලින් යුක්තව වාසය කරන්නාවූ ඒ අප කවර විහරණයකින් වාසය කටයුතු වන්නේ දැ'යි යමක් විචාරන්නහුද, මෙය වනාහි කුල පුත්‍රවූ තොපට සුදුසු වේ. නන්දියය, ශ්‍රද්ධා ඇත්තේ වනාහි සම්පාදනය කරන්නේවේ, ශ්‍රද්ධා නැත්තේ සම්පාදක නොවේ. සිල් ඇත්තේ සම්පාදකවේ. දුශ්ශීල වූයේ සම්පාදක නොවේ. පටන් ගන්නාලද වීර්‍ය ඇත්තේ සම්පාදක වේ. කුශීතවූයේ සම්පාදක නොවේ. පැමිණ සිටි සිහි ඇත්තේ සම්පාදක වේ. මුළා සිහි ඇත්තේ සම්පාදක නොවේ. එකඟවූ සිත් ඇත්තේ සම්පාදක වේ. එකඟ නොවූ සිත් ඇත්තේ සම්පාදක නොවේ. ප්‍රඥා ඇත්තේ සම්පාදක වේ. දුෂ්ප්‍රාඥ වූයේ සම්පාදක නොවේ. නන්දියය, මේ ධර්ම සයෙහි වනාහි පිහිටා තොප විසින් ධර්ම

පසෙක්හි තමා කෙරෙහි සිහි එළවිය යුත්තීය. නන්දියය, මෙහි නුඹ තථාගතයන් සිහි කරන්නෙහිය. ඒ භාග්‍යවත් තෙම මෙසේද අර්හත්ය; සම්‍යක් සම්බුද්ධය; විද්‍යාචරණ සම්පන්නය; සුගතය; ලොකවිදූය; නිරුත්තරවූ පුරුෂයන් දමනය කිරීමෙහි සාරථීය; දෙව් මිනිසුන්ට ශාස්තෲය, බුද්ධය; භාග්‍යවත්ය;' නන්දියය, මෙසේ වනාහි ඔබ විසින් තථාගතයන් අරබයා තමා කෙරෙහි සිහි එළවිය යුත්තීය.

**5.** "නැවත අනිකක්ද කියමි. නන්දියය, ඔබ ධර්මය සිහි කරන්නෙහි 'භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මයතෙම මනාකොට දෙශනා කරණ ලද්දේය. තමා විසින් දැක්ක හැකි විපාක ඇත්තේය, කල් නොයවා ලැබිය හැකි විපාක ඇත්තේය, එව, බලව, යන විධියට සුදුසුය. නිවණට පමුණුවන්නේය, නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දතයුතුය' (කියායි.) නන්දියය, මෙසේ වනාහි ඔබ විසින් තථාගතයන් අරබයා තමන් කෙරෙහි සිහි එළවිය යුතුය.

**6.** "නැවත අනිකක්ද කියමි. නන්දියය, ඔබ කල්‍යාණ මිත්‍රයන් සිහි කරන්නෙහිය. යම්බඳුවූ මට අනුකම්පා ඇත්තාවූ වැඩ කැමැත්තාවූ අවවාද දෙන්නාවූ අනුශාසනා කරන්නාවූ යහපත් මිත්‍රයෝ වෙද්ද, ඒකාන්තයෙන් මට ලාභයෙකි. ඒකාන්තයෙන් මා විසින් මනාකොට ලබන ලද්දකැයි' (කියාය.) නන්දියය, මෙසේ වනාහි ඔබ විසින් යහපත් මිත්‍රයන් අරබයා තමන් කෙරෙහි සිහිය එළවිය යුතුවේ.

**7.** "නැවත අනිකක්ද කියමි. නන්දියය, ඔබ තමන්ගේ ත්‍යාග ගුණය සිහි කරන්නෙහිය. 'යම්බඳුවූ මම මසුරු මලින් මඩනාලද සිත් ඇති ප්‍රජාවෙහි පහව ගියාවූ මසුරු මල ඇති සිතින් යුක්තව මුදනලද ත්‍යාග සිත් ඇත්තේ, පවිත්‍රවූ අත් ඇත්තේ, දීමෙහි ඇළුනේ, ඉල්ලීමට සුදුසුවූයේ, දන් බෙදීමෙහි ඇළුනේ, ගිහිගෙයි වාසය කෙරෙම්ද, ඒකාන්තයෙන් එය මට මහත් ලාභයෙකි. ඒකාන්තයෙන් මා විසින් මනාකොට ලබන ලද්දකැයි' (කියාය) නන්දියය, මෙසේ වනාහි ඔබ විසින් ත්‍යාගය අරබයා තමන් කෙරෙහි සිහිය එළවිය යුතුවේ.

8. "නැවත අනිකක්ද කියමි. නන්දියය. ඔබ දෙවතාවන් සිහිකරන්නෙහිය. 'යම් ඒ දෙවතාවෝ කබලීකාරාහාර බුදින්නාවූ දෙවියන්ගේ හෙවත් කාමාවචර දෙවියන්ගේ සහ භාවය ඉක්මවා මනොමය දෙව නිකායකට පැමිණියාහු වෙද්ද, ඔව්හු තමාගේ කටයුත්තක් හෝ කරණ ලද්දහුගේ නැවත කිරීමක් හෝ නොදකිත්ද, නන්දියය, යම්සේ අසමය විමුක්තියෙන් මිදුණාවූ භික්ෂුතෙම (-ක්ෂීණාශ්‍රව තෙම) තම හට කටයුත්තක් හෝ කරණ ලද්දහුගේ නැවත කිරීමක් හෝ නොදකීද, නන්දියය, එපරිද්දෙන් යම් ඒ දෙවතාවෝ කබලීකාරාහාර බුදින්නාවූ දෙවියන්ගේ හෙවත් කාමාවචර දෙවියන්ගේ සහභාවය ඉක්මවාම එක්තරා මනොමය දෙව නිකායකට පැමිණියාහුද, ඔව්හු තමහට කටයුත්තක් හෝ කරණ ලද්දහුගේ නැවත කිරීමක් හෝ නොදකිත් 'නන්දියය, මෙසේ වනාහි නුඹ විසින් දෙවතාවන් අරබයා තමන් කෙරෙහි සිහිය එළවිය යුතුවේ.

9. "නන්දියය, මේ එකොළොස් ධර්මයන්ගෙන් යුක්තවූ ආර්ය ශ්‍රාවකතෙම ලාමකවූ අකුශල ධර්මයන් දුරු කෙරේමය. අල්ලා නොගනීමය. නන්දියය, යම්සේ කළය තෙම යටිකුරු කරණ ලද්දේ ජලය වමාරන්නේමද, වමාරූ ජලය පසුව නොගන්නේවේද, නන්දියය, යම්සේ හෝ වියලුණු තණ ලැහැබෙහි ගිනි ඇවිළුණේ දවමින් ම යේද, දවන ලද්ද, පෙරලා නොහට ගනීද, නන්දියය, මෙපරිද්දෙන්ම මේ එකොළොස් ධර්මයකින් යුක්තවූ ආර්ය ශ්‍රාවකතෙම ලාමකවූ අකුශල ධර්මයන් දුරු කෙරේමය නැවත නොගනිමියයි වදාළසේක.

**15. (සුභූති) සද්ධාපදාන සූත්‍රයඃ-** 1. ඉක්බිති ආයුෂ්මත් සුභූති ස්ථවිරතෙම සද්ධ නම් භික්ෂුව සමග භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය එකත් පස්ව හුන්නාවූම ආයුෂ්මත් සුභූති ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. "සුභූතිය, මේ භික්ෂුතෙම කිනම්ද?" "ස්වාමීනි මේ භික්ෂුතෙම සද්ධනම්වේ. සද්ධ නම් උපාසකයාගේ පුත්‍රතෙම ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවූයේය."

2. "කිමෙක්ද, සුභූතිය මේ සද්ධනම් භික්ෂුතෙම සද්ධ නම් උපාසකයාගේ පුත්‍රවූයේ, ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේ ශ්‍රද්ධාපදානයන්හි (ශ්‍රද්ධාවන්තයන්ගේ ලක්ෂණවල) දක්නා ලැබේද" "භාග්‍යවතුන්වහන්සේ, ශ්‍රද්ධාවන්තයාගේ ශ්‍රද්ධා ලක්ෂණ වදාරන්නේය යන යමක්වේද, භාග්‍යවතුන් වහන්ස, එයට මේ සුදුසු කාලයවේ. සුගතයන් වහන්ස, එයට මේ සුදුසු කලවේ. දැන්මම දැනගන්නෙමි. මේ භික්ෂුතෙම ශ්‍රද්ධා ලක්ෂණයන්හි ඉදින් දක්නා ලැබෙයි හෝ නොහොත් දක්නා නොලැබෙයි." කියායි "සුභූතිය එසේවී නම් අසව යහපත්කොට මෙනෙහි කරව කියන්නෙමි." "එසේය, පින්වතුන් වහන්සැයි" කියා ආයුෂ්මත් සුභූති ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

3. "සුභූතිය මේ ශාසනයෙහි භික්ෂුතෙම සිල්වත්වෙයි (ii) ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තවූයේ වාසයකරයි. ආචාරගොචරයෙන් යුක්තවූයේ ස්වල්පමාත්‍රවූ වැරැදිවල භයදක්නා සුලුවූයේ ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මෙයි. (iii) සුභූතිය, භික්ෂුතෙම සිල්වත්වෙයි (මෙහි මේ සූත්‍රයේ 3 (ii) යෙදිය යුතුයි) යන යමකුත්වේද, සුභූතිය මෙයද ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධා ලක්ෂණයවේ.

4. "නැවත අනිකක්ද කියමි. සුභූතිය, භික්ෂුතෙම (ii) ඇසූදෙය දරන්නේ ඇසූදෙය රැස්කිරීම ඇත්තේ බහුශ්‍රැත වෙයි. මුලයහපත්වූ මැදයහපත්වූ කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ යම් ඒ ධර්ම කෙනෙක් සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කෙරෙද්ද එබඳුවූ ධර්මයෝ මොහුවිසින් බොහෝකොට අසනලද්දාහු, දරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරණලද්දාහ. සිතින් සළකන ලද්දාහු දෘෂ්ටියෙන් මනාව ප්‍රතිවේධ කරණලද්දාහු වෙත්ද, (iii) "සුභූතිය, භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 4 (ii) යෙදිය යුතුයි.) බහු ශ්‍රැතවූයේවෙයි. දෘෂ්ටියෙන් මනාව ප්‍රතිවේධ කරණ ලද්දාහුවෙත් යන යමක්වේද සුභූතිය මෙයද ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධා ලක්ෂණයවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**5.** "නැවත අනිකක්ද කියම්. සුභූතිය, භික්ෂුතෙම කල්‍යාණ මිත්‍රයන් ඇත්තේ යහපත් යහළුවන් ඇත්තේ යහපතට නැමීම ඇත්තේවෙයි. සුභූතිය භික්ෂුතෙම කල්‍යාණ මිතුරන් ඇත්තේ සොඳුරු යහළුවන් ඇත්තේ යහපතට නැමීම ඇත්තේවෙයි, යන යමක්වේද, සුභූතිය, මෙයද ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධාලක්ෂණයවේ.

**6.** "නැවත අනිකක්ද කියම්. සුභූතිය, භික්ෂුතෙම කීකරුවූයේ සුවච භාවය කරන්නාවූ කරුණුවලින් යුක්තවූයේ ඉවසන්නේ අනුශාසනාව පැදකුණු කිරීමෙන් ගන්නේවෙයි. සුභූතිය, භික්ෂුතෙම කීකරුවූයේ සුවච බැව් කරණ කරුණුවලින් යුක්තවූයේ ඉවසන්නේ අනුශාසනය පැදකුණු කිරීමෙන් ගන්නේවෙයි. යන යමකුත්වේද සුභූතිය, මෙයද ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධා ලක්ෂණයවේ.

**7.** "නැවත අනිකක්ද කියම්. සුභූතිය, භික්ෂුතෙම සබ්‍රම්සරුන්ගේ, පිළිවිස කටයුතුවූ යම් මේ කුඩු මහත් කටයුතුවෙද්ද? එහි දක්ෂවූයේ අලස නොවූයේ එහි උපායෙන් විමසීමෙන් යුක්තවූයේ කරන්ට සමර්ථවේ. සංවිධාන කරන්ට සමර්ථවේ. සුභූතිය, භික්ෂුතෙම සබ්‍රම්සරුන්ගේ පිළිවිස කටයුතු යම්මේ කුඩු මහත් කටයුතු ඇද්ද එහි දක්ෂවූයේ වෙයි. අලස නොවූයේ එහි උපාය නුවණින් යුක්තවූයේ කරන්ට සංවිධාන කරන්ට සමර්ථවෙයි යන යමකුත් ඇද්ද, සුභූතිය, මෙයද ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධා ලක්ෂණයවේ.

**8.** "නැවත අනිකක්ද කියම්. සුභූතිය, භික්ෂුතෙම ධර්මය කැමැත්තේවෙයි. ප්‍රියවූවචන ඇත්තේ අභිධර්මයෙහි අභිවිනයෙහි මහත්වූ ප්‍රමුදිත භාවය ඇත්තේවෙයි. සුභූතිය, භික්ෂුතෙම ධර්මය කැමැත්තේ ප්‍රියවූවාක් ව්‍යවහාර ඇත්තේ අභිධර්මයෙහි අභිවිනයෙහි මහත්වූ ප්‍රමොද්‍ය ඇත්තේවෙයි යන මතයකුත් ඇද්ද, සුභූතිය, මෙයද ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධා ලක්ෂණයවේ.

**9.** "නැවත අනිකක්ද කියම්. සුභූතිය, භික්ෂුතෙම අකුශල ධර්මයන්ගේ දුරුකිරීමටද කුශල ධර්මයන්ගේ රැස් කිරීමටද ශක්තිමත්වූයේ දැඩිවූ වීර්‍ය ඇත්තේ පටන් ගන්නා ලද වීර්‍ය

ඇත්තේ කුශල ධර්මයන්හි බහා නොතබනලද බර ඇත්තේ වාසයකරයි. සුභූතිය, භික්ෂුතෙම අකුශල ධර්මයන්ගේ දුරුකිරීමටද කුශල ධර්මයන්ගේ රැස්කිරීමටද පටන් ගන්නාලද වීර්ය ඇත්තේ ශක්තිමත්වූයේ දැයි උත්සාහ ඇත්තේ කුශල ධර්මයන්හි බහා නොතබනලද බර ඇත්තේ වාසය කරයි යන යමකුත්වේද, සුභූතිය, මෙයද ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධා ලක්ෂණයවේ.

**10.** "තවද අනිකක් කියමි. සුභූතිය, භික්ෂුතෙම සිතින් නිපදවන ලද්දාවූ ඉහාත්මයෙහි සැප විහරණ ඇත්තාවූ සතර ධ්‍යානයන් කැමතිපරිදි ලබන්නේ නිදුකින් ලබන්නේ පහසුවෙන් ලබන්නේවෙයි. සුභූතිය, භික්ෂුතෙම සිතින් නිපදවන ලද්දාවූ ඉහාත්මයෙහි සැපවිහරණ ඇත්තාවූ සතර ධ්‍යානයන් කැමතිපරිදි ලබන්නේ නිදුකින් ලබන්නේ පහසුවෙන් ලබන්නේවෙයි යන යමකුත්වේද, සුභූතිය, මෙයද ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධා ලක්ෂණයවේ. තවද අනිකක් කියමි. සුභූතිය, භික්ෂුතෙම නොයෙක් ආකාරවූ පෙරවිසූ කඳ පිළිවෙළ සිහිකරයි. එනම් එක ජාතියක්ද ජාති දෙකක්ද ජාති තුනක්ද ජාති සතරක්ද ජාති පහක්ද ජාති දසයක්ද ජාති විස්සක්ද ජාති තිහක්ද ජාති සතළිසක්ද ජාති පනසක්ද ජාති සියයක්ද ජාති දහසක්ද ජාති ලක්ෂයක්ද නොයෙක් සංවර්ත කල්පයන්ද, නොයෙක් විවර්ත කල්පයන්ද නොයෙක් සංවර්තවිවර්ත කල්පයන්ද අසවල්තැන්හි මෙනම් ඇත්තෙක් මෙබඳු ගොත්‍ර ඇත්තෙක් මෙබඳු වර්ණ ඇත්තෙක් මෙබඳු ආහාරය ඇත්තෙක් මෙබඳු සුවදුක් විඳින්නෙක් මෙබඳු ආයුෂය කෙළවරකොට ඇත්තෙක්වීමි. ඒ මම එයින් චුතවූයේ අසවල්තැන්හි ඉපදුනෙමි. එහිද මෙබඳු නම් ඇත්තෙක් මෙබඳු ගොත්‍ර ඇත්තෙක් මෙබඳු වර්ණ ඇත්තෙක් මෙබඳු ආහාර ඇත්තෙක් මෙබඳු සුවදුක් විඳින්නෙක් මෙබඳු ආයුෂ කෙළවරකොට ඇත්තෙක්වීමි. ඒ මම එයින් චුතවූයේ මෙහි උපන්නේ වෙමියි' මෙසේ ආකාරසහිතවූ උදෙසීම් සහිතවූ අනෙකප්‍රකාරවූ පෙරවිසූ කඳ පිළිවෙළ සිහිකරයි. සුභූතිය, භික්ෂුතෙම අනෙකප්‍රකාරවූ පෙරවිසූ කඳපිළිවෙළ සිහිකරයි නම්, එක ජාතියක්ද ජාති දෙකක්ද (මෙහි 3 (ii)

යෙදිය යුතුයි) මෙසේ ආකාර සහිතවූ උදෙසීම් සහිතවූ අනෙකප්‍රකාරවූ පෙර විසූ කඳ පිළිවෙළ සිහිකෙරෙයි යන යමකුත්වේද, සුභූතිය, මෙයද ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධා ලක්ෂණයවේ.

11. "තවද අනිකක් කියමි. සුභූතිය, භික්ෂුතෙම පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් චුතවනු ලබන්නාවූද උපදිනුලබන්නාවූද සත්වයන් බලයි. හීනවූද ප්‍රණීතවූද යහපත්වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද යහපත් ගති ඇත්තාවූද අයහපත් ගති ඇත්තාවූද කම්වූ පරිද්දෙන් මියගියාවූ සත්වයන් දැනගනියි. පින්වත්නි, ඒකාන්තයෙන් මේ සත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහුය වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහුය. මනොදුශ්චරිතයෙන් යුක්තවූවාහුය. ආර්යයන්ට උපවාද කියන්නාහුය, මිත්‍ථ්‍යාදෘෂ්ටි ඇත්තාහුය, මිත්‍ථ්‍යාදෘෂ්ටීන්ගේ කර්ම සමාදන්වූවාහුය ඔව්හු ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපනැත්තාවූ දුකට පිහිටවූ නපුරුසේ ඇදවැටෙන්නාවූ නරකයෙහි උපන්නාහුය. පින්වත්නි, මේ සත්වයෝ වනාහි නරකයෙහි උපන්නාහුය. පින්වත්නි මේ සත්වයෝ වනාහි කායසුචරිතයෙන් යුක්තවූවාහුය, වාක්සුචරිතයෙන් යුක්තවූවාහුය මනොචරිතයෙන් යුක්තවූවාහුය, ආර්යයන්ට උපවාද නොකියන්නාහුය, සම්‍යක්දෘෂ්ටි ඇත්තාහුය, සම්‍යක් දෘෂ්ටීන්ගේ කර්ම සමාදන්වූවාහුය, ඔව්හු ශරීරයාගේ බිඳීමෙන් මරණින්මතු යහපත්ගති ඇත්තාවූ සවර්ග ලෝකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් (iii) චුතවන්නාවූද උපදින්නාවූද සත්වයන් බලයි. ලාමකවූද උතුම්වූද යහපත් වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද යහපත්ගති ඇත්තාවූද අයහපත්ගති ඇත්තාවූද (iv) කම්වූ පරිද්දෙන් පරලොව ගියාවූ සත්වයන් දැනගණියි. සුභූතිය, භික්ෂුතෙම පිරිසිදුවූ දිව්‍යවූ ඇසින් (මෙහි මේ වර්ගයේ මේ සූත්‍රයේ 11 (iii) ඡෙදය යෙදිය යුතුයි.) කම්වූ පරිද්දෙන් පරලොව ගියාවූ සත්වයන් දැනගණියි. යන යමකුත්වේද, සුභූතිය, මෙයද ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධා ලක්ෂණයවේ.

12. "තවද අනිකක් කියමි. සුභූතිය, භික්ෂුතෙම ආශ්‍රවයන් නැසීමෙන් (ii) ආශ්‍රව නැත්තාවූ අර්හත්ඵල සමාධියටද, අර්හත් ඵල ප්‍රඥාවටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන (iii) ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසයකරයි. සුභූතිය, භික්ෂුතෙම ආශ්‍රවයන් නැසීමෙන්, (මෙහි මේ වර්ගයේ මේ සූත්‍රයේ 12 (ii) ඡෙදය යෙදිය යුතුයි.) ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරෙයි යන යමකුත්වේද, සුභූතිය, මෙයද ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධා ලක්ෂණයවේයයි" වදාළේය.

13. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් සුභූති ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධා ලක්ෂණයෝ වදාරණ ලද්දාහුද ඒ ලක්ෂණ මේ භික්ෂූහුගේ පවතිත්. මේ භික්ෂු තෙමේද මේ ලක්ෂණයන්හි දක්නා ලැබේ. ස්වාමීනි, මේ භික්ෂුතෙම සිල්වත්වේ. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තවූයේ ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ ස්වල්ප තරම්වූ වරදවල පවා බිය දක්නා සුළුවූයේ වාසයකරයි, ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මෙයි. ස්වාමීනි, මේ භික්ෂුතෙම බොහෝ ඇසූ පිරූතැන් ඇත්තේ ඇසූ දෙය දරන්නේ ඇසූදෙය රැස්කිරීම ඇත්තේවෙයි. මුල යහපත්වූද මැද යහපත්වූද කෙළවර යහපත්වූද යම් මේ ධර්මයෝ අර්ථ සහිතවූවාහු ව්‍යංජන සහිතවූවාහු සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කෙරෙද්ද, එබඳුවූ ධර්මයෝ මොහු විසින් බොහෝකොට අසනලද්දාහු දරණ ලද්දාහු වචනයෙන් පුරුදුකරණ ලද්දාහු සිතින් සලකන ලද්දාහු දෘෂ්ටියෙන් ප්‍රතිවෙධ කරණ ලද්දාහුවෙත්. ස්වාමීනි, මේ භික්ෂුතෙම කළණ මිතුරන් ඇත්තේ සොඳුරු යහළුවන් ඇත්තේ යහපතට නැමීම ඇත්තේවෙයි. ස්වාමීනි, මේ භික්ෂුතෙම කීකරුවූයේ සුවච භාවය ඇතිකරන්නාවූ කරුණුවලින් යුක්තවූයේ ඉවසීම ඇත්තේ අනුශාසනාව පැදකුණු කිරීම් වශයෙන් ගන්නා ස්වභාව ඇත්තේවේ. ස්වාමීනි, මේ භික්ෂුතෙම සබ්‍රම්සරුන්ගේ යම් ඒ කුඩු මහත්වූ පිළිවිස කටයුතු දෑ වෙද්ද, එහි දක්ෂවූයේ අලස නොවූයේවෙයි. එහි උපායවූ විමසීමෙන් යුක්තවූයේ කරන්ට සුදුසුවූයේ සංවිධාන කරන්ට සුදුසුවූයේවෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ස්වාමීනි, මේ භික්ෂුතෙම දහම් කැමැත්තේ ප්‍රියවූ වාක් ව්‍යවහාර ඇත්තේ අභිධර්මයෙහි අභිවිනයෙහි මහත්වූ ප්‍රමොද්‍ය ඇත්තේවෙයිද ස්වාමීනි, මේ භික්ෂුතෙම පටන් ගන්නාලද වීර්ය ඇත්තේ ශක්තිමත්වූයේ දෘඪවීර්ය ඇත්තේ කුශල ධර්මයන්හි බහා නොතබනලද බර ඇත්තේ වාසය කරයි, ස්වාමීනි, මේ භික්සුතෙම සිතින් නිපදවන ලද්දාවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇත්තාවූ සතර ධ්‍යානයන් කැමැතිසේ ලබන්නේ, නිදුකින් ලබන්නේ පහසුවෙන් ලබන්නේවෙයි.

14. "ස්වාමීනි, මේ භික්ෂුතෙම අනෙකප්‍රකාරවූ පෙරවිසූ කඳපිළිවෙළ සිහිකරයි. (මෙහි මේ වර්ගයේ මේ සූත්‍රයේ 10 ඡෙදයේ එනම් එක් ජාතියක්ද" යන තැන්සිට උපන්නේ වෙයි" දක්වා යෙදිය යුතුයි.) මෙසේ ආකාර සහිතවූ උදෙසීම් සහිතවූ අනෙකාකාරවූ පෙරවිසූ කඳපිළිවෙළ සිහිකරයි. ස්වාමීනි, මේ භික්ෂුතෙම පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් (මෙහි මේ වර්ගයේ මේ සූත්‍රයේ 11 (iii) ඡෙදය යෙදිය යුතුයි) කම්වූපරිදි මිය පරලොව ගියාවූ සත්වයන් දැනගනියි. ස්වාමීනි, මේ භික්ෂුතෙම ආශ්‍රවයන් නැසීමෙන් (මෙහි මේ වර්ගයේ මේ සූත්‍රයේ 12 (ii) ඡෙදය යෙදිය යුතුයි) ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසයකරයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම්මේ ශ්‍රද්ධා ඇත්තහුගේ ශ්‍රද්ධා ලක්ෂණ කෙනෙක් වදාරණ ලද්දාහුද? ඒ ලක්ෂණ මේ භික්ෂුහුගේ පවතිත්. මේ භික්ෂු තෙමේද මෙකී ලක්ෂණයන්හි දක්නා ලැබේයයි" කීයේය.

14. "සුභූතිය, යහපත යහපත සුභූතිය, එසේවීනම් නුඹ මේ සද්ධනම් භික්ෂුව සමග වාසය කරන්නෙහි සුභූතිය, යම් කලෙකත් නුඹ තථාගතයන් දැකීමට කැමැතිවන්නෙහි නම් මේ සද්ධනම් භික්ෂුව සමගම තථාගතයන් දැකීමට එළඹෙන්නෙහිවායි" වදාළේය.

16. **මෙත්තානිසංස සූත්‍රයː**- 1. "මහණෙනි, නිතර සේවනය කරණ ලද්දාවූ වඩන ලද්දාවූ නැවත නැවත කරණ ලද සුදුසු යානාවක් මෙන් කරණ ලද වත්තක් මෙන් කරණ ලද අධිෂ්ඨාන කරණ ලද පුරුදු කරණ ලද මනාකොට පටන්ගන්නා ලද මෛත්‍රී

චිත්ත විමුක්තිහුගේ ආනිශංස එකොළොසක් කැමති විය යුතුවෙත්.

2. "කවර එකොළොසක්ද යත්: සුවසේ නිදයි, සුවසේ පුබුදියි පවිටු සීන නොදකියි. මිනිසුන්ට ප්‍රිය වෙයි. අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි. දෙවතාවෝ රක්ෂා කෙරෙත්. මොහුට ගින්න හෝ විස හෝ ආයුධයක් හෝ නොවදියි. වහාසිත එකග වෙයි. මුඛ වර්ණයතෙම විශෙෂයෙන් ප්‍රසන්න වෙයි. මුළාවට නොපැමිණියේ කළුරිය කරයි. මත්තෙහි අර්හත් මාර්ග ප්‍රතිවේධය නොකරන්නේ බඹලොව උපදින්නේ වෙයි. (මෙහි 1 ඡෙදයයෙදිය යුතුයි.)

17. **අට්ඨක නාගර සූත්‍රයඃ-** 1. එක් කලෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම විසාලා මහනුවර බේලුව නම් ගමෙහි වාසය කරයි. එකල්හි වනාහි අට්ඨක නම් නුවර වැසි දසම නම් ගෘහපති තෙම කිසියම් කටයුත්තක් සඳහා පැළලුප් නුවර පැමිණියේ වෙයි. ඉක්බිති අට්ඨක නම් නුවර වැසි දසම නම ගෘහපති තෙම කුක්කුටාරාමය යම් තැනෙක්හිද එක්තරා භික්ෂු නමක් යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ඒ භික්ෂුහට මෙය කීයේය. "ස්වාමීනි, කොහි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම මෙකල්හි වාසය කෙරේද? ස්වාමීනි, අපි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ දකිනු කැමැත්තම්හයි" "ගෘහපතිය, මේ ආයුෂ්මත් ආනන්ද, ස්ථවිරතෙමේ විසල් නුවර බේලුව නම් ගමෙහි වාසය කෙරේ යයි" කීයේය.

2. "ඉක්බිති අට්ඨක නම් නුවර වැසි දසම නම් ගෘහපති තෙම පැළලුප් නුවර ඒ කටයුත්ත නිමවා විසල් පුර බේලුව නම් ගම යම් තැනෙක්හිද ආයුෂ්මත් ආනන්ද ස්ථවිර යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට වැඳ එකත් පස්ව හුන්නේය. එකත් පස්ව හුන්නාවූම අට්ඨක නම් නුවර වැසි දසම නම් ගෘහපතිතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වන්සේට මෙය කීයේය. "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස යම් ධර්මයෙක්හි අප්‍රමාදව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව හරණ ලද ආත්මාලය ඇතිව වාසය

කරන්නාවූ භික්ෂූහුගේ නොමිදුනාවූ හෝ සිත කෙලෙසුන් කෙරෙන් මිදේද? ක්ෂය නොවූ ආශ්‍රව හෝ ක්ෂය වීමට යද්ද? නො පැමිණියාවූ හෝ උතුම්වූ නිවණට අනුව පැමිණේද? එබඳුවූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට ප්‍රකාශ කරණ ලද්දාවූ එක් ධර්මයෙක් ඇත්තේ දැයි" ඇසීය.

3. "ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව කෙලෙස් තවන වීර්ය ඇතිව හරණ ලද ආත්මාලය ඇතිව වාසය කරන්නාවූ භික්ෂූහුගේ නොමිදුනාවූ සිත හෝ කෙලෙසුන් කෙරෙන් මිදේද, ක්ෂය නොවූ ආශ්‍රව හෝ ක්ෂය වීමට යෙද්ද, නොපැමිණියාවූ උතුම්වූ නිවණට හෝ අනුව පැමිණේද, එබඳුවූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට වදාරණ ලද්දාවූ එක් ධර්මයෙක් ඇතැයි" කීයේය.

4. "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, යම් ධර්මයෙක්හි අප්‍රමාදව කෙලෙස් තවන වීර්ය ඇතිව හරණලද ආත්මාලය ඇතිව වාසය කරන්නාවූ භික්ෂූහුගේ නොමිදුනාවූ සිත හෝ කෙලෙසුන්ගෙන් මිදේද, ක්ෂය නොවූ ආශ්‍රව හෝ ක්ෂය වීමට යෙද්ද, නොපැමිණියාවූ උතුම් නිවණට හෝ අනුව පැමිණේද, එබඳුවූ සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරණ ලද්දාවූ එක් ධර්මය තෙම කවරේදැයි" ඇසීය.

5. "ගෘහපතිය, මේ ශාසනයෙහි භික්ෂුතෙම කාමයන්ගෙන් වෙන්වම අකුශලධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙසේ කල්පනා කරයි. මේ ප්‍රථම ධ්‍යානයද වනාහි අභිසංස්කරණය කරණ ලද්දක්ය. සිතින් නිපදවන ලද්දක්ය. යම් කිසිවක් වනාහි රැස්කරණ ලදද, සිතින් නිපදවන ලදද, එය අනිත්‍යය නිරුද්ධවීම ස්වභාව කොට ඇත්තේයයි දැන ගණියි. හෙතෙම එහි පිහිටියේ ආශ්‍රවයන් නැසීමට පැමිණෙයි. ඉදින් ආශ්‍රවයන් නැසීමට

නොපැමිණේ නම් ඒ ධර්මයෙහිවූ රාගයෙන්ම ඒ ධර්මයෙහිවූ සතුටෙන්ම ඕරම්භාගිය සංයෝජන පස නැසීමෙන් ඕපපාතිකවූයේ එහි පිරිනිවෙණ සුළුවූයේ ඒ ලෝකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ වෙයි. ගෘහපතිය යම් ධර්මයෙක්හි අප්‍රමාදව කෙලෙස් තවන වීර්ය ඇතිව හරණ ලද ආත්මාලය ඇතිව වාසය කරන්නාවූ භික්ෂූහුගේ නොමිදුනාවූ සිත හෝ කෙලෙසුන්ගෙන් මිදේද, ක්ෂය නොවූ ආශ්‍රව හෝ ක්ෂය වීමට යෙද්ද, නොපැමිණියාවූ උතුම් නිවණට හෝ අනුව පැමිණේද, එබඳුවූ සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට ප්‍රකාශ කරණ ලද්දාවූ මේ ධර්මය තෙමේද එක් ධර්මයක් වේයයි" කීයේය.

**6.** "නැවත අනිකක්ද කියමි. ගෘහපතිය, භික්ෂු තෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් තමා කෙරෙහි පැහැදීම ඇත්තාවූ සිත පිළිබඳ එකඟ බව ඇති විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. (මෙහි 1493 පිටේ 4 වර්ගයේ 32 සූත්‍රයේ 3 ඡෙදයේ 'ප්‍රීතියේ' යන තැන්සිට යෙදිය යුතුයි.

"සතර වන ධ්‍යානයට පැමිණ වාසයකරයි. හෙතෙම මෙසේ සළකයි. මේ සතර වන ධ්‍යානයද වනාහි රැස්කරණ ලද්දක සිතින් නිපදවන ලද්දක යම්කිසිවක් වනාහි රැස්කරණ ලදද, සිතින් නිපදවන ලදද එය අනිත්‍යය, නිරුද්ධවීම ස්වභාවකොට ඇත්තේයයි දැන ගණියි. හෙතෙම එහි පිහිටියේ ආශ්‍රවයන් නැසීමට පැමිණෙයි. ඉදින් ආශ්‍රවයන් නැසීමට නොපැමිණේ නම් ඒ ධර්මයෙහිවූ ඇල්නේම ඒ ධර්මයෙහි සතුටින්ම ඕරම්භාගීයවූ සංයෝජන පස නැසීමෙන් ඕපපාතිකවූයේ එහි පිරිනිවෙන සුළුවූයේ ඒ ලෝකයෙන් පෙරළා නොඑන ස්වභාවය ඇත්තේ වෙයි. ගෘහපතිය යම් ධර්මයෙක්හි අප්‍රමාදව කෙළෙස් තවන වීර්ය ඇතිව හරණලද ආත්මාලය ඇතිව වාසයකරණ භික්ෂූහුගේ නොමිදුනාවූ සිත හෝ කෙලෙසුන්ගෙන් මිදේද, ක්ෂය නොවූ ආශ්‍රව හෝ ක්ෂයවීමට යෙද්ද, නොපැමිණියාවූ උතුම්වූ නිවණට හෝ අනුව පැමිණේද, එබඳුවූ සියල්ල දන්නාවූ

සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරණ ලද්දාවූ මේ ධර්මයද වනාහි එක් ධර්මයක්වේ යයි' කීයේය.

7. "නැවත අනිකක්ද කියමි. ගෘහපතිය, භික්ෂුතෙම මෛත්‍රිය සමග ගියාවූ සිතින් (ii) එක් දිසාවක් පැතිර වාසය කරයි. එසේ දෙවන දිසාවද එසේ තුන්වන දිසාවද එසේ සතරවන දිසාවද පැතිර වාසය කරයි. මෙසේ උඩයට සරස සියලු තන්හි සියල්ලන් කෙරෙහි සමව පැවති සියල්ලන් ඇති ලෝකය පැතිරීමෙන් මහත්වූ මහත් බවට ගියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ නිදුක්වූ (iii) මෛත්‍රී සහගත සිතින් පැතිර වාසය කරයි. හෙතෙම මෙසේ සළකයි. මේ මෛත්‍රී චිත්ත විමුක්තියද වනාහි රැස් කරණ ලද්දීය. සිතින් නිපදවන ලද්දීය. යම්කිසිවක් වනාහි රැ ස්කරණ ලදද සිතින් නිපදවනලදද එය අනිත්‍යය නිරොධය ස්වභාවකොට ඇත්තේ යයි දැන ගනියි. හෙතෙම එහි පිහිටියේ ආශ්‍රවයන්ගේ නැසීමට පැමිණෙයි. ඉදින් ආශ්‍රවයන්ගේ නැසීමට නො පැමිණේ නම් ඒ ධර්මයෙහි ඇල්මෙන්ම ඒ ධර්මයෙහි සතුටෙන්ම ඕරම්භාගීය සංයෝජන පස නැසීමෙන් ඕපපාතික වූයේ එහි පිරිනිවෙන සුළුවූයේ ඒ ලෝකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ වෙයි. ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව කෙලෙස් තවන වීර්ය ඇතිව හරණලද ආත්මාලය ඇතිව වාසය කරණ භික්ෂූහුගේ නොමිදුනාවූ සිත හෝ කෙලෙසුන්ගෙන් මිදේද, ක්ෂය නොවූ ආශ්‍රව හෝ ක්ෂය වීමට යෙත්ද, නොපැමිණියාවූ උතුම්වූ නිවණට හෝ අනුව පැමිණේද එබඳුවූ මේ ධර්මයද සියල්ල දන්නාවූ සියලුදෙය දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට ප්‍රකාශ කරණ ලද්දාවූ එක් ධර්මයෙක් වේයයි' කීයේය.

8. "නැවතද අනිකක් කියමි. ගෘහපතිය, භික්ෂු තෙම කරුණාව සමග ගියාවූ සිතින් (මෙහි මේ වර්ගයේ මේ සූත්‍රයේ 7 (ii) ඡෙදය යෙදිය යුතුයි) මෘදු භාවය සමග ගියාවූ උපෙක්ෂාව සමග ගියාවූ සිතින් එක් දිසාවක් පැතිර වාසය කරයි. එසේ දෙවන දිසාවද එසේ තුන්වන දිසාවද එසේ සතරවන දිසාවද පැතිර වාසය කරයි. මෙසේ උඩ යට සරස සියලු තන්හි සියල්ලන්

කෙරෙහි සමව පැවැත්තාවූ සියල්ලන් ඇති ලෝකය පැතුරුනාවූ මහත් බවට ගියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ නිදුක්වූ උපෙක්ෂාව සමග ගියාවූ සිතින් පැතිර වාසය කරයි. හෙතෙම මෙසේ සළකයි. මේ උපෙක්ෂා චිත්ත විමුක්තියද වනාහි රැස්කරණ ලද්දීය. සිතින් නිපදවන ලද්දීය යම්කිසිවක් වනාහි රැස් කරණ ලදද සිතින් නිපදවන ලදද එය අනිත්‍යය නිරුද්ධවීම ස්වභාව කොට ඇත්තේයයි දැන ගනියි. හෙතෙම එහි සිටියේ ආශ්‍රවයන් නැසීමට පැමිණේ. ඉදින් ආශ්‍රවයන් නැසීමට නොපැමිණේනම් ඒ ධර්මයෙහි ඇල්මෙන්ම ඒ ධර්මයෙහි සතුටෙන්ම ඕරම්භාගිය සංයෝජන පස නැසීමෙන් ඕපපාතිකවූයේ එහි පිරිනිවෙන සුළුවූයේ ඒ ලෝකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේවෙයි. ගෘහපතිය, මෙයද වනාහි යම් ධර්මයෙක්හි අප්‍රමාදව කෙළෙස් තවන වීර්ය ඇතිව හරණ ලද ආත්මාලය ඇතිව වාසය කරණ භික්ෂූහුගේ නොමිදුනාවූ සිත හෝ කෙළෙසුන්ගෙන් මිදේද ක්ෂය නොවූ ආශ්‍රව හෝ ක්ෂය වීමටයෙත්ද, නොපැමිණියාවූ උතුම්වූ නිවණට හෝ අනුව පැමිණේද, එබඳුවූ සියල්ල දක්නාවූ සියලු දෙය දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරණ ලද්දාවූ එක් ධර්මයෙක් වේයයි කීයේය.

**9.** "නැවත අනිකක්ද කියමි. ගෘහපතිය, භික්ෂු තෙම සියලු ආකාරයෙන් රූප සංඥාවන්ගේ ඉක්මවීමෙන් ප්‍රතිඝ සංඥාවන්ගේ නැසීමෙන් නානත්ත සංඥාවන්ගේ මෙනෙහි නොකිරීමෙන් ආකාශය අනන්තයයි ආකාශානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. හෙතෙම මෙසේ සළකයි. මේ ආකාශානඤ්චායතන සමාපත්තියද වනාහි රැස් කරණ ලද්දේය. සිතින් නිපදවන ලද්දීය. යම් කිසිවක් වනාහි රැස්කරණ ලදද, සිතින් නිපදවන ලදද, එය අනිත්‍යය නිරුද්ධවීම ස්වභාව කොට ඇත්තේයයි දැනගණියි. හෙතෙම එහි සිටියේ ආශ්‍රවයන් නැසීමට පැමිණේ ඉදින් ආශ්‍රවයන් නැසීමට නොපැමිණේනම් ඒ ධර්මයෙහිවූ ඇල්මෙන්ම ඒ ධර්මයෙහි සතුටෙන්ම ඕරම්භාගීය සංයෝජන පස නැසීමෙන් ඕපපාතිකවූයේ එහි පිරිනිවෙන සුළුවූයේ ඒ ලෝකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේවෙයි.

**10.** "ගෘහපතිය, මෙයද වනාහි යම් ධර්මයෙක්හි අප්‍රමාදව කෙළෙස් තවන වීර්ය ඇතිව හරණ ලද ආත්මාලය ඇතිව වාසය කරණ භික්ෂූහුගේ නොමිදුනාවූ සිත හෝ කෙලෙසුන්ගෙන් මිදේද, ක්ෂය නොවූ ආශ්‍රව හෝ ක්ෂය වීමට යෙද්ද, නොපැමිණියාවූ උතුම්වූ නිවණට හෝ අනුව පැමිණේද, එබඳුවූ සියල්ල දන්නාවූ සියලු දෙය දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරණ ලද්දාවූ එක් ධර්මයෙක් වේ.

**11.** නැවත අනිකක්ද කියමි. ගෘහපතිය, භික්ෂුතෙම සියලු ආකාරයෙන් ආකාශානඤ්චායතන සමාපත්තිය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. හෙතෙම මෙසේ සළකයි. මේ ආකිඤ්ඤායතන සමාපත්තියද රැස්කරණ ලද්දීය. සිතින් නිපදවන ලද්දීය. යම්කිසිවක් වනාහි රැස් කරණ ලදද, සිතින් නිපදවන ලදද, එය අනිත්‍යය නිරුද්ධවීම ස්වභාව කොට ඇත්තේයයි දැන ගනියි. හෙතෙම එහි සිටියේ ආශ්‍රවයන් නැසීමට පැමිණෙයි. ඉදින් ආශ්‍රවයන් නැසීමට නොපැමිණේනම් ඒ ධර්මයෙහිවූ ඇල්මෙන්ම ඒ ධර්මයෙහි සතුටින් ඕරම්භාගීය සංයෝජන පස නැසීමෙන් ඕපපාතිකවූයේ එහි පිරිනිවෙන සුළුවූයේ ඒ ලොකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේවෙයි. ගෘහපතිය, මේ ධර්මයද වනාහි යම් ධර්මයෙක්හි අප්‍රමාදව කෙළෙසුන් තවන වීර්ය ඇතිව හරණලද ආත්මාලය ඇතිව වාසය කරණ භික්ෂූහුගේ නොමිදුනාවූ සිත හෝ කෙලෙසුන්ගෙන් මිදේද, ක්ෂයනොවූ ආශ්‍රව හෝ ක්ෂය වීමට යෙද්ද, නොපැමිණියාවූ උතුම් නිවණට හෝ අනුව පැමිණේද එබඳුවූ සියල්ල දන්නාවූ සියලු දෙය දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනාකරණ ලද්දාවූ එක් ධර්මයෙක් වේයයි" කීයේය.

**12.** "මෙසේ කී කල්හි අට්ඨක නම් නුවර වැසි දසම නම් ගෘහපතිතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කීයේය. ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන්වහන්ස යම්සේ පුරුෂයෙක් තෙම එක් නිදන් දොරටුවක් සොයන්නේ එක්වරම නිදන් දොරටු එකොළොසක් ලබන්නේද, ස්වාමීනි, එපරිද්දෙන්ම මම එක් නිවන් දොරටුවක් සොයන්නේ එකවරම නිවන්දොරටු එකොළොසක් සෙවනය කිරීමට ලැබූයෙමි. ස්වාමීනි, යම්සේ පුරුෂයෙකුගේ දොරටු එකොළොසක් ඇති ගෙයක් වේද, හෙතෙම ඒ ගෙය ගිනි ඇවිලගත් කල්හි එකෙක දොරටුවෙනුත් තමහට සුවයක් කරන්ට හැකි වන්නේද, ස්වාමීනි, මෙපරිද්දෙන්ම මම මේ නිවන් දොරටු එකොළොස අතුරෙන් එක එක දොරටුවකිනුත් තමහට සුවයක් කරන්නට හැකිවන්නෙමි. ස්වාමීනි මේ අන්‍ය තීර්ථකයෝ නම් ගුරුවරයාට ගුරුවැටුප් සොයන්නාහුය. කුමක් හෙයින් වනාහි මම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට පූජාවක් නොකරන්නෙම් දැයි" කීයේය.

13. "ඉක්බිති, අට්ඨක නම් නුවරවැසි දසම නම් ගෘහපති තෙම විසල් නුවර වැසිවූද පැළලුප් නුවර වැසිවූද භික්ෂු සංඝයා රැස්කරවා ප්‍රණීතවූ කෑයුතු දෙයින්ද බුදියයුතු දෙයින්ද සියතින් මනාකොට සන්තර්පණය කෙළේය. මනාකොට පවාරණය කෙළේය. එක් එක් භික්ෂුවද වෙන වෙන වස්ත්‍ර යුග්මයකින් හැන්දවිය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද තුන් සිව්රකින් හැඳවී, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට පන්සියයක් වටිනා විහාරයක්ද කරවූයේය."

18. **ගොපාලකංග සූත්‍රයː-** 1. "මහණෙනි, කරුණු එකොළොසකින් යුක්තවූ ගොපළුතෙම ගව සමූහයා පරිහරණය කරන්ට සමෘද්ධ කරන්ට සුදුසු නොවේ. කවර එකොළොසකින්ද යත්?

2. "මහණෙනි, මේ ලෝකයෙහි ගොපළුතෙම රූපය දන්නේ නොවේද, ලකුණු දැනීමෙහි දක්ෂ නොවේද, මැසි බිජුවට නොවළකන්නේද, වණය වසා බඳින්නේ නොවේද, දුම් කරන්නේ නොවේද, තොටුපල නොදනීද, පැන්බීවහු නොදනීද, යායුතු මග නොදනීද, ගොදුරු තැන් දැනීමෙහි දක්ෂ නොවේද? ඉතිරිනොකොට කිරි දොවින්නේත්වේද යම් ඒ ගවපිතෘවූ ගවපරිනායකවූ වෘෂභයෝවෙද්ද, ඔවුන් වැඩියක් පිදීමෙන්

පුදන්නේ නොවේද, මහණෙනි, මේ කරුණු එකොළසින් යුක්තවූ ගොපළුතෙම ගව සමූහයා පරිහරණය කරන්නට සමෘද්ධ කරන්ට සුදුසුනොවේ.

3. "මහණෙනි, මෙපරිද්දෙන්ම එකොළොස් කරුණකින් යුක්තවූ භික්ෂුතෙම මේ ශාසනයෙහි වෘද්ධියට වැඩීමට මහත් බවට පැමිණෙන්ට සුදුසු නොවේ. කවර එකොළොසකින්දයත්?

4. "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම රූපය දන්නේ නොවේද, ලකුනු දැනීමෙහි දක්ෂ නොවේද, මැසි බිජුවට වළකන්නේ නොවේද, වණය වසා බඳින්නේ නොවේද, දුම් කරන්නේ නොවේද, තොටුපල නොදනීද, පානය කළහු නොදනීද, ගමන් කළයුතු මග නොදනීද, ගොචර ස්ථානයෙහි දක්ෂනොවේද, ශෙෂ රහිතව දොවින්නේත් වේද, රාත්‍රඥවූ පැවිදිවී බොහෝකල් ගියාවූ සංඝ පීතෘවූ සංඝ පරිනායක යම් මේ ස්ථවිර භික්ෂූහු වෙද්ද, ඔවුන් වැඩියක් පූජායෙන් පුදන්නේ නොවේද?

5. "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම රූප දන්නේ නොවේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම යම්කිසි රූපයක්වේද, ඒ සියලු රූපය සතරමහ භූතයෝද සතරමහ භූතයන්ගෙන් හටගත් රූපයද වේයයි තත්වූපරිද්දෙන් දැන නොගනියි. මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම රූප දන්නේ නොවෙයි. මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම ලකුණු දැනීමෙහි දක්ෂ නොවේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම අඥානතෙම කර්මය ලක්ෂණකොට ඇත්තේය. පණ්ඩිතතෙම කර්මය ලක්ෂණකොට ඇත්තේයයි තත්වූපරිද්දෙන් දැන නොගනීද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම ලකුණු දැනීමෙහි දක්ෂ නොවේ.

6. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම මැසිබිජුවට හෙවත් ඉහඳ තිබීම වළකන්නේ නොවේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම උපන්නාවූ කාම විතර්කය ඉවසාද, හැර නොදමාද, දුරුනොකෙරේද, විනාශ නොකෙරේද, නැවත අභාවයට නොපමුණුවාද, උපන්නාවූ ව්‍යාපාද විතර්කය උපන්නාවූ විහිංසා විතර්කය, උපනූපන්නාවූ ලාමකවූ අකුශල ධර්මයන් ඉවසාද,

නොහරීද, දුරු නොකෙරේද, කෙළවර නොකෙරේද, නැවත අභාවයට නොපමුණුවාද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම ඉහඳ තිබීම වළකන්නේ නොවෙයි.

7. "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම වණය පිළිසන් කරන්නේ නොවේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ඇසින් රූපය දැක නිමිතිවශයෙන් ගන්නේවේද, කුඩා ලකුණු වශයෙන් ගන්නේවේද, යම්හෙයකින් මේ චක්ෂුරින්ද්‍රියෙහි සංවර නැතුව වාසය කරන්නහුට විෂම ලෝභය දොම්නස්ය යන ලාමකවූ අකුශල ධර්මයෝ අනුව වහනය වන්නාහුද, එය සංවර කිරීම පිණිස නොපිළිපදීද, චක්ෂුරින්ද්‍රිය නොරකීද චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට නොපැමිණේද, කණින් ශබ්ද අසා නාසයෙන් සුවඳ දැන දිවෙන් රසය විඳ කයින් ස්පර්ශ කළ යුත්තේ ස්පර්ශකොට සිතින් ධර්මය දැන නිමිති වශයෙන් ගන්නේවේද, කුඩා ලකුණු වශයෙන් ගන්නේවේද, යම් හේතුවකින් මේ මනෙන්ද්‍රියෙහි සංවරනැතිව වාසයකරන්නහුට විෂම ලෝභය දොම්නසය යන ලාමකවූ අකුශල ධර්මයෝ අනුව වහනය වන්නාහුද, එය සංවර කිරීම පිණිස නොපිළිපදීද, මනෙන්ද්‍රිය නොරකීද, මනෙන්ද්‍රියෙහි සංවරයට නොපැමිණෙයිද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම වණය පිළියම් කරන්නේ නොවෙයි. මහණෙනි, කෙසේ නම් භික්ෂු තෙම දුම කරන්නේ නොවේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම අසනලද පරිදි පිරිවහනලද පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනා කරන්නේ නොවේද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම දුමකරන්නේ නොවෙයි.

8. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම තොටුපල නොදනීද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම යම් ඒ භික්ෂූහු බොහෝ ඇසූපිරූ තැන් ඇත්තාහු පැමිණියාවූ ශාසන ධර්මය ඇත්තාහු ධර්මය දරන්නාහු විනය දරන්නාහු මාතෘකා දරන්නාහු වෙද්ද, ඔවුන් වෙත කලින් කල පැමිණ ස්වාමීනි, මෙය කෙසේද, මොහුගේ අර්ථය කවරේදැයි නොවිචාරාද, ප්‍රශ්න නොකෙරේද, ඔහුට ඒ ආයුෂ්මත්හු අප්‍රකටවූ ධර්මයද ප්‍රකට නොකෙරෙත්. ගැඹුරුවූ ධර්මයද ප්‍රකාශ නොකෙරෙත්. අනෙකප්‍රකාරවූද, සැක

කටයුතු ධර්මයන්හි සැකය දුරුනොකෙරෙත්. මහණෙනි, මෙසේ වනාහි භික්ෂු තෙම තොටුපල නොදනියි.

9. "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම පානය කළහු නොදනීද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරණලද ධර්ම විනය දෙශනා කරණු ලබනකල්හි අර්ථය පිළිබඳ සතුට නොලබාද, ධර්මය පිළිබඳ සතුට නොලබාද, ධර්මයෙන් යුක්තවූ ප්‍රමුදිතභාවය නොලබාද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම පානය කරණ ලද්දහු නොදනියි.

10. "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම ගමන් මාර්ගය නොදනීද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ආර්ය අෂ්ටාංගික මාර්ගය තත්වූ පරිද්දෙන් නොදනීද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම ගමන් මාර්ගය නොදන්නේවේ.

11. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම ගෝචර ස්ථානයන්හි දක්ෂවූයේ නොවේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම සතර සතිපට්ඨානයන් තත්වූ පරිද්දෙන් නොදනීද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම ගොචර ස්ථානයන්හි දක්ෂවූයේ නොවෙයි.

12. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම ඉතිරි නොකොට දොවින්නේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ශ්‍රද්ධාව ඇති ගෘහපතීහු චීවරය පිණ්ඩපාතය සයනාශනය ගිලනුන්ට ප්‍රත්‍යවූ බෙහෙත් පිරිකරය යන මෙයින් ලඟට එළවා පවරද්ද, එහි භික්ෂුතෙම පිළිගැනීමට පමණ නොදනීද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම ඉතිරි නොකොට දොවින්නේ නම් වේ.

13. "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම චිරකල් දන්නාවූ පැවිදිවූ බොහෝ කල් ඇති සංඝ පිතෘවූ සංඝපරිනායකවූ යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙද්ද, ඔවුන් වැඩියක් පිදීමෙන් පුදන්නේ නොවේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම චිරරාත්‍රඥවූ චිරප්‍රව්‍රජිතවූ සංඝපිතෘවූ සංඝපරිනායකවූ යම් ඒ ස්ථවිර භික්ෂූහුවෙද්ද, ඔවුන් කෙරෙහි ප්‍රකාශයෙහිද රහසිගතවද මෛත්‍රී

කාය කර්මය නොපිහිටුවාද, මෛත්‍රී වාක්කර්මය නොපිහිටුවාද, මෛත්‍රී මනො කර්මය එළිපිටද රහසද නොපිහිටුවාද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම චිර රාත්‍රඥවූ චිරප්‍රව්‍රජිතවූ සංඝපිතෘවූ සංඝපරිනායකවූ යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙද්ද, ඔවුන් වැඩිතරම් පූජාවෙන් පුදන්නේ නොවේද, මහණෙනි, මේ ධර්ම එකොළොසින් යුක්තවූ භික්ෂු තෙම වනාහි මේ ශාසනයෙහි වැඩීමට හටගැනීමට මහත් බවට පැමිණෙන්ට නුසුදුස්සෙක් වේ.

14. "මහණෙනි, කරුණු එකොළොසකින් යුක්තවූ ගොපළුතෙම ගව සමූහයා පරිහරණය කරන්ට සමෘද්ධ කරන්ට සුදුස්සෙක් වේ, කවර නම් එකොළොසකින්ද යත්? මහණෙනි, මේ ලෝකයෙහි ගොපළුතෙම රූප දන්නේවේද, ලකුණු දැනීමෙහි දක්ෂයෙක්වේද, මැසිබිජුවට වළක්වන්නේවේද? වණය පිළිසන් කරන්නේවේද? දුමකරන්නේවේද, තොටුපළ දනීද, පානය කළහු දනීද ගමන් මාර්ගය දනීද, ගොදුරුතන්හි දක්ෂයෙක්වේද ඉතිරිකිරීම් සහිතව දොවින්නේවේද, ගවපිතෘවූ ගවපරිනායකවූ යම් මේ වෘෂභයෝ වෙද්ද, ඔවුන් වැඩිතරම් පිදීමෙන් පුදන්නේවේද, මහණෙනි, මේ කරුණු එකොළසින් යුක්තවූ ගොපළුතෙම වනාහි ගව සමූහයා පරිහරණය කරන්ට සමෘද්ධ කරන්ට සමර්ථයෙක්වේද.

15. "මහණෙනි, මෙපරිද්දෙන්ම ධර්ම එකොළොසකින් යුක්තවූ භික්ෂුතෙම මේ ශාසනයෙහි වැඩීමට නැඟීමට මහත් බවට පැමිණෙන්ට සමර්ථයෙක්වේ. කවර එකොළොසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම රූප දන්නේවේද, ලකුණු දැනීමෙහි දක්ෂයෙක්වේද, මැසිබිජුවට වළක්වන්නේද, වණය පිළිසන්කරන්නේවේද, දුම කරන්නේවේද තොටුපොළ දනීද, පානය කළහු දනීද, ගමන්මග දනීද, ගොදුරු තැන් දැනීමෙහි දක්ෂයෙක්වේද, ඉතිරි සහිතව දොවින්නේවේද, චිරකල් දන්නාවූ පැවිදිවූ බොහෝකල් ඇති සංඝපිතෘවූ සංඝ පරිනායකවූ යම් මේ ස්ථවිර භික්ෂූහු වෙද්ද ඔවුන් වැඩිතරම් පිදීමෙන් පුදන්නේවේද,

16. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම රූප දන්නේවේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම යම්කිසි රූපයක්වේද,

ඒ සියලු රූපය සතර මහාභූතයෝය. සතර මහා භූතයන්ගෙන් හටගත් රූපයයි තත්වූ පරිද්දෙන් දනීද මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම රූප දන්නේවේ.

17. "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම ලකුණු දැනීමෙහි දක්ෂයෙක්වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙම බාලතෙම කර්මය ලක්ෂණකොට ඇත්තේය. පණ්ඩිත තෙම කර්මය ලක්ෂණකොට ඇත්තේයයි තත්වූපරිද්දෙන් දැනගනීද, මහණෙනි, මෙසේවනාහි භික්ෂුතෙම ලකුණු දැනීමෙහි දක්ෂයෙක්වේ.

18. "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම මැසිබිජුවට වළකන්නේවේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම උපන්නාවූ (ii) කාම විතර්කය නොඉවසාද, හැරදමාද, කෙළවර කෙරේද, දුරු කෙරේද, නැවත අභාවයට පමුණුවාද, (iii) උපන්නාවූ ව්‍යාපාද විතර්කය උපන්නාවූ විහිංසා විතර්කය (මෙහි මේ වර්ගයේ මේ සූත්‍රයේ 18 (ii) ඡේදය යෙදිය යුතුයි.)

"උපනුපන් ලාමකවූ අකුශලධර්මයන් නො ඉවසාද, හැරදමාද, දුරුකෙරේද, අවසාන කෙරේද, නැවත අභාවයට පමුණුවාද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම මැසිබිජුවට වළක්වන්නේ වෙයි.

19. "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම වණය වසන්නේවේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ඇසින් රූපය දැක නිමිතිවශයෙන් ගන්නේ නොවේද, කුඩා ලකුණු වශයෙන් ගන්නේ නොවේද? යම් හේතුවකින් මේ චක්ෂුරින්ද්‍රියෙහි සංවර නැතිව වාසය කරන්නහුට විෂම ලොභය දොම්නසය යන ලාමකවූ අකුශල ධර්මයෝ අනුව වැහෙන්නාහුද, එය වැළැක්ම පිණිස පිළිපදීද? චක්ෂුරින්ද්‍රිය රකීද, චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට පැමිණේද, කනින් ශබ්දය අසා, නාශයෙන් සුවඳ දැන දිවෙන් රශය විඳ, කයින් ස්පර්ශ කළයුත්ත ස්පර්ශකොට සිතින් ධර්මය දැන නිමිති වශයෙන් ගන්නේ නොවේද, කුඩා ලකුණු වශයෙන් ගන්නේද, යම් හේතුවකින් මේ මනෙන්ද්‍රියෙහි සංවර නැතිව වාසය කරන්නහුට විෂම

ලෝභය දොම්නසය යන ලාමකවූ අකුශල ධර්මයෝ අනුව වැගෙහෙන්නාහුද, එය වැළැක්ම පිණිස පිළිපදියිද, මනෛන්ද්‍රිය රකීද, මනෛන්ද්‍රියෙහි සංවරයට පැමිණේද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම වණය වසන්නේවේ.

20. "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම දුම කරන්නේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනා කරන්නේවේද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම දුම කරන්නේ වෙයි.

21. "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම තොටුපල දනීද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම දැනගත් ආගම ඇත්තාවූ ධර්මය දරන්නාවූ විනයදරන්නාවූ මාතෘකා දරන්නාවූ යම් මේ බහුශ්‍රැත භික්ෂූහුවෙද්ද, කලින්කල ඔවුන් වෙත පැමිණ ස්වාමීනි, මෙය කෙසේද, මොහුගේ අර්ථය කවරේදැයි විචාරාද ප්‍රශ්න කෙරේද, ඕහට ඒ ආයුෂ්මත්හු විවෘත නොවුම අර්ථය විවෘත කෙරෙත්. ප්‍රකට නොවූද, කාරණය ප්‍රකට කෙරෙත්. නොයෙක් ආකාරවූද සැක කටයුතුවූ ධර්මයන්හි සැකය දුරුකෙරෙත්. මහණෙනි, මෙසේ වනාහි භික්ෂු තෙම තොටුපල දකියි.

22. "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම පානය කළහු දනීද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම තථාගතයන් වහන්සේ විසින් වදාළාවූ ධර්ම විනය දෙශනා කරණු ලබන කල්හි අර්ථය පිළිබඳ සතුට ලබාද, ධර්මය පිළිබඳ සතුට ලබාද ධර්මයෙන් යුක්තවූ ප්‍රමුදිත භාවය ලබාද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම පානය කළහු දනියි.

23. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම යායුතුමග දනීද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ආර්ය අෂ්ටාංගික මාර්ගය තත්වූපරිද්දෙන් දනීද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම යායුතු මග දනියි.

24. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම ගොචරස්ථානයන්හි දක්ෂවූයේද? මහණෙනි මේ ශාසනයෙහි භික්ෂුතෙම සතර සතිපට්ඨානයන් තත්වූ පරිද්දෙන් දනීද,

මහණෙනි මෙසේ වනාහි භික්ෂුතෙම ගොචරස්ථානයන්හි දක්ෂ වූයේ වෙයි.

**25.** "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම ඉතිරිකිරීම ඇතිව දොවින්නේවේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙම ශ්‍රද්ධාවන්ත ගෘහපතීහු චීවරය පිණ්ඩපාතය, ශයනාසනය ගිලන්පස බෙහෙත් පිරිකර යන මෙයින් ලඟට එළවා පවරත්ද, එහි භික්ෂුතෙම පිළිගැනීමට පමණ දනීද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම ඉතිරි සහිතව දොවින්නේ වෙයි.

**26.** "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම චිරරාත්‍රඥවූ පැවිදිවූ බොහෝකල් ඇති සංඝපිතෘවූ සංඝ පරිනායකවූ යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙද්ද, ඒ භික්ෂූන් අධිකවූ පූජාවෙන් පුදන්නේවේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම චිරකල් දන්නාවූ, පැවිදිවූ බොහෝකල් ඇති සංඝ පිතෘවූ සංඝපරිනායකවූ යම් ඒ ස්ථවිර භික්ෂූහුවෙද්ද, ඔවුන් කෙරෙහි මෛත්‍රීසහගත කායකර්මය ඉදිරියෙහිද නැතිතැනද යොදවාද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම චිරකල් දන්නාවූ පැවිදිවූ බොහෝකල් ඇති සංඝ පිතෘවූ සංඝ පරිනායකවූ යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙද්ද, ඔවුන් අතිරේක පූජාවෙන් පුදන්නේවේ.

**27.** "මහණෙනි, මේ කරුණු එකොළොසින් යුක්තවූ භික්ෂුතෙමේ වනාහි මේ ශාසනයෙහි වැඩීමට හටගැනීමට මහත් බවට පැමිණීමට සුදුසු වේයයි" වදාළේය.

**19. පඨම සමාධි පටිලාභ සූත්‍රයඃ-** 1. "එකල්හි වනාහි බොහෝවූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව උන්හ. එකත්පස්ව හුන්නාවූම ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය.

**2.** "ස්වාමීනි, (ii) යම්සේ පෘථිවියෙහි පෘථිවිය යන සංඥා ඇත්තේ නොවන්නේද? ජලයෙහි ජලය යන සංඥා ඇත්තේ නොවන්නේද, තෙජසෙහි තේජස යන සංඥා ඇත්තේ නොවන්නේද, වායුවෙහි වායුව යන සංඥා ඇත්තේ නොවන්නේද, ආකාශානඤ්චායතනයෙහි ආකාශානඤ්චායතන

යන සංඥා ඇත්තේ නොවන්නේද, විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්ඤචඤ්ඤා යතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන සංඥා ඇත්තේ නොවන්නේද, මෙලොව උපදනා සමාපත්තියෙහි මෙලොව උපදනා සමාපත්තිය යන සංඥා ඇත්තේ නොවන්නේද, පරලොව උපදනා සමාපත්තියෙහි පරලොව උපදනා සමාපත්තිය යන සංඥා ඇත්තේ නොවන්නේද, දක්නා ලදය, අසන ලදය, ස්පර්ශ කරණ ලදය, දැනගන්නා ලදය, පැමිණෙන ලදය, සොයන ලදය, සිතින් අනුව හැසිරෙන ලදය යන මේ යමකුත් වේද, එහිදු සංඥා ඇත්තේ නොවන්නේද, එතකුදු වුවත් සංඥා ඇත්තේත් වන්නේද? (iii) භික්ෂුහට එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් වන්නේදැයි"? ඇසූහ.

3. "මහණෙනි, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) භික්ෂුහට එබඳුවූ සමාධි ප්‍රතිලාභයක් වන්නේයයි" වදාළේය.

4. "ස්වාමීනි, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඒ කෙසේ නම් භික්ෂුහට එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් වන්නේ දැයි," ඇසූහ.

5. "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම යම් මේ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමවූ සියලු කෙලසුන්ගේ දුරලීමවූ තෘෂ්ණාව නැසුවාවූ නොඇල්මවූ නිරොධ නම්වූ නිවණක් වේද, මෙය ශාන්තය මෙය ප්‍රණීතයයි මෙබඳු සංඥා ඇත්තේවේද, මහණෙනි, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මෙසේ වනාහි භික්ෂුහට එබඳුවූ සමාධි ප්‍රතිලාභය වන්නේයයි" වදාළේය.

**20. දුතිය සමාධි පටිලාභ සූත්‍රය**:- 1. "එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, කියා භික්ෂූන්ට අඬගා වදාළසේක. "කිමෙක්ද, පින්වතුන් වහන්සැයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, (මෙහි මේ වර්ගයේ 19 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට වන්නේදැයි," ඇසූසේක.

3. "ස්වාමීනි, අපට ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ නායකකොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහුය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේටම මේ භාසිතයාගේ අර්ථය වැටහෙන සේක්වා. එය මැනව භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් අසා භික්ෂූහු එය දරන්නාහුයයි" කීහ. "මහණෙනි, එසේ වීනම් අසව් යහපත් කොට මෙනෙහි කරව් කියන්නෙමියි'' වදාළේය, "ස්වාමීනි, එසේයයි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

4. "මහණෙනි, (මෙහි මේ වර්ගයේ 19 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට වන්නේයයි" වදාළේය.

5. "ස්වාමීනි, (මෙහි මේ වර්ගයේ 19 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට ඒ කෙසේ නම් වන්නේදැයි" ඇසූහ.

6. "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම යම් මේ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමවූ සියලු කෙළෙසුන්ගේ දුරලීමවූ තෘෂ්ණාව නැසුවාවූ නොඇල්මවූ නිරොධවූ නිවණක් වේද, මෙය ශාන්තය, මෙය ප්‍රණීත යයි මෙබඳුවූ සංඥා ඇත්තේ වේද, මහණෙනි, (මෙහි මේ වර්ගයේ 19 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි) එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට මෙසේ වනාහි වන්නේයයි" වදාළේය.

**21. පඨම සාරිපුත්ත සමාධිලාභ සූත්‍රයː-** 1. "එකල්හි වනාහි බොහෝවූ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවූවාහුය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එකත්පස්ව උන්හ. එකත්පස්ව හුන්නාවූම ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය කීවාහුය.

2. "ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, (මෙහි මේ වර්ගයේ 19 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට වන්නේදැයි" ඇසූහ.

3. "ඇවැත්නි, (මෙහි මේ වර්ගයේ 19 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට වන්නේයයි කීසේක.

4. "ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, (මෙහි මේ වර්ගයේ 19 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට ඒ කෙසේනම් වන්නේදැයි" ඇසූහ.

5. "ඇවැත්නි මේ ශාසනයෙහි භික්ෂුතෙම මෙබඳු සංඥා ඇත්තේ වේද, එනම් යම් මේ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමවූ සියලු කෙලෙසුන්ගේ දුරලීමවූ තෘෂ්ණාව ක්ෂයවූ විරාගවූ නිරොධවූ නිවණක් වේද, මෙය ශාන්තය. මෙය ප්‍රණීතය කියායි. ඇවැත්නි, යම්සේ පෘථිවියෙහි පෘථිවිය යන සංඥා ඇත්තේ නොමවන්නේද, ජලයෙහි ජලය යන සංඥා ඇති නොවන්නේද, තෙජසෙහි තෙජස යන සංඥා ඇති නොවන්නේද, වායුවෙහි වායුවය යන සංඥා ඇති නොවන්නේද, ආකාශානඤ්චායතනයෙහි ආකාශානඤ්චායතනය යන සංඥා ඇති නොවන්නේද, විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනය යන සංඥා ඇති නොවන්නේද, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනය යන සංඥා ඇති නොවන්නේද, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය යන සංඥා ඇති නොවන්නේද, මෙලොව උපදනා සමාපත්තියෙහි මෙලොව උපදනා සමාපත්තිය යන සංඥා ඇති නොවන්නේද, පරලොව උපදනා සමාපත්තියෙහි පරලොව උපදනා සමාපත්තිය යන සංඥා ඇති නොවන්නේද, දක්නා ලදය, අසන ලදය, ස්පර්ශ කරණ ලදය, දැනගන්නා ලදය, පැමිණෙන ලදය, සොයන ලදය සිතින් අනුව හැසිරෙන ලදය යන මේ යමකුත් වේද, එහිදු සංඥා ඇති නොවන්නේද, එතකුදු වුවත් සංඥා ඇත්තේත් වන්නේද, එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් මෙසේ වනාහි භික්ෂුහට වන්නේයයි" වදාළේය.

**22. දුතිය සාරිපුත්ත සමාධි ලාභ සූත්‍රයඃ-** 1. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරතෙම භික්ෂූන්ට ආමන්ත්‍රණය කෙළේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඇවැත්නි, (මෙහි මේ වර්ගයේ 19 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට වන්නේදැයි ඇසීය.

2. "ඇවැත්නි, අපි වනාහි දුරසිටද ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ සමීපයෙහි මෙබඳුවූ භාෂිතයාගේ අර්ථය දැනගන්නට එන්නෙමු. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේටම මේ භාෂිතයාගේ අර්ථය වැටහේවා ඒ මැනව, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් අසා භික්ෂූහු එය දරන්නාහුයය" කීහ. "ඇවැත්නි, එසේ නම් අසව්, යහපත්කොට මෙනෙහි කරව්, කියන්නෙමියි" කීය. "ඇවැත්නි, එසේයයි" කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරතෙම මෙය වදාළේය.

3. "ඇවැත්නි, (මෙහි මේ වර්ගයේ 19 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් භික්ෂුහට වන්නේයයි" කීයේය.

4. "ඇවැත්නි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, (මෙහි මේ වර්ගයේ 19 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් ඒ කෙසේ නම් භික්ෂුහට වන්නේදැයි" ඇසූහ.

5. "ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම යම් මේ සියලු සංස්කාරයන්ගේ සංසිඳීම ඇත්තාවූ සියලු කෙලෙසුන්ගේ දුරලීම ඇත්තාවූ තෘෂ්ණාක්ෂයවීම ඇත්තාවූ විරාගය ඇත්තාවූ නිරෝධය ඇත්තාවූ නිර්වාණයක්වේද, මෙය ශාන්තය මෙය ප්‍රණීතයයි මෙබඳු සංඥා ඇත්තේවේද, ඇවැත්නි, (මෙහි මේ වර්ගයේ 19 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි.) එබඳුවූ සමාධි ප්‍රතිලාභයෙක් මෙසේ වනාහි භික්ෂුහට වන්නේයයි කීයේය."

---

## 3. සාමඤ්ඤ වර්ගය

23. **චක්ඛවාදිනං අනිච්චාදි සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු එකොළසකින් යුක්තවූ ගොපළුතෙම ගව සමූහයා පරිහරණයකරන්ට සමෘද්ධ කරන්නට නුසුදුසුවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "කවර එකොළොසකින්ද යත්? මහණෙනි, මේ ලෝකයෙහි ගොපළුතෙම (ii) රූපදන්නේ නොවේද ලකුණු දැනීමෙහි දක්ෂනොවේද, මැසි බිජුවට වළකන්නේ නොවේද, වණය වසන්නේ නොවේද, දුමකරන්නේ නොවේද, තොටුපල නොදනීද, පානයකළහු නොදනීද, යායුතු මග නොදනීද, ගොදුරුතැන් දැනීමෙහි දක්ෂ නොවේද, ඉතිරි නොකොට දොවින්නේවේද, ගවපිතෘවූ ගව පරිනායකවූ යම් ඒ වෘෂභයෝ වෙද්ද, ඔවුන්ට අධික පූජාවෙන් පුදන්නේ නොවේද, (iii) මහණෙනි, මේ කරුණු එකොළොසින් යුක්තවූ ගොපළුතෙම ගව සමූහයා පරිහරණය කරන්ට සමෘද්ධකරන්නට සුදුසු නොවේ.

3. "මහණෙනි, එපරිද්දෙන්ම ධර්ම එකොළොසකින් යුක්තවූ භික්ෂුතෙම (ii) ඇස කෙරෙහි අනිත්‍යය අනුව දකිමින් වාසයකරන්ට සුදුසු නොවේ. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඇසකෙරෙහි දුක අනුව දකිමින්වාසය කරන්ට සුදුසු නොවේ. ඇස කෙරෙහි අනාත්මය අනුව දකිමින් වාසය කරන්ට සුදුසු නොවේ. ඇස කෙරෙහි ක්ෂයවීම අනුව දකිමින් වාසයකරන්ට සුදුසු නොවේ. ඇස කෙරෙහි විනාශවීම අනුව දකිමින් වාසය කරන්ට සුදුසු නොවේ. ඇස කෙරෙහි නොඇලීම අනුව දකිමින් වාසය කරන්නට සුදුසු නොවේ. ඇස කෙරෙහි නිරුද්ධවීම අනුව දකිමින් වාසයකරන්ට සුදුසු නොවේ. ඇස කෙරෙහි දුරලීම අනුව දකිමින් වාසය කරන්ට සුදුසු නොවේ. කණෙහිද නැහැයෙහිද, දිවෙහිද, කයෙහිද, සිතෙහිද, රූපයන්හිද ශබ්දයන්හිද, ගන්ධයන්හිද, රශයන්හිද, ස්පර්ශයන්හිද, ධර්මයන්හිද, ඇස පිළිබඳ විඤ්ඤාණයෙහිද කණ පිළිබඳ විඤ්ඤාණයෙහිද නාසය පිළිබඳ විඤ්ඤාණයෙහිද, දිව පිළිබඳ විඤ්ඤාණයෙහිද, කය පිළිබඳ විඤ්ඤාණයෙහිද, සිත පිළිබඳ විඤ්ඤාණයෙහිද, ඇස පිළිබඳ ස්පර්ශයෙහිද, කණ පිළිබඳ ස්පර්ශයෙහිද, නාසය පිළිබඳ ස්පර්ශයෙහිද, දිව පිළිබඳ ස්පර්ශයෙහිද, කය පිළිබඳ ස්පර්ශයෙහිද, සිත පිළිබඳ ස්පර්ශයෙහිද, ඇස පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාවෙහිද, කණ පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාවෙහිද, නාසය පිළිබඳ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ස්පර්ශයෙන් හටගත් වේදනාවෙහිද, දිව පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාවෙහිද කය පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාවෙහිද, සිත පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාවෙහිද, රූපසංඥාවෙහිද, ශබ්ද සංඥාවෙහිද ගන්ධ සංඥාවෙහිද, රස සංඥාවෙහිද, ස්පර්ශයන් පිළිබඳ සංඥාවෙහිද, ධර්මසංඥාවෙහිද, රූප සඤ්චෙතනාවෙහිද, ශබ්ද සඤ්චෙතනාවෙහිද, ගන්ධ සඤ්චෙතනාවෙහිද රශ සඤ්චෙතනාවෙහිද, ඓාට්ඨබ්බ සඤ්චෙතනාවෙහිද, ධර්ම සඤ්චෙතනාවෙහිද, රූපතෘෂ්ණාවෙහිද, ශබ්දතෘෂ්ණාවෙහිද ගන්ධ තෘෂ්ණාවෙහිද, රශතෘෂ්ණාවෙහිද, ස්පර්ශ තෘෂ්ණාවෙහිද, ධර්ම තෘෂ්ණාවෙහිද, රූප විතර්කයෙහිද ශබ්ද විතර්කයෙහිද, ගන්ධ විතර්කයෙහිද, රශ විතර්කයෙහිද, ස්පර්ශයන් පිළිබඳ විතර්කයෙහිද, ධර්ම විතර්කයෙහිද, රූප විචාරයෙහිද, ශබ්ද විචාරයෙහිද, ගන්ධ විචාරයෙහිද, රශ විචාරයෙහිද, පොට්ඨබ්බ විචාරයෙහිද, ධර්ම විචාරයෙහිද, අනිත්‍ය අනුව දකිමින් වාසය කරන්ට දුක අනුව දකිමින් වාසය කරන්ට අනාත්මය අනුව දකිමින් වාසය කරන්ට ක්ෂයවීම අනුව දකිමින් වාසය කරන්ට විනාශය අනුව දකිමින් වාසය කරන්ට විරාගය අනුව දකිමින් වාසය කරන්ට නිරොධය අනුව දකිමින් වාසය කරන්ට (iii) දුරලීම අනුව දකිමින් වාසය කරන්ට නුසුදුසු වේයයි" වදාළේය.

4. "මහණෙනි, කරුණු එකොළසකින් යුක්තවූ ගොපළුතෙම ගව සමූහයා පරිහරණය කරන්ට සමෘද්ධ කරන්ට සමර්ථවේ. කවර එකොළොසකින්ද යත්? මහණෙනි, මේ ලෝකයෙහි ගොපළුතෙම (ii) මේ රූප දන්නේවේද? (මෙහි 2 (ii) "රූප දන්නේ නොවේද" ආදිය, "දන්නේවේද" ආදීවශයෙන් යෙදිය යුතුයි.)

5. "මහණෙනි, මෙපරිද්දෙන්ම ධර්ම එකොළොසකින් යුක්තවූ භික්ෂුතෙම ඇසෙහි අනිත්‍යය අනුව දකිමින් වාසය කරන්ට (මෙහි 4 (ii) යෙදිය යුතුයි. එහි "නුසුදුසුවේයයි" වෙනුවට "සුදුසුවේයයි" යෙදිය යුතුයි.) දුරලීම අනුව දකිමින් වාසය කරන්ට සමර්ථවේයයි" වදාළේය.

**24. රාගාදීනං අභිඤ්ඤාදී සූත්‍රය:-** 1. "මහණෙනි, රාගයාගේ වෙසෙසා දැනීම පිණිස එකොළොස් ධර්ම කෙනෙක් වැඩිය යුත්තාහු වෙත්.

2. "කවර එකොළොසක්ද යත්? ප්‍රථම ධ්‍යානය ද්විතීයධ්‍යානය තෘතීයධ්‍යානය චතුර්ථධ්‍යානය, මෛත්‍රී චිත්ත විමුක්තිය කරුණා චිත්ත විමුක්තිය, මුදිතා චිත්ත විමුක්තිය උපෙක්ෂා චිත්ත විමුක්තිය, ආකාශානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය යන එකොළොසයි, මහණෙනි, රාගයාගේ වෙසෙසා දැනීම පිණිස මේ එකොළොස් ධර්මයෝ වැඩිය යුත්තාහුය. මහණෙනි, රාගයාගේ වෙසෙසා දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස හාත්පසින් ක්ෂයකිරීම පිණිස දුරුකිරීම පිණිස ක්ෂයකිරීම පිණිස විනාශය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස හැරදැමීම පිණිස දුරලීම පිණිස මේ එකොළොස් ධර්මයෝ වැඩිය යුත්තාහුයයි වදාළේය.

ද්වේෂයාගේද, මොහයාගේද ක්‍රොධයාගේද, බද්ධ වෛරයාගේද ගුණමකු භාවයාගේද උතුමන් තමා හා සමකිරීමේද ඊර්ෂ්‍යාවගේද මසුරුකමේද මායාවගේද කෛරාටිකකමේද තද ගතියේද එකටඑක කිරීමේද, මානයාගේද, අධිකමානයාගේද මදයාගේද ප්‍රමාදයාගේද වෙසෙසා දැනීම පිරිසිඳ දැනීම පිණිස හාත්පසින් ක්ෂයකිරීම පිණිස ප්‍රහාණය පිණිස ක්ෂය කිරීම පිණිස විනාශය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස හැරදැමීම පිණිස දුරලීම පිණිස මේ එකොළොස් ධර්මයෝ වැඩිය යුත්තාහුයයි වදාළේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටුසිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ ඒ භාෂිතය සතුටින් පිළිගත්තාහුය."

සූත්‍ර නව දහසක්ද අධිකවූ පන්සියයක්ද සත් පණසක්ද සූත්‍රාන්තයෝ අංගුත්තර නිකායෙහි යුක්තවූවාහුය.

**එකොළොස්වන නිපාතය නිමි.**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.